

# සාරාත්ථ මඤ්ජරී

නම් වූ

# විනය ගැටපදය.

සම්පූර්ණ විනය පිටකයට ලියැවුණු

# සාරාර්ථ මඤ්ජරී

නම් වූ

# විනය ගැටපදය.

(ප්‍රථම භාගය)

---

පණ්ඩිත වේරගොඩ අමරමෝලි ස්වාමීන් වහන්සේ

විසින්

ලියන ලදී.

---

විද්‍යෝදය පිරිවෙණේ උපප්‍රධානාචාර්ය්‍ය

ගරු පණ්ඩිත වැලිවිටියේ ශ්‍රී සෝරතාභිධාන

ස්ථවිරපාදයන් ප්‍රධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින්

ශුද්ධිපත්‍රාවලෝකනය කරණ ලදී.

---

ගණේකම; ඇල්බර්ට් එදිරිසිංහ,

විමලසිරි විතානාච්චි යන මහතුන්

විසින්

මහාබොධි යන්ත්‍රාලයයෙහි මුද්‍රණය

කරවන ලදී.

2489



කහවේ ශ්‍රී රත්නසාර නායක මාහිමියන්

වහන්සේ

සාරාර්ථමඤ්ජරී නම් වූ විනය ගැටපදය වනාහි විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩ විසූ අති ගරු කහවේ ශ්‍රී සුමඞ්ගල රතන-සාරාභිධාන කොළඹ නවකෝරළේ ප්‍රධාන සඞ්ඝනායක මාහිමියන් වහන්සේ විසින් ආරබ්ධව අඩාලව පැවතියේය.

එග නායක මාහිමියන් වහන්සේගේ ශිෂ්‍යවරයෙකු වූ වේරගොඩ අමරමෝලි ස්වාමීන් වහන්සේ විසින් සම්පූර්ණ විනය පිටකයට ම ලියා අවසන් කරණ ලදී.

එහෙත් මෙකල මුද්‍රණයෙහි පවත්නා අනවකාශබාධා නිසා සම්පූර්ණ ග්‍රන්ථරත්නයම මුද්‍රණ වාරයෙන් ප්‍රකාශයට පමුණුවන්ට නොහැකි විය. මේ ප්‍රථම භාගයෙහි පාරාජික පචිති හා මහාවග්ග අවසානය දක්වා පැවති කරුණු ඇතුලත් වෙයි. උපකාරානුසම්‍ථි ආදියද, සවිස්තර සංඥාපනයක් ද, අනුක්‍රමණිකාවක් ද ඇතුලත් දෙවන භාගය ලඟදී බලාපොරොත්තු වන්න.

ඇල්බර්ට් එදිරිසිංහ,
විමලසිරි විතානාච්චි.

2489
1946 . 8 . 2 දින ගණේගම දීය.

සාරාර්ථ මඤ්ජරී

නම් වූ

# විනය ගැටපදය.

---

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

## පාරාජික පාළි.

**තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති නළෙරු-පුචිමන්දමූලෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි.**

තෙන සමයෙන, එසමයෙහි; මෙහි 'තෙන' යනු අනියම් නිර්දේශයි, 'යෙන සමයෙන' යි පාළියෙහි නො පෙනෙන නමුත් "යත්තදෙ(ා)ර් නිත්‍යසම්බන්ධඃ" යු හෙයින් ය ශබ්ද ත ශබ්දයන්ගේ නිත්‍ය සම්බන්ධය නො වැළැක්විය හැකිබැවින් "යෙන සමයෙන ආයස්මතො සාරිපුත්තස්ස විනය පඤ්ඤත්තියා යාචනහෙතු භූතො පරිවිතක්කො උදපාදි; තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති" යනාදීන් මෙහි සම්බන්ධය දතයුතුයි. කුමක් හෙයින් සූත්‍රපිටකයෙහි දී "එකං සමයං" යනාදි තන්හි ද්විතීයාවෙන් ද, අභිධර්මයෙහි දී "යස්මිං සමයෙ කාමාවචරං කුසලං" යනාදීන්හි සප්තමියෙන් ද මේ විනයෙහි "තෙන සමයෙන" යි තෘතීයාවෙන් යොදන ලද්දේ ද? යම් කාලෙක භාග්‍යවතුන්වහන්සේ බ්‍රහ්මජාලාදි සූත්‍රධර්මයන් දෙසනසේක් ද, ආරම්භයෙහි පටන් පරිසමාප්තිය තෙක් පරහිත ප්‍රතිපත්තිසඞ්ඛ්‍යාත කරුණාවෙන් යුක්තව දෙසූහෙයින් "එකං සමයං" යි අත්‍යන්ත සංයොගයෙහි ද්විතීයා විභක්තිය යෙදිනි. මාසං සජ්ඣායති, යනාදි තන්හි මෙනි. අභිධර්මයෙහි වනාහි "යස්මිං සමයෙ" යනාදි තන්හි ආධාරාර්ථය හා භාවාර්ථය ලැබේ. ආධාරාර්ථයෙහි සමය ශබ්දයෙන් කාලාර්ථය හා සමූහාර්ථය කියැවේ. "යස්මිං කාලෙ, ධම්මසමූහෙ වා කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති තස්මිං කාලෙ, ධම්මසමූහෙ වා ඵස්සාදයොපි හොන්ති" යි අර්ථ දතයුතුයි. භාවාර්ථයෙහි ක්ෂණ,-සමවාය, හෙතු යන අර්ථත්‍රයකා වැටෙන සමය ශබ්දයාගේ භාවයෙන් ඵස්සාදිධර්මයන්ගේ භවනක්‍රියාව හඳුන්වනු ලැබේ. යම් සේ "ගාවීසු දුය්හමානාසු ගතො" යි කී කල්හි දොහනක්‍රියාවෙන් ගමන ක්‍රියාව හඳුන්වනු ලැබේ ද, එමෙන් ම "යස්මිං ඛණෙ සති කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති, තස්මිං සමයෙ සති ඵස්සාදයො පි හොන්ති" යි වාක්‍යයෙහි අධ්‍යාහෘත 'සති' යන ක්‍රියාවෙන් 'උප්පන්නං' යන අපරක්‍රියාව හඳුන්වනු ලැබේ. භාව සප්තමිය ව්‍යක්ත වන සේ වාක්‍යය සම්පූර්ණ කරගත්කල වාක්‍යය මෙසේ යි:- "යස්මිං ඛණෙ, යස්මිං සමවායෙ, යස්මිං හෙතුම්හි ච සති කාමා

චවරං කුසලං චිත්තං උප්පන්නං හොති, තස්මිං යෙව ඛණෙ, තස්මිං යෙව සමවායෙ, තස්මිං යෙව හෙතුම්හි ච සති ඵස්සාදයොපි ධම්මා හොන්ති” යනුයි. මෙසේ අභිධර්මයෙහි ආධාරාර්ථය ද, භාවාර්ථය ද සලකා සප්තමී විභක්තියෙන් යෙදින. විනය පිටකයෙහි හෙතු අර්ථය ද, කරණාර්ථය ද, ලැබේ. ශික්ෂාපද පණවන කාලයතෙම ශාරිපුත්‍රාදි මහතෙරුන් විසින් ද, නො දතහැකි වූයේය. හේතුවූ ද කාරණවූ ද ඒ සමයෙහි ශික්ෂාපද පණවමින්, ශික්ෂාපද පැණවීමට හෙතුව ද අපෙක්ෂා කරමින් භාග්‍යවතුන්වහන්සේ ඒ ඒ තන්හි වාසය කළසේක් ද එහෙයින් ඒ අර්ථය ප්‍රකාශ කරණු පිණිස කරණයෙන් (තෘතීයාවෙන්) යොදනලදී. පුරාණාචාර්‍ය්‍යවරයෝ වනාහි මෙසේ වර්ණනාකෙරෙත්:– ‘තස්මිං සමයෙ’ යනාදියද, ‘තෙන සමයෙන’ යනාදියද, ‘එකං සමයං’ යනාදියද ව්‍යඤ්ජනභෙද මාත්‍රයෙකි. තුන් තන්හිම සප්තම්‍යර්ථය උචිත වේ; එහෙයින් ‘තෙන සමයෙන’ යන තන්හි ‘එසමයෙහි’ යි අර්ථ දතයුතුයි යනුයි.

වෙරඤ්ජායං, වෙරඤ්ජා නුවරෙහි; (විගතො රජො අස්සාති වෙරඤ්ජා.) මෙහි අයබදු දීමෙන් ජනයාට පීඩාවක් නැති බැවින් වෙරඤ්ජා යයි ද, (වෙරං එත්ථ ජහන්තීති වෙරඤ්ජා) සෙරිවාණිජ ජාතකයෙහි දෙව්දත්හුගේ වෛරය හටගත් පෙදෙසෙහි කළ හෙයින් වෙරඤ්ජා යයි ද, (විවිධෙහි රඤ්ජයතීති වෙරඤ්ජා) පිවිසි පිවිසි නර ආදීන් කෑම බීම අලඞ්කාරාදියෙන් ද, විවිධ උපකරණයන්ගෙන් ද, සතුටු කරණ හෙයින් වෙරඤ්ජා යයි ද, (වෙරං අභිභවිත්වා ජහාතීති වෙරඤ්ජං) පසමිතුරන් අබිබවා කළ හෙයින් වෙරඤ්ජා යයි ද, (වෙරඤ්ජස්ස ඉසිනො අස්සමට්ඨානෙ කතත්තා වෙරඤ්ජා) වෙරඤ්ජ නම් ඍෂිහුගේ අසපුව පිහිටි තන්හි කළ බැවින් වෙරඤ්ජා යයි ද වෙරඤ්ජා ශබ්දාර්ථ පැරණියෝ වැණූහ. වෙරඤ්ජායං යනු සමීපාර්ථයෙහි සප්තමී විභක්තියි. “ගඞ්ගායං ගාවො චරන්ති” යනාදි තන්හි මෙනි. මෙකල මධුරා හෝ මත්‍රා නමින් යමුනා නදීතීරයෙහි වූ ගම වෙරඤ්ජා යයි සලකනු ලැබේ.

නළෙරු පුචිමන්ද මූලෙ– නළෙරු නම් යක්ෂයා විසින් අධිගෘහීත කොසඹරුක සමීපයෙහි; මෙහි අරුත් දක්වන්නෝ:– “නළෙරු” යනු එක්තරා යක්ෂයකුගේ නමක් බැවින් “නළෙරුස්ස පුචිමන්දො= නළෙරු පුචිමන්දො” කියා ද; “රුක් සිදුරෙක හටගත් කොසඹ රුකෙක” යන අර්ථ සලකා “රුක්ඛසුසිරෙ ජාතත්තා නළෙරු, නළෙරු ච සො පුචිමන්දො චාති නළෙරු පුචිමන්දො” කියා ද; නළවනයෙහි හටගත්තේනුයි, නළෙරු, උරුකළො පුචිමන්දො= නළෙරු පුචිමන්දො” කියා ද වණති. ‘පුචි’ යනු කුෂ්ටයට නම්. එය නසානුයි කොසඹරුක ‘පුචිමන්ද’ නම්. “මූල” ශබ්දයෙන් සමීපාර්ථය කියවේ. මූලශබ්දය නානාර්ථ වාචී මෙයි. ‘ මූලානි උද්ධරෙය්‍ය උසීරනාලමත්තානිපි” යනාදි තන්හි මූලමූලයෙහි ද “ලොභො අකුසලමූලං” යනාදි තන්හි අසාධාරණ හෙතුවෙහි ද; “යාව මජ්ඣන්හිකෙ කාලෙ ඡායා ඵරති නිවාතෙ පණ්ණානි පතන්ති එත්තාවතා රුක්ඛමූලං” යනාදි තන්හි සමීපයෙහි ද වැටේ. මෙහි

සම්පාපිය කෙණ දේ. දුටුවන් පහදවන මේ රුක සෙසු රුක්නට අධිපති යකු මෙන් නුවර අබියස ගමනාගමනයට පහසු තැනෙක වී.

**වෙරඤ්ජා බ්‍රාහ්මණො**— වෙරඤ්ජා නුවර වැසි බ්‍රාහ්මණ තෙම; "වෙරඤ්ජායං ජාතො, තත්‍ථ භවො වෙරඤ්ජො අස්ස නිවාසොති වා වෙරඤ්ජො"යි විග්‍රහ හෙයින් මොහුට වෙරඤ්ජයයි ව්‍යවහාර කෙරෙති. එහෙත් මවුපියන් විසින් කළ නාමය "උදය" යනුයි. "බ්‍රහ්මං අණතීති බ්‍රාහ්මණො"යි විග්‍රහ හෙයින් සාංග්වෙදාදි මන්ත්‍ර හදාරණ තැනැත්තේ බ්‍රාහ්මණ නම්, මේ ජාති බ්‍රාහ්මණයායි. ආර්යයන්ට ද බාහිත පාපතාව යෙන් (කෙලෙස් නැසූ හෙයින්) බ්‍රාහ්මණ යයි කියති.

**සක්‍යපුත්තො**, ශාක්‍යපුත්‍ර වූ; මෙයින් භාග්‍යවතුන්වහන්සේ ශ්‍රේෂ්ඨ කුලයෙහි උපන් බැව් හැඟවූහ.

**සක්‍යකුලා පබ්බජිතො**, ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූයේ; මහාසම්මත රජු පටන් අසම්භින්නවූ අතිශයින් උසස් ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූයේ. සක්‍යකුලා යන තන්හි 'ත්‍යාලොප පඤ්චමී'යි 'සක්‍ය කුලං පහාය නික්ඛමිත්වා'යි අර්ථ ගන්නේය. මෙයින් භාග්‍යවතුන්වහන්සේ ඥාතිපරිහානි, ධනපරිහානි ආදි කිසිවකින් නො මිරිකී ශ්‍රද්ධාවශයෙන් ම නික්ම පැවිදි වූ බැව් හැඟවූහ.

**තං ඛො පන භගවන්තං = පෙ = අබ්භුග්ගතො**, තං ඛො පන භගවන්තං, ඒ භාග්‍යවතුන්වහන්සේගේ; **කල්‍යාණො**, සුන්දරවූ; හෙවත් ශ්‍රේෂ්ඨවූ; **කිත්තිසද්දො**, කීර්තිඝොෂාව; **එවං**, (වක්ෂ්‍යමාණ වූ ඉතිපිසො භගවා යනාදි) ප්‍රකාරයෙන්; අබ්භුග්ගතො (අභි + උග්ගතො) (දෙවියන් සහිත ලොකයා අභිබවා උස්ව) නැංගේය: මෙහි 'තං භගවන්තං ගොතමං' යන තන්හි ඉත්ථම්භූතාඛ්‍යානාර්ථයෙහි විභක්තියයි. "තස්ස භගවතො ගොතමස්ස"යි අර්ථ ගත යුතුයි. "අබ්භුග්ගතො" යන්නෙන් එම කීර්ති ශබ්දය අනන්‍ය සාධාරණ ගුණයන් අරභයා පැවති බැවින් දෙවියන් සහිත ලෝකයා අභිබවා පැවැත්තේ යන අර්ථ ගන්නේයි. සො ඉමං = පෙ = පවෙදෙති. **සො**, ඒ සර්වඥ තෙම; **සදෙවකං**, දෙවියන් සහිතවූ; **සමාරකං**, මාරයා සහිතවූ: **සබ්‍රහ්මකං**, බ්‍රහ්මයා සහිතවූ; **ඉමං ලොකං**, මේ අවකාශ ලොකය ද; **සස්සමණබ්‍රාහ්මණිං**, සමණබ්‍රාහ්මණයන් සහිතවූ; **සදෙවමනුස්සං**, දෙව් මිනිසුන් සහිතවූ; **පජං**, සත්ත්වලොකය ද; **සයං**, තෙමේ; **අභිඤ්ඤාය**, අධික ඥානයෙන් දැන; **සච්ඡිකත්වා**, ප්‍රත්‍යක්ෂ කොට; **පවෙදෙති**, (පපුබ්බවිද ඤාණෙ, ධාතුයි.) ප්‍රකාශ කරයි; මෙහි "සදෙවකං" යන්නෙන් චාතුර්මහාරාජිකාදි දෙව්ලෝ පස ද; "සමාරකං" යන්නෙන් පරනිම්මිත වසවත්ති දෙව්ලොව ද; "සබ්‍රහ්මකං" යන්නෙන් බ්‍රහ්මකායිකාදි බ්‍රහ්මයන් ද; "සස්සමණ බ්‍රාහ්මණිං" යන්නෙන් ශාසනයට පසමිතුරු මහණ බමුණන් හා සමිත පාප බාහිත පාප මහණ බමුණන් ද; "පජං" යන්නෙන් සත්ත්වලොකය ද; "සදෙව මනුස්සං" යන්නෙන් සම්මුති දෙවියන් හා සෙසු මනුෂ්‍යයන් ද; ගන්නේය.

සො ධම්මං දෙසෙති = සෙ. = පකාසෙති. සො, හෙතෙම; ආදි කල්‍යාණං, ආදිය යහපත්වූ; මජ්ඣෙ කල්‍යාණං, මධ්‍යය යහපත්වූ; පරියොසාන කල්‍යාණං, අවසානය යහපත්වූ; ධම්මං, ධර්මය; දෙසෙති, (දිස-උච්චාරණෙ; චුරාදිගණික) දෙසයි; සාත්ථං, සුදුසු අර්ථ සම්පත්තියෙන් යුක්තවූ හෙයින් අර්ථ සහිතවූ; සබ්‍යඤ්ජනං, පදසම්පත්තියෙන් යුක්තවූ හෙයින් ව්‍යඤ්ජන සහිතවූ; කෙවලපරිපුණ්ණං, සර්වප්‍රකාරයෙන් සම්පූර්ණවූ; පරිසුද්ධං, දොස් රහිතවූ; බ්‍රහ්මචරියං, ශාසන බ්‍රහ්මචර්‍ය්‍ය හා මාර්ග බ්‍රහ්මචර්‍ය්‍ය; පකාසෙති. (ප + කාසු-දිත්තියං, දිප්ති යනු ප්‍රකට බවයි) ප්‍රකාශ කරයි; සියලු ශාසනය ශීලය මුල් කොට ඇති බැවින් ආදි කල්‍යාණයි. සමථවිදර්ශනා මාර්ගඵලයන් මධ්‍යකොට ඇති බැවින් මධ්‍ය කල්‍යාණයි. නිර්වාණය අවසන් කොට ඇති බැවින් පරියොසාන කල්‍යාණයි. පිටතින් එලවිය යුත්තක් නැති බැවින් කෙවල පරිපුණ්ණයි. බැහැර කටයුත්තක් නැති බැවින් පරිශුද්ධයි. ශික්ෂාත්‍රය ඇතුළත් බැවින් ශ්‍රෙෂ්ඨයන් විසින් ම හැසිරියයුතු හෙයින් බ්‍රහ්මචර්‍ය්‍ය නම්.

සම්මොදි (සං පුබ්බ මුද හාසෙ, අජ්ජතනී) සමග සතුටු වූයේය. සම්මොදනීයං, සතුටුවීමට සුදුසුවූ; සාරාණීයං, බොහෝ කලක් සිහි කටයුතුවූ; කථං, කථාව; වීතිසාරෙත්වා, (වි + අති පුබ්බ සර ගතියං) නිම කොට; එකමන්තං, එකත්පසක. මෙහි ක්‍රියාවිශෙෂණයෙහි විතී යායි. "විසමං චන්දිමසුරියා පරිවත්තන්ති" යනාදි තන්හි මෙති. ක්‍රියා විශෙෂණය පැරණියෝ "භාව නපුංසක" යන්නෙන් හැඳින්වූහ. නිසීදි- (නි + සද විසරණගත්‍යවසාදනෙසු. අතීත) හුන්නේය. මෙ, මා විසින්; ඒතං, මේ මතු දක්වනාකාරය; සුතං, අසනලදී. ජිණ්ණෙ (ජර + වයොහානිම්හි. කත්‍රිකාරක අතීත ත ප්‍රත්‍යය, තහට ඉණ්ණාදෙශයි) ජරාවෙන් දිරාවාවූ හෙවත් ජරාවට පත්වූ; වුඩ්ඪෙ, අඟපසඟ වැඩී අවසන්වූ; මහල්ලකෙ, මහලුවූ; අද්ධගතෙ, දෙතුන් රජ්‍යානුශාසනා කාලයක් ඉක්මෙව්වාවූ; වයොඅනුප්පත්තෙ, පශ්චිම වයසට පැමිණියාවූ; පශ්චිම වයස නම් සත්සැට වසේ පටන් සියක් වස දක්වා අතර කාලයයි. බ්‍රාහ්මණෙ, ජාති බ්‍රාහ්මණයන්; න අභිවාදෙති, නො වඳියි. න පච්චුට්ඨෙති (පති + උද් පුබ්බ ඨා-ගති නිවුත්තියං) හුනස්නෙන් නැගිට පෙර ගමන් නොකරයි. ආසනෙන වා නිමන්තෙති, (මෙහි වැඩසිටීවායි) ආසනයෙන් නොපවරයි යනුයි. තයිදං (තං + ඉදං) ඒ මේ කාරණය; තථෙව, එසේම ද? තදිදං, ඒ මේ කාරණය: න සම්පන්නමෙව, අයුතුමය.

විපතෙය්‍ය (වි + පත- පතනෙ, සත්තමී.) ගෙලෙන් ගිලිහී බිම වැටෙන්නේය. අලුයම් කාලයෙහි නටුවෙන් ගිලිහී වැටෙන තල්ගෙඩියක් මෙන් හිස ග්‍රීවායෙන් ගැලවී බිම හෙන්නේය යනු අභිප්‍රායයි. අරසරූපො. සාමග්ගිරසය නැත්තෙක. "අභිවාදන-පච්චුට්ඨාන-අඤ්ජලිකම්ම-සාමීචිකම්ම යන මොහු සාමග්ගිරසයෝ යයි ලෝකයා විසින් ව්‍යවහාරකරණු ලැබෙත්. එය භවත් ගෞතමයන්වහන්සේට

නැත" යනාර්ථයි. අත්ථෙසො බ්‍රාහ්මණ පරියායො, (අත්ථි + ඛො + එස.) බ්‍රාහ්මණ, බමුණ; එසපරියායො, මේ කාරණය, අත්ථි ඛො, (මා කෙරෙහි) විද්‍යමාන වෙයි. පරියාය ශබ්දය වනාහි "මධුපිණ්ඩික පරියායොත්වෙව නං ධාරෙහි" යනාදි තන්ති දෙශනාර්ථයෙහි ද, "කස්ස නු ඛො ආනන්ද අජ්ජ පරියායො භික්ඛුණියො ඔවදිතුං" යනාදි තන්ති වාරාර්ථයෙහි ද, "සාධු භන්තෙ භගවා අඤ්ඤං පරියායං ආචික්ඛතු යථායං භික්ඛු සඞ්ඝො අඤ්ඤාය සණ්ඨහෙය්‍ය" යනාදි තන්ති කාරණයෙහිද වැටේ. මෙහි ද කාරණයෙහි ය. "යෙන පරියායෙන සම්මා වදමානො පුග්ගලො අරසරූපො සමණො ගොතමො'ති මං වදෙය්‍ය, එසපරියායො ඛො (මයි) අත්ථි"යි සම්බන්ධකරණු. යම් කරුණකින් 'ශ්‍රමණ භවද් ගෞතම තෙම අරසරූපය'යි සත්‍යවාදියෙක් මට කියයි ද, ඒ කාරණය මා කෙරෙහි විද්‍යමාන වෙයි යනු භාවාර්ථයි.

ඉක්බිති තමන්වහන්සේ කෙරෙහි අවිද්‍යමාන රසයන් දක්වන සේක්, "යෙ තෙ බ්‍රාහ්මණ = පෙ = අනුප්පාද ධම්මා"යි වදාළසේක. තථාගතස්ස, තථාගතයන්වහන්සේ විසින් (කර්තෘයාර්ථයෙහි ෂෂ්ඨියි) පහීණා, ප්‍රහීණකරණලද්දුහ. (පපුබ්බ හා වාගෙ) සමන්වහන්සේ ඥාණ ම වදුරණ හෙයින් "මය්හං පහීණා"යි වදාළ යුතු නමුත් දෙශනා විලාස වශයෙන් "තථාගතස්ස පහීණා"යි වදාළේ. "තථාගතෙන පහීණා"යි අර්ථ ගන්නේය. උච්ඡින්නමූලා (උච්ඡින්නං මූලං එතෙසං'ති උච්ඡින්න මූලා) සිඳිකලද බවමුල් ඇත්තාහ. සර්වඥයෝ ආර්යමාර්ග නමැති ශස්ත්‍රයෙන් තෘෂ්ණා අවිද්‍යමය භවමූලය විනාශකළහ. එහෙයින් උන්වහන්සේ කෙරෙන් රූප රසාදීහු අති දූරයහ. තාලාවත්ථුකතා, මුලිඋදුරණලද තල්රුක් ඇති පෙදෙසක් මෙන් කරණ ලද්දුහ. මෙහි දෙපරිද්දකින් අරුත් බිණිය යුතුයි. 'තාලවත්ථු විය වත්ථු කතා'යි කියයුතු තැන මධ්‍ය පදලෝපයෙන් හා පූර්වයට දීඝකිරීමෙන් 'තාලාවත්ථු කතා'යි ගතයුතුයි. යම්සේ තල්රුකක් මුලිනුදුරා දමා එහි භූමිය සමකල කල්හි නැවත එ රුක නො හටගණීද එමෙන් සර්වඥයෝ ආර්යමාර්ග ශස්ත්‍රයෙන් මුල් සහිත රූපාදි රසයන් සිඳදමා නැවත නොහටගන්නා සේ කළහ. දෙවන අර්ථයෙහි:- 'තාලාවත්ථු විය කතා'ති තාලාවත්ථු කතා'යි විග්‍රහ හෙයින් සර්වඥයෝ මුදුන සිඳ දමනලද තල්ගසක් මෙන් රූප රසාදීන් නැවත නොහටගන්නා සේ කළහ. අනභාවඞ්කතා, පසුව නොඋපදින සේ විනාශයට පමුණුවන ලද්දුහ. මෙහි 'අනු + අභාවං කතා'යි පදච්ඡෙද කටයුතුයි. 'අනච්ඡරියං" යනාදි තන්හි මෙනි. "අනභාවගතා"යි ද පාඨයි. ආයතිං, මත්තෙහි; අනුප්පාද ධම්මා (න + උප්පාද ධම්මා) නොඋපදිනා ස්වභාව ඇත්තාහ. තෙනාව ඛො යං ත්වං සන්ධාය වදෙසි, ත්වං, තුඹ; යං සන්ධාය, යම් කරුණක් සඳහා; වදෙසි, (මා සමගිරස නැත්තෙකැයි) කියහි ද?, (තං, ඒ කාරණය,) නොව ඛො, (අප කෙරෙහි) විද්‍යමාන නොවේ. නිබ්භොගො, (නිබ්භොගො පරිභොගො එතස්මාති නිබ්භොගො) වයොවෘද්ධයන්ට කළමනා අභිවාදනාදියෙන් පහවූවෙක. අකිරියවාදො, කුල සිරිත් නොකියන්නෙක. වයොවෘද්ධා

දීන්ට අභිවාදනාදී කුල සිරිත් ලෝකයා කෙරෙති. භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි එය අවිද්‍යමානයයි චෝදනා කරයි. **උච්ඡේදවාදො,** (උච්ඡේදං වදතීති උච්ඡේදවාදො) ලෝකප්‍රවේණිය සිඳීම කියන්නෙක. මේ බ්‍රාහ්මණයා බුදුන් කෙරෙහි වෘද්ධයන්ට කළමනා අභිවාදනාදි ලෝක ප්‍රවේණිය නොදක්නේ මෙසේ චෝදනා කෙරෙයි.

**ජෙගුච්ඡී** (ජිගුච්ඡතීති සීලෙනාති ජෙගුච්ඡී) අභිවාදනාදිය පිළිකුල් කරන්නෙක. සර්වඥයන්වහන්සේ වෘද්ධයන්ට කළමනා අභිවාදනාදි කුල සිරිත් පිළිකුල් කරන්නෙකැයි හඟිමින් මෙසේ චෝදනා කෙරෙයි. **වෙනයිකො,** කුල සිරිත් නසන්නෙක. නොහොත් නිග්‍රහයට සුදුස්සෙක. විනයතීති විනයො, විනයො එව වෙනයිකො විනාශ කරන්නෙක යනාර්ථයි විනයං වා අරහතීති වෙනයිකො. නිග්‍රහකිරීමට සුදුස්සෙක යනාර්ථයි. **තපස්සී,** වෙහෙස කරවන්නෙක හෙවත් අනුන්ට දොම්නස් උපදවන්නෙක. වෘද්ධයන්ට කළමනා අභිවාදනාදිය නොකිරීමෙන් ඔහු වෙහෙසෙත්, කිපෙත්, දොම්නස් උපදවා ගණිත්; භාග්‍යවතුන්වහන්සේ ඔවුන් කෝපකරවන්නෙක, ඔවුන්ට දොම්නස් උපදවන්නෙකැයි චෝදනා කෙරෙයි. **අපගබ්භො;** (ගබ්භතො අපගතො'ති අපගබ්භො; හීනො ගබ්භො අස්සාති වා අපගබ්භො) යහපත් ප්‍රතිසන්ධිය නැතිකරන්නෙක, නොහොත් හීනවූ ප්‍රතිසන්ධිය ඇත්තෙක; වෘද්ධයන්ට කළමනා අභිවාදනාදියෙන් දෙව් ලොව ප්‍රතිසන්ධිය ලැබෙන බවද, එය නොකිරීමෙන් හීනවූ ප්‍රතිසන්ධිය ලැබෙන බව ද, සලකා භාග්‍යවතුන්වහන්සේට දෙව් ලොව ප්‍රතිසන්ධියක් නැතැ යනු බමුණාගේ අභිප්‍රායයි. **ගබ්භසෙය්‍යා,** මවුකුස විසීම, මෙයින් ජලාබුජ යොනිය කියවේ. **පුනබ්භවාභිනිබ්බත්ති,** නැවත භවයක ඉපදීම; මෙයින් සෙසු අණ්ඩජ, සංසේදජ, ඕපපාතික යන යෝනි තුණ කියවේ.

**අණ්ඩානි,** බිජුවට, **නානස්සු** (නානි + අස්සු) නානි = පෙ = පරිභාවිතානි අස්සු'යි සම්බන්ධ කරණු. "අස්සු" යනු අස භූමි ධාතුහුගේ සත්තමී විභක්ති ප්‍රථම පුරුෂ බහුවචනයි. **සම්මා අධිසයිතානි;** මනාකොට මතුයෙහි හෝනා ලද්දාහු. (අධි + සී, සයෙ ධාතුයි); **සම්මා පරිසෙදිතානි,** (පරි + සිද මොචනෙ) සිය සිරුරේ උණුසුමින් මනාකොට උණුසුම් කරණ ලද්දාහු; **සම්මා පරිභාවිතානි** (පරි + භූ, සත්තායං), මනාකොට කුකුළුගඳ ගන්වන ලද්දාහු; **අස්සු,** වන්නාහු ද; **කුක්කුටච්ඡාපකානං,** කුකුළුපැටවුන් අතුරෙන්; **යො,** යම් පැටවෙක්; **පාදනඛසිඛාය වා,** පාතිය අගින් හෝ; **මුඛතුණ්ඩකෙන වා,** මුවතුඩින් හෝ; **අණ්ඩකොසං,** බිජුකටුව; **පදාලෙත්වා,** පළාගෙණ; **සොත්ථිනා,** සුවසේ, **අභිනිබ්බිජ්ජෙය්‍ය,** නික්මෙන්නේ ද; **අවිජ්ජාගතාය,** අවිද්‍යාවෙන් යුක්තවූ; **අණ්ඩභූතාය,** (අවිද්‍යා නමැති) බිජුවටින් හටගත්; **පජාය,** ප්‍රජාව අතුරෙන්; **අවිජ්ජණ්ඩකොසං,** අවිද්‍යා නමැති බිජුකටුව; **එකොව,** හුදකලාවූයේ ම; අවිද්‍යා යනු බුද්ධ, ධම්ම, සඞ්ඝ, සික්ඛා, පුබ්බන්ත, අපරන්ත, පුබ්බන්තාපරන්ත, ඉදප්පච්චයතා පටිච්චසමුප්පාද යන අට තන්හි නොදැනීමයි. **ආරද්ධං** (ආ + රභ, හිංසාකරණවායාමෙසු) දුඃඛවශයෙන්

පටන්ගන්නාලදී. **අසල්ලීනං** (අසං + ලීනං) (පටන්ගන්නාලද හෙයින්ම) නොහැකිවූයේය, **උපට්ඨිතා** (උප + ඨා) එළඹසිටියා හෙවත් ඉදිරිපත් වූවාය; **අසම්මුට්ඨා**, (එළඹ සිටි බැවින් ම) නුමුළා වූවාය; **කායො**, නාම-රූප කායද්වය; **පස්සද්ධො**, බර ඇරුණේය; **අසාරද්ධො**, (බර ඇරුණු බැවින්ම) පහවූ කෙලෙස් දරථ ඇත්තේය; **සමාහිතං**, සමාධියෙහි මනාකොට පිහිටියේය. **එකග්ගං**, (මනාකොට පිහිටිහෙයින්ම) එකඟ විය. මෙපමණකින් ධ්‍යානයෙහි පූර්වභාගප්‍රතිපදාව කියනලදී. **කාමෙහි**, කාමවස්තූන්ගෙන්; **විවිච්චෙව**, (විපුබ්බ විච, විවෙචනෙ පූර්වක්‍රියා යි, විවිච්ච + එව යනු විසන්ධියි.) වෙන්වම; **අකුසලෙහි**, අකුසලයන්ගෙන්; (කෙලශකාමයන්ගෙන් වෙන්ව) **සවිතක්කං**, විතර්කසහිතවූ, විතර්ක නම් අරමුණට සිත නැඟීමයි. **සවිචාරං**, විචාරසහිතවූ; විචාරනම් අරමුණ පිරිමැදීමයි. **විවෙකජං**, විවෙකයෙන් හටගත්; මෙහි 'විවෙක' යනු නීවරණයන්ගෙන් පහවීමයි. **පීතිසුඛං**, ප්‍රීතිය හා සැපය ඇති; මෙහි ප්‍රීතියනම් ඉටු අරමුණු ලැබීමෙන් සතුටුවීමයි. සැප නම් ඉටු අරමුණෙහි රස විඳීමයි. **වූපසමා**; (වි + උප + සමු, උපසමෙ) සන්සිඳීමෙන්; **අජ්ඣත්තං**, (අධි + අත්තං) තමා සන්තානයෙහි හටගත්; **එකොදිභාවං**, චිත්තයාගේ ශ්‍රෙෂ්ඨබව හෝ එකඟ බැව් ඇති; එකොඋදෙතීති එකොදි; විතර්ක විචාරයන්ගෙන් වෙන්වූ හෙයින් ශ්‍රෙෂ්ඨව උදාවෙයි යනාර්ථයි. නොහොත් 'සම්පයුත්තධම්මෙ උදයතීති උදි, සම්ප්‍රයුක්ත ධර්මයන් නැඟිටුවයි යන අර්ථයි. එකොච සො උදිචාති එකොදි, "එකොදි" නම් සමාධිය යි. **විරාගා**, සමතික්‍රමණයෙන්, **උපෙක්ඛකොච**, උපෙක්ෂා ඇත්තේද; මෙහි මධ්‍යස්ථතා ලක්ෂණ ධ්‍යානොපෙක්ෂාව ගන්නේය. **විහාසිං** (වි + හර, අජ්ජතනී- ඉං, රහට ලොප් හා සකාරාගමද වී සිද්ධයි.) වාසය කෙළෙමි. **සතො**, සිහිඇත්තේ; සරතීති සතො, සරණං වා සති, සතිඅස්ස අත්ථීති සතො. **සම්පජානො**, සම්‍යක්ප්‍රඥාවෙන් යුක්තවූයේ; **පටිසංවෙදෙසිං**, වින්දෙමි. (පටි + සං + විද-ලාභෙ, අතීත) **සති පාරිසුද්ධිං**, තත්‍රමධ්‍යස්ථ උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති;

**සමාහිතෙ**, (සං + අ පුබ්බ ධා ධාරණෙ) චතුර්ථධ්‍යාන සමාධියෙන් සමාධිගතවූකල්හි; **පරිසුද්ධෙ**, උපෙක්ෂා ස්මෘති පරිශුද්ධියෙන් පිරිසිදුවූ කල්හි; "චිත්තෙ සමාහිතෙ, චිත්තෙ පරිසුද්ධෙ" යනාදින් යොදගත යුතුයි. **පරියොදාතෙ**, ප්‍රභාස්වරවූකල්හි; **අනඞ්ගණෙ**, පහවූ රාගාදි අඞ්ගණ ඇතිකල්හි. (සිත අපිරිසිදුකරණ හෙයින් රාගාදීහු අඞ්ගණ නම් වෙත්.) **විගතූපක්කිලෙසෙ**, (අඞ්ගණරහිතබැවින්ම) පහවූ උපක්ලේශ ඇතිකල්හි; **මුදුභූතෙ**, මෘදුවූකල්හි; වසීභාවයට පැමිණි සිත මෘදු වේ. **කම්මනියෙ ඨිතෙ**, විකුර්වණාදි කර්මයට සුදුසුව සිටිකල්හි; **ආනෙඤ්ජප්පත්තෙ**, අචංචල වූ කල්හි; (ශ්‍රද්ධාදියෙන් සිත හාත්පස අල්වාගත් කල්හි චංචල නොවේ.) **පුබ්බෙනිවාසානුස්සතිඤාණාය**, පෙරවිසූ කඳපිළිවෙළ සිහිකිරීම් නුවණ පිණිස; **අභිනින්නාමෙසිං**, අභි + නි + නම නමනෙ, ප්‍රයොජක අතීත කර්තෘ කාරක උත්තම පුරුෂ

එකමවන ක්‍රියාසි) නැමූයෙමි. අනෙකවිහිතං, නන්වැදෑරුම්වූ; අනෙකෙපි සංවට්ටකප්පෙ, නොයෙක් සංවර්තකල්පයන් හෙවත් ප්‍රලය කාලයන්ද; (විනාශවන කල්පය සංවට්ටකප්ප නම්. නැවත වැඩෙන කාලය විවට්ටකප්ප නම්) අමුත්‍රාසිං, අමුත්‍ර + ආසිං, අමුත්‍ර එවංනාමො ආසිං, එවංගොත්තො ආසිං යනාදීන් සම්බන්ධ කටයුතුයි. අමුත්‍ර, අසවල්තැන. එවං නාමො ආසිං, මෙනම් ඇත්තෙක් වීමි; එවමායුපරියන්තො, මෙනම් ආයුෂයක් කෙළවර කොට ඇත්තෙක්; (ආසිං, වීමි.) ඉති, මේ ප්‍රකාරයෙන්; මෙහි 'ඉති' ශබ්දය ප්‍රකාරාර්ථයි. සාකාරං, වර්ණ සංස්ථානාදිවශයෙන් ආකාරසහිත වූ; සඋද්දෙසං, නාමගොත්‍රාදිවශයෙන් උදෙසීම්සහිතවූ; පඨමා විජ්ජා, පළමුවන පූර්වේනිවාසානුස්මෘති ඥානය; අධිගතා, ලබනලදී. විහතා, නසනලදී. (වි + හන, හිංසායං). පඨමාභිනිබ්භිදා, පළමුනික්මීම. (පූර්වේනිවාසානුස්මෘතිඥානනමැති මුවතුඩින් පෙර විසූ කඳපිළිවෙළ වසා ගෙණසිටි අවිද්‍යා නැමැති බිජුකටුව පළාගෙණ පළමු නික්මීම විය යනු විස්තරාර්ථයි.) චුතූපපාතඤාණාය, චුති උත්පත්ති දෙක දැනීම පිණිස; අතික්කන්තමානුසකෙන, මිනිස් ඇස ඉක්ම පැවැත්තාවූ; චවමානෙ, චුත වන්නාවූ; අරියානං, බුදු පසේබුදුරහත් ආදීන්ට; උපවාදකා, ආක්‍රොශ පරිභව කරන්නාවූ; දුතියා විජ්ජා, දෙවන චුතූපපාත ඥානය; ආසවානං, ආශ්‍රවයන්ගේ; ඛයඤාණාය, ක්ෂය කරණ ඥානය හෙවත් අර්හන්මාර්ග ඥානය පිණිසය; අබ්භඤ්ඤාසිං, (අභි + අඤ්ඤාසිං) දැනගතිමි.

ජානතො, දන්නාවූ; පස්සතො, දක්නාවූ; භාගො මෙ, ඒ මාගේ; (ජානතො පස්සතො යන්නෙහන් විදර්ශනාවෙන් යුක්ත කොට පැමිණි මාර්ගය කියනලදී.) විමුච්චිත්ථ, මිදුනේය. (විමුච මුච, මොචනෙ.) විමුත්තස්මිං, මිදුනුකල්හි; විමුත්තං ඉති, මිදුනේයයි; ඤාණං අහොසි, ප්‍රත්‍යවෙක්ෂා ඥානය පහළ විය. වුසිතං, වැස නිමවිය; තතියා විජ්ජා, ආශ්‍රවක්ෂයකර ඥානසංඛ්‍යාත තුන්වැනි විද්‍යාව; අණ්ඩකොසම්හා, බිජුකටුවෙන්; කුක්කුටච්ඡාපකස්ස ඉව, කුකුළුපැටවාගේ නික්මීම මෙන්; ද්විහිතිකා, (ද්විධා පවත්තා ඊහිතිකා) දෙපරිද්දකින් පැවති ඉරියවු ඇති; භික්ෂාව ලබන්නෙමු දෝ නොලබන්නෙමුදෝ, මෙහි ජීවත්වන්ට හැක්කෙමුදෝ නොහැක්කෙමුදෝයි දෙපරිද්දෙකින් පැවති සිතිවිලි ඇතිහෙයින් 'ද්විහිතිකා'යි කීහු. නොහොත් ද්විහිතිකා, දුකසේ ජීවත්වියයුතු; "දුහිතිකා" යනු ද පාඨයි; සෙතට්ඨිකා, තන්හිතන්හි විසුරුණු සුදු මිනී ඇට ඇති; ආහාර නොලදින් මැරුණු දුගී මිනිසුන්ගේ ඇට ඒ ඒ තැන්වල විසිරීතිබෙනහෙයින් 'සෙතට්ඨිකා'යි කීහු. නොහොත් සෙතට්ඨිකා, (සෙතා අට්ඨි එතිස්සාති සෙතට්ඨිකා) සෙතට්ඨි නමැති රෝගය ඇති; ගැබ්ගන්නා කාලයෙහි ශස්‍යයන්ට සෙතකානම් රෝගය වැළඳේ. කිරි නොවැදුනු ධාන්‍ය ඇට ඇති සුදුවර්ණයෙන් යුක්ත වූ කරල් එහින් නික්මෙයි. සලාකාවුත්තා, (සලාකාය වුත්තජීවිතං එතිස්සාති= සලාකා වුත්තා) සලාකායෙන් ජීවිතවෘත්තිය පැවැත්වීම ඇති; (පදත්‍රයම 'දුබ්භික්ඛා' යන්නට විශෙෂණයි.) දුප්පතුන් ධාන්‍ය විකුණන්නා සමීපයට තල්පතක් ආදියෙහි ලියන ලද කුපම රැගෙණ ගොස්

පිළිවෙළින් සිට ධාන්‍ය මිලට ගෙණ, විත් ජීවත්වන හෙයින් 'සලාකා වුත්තා'යි කීහු. නොහොත් 'සලාකාවුත්තා' සලාක (ඉරටු) පමණක්ව හටගත් ශස්‍ය ඇති; වපුරණ කාලයෙහි මනාකොට භූමිය සකස්කොට ශස්‍ය වපුරණ ලද නමුත් ඵල නො හටගෙණ සලාක පමණක් නැගෙත්, එහෙයින් සලාකවුත්තාහයි කීහු. **දුබ්භික්ඛා**, දුර්භික්ෂයක්; **උඤ්ඡේන පග්ගහේන**, සිඟිම්පාත්‍රයෙන්. "පග්ගහ" නම් පාත්‍රය යි. පාත්‍රය ගෙණ භික්ෂාවෙහි හැසිරීමෙන් යනාඑයි. **යාපෙතුං**, යැපෙන්ට, ජීවත්වන්ට; **න සුකරා**, පහසු නොවේ. **උත්තරාහකා**, උත්තර පථයෙන් පැමිණි. උත්තරාපථතො ආගතා, උත්තරාපථෙ නිවාසො එතෙසං ති වා "උත්තරාපථකා" යි කියයුතුතැන නිරුක්ති ක්‍රමයෙන් 'උත්තරාහකා'යි සිද්ධයි. නොහොත් උත්තරාහකා විශිෂ්ට වූ බඩුරැගෙණ පැමිණියාවූ; උත්තර + ආහකායි පියස් කටයුතුයි. **අස්සවාණිජා**, අශ්වවෙළෙන්දෝ; **අස්සමණ්ඩලිකාසු**; අස්මඩුළුවල; 'අස්සමණ්ඩලිකා' යනු අසුන් දසදෙනෙකුන් වසන මඩුල්ලට නමෙකි. එබඳු මඩුලු පණයක් ඇතිහෙයින් බහුවචනයෙන් දක්වූහ. **පත්ථපත්ථපුලකං**, යවසහල් නැළිය නැළිය පමණ; **පඤ්ඤත්තං**, පණවන ලදි. නියම කරණලදි. පත්ථ නම් නැළියයි. 'පුලක'යනු පොතුහැර මනාකොට ශුද්ධකරගත් යවසහලට නමෙකි. එය එක් පුරුෂයකුගේ යැපීමට පමණි. අශ්වවාණිජයෝ භික්ෂූන් ආහාරයෙන් කලාන්තවන බැව් දැන යව නැළිය බැගින් භික්ෂූන්ට දීමට සම්මත කර ගත්හ. **උදුක්ඛලෙ**, වංගෙඩියෙහි ලා; **කොට්ටෙත්වා**, කොටා; **සිලායං**, ගලෙහි ලා; **පිංසිත්වා**, අඹරා; **උපනාමෙසි**, පිළිගැන්වීය. ඉතා මිතුකමින් වස්වැසීමට ආරාධනා කළ වෙරඤ්ජ බමුණා මාරාවේශයෙන් වැළැක් සිටි; එහෙයින් මේ කාලය තුළ බුදුරජානන් වහන්සේ සමග කිසිවෙකුගේ සාමීචි මාත්‍රයක් වත් නො වීය.

**අත්ථසංහිතං**, කාරණය ඇසුරු කළ; **අනත්ථසංහිතෙ**, අනර්ථය ඇසුරු කළ වචනය; **සෙතුඝාතො**, මාර්ගයෙන් නැසීම වෙයි. 'සෙතු' නම් අර්හන්මාර්ග යයි. තථාගතයෝ අර්හත්මාර්ගයෙහි දී අනර්ථනිශ්‍රිත වචනය නැසූහ. අනත්ථ සංහිතෙ යනු සාමීප්‍යඑයෙහි සප්තමියි. අනත්ථ සංහිතස්ස'යි අර්ථ ගතයුතුයි. **සප්පුරිසෙහි**, සත්පුරුෂවූ; **තුම්හෙහි** තොප විසින්; **විජිතං**, දුර්භික්ෂයද, ලෝභය ද, ඉච්ඡාචාරය ද, දිනන ලදී. කෙසේද? යත්, මේ කල දුර්භික්ෂය පවත්නේ වෙරඤ්ජාවෙහි පමණක, හාත්පස වූ ගම් නියම්ගම් සියල්ල ම සුභික්ෂය. බුදුරජානන් වහන්සේ මෙසේ කරදර වූ වස්වැසීමකට අප ද මෙහි කැඳවාගෙණ වැඩිසේක යි චින්තනමාත්‍රයකින් යුත් එක ද භික්ෂු නමක් මෙහි අවිද්‍යමානය. එහෙයින් තොප විසින් දුර්භික්ෂය දිනන ලදී. මේ වෙරඤ්ජාව දුර්භික්ෂය. හාත්පස වූ ගම් නියම්ගම් සියල්ල ම සුභික්ෂය. එහෙයින් වස්සච්ඡේදය කොට එහි පැමිණවත් වළඳමු යයි ලෝභ වසයෙන් සිතා රාත්‍රිච්ඡේදයවත් වස්සච්ඡේදය වත් කළ එක ද භික්ෂුවක් මෙහි නැත. එහෙයින් ලෝභය දිනන ලදී. මේ වෙරඤ්ජාව ද

දුර්භික්ෂය. මෙහි වැසියෝ දෙතුන් මසක් විසූ අප ද නොහඳුනති. එහෙයින් අපි "මේ භික්ෂුව ධ්‍යානලාභීය, මේ භික්ෂුව ෂඩභිඥලාභීය" යනාදි වශයෙන් ප්‍රකාශකොට ඔවු නොවූත්ගේ ගුණ කීකොට ගෙණ තා පණ රැක පසුව සිල් රැක ගණිමු" යි සිතූ එක ද භික්ෂුවක් මෙහි නැත. එසේ හෙයින් භොප මිසින් ඉච්ඡාචාරය දිනන ලදී.

සාලිමංසොදනං— මසින් යුත් හැල් සහලින් සම්පාදනය කරණ ලද බත; නොයෙක් සහලින් කරණලද නෑම වශී හා මසින් යුත් බත; අභිහරිස්සන්ති. අවමන් කරන්නේය; අති පූජ් මහ ස‍ඤ්ඤෙ ධාතුයි. ඝටඛිමංසලං, යට තලය (යටපැත්ත) සමසනයං, මිහිරි රසය; සම්පන්න ශබ්දය පරිපූර්ණ, සමඬි, මධුර යන අර්ථත්‍රයක වැටෙතුදු මෙහි මධුරාර්ථය ගත යුතුයි. අනීලකං, මැස්සන් නැති හෙයින් නිදොස් වූ; ඛුද්දක මධුං; කුඩා මැස්සන් විසින් කළ මීවදයක්; කුඩා මැස්සන් විසින් කළ මීවදය මැස්සන් නැත්තේ ඉතා මිහිරි වෙයි. රසයෙන් හැම මීම ජය ගණී. මෙහි ඛුද්දක මධු නම් දඹුවැල් මීයයි. පප්පටකොජං. පෘථිවි මණ්ඩය; පොළොවෙහි යට පැත්තෙහි හටගත් කෑදීම පටලයක් බඳු ඉතා මිහිරි රසින් යුත් මණ්ඩය පප්පටකොජ නම්.

ශෛ පක්ඛී නිසසිකා පාණා ගො කාණ සංඝා ඉඹසසාමි, මෙසේ භාසනකලයෙහි මිනිස් අම්නිස් තිරිසන් ගතයන් හැසිරෙණ කල්හි මුගලන් මහතෙරුන්ට අනාමංශ දෙෂය නො වන්නේ ද යත්; අනාද්‍රතාහි භිකඛවෙ ඉද්ධිමතො ඉද්ධිවිසයෙ යනු වදාළහෙයින් නොවන්නේ ය. විපල්ලාසම්පි සතතා පටිලභෙසසුං, සත්වයෝ වරදවා ද සිතත්; කෙසේද? යත්, මේ අපේ පෘථිවිය ද නොහොත් අනිකක් ද, මේ අපගේ ගම ද? නැතහොත් අන්ගමක් ද? වරදවා මෙසේ සිතීම නො වෙයි. ඍද්ධිමතුන්ගේ ඍද්ධිවිෂය අචින්ත්‍යය ය. ලැබියයුත්තේ මෙසේ විපර්‍යාසයක. එනම් මෙ වැනි දුර්භික්‍ෂ සිදුවන්නේ දුත් පමණක් නො වෙයි. අනාගතයෙහි ද සිදු වන්නේ ය. එකල භික්ෂූහු මෙ වැනි ඍද්ධිමත් භික්ෂුවක කෙසේ ලබද්ද? ඒ භික්ෂූහු සෝවාන් ආදි මාර්ගඵල ලාභී භික්ෂූන් වුවත් ඍද්ධිමත් නො වන හෙයින් පරකුලයන් කරා පිඬු පිණිස හැසිරෙන්නාහුය. එකල මිනිසුන්ට මෙ වැනි විපරීත අදහසක් ද වන්නේය. "බුද්ධකාලයෙහි භික්ෂූහු සිකපද පිළිපදින්නෝ වූහ. උන්වහන්සේ ඍද්ධිය උපදවා පෘථිවිය පෙරළා පප්පටකොජ නම් පෘථිවිසාරමණ්ඩය අනුභව කළාහුය. මෙකල ශික්ෂාපද පරිපූරකාරී භික්ෂූහු නැත්තාහ. ඉදින් වත්නාහු නම් එසේම කරන්නාහුය. එහෙයින් අපට අයත් අමු හෝ පැසුනු හෝ යමක් අනුභව කරන්ට නොදෙමු. මොවුන් අතුරෙහි කිසියම් ආර්‍යපුද්ගලයෙක් ද නැතැ"යි මෙ වැනි විපර්‍යාසයකට වැටෙන්නාහුය. එසේ වරදවා ගැණිම් හෙතුවෙන් ආර්‍යොපවාද කර්මය කොට අපායෙහි වැටෙන්නාහුය යනුයි.

පවිසලලිනසස— නොයෙක් අරමුණු කරා සිත නො විසිරී ගියහුගේ හෙවත් චිත්තවිවෙකයෙන් යුක්තවූවහුගේ; චිරං— කාලාපෙක්ෂක අත්‍යන්තසංයෝගයෙහි ඊතියා විභක්තියි. කිලාසුභො— අලසකම නිසා

නොව ප්‍රයෝජනය මඳකමින් උත්සාහරහිත වූවෝ විපස්සී බුදුරදුන්ගේ ආයුෂ අවුරුදු අසූදහසකි. සිඛී බුදුන්ගේ හැත්තෑ දහසකි. වෙස්සභූ බුදුන්ගේ සැට දහසකි. කකුසඳ බුදුන්ගේ සතළිස් දහසකි. **ආසවට්ඨානීයා ධම්මා**, ආසවා තිට්ඨන්ති එතෙසු= 'ආසවට්ඨානීයා' මෙහි 'අනීය' ප්‍රත්‍යය ආධාරකාරකයෙහිය. ආසවට්ඨානීය ධර්ම නම් ඉහාත්මභාව වශයෙන් පරූපවාදාදියයි. සම්පරායික වශයෙන් අපායදුඃඛ විශෙෂයෝයි. **රත්තඤ්ඤුමහත්තං**= පැවිදි වී කල් වයස් ගතවූවෝ රත්තඤ්ඤු නම්. ස්ථවිර භික්ෂූන්ගේ අධික බව මෙයින් හඟවයි. **වෙපුල්ලමහත්තං**– ස්ථවිර මජ්ඣිම නවක භික්ෂූන්ගේ බහුල භාවයයි. සඞ්ඝයා බහුලකල්හි ශික්ෂාවන් පැණවීමට කරුණු ඇතිවෙත් යයි සේයි. **ලාභග්ගමහත්තං** සංඝයා ලාභයෙන් ශ්‍රෙෂ්ඨත්වයට ද, අග්‍රත්වයට ද පැමිණි බව; භික්ෂූන් චීවරාදි ලාභයෙන් අගතැන් පැමිණි කල්හි ශික්ෂා පැණවීමට කරුණු ඇති වෙත්. **බාහුසච්චමහත්තං**, බහුශ්‍රැත භික්ෂූන්ගේ බහුල භාවය; **නිරබ්බුදො**– 'අබ්බුද' නම් සොරුයි. දුඃශීල භික්ෂූහු ද චෞර සඞ්ඛ්‍යාවට ගැණෙත්. අශ්‍රමණ ව සිට ශ්‍රමණයෙකැයි හඟවා නියම ශ්‍රමණයන් වහන්සේට අයත් වූ, තමන්ට අයිති නැති සිවුපසය සොර කම් කර පරිභොග කරණ බැවිනි. නිඃචෞරය, දුඃශීල විරහිතය යන අර්ථයි. **නිරාදීනවො**, දුඃශීලාදිනවයෙන් විරහිතය. **අපගතකාලකො**, 'කාලක' නම් දුඃශීලයෝය. ඔවුහු පැහැයෙන් රන්වන් වුවත් කෘෂ්ණ ධර්මයන්ට අනුව පවත්නා හෙයින් කාලකයෝ ම ය. එබන්දෝ නොමැත්තාහ. යන අර්ථයි. **සුද්ධො**, අපගත කාලක හෙයින් ම පරිශුද්ධය.

**සාරෙපතිට්ඨිතො**, සීල, සමාධි, පඤ්ඤා, විමුත්ති, විමුත්තිඤාණ දස්සන යන මේ පස්වැදෑරුම් ධර්ම සාර නම්. සඞ්ඝතෙමේ ඒ පඤ්චවිධ සාරධර්මයන්හි පිහිටියේ වෙයි. **සොතාපන්නො**, 'සොත' නම් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග යයි. ඒ සොත සඞ්ඛ්‍යාත ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙන් යුක්ත තැනැත්තා සොතාපන්න නම්. මාර්ගය නිසා ඵලය ද ඒ නම ලබයි. එබැවින් ඵලයෙන් යුක්ත පුද්ගලයා ද සොතාපන්න නම්. **අවිනිපාතධම්මො**, අපායෙහි නො වැටෙන ගතිය ඇත්තෙකි. මෙහි 'ධම්ම' ශබ්දය සභාව වාචීය. **නියතො**, භවාන්තර සතක් ඇතුළත නියම වශයෙන් සිදුවන සක්ඛපරි නිර්වාණය ඇත්තෙක. **සම්බොධිපරායණො**, අතික් තුන් මගට ද අවශ්‍යයෙන් පැමිණෙන්නෙක. හෙවත් ලොකොත්තර ධර්මය අනුව ගිය සවභාව ඇත්තෙක. **ආචිණ්ණං**, සිරිතකි. බුදුහු යම් කෙනෙකුගේ අයැදුමකින් වස් වුසු සේක් නම් ඔහුට නො දන්වා ජනපදචාරිකාවෙහි නො හැසිරෙත්. සව්වෝ එසේ දන්වාද නො දන්වා ද වඩිති. **දෙය්‍යධම්මො**, දිය යුතු දෙය; දවස් පතා උදය කැඳ හා කැවිලි ද, මධ්‍යාහ්ණයෙහි වැළඳිය යුතු දෑ ද, හවස් කාලයෙහි නන්වැදෑරුම් පානීය වර්ග ද, එසේම ගඳමල් සුවඳ ආදි පූජා සත්කාර ද යන මේ දෑ, වස් ආරාධනා කළ පින්වතා විසින් ඒ තෙමස මුළුල්ලෙහි වස් එළඹි භික්ෂූන්ට කටයුතුයි. **තං ච ඛො නො**

අසන්තං, ඒ දෙය්‍යධර්ම ය නැත්තේ ද නො වේ. අප ළඟ නුඹවහන්සේලාට දියයුතු දෙය නැත්තේ ද නොවෙයි යන අදහසයි. ඔනීතපත්තපාණිං, පාත්‍රයෙන් යත් අත් ඇති හෙයින් වළඳා අවසන් වූ; සොරෙය්‍යං, මෙය ගඞ්ගානදීතීරයෙහි ප්‍රයාගයට ආසන්නව පිහිටි වංසරටට අයත් නගරයකි. සඞ්කස්සං; සැවැත් නුවරට යොදුන් තිහක් ඈතින් පිහිටියේය. තව්තිසා දෙව්ලොවින් බස්නා බුදුරජනන් වහන්සේ ප්‍රථමකොට මේ නගරයට වැඩිසේක. කණ්ණකුජ්ජං, සොරෙය්‍ය නගරසන්නයෙහි පිහිටි නුවරකි. පයාගපතිට්ඨානං, ගඞ්ගා නදීතීරයෙහි සොරෙය්‍ය නගරය ආසන්නයෙහි ම පිහිටියේ ය. බාරාණසිං, දඹදිව සොළොස් මහා නගරයන්ට අයත් වූ මේ නගරය කසීරටේ අගනුවරයි. ගඞ්ගානදිය ආසන්නයෙහි පිහිටියේ ය. වරණා- අසි යන දෙ නදීන් අතර ඉදිකළ හෙයින් මෙය බාරාණසී නම් වීය. මෙහි සිට ජය ශ්‍රී මහා බෝමැඩට දුර ගවු අටළොසකි. වෙසාලි, වජ්ජිරටෙහි අගනුවරය. රජගහනුවර සිට මේ නගරයට යොදුන් අටකි. ගඞ්ගා නම් නදියේ සිට යොදුන් තුනකි.

වෙරඤ්ජ කථා නිමි.

---

සඞ්ඛලිඛිතං, ගටා සෝදන ලද සකක් වැනි වූ; කෙසමස්සුං, මෙහි මස්සු' යන්නට උඩුරැවුල ද අයත් වේ. අච්ඡාදෙත්වා, ඇඳ පොරවා; අනගාරියං, අගාරයට හිත වූ කෘෂිවණික් ඈදිය අගාරිය නම්. පැවිද්දෙහි එය නොමැති බැවින් පැවිද්ද අනගාරිය නම්. සුඛෙධිතො, සුවයෙන් වැඩුනේ; සුඛපරිහතො, සැපසේ පරිහරණය කරණ ලද්දේ; උපන් තැන් පටන් කිරිමවුන් විසින් ඇකයෙන් ඇකයට වඩා ගනිමින් ඇත් අස් රිය ආදි කෙළිබඩුවලින් නළවමින්, මිකිරි රස බොජුන් වළඳමින් මනාව පරිහරණය කරණ ලද්දේය. අනන්තරිකාය, (තලාල් ආදිය කින්) ඇතිරීමක් නොමැති; ආරඤ්ඤිකො, ගම් සෙනසුන් හැර ආරඤ්ඤකධුතාඞ්ගය සමාදන්ව අරණ්‍යයෙහිම වසන භික්ෂු තෙමේ; පිණ්ඩපාතිකො, (සඞ්ඝභත්ත උද්දෙසභත්ත- නිමන්තන- සලාක- පක්ඛික- උපොසථික- පාටිපදික- ආගන්තුක- ගමික- ගිලාන- ගිලානුපට්ඨාක- විහාර-ධුර-වාර යන බත් තුදුස හැර) පිණ්ඩපාතිකධුතාඞ්ගය සමාදන්ව වසන්නෙක්) පංසුකූලිකො- (ගෘහපති චීවරය ප්‍රතික්ෂෙප කොට) පංසුකූලික වශයෙන් ලැබුනු සිවුරු දරන්නෙක්; සපදානචාරිකො- (තෘෂ්ණාවෙන් වෙන්ව) ගෙපිළිවළින් පිඬුසිඟන භික්ෂුව; වජ්ජී- විසල් පුරය මෙහි අගනුවරය.

අඩ්ඪා- (පංචකාම ගුණ සඞ්ඛ්‍යාත උපභොගයන්ගේ ද හස්ති- අශ්ව- රථ- සත්‍රී ආදි පරිභොගවස්තූන්ගේ ද මහත් බැවින්) ආඪ්‍ය වූ; මහද්ධනා- (නිදන් කොට තබන ලද ධනය මහත් හෙයින්) මහත් වූ ධනය ඇති; පහූතවිත්තූපකරණා- පිඩු පිඩු වශයෙන් ද සුවණ්ණ රජත මාසක වශයෙන් ද මහත් වූ ජාතරූපරජතයන්ගෙන් යුක්ත වූ; පහූතධනධඤ්ඤා- ගණුදෙනුවට යොග්‍යවූ බොහෝ ධනධාන්‍ය ඇත්

තාවූ; **ථාලිපාකෙ**- බත්සැළි; එක් සැළියක බත් පිසුනත් දස නමකට සෑහේ. **ඤාතිදාසී**- නෑයෙකු වැනි දසියක්; **ආභිදොසිකං කුම්මාසං**- ('දොස' නම් රාත්‍රියයි. 'අභිදොස' නම් පච්චූෂ කාලයයි. අභිදොසං අතික්කන්තො- ආභිදොසිකං, එක් රැයක් පසුවූ හෙයින්) පිලුත් වූ යව රොටියක්; **ඡඩ්ඩෙතුකාමා**- (යටත්පිරිසෙයින් දසකම්කරුවන්ගේ වත් ගවාශ්වාදීන්ගේවත් කෑමට නුසුදුසු හෙයින්) ඉවත ලනු කැමැත්තී; **ඡඩ්ඩනීය ධම්මං ඉධ මෙ පත්තෙ ආකිර**–මෙහි 'ඡඩ්ඩනීය ධම්මං' යන්න විසදෘශතිදොසය දුරු කරයි. හිමියන්ට අකාලය දෙයක් ඉල්ලා ගැනීම දෙශනාවද්‍ය නොවන හෙයිනි. **හත්ථානං**- මණිබන්ධය පටන් දෙ අත්හිඳ; **යග්ඝෙ**, ආරොචනාර්ථයෙහි නිපාතයකි. **ජෙ**- දසී, ආමන්ත්‍රණාර්ථයෙහි නිපාතයකි. **කුඩ්ඩමූලං**- බිත්තිමුල, එකල සියලු දනපතීන්ගේ ගෘහවලම ආගන්තුක භික්ෂූන් උදෙසා තිබී පණවන ලද අසුන් ඇති ශාලා වූහ. පැවිද්දෝ පිඩු පිණිස ගෙණ එහි පැමිණ හිඳ වළඳත්. යාචකයන් මෙන් නො සරුප් තැන්වල හිඳ නො වළඳත්. **පුකිසො**- ඉතා නූස් නොමිටි මධ්‍යම පුරුෂයෙක් ගැණේ. **තිරොකරණීයං**- කඩ තුරුවෙන්; රෙදිවලින් වට කොට සාදන ලද පවුරකින්; 'තිරොකරණීයං' යනු කරණාර්ථයෙහි ආධාර විභක්තියි. **පුබ්බණ්හසමයං**- පෙරවරුකල සුදින්නය තුඹට දනය සූදනම්ය. මේ ඊට සුදුසු කාලයයි. ගෙදරින් නියම කළ වේලාවය. **මාතිකං**- මවුපරපුරට අයත් ධනය; මුත්තනිය දිග එන කල්හි දෑවැද්ද වශයෙන් ගෙණෑ ධන යයි. **ඉත්ථිකාය ඉත්ථි ධනං**- මෙය ස්ත්‍රීන්ගේ දෛනික පරිභොග වූ නහනීය සුණු ආදිය ගැණීම පිණිස පරිත්‍යාග කරණ ලද ධන යයි. **පිතාමහං**- පිය පරපුරට අයත් ධනය; පිතා මහතො ආගතං- 'පෙතාමහං' යි වියයුතු තැන වෘද්ධි නොවී 'පිතාමහං' යි වීය. **නාංකිකාඩෙඩ්යාසි**–නො කිපෙන්නෙහි නම්; **ඔභාවකෙ**- විසල්පුරය පටන් හිමාලය තෙක් පැතිර සිටි වන යයි. **බීජකං**- කුලවංශය ආරක්‍ෂා කිරීම පිණිස බීජයක් වැනි වූ පුත්‍රයෙකු; **සාපතෙය්‍යං**- 'සං' යනු ධන යයි; ඒ ධනයට අධිපතියා 'සංපති= සපති' නමි. සපතිනො ඉදං– සාපතෙය්‍යං, වස්තුවයි; **එසං ඛො මෙ අම්ම සකානා සාතුං**- සුදින්න සිටුවර තෙමේ මෙසේ සිතිය. එනම්, මේ ධනයට එකම හිමියා මම වෙමි. ඔවුහු ඒ ධනය ආරක්‍ෂා කරන්ට යයි කියමින් නිතරම මා කරා පැමිණ මට කරදර කරත්. එහෙයින් විවේකීව මට මහණදම් පුරන්ට ද නො හැකිය. පුත්‍රයෙකු ඇති කල ඔවුහු එයින් සතුටු වෙති. එකල මටද කැමැතිසේ මහණදම් කට හැකිය. යනුයි) **පුප්ඵං**- ඍතු කාලයෙහි ස්ත්‍රීන්ට ඇතිවන ලෙයට මේ නමකි. ඍතුකාලයෙහි මාගමුන්ගේ ගර්භාශයයෙහි රක්තවර්ණ බුබුළු ගෙණ වැඩී සත්දවසකින් බිඳීයෙත්. ඉන්පසු රුධිරවහනය පටන් ගණී. එසේ වැගිරෙණ ලෙය පුප්ඵ නමි. මෙසේ ලේ වැගිරගිය කල්හි ඇතිවන ප්‍රතිසන්ධිය ස්ථිර වෙයි. **පුප්ඵංසා**- (පුප්ඵං අස්සා යි නිගෘහීතයා කෙරෙන් අකාර ලොපව සිද්ධයි. **ආදීනවඤ්ඤෙය්‍යො**- (වරං තෙ මොඝ පුරිස ආසිවිසස්ස ඝොරවිසස්ස මුඛෙ අංගජාතං පක්ඛිත්තං, නත්වෙව මාතුගාමස්ස අඞ්ගජාතෙ අඞ්ගජාතං පක්ඛිත්තං"යි ආදි වශයෙන් වදාළ)

ආදීනවය නො දන්නේ; **ඉතිහ**– 'එවං' යන්නෙහි අර්ථ ඇති නිපාත පදයකි. **මුහුමෙසාන**– යනු 'ඛණෙන' යන්නට පර්‍යාය නාමයකි. **අලාභා වත මෙ**– ධ්‍යානාදි ගුණයන්ගේ නො ලැබීමයි. **න වත මෙ ලාභා**– මා විසින් ලබන ලද පැවිද්ද, එසේම සරණාගමනයසික්ඛාපද සමාදානය යනාදි ගුණයෝ ද මට ලාභයෝ නුවූහ. කුමක් හෙයින් ද? යත්; මෙවුන් දමින් කිලුටු වූ බැවිනි. **දුල්ලභං වත මෙ**– ලැබූ ශාසනය ද මට දුර්ලභ විය. **උප්පණ්ඩුප්පණ්ඩුක ජාතො**– පඬුවන් පැහැ ඇති වූයේ (ඉදී රත්පැහැය වූ පත්‍රයක් මෙන්) සුදුමැලි වූයේ, **ධමනිසන්ථත ගත්තො**– නහර වැල් මතුවූ සිරුරු ඇත්තේ; මස් ලේ වියලි ගිය බැවින් නහරවැලින්ම වෙලූනාක් වැනි සිරුරු ඇත්තේ; **අනත්තමනො**– නිතරම ශෝක කිරීම් හෙතුවෙන් ලය ඇතුලෙහිම සැඟවුනු සිත් ඇත්තේ; **ලීනමනො**– උදෙසීම්හි ද, පිළිවිසීම්හි ද, අධිසීල අධිචිත්ත අධි ප්‍රඥා පිණිස වත් පිළිවෙත් පිරීමෙහිද, දුරුකරණලද ව්‍යායාම ඇත්තේ; කුසීත වසයෙන් හැකුළුනු සිත් ඇත්තේ; **පජ්ඣායි**– පපුබ්බඛෙඩ විත්තායං (කඳ බිඳුනු කොටඋවෙකු මෙන්) සිතිවිලි සිතන්ට විය. **අජ්ජ මෙ පාපං කම්මං කතං**– මා විසින් කරණ ලද එක් පාපකර්මයක් හැම කල්හි අභිමුඛව සිටියි. **විසංයොගාය**– කෙලශයන්ගෙන් වෙන්වීම පිණිස; **අනුපාදාය**– කෙලශයන් වශයෙන් හෝ තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නො ගැණීම පිණිස; **රාගවිරාගාය**– යම් තැනකට පැමිණීමෙන් රාගය සමුච්ඡින්න වේද ඒ රාගවිරාග නම් නිර්වාණය පිණිස; **මදනිම්මදනාය**– යම් තැනකට පැමිණීමෙන් මාන මද පුරුෂමදාදිය සහමුලින් මැකසේ ද ඒ මදනිම්මද නම් නිර්වාණය පිණිස; ආදි ශබ්දයෙන් බලමද යෞවනමද ගත යුතුයි. **පිපාසවිනයාය**– යම් තැනකට පැමිණීමෙන් කාම පිපාසයෝ සංසිඳෙද් ද, ඒ පිපාසවිනය නම් නිවණ පිණිස; **ආලය සමුග්ඝාතාය**– යම් තැනකට පැමිණීමෙන් පංචකාම තෘෂ්ණා ආලයෝ මුල් සිඳී යෙද් ද ඒ ආලය සමුග්ඝාත සංඛ්‍යාත නිවණ පිණිස; **වට්ටූපච්ඡෙදාය**– (කම්මවට්ට කෙලෙස්වට්ට විවට්ට යන ත්‍රෛභූමික වෘත්තයන්ගේ සංසිඳීම යයි කියන ලද නිවණ පිණිස; **කාමානං පහානං**– වස්තු කාම කෙලශකාමයන්ගේ ප්‍රහාණය; **පරිඤ්ඤා**– ත්‍රිවිධයි. ලක්ඛණ රසාදීන්ගේ වශයෙන් නාමරූපයන්ගේ පරිග්‍රහය ඤාත පරිඤ්ඤා නම්. කලාපසම්මසනාදී වසයෙන් පැවැත්තා වූ නාමරූපයන් අනිත්‍යවශයෙන් දුක් වශයෙන් රොග වශයෙන් යනාදි දෙසාළිස් ආකාරයකින් මෙනෙහි කිරීම් සංඛ්‍යාත වූ ලෞකික විදර්ශනාව තීරණ පරිඤ්ඤා නම්. මෙසේ තීරණය කොට ගත්තහුගේ සියලු ඡන්දරාගය ආර්‍ය්‍ය මාර්ගයෙන් දුරුවන හෙයින් ආර්‍ය්‍යමාර්ගීය ප්‍රහාණ පරිඤ්ඤා නම්. **කාමපිපාසානං**– කාම පිපාස නම් කාමයන් සුභාදි ආකාරයෙන් ගණු ලබන්නා වූ තෘෂ්ණා වයි. **එතදවොචානං**– සෝවාන් මාර්ගයට නො පැමිණියන් සඳහා මෙසේ කියන ලදී; **අස්සාමඤ්ඤකං**– ශ්‍රමණයන්ට අයත් ක්‍රියාවක් නො වෙයි. **ආසිවිසස්ස**– සියලු සිරුරෙහි වහා විෂ දුවන හෙයින් හෝ සියලු සිරු

රෙහි විෂ ඉස්සාක් මෙන් පැතිර පවතින බැවින් හෝ තියුණු කඩුවකින් මෙන් වහා අනුන්ගේ මර්මච්ඡේදය කිරීමට සමර්ථවන හෙයින් හෝ දළයන්හි විෂ ඇති බැවින් හෝ නාගයෝ ආසිවිස නමැයි යෙත්. **අඞ්ගාරකාසූපමා**– 'කාසු' යනු ආවාටයට ද රාශියට ද නමි. එසේ හෙයින් අඟුරුවළක හෝ අඟුරු ගොඩක යයි අර්ථ ගත යුතුයි. **අසද්ධම්මං**– නීච ජනයන්ගේ සවභාවයක් වූ; (ඔවුන් විසින් සෙවිය යුතු) **ගාමධම්මං**, ගම් වැස්සන්ගේ සවභාවයක් වූ; මෙහි 'ගාම' ශබ්දයෙන් අභෙදෞපචාර යෙන් ගම්වැස්සෝ ගැණෙති. **දුට්ඨුල්ලං**– රාගාදි කෙලෙසින් කිලුටුවීම මහත් වරදක් සෙයින් ථූලත්වය ඇසුරු කළ; **දුට්ඨුල්ලනිස්සිතං**– දුට්ඨුල්ලං කෙලෙශයන්ගෙන් දූෂිතය යනාර්ථයි. **ඔදකන්තිකං**– දිය කිස අවසන් කොට ඇති; (උදකෙ අන්තං ඔදකං) සේදීම් කිසයි. සේදීම් කිස කෙළවර කොට පවත්නේ ඔදකන්තික නමි. **රහස්සං**– රහසිගතවූ; නාප් පසින් වැසුනු තැනක පවතින මෙය පිළිකුල් කටයුතු දෙයක් හෙයින් අනුන්ට පෙණීමට නුසුදුසුය. **දුභරතාය**– තමන් විසින් ද අනුන් විසින් ද දුකසේ පොෂණය කටයුතු බව පිළිබඳ, යමෙක් තෙම ඇඹුල් ලැබ නැවත නැවතත් ඇඹුල් ම සොයයි ද; අනිකෙකුගේ හෙයින් ලද දෙය අනිකෙකුගේ ගෙහි විසුරුවා ගම හැම්තැනම ඇවිදත් තිස්පාත්‍ර යෙන් යුක්තවම විහාරයට පිවිසෙයි ද මේ අත්තදුභර නමි. යමෙක් හැල් සාලේ බත මසුන් සමග පාත්‍රය පුරා ලදින්නු නො සතුටු ගතියම පෙන්වයි නම් හේ උපට්ඨාකදුභර නමි. **මහිච්ඡතාය**– මහත් මහත් දූය ගැණ ආශා කිරීම පිළිබඳ; ලොභොබී පුද්ගලයා ලබාගැණීමෙදී තමන්ගේ සීලාදිගුණය අනුන්ට හඟවයි. පිළිගැණීමේදී පමණ නො දක්වයි. **කොසජ්ජස්ස**– කුසීතකමේ; 'කුසීතස්ස භාවො කොසජ්ජං' මෙහි 'කුසීත' ශබ්දයාගේ තකාරයට දකාරය වී සිද්ධය. අෂ්ටවිධ කුසීත වස්තූන් සාරත්ථදීපනියෙන් බලනු. **අසන්තුට්ඨියා**– (පසුගිය දූය ගැණ සෝක නොවී, මතු දූයක් නො පතමින්, ලත් දෙයින් යැපීම් සඞ්ඛ්‍යාත) සන්තොෂයාගේ; සිවුපසයෙහි යථාලාභ, යථාබල, යථා සාරුප්ප වශයෙන් එකක තුණ බැගින් පවත්නා දොළොස් ආකාර සන්තොෂය;

**දුම්මඞ්කූනං**– දුස්සීලයන්ගේ; **දිට්ඨධම්මිකානං ආසවානං**– අසංවරවූවහු විසින් ඉහාත්මභාවයෙහිදීම ලැබියයුතු අතුල්පහර, මුගුරු පහර, අත් පා සිඳීම් ආදී දුඃඛවිශෙෂයන්ගේ; **සම්පරායිකානං ආසවානං**– තමන් විසින් කරණ ලද පාපකර්මයන්ට විපාක වශයෙන් පර ලොවදී විඳ යුතු වූ දුඃඛ විශෙෂයන්ගේ; **සද්ධම්මට්ඨිතියා**– සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස; සද්ධර්මය පරියත්ති පටිපත්ති පටිවෙධ වශයෙන් ත්‍රිවිධ වේ. සියලු පිටකත්‍රය බුද්ධවචනය පරියත්ති නමි. තෙරසධුත ගුණ, චුද්දස ඛන්ධකවත්ත, දෙඅසූ මහාවත්ත, සීලසමාධිවිපස්සනා යන මොහු පටිපත්ති නමි. චතුර්විධ ආර්යමාර්ගය, චතුර්විධ ශ්‍රාමණ්‍ය ඵල, නිර්වාණය යන මොහු පටිවෙධ නමි. **විනයානුග්ගහාය**– විනයානු ග්‍රහය පිණිස; සංවරවිනය, පහාණවිනය, සමථවිනය, පඤ්ඤත්ති විනයයි

විනය චතුර්විධ වේ. ඉන් සංවර විනය, සීල, සති, ඤාණ, ඛන්ති, විරියයි පස්වැදෑරුම්ය. පහාණවිනය තදඞ්ග, වික්ඛම්භන, සමුච්ඡේද, පටිප්පස්සද්ධි, නිස්සරණ යයි පඤ්චවිධය; සත්තඅධිකරණ සමථ ධම්ම සමථවිනය නම්. සික්ඛාපද පඤ්ඤත්තිවිනය නම්.

### සුදින්න කථා නිමි.

---

උපලාළෙන්තා- සංග්‍රහ කොට; පටිසෙවන්ති- දවස් පතා නිතර නිතර සෙවනය කෙරෙති. මෙහි 'සෙවන්ති' යි වර්තමාන කාලිකව බාහුල්‍ය වශයෙන් යෙදූහ. සෙනාසනචාරිකං ආහිණ්ඩන්තා- සෙනාසන චාරිකාවෙහි හැසිරෙන්නෝ; බුදුරජාණන් වහන්සේ දැකීමට පැමිණි ආගන්තුක භික්ෂූහු උද්දසන ම ආගන්තුක දානය වළඳා සෙනාසන චාරිකාවෙහි හැසිරෙති. නඞ්ගුට්ඨං- නගුට; ඔඩ්ඩි- අභිමුඛ කෙළේය. නිමිත්තම්පි අකාසි- මෙවුන්දම් සෙවීමේ අදහසට නිමිති ද කෙළේය. (යම් ක්‍රමය කින් යම් ක්‍රියාවකින් මෙවුන්දම් සෙවීමේ අදහස භික්ෂූහු දැනගණිත් ද ඒ නිමිත්ත කම්ම නම්.) නනු සො තථෙව නාම හොති- ඇවැත්නි, ඒ සිකපදය තිරිසන් ගිය මාගමක පිළිබඳ වත් එසේම නොවේද? මනුෂ්‍යාමනුෂ්‍යාදි කිසිම පුද්ගල විශෙෂයක් නො දක්වා සාමාන්‍ය වශයෙන් "යො පන භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය" යි වදාළ හෙයින් මනුෂ්‍යස්ත්‍රිය පිළිබඳව තිරශ්චීන ගතයන්ගේ ද, ඉත්ථි පුරිස පණ්ඩක උභතොව්‍යඤ්ජනකයන්ගේද වසයෙන් තිස්වැදෑරුම් මාර්ගයෙහි මෙවුන් දම් සෙවනය පරිජි ඇවැත් සිදු කෙරෙයි යන අදහසි. වජ්ජිපුත්තකා භික්ඛූ- මොවුහු වැදෑරට විසල්පුර කුල පුත්‍රයෝය. ශාසනයට ඒ ඒ අර්බුද ඇතිකළෝ ද මේ භික්ෂූහුමය. දෙව්දත් තෙමේ වජ්ජිපුත්‍රක භික්ෂූන්ගේ පක්ෂබලය ලැබම සඞ්ඝභෙදකර්මය කෙළේය. බුදුරදුන් පිරිනිවි සියක් අවුරුද්දක් ගතවන්නටත් පෙර මොහු ශාසනයට අර්බුද ඇතිකළාහුය. අලක්ඛිකා- නිශ්‍රීකයෝය; විපස්සකා කුසලානං ධම්මානං- (ආලෝක කසිණ, ආකාශකසිණ, යන කසිණද්වය හැර අනික් අටතිස් අරමුණු අතුරෙන් මේ අරමුණෙහි මෙය ලැබේ යයි කොටස් වසයෙන් දක්වන ලද උපචාර ධ්‍යානය සහිතවූ ප්‍රථම ධ්‍යානාදී වූ මහද්ගත කුශලධර්මයන් විදර්ශනා වශයෙන් වඩන්නෝ; පුබ්බරත්තාපරරත්තං- පෙරයම හා පැසුළුයම; මැදුම්යම භික්ෂූන්ගේ නිද්‍රාකලමථය දුරුකර ගැණීම පිණිස අත්හළ හෙයින් මෙහි නො දක්වනලදී. බොධිපක්ඛිකානං ධම්මානං- 'බොධි' නම් අර්හත්මාර්ග ඥානයයි; ඊට උපකාර වශයෙන් පවත්නාවූ සතර සතිපට්ඨානය, සතර සම්‍යක් ප්‍රධානය, සතර ඍද්ධිපාදය, පඤ්චෙන්ද්‍රියය, පඤ්චබලය, සප්තබොජ්ඣඞ්ගය, ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය යන මේ සත්තිස් දෙන බොධිපාක්ෂික ධර්මයෝයි. අනුයුත්තා- ගිහි පළිබොධ සෙනාසන පළිබොධයන් හැර විවෙකී වූ සෙන සුන්වල යෙදුණෝ; එවමාවුසො- ස්ථවිර තෙමේ මොවුන්ගේ මහා ගජ්නාව අසා අදහස නොදන්නේ ඉදින් මොවුහු මෙවැන්නෝම යයි සලකා යහපතැයි කියමින් මෙසේ පිළිගති. අට්ඨානමෙතං ආනන්ද

**අනවකාසො**- මෙහි සඳහන් 'අට්ඨාන- අනවකාස' යන වචන දෙක ම කාරණය ප්‍රතික්ෂේප කරයි. යම් හෙයකින් බුදුරජානන් වහන්සේ "ලභෙය්‍යාම උපසම්පදං" යි යදින්නාවුන්ට උපසම්පදාව නැවත දුන් සේක් නම් පැණවූ ශික්ෂාපදය උද්ධරණය කිරීමක් වැනි ය. එසේ පැමිණියෝ පැවිදි නොකටයුත්තෝ යයි ද, නො වදාරා උපසම්පදා නො කටයුත්තෝ යයි වදාළ හෙයින් පරිජි ඇවතට පිළිපන්නහුට ද සාමණේර භූමියට පැමිණීමට අවසර දුන් සේක.

**යථායුත්තකො**- නව කර්මාන්තයෙහි හෝ උද්ග්‍රහණයෙහි හෝ විදර්ශනාවෙහි හෝ යෙදුනෙක යන අර්ථයි. **යථාජච්චො**- ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී යම්කිසි ජාති ඇත්තෙක. 'ජච්චො' යන තන්හි 'ජාති' ශබ්දය කෙරෙන් වූ 'ය' ප්‍රත්‍යය ස්වාර්ථයෙහි ය. **යථාසීලො**- යම් කිසි ගතියක් ඇත්තෙක. මෙහි 'සීල' ශබ්දය 'ප්‍රකෘති' අර්ථය පවසයි. **ථෙරො**- පිරිපුන් දසවස් ඇත්තෙකි. **නවො**- උනු පස් වස් ඇත්තෙකි. **මජ්ඣිමො**- පස්වසකින් වැඩි දසවසකින් උනු වස් ඇත්තෝ; **සික්ඛාකාමො**- ආර්‍ය්‍යයන්ට අයත් හික්මීමෙන් හික්මෙන කැමැත්තෝයි. ආර්‍ය්‍යයෝ වනාහි යමක් ලැබගණු සඳහා පැමිණ මුවින් නොබැණ සිටිති. බ්‍රාහ්මණාදීන් මෙන් 'මට දෙවයි' 'මට දෙව්යි' නො ඉල්ලති. **භික්ඛාචරියං අජ්ඣුපගතො**- පිඬු හැසිරීම ප්‍රකෘති කොට ඇති භික්ෂූන් වහන්සේයි. විහාරයට කත් බැඳගෙණ ගෙණෙන ලද දනින් යැපෙන භික්ෂූන්වහන්සේ ද මීට ඇතුළත් වෙති. ජීවිකාව අනුන් පිළිබඳව පවත් නා හෙයිනි. **හීනකපටධරො**- වටිනාකමින් ද, ස්පර්ශයෙන්, පැහැයෙන් ද නො අගනා වස්ත්‍ර දරණ කැනැත්තෝ; දහසක් අගනාවූ වස්ත්‍රයක් වුවත් කඩ කඩ කොට කපා වෙන්කළ කල්හි එහි අගය පිරිහෙයි. සුව පහස් එළවන වස්ත්‍රයක් වුවත් තැන් තැන් වල නොයම් ලෙස නූල් ඇද මැහීමෙන් එහි ස්පර්ශ සුඛය පිරිහෙයි. මනහර පැහැයෙන් යුත් වස්ත්‍රයක් වුවත් ඉඳිකටු මළ අත්වල ඔහදිය යන මෙයින් කිලු වූ වූ කල වර්ණ සම්පත්තිය පිරිහෙයි. **එහිභික්ඛූති භික්ඛු**- 'එව මහණ'යි වදාළ පමණින් භික්ෂුභාවයට ද උපසම්පදාවට ද පැමිණි භික්ෂුතෙමේ; බුදුරජානන් වහන්සේ ප්‍රථම බොධියෙහි දීම එක් දහස් තුන්සිය එක් සාළිසක් භික්ෂූන්ට එහි භික්ෂුභාවයෙන් මහණ උපසම්පදාව දුන්සේක. **තීහි සරණාගමනෙහි උපසම්පන්නො**- 'බුද්ධං සරණං ගච්ඡාමි' යි මෙසේ තුන්වරක් බිණීමෙන් උපසපන් වූ භික්ෂුතෙමේ; උපසම්පදා අටකි. එනම්, එහි භික්ඛු උපසම්පදා, සරණාගමන උප සම්පදා, ඔවාද පටිග්ගහණ උපසම්පදා, පඤ්හ ව්‍යාකරණ උපසම්පදා, ගරුධම්මපටිග්ගහණ උපසම්පදා, දූතෙන උපසම්පදා, අට්ඨවාචික උප සම්පදා' ඤත්තිචතුත්ථකම්ම උපසම්පදා යන මොනුයි. මෙකල පවත් නේ ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාවයි. **භද්‍ර**- සීල, සමාධි, පඤ්ඤා, විමුත්ති, විමුත්තිඤාණ දස්සන යන මේ පඤ්චධර්මයන්ගෙන් යුක්ත වූ යේයි. **එයම සාර** නම්. **සෙඛ**- කල්‍යාණ පෘථග්ජන භික්ෂුහුද සප්ත විධ ආර්‍ය්‍යයෝද ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙත් තුයි සෙඛ නම්. **අසෙඛ**-

ක්ෂීණාශ්‍රවයෝය, සමග්ගෙන සංඝෙන- පරිජ් නුවූ අනුක්ඛිත්තවූ පස් නමකට අඩු නුවූ සඞ්ඝයා, මධ්‍ය දේශයෙහි නම් පඤ්චවර්ගිය සඞ්ඝයා විසින් උපසම්පද කර්මය නොකළ හැකිය. ඤත්තිචතුත්ථෙන කම්මෙන- ඤත්තිය සතර වැනිකොට ඇති ධාර්මිකවූ විනය කර්මයෙන් (මෙහි මුලින් ඤත්තිය හා අනුශ්‍රාවණ තුණක්ද ඇතුළති.) අකුප්පෙන- වත්ථු, ඤත්ති, අනුසාවණ, සීමා, පරිස යන පංච සම්පත්තීන් යුක්ත හෙයින් ආක්‍රොශ නොකට (දෙස් නොකිය) යුතු බවට පැමිණියාවූ; 'වත්ථු' නම් උපසම්පදාපෙක්ෂක පුද්ගලයායි. ඌනවිසි වයස් ඇති පුද්ගලයා ද, අන්තිම වස්තුවට පැමිණි තැනැත්තේ ද, පණ්ඩකාදි එකොළොස් අභව්‍ය පුද්ගලයෝද බැහැර කටයුත්තෝයි. ඤත්ති- නම් දැන්වීමයි. ඤත්ති දොස පසකි. එනම් වත්ථු, සඞ්ඝ, පුග්ගල යන මොවුන්ගේ අකීර්තනය ද, ඤත්තිය නොතැබීම ද, කර්මවාක්‍යය අවසන් කොට පසුව ඤත්තිය තැබීම ද යන මොහුයි; අනුසාවණ නම් කර්ම වාක්‍ය ඇස්වීමයි. එය ද පඤ්චදෝෂයකින් යුක්තය, එනම්, වත්ථු සඞ්ඝ පුග්ගල යන මොවුන්ගේ අකීර්තනය, ශ්‍රාවණය වැළැක්වීම, නොකල්හි ඇස්වීම යන මොහුයි. 'සීමා' නම් එකොළොස් විපත්ති සීමාවන්ගෙන් වෙන්වූ බද්ධ අබද්ධ වශයෙන් දෙපරිදිවූ සීමා දතයුතුයි. 'බද්ධ සීමා' නම් නිමිත්ත, පරිස, කම්මවාචා යන ත්‍රිවිධ සම්පත්තීන් නොපිරිහෙළා නිමිත්තෙන් නිමිත්ත ගළපා කළ සීමාවයි; 'අබද්ධ සීමාව- ගාම සීමා, සත්ත-බ්භන්තර සීමා, උදකුක්ඛෙප සීමා වශයෙන් ත්‍රිවිධ වේ. පරිස නම් යටත් පිරිසෙයින් අනුක්ඛිත්ත භික්ෂූන් පස් නමක්වත් නොපැමිණීම ය. ඡන්දාරහ භික්ෂූන්ගේ ඡන්දය නොගැනීම ය. සම්මුඛීභූත භික්ෂූන් ඔවුනොවුන් ආක්‍රොෂ පරිභව කරගැනීමය යන ත්‍රිවිධ දෝෂයන්ගෙන් වෙන්වූ සමගි පිරිසයි. ඨානාරහෙන- නිවණට පැමිණීම හෙතුකොටගෙණ ත්‍රිවිධ ශික්ෂාවන්ගෙන් යුත් ශාසනය ඨාන නම්. ඒ ශාසනයට සුදුසු වූයේ ඨානාරහයි; එබැවින් පිරිසිදු කර්ම වාක්‍යය කෙළවර කොට ඇති සියලු සඞ්ඝකෘත්‍යය ඨානාරහ යි. අධිසීලසික්ඛං- පඤ්ච සීල, දස සීල ආදිය සීල නම්. අබුද්ධොත්පාදකාලයන්හි ද පවත්නා හෙයිනි. මෙහි ඒ ශීලයන්ට වඩා අධික හෙයින් අධි සීල යයි අදහස් කරණ ලද්දේ ප්‍රාතිමොක්ෂ සංවර ශීල යයි. අධිචිත්ත සික්ඛං- කාමාවචර කුසල්සිත් හා ලෞකික අෂ්ටසමාපත්ති සිත් ද 'චිත්ත' නම්. අබුද්ධොත්පාදකාලයන්හි ද සුලබ හෙයිනි. මෙහි විදර්ශනා පාදක අෂ්ට සමාපත්ති චිත්තය ඒ චිත්තයන්ට වඩා ශ්‍රේෂ්ඨ හෙයින් අධි චිත්ත යයි ගණු ලැබේ. අධිපඤ්ඤං- 'අත්ථි දින්නං' යනාදි කම්මස්සකතා ඥානය පඤ්ඤා නම්. ලක්ෂණත්‍රය පිරිසිඳ දන්නා විදර්ශනා ඥානය අධිපඤ්ඤා නම්. සාජීවං- නානා දෙස ජාති ගොත්‍රාදි භෙද භින්නවූ භික්ෂූන් සමාන පැවතුම් ඇත්තන් කරණ හෙයින් 'ශික්ෂාපද' සාජීව නම්. උක්කණ්ඨිතො- ශාසනයෙහි නො ඇලීමෙන් ගාලෙහි බැඳුන ගව සමූහයා මෙන් 'අද යමි, හෙට යමි.' යි ඔසවා ගත් ග්‍රීවාව ඇතිව විසුරුණු සිත් ඇතිව වාසය කරණ තැනැත්තේයි. භික්ඛුභාවං අට්ටියමානො- භික්ඛුභාවය කරණකොටගෙණ පෙළෙන්නේ;

'සික්ඛාභාවං' යනු කරණාර්ථයෙහි ෂෂ්ඨීයාවිභක්තියි, **උම්මත්තකො**- උමතු වූයේ; විපරිත සංඥා ඇත්තේ; **ඛිත්තචිත්තො**- යකුන් විසින් ආවේශ වීමෙන් පහවූ සිහි ඇත්තේ; **වෙදනට්ටො**- බලවත් වූ දුඃඛ වෙදනාවකින් මුසපත් වූයේ; **අරියක**- මගධ භාෂාවයි. **මිලක්ඛක**- ආන්ධ්‍ර ද්‍රවිඩාදී භාෂායි; **දවාය**- කලබලයෙන් වහා අනිකක් කියනු කැමැත්තේ 'බුද්ධං පච්චක්ඛාමි' යි කියයි නම් එය දවයෙන් කීම යි. **රවාය**- අනිකක් කියමියි සිතා පැකිළෙමින් අනිකක් කියා නම් එය රවයෙන් කීම යි. දවයෙන් කීම පණ්ඩිතයෙකුට වුවත් සාහසිකත්වය නිසා සිදුවියහැක, රවයෙන් කීම මුග්ධත්වය නිසා සිදුවන්නකි. **තිලමත්තම්පි**- 'සාසපමත්තං තිලබීජං' යනු හෙයින් පියවි පවතින් පහස් නොලද තන්හි අබ ඇටක් පමණ තැනුදු; **සාදියති**- සෙවන චිත්තය උපදවයි. **සිතං**- සුකුරු මුදන වේලෙහි සුදුසු තැනට පැමිණ සිටියේ; **සන්ථතං**- යම්කිසිවකින් යම්කිසි ලෙසකින් වැසූ; **නාසෙතබ්බො**- සිවුරු හැර වීම සඞ්ඛ්‍යාත ලිඞ්ග නාශනයෙන් නැසිය යුතුයි. **අජානන්තස්ස**- මහ නින්දට පැමිණි හෙයින් අනුන් විසින් කරණලද උපක්‍රමය නොදන්නේ; **අසාදියන්තස්ස**- දූතගත්තල්හිද සෙවන චිත්තය නූපදවන්නේ; **ආදිකම්මිකස්ස**- පළමු වරට වැරැද්ද කළේ; මෙහි සුදින්න තෙර ආදිකම්මිකයා ය. එබැවින් ඔහුට අනාපත්ති ය.

**ගිහිලිඞ්ගෙන**- ගිහි වෙසින්, සුදුවත් ඇඳගත්තකු විසින්; **වාකචීරං**- තවුසන්ගේ වැහැරි සිවුර; **කෙසකම්බලං**- මිනිස් හිසකෙස් වලින් ගෙතූ කම්බිලි රෙද්ද; **වාලකම්බලං**- සෙමරලොමින් කළ කම්බිලිය; **අජිනක්ඛිපං**- ලොම්-කුර සහිත අඳුන් දිවි සම; **සාරත්තො**- කාය සංසර්ග රාගයෙන් යුක්ත වූයේ; **පටිබද්ධචිත්තො**- පිළිබඳ සිත් ඇත්තේ; ගිහිකාලයෙහි පටන් ඇතිව තිබූ රාගයෙන් යුක්ත සිත් ඇත්තේ, **මුදුපිට්ඨිකො**- ඉතා පහසුවෙන් නැමිය හැකි මොළොක් පිට ඇත්තේ; මේ භික්ෂුව ගිහි කාලයේදී පිනුම් කරුවෙකි. ශිල්ප පුරුදු කිරීමේදී හෙතෙමේ තමන්ගේ පිට කැමැතියේ නමන්ට පුරුදුවී සිටියේය. **ලම්බී**- ඉතා දික්වූ රහසඟ ඇත්තේ; **ලෙපචිත්තකස්ස**- සිතියම් කරණලද රූපයක; **දාරුධීතලිකාය**- ලී ආදී යමකින් කළ පෙතැළි ඉතිරි රුවක් සමඟ; **වණකතෙ**- විවෘතවූ; **ජාතියාවනෙ**- බොහෝ සමන් මල් ගොමු ඇති හෙයින් මේ උයන ජාතියාවන නමින් ප්‍රකටවිය. 'ජාතියා උපලක්ඛිතං වනං- ජාතියාවනං' අලුප්ත සමාස යි. **දිවාපටිසල්ලීයන්තෙන**- දහවල් නිදන්නනු විසින්; **ද්වාරං සංවරිත්වා පටිසල්ලීයිතුං**- දොර වසාගෙණ හොවින්ට; ලෑලි උණ පතුරු කලාල් පැලලි ආදී යමකින් අසව් සවි කොට කරණලද පරිවත්තක ද්වාරය සංවරණය කටයුතුමය. අන්‍යවූ රුක්ඛසූචිද්වාරය, කණ්ටකද්වාරය, චක්කලයුත්තද්වාරය, සංසරණ කිටිකද්වාරය, උග්ඝාටන කිටික ද්වාරය, සලාකහත්ථ ද්වාරය, දුස්සසාණි ද්වාරය යන මේ සියල්ල සංවරණය නොකිරීමෙන් ඇවැත් සිද්ධ නොවේ.

'රුක්ඛ සූචි ද්වාරය' නම් දෙකුත් පලකින් සිදුරු කරණ ලද මැද් දෙපස පිහිටුවා ඒ සිදුරුවල කැමැති විටෙක සවිකරන්ට අස් කරන්ට හැකි වන සේ පොලු යොදා කළ ද්වාර යයි. 'කණ්ටක ද්වාරය' නම් ඇතුල් වන පිටවන සියලු කාලයන්හි අස්කොට හෝ වසාගෙණ යා හැකිවූ කටුඅතු ආදියකින් කළ පැලැල්ලකින් යුක්තද්වාර යයි. 'චක්කලක යුත්ත ද්වාරය' නම් අසවු ආදියෙන් සවි නොකළහෙයින් සංවෘත විවෘත කරන්ට පහසු වන සේ දොර යට පෙදෙසෙහි පරිවර්තනය කළ හැකිසේ චක්‍රයක් යොදා කළ ද්වාරයයි; 'උග්ඝාටන කිටික ද්වාරය' නම් උණලී පතුරු තබා කැමති විටෙක ඔසවා අස්කරන්ට හැකි වන සේ කළ ඉදිකඩුල්ලයි. 'සංසරණ කිටික ද්වාරය' නම් 'උණ ලී තබා වෙලා හරින්ට පියන්ට හැකිවනසේ යට පෙදෙසෙහි චක්‍රයක් යොදා කළ ඉදි කඩුල්ලයි. 'සලාක හත්ථ ද්වාරය' නම් සරසට ලී තුණක් තබා වෙලාගත් පැත යාගන්නට හැකි වන සේ කළ තිසල කඩුල්ලයි. 'දුස්සසාණි ද්වාරය' නම් රෙදි කඩකින් ආවරණය කළ ද්වාරයයි. (පාත්‍ර නත් අත් ඇත්තහුට මේ ද්වාරය අනාපත්ති කරය.)

ප්‍රථම පාරාජිකා ශික්ෂාපදය නිමි.

---

රාජගහෙ– මහා ගොවින්දාදි රජුන් විසින් පරිග්‍රාහීත හෙයින් මෙය රාජ ගෘහ නමින් ප්‍රකටවිය. 'නගරශබ්දාපෙක්ෂාවෙන් 'රාජගහ' ශබ්දය නපුංසකලිඞ්ග වශයෙන් දක්වී. ගයාම ආසන්නයෙහි වේභාර, වෙපුල්ල, ගිජ්ඣකූට, ඉසිගිලි, පාණ්ඩව යන පර්වතයන්ගෙන් ශාලක් මෙන් වටවූ හෙයින් 'ගිරිබ්බජ' යයි අපර නාමයකින් ද ප්‍රසිද්ධවූ මගධ දනව් වෙහි අගනුවර වූ මේ නගරය මෙකල 'රාජගිර්' නමින් ප්‍රකටය. මෙය ගඞ්ගා නදියේ සිට පස් යොදුනකින් දකුණු දිග පිහිටියේය. ප්‍රථම ධර්ම සඞ්ගායනාව කළ සප්තපර්ණී ගුහාව ද මේ නගර යෙහි ම ඇත.

ගිජ්ඣකූටෙ පබ්බතෙ– රජගහනුවරට එක් පසෙකින් පිහිටි මේ පර්වතය දුර සිට බලන්නවුන්ට ගිජුලිහිණි සටහනක් සේ පෙණේ. එ හෙයින්ම මීට 'ගිජ්ඣකූටය.' යන නාමය ව්‍යවහෘත ය. දෙව්දත් බුදුරදුන්ට ගල්පෙරළුයේ මේ පව්වෙහි සිට ය. සඤ්ජිට්ඨා- අඳුනත්තෝ; ඍමන්තනා– දුඃස්මිත්‍රත්වයට පැමිණියෝ; ඉසිගිලිපස්සෙ– සෘෂිගිරි නම් පර්වතයෙහි පාර්ශ්වයක; පෙර පන්සියයක් පමණවූ පසේබුදු වරුන් වහන්සේ පෙර බත් කල කාසී කොසොල් ඇතන්හි පිඬු සිඟා වළඳා මේ ඉසිගිලියට රැස්වී සමවත් සුවින් කල් ගත කළාහුය. අවට වාසීහු මෙසේ පසේබුදුන් වහන්සේ මෙහි වඩිනු මිස පෙරළා වඩිනු නොදුටු 'අයං පබ්බතො ඉමෙ ඉසී ගිලති' යන හැඟීම ඇතිකර ගත්හ. එහෙයින් මේ පර්වතයද 'ඉසිගිලි' නමින් ප්‍රකට විය.

**තිණකුටිකායො**- වියලුනු කුසතණ ආදියෙන් සෙවිලි කරණලද එසේම දොර පැලලිද ඇති කුඩා පැල්; 'සවාර බන්ධා' යන්නෙන් මේ කුටි වස්වැසීමට ද යොග්‍ය බැව් හඟවයි. මොනෙය්‍ය ප්‍රතිපදව රක්නවුන් විසින්ද දොර පැලලී ඇති වහල සෙවිලිකළ සෙනසුනකම වස්එලඹිය යුතුයි. **ධනියො කුම්භකාරපුත්තො**- 'ධනිය' යනු ඒ තෙරුන්ගේ නාමය වෙයි. පියා කුම්භකාරයෙකු හෙයින් 'කුම්භකාර පුත්තො' යි යෙදින. **වස්සංවුට්ඨා**- පෙර වස් එළඹ මහා පවාරණ යෙන් පැවරූ; **තෙමාසච්චයෙන**- තුන් මස් ඇවෑමෙන්; වස් තුන් මසට පවාරණය කරණ දිනද ඇතුලත්වේ. **පටිසාමෙත්වා**- තැන්පත් කොටතබා, විහාරය ආසන්නයෙහි කරණලද කිළියක් නම්, විහාරයෙහි නිත්‍ය වාසික භික්ෂූන් වෙත පැමිණ "ඇවැත්නි මේ කුටිය ආරක්ෂා කළ මැනව. මෙහි වසන්ට කැමැති කෙනෙකු පැමිණියහොත් උන්වහන්සේට භාරදෙනු මැනව" යි භාරකොට යා යුතුය. ඉදින් අරණෙහි කරණ ලද්දක් නම් ආරක්ෂකයෙකු නොලබන්නනු විසින් තණ හා දැව බඳු පසෙක තැන්පත් කොට තබා, 'මෙහි වසනු කැමතියන්ට උපකාර වේවා" යි ගමිකවත් පුරා යා යුතුයි. **හෙමන්තං**- ඉල් මස කාල පක්ෂයෙහි පටන් මැදින් මස කාල පක්ෂය දක්වා ඇති සිවු මසයි; **ගිම්හං**- මැදින් මස කාල පක්ෂයෙහි පටන් ඇසළ මස කාලපක්ෂය දක්වා ඇති සිවු මසයි. **අනවයො**- 'වය' නම් හානියයි. 'නාස්සඑතස්ස වයො' ති අවයො, අනු + අවයො=අනවයො; තමන් උගත් ශිල්පයෙහි ඌනතාවක් නැත යන අර්ථයි. මෙහි 'අනු' ශබ්දය විප්සාර්ථයෙහිය. **ආචරියකෙ**- 'ආචරියස්ස කම්මං=ආචරියකං'; **චික්ඛල්ලං**- මඩ; **සබ්බමත්තිකාමයං**- දොර උළුවහු ජනෙල්, අගුළු, ආදිය හැර බිත්ති පියසි ආදී සෙසු ගෘහාංග මැටියෙන් ම කරණ ලද; **කිඞ්කිණිකසද්දො**- කිකිණි හඬ හෝ කස්ලෝ හඬ, නානා රුවතින් කරණ ලද කිකිණි දැල්වල පවන් පහට කල්හි පැවති ශබ්දය යම්සේ වේද, වා කවුළු ආදියෙන් සුළඟ මේ ගෙට පිවිසෙන කල්හි පවත්නා ශබ්දය ද එබඳුය. නොහොත් කස් ලෝ බඳුනකට තට්ටුකිරීමේදී යම්බඳු හඬක් පැතිරේද, සුළඟ කරණකොටගෙණ එ ගෙයින් පැන නගින ශබ්දය ද එබඳුය. **අනුද්දයා**- අනුරක්ෂණය; මෙයින් මෛත්‍රී ධ්‍යානයාගේ පූර්වභාගය වූ සියලු සතුන් කෙරෙහි හිත පැතිරවීම දැක්වේ. **අනුකම්පා**- අනුන්ගේ දුක දැක හිත කම්පාවීම; **අවිහෙසා**- කරුණාධ්‍යානයාගේ පූර්වභාගය වූ සියලු සතුන් කෙරෙහි පවත්නා අනුකම්පා මාත්‍රය යි. තෙරුන් විසින් දුක දූන කුඩා සතුන් මරණ අදහසින් මෙය නොකරණ ලදි. කරුණා චෛතසිකයාගේ ඌනත්වය හෙයින් කුඩා සතුන්ගේ මරණය සිදුවන්නේ යයි නොසලකා අපරීක්ෂාකාරීව කළ හෙයින් බුදුරජානන් වහන්ගේ මෙසේ නින්දා කළ සේක. **පච්ඡිමා ජනතා පාණෙසු පාතබ්‍යතං ආපජ්ජි**- බුදුරජානන් වහන්සේ වැඩහින්දදීම භික්ෂූහු මෙසේ මෙසේ කළාහුය. එබැවින් මෙ වැනි කරුණුවලදී කුඩා සතුන්ගේ විනාශය වුව ද ඒ නිවරදයයි සලකා

පවජ්ම ජනතාව ද පාත්‍ර පිසීම්, කුටිකිරීම්, විහාර කරවීම්, වෙහෙර විහාර මලු හැමදීම්, පොකුණු කැණවීම්, ආදියෙහි දී කුඩා සතුන්ට කරුණාව නොපෙන්වති' යන අදහසි; යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්ස- යම් භික්ෂුවක් සතුන්ට කරදර නොවන අයුරින් හෝ කුටියක් කෙරේද, ඒ භික්ෂු තෙමේ දුකුලා ඇවැතට පැමිණේ. බුදුරජාණන් වහන්සේ අකපපිය හෙයින් මේ ධනිය භික්ෂුව විසින් කළ කුටිය බිඳවා දැම්මූසේක. විනයධර බහුශ්‍රැත නමක් අකැප පිරිකර ගෙණ හැසිරෙණ අන් භික්ෂු නමක් දැක ඒ අකැප පිරිකර සිඳබිඳ දැමූ කල්හි එය අයිති මහණ විසින් මගේ මෙනම්වටිනා දෙයක් නැසූ යයි චෝදනා නොකටහැකිය. තුඹවහන්සේ විසින් නැසූ පිරිකර ආපසු දිය යුතු යයි ද නො ඉල්විය යුතුයි. දාරුගහෙ ගණකො- රජයට අයත් දැවභාණ්ඩාගාරයෙහි දැව ආරක්ෂකයා; ඛණ්ඩාඛණ්ඩිකං ඡෙදාපෙත්වා- (තමන්ට උවමනා ප්‍රමාණය සලකා) ඒ ඒ ලී වල අගින් ද මුලින් ද මැදින් ද සිඳ බිඳ දම්මා; අනුසඤ්ඤායමානො- ඒ ඒ තැන්හි පැමිණ පරීක්ෂා කරන්නේය; සෙනියො- 'සෙනිකො' යන නමෙහි 'ක' හට 'ය' වී සෙනියො යි සිද්ධවිය. බිම්බිසාරො- 'බිම්බි' නම් රන් රන්ය. එබඳු පැහැ ඇති හෙයින් බිම්බිසාර නම් විය; බද්ධං ආණාපෙසි- (ඇමති බමුණා ස්වභාවයෙන් ම භාණ්ඩාගාරිකයාට ඊර්ෂ්‍යා කරයි; එහෙයින් රජු කී පමණකින් ම) ඔහු අල්වා බැඳ ගෙන්වාපිය. කිස්සාසි සඞ්කෙත පුරහං භඤ්ඤාමි- මා නසන්ට පළමුව එන්නෙහිය යන අදහසි. පුර + අහං=පුරහං; ඉඞ්ඝ භණෙ- 'ඉඞ්ඝ' යනු චෝදනාර්ථයෙහි නිපාතයකි. ලොමෙන ත්වං මුත්තොසි- (ලොම් මැතිනුයි ලොම නම්, පැවිදි ලිඞ්ගයයි. ධූර්තයෝ මස් පිණිස වටිනා ලොම් ඇති එළුවෙකු මිලදී ගත්තාහුය. අනෙක් නුවණැති පුරුෂයෙක් එය දැක මේ එළුවාගේ මස කහවණුවක් පමණ අගී. ලොම් වනාහි වාරයෙන් වාරයෙහි සිඳගන්ට හැකිය. එලෙසින් මහාර්ඝයයි සලකා ඒ වෙනුවට ලොම් රහිත එළුවන් දෙදෙනෙකු දී උග මරණින් මුදවා ගති. ඒ එළුවා මරණින් නිදහස් වූයේ ලොම් හේතුකොටගෙණය. තුඹවහන්සේගේ මේ කාර්යද වධබන්ධනාර්හය. තුඹවහන්සේ පැවිදි වූ හෙයින් පැවිදි ලිඞ්ගයයි කියනලද අර්හද් ධවජය දරන්නාහුය.) යම්සේ ලොම් කරණකොටගෙණ එළු තෙමේ මරණින් නිදහස් වීද එසේම තුඹවහන්සේ පැවිදි ලිඞ්ගය නිසා වධයෙන් නිදහස් වූහ. උජ්ඣායන්ති- පහත්කොට සිතත්; ඛීයන්ති- නින්දා කරත්; විපාචෙන්ති- සියල්ලන්ට ම ප්‍රකාශ කෙරෙත්; බ්‍රහ්මඤ්ඤං- ශ්‍රෙෂ්ඨභාවය; වොහාරිකො- විනිසකරු; රජකත්ථරණං- රද තොටකම; රජකභණ්ඩිකං- (රජකයෝ පසුදින නගරයට පිවිසෙන අදහසින් රෙදි පොදි බැන්දෝය. මේ එක එක රෙදි පොදියෙහි බොහෝ වස්ත්‍ර වූහ. ඔවුන්ගේ ප්‍රමාදක් බලා එයින්) පොදියක් සොරකම්කොට ගෙණ ගියහ. අමනුස්සා- මිනිසුන් නැතිහෙයින් අමනුෂ්‍යයන් අධිකෘත වූ පෙදෙසද, එසේම නැවත පැමිණෙන අදහසින් නික්ම ගිය හෙයින්

මිනිසුන්ගෙන් හිස් වූ ගම්ද අමනුෂ්‍ය නම්. **පරික්ඛිත්තො**– පවුර කින් හෝ කටු වැටකින් වට වූ හෝ පිරිකෙවි කළ ගම; **ගාමූප චාරො**– ('ගාමො එව උපචාරො= ගාමූපචාරො') ගම ම ගාමූපචාර නමි. මෙයින් අරණ්‍ය සීමාව දක්වූහ. **ගොනිසාදි නිවිට්ඨො**- වීථි පිහිටු වීම් ආදි වශයෙන් ක්‍රමානුකූලව තැනීමකින් තොරවූ ගවයන් දෙතුන් දෙනා රැස්වී තැන් තැන් වල ලැගසිටින්නාක් මෙන් තැන් තැන් වල ගෙවල් දෙක තුණ වශයෙන් පිහිටි ගම; **ඉන්දඛීලෙ**– එළිපතෙහි; නොසැලෙන සේ කඩඉම් පිණිස සිටුවන ලද සීමා කණුව, ඉන්දඛීල නමි. 'ඉන්ද' යනු 'ස්ථිරය' යන අර්ථයි. **ලෙඩ්ඩුපාතො**– මධ්‍යම පුරුෂයෙක් යම්සේ තමන්ගේ බල පමණින් ගලක් විසි කෙරේද, ඒ විසිකළ ගල පතිතවූ ස්ථානය අතර ඇති දුර ප්‍රමාණය එක් ලෙඩ්ඩු පාතයකි. පොළා පැනගොස් ගල නැවතී තුබුනු තැන නොගත යුතුයි. **සරූපචාරො**– වැසිකල ගෙ පියසි අගින් දිය වැටෙන තැනින් ඇතුල් පෙදෙස සර නමි. ගේ කලූවේ සිටි මාගමක විසින් හෙලූ ඉඳුල් දිය වැටුනු තැනින් අබතුරු පෙදෙස සරූපචාර නමි. ගෙය ඉදිරිපස ගෙරින්ගේ ආගමනය වලකනු සඳහා බැඳි කඩුල්ලෙන් ඇතුල් පෙදෙස සරූපචාර නමැයි ද යෙත්. **අදින්නං**– හිමියන් විසින් කයින් හෝ බසින් නුදුන්දැය, **අනිස්සට්ඨං**– තම අයින් හෝ තුබූ තැනින් වෙනස් නොකළදැය. **අපරිච්චත්තං**– ගැණීමට සුදුසු තැනක තුබූ දැය නමුත් අනපෙක්ෂාවෙන් නුදුන් දැය; **රක්ඛිතං**– ආරක්‍ෂා යෙදී මෙන් රක්නා දැය; **ගොපිතං**– පෙට්ටි පියලි ආදියෙක ලා රැකිදැය. **මමායිතං**– මෙය මාගේ යයි තෘෂ්ණා වශයෙන් ගත්දැය; **පරපරිග්ගහිතං**– හිමියන් විසින් විශදීමක්වත් රැකීමත් වත් නැති හෙයින් අනුන් අයිතිකර ගත් දැය.

**ආදියෙය්‍ය**– සොර සිතින් යම්කිසිතැනකට හෝ දැයකට තලන කොරේද, ඒ භික්‍ෂු හට දුකුළා ඇවැත් සිදුවේ. හිමියාට විමති උපදවා නම් තුලශි වේ. හිමියා මෙහැන් පටන් මට මෙය නොලැබේ යයි බලා පොරොත්තු අත්හරීනම් පරිජි ඇවැත් වේ. **හරෙය්‍ය**– අනුන් දැයක් ගෙණයන්නෝ හිසෙහි වූ දැය සොර සිතින් අතගා නම් දුකුළා වේ. සොලවා නම් තුලශි වේ. හිසෙහි වූ දැය උර මතු පිටට ගණීනම පරිජි ඇවැත් වේ. **අවහරෙය්‍ය**– ආරක්‍ෂාවට තබනලද දැයක් නැවත හිමියා මාගේ දැය මට දෙවයි කී කල්හි මම නොගතිමි කියා නම් දුකුළා වේ. හිමිහට සැක උපදවා නම් තුලශි ඇවැත් වේ. හිමියා ඔහුගෙන් මට එය නොලැබේ යයි අවිශ්වාස කෙරේ නම් පරිජි ඇවැත් වේ. **ඉරියාපථං විකොපෙය්‍ය**– අනුන්ගේ බඩුවක්, ගෙණ යන් නානුත් සමග රවටාගෙණ ගෙණයම්යි කල්පනාකොට ඔහුත් කැටුව යන්නෙ පළමු පාදය තුබූකල්හි තුලසිද දෙවෙනි පාදය තුබූනම් පරිජි ද වේ. **ඨානාචාවෙය්‍ය**– බිම තුබුනු දැයක් ගණීම් යි සොර සිත උප දවා අතගාතම් දුකුළා වේ, සොලවා නම් තුලසි වේ. තුබූ තැනින් ගත් කෙණෙහි පරිජි වේ. **සංකෙතං විතාමෙය්‍ය**– නියමිත සංකෙත

ස්ථානයෙන් පළමු පිය ඉක්මවූ කොණෙහි තුලසිද, දෙවෙනි පිය ඉක්මවා තුබූ කොණෙහි පරිජි ද වේ. නොහොත් සුඛඝාත ස්ථානයෙන් සැඟවී යනු කැමැත්තහුට පළමු පිය ඉක්මවීමෙන් තුලසි ද දෙවෙනි පිය ඉක්මවීමෙන් පරිජි ද වේ. මේ නානා භණ්ඩ පඤ්චක යයි. එක භණ්ඩ පඤ්චකයෙහි හිමියන් ඇති දැසිදස ගව මහිෂාදීන් අතුරෙන් යම්කිසිවෙකු, හොර සිතින් සඟවාගෙණ යනු කැමැත්තෙන් ආදියන, හරණ, අවහරණ, ඉරියාපථ විකොපන, ඨානාචාවන යන්ගේ වශයෙන් (නානා භණ්ඩ පඤ්චකයෙහි කියනලද පරිදි) ගෙණ සීමාව ඉක්මවූ යේ නම් පළමු ක්‍රමයෙන් ම ඇවැත් සිදු වේ.

**පඤ්චවිසි අවහාර්**– නානා භණ්ඩ පඤ්චක, එක භණ්ඩ පඤ්චක, සාහත්ථික පඤ්චක, පුබ්බපයොග පඤ්චක, ථෙය්‍යාවහාර පඤ්චක යන මොහුයි. නානා භණ්ඩ පඤ්චක එකභණ්ඩ පඤ්චක යන වයද ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානා චාවෙය්‍ය යන මොවුන්ගේ වශයෙන් ප්‍රභෙද වෙත්. නානා භණ්ඩක පඤ්චකය අවිඤ්ඤාණක වස්තූන් පිළිබඳ වද, එකභණ්ඩ පඤ්චකය සවිඤ්ඤාණක වස්තූන් පිළිබඳ වද වීම එහි ඇති වෙනසය. **සාහත්ථික පඤ්චකය**– සාහත්ථික, ආණත්තික, නිස්සග්ගිය, අත්ථසාධක, ධුර නික්ඛෙප යන මොහුයි. 'සාහත්ථික' නම් අනුන්ගේ බඩු සියතින් ම හොරෙන් ගැණීමයි. 'ආණත්තික' නම් අසවලාගේ බඩු ගණුව' යි නියොග කිරීමයි. 'නිස්සග්ගිය' නම් තමන් ගෙණ යන බඩු ආදිය සුන්වත් ගණුලබන රේන්දපල්වලදී හෝ තොටුපලෙහිදී රාජපුරුෂයන්ට නොපෙණෙන සේ සොර සිතින් ගෙණයාමයි. සීමාවෙහි ඇතුලත සිටගෙණ පිටතට බඩු විසිකිරීමද, අන්‍ය වූ තොටුපලකින් හොරෙන් එතෙරවීමද, මීට ම ඇතුලත් වේ. 'අත්ථසාධක' නම් අසවලා ලඟ තිබෙන අසවල් බඩුව යම් දවසෙක හැකිවීනම් ගණුවයි නියම කිරීමයි. නියමකාල තැනැත්තේ නියමකල තැන්සිට ද, ගත් තැනැත්තේ ගත් කෙණෙහිද පරිජි ඇවතට පැමිණේ. 'ධුරනික්ඛෙප' නම් ආරාම අභියුඤ්ජනාදියෙහි තමන්ගේද අනුන්ගේද දීම් ගැණුම් වලදී නිරුත්සාහ වීමයි. **පුබ්බපයොග පඤ්චකය**– පුබ්බපයොග, සහපයොග, සංවිදූවහාර, සංකෙත කම්ම, නිමිත්තකම්ම යන මොහුයි. අසවලාගේ බඩු ගණුවයි නියම කිරිමේදී, එය ගැණීමට පූර්වයෙහිදීම නියම කලහුට ඇවැත් සිදුවන බැවින් එය 'පුබ්බපයොග' නම්. මායිම් ගල් වෙනස්කොට කුඹුරු විශාල කරගැණීම් ආදියෙහිදී ගැණීම සමග ඇවතද සිදු වන හෙයින් එය 'සහපයොග' නම්. "අපි අසවලාගේ බඩු ගණිමු" යි බැණගෙණ සමූහයක් ව සොරකම් කිරීමෙහිදී එය එකෙකු ගත්කල්හි සියල්ලන්ටම පරිජි ඇවැත් සිදුවේ. මෙය 'සංවිදූවහාර' නම්. පෙර බත් ආදි යම්කිසි කාලයක් නියම කොට අසවල් වේලාවේදී අසවල් බඩුව ගණුවයි කියනලද්දේ නියම කාලයේම ඒ බඩු ගණිද, නියමකලහුට පරිජි ඇවැත් සිදුවේ. මෙය 'සංකෙත කම්ම' නම්. 'නිමිත්තකම්ම' නම් සුදුසු වේලාව හැඟවීම

පිණිස ඉඟි මැරීම මුහුණු හැකිළීම් ආදියයි. එසේ ශාත්‍ර සලකුණු අනුව සොරකම සිදුකෙරේ ද, සලකුණ කළහුම එය ඇඟවූ කෙණෙහිම ඇවැත් සිදු වේ. ථෙය්‍යාවහාර පඤ්චකය- ථෙය්‍යාවහාර, පසය්හාවහාර, පරිකප්පාවහාර පටිච්ඡන්නාවහාර, කුසාවහාර යන මොහුයි. යමෙක් සන්ධි බිඳීම් ආදියෙන් බඩු සොරකම් කොට ගණී ද, තුලාකූට මානකූටාදියෙන් වංචා කොට බඩු විකුණා ද මේ සියල්ල 'ථෙය්‍යාවහාර' නම්. යමෙක් බලාත්කාරයෙන් අනුන් සන්තක දෙය කඩා වඩා ගණී ද, රජ භටයන් මෙන් තමන්ට නියම ප්‍රමාණයට වඩා අධිකයක් ගන්ට උත්සාහ කෙරේ ද මෙය 'පසය්හාවහාර' නම්. යමෙක් රෙදි සොරකම් කරණ අටියෙන් බඩුතලට වැද අඳුරෙහිම බඩු පොදියක් ගෙණ යයි; එය රෙදි පොදියක් වීනම් ගත් කෙණෙහිම පරිජි ඇවතට පැමිණේ, නූල් පොදියක් නම් නැවත ගෙණැවිත් යථා ස්ථානයෙහි ම තැබුව හොත් රැකේ. නූල් වූවද වර දක් නැතැයි සිතා රැගෙණ ම යේ නම් දෙවෙනි පාදය ඉක්ම වූ කෙණෙහි පරිජි ඇවතට පැමිණේ. මෙය 'පරිකප්පාවහාර' නම්. යම් මහණෙක් උයන් ආදී තැනක අනුන් ගලවා තැබූ රන් මුදු ආදී යම් කිසි වටිනා දෙයක් දුක 'පසුව ගණිමි'යි වැල්ලෙන් හෝ පත්‍රයෙන් වසා තැබීය; ඒ මහණහට තවම පරිජි ඇවැත් සිදු නොවිය. හිමියෝ සම් ගෙහයකින් පැමිණ පරීක්‍ෂා කොටත් නොදුක දෙවෙනි දිනයෙහි පැමිණ සොයමුයි ආලයෙව ගියාහුය; ඔවුහු දෙවෙනි දිනෙහිද පැමිණ සොයා නොදුක ධුරනික්ෂෙපය කොට ගියාහුය. පසුව එය ඒ භික්ෂුව විසින් සඟවා තුබූ තැනින් ගන්නලැබිය. ඒ ගත් භික්ෂුහට භාණ්ඩදෙය්‍ය ය. පසුව දුකගෙණ ඉල්ලා නොදෙන්නහුම හිමියන්ගේ ධුරනික්ෂෙපයෙන් පරිජි ඇවැත් සිදු වේ. මෙය 'පටිච්ඡන්නාවහාර' නම්. කුස පත් දමා සිවුරු ආදී භාණ්ඩ බෙදීමකදී තමන්ට පැමිණි කොටස කඩා සොර සිතින් අනික් කොටසක් ගණු කැමැත්තේ, තමන්ගේ කුස පත අනික් කොටසට දමා, ඒ කොටසෙහි වූ කුසපත ගෙණ තමන්ගේ කොටසෙහි තබාද එකල්හි ඒ මහණ හට පරිජි ඇවැත් සිදුවේ. මෙය 'කුසාවහාර' නම්. මේ පඤ්ච අවහාරයන්හි දක්‍ෂ විනයධර තෙරුන් විසින් ඉදිරිපත් වූ කාරණ වහා විනිශ්චය නො කොට මෙහි මතු සඳහන් වන කාරුණු පස ගැණ ද කල්පනා කටයුතු ය.

"වත්ථුං කාලං ච දෙසං ච- අග්ඝං පරිභොග පඤ්චමං.
තුලයිත්වා පඤ්චඨානානි- ධාරෙය්‍ය අත්ථං විචක්ඛණො."

'වත්ථු' නම් භාණ්ඩයි. සොර මහණ තමන් ඒ බඩු ගන්නාලදැයි පිළිගත් කල්හි ඒ මහණ හට ඇවැත් ආරෝපණය නොකොට එය සස්වාමිකද අස්වාමිකදැයි පරීක්‍ෂා කටයුතුයි. සස්වාමික යයි දත් කල්හි හිමියන්ගේ ඒ ගැණ බලාපොරොත්තුව කෙසේදැයි පිරික්සිය යුතුයි. ඉදින් ආලය සහිත වූවක් නම් ඒ ආලයේ හැටියට වටිනාකම නියමකොට ඇවැත් ආරෝපණය කටයුතුයි, නිරාලය වස්තුවක් නම්

පරිජි ඇවැත් නියම්කළ නොහැක. හිමියෝ ඒ බඩු නැවත ගෙණයන්ට කැමැත්තෝ නම් බාරදිය යුත්තාහුයි. 'කාලය' නම් අවහාර කාලයයි. ඒ ඒ දෙය කිසි කාලෙක අගී. කිසි කාලෙක නො අගී. එබැවින් සොර කම කරණු ලැබූ කාලය පරීක්ෂාකොට ඒ කාලයට ගැළපෙන වටිනා කම අනුව ඇවැත් නියම කළ යුතුයි. 'දෙසය' නම් සොරකම් කළ ප්‍රදෙශ යයි. යම් ප්‍රාන්තයකදී සොරකම කරණලද්දේ නම් ඒ පළාතේ ඒ බඩුවල වටිනාකම අනුව ඇවැත් ආරෝපණය කටයුතුයි. 'අගය' නම් සාමාන්‍යයෙන් බඩුවේ වටිනාකමයි. අභිනව භාණ්ඩයේ නියම අගය පැරණිවූ කල්හි පිරිහේ. එබැවින් වස්තුවෙහි අභිනව පැරණි භාවය විමසා ඇවැත් ආරෝපණය කටයුතුයි. 'පරිභොග' නම් ප්‍රයොජනය ගැණීමයි. පරිභොගයෙන් ද වස්තුවෙහි අගය අඩුවෙයි. මස්සක් වටිනා වෑයක් නමුත්, ගසක අත්තක් සැපූ පමණකින් එහි වටිනාකම භාගයකින් පිරිහේ. කහවණුවක් වටිනා සිවුරක් නමුත් එක් වරක් පරිභොග කළ මාත්‍රයකින් මිල භාගයකින් අඩුවේ. එබැවින් ඇවැත් නියම කිරීමේදී පරිභොග භාවයද සැලකිය යුතුයි.

පාදං– කහවණුවකින් සතරෙන් කොටසක් පාද නම්. 'පොරාණස්ස කහාපණස්ස චතුත්ථො භාගො පාදො; පොරාණකස්සාති පොරාණසත්ථුරූපං උප්පාදිතස්ස ලක්ඛණසම්පන්නස්ස නීලකහාපණස්ස;" "මිස්ස කහාපණෙනෙව නීලකහාපණො, පඤ්චමාසො සුවණ්ණස්ස තථා රජතස්ස, දසමාසං තම්බස්ස, එතානි වීසති මිස්සෙත්වා ඡට්ඨභාගය වීහි මත්තං ලොහං පක්ඛිපිත්වා අක්ඛරානි ච ගහිපාදදීනම් අස්සතරස්ස රූපං දස්සෙත්වා කතො (නිද්දෙසතො) නීලකහාපණො නාම හොති." නීල් කහවණුවෙන් සතරෙන් කොටසක් පාද නම්. රන් පස් මස්සක්ද රිදී පස් මස්සක්ද තඹ මසු දසයක්ද යන මේ විසි මසු මිශ්‍රකොට වී ඇට යක්පමණ ලෝහද කලවම් කොට අකුරු හා යම්කිසි රූපයක් දක්වා කරණ ලද්දේ නීලකහාපණ නම්.

පඨව්‍යාරාජා– මුළු පොළොවටම අධිපතිකම කරණ රජතුමායි. දිපචක්කවත්ති අශොක රජහු මෙනි. පදෙසරාජා– ඒ ඒ පලාත් පාලනයෙහි යුක්ත රජතුමායි. බිම්සර රජහු මෙනි. අන්තරභොගිකා– දෙ රජ කෙනෙකුන්ට අයත් ප්‍රදෙශ දෙකක් අතරෙහි පිහිටි ගම් කීපයකට අධිපතීහුයි; අක්ඛදස්සා– විනිස කරු; 'අක්ඛ' යනු විනිශ හලට නමකි. එහි හිඳුන්නව වරද නිවරද පසිඳිනෝ 'අක්ඛදස්ස' නම්. අන්දුබන්ධනෙන– හිරගෙයක ලෑමෙන්; වධන්ති– රැස්තෙරෙයි. උබ්බරති– පන්නා පිටතට දමයි. ථෙනාවාවෙති– කෙසගක් පමණ නමුදු නැතින් ඉවත් කෙරෙයි. මුට්ඨිං වා ඡින්දති– මිටට ගත් කහවණු සැළියේ කහවණු සමග සැඥෙන සේ මිටි කරයි. සුත්තාරූළ්හං– නූල්වල අමුනන ලද මුතු ආදී යයි. මෙඛලං– හිස් මෙවුම; නාගදන්තං– නාදන්ත; බිත්තෙහි සවිකරණ ලද මුව අං ගෝණ අං ආදිය හෝ යම් යම් දේ එල්වා තැබීම පිණිස සිටු අසල් පමණ පිටතට නික්මුනු ඇණ වලින්

යුක්තව තිත්තිණේ සවිකිරීමට හැකිවන අයුරු තනාගණු ලැබූ බෝල කුඩුව; වය්හං– ගැලැත්ත මතුපිට මණ්ඩපයක් මෙන් සිටින සේ ශාත්පස ඇලිවලින් වසා තැනූ රථය. සන්දමානිකා– කණු සතරක් මතුයෙහි සතරැස් ලී සවිකොට වම් දකුණු දෙ දිසාවෙහි වූ සුලං වැළැක්වීම පිණිස ගුරුළු පියාපත් දෙකක් මෙන් දෙ පියැසි යොදා කළ රථය; සීසභාරෝ– හිසින් උසුලන බර; කන් සිළුවෙන් හා ගලවැටයෙන් මතු පෙදෙස 'සීස' නම්. ඛන්ධභාරෝ– කඳින් උසුලන බර; ගලවැටයෙන් යට වැළමිට දක්වා දෙ අත ද පිටමැද හා ආමාශය දක්වා කඳ ද යන මොවුන්ගෙන් සීමා වූ පෙදෙස 'ඛන්ධ' නම්. කටිභාරෝ– කටියෙන් උසුලන බර; හෘදයාවාටයෙන් ද පිටමැදින් ද යට පා නිය අග තෙක් පෙදෙස 'කටි' නම්. ඔලම්බකො– වැළමිට පටන් නිය තෙක්වූ අතින් උසුලන බර; පුබ්බණ්ණං– සාලි වීහි ආදි සත්තවිධ ධාන්‍යය; අපරණ්ණං– මුං මෑ ආදී ශෙෂ ධාන්‍යය. ධම්මං චරන්තො සාමිකං පරාජෙති– භික්ෂුසංඝයා මැද හෝ රජකුලෙහි හෝ නඩු විසඳීමකදී අත්ලස් දීම් ආදියකින් හෝ බොරු සාක්‍ෂි කීමෙන් හිමියා අහිමියා කොට පරදවයි. රජ්ජුං– හුම් වරේ ඇදපු රැහැණ; වතිං–වැට; තමන්ට අයිති කොටස මේ යයි හඟවනු පිණිස රැහැන් දඬු ආදියකින් පිරිසකාව් කරයි. නැතහොත් අනුන්ට අයිති කෙතක් තමන්හට අයිතිකර ගැනීම පිණිස දුව ආදියකින් වැටක් හෝ බඳියි. මරියාදං– නියර, තමන්ගේ කුඹුරු සීමාව ඉක්මවා අනුන්ගේ කුඹුරෙන් අඩුවන සේ නියර බඳියි. දන්තපොණං– දැහැටි, වනප්පතිං– වනදෙටුරුකා, තුන; හරණකං– ගෙණ යන දෙය; උපනිධි– ආරක්‍ෂාව පිණිස හිමියන් විසින් තමන් ලඟ තුබූ වස්තුව උපනිධි නම්. එසේ තුබූ බඩු ආණ්ඩු විප්ලවයකදී 'නුඹට ද නොදෙමි, මටද නොලැබේ' යයි සම අදහස්ව දෙදෙනාම ධුර නික්‍ෂෙපයකළ කල ගත්කල්හි පරිජි ඇවැත් සිද්ධ නො වේ. ආරක්‍ෂාව පිණිස දුන්දෙය හෙයින් පරිජි ඇවැත් වේයයි ඇතැම් ඇදුරන්ගේ මතයකි. අඞි– (අඞිගුණ්ඨිකාදීන්ගේ) සමූහයෙකි. ඔවරකො– අනුන්ගේ ගෙවල හෝ විහාරාරාමයන්හි ආරක්‍ෂාවෙන් තොරවූ බඩු සොය සොයා අසවල් අසවල් දෙය සොරා ගණුවයි සංඥාදීම් ආදිය කරණ තැනැත්තේ; ඔතිරසකො– 'මෙය මොහොතක් රකුව, මම මෙ නම් දෙයක් කොට එමි' යි අන්‍යයා විසින් ලඟ තුබූ බඩු ආරක්‍ෂා කරණ තැනැත්තේ; සංවිදාවහාරො– බොහෝ දෙනකු 'අපි අසවලාගේ බඩු ගණිමු' යි කථාකොට සෙණ ගොස් සොරා ගැණීමයි. ඔවුන් අතුරෙන් එකකු නමුත් බඩු ගත් කල්හි සියල්ලන්ට ම අවහාරය සිදුවේ. සඞ්කෙතකම්මං– කාලවේලාදිය නියම කොට කෙරෙණ බඩු සොරා ගැණීම; නිමිත්තකම්මං– සොරකම් කළයුතු වේලාව; හැඟවීම පිණිස ඉඟිබිඟි කිරීම; සසඤ්ඤිස්ස– 'මෙය මාසතු දෙයකැ' යි හැඟීම ඇතිව අනුන් අයිති දෙය ගත්තනුට; ගත්දෙය ආපසු දියයුතුයි. ඉදින් ඉල්ලන ලද කල්හි නොදේනම් හිමියාගේ ධුරනික්‍ෂෙපයෙන් (ආලය හැරීමෙන්) පරිජි ඇවැත් වේ. විස්සාසග්ගාහෙ– විශ්වාස ග්‍රාහය ඇතිකල්හි, එකී

ලක්ෂණ මෙසේය; "අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස විස්සාසං ගහෙතුං, සන්දිට්ඨො ච හොති සම්භත්තො ච, ආලපිතො ච ජීවති ච, ගහිතෙ ච අත්තමනො; 'සන්දිට්ඨ' නම් දුටු පමණින් මිත්‍ර වූ අයයි. 'සම්භත්ත' නම් දෘඪ මිත්‍රයායි. 'ආලපිත' නම් 'මට අයත් දෙයින් යමක් කැමති නම් ගණුව'යි කැමැත්ත ලැබූ තැනැත්තේ යි. 'ගහිතෙ අත්තමනො' ගත් කල්හි 'හොඳය'යි තුටු පහටුවන තැනැත්තේ "මොහු සතු දෙය මා ගත් කල්හි ජේ තුටුපහටු වන්නේ'යයි දන්නහු විසින් ම ගතයුතුයි. 'විස්සාසගාහය' අඞ්ගත්‍රයකින් සමන්විත වේ. එනම්, 'සන්දිට්ඨො ජීවති ගහිතෙ අත්තමනො;' 'සම්භත්තො ජීවති ගහිතෙ අත්තමනො;' 'ආලපිතො ජීවති ගහිතෙ අත්තමනො' යන මොහුය. යමෙක් ජීවත් වේද, ගත් කල්හි තුටුපහටු නොවේද, එකල්හි විස්සාසගාහයෙන් ගත් දෙය ආපසු දිය යුතුයි. 'මා අසිති අසුවල් දෙය ගැණීමෙන් තොප විසින් කරණලද දේ යහපත්නැ'යි පළමු වෙන් කියා හෝ සිතා තුබුනු දෙයක් නැවත කිපී ආපසු ගන්නට නොවටී. යමක් ගණු ලබන කල්හි නොදෙනු කැමැත්තෙන් වචනයෙන් කිසිත් නොකියා ඒ ගැණීම සිතින් ඉවසා ද? එසේ ගත් දෙය නැවත කිපීමකින් හෝ ආපසු නොගතනැකියි; 'මා විසින් තොප සන්තක වූ මෙනම් දෙයක් ගන්නා ලද්දේය, මෙපමණ කලක් පරිභොග කරණ ලද්දේය'යි කී කල්හි, 'ඒ දෙය මා විසින් කිසියම් ප්‍රයෝජනයක් උදෙසා තබනලද්දකි. එය තුබුනු ලෙසින් ම කළහොත් මැනව'යි හිමියා ඉදින් කියා නම් එය ආපසු දෙන්ට වටී. 'නැවත දෙමී'යි තාවකාලික වශයෙන් ගැණීමෙහි ද අනාපත්තිය. එසේ ගත්දෙය හිමියා විසින් එය තොපට ම වේවයි කියා නම් ගැණීම වටී. නො එසේ නම් ආපසු භාරදිය යුතුය. සඞ්ඝ සතු දෙය නම් ආපසු දියයුතු ම ය. ප්‍රේතයන් අයත් දෙයෙහිද, චාතුර්මහාරාජික දෙවියන් අයත් දෙයෙහිද අනාපත්ති වේ. ශක්‍රයා සල්පිලක් විවෘත කෙළේය. එය දුනගත් දිවැස් ඇති භික්ෂු නමක් ලක්ෂයක් අගනා වස්ත්‍රයක් 'නොගණුව, නොගණුව'යි කියද්දීත් ඒ සල්පිලෙන් හැරගති, එය ඒ භික්ෂු හට අනාපත්තිකරය. දෙවියන්ට බිලියම් පිණිස ගසක හෝ එල්වා තුබූ දෙයක් ගැණීමෙහි කියයුත්තක් ම නැත. දෙවාලයවල නියුක්තයන් විසින් රක්නා ලද්ද ගන්ට නො වටී. තිරිසන් ගතයන් සතු දෙය ගැණීමෙහිද අනාපත්ති වේ. නා රජු හෝ ගුරුළු රජු විවෘත කළ සල්පිලකින් වුවත් පෙරලෙස වස්ත්‍රාදිය ගැණීමද නිවරද ය.

එහෙත් බඩ සගින් පෙළෙන සතුන් අනුභව කරණ මස් ආදිය උන් එලවාදමා උදුරාගෙණ අනුභවකිරීම කාරුණාවට හානියක් වන හෙයින් නොසරුප්ය. ආර්යවංශිකයෝ සවකීය පාත්‍රයෙහි වූ ආහාර අනුභව කරණ සුනඛාදීන් පවා එලවා නොදමති. තිරිසන් ගතයන්ට පරිත්‍යාග කළ ආමිසයෙන් යම් කුසලයක් සිදුවේනම් ඔවුන් අනුභව කරණ දෙය පැහැර ගැණීමෙහිදී ඊට සමාන අකුසලයක් සිදු වේයයි ඔවුහු සලකති.

අසාමිකා වූ යමක් පාංශුකූල සංඥාවෙන් ගැනීම ද අනාපත්තිය. එහෙත් ඊට හිමියෙක් වේ නම් පරීක්ෂාකොට එය භාරදිය යුතුයි. **නිරුත්තිපථෙ**- සොර සිතක් නැති හෙයින් වූ ව්‍යවහාර වචන මාත්‍රයෙහි; **අග්ගිනො සරීරෙ**- උණුසුම් ගතිය රඳා පැවැති නොබිඳී මළ සිරුරෙහි; එබන්දක් වේනම් එය සොහොන් හොවුවන්ට දන්වා ගෙන් වා ගතයුතුයි. නො එසේ නම් ආයුධයකින් හෝ මළ සිරුර මදක් සිදුරුකොට එය ගැණීම වටී. **සූනාඝරං**- විකිණීම පිණිස මස් පිසන ගෙය; **න ච භික්ඛවෙ වුත්තො වජ්ජෙමීති වත්තබ්බො**- මම නුඹ විසින් කියවුනෙමියි සිතා නුඹගේ වචනයෙන් කියමියි අනෙක් භික්ෂුවක්හට අන් මහණකු විසින් නොකියයුතුය යන අර්ථයි. **වුත්තො වජ්ජෙහි**- නුඹ මා විසින් කියන ලද්දෙහි යයි සලකා මාගේ වචනයෙන් කියව. **අකල්ලකො**- ගිලනා; **සූකරමංසනුමොචෙති**- (පාසයෙහි බැඳී හුන් ඌරන් මිදූ හෙයින් අනාපත්තිය. එහෙත් හිමියෝ නොසතුටු වෙත් නම් එය භාණ්ඩදෙය්‍යය. එබැවින් ඊට මිළ ඌරන් ගෙන්වා දියයුතුය. නැතහොත් එපමණ අගනා දෙය හෝ දිය යුතුය. හිමියන් නො සඳුනා නම් පාසය හාත්පස එපමණ අගනා සිවුරු හෝ කැප දෙයක් පැමිණියවුන්ට වහා පෙනෙනසේ තැන්පත් කළයුතුයි.) **යෙනකාබුල පායාසං**- (තල සහල් මුං හෝ, තල සහල් මෑ හෝ, තල සහල් කොල්ලු හෝ, තල සහල් දෙක යම්කිසි අපරණ්ණ ධාන්‍යයක් සමග මිශ්‍රකොට ගන්නා ලද්ද සතරෙන් කොටසක් ජලය මිශ්‍ර ක්ෂීරයෙහි බහා පිසගත් ගිතෙල් මී සකුරු ආදිය යෙදූ) එනම් කැඳ: **ඔධුමණාලකා**- අසිරස සැඳුම්.

## දුතිය පාරාජික ගැටපදය නිමි.

---

**කූටාගාරසාලායං**- මහාවනෙහි කරවනලද සඞ්ඝාරාමයෙහි, එහි වූ පහය බල්ක මතුපිට කණු සිටුවා මුදුන් සහිතකොට කළ කෙන් දෙව් විමනක් මෙන් බබලන්නකි. බුදුරජානන්වහන්සේගේ මහ විහාරයෙහි වූ ගඳකිළිය මෙයයි. ප්‍රධාන ගෘහය කූටාගාර සහිත වූවක් හෙයින් සකල සඞ්ඝාරාමයම 'කූටාගාර සාලා' නමින් ප්‍රකට විය. **අසුභ කථං කථෙති**- (මහණනි, ව්‍යාම මාත්‍ර වූ මේ සිරුරෙහි ඉතා සියුම් ලෙස පරීක්ෂා කරන නමුවුවත් මුතු මැණික් ආදි කිසියම් රත්නයක් හෝ සඳුන් අගිල් ආදී සුගන්ධ ද්‍රව්‍යයක් හෝ නොලැබිය හැක. දුර්ගන්ධවූ එසේම පිළිකුල් කටයුතුවූ කෙශලොමාදි අසුචියක්ම දකින්ට ලැබේ. එහෙයින් මෙහි ඇලීම නො කටයුතුය යනාදි වශයෙන්) අසුභ නිඃශ්‍රිතවූ කථා වදාරයි. **පටිසල්ලීයිතුං**- හුදකලාව වාසය කරන්නට; **අනෙකාකාරවොකාරං**- නොයෙක් අයුරින් සම්මිශ්‍රවූ; **අට්ටියන්ති**- කය හෙතුකොට ගෙණ දුඃඛිතයෝ වෙත්; **හරායන්ති**- ලජ්ජිතයෝවෙත්; **ජිගුච්ඡන්ති**- ශරීරය කෙරෙහි හටගත් පිළිකුල්බැව් ඇත්තෝ වෙත්. **මිගලණ්ඩිකො සමණකුත්තකො**- 'මිගලණ්ඩික' යනු ඔහුගේ නාමයයි. මහණ වෙස් දරණ හෙයින් සමණකුත්තක නම් විය. හේ වනාහි සිය තුබ,

හිස මුඩු කොටගෙණ එක් සිවුරක් හැඳ එක් සිවුරක් එකස්කොට පොර
වා විහාරය ආශ්‍රය කොට ගෙණ ඉතා දුකසේ ආහාරපාන ලබමින් ජීවත්
වූවෙකි. දුල්ලභං වත මෙ- කුසලානුභාවයෙන් ලැබූ මේ මිනිසත් බවද
එකාන්තයෙන් මට දුර්ලභ වීය. අඤ්ඤතරා මාරකායිකා- නාම වශ
යෙන් අප්‍රකට වූ මාරපාක්ෂික වූ එක් බුමාටු දෙවියෙක්; මේ තෙමේ
සියල් අබරණින් සැරසී තමන්ගේ අනුභාවය පෙන්වන්ට මෙන් ජල
යෙහි නො හැපී ජලය මතුයෙහි සක්මන් කරන්නේ සමණකුත්තකයා
අමතා මෙසේ කීය. අතිරොණනාරෙසි- සසරින් එතර වූවමත්
මෙසේ දිවිගැලවීමෙන් එතරකාරව; ආනාපානසතිසමාධි- ආශ්වාස
ප්‍රශ්වාසයන් අරමුණුකොටගෙණ පවත්නා සිහිය සමග ඇතිවන සිතේ
එකඟ කම; භාවිතො- වඩන ලද්දේ; බහුලීකතො- නැවත නැවත
කරණ ලද්දේ; අසෙචනකො- සවභාවයෙන් මධුරය. පරිකර්මාදියෙන්
අසම්මිශ්‍රය. එහෙයින් අතිත්තිකරය යනාර්ථයි. සුඛොච විහාරො
සවභාව මධුර හෙයින් අර්පිත අර්පිත ක්ෂණයෙහි කායික චෛත
සික සුඛ ප්‍රතිලාභය පිණිස පවතී නුයි සුඛ විහාර නමැයි දතයුතුයි. ගිම්
හානං පච්ඡිමෙ මාසෙ- ඇසළමාසයෙහි; ඌහතං රජොජල්ලං (අවුසුල
ගින් වියලි ගෝමහිෂාදීන්ගේ පා පහරින්) ඇවිස්සී අහසට නැගුනු දූලි;
මහා අකාල මෙඝො- මහ අකල් වැස්ස; ඇසළ පුර පක්ෂයට අයත්
අඩමස මුළුල්ලෙහි අනස වහා සිට වස්නා වැස්ස අකාලයෙහි උපන්
හෙයින් අකාල මෙඝ නමින් ප්‍රකට විය; රුක්ඛමූලගතො- වෘක්ෂමූල
යට පැමිණියේ; මෙහි මූල ශබ්දය සමීපාර්ථවාචීය, සුඤ්ඤාගාරගතො-
විවික්තවූ අවකාශ ස්ථානයකට පැමිණියේ; අරණ්‍ය, වෘක්ෂමූල
යන දෙසෙනසුන් හැර සෙසු පර්වත, කන්දර, ගිරිගුහා, සුසාන,
වනප්‍රස්ථ, අභ්‍යවකාශ, පලාලපුඤ්ජ යන සත් සෙනසුන් සුඤ්ඤ
ගාර නමි. ග්‍රීෂ්මකාලයෙහි අරඤ්ඤ සෙනාසනයද, හෙමන්ත කාල
යෙහි රුක්ඛමූල සෙනාසනයද, වසන්ත කාලයෙහි සුඤ්ඤාගාර
සෙනාසනයද, එසේම සෙම් අධිකයාහට අරඤ්ඤ සෙනාසනයද,
පිත් අධිකයා හට රුක්ඛමූල සෙනාසනයද, වාතාධිකයාහට සුඤ්ඤ
ගාර සෙනාසනයද සරුප් සෙනසුන් ය. පල්ලඞ්කං- ඌරුබද්ධා
සනය හෙවත් අරමිනිය නොහා වාඩිවීම, ආභුජිත්වා- බැඳගෙණ;
පරිමුඛං සතිං උපට්ඨපෙත්වා- කමටහනට අභිමුඛ කොට සිහිය
පිහිටුවා; සතොව අස්සසති- සිහියෙන් යුක්තවම ආශ්වාස කෙරෙයි.
අස්සාස' නම් ඇතුළට පිවිසෙන වාතයයි. දීඝංවා අස්සසන්තො- දීර්ඝව
හෙවත් දීර්ඝකාලයක් පවතිනසේ ආශ්වාස කරන්නේ; සබ්බකාය
පටිසංවෙදී- සියලු ආශ්වාස සංඛ්‍යාත කයේ මුල මැද අග ප්‍රකට
කරන්නේ; කායසඞ්ඛාරං- 'කායසඞ්ඛාර' නම් අස්සාස පස්සාස දෙක
මය. එය චිත්ත සමුට්ඨානවූයේද කරජකය පිළිබඳව පවත්නා හෙයින්
මෙනමි. පස්සම්භයං- සංසිඳුවමින්; පීතිපටිසංවෙදී- ප්‍රීතිය අරමුණු
වසයෙන් ප්‍රකට කරන්නේ; සුඛපටිසංවෙදී- කායිකවූද චෛතසිකවූද
සුඛය විඳින්නේ; චිත්තසංඛාරං- සඤ්ඤා වෙදනා යන චෛතසිකවූ

සිත පිළිබඳව පවත්නා හෙයින් චිත්තසඞ්ඛාර නම්. අභිප්පමොදයං- ප්‍රමෝදයට පමුණුවමින්; සමාදහං- අරමුණෙහි සමව පිහිටුවමින්; විමොචයං- (සිත ප්‍රථමධ්‍යාන හෙතුවෙන් නිවරණයන්ගෙන්ද, ද්විතීය ධ්‍යාන හෙතුවෙන් විතර්ක විචාරයන්ගෙන්ද, තෘතීයධ්‍යාන හෙතුවෙන් ප්‍රීතියෙන්ද, චතුර්ථධ්‍යාන හෙතුවෙන් සුඛයෙන්ද) මුදන්නේ; අනිච්චානුපස්සී- ඉපදී නැසෙන සවභාව ඇතිහෙයින් පඤ්චස්කන්ධ අනිත්‍යයෝය. ඒ පඤ්චස්කන්ධයන්ගේ ඉපදීම නැසීම අන්‍යථාභාවය අනිච්චතා නම්, මෙසේ පඤ්චස්කන්ධය අනිත්‍යතා වශයෙන් මෙනෙහිකිරීම අනිච්චානුපස්සනා නම්. අනිච්චානුපස්සනාවෙන් යුක්ත තැනැත්තේ අනිච්චානුපස්සී නම්. විරාගානුපස්සී- ඛය විරාගය, අච්චන්ත විරාගයයි විරාගය විවිධයි. සංස්කාරයන්ගේ ක්ෂණභඞ්ගය ඛය විරාග නම්. නිර්වාණය අච්චන්තවිරාග නම්. ඒ දෙක දැකීම් වශයෙන් පවත්නා විදර්ශනාවද මාර්ගයද විරාගානුපස්සනා නම්. ඒ දෙපරිදිවූ අනුපස්සනාවන්ගෙන් යුක්තවූයේ විරාගානුපස්සී නම්. නිරොධානුපස්සී- නිරොධය දැකීම් සඞ්ඛ්‍යාත අනුපස්සනාවෙන් යුක්තවූයේ නිරොධානුපස්සී නම්. පටිනිස්සග්ගානුපස්සී- 'පටිනිස්සග්ග' යනු විපස්සනාමග්ග දෙකට නමකි. පරිච්චාග, පක්ඛන්දන වශයෙන් පටිනිස්සග්ගය විවිධයි. විදර්ශනාව ස්කන්ධාභිසංස්කාරයන් සමග ක්ලේශයන්ද තදඞ්ග වශයෙන් දුරුකරයි. ඒ පරිච්චාගපටිනිස්සග්ග නම්. සියලු කාමාදීන් දුරුවීමෙන් නිවන්කරා නැමුනු හෙයින් එහිබැස ගැනීම පක්ඛන්දන පටිනිස්සග්ග නම්. අකතං කල්‍යාණං- කල්‍යාණ දෙය තුඹවිසින් කරණලදී. අකතං කුසලං- නිරවද්‍යදෙය කරණලදී. අකතං භීරුත්තාණං- මරණය පැමිණිකල්හි වන බියෙන් ආරක්ෂාවීම පිණිස කටයුතු දෙය කරණලදී. අකතං පාපං- ලාමකදෙය නොකරණලදී. අකතං ලුද්දං- දරුණුවූ දුස්සීලකම් තුඹවිසින් නො කරණලදී. අකතං කිබ්බිසං- ලොභාදි ක්ලේශයන් උත්සන්න වීමෙන් සිදුවන සාහසික දේ නො කරණලදී, මතං තෙ ජීවිතා සෙය්‍යො- තුඹගේ මරණය ජීවත්වීමට වඩා හොඳය. පඤ්චහි කාමගුණෙහි- (මනාප වූ රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ යන) පස්වැදෑරුම් වස්තුකාමයන්ගෙන්; සමප්පිතො- මනාව යෙදුනේ; සමඞ්ගීභූතො- එකතුවූයේ; පරිචාරෙස්සති- ඔබමොබ හසුරුවන්නේය. අසප්පායානි- අහිත, එසේම වහා ජීවිතක්ෂයට පමුණුවන සුලු;

පඨමං චිත්තං- ප්‍රතිසන්ධිචිත්තය; පඨමං විඤ්ඤාණං- යනුද මීට පර්‍යායවචනයි. මෙයින් කලලරූපය ගැණේ. එහි 'කායදසක, භාවදසක, වත්ථුදසක' වශයෙන් රූප කොටස් තිසකි. එය විනාශකිරීමද මනුෂ්‍ය විග්‍රහ සඞ්ඛ්‍යාවට අයිති වේ. එබැවින් ආපත්තිකරය. ජීවිතා වොරොපෙය්‍ය- යථොක්ත කලලරූපය කලල අවස්ථාවේදීම තැවීම්, මැඩීම්, ගැබ් හෙලන බෙහෙත් යෙදීම් ආදි උපක්‍රමයකින් දිවියෙන් ගලවා නම්; ජීවිතින්ද්‍රියං- රූපඅරූපවශයෙන් විප්‍රකාරවූ ජීවිතෙන්ද්‍රිය; එයින් අරූප ජීවිතෙන්ද්‍රිය විෂයෙහි උපක්‍රමයක් යෙදිය නොහැකිය. එසේම එය විනාශ

කරන්ට ද නො හැකිවේ. රූප ජීවිතෙන්ද්‍රිය භංගයෙහි උපක්‍රමද ඇත, විනාශද කටහැකිය. රූපජීවිතෙන්ද්‍රිය නැසීමෙන් අරූපජීවිතෙන්ද්‍රියද නැසේ. ඊටම අයත් හෙයිනි. මෙසේ සිදුවන ජීවිතෙන්ද්‍රියවිනාශය බල පවත්වන්නේ පච්චුප්පන්න ජීවිතෙන්ද්‍රිය විෂයෙහි පමණක්ය. අතීත අනාගත ජීවිතෙන්ද්‍රියයන්ගේ අභාවය නොවන හෙයිනි. යෙනාතිං ඕපක්කමති– සන්තතිය විනාශ කෙරෙයි. ඛණ, සන්තති, අද්ධායයි පච්චුප්පන්නය ත්‍රිවිධයි. උත්පත්ති, ජරා, භඞ්ග යන ත්‍රිවිධ ක්‍ෂණය ඛණ පච්චුප්පන්න' නමි. එය අනුන්ගේ ව්‍යාපාරයකින් විනාශ නොකට හැකිවෙයි, තමන්ම විනාශ වන හෙයිනි. සන්තති පච්චුප්පන්නය වනාහි ජවනවාර හත අටක් සභාග අරමුණු වශයෙන් පැවත නිරුද්ධවන්නකි. අව්වෙහි සිට කාමරයකට පැමිණ පුත්කනු ගේ ඇස්වල අඳුරු ගතිය යම්තාක්කල් පවතීද, සිසිල් තැනකින් අව්වට කාමරයකට වැදුනහුගේ විෂභාග සෘතු ගුණ පහලවීමෙන් පලමු සිසිල්ගුණය යම්තාක්කල් නොනැසී පවතීද මේ අතර පැවති කාලය 'සන්තතිපච්චුප්පන්න' නමි. පටිසන්ධියෙහි පටන් ච්‍යුතිය තෙක් අතර කාලය 'අද්ධාපච්චුප්පන්න' නමි. සන්තති අද්ධා යන පච්චුප්පන්නවයම විනාශ කටහැකිය.

සත්ථහාරකං– දිවිනසන ගල් මුගුරු විෂ රැහැන් ආදිය; ජීවිතංහරතීති හාරකං' සත්ථං ච තං හාරකං චෙති 'සත්ථහාරකං'. ලගුලං– මුගුර; මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය– මරණයෙහි අනුසස් කියන්නේ නමි; "තුඹගේ මේ ලාමකවූ ජීවිතයෙන් ප්‍රයෝජන කවරේද, ප්‍රණීත භොජනයක්වත් වලඳන්නට නො ලබන් නෙහිය," යනාදි ක්‍රමයෙන් ජීවත්වීමෙහි ආදීනව දක්වමින් "උපාසකය, තුඹ කළ පින් ඇත්තෙක් වෙහිය; පව්කම් නො කෙළෙක් වෙහිය; තුඹගේ මරණය ජීවත්වීමට වඩා ශ්‍රෙෂ්ඨය; තුඹ මෙයින් පරලොව ගියකල දෙවගනන් හා නන්දනවනයෙහි සැපසේ වාසය කරන්නෙහිය;" යන ආදි වශයෙන් මරණයෙහි අනුසස් පවසන්නේය. මරණං වා සමාදපෙය්‍ය– මැරෙන්නට උපායද පෙන්වන්නේ නමි; ඉති චිත්තමනො– මෙසේ මරණය පිළිබඳවූ සිත් ඇත්තේ; උච්චාවචෙහි ආකාරෙහි– මහත්වූද කුඩාවූද උපායවලින්; සොබ්භෙ– ගැඹුරු ආවාටයෙක්හි; නරකෙ– ප්‍රාචීරය තමන්ම දෙබෑවීමෙන් හටගත් ඉහවලෙක; නිස්සගගියෙන– දමාගසනු ලබන සත්ත්වතෝමරාදියකින්; අපිට්ඨසිත්වා– සමීපයෙහි සිටගෙණ;

'වත්ථු කාලො ච ඔකාසො–ආවුධං ඉරියාපථො
කිරියා විසෙසොති ඉමෙ–ඡ ආණත්ති නියාමකා'[1]

මොහු ආණත්තිකප්‍රයෝගයෝයි. 'වත්ථු' නම් මැරියයුතු සත්ත්වයාය. 'කාල' නම් පූර්වාහ්ණාදි කාලයයි. යෞවනාදි කාලය ගෝ ගන්නේය. 'ඔකාස' නම් ගමය වනය ආදිවූ ස්ථාන නියමයයි; 'ආවුධ' නම් කඩු, දුනු ආදි ආයුධයයි. 'ඉරියාපථ' නම් ගමන, නිසජ්ජාදි පැවතියයුතු ඉරියව්වයි. 'කිරියාවිසෙස' නම් විදීම, කිස සිඳීම ආදි මරණයට පමුණු

වන අයුරැයි. ආරහො රහො සඤ්ඤිනො- 'අරහො' ඉදිරියෙහි සිටි තැනැත්තේ; 'රහො'- අනභිමුඛයෙහි සිටි තැනැත්තේ; ගම් සිසු නමක් උපස්ථාන කාලයෙහි අන්‍ය භික්ෂූන් සමග පැමිණි වෛරි මහණ ඉදිරියෙහි හුන්නේම අඳුරු හෙයින් නොදක්නේ වෛරි භික්ෂුහට "අසුවල් භික්ෂුව සොරුන්වත් නසතු ලැබුවොත් යහපතැ" යි කියයි. මේ අභිමුඛයෙහි සිටියහුට අනභිමුඛ සංඥීව කථාකිරීමයි. එසේම ඒ භික්ෂුතෙමේ උපස්ථානයට පැමිණ හුන්නාහු අන් භික්ෂූන් සමග පෙරළා ගියකල්හිද ඉදිරියෙහි දැනුදු සිටියයි සලකා කථාකෙරෙයි. මෙය අනභිමුඛ වූවහුට අභිමුඛ සංඥීව කථා කිරීමයි. මෙසේ කථාකරණ භික්ෂු හට වචන ගණනින් දුකුළා වේ. ලෙඛං ඡින්දති- (යමෙකු අසවල් ආයුධයෙන් හිස සිඳගෙණ හෝ අසවල් ප්‍රපාතයට පැන හෝ ගින්නට පැන හෝ මේ ආදි උපායකින් දිවිගලවාගණී නම් හේ මේ මේ දෙය ලබන්නේ යයි) පත්‍රයක හෝ පතණක ලියවා තබයි. ඔපාතං ඛනති- අසවල් තැනැත්තේ මෙහි වැටී ජීවිතක්ෂයට පැමිණේවායි යමෙකු උදෙසා ආවාටයක් කණියි; ඔහුම එහි වැටී මළ කල්හි පමණක් ආවාටය කැණූ භික්ෂුව පරිජී ඇවතට පැමිණේ. අනිකෙකු වැටී මළකල ඒ භික්ෂුහට අනාපත්තිය. පුද්ගල විශෙෂයක් නොමැතිව තාගේ නමුත් එහි වැටී මැරී ම පැයී නම් එහි වැටී මළුවුන්ගේ ගණනින් ඇවැත් සිදුවේ. ආවාටය කැණ ගතවම් ගණනක් නමුත් ගුහුක්වූ කල්හි දු සන්නිට්ඨාපක චෙතනාවශයෙන් ඔහුට ඇවැත් සිදුවේ. මවුපියන් එහි වැටී මැරීමෙන් ආනන්තරිය කර්මය පවා සිදුවිය හැක. ඉදින් යකිණියක් වැටී මළා නම් ඇවැත් දෙකක්ම සිදුවේ. සොරුන් විසින් ලුහුබැඳුනෝ වැටී මළේ නම් ඔපාතඛනකය කළහුට ඇවැත් සිදුවේ. ආවාටයෙහි වැටී එහිදී කාලක්‍රියා නොකොට එයින් නගගත් වෙදනාවෙන් ම ගොඩට පැමිණි කල මැරේද, ඒ ආවාටය කැණූවහුට පරිජි ඇවැත් සිදුවේ. ආවාටය අන්‍යයෙකුට විකුණනලද්දේද, නැතහොත් පරිත්‍යාග කරණලද්දේද; එහෙත් යමුන් වැටී මැරීමෙන් සිදුවන අකුශලය මුල් කිමියා කරා පැමිණේ. ඒ ආවාටය පිහිටි තැන පොකුණක් හෝ කොරේද, ගොඩ කරවා ඊ මත චෛත්‍යයක් හෝ බඳවා ද බෝධියක් හෝ රෝපනය කරවාද, ගැල් මගක් හෝ පිහිටුවාද, එතැන් පටන් මුල් කිමියා එයි අයිතිකාරයෙකු නොවන හෙයින් මිදෙයි. අන්‍ය වූ උගුල් ඇටවීම් වලදීද මෙම ක්‍රමය සැලකිය යුතුයි.

අපස්සෙනං- භික්ෂු පරිභොගය පිණිසවූ ඇඳපුටු ආදියද යාන්ත්‍රි ඊමට ආධාරවන වැම්මහෝ රැක්ද 'අපස්සෙන' නම්. දූසිලං කරොති- (ඇඳපුටු ආදිය වැල් හීපයක් ඉතිරිවනතෙක් සානාහැර) දුර්වල කරයි. එය ඉදිරියකින් හෝ පැදුරකින් හෝ ඇතිරිල්ලකින් වසා දමයි. ශටකාශයෙහි ආදුබ ආදියක් තබයි. උපනික්ඛිපනං- යම්ස්ථානයෙහි යමක් තැබීම; "යමෙක් මේ අවියෙන් හිස සිඳගෙණ මළේනම් නොහොතම් ඔබාගෙන වයතුම ලබන්නේය" යි ආසන්නයෙහි යම්කිසි අවියක් තබයි. උපසංහරණං-

(යම්කිසි මහණෙක් වෛරී භික්ෂුනමකට අසාධ්‍ය රෝගයක් වැළඳුනු කල්හි මරණ චේතනාවෙන් ඔහුට අහිත වූ හිතෙල් ආදි) බෙහෙතක් දෙයි. රූපූපහාරෙ- අමනාප රූපයෝ බියජනක යම්ක් ඔහු ඉදිරියෙහි තැබීමෙහි; යක්ෂ ප්‍රේතාදි වෙස් ගෙණ බිය දනවා මරණ අදහසින් ලඟ සිටීමෙහි; අමනාපසද්දූ- තැති ගන්වන සුලුවූ අමනුෂ්‍ය ශබ්දදිය; අමනාපගන්ධා- හිමාලයයෙහි සංජාත විෂවෘක්ෂයන්ගේ මුල්වල ගඳ ද, එසේ ම කුණපගන්ධාදිය ද අමනාප ගන්ධ නම්. ධම්මූපහාරෙ- 'ධම්ම' නම් දෙශනා ධර්මයයි. දෙශනා කිරීම් වශයෙන් දක්වෙන නිරයෙහිද ස්වර්ගයෙහිද විපත්ති සම්පත්ති භෙදසඞ්ඛ්‍යාත ධර්මාරම්මණය ධම්මූපහාර නම්. නෙරයිකස්ස- හීනවූ සංවරය ඇති එහෙයින් ම කරණලද පව් ඇති නිරයෙහි ඉපදීමට සුදුසු වූ සත්වයාහට; පඤ්චවිධ බන්ධන කම්ම කරණාදි වූ නිරය පිළිබඳ කථාවන් අසා තැතිගැණීමෙන් යමෙක් මරණයට පැමිණේද, ධර්මදෙශකයාහට පරිජි ඇවැත්වේ. ඉදින් ස්වභාව යෙන් මරණය සිදුවේද දෙශකයාහට අනාපත්තිය. සුමෙධාහරණානී- (ස්වාමිනි, කවර අනුරසින් මළහොත් කෙතෙමේ ධනය ලබාද? ස්වර්ගී යෙහි උපදීදැයි) විචාරණ ලද්දේ එසේ කියයි. අප්පටිවෙක්ඛිත්වා- පරීක්ෂා නොකොට; ඇතිරිලි නො අතුරණලද පිරිසිදු ආසනයද, එසේම ඉදිරි පිට ද ඇතිරිලි අතුළ ආසනයද පරීක්ෂා නො කළාට මරදක් නොමැත. යම් කෙනෙකු අසුන ඇතින් පිරිමැද "ස්වාමිනි, මෙහි වැඩහිඳිනුමැනව"යි කියා දුන් අසුනද; පළමු භික්ෂුනමක් වැඩහුන් ඉන් ඉවත්වී පාමාදුන් අසුනද, කුනිමූ මයාත්‍රකින් මෙයක ලද හෙයින් පුකඩිව පෙණෙන අසුනද පරීක්ෂා නොකළාට මරදක් නැත. අනික් අසුන්හි පරීක්ෂා කොට ම වැඩහිඳින්ට වටී. මුසලෙ උක්ඛලෙ- මොහොල් දෙක එකතට අතිස ආධාර මක අයුරින් බිත්තියට හාත්සි කොට තැබූ කල්හි; උදුක්ඛලභණ්ඩිකං- වංගෙඩියක් කපාදු පිණිස ගෙණෙන ලද දවය. අග්ගකාරිකං- පළමුවෙන් ලබනලද පිණ්ඩපාතය; සාරාණීය වත් පුරණ භික්ෂූන් වහන්සේ අග්‍රපිණ්ඩය සබ්‍රම්සරුන්ට දන්දී වළඳති. මෙහි 'කාරික' ශබ්දය 'කිරියං' යන්නා හා සමානාර්ථ වෙයි. අම්බකං- මැස්ස; අනභිරතියා පීළිතො- උත්කණ්ඨාවූ කාමචෙතනාවෙන් පීඩිත වූයේ; මේ තෙමේ උපන් කාමචෙතනාව මැඩලිය නොහැකි වූයේ ශාසනය කෙරෙහි අනභිරතියෙන් ගිහි බවට පැමිණෙන්නට සිතා, සිලභෙදයට පැමිණෙන්ට පළමු මැරෙමියි කල්පනා කොට, ප්‍රපාතයකට පැන්නේ විලීවකාරයෙකු යට කොට මැරීය. පවුත්ථපතිකා- පිටරට විසීමටගිය හිමියා ඇති ස්ත්‍රිය. ලොණසොවීරකං- සියලුරසයන් මිශ්‍ර කොට තබා කල්ගිය කල්හි ගපරගණු ලැබූ එක් අරිෂ්ට විශේෂයකි. සකල ධාන්‍ය වර්ගද, මුං මෑ ආදි අපරණ්ණයන්ද, සප්තවිධ ධාන්‍යයෙන් පිසගණු ලැබූබත්ද, ඉඳුනු කෙසෙල් ගෙඩි ආදි සියලු ඵලවර්ගද, වේවැල් ඉඳි ආදි සියලු ගොබ වර්ගද, සකල මත්ස්‍ය මාංශ වර්ගද, මී පැණි, සවිදලුණු ආදියද, එසේම සියලු කුළුබෙහෙත් වර්ගද සමව ගෙණ, හිතෙල් කවා පිළියෙල කරගත් කළයෙහි බහා ප්‍රමාණයට

තිපල් කෂාය වක්කොට මැටිබැඳ අවුරුදු එකක් දෙකක් හෝ තුනක් බුළුල්ලෙහි පසෙක තැන්පත් කොට තබා, මැටිකඩා වපුන් හැර පෙරාගත යුතුයි. මනාව පැසුනු කල්හි දඹපැන් වැනි පැහැය ඇතිවේ. වාත, කාස, කුෂ්ඨ පාණ්ඩු භගන්දරාදි රෝගයන් ගෙන් පෙළෙන්නන් හට ද, එසේම සිනිදු ආහාර අනුභව කරන්නන්ටද මෙය ඉතා ප්‍රත්‍යක්ෂය. භික්ෂූන්ට පසුබක් කාලයෙහිද වැළඳිය හැක. මෙය ඇතැම් තෙනෙක් යාමකාලික යයි ද සමහර කෙනෙක් සත්තාහ කාලික යයි ද කියත්.

තෘතීය පාරාජිකා ගැටපදය නිමි.

---

ගිහීනං කම්මන්තානං අධිට්ඨාම- ගිහියන්ට "කෙත්වත්වල කටයුතු දෙය මේය නොකටයුතු දෙය මේය" යි කියමු. අධි පූර්ව 'ඨාගති නිවුත්තියං' යන ධාතුයි. මෙහි ඨා ධාතුව අවබෝධාර්ථයෙහි වේ. උත්තරිමනුස්ස ධම්මස්ස- මිනිසත් බව ඉක්මවූ, බ්‍රහ්මාත්මභාවය පිළිබඳවූ හෝ නිවන් පසක් කරදෙන දහම් පිළිබඳ, අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්ස ධම්මස්ස වණ්ණං භාසිතො- (පහත් ඉරියව්වෙන් හුන්නාවූ හෝ සක්මන් කරන්නාවූ භික්ෂූන් ගැන විචාරන්නාවූ හෝ නොවිචාරන්නාවූ ගිහියන්ට) ඔවුනොවුන් විසින්ම 'අසවල් භික්ෂුව ප්‍රථමධ්‍යානලාභිය' යනාදි ක්‍රමයෙන් ඒ ඒ භික්ෂූන්ගේ උතුරු මිනිස්දම් පිළිබඳ වර්ණනය ශ්‍රේෂ්ඨවශයෙන් කරණලද්දේ වන්නේ ය. 'භාසිතො' භාස ධාතු කෙරෙන් 'ත' ප්‍රත්‍යයව සිද්ධ අතීත කෘදන්තයකි. 'භාසිතො භවිස්සති' යන අනාගත සම්බන්ධය වනාහි 'අයථා කාල විහිතාපි පච්චයා සාධවො භවන්ති' යන න්‍යාය හෙයින් සිද්ධවූවකි. වණ්ණවා අහෙසුං- (වණ්ණවා යනු වණ්ණවන්තු ශබ්ද පඨමා බහුවචනයි. වනෙ කාපිලවත්ථුවා යනාදි තන්හි මෙනි) අමුතුම ඇතිවූ සිරුරු පැහැයෙන් වර්ණවත් වූවාහුය. පීණින්ද්‍රියා- පඤ්චප්‍රසාද වස්තූන්ගේ මෙන් හෘදයරූපයාගේ ද පරිපූර්ණත්වයවූ හෙයින් සිත සවැනි කොට ඇති ඉන්ද්‍රියයන්ගේ නොමැලවුනු ගතිය ඇත්තෝ; පසන්නමුඛවණ්ණා- මෙය ශරීර පැහැයට වඩා මුහුණේ පැහැය අති ප්‍රණීත යයි දක්වයි. විප්පසන්න ඡවිවණ්ණා- මේ ප්‍රකෘති ශරීර වර්ණයාගේද ප්‍රණීතතරබව දක්වයි. මේ භික්ෂූහු උද්දෙස පරිපුච්ඡා වත්හි නොයෙදුනෝ කම්ටහන් නොපුරන්නෝ කුහක කමින් අභූත ගුණ වර්ණනාවෙන් ලැබූ බොජුන් අනුභව කරමින් කැමැති සේ නිද්දාරාම බැව්හි යෙදුනෝ මෙසේ සිරුරු පැහැපත් බවට පමුණුවා ගත්හ.

වග්ගුමුදා- (වග්ගු ව සා මොදයති සත්තෙති, වග්ගුමුදා, 'වග්ගුමදා' යනුද පාඨයි.) ප්‍රසන්නවූ තරඞ්ග ඇති; ගොවිකන්තනෙන- හෙරි කපන කැත්තෙන්; කුච්ඡිං පරිකන්තො,- බඩ කපාදමන ලද්දේ; 'පරිකන්තෙතා' යනු ද පාඨයි. අත්තමනො දෙසෙති- තමන්ම දැනගත් බැව් හඟවයි. පිරිස්මැද පෙළ ද අටුවා ද සඳ මිහිරි හඬින් ප්‍රසාදවත සූත්‍ර දේශනා කෙරෙති. දෙසුන් කෙළවර විස්මයට පැමිණි නුවණැත්තවුන්

විසින් "අනේ, සවාමීනි පෙළ ද අටුවා ද ගැලපා දහම් දෙසූ සැටි ඉතා මැනවි. ඔබවහන්සේ මෙසේ දහම් දෙසන්ට කාවුරුන් සමීපයෙන් උගත් සේක්දැ"යි විචාළ කල 'අපවැනියන්හට උගන්වන්ට කවරෙක් නම් සමර්ථවේදැ' යනාදීන් ගුරුවරුන්ගෙන් උගත් දෙය අමතක කොට සවයංභූඥානයෙන් දැනගත් බවක් හඟවයි. මේ තෙමේ බුදුරජානන් වහන්සේ විසින් සාරසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි දුකසේ පෙරුම් පුරා අවබෝධකර ගන්නාලද ධර්මය සොරකම් කරගත් දෙවෙනි සොරාය. සුද්ධං බ්‍රහ්මචාරිං- ක්ෂීණාශ්‍රව භික්ෂුව. පරිසුද්ධං- උපක්ලේශ රහිත; අමූලකෙන අබ්‍රහ්මචරියෙන අනුද්ධංසෙති- ඒ පුද්ගලයා කෙරෙහි අවිද්‍යමානවූ අනාචාර වස්තුවෙන් චෝදනා කරයි. මේ විද්‍යමානවූ ගුණය මකනසුලුවූ ආර්‍යගුණයන් සොරකම් කරගත් තෙවෙනි මහසොරායි. ගරුභණ්ඩානි- ගරුබඩු; පස්මස්සක් අගනා දෙය ගරුබඩු සඞ්ඛ්‍යාවෙහි වැටේ. ආරාමං- පුෂ්පාරාම ඵලාරාමයෝයි; ආරාමවත්ථු- ඒ ඒ ආරාමයන්ට අයිතියයි සීමා නියම කොට වෙන්කළ බිම්පෙදෙස්; විහාරං- ප්‍රාසාදාදී සෙනසුන්; විහාරවත්ථු- ඒ සෙනසුන් පිහිටුවා තිබෙන බිම් පෙදෙස්; මඤ්චං- මසාරක, බුන්දිකාබද්ධ, කුළීරපාදක, ආහච්චපාදක යන මේ සතරෙන් එකකි. බිබ්බොහනං- කොට්ට; ලෝහකුම්භි- ලෝහමය සට, ලෝහභාණකං- ලෝසැළ; ලෝහවාරකං- ලෝහමය ක්ෂුද්‍රක සට. ලෝහකටාහං- ලෝකටාරම්; නිඛාදනං- නියන; කුද්දාලං- උදැල්ල; වල්ලි- වේවැල් ආදී වැල්; වෙළු- හුණ; මුඤ්ජං- ඉලුක් ආදී වකළු සෙවිලි කෙරෙණ තෘණ ජාති; මත්තිකා- මැටි; තේහි ගිහී සඞ්ගණ්හාති- ඒ ඒ දෑය දීමෙන් ගිහීන්ට සංග්‍රහ කරයි. උපලාපෙති- අනේ, අපගේ ආර්‍යයන් වහන්සැයි කියමින් පසුපස්සෙන් ලුහුබඳින්නවුන් කරයි. මේ අවෙභඩ්ගිය ගරු පිරිකර එයින් සොරකම් කොට ගෙණ ගිහීන්ට දීමෙන් කුල සංග්‍රහය කරන්නාවූ සතරවැනි මහසොරයි. මේ තෙමේ වනාහි ගරුබඩු කුලසංග්‍රහය පිණිස දෙන්නේ කුලදූසක දුකුලාවට පැමිණෙයි. පබ්බාජනීය කර්මයට ද සුදුස්සෙක් වෙයි. භික්ෂුසඞ්ඝයා මැඩ අධිපති කමින් දෙන්නේ තුලසියට පැමිණෙයි. සොර සිතින් දෙන්නේ වටිනාකමේ හැටියට ඇවැත් ආරෝපණය කටයුත්තෙකි. අයං අග්ගො මහාචොරො- මේ සොර දෙටු තෙමේයි. මෙවැනි දරුණු අන් සොරෙක් නම් අවිද්‍යමානය. පඤ්චේන්ද්‍රිය ග්‍රහණයද ඉක්මවා සිටි ඉතා සියුම්වූ ලොකොත්තර ධර්මය පවා සොරකම් කර ගනියි. රට්ඨපිණ්ඩො- රට නිසා මහණ වූවහු විසින් අනුන්ගේ ගෙයින් ලත් පිඬු; ථෙය්‍යාය- සොරසිතින්; අසුද්ධකායසමාචාරං- අපරිශුද්ධ කායසමාචාරාදීවූ අන් අයුරකින් විද්‍යමාන වූවහු; අසුද්ධ ථාසො පටිජානාති- පරිශුද්ධකාය සමාචාරාදීවූ අන් අයුරකින් 'මම පරිසුද්ධයෙක්මියි. මාගේ සිත තුළ ලොකොත්තර ධර්ම ඇතැයි' මෙසේ දන්වන්නේ, පවසන්නේ, එයින් ලත් බොජුන් රහතෙකු මෙන් වළඳයි. නිකච්ච කිතවස්සෙව- නිකච්ච- රවටා; අන් පරිද්දකින් විද්‍යමාන වන්නක් අන් අයුරකින් පෙන්වා, අතු කොළ දළු ආදියෙන් වසාගත් තමන්ම පඳුරක් වනරොදක් මෙන් හඟවා; කිතවස්සෙව- (ගුම්බගච්ඡ

සංඝුවෙන් ආ ආ ලිහිණියන් අල්වාගෙණ මරා කා ජීවිකාව කරන්නාවූ) ලිහිණි වැද්දෙකුගේ මෙන්; **භුඤ්ජාං රට්ඨපිණ්ඩං**- ඒ නොරහත් වූ රහත් බැව් හඟවා දැබූ බොජුන් අනුභව කරන්නාහුගේ; එසේ අනුභව කරණලද්ද ලිහිණි වැද්දාගේ ලිහිණියන් රවටා අල්ලා ගැණීම මෙන් මිනිසුන් රවටා ලත් භොජනය අනුභව කළ හෙයින්, යනාර්ථයි. **කාසාවකණ්ඨා**- අර්හද්ධ්වජ සංඛ්‍යාත සිවුරු කඩකින් වෙලාගණු ලැබූ බොටුව ඇති දුසිල් මහණෝ. ශ්‍රාමණ්‍යයක් නම් මොවුන්ට නැත. **අසඤ්ඤතා**- කායාදි ඉන්ද්‍රිය සංයමයක් නැත්තාවූ; **අදිට්ඨෙ දිට්ඨසඤ්ඤිනො**- ප්‍රත්‍යවේක්‍ෂා ඥාන නැමැති ඇසින් නොදක්නා ලද අර්හත්වය ඇතිකල්හිද අප විසින් දක්නාලදැයි යන හැඟීම් ඇති; **අප්පත්තෙ**- තමාගේ චිත්ත සන්තානයට උත්පත්ති වශයෙන් නොපැමිණි; **අනධිගතෙ**- මාර්ගභාවනා වශයෙන් නොලබන ලද; **අසච්ඡිකතෙ**- ප්‍රත්‍යවේක්‍ෂා කිරීම් වශයෙන් ප්‍රතිවේධ නොකරණ ලද්දාවූ; **අධිමානෙන**- මා විසින් චතුරාර්‍ය්‍ය සත්‍යාධිගමය කරණ ලද්දේයයි උපන් මානයෙන්; **අඤ්ඤං**- රහත්බව; **අබ්බොහාරිකං**- ඇවැත් ආරොපණයෙහිදී කරුණක් වශයෙන් නොසලකත්. එය ඇවතට කාරුණක් නොවෙයි යන අර්ථයි. **අලමරියඤාණදස්සනං**- ලෞකික ලොකොත්තර ප්‍රඥාව දැනීම් අර්ථයෙන් ඥාණ නම් ද, ඇසින් දක්නාක් මෙන් කරණ හෙයින් දර්ශනාර්ථයෙන් ඥාණදස්සන නම්ද වේ. ආර්‍ය්‍යවූ පහවත් උතුම් වූ ඥාණදස්සනය අරියඥාණදස්සන නම්. කෙලශ විද්ධවංසනයට අසමර්ථවූයේ අලමරිය ඥාණදස්සන නම්. **සමුදාචරෙය්‍ය**- උක්තප්‍රකාර වූ උතුරු මිනිස්දම් තමා කෙරෙහි පිහිටියක් කොට ආරොපනය කරන්නේය. **කිං තෙ අධිගතං**- (ධ්‍යාන විමොක්‍ෂාදීන් අතුරෙන් හෝ ශ්‍රොතපත්ති මාර්ගාදීන් අතුරෙන්) කුමක් තුඹවහන්සේ විසින් අධිගමය කරණලද්දේ ද? කිම තුඹවහන්සේ විසින් අනිත්‍යලක්‍ෂණය ධුර කොට ගෙණ, අධිගත ද? නැතහොත් දුඃඛ ලක්‍ෂණය හෝ අනාත්ම ලක්‍ෂණය ධුර කොට ගෙණ අධිගත ද? **කදා තෙ අධිගතං**- පූර්වාහ්ණ මධ්‍යාහ්ණාදි කාලයන් අතුරෙන් කවර කාලෙක අධිගත ද? **කත්ථ තෙ අධිගතං**- කවර නම් රාත්‍රි ස්ථාන දිවාස්ථානාදියකදී අධිගත ද? නැතහොත් කවර නම් විහාරයකදී ද? **කතමෙ තෙ කිලෙසා පහීණා**- කවර මඟකින් දුරු කටයුතු කෙලශයෝ තුඹවහන්සේ විසින් නාසිතයෝද; **කතමෙසං ත්වං ධම්මානං ලාභී**- ප්‍රථම මාර්ගාදීන් අතුරෙන් කවර නම් මාර්ගයක් ලැබූයේක් ද; **පාපිච්ඡො**-"දුස්සීලවූයේ මම සිල්වතෙක්මි යි ජන තෙමේ දනීවා"යි ඇතැමෙක් කැමති වෙයි මේ ආදී වූ ක්‍රමයෙන් දක්වන ලද ලාමක ඉච්ඡාවන්ගෙන් යුක්තවූයේ; **ඉච්ඡාපකතො**- පරිජි ඇවතට පැමිණියේ; **විසුද්ධාපෙක්ඛමානො**- තමන්ගේ පරිශුද්ධභාවය කැමැති වන්නේ; පරිජි ඇවතට පැමිණි හෙයින් භික්‍ෂුභාවයෙහි සිට ධ්‍යානාදියක් ලබන්ට වත් නොහැකිය. ඔහුට භික්‍ෂු භාවය සග්ගන්තරාය ද මග්ගන්තරායද කෙරෙයි. එහෙයින් ඔහුගේ භික්‍ෂුභාවය විශුද්ධිය පිණිස නොවෙයි. සාමණේර බවට හෝ ගිහි බවට පැමිණි කල ඔහු විසින්, දන්දීම් සරණ සීලාදීන් සම්පූර්ණකර ගැණීම් වශයෙන් ස්වර්ගමාර්ගයද

ධ්‍යානාදීන් කරණ කොට ගෙණ මෝක්‍ෂ මාර්ගයද සාදාගත හැකිවෙයි. එහෙයින් ගිහි බවම ඔහුට විසුද්ධි නම් වෙයි. **පුරිමෙ උපාදාය**- පළමු තුන් පරිජිවලට පැමිණි පුද්ගලයන් ගෙණය යන අර්ථයි. **විමුත්තො**- 'විවිධෙහි කිලෙසෙහි මුත්තො'ති 'විමුත්තො' නානා වැදෑරුම් කෙලෙසයන්ගෙන් මිදුනේය යන අර්ථයි. **සුඤ්ඤතො**- රාග දෙස මොහයන් ගෙන් ශූන්‍යහෙයින් සුඤ්ඤත නාම්. **අනිමිත්තො**- රාග දෙස මොහ නිමිති විරහිත හෙයින් අනිමිත්ත නාම්. **අප්පණිහිතො**- රාග දෙස මොහ ප්‍රණිධීන්ගේ අභාවය හෙයින් 'අප්පණිහිත' නාම්; **සමාධි**- (චිත්තං සමං ආදහති ආරම්මණෙ ඨපෙතීති 'සමාධි') සිත සමව අරමුණෙහි පිහිටුවාතුයි සමාධි නාම්. 'සං + ආ' පුබ්බ 'ධා' ධාරණෙ ධාතු කෙරෙන් 'ඉ' ප්‍රත්‍යයයි. මෙසේ 'ඉ' ප්‍රත්‍යය වී සිද්ධවන ශබ්ද නිත්‍යයෙන්ම පුල්ලිංගික වන්නේය. **සමාපත්ති**- ආර්‍ය්‍යයන් විසින් ම සමවැදිය යුතු හෙයින් සමාපත්ති නාම්. සං + ආ පුබ්බ' පද ගතියං ධාතුයි. **තිස්සො විජ්ජා**- පුබ්බෙනිවාසානුස්සති, දිබ්බචක්ඛු, ආසවානං ඛයෙ ඤාණං යන මොහු ත්‍රිවිද්‍යා නාම්. **රාගස්ස පහාණං**- (රාග ද්වේෂයන්ගේ ප්‍රහාණය තෘතීය මාර්ගයෙන් ද, මෝහයාගේ ප්‍රහාණය චතුර්ථ මාර්ගයෙන් ද සිදුවේ. එහෙයින් මා විසින්) රාගය ප්‍රහාණයයි කියන්නාහුටද පරිජි ඇවැත් සිදුවේ. **රාගා චිත්තං විනීවරණතා**- 'රාගා මෙ චිත්තං විනීවරණං' මේ ආදී වශයෙන් කියන්නාහුට ද පරිජි ඇවැත් සිදුවේ. මෙහි ආදී ත්‍රිකයෙහි ලෝකොත්තර චිත්තය කථිතය. **පඨමෙන ඣානෙන සුඤ්ඤාගාරෙ අභිරමාමි**- යමෙක් යම් ධ්‍යානයක් හට ඒ ප්‍රථම ධ්‍යානයෙන් යුක්තව ශූන්‍යාගාරයෙහි වසමියි කියේ නම් ඔහුට පරිජි ඇවැත් සිද්ධවේ. නිරෝධ සමාපත්තියට සමවදිමියි කියන්නාහුට ඇවැත් සිදුනොවේ. කුමක් හෙයින්ද ? යත්; නිරෝධ සමාපත්තිය ලෞකික හෝ ලෝකොත්තර නොවන හෙයිනි. මහාපච්චරියෙහි ද සඞ්ඛෙපට්ඨකථාවෙහිද පරිජි ඇවැත් සිදුවේයයි දක්වයි. එබැවින් විමසාගත යුතුයි. කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි සෝවාන් වූයෙමි යි කියන භික්ෂුහට පරිජි ඇවැත් නොවේ. අතීත ස්කන්ධයක් පරාමර්ශණය කළ හෙයිනි. අතීතාත්මභාවය සඳහා කියන්නහුට පරිජි ඇවතක් නැත. පච්චුප්පන්න ආත්මභාවය සඳහා කියන්නාහුට ම පරිජි ඇවැත් සිදු වේ. **පුබ්බෙවස්ස හොති**- පූර්වභාගයෙහි ම මේ පුද්ගලයාට මෙබඳු සිතක් වෙයි. යමෙක් 'මා විසින් මුසා කියන ලද්දේ ය යි කියන්ට පළමුවෙන්ද, කියද්දීද, කියූ පසුද දැනගණී යන අර්ථයි. **විනිධාය**- වසා, **උබ්බාධිතො**- නැතිගන්වා පන්නා දමන ලද්දේ; 'උ' පූර්ව 'බධ' උත්‍රාසනෙ යන ධාතුයි; **අනුල්ලපනාධිප්පායස්ස**- කුහක බැව්හි හෝ ඉච්ඡාචාරයෙහි නො පිහිටා සබ්‍රම්සරුන් ලඟ අතිසක් ප්‍රකාශ කරණ භික්ෂුහට; 'උත්තරිමනුස්ස ධම්මො මයා පකාසිතො හොති' උතුරුමිනිස්දම් මා විසින් ප්‍රකාශ කරණ ලද්දේ යයි මෙනෙහි නොකොට, 'නාහං ආවුසො මච්චුනො භායාමි' යනාදි වශයෙන් කියන්නාහට; මේ ශික්ෂාපදය හි සමුට්ඨානය, හස්තමුද්‍රාවෙන් අඟවන්නහුට කායචිත්ත වසයෙන්ද, වචනයෙන් කියන්නාහුට වාචාචිත්ත වස

යෙන්ද, යථොක්ත දෙවිධියෙන් ම අගවන්නහුට කායවාචාචිත්ත වශයෙන්ද සමුට්ඨානය වේ. **පණිධාය**- ප්‍රාර්ථනා කොට; **එවං මං ජනො සම්භාවෙස්සති**- මෙසේ අරණ්‍යෙහි වසන්නාවූ මා ජනතෙමේ අර්හත්වයෙහි හෝ ශෛක්‍ෂභූමියෙහි පිහිටුවා ගරු කරන්නේය. ඒ හෙතුවෙන් ලොකයා විසින් සත්කාර කටයුත්තෙක් ද, ගරුකටයුත්තෙක් ද පිදියයුත්තෙක් ද වෙමි. මෙසේ සිතා අරණ්‍යවාසය පිණිස යන්නහුට පියවරක් පාසා දුකුලා වේ. මෙසේ ම අරණ්‍යෙහි කුටිකරණ, චඞ්කමන, නිසීදන, නිවාසන, පාපුරණාදිවූ සියල්ලෙහිදීම ප්‍රයොගයක් පාසා දුකුලාවේ. **ආමඩා**- ප්‍රතික්‍ෂිප්තයෝය. **සිතං පාත්වාකාසි**- බුදුන්ගේ ඥාණ සම්පත්තිය දැක මඳ සිනාවක් පහළකළ සේක. **අට්ඨිසඞ්ඛලිකං**- සුදුවූ මස් ලේ නොමැති ඇටසැකිල්ලක්; **ඵාසුළන්තරිකාහි විතුදෙන්ති**- ('විතුදෙන්ති' විනිවිජ්ඣන්ති, ඩෙනති, ගවජනති) ඉල ඇට අතුරෙහි කුඩා මහත් සිදුරු කොටගෙණ පියාඹත්. 'විතුදන්ති' යනුද පාඨයි. 'ඵාසුළන්තරිකාහි' යනු ආධාරාර්ථයෙහි පඤ්චමී විභක්තියි. **සා**- ඒ ඇට සැකිල්ල; **අට්ටස්සරං**- බැගෑහඬ; **චක්ඛුභූතා විහරන්ති**- දිවැස් ඇත්තෝ වාසය කරත්.

**පුබ්බෙව මෙ සො සත්තො දිට්ඨො**- බෝමැඬදී සර්වඥතාඥානය ප්‍රතිවෙධ කිරීමෙන් අප්‍රමාණ චක්‍රවාටයන්හි සත්ව කොට්ඨාසවල ගමගති ආදීන් මෙනෙහි කරන්නාවූ මා විසින් පූර්වයෙහිදී ම මේ සත්වයා දක්නා ලදී. **ගොඝාතකො**- ගවයන් මර මරා ඇටවලින් මස් වෙන්කොට විකුණමින් දිවිරැකිත්තෙක්; **මාගවිකො**- මුවවැද්දෙක්; **සූචකො**- කේලම් කියන්නෙක්; **ගාමකූටකො**- විනිශ්චයාමාත්‍යයෙක්; **මඞ්ගුලිං**- දුද්දසිකාවූ එහෙයින් ම පිළිකුල් කටයුත්තියක්වූ; **උප්පක්කං**- ගින්නෙන් දැවුනු සිරුරු ඇත්තියක්; **ඔකිලිනිං**- සිරුරෙන් බින්දු බින්දු වශයෙන් ඕජස වැගිරෙන්නියක්; **ඔකිරිනිං**- සාත්පස පිහිටි කැලවල් වැනි ගිනි අඟුරුවලින් මැදිවූ තැනැත්තියක්; **සා ඉස්සා පකතා සපත්තිං අඞ්ගාරකටාහෙන ඔකිරි**- රජහුගේ එක් නාටිකාස්ත්‍රියක් අඟුරු කබලක් ලඟ තබාගෙණ සිරුරින් ජලයද පිසදමයි. අගින් ඛඟ ද ගන්වයි. රජ තෙමේ ඈ සා කථා කෙරෙයි, සතුටුවූ අයුරක් ද දක්වයි. එය ඉවසන්ට නොහැකිවූ ඊර්ෂ්‍යාවෙන් මැඩ ගත්තාවූ අගමෙහෙසිය රජු එසින් නික්ම ගිය කල්හි ඒ අඟුරු කබල ගෙණ ඈ මතුයෙහි මුනින් හැළිය. එසින් ඈ ප්‍රෙත ලොකයෙහි උපන්නීය. **සීතොදකා**- සිසිල්දිය, **සාතොදකා**- මිහිරිදිය; **සුපතිත්ථා**- මනා තොටුපලින් යුක්ත. **නාදිවදති**- ජයබෙරය පතුරුවයි. **පභග්ගො**- පරදවන ලදී. 'පභුබ්බහජ ප්‍රුථසකාරෙ' ධාතුයි. **ආනෙඤ්ජං සමාධිං**- කායවාචා විඥප්තිරහිතවූ චතුර්ථධ්‍යාන සමාධිය; ශබ්දකණ්ටකයන්ගෙන් නැගී සිටීමට නුසුදුසුවූ රූපාවචර සමාධිය යයි දතයුතුයි, ආනෙඤ්ජ නම් නොසෙලවීමයි. **කොඤ්චං කරොන්තානං**- ගං ඉවුරෙහි සිට සොඬය මුවතුළ බහාගෙණ කුඤ්චනාදය කරන්නාවූ; **සොභිතො**- මේ තෙමේ කල්ප පන්සියයකට පෙර තීර්ථායතනයෙහි මහණවූයේ අසඤ්ඤසත්ත සමාපත්තිය උපදවා ගෙණ නො පිරිහුනු ධ්‍යානයෙන්

කළුරිය කොට අසඤ්ඤසත්ත තලයෙහි උපනි. එහි ආයු ඇතිතාක් සිට ඉන් චුතව මේ මිනිස් ලොව ඉපද මේ ශාසනයෙහි මහණවූයේ ත්‍රිවිද්‍යා උපදවා ගති. හෙතෙමේ පූර්වේනිවාසය සිහිකරන්නේ මේ ආත්මභාව යෙහි ප්‍රතිසන්ධිය දැක ඉන් තුන්වන ආත්මභාවයෙහි චුතියද දිටී. මේ දෙ අතුරෙහි පැවැති අචිත්තක ආත්මභාවය සිහි කරන්නට නො හැකි වූයේ 'ඒකාන්තයෙන් මම අසඤ්ඤසත්ත තලයෙහි ඉපදුනෙමියි නය වශයෙන් සැලකිය. මෙසේ සිතා ගැණීමෙන් කරණ ලද්දේ දුෂ්කර වූවකි. එහෙයින්ම බුදුරජානන් වහන්සේ මේ තෙරහු පෙරවුසුතැන් පිළිවෙල සිහිකරණ භික්ෂූන් ගෙන් අග්‍රතනතුරෙහි පිහිටුවා වදාළසේක.

චතුර්ථ පාරාජිකා ගැටපදය නිමි.

---

අනභිරතො- කාම දුවිල්ලෙන් දූවෙන හෙයින්ම විසිරීගිය සිත් ඇත්තේ; ගිහි බව පතමින් හොවෙයි. අනුද්ධංසෙති- කාමරාගය තෙමේ සිත මඩියි. මලානික කරයි. සඤ්චෙතනිකා-('සංචිජ්ජති චෙතනා අස්සාති-සංචෙතනා, සංචෙතනා එව සංචෙතනිකා; සංචෙතනාවා අස්ස අත්ථීති සංචෙතනිකා; මෙහි ප්‍රථම විග්‍රහයෙන් 'සං' යන උපසර්ගයාගේ සාර්ථකබව ද, දෙවෙනි විග්‍රහයෙන් 'ඉක' ප්‍රත්‍යයාගේ අර්ථවත් බව ද ප්‍රකාශිතය.) වා පිත් සෙම් රුහිරු ආදීන්ගේ කිපීමෙන් වෙන්වූ දූන දූන සුකුරු මිදීම යි. චෙතෙති- මොචනස්සාදචෙතනා වශයෙන් කල්පනා කොට; 'චිති' චින්තායං යන ධාතුවෙන් නිපන් පූර්වක්‍රියා පදයකි. අභිවිතරිත්වා- උපක්‍රමවශයෙන් මඩින්නේ නිසැක සිත උපදවා; දසසුක්කානි- පිත් සෙම් පූය ලේ යන මොවුන්ගේ ආසය වශයෙන්ද, පඨවි ආදි සතර මහා භූතයන්ගේ හෝ චක්ඛුරාදි අටලොස් ධාතූන්ගේ තාත්පර්‍ය හෙයින්ද ශුක්‍රයන්ගේ නීලාදි වූ දශවිධ වර්ණභෙදය දතයුතුයි, "රසාසෘක්මාංසමෙදෝස්ථි- මජ්ජා ශුක්‍රාණිධාතවඃ" රස, ලේ, මස්, මෙදස්; අස්ථි, මජ්ජා යන මොවුන් ක්‍රමයෙන් පැසීමෙන් ශුක්‍රධාතු ඇතිවේයයි වෛද්‍යක ග්‍රන්ථයන්හි සූචිතයි. දකවණ්ණං- ජලයට බඳු පැහැය; විස්සට්ඨි- සුකුරු මිදීම; ඨානාචාවනං- නියම තැනින් පහකරවීම, වත්ථිසීසය, කටිය, සියලුකය ශුක්‍රධාතුහට නියමිත ස්ථානයයි ආචාර්‍ය්‍ය වරයෝ වෙන් වෙන්ම දක්වත්. 'වත්ථිසීස' නම් අඞ්ගජාතයාගේ මූලයි. ශුක්‍රධාතුවට නියමිත ස්ථානය සියලු කයය යන මතය සුභාෂිතය යි අටුවා වෙහි දක්වති. කෙස්, ලොම්, නිය, දත්; මළ, මූ, කෙළ, සෙම්, සොටු, විශලිසම් ආදිය හැර ශරීරයෙහි අන් සියලුතන්හිම ශුක්‍රධාතු පැතිර පවත්නේය. පහළොස් ශොළොස් වයස් වූවන්ට ඇතිවන කාමරාග යෙන් ශුක්‍රධාතු පවත්නා තැනින් සෙලවීමට පැමිණෙණ. එසේ චලිතවූ ශුක්‍රධාතුව ආපොධාතු වශයෙන් චිත්තජවූයේ අඞ්ගජාතය කරා ගලාඑයි. අඞ්ගජාතයෙන් පටන් චිත්තපවත්තිය ඍතුජවෙයි. යම් කෙනෙකුන්ට එනාහි සමූවෙත්ද විඤ්ඤාමහරණාදීන් කරණකොට ගෙණ රාගපරියුට්ඨානයක් නැද්ද, ඔවුන්ම සුක්ක විස්සට්ඨියක්ද නැත. රාගචිත්ත සමුට්ඨාන වශ යෙන්ම සුක්ක විස්සට්ඨිය කියනලදී. සුපිනන්තෙන- සිහින දැකීම කාරණ

සතරකින් සිදුවෙයි. ධාතුක්ඛෝභ, අනුභූතපුබ්බ, දේවතෝපසංහාර, පුබ්බනිමිත්ත යන මොවුන්ගේ වශයෙනි. පිත් සෙම් ආදිය කිපීමෙන් පර්වතවලින් වැටෙන්නාක් මෙන් ද, අහසින් ගමන් කරන්නාක් මෙන් ද, වන මෘගාදීන් ලුහුබඳින්නාක් මෙන් ද දක්නා සිහින ධාතුක්ඛෝභ නමි. පළමුවෙන් දක්නාලද්දක් හෝ ඇසුරුකළ යමක් අනුව පෙණෙන සිහින අනුභූතපුබ්බ නමි. තමන්ට මතු සිදුවන අභිවෘද්ධ්‍යාදිය හඟවනු කැමැති දෙවියන් විසින් දක්වනු ලබන සිහින දෙවතොපසංහාර නමි. පෙරකළ පින්පව් අනුව පෙණෙන සිහින පුබ්බනිමිත්ත නමි. බෝසත් මවුද, බෝසත්හු ද, කොසොල් රජු ද දුටු සිහින මෙනි. බෝසත් මවු තොමෝ පසළොස්වක් පොහොය ගිය සත්වැනි දිනයෙහි අළුයම පිබිද සුවඳපැනින් නා සර්වාභරණයෙන් සැරසුනී උතුම් බොජුන් අනුභවකොට පෙහෙවස් ඉටා සිරියහනට පැමිණ සැතපුනී මෙසේ සිහිනයක් දුටු, වරම් රජවරු පැමිණ සිරියහන සමගම ඇය අනවතත් විලට පමුණුවා නහවා දිව වත් හඳවා දිව බරණ පලඳවා එහි රන්විමනෙහි පෙරදිගට හිස සිටින සේ සැතැප්පූහ. ඉක්බිති සුදු ඇතෙක් පැමිණ බියම ප්‍රදක්ෂිණා කොට කුසෙහි දකුණු අංශය බිඳගෙණ කුසතුළට වනි.

බුදුරජානන් වහන්සේ හෙට බුදුවෙමියි තුදුස්වක්දා රාත්‍රියෙහි බෝමැඩ වැඩහුන්සේක් මෙබඳු සිහින පසක් ම දුටුසේක. මේ මහා පෘථිවිය ශයනයක් ව හිමවුකුළ බිම්බෝහනය කොට නැගෙනහිර සමුද්‍රයෙහි වම් අතද, පශ්චිම සමුද්‍රයෙහි දකුණු අතද දකුණු මුහුදෙහි දෙපාද පිහිටුවා සැතපීම ද, තැලිස් පමණ මහතැති රතු දණ්ඩන් නුතු කුසතණ නාභියෙන් නැඟී බල බලා සිටියදී ම වියතක් රියනක් බඹයක් යෂ්ටියනක් ගවුවක් අඩයොදුනක් යොදුනක් ආදි වශයෙන් ක්‍රමයෙන් පැතිරී අහස්කුස වසාගෙණ සිටීම ද, කළුහිස් ඇති පණුවන් පාදයෙන් නැඟී දණමඬුලු තෙක් වසාගෙණ සිටීමද, නානා පැහැයෙන් යුත් පක්ෂීන් සිවුදෙනකු සිවුදිගින් දිව අවුත් පාමුල වැටී ශ්වේතවර්ණ බවට පැමිණීමද, අසූචි පර්වතයකට නැගී අසූචියෙහි නො ගැටී ඒමත්තෙහි සක්මන් කිරීම ද දුටුසේක. කොසොල් රජහු මෙසේ ම සොළොස් මහ සිහිනයක් දුටහ.

'උසභා රුක්ඛා ගාවියො ගවා ච - අස්සො කංසො සිගාලී ච
කුම්භො පොක්ඛරණී ච අපාකචන්දනං,
ලාබූනිසීදන්ති සිලාපලවන්ති - මණ්ඩූකියො කණ්හසප්පෙ ගිලන්ති
කාකං සුවණ්ණාපරිවාරයන්ති - තසාවකා එළකානං භයාහිති,

යන මොහුයි. නිතර නිතර පිබිදීම ස්වභාවකොට ඇති මක්කට තින් දෙන් නිදන්නාහුට ම සිහින පෙණේ.

සඞ්ඝාදිසෙසසා – (සඞ්ඝෝ ආදිම්හි චෙව සෙසෙ ච ඉච්ඡිතබ්බෝ අස්සාති) පිරිවෙස් සමාදානය පිණිස ආදියෙහිදී ද, මානත්තසමාදානය පිණිස මැදදී ද, අබ්භානය සඳහා අවසන්හිදී ද සඞ්ඝයා කැමතිවියයුතු

හෙයින් සඞ්ඝාදිසෙස නම්. සඞ්ඝා ආපත්තියා පරිවාසං දෙති- මේ පරිවාසය පටිච්ඡන්න, සුද්ධන්ත, සමොධානය යි ත්‍රිවිධ වෙයි. 'පටිච්ඡන්න' නම් ඇවැත් ප්‍රතිච්ඡන්න ගණනින් දියයුතු පිරිවෙසයි. ඇතැම් භික්ෂූන්ගේ එක් දින දෙදින කෙදින ප්‍රතිච්ඡන්න වූ ඇවැත් වෙත්. කිසිවෙකුට ආපත්තිපන්ති වශයෙන් එක දෙක තුණ හතර ආදී ක්‍රමයෙන් ප්‍රතිච්ඡන්න වූ ඇවැත් ඇත. පටිච්ඡන්න පරිවාසය සමාදන් කරවන සඞ්ඝයා විසින් ආපත්තීන් පිළිබඳ ප්‍රතිච්ඡන්නතාව පළමු කොට ම සැලකිය යුතුයි. ආපත්තිපටිච්ඡාදනය වනාහි ආපත්ති, ආපත්තිසඤ්ඤී, පකතත්තො, පකතත්තසඤ්ඤී, අනන්තරායිකො, අනන්තරායිකසඤ්ඤී, පහු, පහුසඤ්ඤී, ඡාදෙතුකාමො, ඡාදෙති යන දශාකාරයෙන් සිදුවේ. 'ආපත්ති ච හොති ආපත්තිසඤ්ඤී ච'– විනයටීකා ක්‍රමයෙන් යම් වරදකට පැමිණීම ආපත්ති නම්. මෙහිදී සඞ්ඝාදිසෙසාපත්තිය ම ආපත්ති නමින් ව්‍යවහෘත වේ. ඒ ඇවතට පැමිණි මහණ තෙමේ එහි ඇවැත් ඇතැයි යන හැඟීම ඇත්තෙක් වී නම් ඒ ඇවැත පටිච්ඡන්න වේ. නැත පටිච්ඡන්න නො වේ. ඇවැත් නොවන්නක් ඇවතැයි යන හැඟීම ඇත්තහුට හෝ නැත්තහුට පටිච්ඡාදනය නො වේ. ලඝු ඇවත ගරු ඇවත යයි සිතා හෝ ගරු ඇවත ලඝු ඇවතයයි සිතා හෝ ඡාදනය කෙරේනම් එය පටිච්ඡන්න නුවූවක් ම වෙයි. අලජ්ජිපක්ෂයෙහි සිටී. ගරු ඇවත ලඝු ඇවතයයි ගණිමින් දෙශනා කෙරේද එය දෙසූවත් නො දෙසුවත් පටිච්ඡන්න නොවේ. ගරු ඇවත ගරු ඇවත බැව් දැන දැනම ඡාදනය කෙරේනම් පටිච්ඡන්න වෙයි. 'පකතත්තො' සඞ්ඝයා විසින් කරණලද උත්ක්ෂෙපණීය කර්මයකින් අනුක්ෂිප්ත පුද්ගලයා පකතත්ත නම්. හෙතෙමේ පකතත්ත මහණෙක යි දැන ඡාදනය කෙරේද ඒ ඇවත පටිච්ඡන්නය; 'මම සඞ්ඝයා විසින් උත්ක්ෂෙපණීය කර්මය කරණු ලැබුවෙමි' යි අපකතත්තසඤ්ඤීව ඡාදනය කෙරේ නම් පටිච්ඡන්න නුවූවක් ම වෙයි. අපකතත්ත මහණෙකු විසින් පකතත්ත, අපකතත්ත යන හැඟීමක් නොමැතිව ඡාදනය කරණලද්දේ නම් ඒ ඇවත පටිච්ඡන්න නොවෙයි.

අනන්තරායිකො–යම් මහණෙක් දශවිධ අන්තරායන් අතුරෙන් යම් අන්තරයක් නැතිකල අනන්තරායික සංඥීව ම ආපත්ති ඡාදනය කෙරේ නම් ඒ ඇවත ඡාදනය වේමය. ඉදින් හෙතෙමේ බියසුලු බැවින් අඳුරෙහිදී අමනුෂ්‍යයන්ට හෝ චණ්ඩ මෘගයන්ට බියෙන් අනන්තරායික සංඥීව ඡාදනය කෙරේද ඒ ඇවත පටිච්ඡන්න නුවූයේ වෙයි. යම් භික්ෂුවක් පච්ඡාසන්න විහාරයක වසයි. අන් විහාරයකට යායුත්තේ කඳුරක් හෝ නදියක් එතර කොට ගෙණය. මාර්ගයද අමනුෂ්‍ය වල් මෘගාදීන්ගෙන් ගහනය. මෙසේ හෙයින් ඒ භික්ෂු තෙමේ මග උවදුරු බියෙන් අනන්තරායික සංඥීව ආපත්තිඡාදනය කෙරෙයි. ඒ ආපත්තිය පටිච්ඡන්න නොවේ. අන්තරු ඇත යන බියෙන් ඡාදනය කරණ භික්ෂූහුගේ ඇවත ද පටිච්ඡන්න නොවෙයි. යම් මහණෙකුහට භික්ෂුවක් හරා යාමටද ආරොචනය කිරීමටද හැකිවේ නම් ඒ පහු නම්. හෙතෙමේ

අහු සංඝේම ම ඡාදනය කෙරෙති. ඇවත පටිච්ඡන්නා වේ ම ය. යම් භික්ෂුවකගේ මුඛයෙහි ස්වල්පමාත්‍රවූ ගඩක් හෝ හනුවාතයක් හෝ දත් රිදීමක් වේද භික්ෂාව නො ලැබීමක් හෝ වේද, එහෙත් කථා කරන්ට හෝ ගමන්කරන්ට හැකිය. ඉදින් දුරතට යාගත නොහැකි යන හැඟීම ඇත්තෙක් නම් හේ අහුවූයේ අපහුසංඥ ඇත්තෙකි. මොහු විසින් ඇවත ඡාදනය කරණලද මුත් අච්ඡාදිතය. 'ඡාදෙතු කාමො ච හොති ඡාදෙති ච' පෙර කී නයින් ම සැලකිය යුතුයි. 'ඡාදනය කරමි' යි ධූරනික්ෂේපය කොට පෙරබත්කල හෝ පසුබත් කල හෝ ප්‍රථමයාමයකදී හෝ කෙසේ නමුත් අරුණට පළමු ආරෝචනය කරණ තැනැත්තේ ඡාදනය කරන්ට කැමැතිවන්නේ ඡාදනය නොකරන්නේ නම්. භික්ෂූන් දුර්ලභ ආරාමයක වසන්නහුටද ඇවතට පැමිණි සභාග භික්ෂුවකගේ ආගමනය පතන්නහුට ද සභාග භික්ෂුවක කරා යන්නහුට ද අඩවසක් හෝ ඉක්මයේ නම් මේ ඡාදනය නොකරණු කැමැත්තේ ඡාදනය කරන්නේ නම් යම් මහණෙක් ගිනිවැදුනු කෙනෙකු මෙන් වහා සභාග භික්ෂුවක් කරා පැමිණ ආරෝචනය කෙරේද, මේ ඡාදනය නොකරණු කැමැත්තේ ඡාදනය නොකරන්නේ නම්. ඉදින් සභාග භික්ෂුවක් දැක මේ මාගේ ගුරුවරයාය යන හැඟීමෙන් ලජ්ජාව ආරෝචනය නොකෙරේද, ඇවත පටිච්ඡන්නා වේම ය. අවෛරී සභාගභාවය ම ඇවත පටිච්ඡන්න නොවීමට කාරණු වෙයි. උපාධ්‍යායාදීභාවය කාරණු නොවේ. එබැවින් අවෛරීසභාග නම් කවර කෙනෙකු ලඟවුවත් ආරෝචනය කටයුතුම ය. යමෙක් විසභාග හෝ වේද, දූනගත් කල අන්‍යයන්ට දන්වායයි සැහැසිත ද එබඳු ගුරුවරයා ලඟ වුවද ආරෝචනය නො කටහැකියි.

පෙරබත්කල හෝ පසුබත්කල හෝ පෙරයම හෝ මැදුම්යම හෝ අරුණු නො නැගෙන තුරුම ආරෝචනයට සුදුසු කාලයයි. අරුණ නැගුනු කල්හිම ඇවත පටිච්ඡන්නා වේ. පටිච්ඡන්නා හෙතුවෙන් දුක්කුළා ඇවතට ද පැමිණේ. සමාන සඞ්ඝාදිසෙසයන්ට පැමිණි භික්ෂූන් ඔවුනොවුන් එය ආරෝචනය නො කටයුතුයි. ආරෝචනය කරන්නහු විසින් "තුයහං භන්තෙ එකං ආපත්තිං ආවිකරෙමි' කියා හෝ ආවිකාමි' කියා හෝ 'ආරොචෙමි' කියා හෝ 'මම එකං ආපත්තිං ආපන්නභාවං ජානාහි' කියා හෝ 'එකං ගරුකං ආපත්තිං ආවිකරෙමි' කියා හෝ කිණිය යුතුයි. මෙසේ යොබඳු ක්‍රමයකින් හෝ යැලිකළ කල ඇවත පටිච්ඡන්නා නොවෙයි. "ලහුකාපත්තිං ආරොචෙමි" කී කල ඇවත පටිච්ඡන්නා වෙයි. වස්තුව හෝ ඇවත හෝ වස්තු ආපත්ති දෙකම හෝ සඳහන් වන සේ ආරෝචනය කටයුතු ම ය.

මෙසේ දස අයුරින්ම පරීක්ෂාකොට පටිච්ඡන්නපරිවාසදායක සඞ්ඝයා විසින් පටිච්ඡන්නභාව ද, පටිච්ඡන්න දින ගණනද, ඇවැත් ද සලකා බැලිය යුතුයි. ඉදින් පටිච්ඡන්නය එක් දිනක් නම්,– "අහං භන්තෙ එකං ආපත්තිං ආපජ්ජිං සංචෙතනිකං සුක්කවිස්සට්ඨිං, එකාහ පටිච්ඡන්නං" මෙසේ යාචනා කරවා ඛන්ධකයෙහි කී ක්‍රමයෙන් කම්වාක්‍යය

දෙශනා කොට පිරිවෙස් සමාදන් කරවිය යුතුයි. යම්හෙයකින් ද්වීහ තීහාදිවශයෙන් පටිච්ඡන්න දිනගණන අධික නම්, 'ද්වීහපටිච්ඡන්නං, තීහපටිච්ඡන්නං, පඤ්චාහපටිච්ඡන්නං,- චුද්දසාහපටිච්ඡන්නං, යනාදි ක්‍රමයෙන් තුදුස් දිනක් දින වශයෙන් බැණ; පසළොස් දිනක් නම් 'පක්ඛපටිච්ඡන්නං'යි ද එකුන් තිස්දිනෙක් නම් 'අතිරෙකපක්ඛ පටිච්ඡන්නං' යිද ඉන්පසු 'මාසපටිච්ඡන්නං' අතිරෙකමාස පටිච්ඡන්නං, ද්වෙමාස පටිච්ඡන්නං- එකසංවච්ඡරං, අතිරෙක සංවච්ඡරං- සට්ඨිසංවච්ඡරං, අතිරෙක සට්ඨිසංවච්ඡරං, යනාදි ක්‍රමයෙන් පටිච්ඡන්න දිනගණන් වෙනස්කරමින් කම්මවාක්‍යය යොදාගත යුතුයි.

ඉදින් ආපත්ති දෙකක් තුණක් හෝ ඊටත් වඩා අධික සඞ්ඛ්‍යාවක් වේ නම්:- 'එකං ආපත්තිං' යන්න 'ද්වෙ ආපත්තියො, තිස්සො ආපත්තියො, සම්බහුලා ආපත්තියො' යනාදි ක්‍රමයෙන් වෙනස් කොට ගතයුතුයි. නානාවස්තුක ආපත්ති නම් "අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං, එකං සුක්කවිස්සට්ඨිං, එකං කායසංසග්ගං, එකං දුට්ඨුල්ලවාචං, එකං අත්තකාමං, එකං සඤ්චරිත්තං, එකාහපටිච්ඡන්නායො'යි සඞ්ඛ්‍යා වශයෙන් ද, "අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසාපත්තියො ආපජ්ජිං නානාවත්ථුකායො එකාහපටිච්ඡන්නායො" යි මෙසේ වස්තුකීර්තනය කිරීම් වශයෙන් ද, "අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසාපත්තියො ආපජ්ජිං එකාහපටිච්ඡන්නායො" යි නාමමාත්‍රය පමණක් දැක්වීම් වශයෙන් ද, කම්මවාක්‍යය සකස්කරගත යුතුයි.

මෙහි නාමය සජාති සාධාරණය, සබ්බසාධාරණ'යයි විවිධ වේ. 'සඞ්ඝාදිසෙසො'යනු සජාතිසාධාරණ නාමයයි. 'ආපත්ති'යනු සබ්බසාධාරණ නාමය වෙයි. එහෙයින් "සම්බහුලා ආපත්තියො ආපජ්ජිං එකාහපටිච්ඡන්නායො"යි සියල්ලන්ට ම සාධාරණ වූ නාම වශයෙන් කීර්තනය ද කටහැකි ය. මෙසේ පරිවාසදාන කම්මවාක්‍යය 'වත්ථු, ගොත්ත, නාම, ආපත්ති' වශයෙන් ද වෙනස් කරන්ට වටී. 'සඞ්ඝාදිසෙසො'යි කී කල ද, 'ආපත්තියො' යි කී කල ද නාමය හා ආපත්තිය ද කියැවේ. එහෙයින් මොවුන් අතුරෙන් යම්කිසිවක් යොදා කම්මවාක්‍යය පිළියෙල කටහැකියි. මෙහිදී සියලු ආපත්තීන්ට සාධාරණ වූ 'සම්බහුලා' යි යොදා කම්මවාක්‍යය පිළියෙල වේ. එක් ඇවතක් වුවද 'සම්බහුලා' යි යෙදීම නිවරද හෙයිනි.

පටිච්ඡන්න පරිවාසය දෙන්නාවූ සඞ්ඝයා විසින් 'එකාහපටිච්ඡන්න ආපත්ති' වේනම් මෙසේ කටහැකියි. "අහං භන්තෙ සම්බහුලා ආපත්තියො ආපජ්ජිං, එකාහපටිච්ඡන්නායො, සොහං භන්තෙ සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං, එකාහපරිවාසං යාචාමි, අහං භන්තෙ සම්බහුලා ආපත්තියො ආපජ්ජිං එකාහපටිච්ඡන්නායො, දුතියම්පි භන්තෙ සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං යාචාමි. අහං භන්තෙ සම්බහුලා ආපත්තියො ආපජ්ජිං, එකාහ පටිච්ඡන්නායො තතියම්පි භන්තෙ සඞ්ඝං සම්බහුලානං ආපත්තීන

එකාහපටිච්ඡන්නානං එකාහ පරිවාසං යාචාමි" මෙසේ තුන්වරක් කථනයකරවා "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමො භික්ඛු සම්බහුලා ආපත්තියො ආපජ්ජි, එකාහපටිච්ඡන්නායො, සො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං දදෙය්‍ය. එසා ඤත්ති; සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමො භික්ඛු සම්බහුලා ආපත්තියො ආපජ්ජි, එකාහපටිච්ඡන්නායො; සො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං දෙති, යස්සායස්මතො ඛමති, ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසස්ස දානං, සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය; දුතියම්පි එතමත්ථං වදාමි.-පෙ- තතියම්පි එතමත්ථං වදාමි.-පෙ-දින්නො සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසො; තස්මා තුණ්හී,එවමෙතං ධාරයාමි." මෙසේ යම් ඒ ඇවතකට පැමිණියේ ද, ඒ ඒ ඇවතෝ නාමය ගෙණ කම්වාක්‍යය කටයුතුයි. කම්වාක්‍යය අවසන්හි ඒ භික්ෂුව විසින් සීමාමාලකයේදීම "පරිවාසං සමාදියාමි. වත්තං සමාදියාමි"යි වත්තසමාදානය ද කටයුතුයි. ඒ සමාදන් වූ වත් ඇත්තහු විසින් එහිදී සඞ්ඝයාට ද "අහං භන්තෙ සම්බහුලා ආපත්තියො ආපජ්ජිං එකාහපටිච්ඡන්නායො, සොහං සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං යාචිං; තස්ස මෙ සඞ්ඝො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං අදාසි. සොහං පරිවසාමි. වෙදියාමහං භන්තෙ වෙදියතීති මං සඞ්ඝො ධාරෙතු'යි මෙසේ ආරොචනය කටයුතුයි.

ඉන්පසු සමාදන්වූ වතින් අරුණනැගෙන තෙක් වෙන්ව වසන්ට නැමැත්තේ නම් 'පරිවාසං නික්ඛිපාමි, වත්තං නික්ඛිපාමි' යි වත නික්ෂෙප කටයුතුයි. මෙසේ එක්වරකින් නමුත් නික්ෂෙපය සිද්ධවුව ද දෙවරක් කථනය කිරීමෙන් නිසැකයෙන් ම නික්ෂෙපය වේම ය. සමාදානයෙහි ද මෙසේම ය. වත නික්ෂෙප කළ තැන් පටන් ප්‍රකෘතත්ත භික්ෂුවක් වශයෙන් කටයුතු කළහැකියි. මාලකයෙන් පිටත භික්ෂූන් වැඩි කල්හි එහි සිටි එක් භික්ෂුවක් ලඟ වුවත් වත නික්ෂෙප කටයුතුය. වත් සමාදන් වූ භික්ෂුව ද වත නික්ෂෙප කරන්ට අමතක වීමෙන් මාලකයෙන් පිටත්වන භික්ෂූන් සමග ම යන්ට වනී. එසේ පැමිණ මඳවේලාවකින් සිහිවූ කල්හි මාලකයෙන් පිටතදී වුව ද ඒ භික්ෂූන් ලඟම වත නික්ෂෙපකරන්ට හැකිය. නොහොත් මාලකයෙහි සිටි අන් භික්ෂුවක් ලඟ වුව ද වත නික්ෂෙප කටයුතු. ආරොචනය කරන්නහු විසින් "වෙදියතීති මං ආයස්මා ධාරෙතු"යි ද දෙනමක් හෝ ඉන් අධිකවූ සඞ්ඝයා ලඟ නම් "මං ආයස්මන්තො ධාරෙන්තු"යි ආරොචනය කටයුතු.

ඉදින් ස්වල්ප භික්ෂූන් වසන විහාරයක නම් වත නික්ෂේප නො කොට විහාරයෙහි ම රාත්‍රිය ගත කළ හැක. වත පිරිසිදුව තබා ගන්ට නො හැකියයි අදහසක් පහළවේ නම් ඉතා අලුයම්හි එක් භික්ෂුනම කුඩා සමග විහාර සීමාවෙන් ලෙඩ්ඩුපාත දෙකක් ඉක්මවා ශෙෂ මහ මගින් ඈත්ව පඳුරකින් හෝ පවුරකින් හෝ වැටකින් හෝ මුවහ වූ තැනක වැස අරුණට පළමුවම ඊට කියනලද ක්‍රමයෙන් වත සමාදන් වී අන් භික්ෂුවක්හට ආරෙවනය කටයුතුයි. ආරෙවනය ලබන භික්ෂුව නවක නමක් නම් ‘ආවුසො’ යි කියා ද වෘද්ධ නමක් නම් ‘භන්තෙ’යි කියා ද පැවසිය යුතුයි. කිසියම් කටයුත්තක් පිණිස එතැනට පැමිණි අන් භික්ෂුවක් දකින්ට හෝ ලැබේ ද ඒ භික්ෂුවගේ ශබ්දය හෝ අසන්ට ලැබේ ද, එකල වත් පූරණ භික්ෂුනම කෙසේ නමුත් ඔහු ලඟට පැමිණ, ඈ සෙසේ ආරෙවනය කටයුතුයි. ඉදින් එසේ නො කළහොත් රත්‍රිච්ඡේද වත්තභෙද දෙකම සිදුවේ. තමන්ට දොළොස් රියනක් ආසන්නයෙන් ගමන් කරණ භික්ෂුනමකට නො දැනීමෙන් ආරෙවනය නොකළ කල්හි ද රත්‍රිච්ඡේදය වේ, වත්ත භෙදය නො වේ.

ඇරුණු පසු කල්හි තමන්ට හමුවන ප්‍රථම භික්ෂූන් වහන්සේ ලඟ ම වත නික්ෂේප කටයුතුයි. විහාරයෙන් පිටත යන්නහු විසින් ද පළමුවෙන් දුටු භික්ෂූන් වහන්සේ ලඟ වත නික්ෂේප කටයුතු. මෙසේ යම් පමණ කාලයක් පටිච්ඡන්නාය පවතී නම් එතරම් කාලයක් හෝ කුකුස් විනොදය පිණිස ඊට අධිකයක් හෝ පිරිවෙස් වැස සඞ්ඝයා කරා එළඹ වත් සමාදන් වී මානත පිණිස යාච්ඤා කළ යුතුයි. සමාදන්වූ වත ඇත්තේ ම මානතට සුදුස්සෙක් වේ. වත නික්ෂේප නොකොට රැකියහුට නැවත සමාදන්වීම් කිසක් නැත. ප්‍රතිච්ඡන්න දිනගණන නො පිරිහෙළා පිරිවෙස් රැකියහු විසින් ම මානත ලැබියහැකි වේ. ඉන්පසු ඒ භික්ෂුවහට සඞ්ඝයාගෙන් මානත ලැබේ. මානත්තදායක සඞ්ඝයා විසින් “අහං භන්තෙ සම්බහුලා ආපත්තියො ආපජ්ජිං එකාහ පටිච්ඡන්නායො, සොහං සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහ පටිච්ඡන්නානං එකාහපරිවාසං යාචිං, තස්ස මෙ සඞ්ඝො සම්බහුලානං ආපත්තීනං එකාහ පටිච්ඡන්නානං එකාහපරිවාසං අදාසි. සොහං භන්තෙ පරිවුත්ථපරිවාසො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහ පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචාමි. අහං භන්තෙ-පෙ-සොහං පරිවුත්ථපරිවාසො දුතියම්පි භන්තෙ සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචාමි. අහං භන්තෙ පෙ- සොහං පරිවුත්ථපරිවාසො; තතියම්පි භන්තෙ සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහ පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචාමි.” මෙසේ තෙවරක් පිරිවෙස් පිරූ භික්ෂුව ලවා යාච්ඤා කරවිය යුතුයි. ඉන්පසු “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සම්බහුලා ආපත්තියො ආපජ්ජි, එකාහපටිච්ඡන්නායො- සො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං යාචි. සඞ්ඝො

ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං දදෙය්‍ය. එසා ඤත්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සම්බහුලා ආපත්තියො ආපජ්ජි එකාහපටිච්ඡන්නායො, සො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං යාචි. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං දෙති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තස්ස දානං, සො තුණ්හස්ස, යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි. -පෙ- දින්නං සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං; ඛමති සඞ්ඝස්ස; තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි" යි මෙසේ කර්මවාක්‍යය දෙශනා කටයුතුයි. කර්මවාක්‍යය උදෙසීමට අනතුරුව ඒ භික්ෂු විසින් සීමාමාලකයෙහි දීම "මානත්තං සමාදියාමි, වත්තං සමාදියාමි" යි වත සමාදන්ව සඞ්ඝයාට ද ආරොචනය කටයුතුයි. ආරොචනය කරන්නහු විසින් "අහං භන්තෙ සම්බහුලා ආපත්තියො ආපජ්ජිං එකාහපටිච්ඡන්නායො, සොහං සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං යාචිං, තස්ස මෙ සඞ්ඝො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං අදාසි. සොහං පරිවුත්ථපරිවාසො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචිං, තස්ස මෙ සඞ්ඝො සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සොහං මානත්තං චරාමි; වෙදියාමහං භන්තෙ වෙදියතීති සඞ්ඝො මං ධාරෙතු" යි මෙසේ ආරොචනය කොට ඉදින් නික්ෂෙපකරණු කැමැත්තේ නම් "මානත්තං නික්ඛිපාමි; වත්තං නික්ඛිපාමි" යි සඟමැද නික්ෂෙප කටයුතුයි. ඉදින් නො සිතියෙන් නික්ෂෙප නොකොට සීමාමාලකයෙන් බැහැ ගියේ නම් සට පිරිවෙණ් වාරයෙහිදී කළාක්මෙන් කළහැක. නැවත සමාදන්වීම් නික්ෂෙප කිරීම් ආදිය ද පෙරසේ මැයි.

මෙසේ සරැයක් මුළුල්ලෙහි මානත්ත ඕනාකොට ආරක්ෂාකොට සිටි ඒ භික්ෂුව විංශති වර්ගික භික්ෂූන් විසින් අබ්භානය කටයුතුයි. ඒ භික්ෂුව නික්ෂිප්ත වත් ඇත්තෙකු හෙයින් තාවම අබ්භාන කර්මයට නුසුදුසු ය. එහෙයින් පළමුකොට ම වත් සමාදන් කරවිය යුතුයි. සමාදන් වූ වත් ඇති ඒ භික්ෂුව සඞ්ඝයා විසින් අබ්භාන කර්මය පිණිස

මෙසේ යාච්ඤා කරවිය යුතුයි. "අහං භන්තෙ සම්බහුලා ආපත්තියො ආපජ්ජිං එකාහප්පටිච්ඡන්නායො, සොහං සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං එකාහපරිවාසං යාචිං, තස්ස මෙ සඞ්ඝො සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං එකාහපරිවාසං අදාසි. සොහං පරිවුත්ථපරිවාසො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචිං; තස්ස මෙ සඞ්ඝො සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි. සොහං භන්තෙ චිණ්ණමානත්තො, සඞ්ඝං අබ්භානං යාචාමි. දුතියම්පි -පෙ- තතියම්පි භන්තෙ සඞ්ඝං අබ්භානං යාචාමි. මෙසේ තුන්වරක් යාච්ඤා කරවා "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සම්බහුලා ආපත්තියො ආපජ්ජි එකාහප්පටිච්ඡන්නායො; සො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං එකාහපරිවාසං යාචි. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං එකාහපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං ඡාරත්තං මානත්තං අදාසි. සො චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං අබ්භෙය්‍ය, එසා ඤත්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සම්බහුලා ආපත්තියො ආපජ්ජි එකාහප්පටිච්ඡන්නායො. සො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං එකාහපරිවාසං යාචි. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං එකාහපරිවාසං අදාසි. සො පරිවුත්ථපරිවාසො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං යාචි. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං එකාහප්පටිච්ඡන්නානං ඡාරත්තං මානත්තං අදාසි සො චිණ්ණමානත්තො සඞ්ඝං අබ්භානං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං අබ්භෙති; යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො අබ්භානං, සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි. -පෙ- අබ්භිතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු, ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි' මෙසේ කර්මවාක්‍ය දෙශනා කටයුතුයි. මෙහි දක්වන ලද 'එකාහපටිච්ඡන්නානං' වෙනුවට කර්මවාක්‍යයෙහි සුදුසු පරිදි 'ද්වීහපටිච්ඡන්නානං' යනාදි වශයෙන් යොදනු මැනවි. පටිච්ඡන්න නුවූ ඇවැත් ඇති සඟුනට පිරිවෙස් සමාදන්වීම් කිසක් නො මැතිය. මානත්ත පමණක් ආරක්ෂිත වූ චිණ්ණමානත්ත භික්ෂුව විංශතිවර්ගික සඞ්ඝයා විසින් අබ්භානය කටයුතුයි. යට දැක්වූ කර්මවාක්‍යය "අප්පටිච්ඡන්නායො"යි වෙනස්කරගැණීම කටයුතුයි.

'සුද්ධාන්තපරිවාසය වනාහි චූලසුද්ධාන්තය මහාසුද්ධාන්තයයි දෙපරිදි වේ. සම්පූර්ණ රාත්‍රිසංඛ්‍යාව හෝ අඩක් හෝ විස්මෘතයාහටද වෙමතිකයාහට ද දියයුතු පරිවාසයයි. සඞ්ඝයා විසින් ඒ පිරිවෙස්

ලබනු කැමති භික්ෂුවගෙන් උපසම්පදා වූ දින පටන් පිරිවෙස් සමාදන් වන දින තෙක් ඇවතකට නො පැමිණ පිරිසිදුව විසූ පක්ෂ මාස-අවුරුදු ගණන විචාළ කල්හි "ස්වාමීනි, මම මෙතෙක් කල් පිරිසිදුව විසීමි. ඒ බැව් දැන වදාළ මැනවයි කී කල්හි ඒ භික්ෂුහට සඞ්ඝයා විසින් දියයුතු පිරිවෙස චූලසුද්ධන්ත නම්. පාරිවාසික භික්ෂුව ද තමන්ගේ උපසම්පදා වස් ගණනින් පිරිසිදු බැව් දන්නා කාලය අත හැර ඉතිරිවූ කාලයට සමාන කාලයක් මුළුල්ලෙහි පිරිවෙස් පිරිය යුතුයි. එසේ පිරිවෙස් පුරණ කල්හි තව මසක් හෝ අවුරුද්දක් හෝ අපිරිසිදු යයි තමන්ට හැඟුනි නම් ඒ කාලයද පිරිවෙස් පිරීමෙන් ගතකළයුතුයි. ඒ කාලයට ගතයුතු පිරිවෙස් සමාදානය නැවත සඞ්ඝයාගෙන් නො ලැබුනාට වරදෙක් නැත. කාලය පිළිබඳ අඩු වැඩි කරගැනීම ඒ පුරණ අතරදීම කළහැක. අපටිච්ඡන්නාවූ ඇවත පටිච්ඡන්නායයි සලකා පිරිවෙස් විසූකල්හි ද ආපත්ති වුට්ඨානය සිදුවේ. පටිච්ඡන්න ඇවත අපටිච්ඡන්න යයි සැලකූ කල්හි ආපත්ති වුට්ඨානයක් සිදු නොවේ. කාලය පිළිබඳවද මේ නයින් සැලකිය යුතුයි.

යමෙක් වනාහි අනුලෝම ප්‍රතිලෝම ක්‍රමයෙන් සඞ්ඝයා විසින් විචාරණ ලද්දේ අපටිච්ඡන්නව විසූ කාලසීමාවක් සිහි නො කෙරේද; ඒ භික්ෂුහට දියයුතු පිරිවෙස 'මහා සුද්ධන්ත' නම්. ඒ භික්ෂුව විසින් උපසපන් වූ තැන්පටන් පිරිවෙස් සමාදන් වන දින තෙක් රාත්‍රීන් ගණන් කොට ඊට සමාන කාලයක් මුළුල්ලෙහි පිරිවෙස් සමාදන්ව විසිය යුතුයි. එසේ පිරිවෙස් සමාදන්වනු කැමති ඒ භික්ෂුව විසින් සඞ්ඝයා කරා එළඹ තනිපටසිවුර එකස්කොට පොරවාගෙණ වැඩිමහලු භික්ෂූන් පා වැඳ උක් කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳගෙණ "අහං භන්තෙ සම්බහුලා, සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං, ආපත්තිපරියන්තං නජානාමි, රත්තිපරියන්තං න ජානාමි. ආපත්තිපරියන්තං න සරාමි රත්තිපරියන්තං න සරාමි. ආපත්තිපරියන්තෙ වෙමතිකො, රත්තිපරියන්තෙ වෙමතිකො, සොහං භන්තෙ සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්ත පරිවාසං යාචාමි." යි තුන් වරක් යාචඤා කටයුතුයි. ඉක්බිති ව්‍යක්ත වූ ප්‍රතිබලවූ භික්ෂුව විසින් සඞ්ඝයාට මෙසේ දැන් විය යුතුයි. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමො භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. ආපත්ති පරියන්තං න ජානාති. රත්ති පරියන්තං න ජානාති. ආපත්ති පරියන්තං න සරති. රත්ති පරියන්තං න සරති. ආපත්ති පරියන්තෙ වෙමතිකො, රත්තිපරියන්තෙ වෙමතිකො, සො සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්ත පරිවාසං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්ත පරිවාසං දදෙය්‍ය, එසා ඤත්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමො භික්ඛු, සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජි. ආපත්ති පරියන්තං නජානාති, රත්ති පරියන්තං නජානාති. ආපත්ති පරියන්තං නසරති. රත්තිපරියන්තං න සරති. ආපත්ති පරියන්තෙ වෙමතිකො රත්ති පරියන්තෙ වෙමතිකො, සො සඞ්ඝං තාසං ආපත්තීනං සුද්ධන්තපරිවාසං

යාචති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්ත පරිවාසං දෙති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්ත පරිවාසස්ස දානං, සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය, දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි–පෙ–දින්නො සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො තාසං ආපත්තීනං සුද්ධන්ත පරිවාසො, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි'' යි මෙසේ සුද්ධාන්ත පරිවාසය දිය යුතුයි. ඉත් සමාදන් වීම් විධි පෙරසේ මැයි.

'සමොධාන පරිවාසය' නම් පිරිවෙස් රක්නාහු අතර ඇවැත්වලට පැමිණීමෙන් ඇති වන පටිච්ඡන්න දිනගණනද මුල් දින ගණනට ම ගලපා දියයුතු පිරිවෙසයි. යමෙක් ප්‍රතිච්ඡන්න ඇවැත් සමූහයක් නිසා පිරිවෙස් හෝ මානත හරින්නේ නැසහොත් අබ්භාන කර්මයට සුදුසු වූයේ හෝ කළ වත් ඇත්තේ අතරෙහි අතික් සඞ්ඝාදිසේසාපත්තියකට පැමිණ පළමු ඇවතට සම වූ හෝ ඌනවූ දින ගණනක් පටිච්ඡන්න කෙරේද, එකල පළමු පිරිවෙස් විසූ දින ගණනද, මානත් පිරූ දින ගණනද සම්පූර්ණයෙන් මකා හැර අනතරාපත්තියෙන් ප්‍රතිච්ඡන්නවූ දින ගණන මූලාපත්තියේ දින ගණනට එකතුකොට ඒ දින ගණනින් නැවත පිරිවෙස් සමාදන් කරවිය යුතුයි.

මූලාපත්තිය පක්ඛපටිච්ඡන්නය, අන්තරාපත්තිය ඌනක පක්ඛපටිච්ඡන්නය; එහෙත් ඔහු විසින් නැවත පක්ෂයක් ම පිරිවෙස් පිරිය යුතුයි. සැට වසක්ම පිරිවෙස් වැස නිමකොට මානත්තාර්හව සිටි භික්ෂු තෙමේ අනතරාපත්තියකට පැමිණීමෙන් වූ පටිච්ඡන්නය එක් දිනක් වුවත් නැවත සැට වසක් ම පිරිවෙස් පිරීමට සුදුස්සෙක් වෙයි. ඉදින් වැස නිමවන ලද වත් ඇත්තෙකුට නම් මූලාපත්තියේ දිනගණන අනතරාපත්තියේ දිනගණනට එකතුකොට නැවත පිරිවෙස් දීම නුසුදුසුය. ඒ මනණකට අනතරාපත්තියේ දින ගණනට සෑහෙනසේ පිරිවෙස් සමාදන් කරවීම වටී. අනතරාපත්තියේ දින ගණන අධික නම් එම ආපත්තිය මූලාපත්තිය කොට පිරිවෙස් සමාදන් කරවිය යුතුයි. මෙය මනායි 'ඔධාන සමොධාන' නම්. අනතරාපත්තියට පැමිණි භික්ෂුව විසින් පෙරසේම පූර්වකෘත්‍යය කොට "අහං භන්තෙ සම්බහුලා ආපත්තියො ආපජ්ජිං, පක්ඛපටිච්ඡන්නායො, සොහං සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං පක්ඛ පරිවාසං යාචිං, තස්ස මෙ සඞ්ඝො සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං පක්ඛපරිවාසං අදාසි. සොහං පරිවසන්තො අන්තරා සම්බහුලා ආපත්තියො ආපජ්ජිං පඤ්චාහ පටිච්ඡන්නායො, සොහං භන්තෙ සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං පඤ්චාහ පටිච්ඡන්නානං මූලාය පටිකස්සනං යාචාමි'' යි තුන් වරක් මෙසේ ආයාචනය කටයුතුයි. ඉක්බිති ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුවක් විසින් මේසේ ආරොචනය කටයුතුයි. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සම්බහුලා

ආපත්තියො ආපජ්ජි පක්ඛපටිච්ඡන්නායො; සො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං පක්ඛපරිවාසං යාචි. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො, සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං පක්ඛපරිවාසං අදාසි. සො පරිවසන්තො අන්තරා සම්බහුලා ආපත්තියො ආපජ්ජි පක්ඛපටිච්ඡන්නායො, සො සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං මූලාය පටිකස්සනං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං අන්තරා සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං මූලාය පටිකස්සෙය්‍ය එසා ඤත්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සම්බහුලා ආපත්තියො ආපජ්ජි පක්ඛපටිච්ඡන්නායො, සො සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං පක්ඛපරිවාසං යාචි. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං පක්ඛපරිවාසං අදාසි. සො පරිවසන්තො අන්තරා සම්බහුලා ආපත්තියො ආපජ්ජි පක්ඛපටිච්ඡන්නායො. සො සඞ්ඝං අන්තරා සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං මූලාය පටිකස්සනං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං අන්තරා සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං මූලාය පටිකස්සති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො අන්තරා සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං මූලාය පටිකස්සනා. සො තුණ්හස්ස යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි—පෙ—තතියම්පි එතමත්ථං වදාමි—පෙ— පටිකස්සිතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු අන්තරා සම්බහුලානං ආපත්තීනං පක්ඛපටිච්ඡන්නානං මූලාය පටිකස්සනං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී එවමෙතං ධාරයාමී”ති මූලායපටිකස්සනය කට යුතුයි.

‘අග්ඝසමොධානය’ නම් බොහෝ ඇවැත් ජාතී අතුරෙහි ඉතා අධික දින ගණන ප්‍රතිච්ඡන්නවූ ඇවත පරීක්‍ෂා කොට එම දින ගණනට තරම් වූ දින ගණනක් පිරිවෙස් පුරණ ලෙස සමාදන් කරවීමයි. ‘මිස්සක සමොධානය’ නම්, නානා වස්තුක ආපත්තීන් පිඬු කොට දෙනු ලබන පරිවාසයයි, ‘අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං, එකං සුක්කවිස්සට්ඨිං, එකං කායසංසග්ගං, එකං දුට්ඨුල්ලවාචං, එකං අත්තකාමං, එකං සංචරිත්තං, එකං කුටිකාරං, එකං විහාරකාරං, එකං දුට්ඨදොසං, එකං අඤ්ඤභාගියං, එකං සඞ්ඝභෙදකං, එකං සඞ්ඝභෙදානුවත්තකං, එකං දුබ්බචං, එකං කුලදූසකං සොහං භන්තෙ සඞ්ඝං තාසං ආපත්තීනං සමොධාන පරිවාසං යාචාමී”ති පාරිවාසික භික්‍ෂුව මෙසේ තුන්වරක් අයැදි කල්හි සඞ්ඝයා විසින් සුදුසු කර්ම වාක්‍යයෙන් පිරිවෙස් සමාදන් කරවිය යුතුයි.

අඤ්ඤබන්ධා මොචෙති- තමන්ගේ අත් පා ආදියක ගටා හෝ අත් පා ආදියකින් ගටා මුදයි. බන්ධා මොචෙති- අනුන් පිළිබඳ අත් පා ආදියක ගටා හෝ අත් පා ආදියකින් ගටා මුදයි. අනුපාදියනෙන- යතුරු, සාඬොලු ආදීයෙහි; උම්මාලිඞ්ගපාණක දම්බුපපුමෙහ-

උච්චා ලිඞ්ගපාණක නම් බූව සහිත පණුවන් දඩකිරීමෙන් අඞ්ග ජාතය කම්මණ්‍යවූ කල්හි; උච්චාලිඞ්ගපාණක යනු දලබූ විශෙෂයකැයි යෙත්. ඔවුන් ගේ බූව ගැවීමෙන් අඞ්ගජාතය විදින්නාක් මෙන් වේදනා දෙනෙන හෙයින් දට්ඨ යි කියන ලදී. අරොගො භවිස්සාමි- සුකුරු මිදීම් හෙතුවෙන් නීරොග වන්නෙමි. සුඛං වෙදනං උප්පාදෙස්සාමි-මිදීමෙහිද ගැටීමෙහිද, මිදීමෙන් පසුවද ඇතිවන සුවය විඳිමි, භෙසජ්ජං භවිස්සති-මා විසින් මිදූ සුකුරු කිසිවෙකුට බෙහෙතක් වන්නේය. දානං දස්සාමි- සුකුරු මුඳු කුහුඹු ආදීන්ට දනක් දෙමි. පුඤ්ඤං භවිස්සති- සුකුරුමුඳු කුහුඹු ආදීන්ට දෙන්නානුව පිණක් සිදු වන්නේය. සග්ගං ගමිස්සාමි- සුකුරු මුඳු කුහුඹු ආදීන්ට දන් දුන් පිණින් දෙව්ලොවට පැමිණෙන්නෙමි. බීජං භවිස්සති- කුලයට අඞ්කුරයක් වැනිවූ දරුකොත්පත්තියට බීජයක් වන්නේය. වීමංසත්ථාය- දූත. ඇණීම පිණිස; නීලං භවිස්සති- කිම නිල් පැහැය වන්නේද; ජනනාසරෙ- ඛහගත්වනශෙහි, මෙය මතු විසතර වෙයි. මග්ගං ගච්ඡන්තස්ස-මග යන්නහුට; ඇතැමෙකු ගමන් කරණ කල්හි කලවා මහත් හෙයින් ලිඟු හා ගැටීමෙන් සුකුරු මිදෙයි. වත්ථිං ගහෙත්වා පස්සාවං කරොන්තස්ස- 'වත්ථි' නම් ලිඟු අග වසා සිටි සමයි. එය දැඩිකොට අල්වා ගෙණ මූත්‍රයෙන් පුරව පුරවා ගම් දරුවන් මෙන් මුත්‍ර කරන්නහුට; උදකඤ්ජලිං- මඩ; පුප්ඵාවලියං- එනම් ක්‍රීඩා විශෙෂය; ගං හෝවල ඉවුරු සිඳි තැන් ජලය දමීමෙන් දැඩිසේ මඩ කොට එහි පා දිගුකොට මුකින් හිඳ ලිස්ස ලිස්සා දියට බැසීම් වසයෙන් කරණ ක්‍රීඩාවකි. වාලිකං අඞ්ගජාතං සඞ්ඝට්ටෙන්තස්ස වැල්ලෙහි ලිඟු ඔබන්නහුට; මෙහි 'පවෙසෙන්තස්ස' යන්න විකම්ක හෙයින් වාලිකං, යනු ආධාරය කර්මත්වයෙන් සිට ද්විතීයා ගත්තැනි. චෙතනා, උපක්කම, මුච්චන වශයෙන් මෙහි අඞ්ගත්‍රයයකි. මෙය කායචිත්ත වසයෙන් සමුට්ඨාන වන හෙයින් පළමු පරිජි සමුට්ඨානයට අයත් වේ.

සුක්කවිස්සට්ඨි සික්ඛාපද ගැටපදයයි.

---

අරඤ්ඤෙ- වනයෙහි; මෙය දෙව්රම් වෙහෙර අසල පිහිටි වන රොදකි. මජ්ඣෙ ගබ්භො- ඒ විහාරය මැද කාමරයක් වෙයි. සමන්තා පරියාගාරො- හාත්පස මණ්ඩලමාලයකින් පිරිකෙව් කළ ගෙමැද පිහිටියේ වෙයි. එම කාමරය මැදිවනසේ ඇතුළුගෙහිම ගමන් කළ හැකිය. සුපඤ්ඤත්තං- සරසා පිළියෙළ කරණලදී. බලන්නවුන්ගේ සිත් යම් යම් සේ සතුටු වේද එසේ සැරසූනකි. වත් සැපයීම් වසයෙන් හෙතෙමේ කිසිවක් නො කරයි. අවාපුරණං- යතුර; සූචිකං- අගුල; උග්ඝාටෙත්වා- හැර; එකමෙකං වාතපානං විවරන්තො- ඇතැම් කවුළු විවෘතකළ කල්හි ගෙය අඳුරුවේද ඒ කවුළු හරිමින්, එකමෙකං වාතපානං ථකෙන්තො- ඇතැම් කවුළු හැරි කල්හි ගෙය ආලොක වත් වේද ඒ කවුළු වසමින්; එක් කවුළුවක් විවෘතකළ කල්හි වැටෙන ආලොකය විවෘත කළ අනික් කවුළු දෙරකින් වැසීයෙයි.

**එවං වුත්තෙ සා බ්‍රාහ්මණී තං බ්‍රාහ්මණං එතදවොච**- මෙසේ ස්තුති වශයෙන් කී කල්හි බැමිණිය බමුණාට මෙය කීය. බැමිණිය තමාගේ අවයව පරාමර්ශනය කෙරෙද්දී අනාචාරානුකූලව කිසිවක් නොකියා සිට, ඔමුණාගේ මෙසේ පැසසීම පැවිද්දාහු අදහසින් වූවක්දැයි සැක කරන්නී, ඒ මහණහට නිග්‍රහ කරණ අදහසින් තමන්ට කළ දෙය මෙසේ විස්තර වශයෙන් කීය. **කුතො තස්ස උළාරත්තතා**-ප්‍රණීතාවූ මුකතිභාවයක් ඔහුට කොයින්ද? (උළාරෙ අත්තා අස්සාති උළාරත්තා උළාරත්තතො භාවො උළාරත්තතා) යනු විග්‍රහ වාක්‍යයි; **කුලිත්ථි**- කෙනීම් සත්‍රිය; **කුලධීතා**- සරණක ගිය කුලදුව; **කුලකුමාරී**-සරණක නොගිය ගෙහි වැඩෙන කුලදුව; **කුලසුණ්හා**- අන් ගෙයින් විවාහ වසයෙන් ගෙණා සත්‍රිය; **ඔතිණ්ණො**- ලිදක වැටුනු සත්වයා ජලයෙන් මැඩෙන්නාක් මෙන් රාගයෙන් මැඩුනු සිත් ඇත්තේ; 'රාගයෙන් ගොඩ නැගෙන්නෙමි' යි භික්ෂුභාවයට පැමිණ නැවත රාගයෙහි ම ගැලුනේ යන අර්ථයි. **සාරත්තො**- කායසංසර්ග රාගය කරණ කොට ගෙණ මනාකොට ඇලුනේ, 'සංපුබ්බ රඤ්ජ' ධාතුයි. **අපෙක්ඛවා**- කාය සංසර්ගය බලාපොරොත්තුවන්නේ; **විපරිණතෙන**- පිරිසිදු භවාඞ්ග සිතින් වෙන්වූ හෙයින් අන් අයුරකින් පවත්නා සිතින්; **තදහුජාතා**- එදවස උපන්; උපන්හැටියේ හෙයින් තෙත මස්පිඩක් වැනි පැහැය ඇති ඒ නැනැත්තිය සමඟ වුවද කායසංසර්ගයෙහි සඞ්ඝාදිසෙසයද මෙවුන්දම් සෙවීමෙහි පරිජ්ද, රහසිගතව හිඳීමෙහි පචිතිද වේ. **කායසංසග්ගං**- අත් ගැණීම් ආදි වසයෙන් සත්‍රියගේ කාය හා මිශ්‍රවීමට; **අජ්ඣාචාරො**- මේ කායසංසර්ග රාගයම සීලය පිළිබඳ සීමාව්‍යතික්‍රමය කළ හෙයින් අජ්ඣාචාර නම්. **හත්ථො නාම කප්පරං උපාදාය**-අත නම් වැලමිටි පටන් ඇති අග බාහුවයි. අතේ මණිබන්ධයේ පටන් ඇඟිලි අග තෙක් ඇති කොටස යයි සමහරු කියති. මෙහි 'හත්ථ' ශබ්දයෙන් පැලඳි වස්ත්‍රාලංකාරාදිය හැර සියලුම උපාදින්නක සිරුර ගත යුතුයයි වජිරබුද්ධි ටීකාවෙහි දක්වේ. **වෙණී**- කෙස් වැටි එකට ගොතා කළ කෙසය; නැතහොත් මල් පැලඳි නො ගෙතූ කෙසය; 'වෙණී' ශබ්දයෙන් අනුපාදින්නක සිරුර හා මිශ්‍රව පවත්නාවූ කෙස් ලොම් නිය දත් ආදි වූ සියල්ල ගතයුතුයයි ඇතැම් කෙනෙක් කියත්. **සුත්තමිස්සා**- පස්වණක් හූ සමඟ මිශ්‍රකොට ගෙතූ කෙසය; **මාලාමිස්සා**- දූසමන් ආදී මල් මිශ්‍ර කෙස්වැටි තුණක් කොට එකට ගෙතූ කෙසය; **හිරඤ්ඤමිස්සා**- කහවණු මාලයක් හා මිශ්‍රකොට ගෙතූ කෙසය; **සුවණ්ණමිස්සා**- රන් හවඩි මිශ්‍රකොට ගෙතූ කෙසය; **මුත්තාමිස්සා**- මුතුපට හා මිශ්‍රකොට ගෙතූ කෙසය; **මණිමිස්සා**- මැණික් ඇවුනු වැල් හා මිශ්‍රකොට ගෙතූ කෙසය; **අඞ්ගං**-අත්ද, වෙණියද හැර සෙසු ශරීරයාගේ; **ආමට්ඨමත්තා**- ස්පර්ශ කළ ස්ථානය නොහැර ගෑවීම; **උම්මසනා**-තමන්ගේ කය සත්‍රියගේ කය මතුයෙහි තැබීම; **උල්ලඞ්ඝනා**- තමන්ගේ කයින් සත්‍රියගේ කය එසවීම; **කායෙන කායං ආමසති පරාමසති**- තමන්ගේ කයින් සත්‍රියගේ කය ආමර්ශනය කෙරෙයි; පරාමර්ශනය කෙරෙයි.

අත තැබූ තැනම ගැටීම ආමර්ශන නම්. එහා මෙහා ගැටීම පරාමර්ශන නම්. තමන්ගේ එක් අතකින් ස්ත්‍රියගේ අතක් ගෙණ එය හුම්බද අනික් අතින් ඇය සිරුර මුළුල්ල අතගෑ නමුදු සිදුවන්නේ එක් ඇවතකි. හයින් අත මිදූ වාරගණනින් ඇවැත් ගණන වැඩේ. නැතහොත් වෙන් වෙන් වශයෙන් අත තැබූ වාරගණනින් ඇවැත් සිදුවේ. ස්ත්‍රියගේ අත ගෙණ යොදුනක් තැන් ගිය භික්ෂුහට ද සිදුවන්නේ එක් ඇවතකි. ද්වෙ ඉත්ථියො- ස්ත්‍රීන් දෙදෙනෙක් නම් සඞ්ඝාදිසෙස ද දෙකකි. ස්ත්‍රීන්ගේ අධිකත්වයෙන් ආපත්ති සඞ්ඛ්‍යාවද වැඩේ. ස්ත්‍රීන් සමූහයක් දෙ අතින් බඳා අල්ලාගත් කල්හි තමන්ගේ කය හා ස්පර්ශවූ ස්ත්‍රීන්ගේ ගණනින් ඇවැත් සිදුවේ. සිරුර හා නොගැටී මැදිවී සිටි ස්ත්‍රීන්ගේ ගණනින් ථුලසී වේ. ස්ත්‍රීන් සමූහයක ඇඟිලි හෝ කෙස් අල්ලාගත් කල ඇඟිලි ගණනින් කෙස් ගණනින් ඇවැත් නියම නොකොට ස්ත්‍රීන් ගණනින් ඇවැත් පිරිසිඳිය යුතුයි. බොහෝ ස්ත්‍රීන් වටකොට ගත් කල ස්ත්‍රීන්ගේ ගණනින් ථුලසී සිදු වේ.

ස්ත්‍රීන් සමූහයක් පිළිවෙළින් ඔවුනොවුන් අත් ගෙණ සිටි කල භික්ෂුවක් එතනට පැමිණ කෙළවර සිටි ස්ත්‍රියගේ ඇඟිල්ල රාගචිත්තයෙන් යුක්තව අල්ලාගනී. ඒ භික්ෂුහට ස්පර්ශවූයේ එතම ස්ත්‍රිය හෙයින් එක් සඞ්ඝාදිසෙසයක් පමණක් සිදුවේ. සෙසු ස්ත්‍රීන් ගණනින් ථුලසී වේ. ඒ ස්ත්‍රීහු තම තමන්ගේ ඇඳුම් පිළිවෙළින් ගෙණ සිටියාහුද එකල සිදුවන්නේ තමන් හා ගැටුනු ස්ත්‍රිය නිසා සඞ්ඝාදිසෙසයක් හා සෙසු ස්ත්‍රීන් ගණනින් දුකුළුං ද වේ. තමන්ගේ සිරුරෙහි ලොමකින් ස්ත්‍රියකගේ සිරුරුගත ලොමක් ස්පර්ශවූ කල්හිද භික්ෂුහට සඞ්ඝාදිසෙසාපත්තිය සිදුවේ. කායසංසග්ගං- ස්ත්‍රියක යන හැඟීමෙන් යුක්තව ස්ත්‍රිය ආමර්ශනය කරන්නහුට සඞ්ඝාදිසෙසය වේ. කය පිළිබඳ වූවක් ආමර්ශනය කරන්නහුට ථුලසී වේ. කළුවතක් පොරවාගෙණ නිදා සිටි නළුපැහැති ස්ත්‍රියකගේ කය ස්පර්ශකරමියි යන හැඟීමෙන් යුක්තව කය ගැටූ කල්හි සඞ්ඝාදිසෙසාපත්තිය සිදුවේ. කය ගටමියි ගැටුනේ වත නම් සිදුවන්නේ ථුලසියකි. වස්ත්‍රය ස්පර්ශකරමින් ඇල්ලූවහුට කය ස්පර්ශවීනම් සඞ්ඝාදිසෙසාපත්තිය සිදුවේ. ඵස්සං පටිවිජානාති ස්පර්ශය දැනගණියි. ස්ත්‍රිය විසින් ආමර්ශනය කරණු ලැබූ මහණ තෙමේ සෙවුනා අදහසින් ස්පර්ශය විඳීම පිණිස මඳක් තම කය සොලවා ද ඒ භික්ෂුහට සඞ්ඝාදිසෙසාපත්තිය සිදු වේ. කායෙන වායමති න ච ඵස්සං පටිවිජානාති- ඇඟිලි වැනීම්, බැම එසවීම් ආදී කායව්‍යායාම කෙරෙයි. එහෙත් ශරීර ස්පර්ශය නොදනී. මෙසේ ඇති කල සිදුවන්නේ දුකුළාව් පමණකි.

මේ ශික්ෂාපදය, මිනිස් මාගමක් වීම ස්ත්‍රියක යන හැඟීම, ඇතිවීම කායසංසග්ග රාගයෙන් යුක්තවීම, ඒ රාගයෙන් ව්‍යායාම කිරීම, අත් ගැණීම් ආදියෙහි යෙදීම යන අඞ්ග පසකින් යුක්තය. කායචිත්ත සමුට්ඨානයෙන් යුක්තය. මාතුයා මාතුපෙමෙන- මාතෘ ප්‍රේමයෙන්

මවගේ සිරුර අංගමර්දනය කෙළේය. මේ මාගේ මවුය, දුවය, සොහොයුරියයි ගෙහසිත ප්‍රේමයෙන් ස්ත්‍රී කායසංසර්ගය කරණ භික්ෂුහට දුකුළා වේ. සැඩපහරකට අසුවූ මවු හුදු අතින් ආමර්ශනය නොකට යුතුයි. ඔරු, කඳු ආදී ලඟ තිබෙන දෙයක් වහා ලංකළ යුතුයි. එබඳු යමක් වහා සපයාගත නොහැකි සල්හි සිවුර හෝ ඉදිරියෙහි තැබිය යුතුයි. එය අල්ලාගත් කල්හි සිය පිරිකර ඇදගෙණ යම් යත හැකිමෙන් සුසාතව ඉවුරට ලංකොට ගත යුතුයි. ඉදින් බියවී නම් ඉදිරියෙන් ඉදිරියෙන් ගමන් කරමින් බිය පහව යන සේ අස්වැසිය යුතුයි. තම අත හෝ යම්කිසි ශරීරාවයවයක් බියෙන් අල්ලා ගත හොත් අතහරින්ට යයි කියන්ට නුසුදුසුය. ඉවුරට කෙසේ නමුත් පැමිණවිය යුතුයි. හුදෙක් මාගම්හුගේ සිරුර පමණක් නොව ඇය අඳිනා පලඳිනා වස්ත්‍රාභරණ ද භික්ෂුහට අනාමාසය. සිවුරු පිණිසයයි දුන් ස්ත්‍රීන්ගේ නිවාසන පාරුපනාදිය පිළිගැණීම නිවරදය. ලී, දත්, මැටි ආදියෙන් තෙලූ මාගම්රූද භික්ෂුහට අනාමාසය. ස්ත්‍රියක් භික්ෂුහුගේ පාදෝපස්පර්ශ වතසේ වඳින්ට පටන්ගණී නම් වහා පා වස්ත්‍රාන්තයින් වසාගත යුතුය. නැතහොත් නිශ්චලව සිටිය යුතුය. දාරුධීතලිකාය- ලීයෙන් කළ මානම් රූවක් සමග; සංකමං- ඒ දඬුකඳ; ආවිඤ්ඡි- ඇද්දේය.

කායසංසග්ග සඞ්ඝාදිසෙස ගැටපදය නිමි.

---

ශිඛරණීයා- පවෙනි බියක් නැත්තියෝ; 'ශිතනාඹතපපා' යි කිය යුතු තැන උත්තරපදලෝපයෙන් 'ශිඛරණී' යි කීය. සම්භින්නා- කොරළි ස්ත්‍රීහු; අහිරිකා- ලජ්ජා නැත්තියෝ; උල්ලපනාති- 'අහෝ ශිම්‍යනි' යනාදී වශයෙන් කාමයෙහි පොළඹවන වචන කථා කරත්. උජ්ජග්ඝකාති- මහා සිනාවෙන් සිනාසෙත්. උප්පණ්ඩකාති- මේ තෙමේ පණ්ඩකයෙකි, පුරුෂයෙක් නොවෙයි, යනාදී වශයෙන් කවටකම් කරත්. විඤ්ඤු පටිබලා සුභාසිත දුබ්භාසිතං දුට්ඨුල්ලා දුට්ඨුල්ලං ආජානිතුං- සාර්ථක නිරර්ථක තෙපුල්ද අසද්ධර්ම ප්‍රතිසංයුක්ත කථාද දැනගන්ට ප්‍රතිබලවූ, එසේම නුවණැත්තාවූ ස්ත්‍රිය; වැඩිමාලු වුවත් මෙබඳු තෙපුල් නොගන්නී නම් ඒ ස්ත්‍රිය මෙහි අනභිප්‍රේතය. ඔභාසෙය්‍ය- නානාප්‍රකාර අසද්ධර්ම ප්‍රතිසංයුක්ත වචන කථාකරන්නේය. අජ්ඣාචාරෝ- සීලය පිළිබඳ සීමාව ඉක්මවා හැසිරීම; ඛුංසෙති- වචන නමැති කෙවිටිවලින් අනියි. වම්භෙති- නින්දා කෙරෙයි. ගරහති- දොස් පෙන්වයි. ජාරස්ස- ජාර සැමියාට; අනිමිත්තාසි- නිමිති රහිත එකියක් වෙහිය, නැතහොත් කෙසි සිදුරක් වැනි දකනෝතය ඇත්තියක් වෙහිය. නිමිත්තමත්තාසි- නිමිති සටහන පමණක් ඇත්තියක් වෙහිය. නොහොත් සම්පූර්ණවූ නිමිත්ත ඇත්තියක් වෙහිය. අලෝහිතාසි- වියළිගිය සෙයින් දකනොහොයානේ පතවසිය ලේවත් බව ඇත්තියක් වෙහිය. ධුවලෝහිතාසි- ලේ නිතර වැගිරෙණ ලිඟු ඇත්තියක් වෙහිය. ධුවචෝළාසි- ප්‍රසම්පත ආනිචෝලය ඇත්තියක් වෙහිය. නොහොත්

රෙදි ගුලියක් නිතර දරන්නෙහිය. පග්ඝරන්තීසි- නිතර මූ වැගිරෙන්නියක් වෙහිය. සිඛරණීසි- පිටතට නික්මුනු මස්පිඩ ඇත්තියක් වෙහිය. ඉත්ථිපණ්ඩකාසි- නිමිති නැත්තියක් වෙහිය. වෙපුරිසිකාසි- දැළිරැවුල් ඇති හෙයින් පුරුෂගති ඇත්තියක් වෙහිය. සම්භින්නාසි- බිඳුනු - වසමග පසමග ඇත්තියක් වෙහිය. උභතොබ්‍යඤ්ජනකාසි- ස්ත්‍රීනිමිති පුරුෂ නිමිති යන දෙනිමිතින් යුක්තියක් වෙහිය. 'අනිමිත්තාසි' යනාදි එකොළොස්පද අතුරෙන් 'සිඛරණීසි, සම්භින්නාසි උභතොබ්‍යඤ්ජනකාසි' යන පද තුණ වනාහි සඞ්ඝාදිසෙසයට සම්පූර්ණ කරත්. 'අනිමිත්තාසි' ආදිවූ සෙසු අටපදය 'අනිමිත්තෙ මෙථුනං ධම්මං දෙසි' යනාදි වශයෙන් 'මෙථුනං ධම්මං' යන දෙපදය හා සහිත කල්හිම ආපත්තිකර වෙති. අධක්ඛකං- අකු ඇඟය පටන් යට පෙදෙස; උබ්භජාණුමණ්ඩලං- දනමඬල පටන් මතු පෙදෙස; අධොජාණුමණ්ඩලං- දනමඬලින් යට පෙදෙස; කායපටිබද්ධං- කය පැළඳි වස්ත්‍ර හෝ පුෂ්ප හෝ ආභරණ; අත්ථපුරෙක්ඛාරස්ස- 'අනිමිත්තාසි' යනාදි පදයන්ගේ අරුත් කියන්නහුට නොහොත් අටුවා කථාව හෝ සජ්ඣායනා කරන්නහුට; ධම්මපුරෙක්ඛාරස්ස- පාලිය කියවන්නහුට; අනුසාසනීපුරෙක්ඛාරස්ස- අනුශාසනය පෙරටු කොට කියන්නහුට; යමෙක් භික්ෂුණීන්ට පෙළ කියවන්නේ ප්‍රකෘතියෙන් කියවන ක්‍රමය වෙනස් කොට සිනාසෙමින් 'සිඛරණීසි, සම්භින්නාසි, උභතොබ්‍යඤ්ජනකාසි'' යනාදි විසින් නැවත නැවත බෙණේද, ඒ භික්ෂුහට ඇවැත් සිදුවෙයි.

සමුට්ඨාන වශයෙන් මේ ශික්ෂාපදය 'කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත' වශයෙන් තිසමුට්ඨාන වේ. මිනිස් මාගමක් වීම, ස්ත්‍රියක යන හැඟීම ඇතිවීම, දුට්ඨුල්ලවාචස්සාද රාගයෙන් යුක්තවීම, ඒ රාගයෙන් යුක්තව කීම, එකෙණෙහිම දැනගැණීම යන අඞ්ග පසකින් යුක්ත වේ. නවාවුතං- අලුත වියන ලද්දකි.

සංඛකාසලොමං- බොහෝ කුඩා ලොම් ඇති; ආකිණ්ණලොමං- එකට ගැටුනු ලොම් ඇති; ඛරලොමං- රළු ලොම් ඇති; දීඝලොමං- දික්වූ ලොම් ඇති; මේ සියල්ල ස්ත්‍රී නිමිත්ත අදහස් කොට කියනලදී. වාපිතං- බීජනික්ෂෙපය කරනලදද? නො පටිවුත්තකං- පැළ නො හිඳුවන ලදද? වැපිරීමෙන් මනාව පැළ හටනොගත්තන්හි හෝ පණු ආදීන් කා තිමකල පැළ ඇති තන්හි නැවත පැළ හිඳුවා දිය වත්කරති. නැත හොත් බිජුවපුරා සමකිරීම පිණිස අශ්වදන්තකයෙන් පිරා හරිති. මේ දෙවිධියම පටිවුත්ත සංඛ්‍යාවට අයත්වේ. මග්ගො තෙ සංසිජ්ජති- අඞ්ගජාත සංඛ්‍යාත මාර්ගය පවතීද.

දුට්ඨුල්ලවාචා ශික්ෂාපද ගැටපදය නිමි.

**කුලූපකානං**- සිවුපසය ලබා ගැණීම පිණිස කුලයන් කරා පැමිණි මෙහි නිති ගෙදුනෝ; **වසලං**- ග්‍රාම්‍ය දෙයක්, අසුචි වැගිරෙන්නක්; 'වසන්ති පගඝරන්තීති වසලං' යන විග්‍රහයි. **නිච්ඡුභිත්වා**- නෙරා දමා; **කස්සාහං කෙන වා හාසාමි**- මම කවර ස්ත්‍රියකගේ කෙබඳු පරිභෝගයකින් අලඞ්කාරයකින් පිරිහෙම්ද? මට වඩා උසස් රූපයකින් යුත් ස්ත්‍රිය නම් කවරීද? **සන්තිකෙ**- යම් තැනක සිටියෙකු අදුනාගත හැකි වේද, එබඳු තැනක; **අත්තකාම පාරිචරියාය**- තමහට මෙවුන්දම් මෙහෙ කිරීමෙහි; (මෙථුන ධම්ම සඞ්ඛාතෙන කාමෙන පාරිචරියා කාමපාරිචරියා, අත්තනො අත්ථාය කාමපාරිචරියා අත්තකාමපාරිචරියා); **වණ්ණං භාසන්ත**- ගුණ කියන්නෝය. **බ්‍රහ්මචාරිං**- මෙවුන්දම් සෙවීමෙන් වෙන්වූවෙකු; **සුභගා**- ඓශ්වර්‍ය්‍යාදියෙන් යුක්ත වූ ස්ත්‍රියක්; (ඉස්සරියාදීහි සුන්දරෙහි භගෙහි සමන්නාගතා සුභගා);

මෙම ශික්ෂාපදය ''මිනිස් මාගමක් වීම, මෛථුනක යන කැමැත්ම ඇති වීම, අත්තකාමපාරිචරිය රාගය ඇතිවීම, ඒ රාගයෙන් ගුණ ප්‍රකාශකිරීම, එකෙණෙහි දැනගැණීමය'' යන අඞ්ග පසකින් යුක්තය. සමුට්ඨානය දුට්ඨුල්ලවාචා ශික්ෂාපදයෙහි මෙනි.

අත්තකාම පාරිචරියා ශික්ෂාපද [illegible] නිමි.

---

**පණ්ඩිතා**- ස්ත්‍රීන් විසින් කටයුතු දෙයෙහි මනාසේ පුහුණුවූ නුවණින් යුක්ත; **මේධාවිනී**- දුටු දුටු දෙය කටහැකි වූ නුවණින් යුක්ත; **දක්ඛා**- කැඳබත් සැපයීම් ආදියෙහි පුහුණුවූ; **අනලසා**- කායික වීර්‍යයෙන් යුක්ත වූ; හුන් තැන නොහිඳ සිටි තැන නොසිට සියලු කටයුත්තෙහිම වීර්‍යවත් වූ; **ඡන්නා**- යොග්‍ය; **කිස්මිං විය**- අපට කාරදරයක් මෙන් වෙයි. **කුමාරිකාය වත්තුං**- 'මැ තුඹලා ගෙන්වා ගණිව්' යයි කුමාරිකාව හෙතුකොට ගෙණ කියන්නට; 'කුමාරිකාය' යනු හෙතුවෙහි යෙදි කරණ වචනයි. **ආවාහො**- සිය පුතුට අන් කුලයකින් දැරියක ගෙන්වා පාවා දීම; **විවාහො**- තමන්ගේ දුව පරකුලයකට යැවීම; මේ දෙතැන්හිම '(ආ) විපුබ්බවහ' ධාතුයෙන් භාවයෙහි ණපසැ වී සිද්ධයි. **වාරෙය්‍යං**- අපගේ දැරුවට තොපගේ දැරිය දෙවයි ඉල්ලීම; නැත හොත් ඒ ආවාහය පිළිබඳව දින නැකත් මොහොත් නියම කර ගැණීම; **පුරාණ ගණිකාය**- එක් ගණිකා බිරින්දකගේ; **පුරාණා**- ජීවමාන කල්හිද මේ තොමෝ ගණිකා නමින් ප්‍රසිද්ධ වූවාය. **ගාමකාගාමං**- (පිට)අන් ගමක්; **සුණිසභොගෙන**- සුණිසා පරිභොගයෙන්; **ආහාරූපහාරෙ**- ගැණීම හා දීම; (ආහාරො ච උපහාරො ච ආහාරූපහාරො); **සමණෙහි නාම භවිතබ්බං අබ්‍යාවටෙහි සමණා අස්සු සුසමණා**- ශ්‍රමණයන් විසින් නම් මෙබඳු ව්‍යාපාරයන්හි අව්‍යාපෘතවූවන් විය යුතුයි. මෙසේ වන්නාවූ ශ්‍රමණ තෙමේ සුශ්‍රමණ නම්. **සජ්ජිතා**- සියලු උපකරණයන්ගෙන් යුක්ත, නොයෙක් අධ්‍යාත්මික වූ කෙශරචනාදියෙන් හා බාහිරවූ වස්ත්‍රාලඞ්කාරයන්ගෙන් ද මනාව සජ්ජිතවූ; **ධුත්තා**- සල්ලාලයෝ; **පටිබද්ධමානසා**- මනාප වූ රූපාදි වස්තූන්හි කැමති සේ

ඉන්ද්‍රියයන් සොළවන්නාහු; අබ්භුං කම්මාසංසු-(ඉදින් කරන්නෙහි නම් තුඹ මෙපමණ දිනුවෙහිය. නො කරන්නේ නම් මම මෙපමණකින් දිනූ වෙමියි) ඔට්ටු කළහ. භික්ෂූන් විසින් මෙසේ ඔට්ටු නො තැබිය හැකිය. යමෙක් කෙළේ නම් පැරදුනහුට ම දියයුතුය. ඉදින් නො දෙන්නහුට ධුරනික්ෂෙපයෙන් ඇමැත් ආරොපණය කටහැකි බැව් මහාපච්චරියෙහි පෙණේ. කාලඞ්ගතං- අචිර කාලයක්; සඤ්චරිත්තං සමාපජ්ජනා-ඔවුනොවුන්ගේ අදහස් ඔවුනොවුන්ට කියමින් මාගමුන් පිරිමින් අතරෙහි හැසිරීම කරන්නේය. "සඤ්චරණං සඤ්චරො, සො එතස්ස අත්ථීති සඤ්චරි, තස්ස භාවො සඤ්චරිත්තං" යනු විග්‍රහයි. ක්ෂීණාශ්‍රවයන් වහන්සේට වුවත් මේ ඇවතින් ඇවැත් සිදුවිය හැකිය. ජායත්තනෙ-භාර්‍යාභාවය නිමිති කොට; ජාරත්තනෙ- ස්වාමි භාවය නිමිති කොට; මේ දෙතැන්හිම නිමිත්තාර්ථයෙහි ආධාර විභක්තියි. ජායත්තන නම් තිබඳ භාර්‍යා භාවයයි. ජාරත්තන නම් සොර බවයි. මාතුරක්ඛිතා ගොපෙති ඉස්සරියං කාරෙති වසං වත්තෙති- මවු තොමෝ කිසි තැනකට යන්ට නොදී රකියි. අනුන්ට නොපෙණෙන සේ ගුප්ත ස්ථානයන්හිලා ගොපනය කරයි. කැමති කැමති සේ හැසිරීම වළක්වා අභිභවනය කරයි. මෙය කරව මෙය නො කරවයි සිය අණසකෙහි පවත්වයි. සගොත්තා සමාන කුලවංශය ඇති ස්ත්‍රිය. මෙහි 'ස' ශබ්දය 'සමානාර්ථයෙහි'ය. සහධම්මිකා- සමාන කුලදම් ඇති ස්ත්‍රිය නොහොත් එකම ශාස්තෘවරයෙකුගේ ශාසනයෙහි හැසිරිය යුතු දහම්හි පිහුණ තැනැත්තී; සාරක්ඛා- සස්වාමික වූ ස්ත්‍රිය. සපරිදණ්ඩා- අසවල් ස්ත්‍රිය කරා යන්හුට මෙපමණ දඩයයි රජු විසින් නියමකළ දඩය හෙයින් රැකෙන ස්ත්‍රිය; ඡන්දවාසිනී- සිය කැමැත්තෙන්ම භාර්‍යා බවට පැමිණ වසන ස්ත්‍රිය; භොගවාසිනී- භෝගොපකරණ ලැබීම් හෙතුවෙන් භාර්‍යා භාවයට පත් ස්ත්‍රිය; පටවාසිනී- ඇඳීම් පෙරවීම් මාත්‍රයක් ලැබීම් හෙතුවෙන් භාර්‍යාභාවයට පැමිණි ස්ත්‍රිය; ඔදපත්තකිනී- අඹු සැමි දෙදෙනාගේ ම අත් එක දියබඳුනෙහි බහා මේ ජලය මෙන් නො වෙන්ව වසමුයි සමඟ කොට ගෙණ වසන ස්ත්‍රිය; ඔභටචුම්බටා- දැස්ස කල හිසේ බැඳි සුඹුලුව මුදහැර භාර්‍යා වශයෙන් පාවාගත් ස්ත්‍රිය; ධජාහටා- අන්රටකට ගොස් ජය අත්පත් කොට ගෙණ පැමිණි සේනාව විසින් කැඳවා ගෙණ ආ ස්ත්‍රිය; මෙහි 'ධජ' ශබ්දයෙන් 'සේනාව' කියැවේ. කරමරානීතා- අසබඳු වශයෙන් පාවාගණු ලැබූ ස්ත්‍රිය; පතිගණ්හාති- අණවන්නහුගේ අණ පිළිගණියි. වීමංසති- එසේ පිළිගෙණ, ඒ ස්ත්‍රිය සමීපයට ගොස් ඒ පතිවුඩය සැල කරයි. පච්චාහරති- එය දැන්වූ කල්හි ස්ත්‍රියගේ පිළිගැණීම හෝ ප්‍රතික්ෂෙපය හෝ ලජ්ජාවෙන් නිශ්ශබ්දවීම හෝ ආපසු පැමිණ ඒ පුරුෂයාට දන්වයි. මෙසේ පටිග්ගහණ ආරොචන පච්චාහරණ සඞ්ඛ්‍යාත වූ අඞ්ග තුණ සම්පූර්ණවීමෙන් සඞ්ඝාදිසෙසය සිදුවේ. සම්බහුලෙ භික්ඛු ආණාපෙති- බොහෝ භික්ෂූන්ට නියම කරයි. එක් පුරුෂයෙකුගේ පතිවුඩය බොහෝ ස්ත්‍රීන්ට පවසන

භික්ෂුහට ස්ත්‍රීන් ගණනින් ඇවැත් සිදුවේ. පුරුෂයෙක් එක් ස්ත්‍රියකට බොහෝ භික්ෂූන් අත පතිවුඩ යවයි. එය සම්පූර්ණ වූ කල්හි සියලු භික්ෂූන්ට ම ඇවැත් සිදුවේ. බොහෝ පුරුෂයෝ එක් ස්ත්‍රියකට භික්ෂුවක් අත පතිවුඩ යවති. ඒ භික්ෂුහට පුරුෂයන්ගේ ගණනින් ඇවැත් සිදුවේ. බොහෝ පුරුෂයෝ එක් භික්ෂුවක් අත බොහෝ ස්ත්‍රීන්ට පතිවුඩ යවති. ඒ භික්ෂුහට වස්තු ගණනින් ඇවැත් සිදුවේ. **අනාපත්ති සඞ්ඝස්ස වා චෙතියස්ස වා ගිලානස්ස වා කරණීයෙන ගච්ඡති**- සඞ්ඝයා පිළිබඳවූ හෝ චෛත්‍යයක් පිළිබඳවූ හෝ ගිලනෙකු පිළිබඳවූ හෝ කටයුත්තකින් යම් භික්ෂුවක් උපාසිකාවක සමීපයට යේද ඒ භික්ෂුහට අනාපත්තිය. මේ ශික්ෂාපදය ඡසමුට්ඨාන වේ. බැම නැමවීම් ආදියකින් දන්වන ලද්දක් ඒ ස්ත්‍රිය කරු පැමිණ හස්තමුද්‍රා වෙන් විමසා නැවත ආපසු පැමිණ හස්තමුද්‍රාවෙන් ම දන්වන භික්ෂු හට කායසමුට්ඨාන වශයෙන් ඇවත සිදුවේ. අසවල් ස්ත්‍රියගේ අදහස දැනගත මැනවැයි වචනයෙන් කියනලද හසුන ගෙණ ගොස් වචන යෙන් ම විචාරු ඇගේ කැමැත්ත දැනගෙණ ආපසු පැමිණ ඔහුට වචනයෙන් ම ප්‍රකාශකෙරේ නම් ඒ භික්ෂුහට වාචාසමුට්ඨානයෙන් ඇවැත් සිදුවේ. ප්‍රඥප්තිය නොදන්නාවූ රහත් නමකට වුවද කායවාචා සමුට්ඨානයෙන් ඇවැත් සිදුවේ. මවුපිය දෙදෙන අසමගියෙන් වසන කල්හි ගෙට වැඩි රහත්නමට පියතෙමේ, "ස්වාමීනි බුදුවහන්සේ මවු නොමෝ මා හැර දමා සියගෙට ගියාය. එහි වැඩමවා නැවත මෙහි පැමිණ මට උවැටන් කරණ ලෙසට සලස්සාලන්නැ" යි කියයි. රහත් භික්ෂුන්වහන්සේ ද එය පිළිගෙණ මවු කරු පැමිණ පියාගේ අදහස දන්වා, මවුගේ එහි නැවත පැමිණීම හෝ නො පැමිණීම පියාට දක්වති. එසේ කල උන්වහන්සේට ද මේ ඇවත සචිත්තක සමුට්ඨාන වශයෙන් සිදුවේ.

සඤ්චරිත්ත සික්ඛාපද ගැටපදය නිමි.

---

**ආලවකා**- අලව්රටේ උපන් කුලදරුවෝ ආලවක නම් වූහ. ඔවුහු පැවිදි වූ කල්හි ද ආලවක නමින් ම ප්‍රසිද්ධ වූහ. **සඤ්ඤාචිකායො**- තමන් ඉල්ලාගත් උපකරණ ඇති; **කාරාපෙන්ති**- කරවත්. ඒ භික්ෂුහු වනාහි ශාසනයෙහි පැවති ග්‍රන්ථධුර විදර්ශනාධුර දෙක ම හැරදමා නව කම් ම ධුරකොට ගත්තාහුය. **අස්සාමිකායො**- කරවාදෙන හිමියන් නැත්තාවූ; **අත්තුද්දෙසිකායො**- තමන්ගේ ම වාසය උදෙසා පටන් ගන්නා ලද්දාවූ; **අප්පමාණිකායො**- මෙ පමණ දිග ආදියෙන් නිමාවට යන්නාහුයයි ප්‍රමාණයක් නොමැත්තාවූ; **පුරිසකඩ්ඪකං**- පුරුෂයෙකු විසින් කළයුතු අත්කම්; 'අත්කම්' යනු යම්කිසි වෘත්තාවක් නොවෙයි. එහෙයින් මිගලුද්ධක මච්ඡබන්ධකාදීන්ගේ සිය කම් හැර සියලු අත්කම් ඉල්ලන්ට වටී. **මනුස්සා උපද්දුතා යාචනාය**- මිනිස්සු භික්ෂූන්ගේ එබඳු ඉල්ලීම්වලින් පෙළුනෝ; **උබ්බිජ්ජන්ති**- කුමක් නමුත් ගෙන්වා ගන්නාහුයයි කලකිරීමට පැමිණෙත්. **උත්තසන්ති**- සර්පයෙකු දුටු කලෙක් මෙන් තැතිගැණීමට පැමිණෙත්. වනා සැඟවීගන්ට උත්සාහ

කරත්. අක්කන්දන්තා පි ගච්ඡන්ති- භික්ෂුහු යම් මඟකින් පැමිණෙත් නාහු ද ඒ මග හැර දකුණු පසින් හෝ වම් පසින් යෙත්. දෙර හෝ වසාගණිත්. අග්ගාළවෙ චෙතියෙ- මේ විහාරය අලවි නුවර පිහිටියේය. අලව්රට කොසොල් ජනපදයට අයිතිවූයේ සැවතින් යොදුන් (30) තිහක් ඈතින් පිහිටියේය. මණිකණ්ඨො- (මණිකණ්ඨ අස්ස) මොහුගේ බොටුවෙහි සියලු වස්තු දෙන මැණිකක් ඇති හෙයින් මෙසේ නම් විය. ('මණිනා උපලක්ඛිතො කණ්ඨො'යි මධ්‍ය පදලොප සමාස විධියෙන් මේ සිද්ධයි.) උපරි මුද්ධනි මහන්තං ඵණං කත්වා අට්ඨාසි- මහත්වූ පෙණය හිස මතුයෙහි තබාගෙණ සිටියේය. මේ නාගරාජයා නදියෙන් එතෙර වී දිව්‍ය අත්බවක් මවාගෙණ මුනිවහන්සේ කරා පැමිණ පිළිසඳර කථා කොට, ඉක්බිති දිව වෙස අත්හැරදමා සිය වෙසින් සිට, ඒ සෘෂින් කෙරෙහි සතුටු වූ අයුරක් අඟවමින් මහත් ඡත්‍රයක් වැනි වූ පෙණය හිස මුදුනෙහි දරා මොහොතක් සිට පෙරළා යයි. කිසො- කෘශ වූයේ; ලූඛො-රළු වූයේ; දුබ්බණ්ණො- අප්‍රිය වූ දුකුම් ඇත්තේ; උප්පණ්ඩුප්පණ්ඩුකජාතො- ඉදීගිය පත්‍රයක් මෙන් හටගත් පඬුවන් පැහැ ඇත්තේ; ධමනිසන්ථතගත්තො-නහර වැලින් වෙලීගිය වැනි සිරුරු ඇත්තේ; විපුලං-මහත්වූ; උළාරං-ප්‍රණීතවූ; අන්නපානං- ආහාරපාන; මය්හං- මට; ඉමස්ස මණිස්ස හෙතු- මේ මැණික හේතුකොට ගෙණ; උපපජ්ජති- සැපයෙයි. අභික්ඛණං යාචසි- නැවත නැවත ඉල්වන්නේමෙහි නමුත්; තං- එය; තෙ-තට; නදස්සං- නො දෙන්නෙමි. තෙ-තුඹගේ; අස්සමං-අසපුවට; න ආගමිස්සං-නො එන්නෙමි. සක්ඛරධොතපාණි-මනාව පිහියුණු වූ කඩුනත් අත් ඇති; "සක්ඛරෙ ධොතො අසි, සක්ඛරධොතො" මෙසේ උත්තරපදලොප විධියෙන් සමාසය විය. "සක්ඛරධොතො පාණිම්හි යස්ස සො සක්ඛරධොතපාණි" යනු විග්‍රහයි. සුසු- තරුණ පුරුෂයෙක් තෙමේ; යථා- යම්සේ ද එපරිද්දෙන්; සෙලං- මැණික; යාචමානො- ඉල්ලන්නාවූ තුඹ; මං- මා; තාසෙසි- තැතිගැන්නුවෙහිය. සෙලලං- මබ; න මෙ අත්ථො- මට පියාපතින් ප්‍රයොජනය; පියාපතින් කිසි ප්‍රයොජන යක් නැතත් සුවය පතා කියනු ලබන මන්ත්‍රයක් මෙන් කීය. බුදුරජානන් වහන්සේගේ අණ ලෙසින් කී හෙයින් ඒ භික්ෂුහට මුසවා නොවීය.

යස්ස-යමෙකුට, පියං-(යමක්) ප්‍රියයයි; ජිගිංසෙ- දන්නේ නම්; තං- එය; න යාචෙ- නො ඉල්වන්නේය; අතියාචනාය-නැවත නැවත ඉල්ලීමෙන්; දිසෙසො හොති-අප්‍රියයෙක් වෙයි. බ්‍රාහ්මණෙන-සෘෂිවූ බමුණා විසින්; නාගො- නාග තෙමේ; මණිං- මැණික; යාචිතො- ඉල්ලනලදී. අදස්සනං එව ගතො- ඔහු නො පෙණීමට ගියේය. 'තං' යන විභක්තිය 'අති' යොගය නිසා සිදුවූවකි. උබ්බෙගප්පත්තො-පීඩිත වූයේ, උකටලී වූයේ; යො සකුණසඞ්ඝො භික්ඛු පත්තං යාචති-ඒ පක්ෂි සමූහ තෙමේ 'මහණ පියාපතක් ඉල්ලයි; ඒ පක්ෂීහු භික්ෂූහුගේ වචන නොදනිත්. බුදුරජානන් වහන්සේ තමන්ගේ ආනුභාවයෙන් දැන ගත්තා ලෙසක් කළසේක. අහං නෙ කො ජනාමි-මම, ඔහු කවරහුද?

කාගේ පුත්තුද'යි නො දනිමි. තෙ- ඔහු; සඞ්ගම්ම- එක්තුව, මැසීමි; මං- මාගෙන්; යාචන්ති- ඉල්ලත්; යාචං අදදම්පියො- යමෙක් ඉල්වන ලද්ද නො දෙන්නේ; අප්පියො- අප්‍රියයෙක් වෙයි. තස්මා- එහෙයින්; අහං- මම; තං- ඔහුගෙන්; මා මෙ විදෙස්සනා අහු- මාගේ අප්‍රියභාවය නොවේවා; මම තුඹට හෝ තුඹ මට හෝ අප්‍රියයෙක් නොවේවා යන අර්ථයි. දුස්සංහරානි- සී සෑම් ආදී උපායවලින් දුකසේ රැස්කළ යුත්තාහුය. වාසිං- වෑය; ඵරසුං- පොරොව; කුඨාරිං- කෙටේරිය; කුදාලං- හුදැල්ල; නිඛාදනං- නියන; වල්ලිං- වැල; වෙළුං- හුන; තිණං- ඉලුක් ආදී තෘණ; සඤ්ඤාචිකාය- තමා ඉල්වා ගත් උපකරණින්; උල්ලිත්තා- අංලෙපකරණ ලද්දවූ; 'උපුබ්බලිප' ධාතුයි. තුලා සඞ්ඝාට, වාතපාන ධූමච්ඡිද්දාදිය හැර සෙසු ලෙපකය කටයුතු සියලු තැන් ලෙපනය කොට භිත්ති සමග පියැසි ඇතුළත ද එකට ගටා සුණුවලින් හෝ මැටියෙන් ආලෙපකරණ ලද්දවූ' යන අර්ථයි. අවලිත්තා- (අවපුබ්බ ලිප ධාතුයි.) ඡදනයේ පිටත සුණු පිරියම් කරණ ලද්දවූ; උල්ලිත්තාවලිත්තා- ඡදනයාගේ ඇතුළත පිටත දෙපැත්තම සුණු පිරියම් කරණ ලද්දවූ; 'ඡදනමෙව සන්ධාය උල්ලිත්තාවලිත්තා' යි කියනලදැයි වජිරබුද්ධියෙහි දක්වේ. අනාරම්භං- කරවා දෙන අන් හිමියෙකු නැත්තාවූ; අත්තුද්දෙසං- තමන්ගේ ප්‍රයොජනය උදෙසා; තත්‍රිදං පමාණං- ඒ කුටිය පිළිබඳවූ මේ ප්‍රමාණය වෙයි. සුගතවිදත්ථියා- මැදුම් මිනිසෙකුගේ අතින් තුන් වියතක් සුගත් වියතයි. වඩුවෙන් එක් රියන් හමාරකි. බාහිරිමෙන මානෙන- කුටියෙහි පිට බිත්ති මැනීමෙන්; මෙය සුගත් වියතින් දොළොස් වියතක් විය යුතුයි. මනින්නහු විසින් පලමු තැබූ මහ මැටිපිඩේ හෝ හලේ පර්‍යන්තය නොගත යුතුය. ථුසපිණ්ඩපර්‍යන්තය සමග මැනිය යුතුයි. එසේ කළ කල ප්‍රමාණාතික්‍රාන්තය යන ව්‍යවහාරයට නො පැමිණේ. අබ්භන්තරිමෙන මානෙන- කුටිය ඇතුළත මිනීමෙන්; මෙය මනින්නහු විසින් බිත්තියේ පිට කෙළවර නො ගෙණ ඇතුල් කෙළවරෙහි පටන් පළල සත් සුගත් වියතක් මැනිය යුතුයි. තාත්‍ය වශයෙන් සලකා, කියනලද ප්‍රමාණය නො ඉක්මවන්නෙමියි දිගින් එකොළොස් වියතක් හා පුළුලින් අට වියතක් හෝ දිගින් තෙළෙස් වියතක් හා පුළුලින් සවියතක් හෝ නො ගත යුතුයි. එක් දිගකින් ප්‍රමාණය ඉක්මවූ කල සියලු කුටියම ප්‍රමාණාතික්‍රාන්ත වේමය. වියතක් තොව කෙසගක් පමණකුදු දිගින් හෝ පුළුලින් වැඩිවූ කල ඒ කුටිය ප්‍රමාණාතික්‍රාන්තය. "ආයාමතො වා විත්ථාරතො වා අන්තමසො කෙසග්ගමත්තම්පි අතික්කමිත්වා කරොති වා කාරාපෙති වා පයොගෙ දුක්කටං"යි වදාළ හෙයිනි. දිගින් සැට රියනක් හා පුළුලින් තුන් රියනක් වූ ගෙයක් වෙයි. එහි ප්‍රකෘති වියතින් සව වියත් ඇති ඇඳක් එහා මෙහා පරිවර්තනය නො කට හැකිවෙයි. එහෙයින් එය කුටි සංඛ්‍යාවෙන් තොරය. නො දෙසුමත් කරවන්ට වටී. භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය- සාරම්භාදිය බලා කුටි වාස්තු දෙසනාය පිණිස භික්ෂූන් කැඳවිය යුත්තෝය. කුටිවත්ථුං සොධෙත්වා- කුටි වාස්තුව

සමතලා කරවා; විෂම්වූ අරණට හිඳුනු නො කැඳවිය යුත්තාහුය. පළමු කොට කුටි වාස්තුව සුද්ධ කරවා සමතලා වූ සීමා මඬුල්ලක් මෙන් කොට පසුව සඞ්ඝයා කරා පැමිණ වැඩිමහලු සඟුන් වැඳ උක්කුටිකා සනයෙන් බද්දැදිලිව හිඳ "අහං භන්තෙ සංයාචිකාය කුටිං කත්තුකාමො අසාමිකං" යනාදීන් කුටිවාස්තුව අවලොකනයට ආරාධනා කොට පැමිණවිය යුත්තාහුය. **සාරම්භං**– උවදුරු සහිත; **අනාරම්භං**– උවදුරු රහිත; **සපරික්කමනං**– උපචාරය සහිත; **අපරික්කමනං**– උපචාරය රහිත; **පත්තකල්ලං**– කුටිවාස්තු ඔලොකනයට සුදුසු කල් ඇති; "පත්තො කාලො අස්ස ඔලොකනස්සාති පත්තකාලං, පත්තකාල මෙව පත්තකල්ලං" යනු විග්‍රහයි.

**කිපිල්ලිකානං**– රතු කළු ආදි වශයෙන් භින්නවූ සිනි ආදීන්ගේ; මෙහි ඛිනු වචනය ආදි ශබ්ද පර්‍යාය වෙයි. එහෙයින් මී, තයි, ගොනුසු, පත්තෑ ආදීහුද ගැණෙති. **ආසයො**– ගුල හෝ ගුහාව; **පුබ්බණ්ණනිස්සිතා**– සාලි වීහි ආදි සත් වැදෑරුම් ධාන්‍ය කෙත් අසල පිහිටි; **අබ්භාඝාතං**– සොරුන් මැරීම පිණිස පිළියෙල කළ තැන; නැතහොත් වරදකරුවන්ට දඬුවම් පමුණුවන තැන, "අභි හනන්ති එත්ථාති අබ්භාඝාතං, අභි පුබ්බ 'හන' ධාතුයි; **ආඝාතනං**– දැකුම් වූ දණ්ඩ නීති ක්‍රමයෙන් වරදට අසුවූවන්ගේ අත්පා ආදිය කඩා සිඳදමන පූවරුකඩ; **සුසානං**– මහසොහොන් බිම; **රච්ඡා**– වීථිය, **චච්චරං**– සිවුමංසල; **සංසරණං**– මහමග; **න සක්කා හොති යුත්තගොසකටෙන**– උළු සුණු දැව ආදිවූ ගෘහභාණ්ඩ අඳින්නාවූ ගොනුන් යෙදූ ගැලින් එක් සැරයක් වහලයෙන් වැසිදිය වැටෙන තැන ද, අනික ඉන් පිටත්හිද සිටින සේ පැදගන්ට නො හැකි වේද? **සමන්තා නිස්සෙනියා අනුපරිගන්තුං**– බිම සිට ගෘහ ඡදනාන්තයෙහි තුබූ හිනි මගින් ගෙය හාත්පස ගමන් කරන්නට; **පයොගෙ දුක්කටං**– අදෙශිත වාස්තුක වූ හෝ පමණ ඉක්මවූ හෝ කුටියක් කරන්නෙමියි වෙනෙත් දැව දඬු සැපයීම පිණිස වෑ පොරෝ මුවහත් කෙරේද දුකුළා වේ. වනයට පිවිසියේද දුකුළාවේ. බිම කනීද, පස් ගෙණැවිත් රැස් කෙරේද, මේ සියලු ප්‍රයොගයන්හි දීම දුකුළාවේ. පවිතියට සුදුසු තැන පවිතිය සමග දුකුළාවක් වේ. **තිණකුටිකාය**–සත්බුමු පහය ද තිණ සෙවෙනි යුක්ත නම් ඒ තිණ කුටි සඞ්ඛ්‍යාවට පැමිණේ. **අඤ්ඤස්සත්ථාය**– සියලු අඞ්ගවලින් යුක්ත කුටියද උපාධ්‍යාය, ආචරියාදි අන් කෙනෙකු උදෙසා කරන්නහුට ආනාපත්තිවේ. **වාසාගාරං ඨපෙත්වා සබ්බත්ථ**– තමන්ගේ විසීම පිණිස වූ ගෙය හැර අන්‍යවූ උපොසථාගාර, ජන්තාඝර, භොජන සාලා, අග්ගිසාලා ආදිය කරවන්නහුට අනාපත්තිවේ. තමාගේ විසීමටත් සමග යයි උපොසථාගාරාදිය තමූත් කරවන්නාහුට ඇවැත් සිදුවේ. මේ ශික්ෂාපදය ඡසමුට්ඨානය; උල්ලිත්තාදි අන්‍යතර කුටියක් වීම, හෙට්ඨිම ප්‍රමාණයෙන් යුක්තවීම, නො දෙසනලද කුටි වාස්තු ඇති බව, පමණ ඉක්මවූ බව, තමන් උදෙසා කළ බව, වාසාගාර බව, ලෙපඝටනය යි අඞ්ග සතකින් යුක්තවේ.

කුටිකාර සික්ඛාපද ශැමපදය නිමි.

**කොසම්බියං**- එනම් නුවරෙකි, මෙය වංසරට්ඨ අග නුවරය. බරණැස සිට යොදුන් 30 කින් ඈත යමුනා නදී තීරයෙහි අලහබාද් නගරයට සැතපුම් 30 ක් උතුරෙන් පිහිටියේය. මෙකල 'කොසාම්' නමින් ප්‍රකට ගම මේ කොසම්බෑ නුවර යයි කල්පනා කරති. මේ පෙදෙසෙහි කොසඹ ගස් බහුල බැවින් ද කුසම්බ නම් ඍෂිහුගේ ආශ්‍රමයට නුදුරෙහි නිර්මිත වූ බැවින්ද මේ නගරය කොසම්බී නම් විය. **ඝොසිතාරාමෙ**- ඝොසිත සිටු විසින් කරවා දෙන ලද විහාරයෙකි; බුදුරජහු නවවෙනි වස මෙහි විසූ සේක. **ඡන්නස්ස**- ඡන්න සථවිරයන් වහන්සේගේ; ඡන්න නමින් බුද්ධ කාලයෙහි දෙනමක් විසූහ. අභිනිෂ්ක්‍රමණයෙහිදී කැටුව ගියාවූ ද, පිරිනිවන් පාන දිනයෙහි බ්‍රහ්ම දණ්ඩයට ගිමි කොට වදාරණලද්දාවූ ද තෙර තෙමේ එක් නමකි. එසේම මජ්ඣිම නිකායෙහි ඡන්නොවාද සූත්‍රයෙහි දී ගිලානව වී, දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්ගේ ඔවා ලැබූ, මාරණාන්තික වේදනාව ඉවසන්ට නොහැකිව තියුණු සැතකින් කණ්ඨනාලිය සිඳගෙණ, මරණ භයද, ගතිනිමිත්ද, උපන් කල්හි නමන් පුහුදුන් බැවි මෙනෙහි කොට සංවේගයට පැමිණ විදර්ශනා වඩා සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් ගෙණ රහත් බවට පැමිණ සමසීසිව පිරිනිවන් පෑ ඡන්න තෙරතෙමේ අනික් නමකි. මේ දෙනමගෙන් මෙහි සඳහන් වන්නේ පළමු කී සථවිර තෙමේයි. **චෙතියරුක්ඛං**- පූජනීවූ දෙවතායතන වෘක්ෂයක්; 'චෙතියන්ති සම්මතං රුක්ඛං චෙතිය රුක්ඛං' මෙහි මධ්‍යපද ලෝපය වී සමාසය සිද්ධයි. **ගාමපූජිතං**- ගම්වැසියා විසින් පුදනලද; **ඒකින්ද්‍රියං**- රූපෙන්ද්‍රියයන්ට අයත්ව විද්‍යමාන වන වස්තුවක් හෙයින් මෙසේ කියන ලදී. එහෙත් භූත ගාමයන් පිළිබඳ මනින්ද්‍රියක් ද අපෙක්ෂා කෙරෙති. **ජීවසඤ්ඤිනො**- සත්ත්වයෝය යන හැඟීම් ඇත්තෝ. **මහල්ලකං**- කරවා දෙන හිමියන් ඇති බැවින්ද, සඤ්ඤාචිත කුටියම වඩා මහත් හෙයින්ද ප්‍රමාණාතික්‍රාන්තය කිරීමෙන් හෝ මහත්වූ ප්‍රමාණය ඇති බැවින් ද මහල්ලක නම්වූ; 'මහන්තභාවෙන එතස්ස අත්ථීති මහල්ලකො', යනු විග්‍රහයි. සඤ්ඤාචිතාදිය කුටිකාර ශික්ෂාපදයෙහි මෙනි.

විහාරකාර ශික්ෂාපද ගැටපදය නිමි.

---

**වේළුවනෙ කලන්දක නිවාපෙ**- කලන්දක නිවාප නම් වූ වේළුවනාරාමයෙහි; ඒ උයන්හි නාමය වේළුවන නම්, ගෝපුර අට්ටාල සහිතවූ අටළොස් රියන් පවුරකින් වටකරනලද මේ උයන සාන්ද්‍ර පිහිටි හුන වනයකින් නීලොභාස ඇත්තක් වූ හෙයින් වේළුවන නමින් ප්‍රකට විය. ලේනුන් නො මරණ ලෙය අණ පතුරුවා උන්ට අභය හා බත් වැටුප් දුන් හෙයින් කලන්දක නිවාප නම් විය. මෙය රජගහ නුවරට අයත් වූවකි. ගයාව අසන්නයෙහි මෙකල රාජගිර් නමින් ප්‍රකටව පැවැති ප්‍රදෙශය රජගහ නුවර යයි සලකති. මෙය ගඞ්ගා නදියේ සිට යොදුන් පහක් ඈතින් පිහිටියේය (**දබ්බස්ස මල්ලපුත්තස්ස**-) 'දබ්බ' යනු නාමයයි. 'මල්ලරාජ' පරපුරට අයත් හෙයින් මල්ල

පුත්‍ර නම් බුදුරජුන් මල්ලරට සැරිසරා අනුපිය නම් අඹවනයට වැඩි කාලයේදී මුන්වහන්සේ සත්හැවිරිදි වයස් ඇති කුමාරයෙකි. එහිදී ඒ ළදරු කුමරුට බුදුරජාණන් වහන්සේ දැක පැවිදිවනු රිසි ඇති විය. ඒ බැව් මුත්තණියට ද දැන්විය. ඔහොමෝ ඊට පහන්වූවා. බුදුරදුන් ලඟට කැඳවා ගෙණ ගොස් "මේ කුමරහු මහණ කළ මැනවැ"යි අයැදියාය. බුදුරජාණන් වහන්සේ එසේ කරණ ලෙස අන් මහණකු හට අණවූ සේක. ඒ තෙරනුවෝ බුදුරදුන්ගේ නියමය පිළිගෙණ එසේ කරණුවෝ තචපඤ්චක කමටහන දුන්හ. පූරුකෘත අභිනීහාර ඇති ඒ කුමර තොමෙ පළමු කෙස් රොද කැපීමෙහිදී සෝවාන් පෙලෙහිද, දෙවෙනි කෙස් රොද කැපීමෙහිදී දෙවෙනි පෙලෙහිද, තෙවෙනි කෙස් රොද කැපීමෙහිදී අනාගාමී ඵලයෙහිද, සියලු කෙස් කපා නිමකරලීම හා සමග ම රහත් පෙලෙහිද පිහිටියේය. යඤ්ච කිඤ්චි සාවකෙන පත්තබ්බං සබ්බං තං තෙන අනුප්පත්තං- සවුවන් විසින් ලැබියයුතු යම් කිසි ගුණ සමූහයක් වේ නම් ඒ සියල්ල මේ දබ්බමල්ල පුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසින්ද ලබනලදී. තෙවිජ්ජා චතුපටිසම්භිදා, ෂ අභිඤ්ඤා, නව ලොකුත්තරධම්ම යන ගුණ සමූහය සවුවන් විසින් ලැබිය යුතුයි. මෙහි 'යං කිඤ්චි' යනාදි වසයෙන්, නපුංසක ලිඞ්ගයෙන් යෙදූයේ 'ගුණජාතං' යන්න අපෙක්ෂාකොට ගෙණය; නාපිස්ස කිඤ්චි උත්තරිං කරණීයං- උන්වහන්සේ විසින් මත්තෙහි කටයුතු කිසිවක් නැත්තේය; දුක්ඛ, සමුදය, නිරොධ, මග්ග යයි කියනලද චතුරාර්‍ය්‍යසත්‍ය ධර්‍මයන් විෂයෙහි පරිඥා, පහාණ සච්ඡිකිරියා භාවනා වසයෙන් එක් එක් මගක් පිළිබඳව සතර සතර බැගින් පවත්නා සොළොස් වැදෑරුම් කෘත්‍යය උන්වහන්සේ නිම කරණලදි. කතස්ස වා පතිචයො- ඒ කරණලද කෘත්‍යයන්ගේ නැවත වැඩීමක් ද නැත. පිපුනු මලෙහි නැවත පිපීමක් නැත්තාක් මෙනි. රහොගතස්ස- රහසිගතවූ; පටිසල්ලිනස්ස- ඒ ඒ කෘත්‍යයන් ගෙන් හෝ අරමුණු ගැනීමෙන් මිදුනු හෙයින් හුදකලා බවට පැමිණියාවූ; දබ්බස්ස මල්ලපුත්තස්ස- දබ්බමල්ල පුත්‍ර තෙරුන්ට; උන්වහන්සේ වනාහි එක් දවසක් මෙසේ සිතීය. මාගේ මේ අන්තිම සිරුරු දැරීමය. එය ද මා හමුවෙහි දැල්වූ පහන් සිළක් මෙන් අනිත්‍ය වෙයි. වහාම නැතිවී යන සුලුවෙයි. එසේ වනා විනාශයට යන මේ සිරුරින් සඞ්ඝයාට වතාවත් මාත්‍රයක් වත් කරගතහොත් මැනව. බුදුරජුන් නොදැකම බොහෝ දුරසිට පැමිණ කුලපුත්‍රයෝ ශ්‍රමණභූමියට ඇතුලත් වෙති. එසේ ම බුදුන් වහන්සේ දකිමුයි භික්ෂූහු ද පැමිණෙති. එසේ පැමිණි ඒ භික්ෂූන්ට සැතපෙන්නට සෙනසුන් ද මෙහි නැත. සුදුසු සෙනසුන් නො ලැබුවෝ ඒ ඒ තැන ගල්තලා මත සැතපෙති. පසු දින උදය කලාන්තවූ සිරුරින් යුක්තව ම පුබුදිත්. එසේ කලාන්තවූවෝ භික්ෂූන් ඉදිරියෙහි ගතානුදෙසයද නො කැමති වෙත්. මම ඒ භික්ෂූන්ට සුදුසු සෙනසුන් මවා දී ගතානුදෙසයද කරමි යනුයි. සඞ්ඝං දබ්බො මල්ලපුත්තො ආයාචිතබ්බො- ප්‍රමුඛකොට

දබ්බමල්ල පුත්‍රයාගෙන් මෙසේ කරන්ට යයි ඉල්විය යුතුයි. අනාගතයෙහි මේ තනතුර නිසා දබ්බයාහට මෛත්‍රීයභූම්මජක භික්ෂූන්ගෙන් උවදුරු ඇතිවන්නේය. එහිදී කිසිකෙනෙක් ශංකා කෙරෙති. එසේ හෙයින් දබ්බමල්ලපුත්‍රයා ඒ නිඤුවෙන් නිදහස්කර ගැණීම පිණිස මෙසේ වදාරණලදී. **සභාගානං**- ගුණ සභාගයන්ගේ; මිත්‍රසන්ථව සභාගයන්ගේ වසයෙන් නො වෙයි. **යෙ තෙ භික්ඛූ සුත්තන්තිකා තෙසං එකජ්ඣං**- යම් පමණ සූත්‍රාන්තික භික්ෂූහු වෙත් ද, ඔවුන්ට එකට පණවයි. **කායදළ්හිබහුලා**- සිරුරු පෝෂණය ම ප්‍රධාන කොට ඇත්තෝ; **ඉමාය පි මෙ ආයස්මන්තො රතියා**- මේ ආයුෂ්මත්වරු සුඛ මග දෙක අවුරන්නා වූ මේ තිරිසන් කථාවන් කිරීමෙහි ආශා වෙත්; **අච්ඡිස්සන්ති**- වාසය කරන්නාහුය. **තෙජොධාතුං සමාපජ්ජිත්වා තෙනෙව ආලොකෙන**- තෙජෝකසිණ චතුත්ථජ්ඣානයට සමවැද එයින් නැඟිසිට අභිඥාඥානයෙන් ඇඟිලිවල ගිනිදැල් අධිෂ්ඨාන කොට, ඒ තෙජෝධාතු සමාපත්තියෙන් ඇඟිලිවල හටගත් ආලෝකයෙන්; මෙසේ තෙරුන්ගේ ආනුභාවය මඳකලකින්ම සියලු දඹදිව පැතිර ගියේය. තෙරුන්ගේ මේ සෘද්ධිය බලන්ට කැමැතිවූ භික්ෂූහු සමූහ සමූහව විකාලයෙහි එහි පැමිණියාහුය. **සත්තපණ්ණිගුහායං**- මෙනම් ලෙනෙහි; රජගහනුවර වෙභාර පර්වතප්‍රාන්තයෙහි පිහිටියේය. අජාසත් රජහුගේ ප්‍රධානත්වයෙන් කළ පළමුවෙනි සංගායනාව සිදුකරණ ලද්දේ මෙහි දීය. රජගිර් දුම්රියපල ආසන්නයෙහි පිහිටි මෙහි දැන් පවත්නේ ගල්ලෙන පමණකි. එහි මත මණ්ඩපයක් සෑදූ තිබුනු බවට සලකුණු දැනුදු ශේෂව පවතී. "සීතවන, ගෝතමකන්දර, තපෝදාරාම, ජීවකම්බවන, මද්දකුච්ඡි," යන මේ සියල්ලද රජගහනුවර සමීපයෙහි පිහිටි බුදුරජාණන් වහන්සේ පරිභෝගකළ තැන්ය. **මෙත්තියභූම්මජකා**- ඡබ්බග්ගිය භික්ෂූන්ගේ ප්‍රධාන දෙනම මොවුහුය. **ලාමකානි ච භත්තානි**- ලාමක බත්ම ලැබෙති. දන් පිණිස වූ ලග ආලෝලනය කොට එක එක ගෙණ බලති. එයද ඔවුන්ගේ මඳ පින් හෙයින් ඔවුන්ට පැමිණි වාරයෙහි ලාමක බවට පැමිණෙයි. නොහොත් මොවුන් දුටුකල්හි ප්‍රණීත දෙය නොදී ලාමක දෙය ම දෙති. **අභිසඞ්ඛාරිකං**- රසවත් වූ නොයෙක් දෙයින් සම්පාදනය කරණලද; **කණාජකං**- කුඩුහාලේ බත; **බිලඞ්ගදුතියං**- කාඩි දෙවෙනි කොට ඇති; **කල්‍යාණභත්තිකො**- ඉතා ප්‍රණීත කෑම දනය දෙන තැනැත්තේ; '**කල්‍යාණං** අතිවිය පණීතං භත්තං අස්ස අත්ථීති කල්‍යාණභත්තිකො' යනු විග්‍රහයි. **චතුක්කභත්තං**- සිවු නමකට ප්‍රමාණ වූ බත; 'චත්තාරි පරිමාණං අස්ස ඉති චතුක්කං' යන තද්ධිත ව්‍යවහාර එසේමෙති; **උපසාළකාය**- දන්හලෙහි; **උපතිට්ඨිත්වා පරිවිසන්ති**- (සියලු කාර්යනු හැරදමා මහත් වූ භක්තියෙන්) ළඟම සිටගෙණ වළඳවයි. **ඔදනෙන පුච්ඡන්ති**- (බත් බඳුන් ගෙණ ළඟ සිට කිම ස්වාමීනි, බත් පිළිගන්වන්වදූයි) බතින් පිළිවිසිමින් වළඳවත්. **ස්වාතනාය**- දෙවෙනි දිනයෙහි කටයුතු වූ දන් වැළඳීම කිස පිණිස; **උද්දිට්ඨං හොති**- ගෙදරට වන

මෙවා පිළිගන්වන ලද්දක් වෙයි. න චිත්තානුරූපං- සිත් පරිදි නොවිය. අන් දිනයන්හි මොවුහු කැමැති තාක් කල් සැතපෙත්. එදිනෙහි එසේ නො සැතපුනාහුය. සැතපුනා නම් මද වේලාවකි. බහාරාමකොට්ඨකෙ- (වෙළුවනාරාමයෙහි) පිවිත දොරටුවෙහි; සඞ්ඝාටිපල්ලත්ථිකාය- දෙදන දෙපට සිවුරට තදවනසේ ඇතාවටුගන්වාගෙණ හිඳීමෙන්; පත්තක්ඛන්ධා- කඳට නමාගත් හෙවත් කරබාගත් සිරුරු ඇත්තෝ; පජ්ඣායන්තා- නැවත නැවත උපන් ක්‍රෝධ වශයෙන් දුමන්නෝ; 'පපුබ්බ ඣෙ' ධාතුයි. අප්පටිභාණා- කරුණු නො කරුණු සැලකීම් නුවණින් තොරවූවෝ; කිස්ස මං- කවර කරුණකින් මා අමග; අනිත්ථිකා- උවදුරු රහිත ද; යතො නිවාතං තතො සවාතං- යම් දිගක සවල්ප සුලඟක්වත් නැත්තේ ද ඒ දිගෙහි ම මහා වාතය හටගත්තේය. උදකං මඤ්ඤෙ ආදිත්තං- ජලය ගින්න වියයි සිතමි; සරසි ත්වං දබ්බ එවරූපං කත්තා යථායං භික්ඛුනී ආහ-මේ භික්ෂුණිය යම් පරිද්දකින් කියා නම් නුඹ එබන්දක කතෘ වෙහි ද? එය සිහිකරව. මෙහි 'අසි' යනු අධ්‍යාහාර කටයුතු ය. "සරසි ත්වං" "කත්තා අසි" වශයෙන් වාක්‍ය දෙකක් කොට 'එවරූපං' යන්න වාක්‍ය දෙකේ ම කර්මය වශයෙන් සැලකිය යුතුයි. 'කත්තා අසි' යන්නට කර්මය වනවිට ''එවරූපස්ස''යි ෂට්ඨී විභක්තියෙන් සිටි. 'කම්මස්ස කත්තා' යනාදිය මෙනි. යථා මං භන්තෙ භගවා ජානාති- ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දකින් මා දන්නාසේක් ද එපරිද්දෙන් ම දතයුතුය. භාග්‍යවතුන් වහන්සේ සර්වඥසේක. මම ක්ෂීණාශ්‍රවයෙක් වෙමි. කාම වස්තුප්‍රසෙවන චිත්තයක් මට නැත. භාග්‍යවතුන් වහන්සේ මා අඳුනන සේක. එසේ කල මම කුමක් කියම් ද, මා පිළිබඳව භාග්‍යවතුන් වහන්සේගේ දැනීම යම්සේ වේද, එසේ ම වේවා' යන අදහසි. න ඛො දබ්බ දබ්බා එවං නිබ්බෙඨෙන්ති- දබ්බය පණ්ඩිතයෝ මෙසේ වරදින් නිදහස් නො වෙති. නුඹ යම්සේ අනුන් පසය කොට ගෙණ වරදින් මිදෙහි ද, නුවණැත්තෝ එසේ නො මිදෙති යන අදහසි. මෙහි ද්විතීය 'දබ්බ' ශබ්දය පණ්ඩිතාධිවචනයි. සචෙ තයා කතං කතන්ති වදෙහි- ඉදින් නුඹ විසින් කරණලද නම් කරණලදැයි කියව. ප්‍රිය බලයෙන් හෝ පක්ෂ බලයෙන් වරද කළහු නො කළහු කරන්ට නො හැකි ය. එහෙයින් තමන් එය කළබැව් හෝ නො කළ බැව් පැවසිය යුතුයයි දක්වයි. බුදුරජානන් වහන්සේ දබ්බමල්ලපුත්‍රයන් රහත් බැව් ද, මෙබන්දක් නො කරණ බැව් ද දන්නාසේක. එහෙයින් නුඹ නිර්දෝෂය, මේ භික්ෂුණිය මුසා බෙණෙයි යනාදි වශයෙන් කුමක් හෙයින් නො වදාලසේක් ද? පරානුකම්පාව පිණිස ය. 'එසේ මම දනිමි' යි උන්වහන්සේ වදාළසේක් නම් ලෝවැස්සාගේ දෝෂාරොපණයෙන් නො මිදෙන සේක. යතො අහං භන්තෙ ජාතො නාභිජානාමි සුපිනන්තෙනපි මෙථුනං ධම්මං පටිසෙවිතා පගෙව ජාගරො- ස්වාමීනි' යම් දවසෙක මම උපන්නෙම් ද එතැන් පටන් සිහිනෙනුදු මෙවුන්දම් සෙවීම නැණ නො දනිමි. නො නිදන්නෙන් පළමු කොට ම නොදනිමි, හෙවත් මෛථුනධර්ම ප්‍රතිසෙවනය කරන්නෙක්

හුවූයෙමි යන අර්ථයි. මෙහි 'මෙථුනං ධම්මං' යනු 'නාභිජානාමි' යන්නට කර්මය වූ ද්විතියාවෙන් සිටියේය. 'පටිසෙවිතා' යන්නට කර්මය වී නම් 'මෙථුනධම්මස්ස' යි ෂෂ්ඨී විභක්තියෙන් සිටී. 'පගෙව' යන තන්හි 'පග' ශබ්දය ප්‍රථමාර්ථවාචී වෙයි. තෙනහි භික්ඛවෙ මෙත්තියං භික්ඛුණිං නාසෙථ- මහණෙනි, එහෙයින් මෙත්තියා භික්ඛුණිය ලිඞ්ග නාසනයෙන් නසව්. ක්ෂීණාශ්‍රව වූ දබ්බමල්ලපුත්‍රයාගේ වචනා හා ඒ භික්ෂුණියගේ වචන නො ගැළපෙයි. එහෙයින් මෙසේ නියම්කළ සේක. නාසනය වනාහි ලිඞ්ග, සංවාස, දණ්ඩකම්මය යි ත්‍රිවිධ වේ. මහණෙක් හෝ මෙහෙණක් සුදු වත් හඳවා ගිහිබවට පැමිණවීම ලිඞ්ගනාසනා නම්, ඇවැත් නො දක්මෙහි හෝ අප්‍රතිකර්මයෙහි හෝ ලාමක දෘෂ්ටිය අත් නොහැරීමෙහි හෝ සඞ්ඝයා විසින් උත්ක්ෂෙපණීය කර්මය කළහු සඞ්ඝකර්මයන්ට සහභාගීකරවා නොගෙණ නෙරපීම සංවාස නාසනා නම්. දඬුවම් වශයෙන් නියමකළ වැලි ඇදීම් ආදිය කොට සඞ්ඝයා ක්ෂමාකරවා නො ගත්තහු 'පහමෙව්, අප හා එකට නො රැඳෙව්' යනාදීන් බැහැරලීම දණ්ඩනාසනා නම්. ඉමෙ ච භික්ඛූ අනුයුඤ්ජථ-මේ භික්ෂූන් ද පරීක්ෂාකරව්. මේ භික්ෂුණිය විසින් ස්වකීය හැඟීම පරිදි මෙය නො කරණලදී, අන් භික්ෂූන් විසින් මෑ උත්සාහවක් කරණලදී. එසේ පොළඹවනලද භික්ෂූන් ද පරීක්ෂාකරව්. 'අය්‍යෙනම්හි දූසිතා' යන ප්‍රතිඥාව අනුව ඉදින් මෑ ලිඞ්ග නාසනයෙන් නැසුනි නම් දබ්බමල්ලපුත්තතෙර තෙමේ භික්ෂුණී දූෂක කර්මය පිළිබඳ චෝදනාවෙන් නො මිදෙයි. බුදුරජාණන් වහන්සේ ඇගේ ඒ කළ ප්‍රතිඥාව අපෙක්ෂා නො කොට ම සාමාන්‍ය වශයෙන් 'මෙත්තියං භික්ඛුණිං නාසෙථ' යි වදාළසේක. එහෙයින් තෙර තෙමේ අකාරකයෙකි. මේ දෙසින් තෙරුන් සදොස් නම් 'ඉමිනා කාරණෙන මෙත්තියං භික්ඛුණිං නාසෙථ' යි කියයුතු වන්නේය. එසේ නො වදාළ හෙයින් ද, 'දබ්බං ච භික්ඛුං අනුයුඤ්ජථ' යි නොවදාරා 'ඉමෙ ච භික්ඛූ අනුයුඤ්ජථ' යි වදාළ හෙයින් ද අනාගතවූ දුඃශීල දෙෂයකින් මෙත්තියා භික්ෂුණියගේ ලිඞ්ග නාසනාරහත්වය ද, වස්තුහුගේ අමූලිකත්වය ද, තෙරුන්ගේ අකාරකත්වය ද, ප්‍රකට විය. අථඛො මෙත්තිය භුම්මජකා භික්ඛූ-ඉක්බිති මෙත්තිය භුම්මජක භික්ෂූහු; 'මෙත්තියං භික්ඛුණිං නාසෙථ, ඉමෙ ච භික්ඛූ අනුයුඤ්ජථ' යි වදාරා බුදුරදුන් විහාරයට වැඩි කල්හි ලිඞ්ගනාසනයෙන් නැසුම ලබන භික්ෂුණිය දොස ඇ නිදොස් කරවනු කැමැත්තෙන් තමන්ගේ අපරාධය ප්‍රකාශකළාහුය. ආහත චිත්තා- ක්‍රොධ වශයෙන් මැඬනක් සිත් ඇත්තෝ; අප්පතීතා-ප්‍රීතිසුඛාදියෙන් තොර කරණලද්දෝ; යමෙක් ප්‍රීතිසුඛාදියෙන් යුක්තවූයේ නම් හෙතෙමේ ඔවුන් විසින් තොරකරණලද්දේ නම් වෙයි. අනභිරද්ධා-නොසතුටුවූයෝ, යමෙක් අතුටසී නම් හෙතෙමේ සුඛිත නම් නොවෙයි. බිලඞ්ගතා- සිත තදබවට පැමිණියෝ; 'බිලීයති තෙන චිත්තං ථද්ධ භාවං ආපජ්ජතීති බිලං' මේ කාරණකොට තෙණ සිත තදබවට පැමිණේ නුයි බිල නම්. මෙය ප්‍රතිඝයට ම නමකි. එය සිතෙහි ඇතිවූ කල්හි

සිත කුණුකසළින් ගහනාවූවක් මෙන් අමනොඥ බවට පැමිණෙයි. එහෙයින් බිලය නවවර සදෘශවූවක් ද වෙයි. අදිට්ඨං– පියවි ඇසින් හෝ දිව්‍යැසින් නොදිටු; අසුතං– කිසිවෙකු විසින් කියනලද්දක් නො ඇසූ; අපරිසඞ්කිතං– සිතින් ද සැක නොකළ; පරිසඞ්කිතං– තමන් විසින් හෝ අනුන් විසින් සැකකරණ ලද; 'පරිසඞ්කිතය වනාහි- 'දිට්ඨ, සුත, මුත වශයෙන් තෙවැදෑරුම් වේ. එක් භික්ෂුවක් ශරීරකෘත්‍යය පිණිස එක් ගුම්බයකට වනි. එක් ස්ත්‍රියක් ද ශරීරකෘත්‍යය පිණිස එහි ම ගියාය. ස්ත්‍රිය භික්ෂුවවත් භික්ෂුව ස්ත්‍රියවක් නුදුටී. දෙදෙනාම තම තමන් පැමිණි කිස අවසන් කොට කැමැති පරිදි නික්මුනාහු ය. මේ දෙදෙනාගේ පිවිසීමත් නික්මීමත් බලාසිටි එක් භික්ෂුනමකට මේ දෙදෙනා පිළිබඳව සැක උපනී. මේ දිට්ඨපරිසඞ්කිත නමි. භික්ෂුනමක් අඳුරෙහි සැඟවුනු තැනක ස්ත්‍රියක් සමඟ කථාකරමින් සිටියේ ය. එය ඇසූ අන් භික්ෂුනමකට සැක උපනී. මේ සුත පරිසඞ්කිත නමි. ධූර්තයෝ රාත්‍රියෙහි සුවඳමල් ආදිය ද සුරා ද රැගෙණ වෙසඟනන් ද කැඳවා ගෙණ පිරිසරබඳ විහාරයකට පැමිණියාහුය. එසේ පැමිණ ඒ රෑ එහි දම්හලෙහි විසුම් ගෙණ රතිකෙළියෙහි ද යෙදී මල් සුවඳ ආදිය එහි දමා රැයින්ම නික්ම ගියාහු ය. එහි එක් විත්සපත් සඟනමක් අරුණට පළමුව නැගිට වත් පිළිවෙත් කරන්නේ දම්හලෙහි තන්හි තන්හි වූ සුවඳ මල් ආදිය දැක, පිදීම පිණිස විහාරයම් ගෙණ ගොස් තැන්පත්කර තැබිය. තැන් තැන්වල තිබුනු ගඳ හෙත් අරිෂ්ට වශීද පානය කෙළේ ය. වෙහෙර වැසි භික්ෂූහු පැමිණ දම්හලෙහි මේ විප්‍රකාරය දැක පරීක්ෂාකරන්නාහු යථොක්ත විත් සපත් භික්ෂුව කෙරෙහි සැක උපදවා ඒ භික්ෂුනමගේ අත් හා මුව ඉවකර බැලූවාහු ය. ඒ භික්ෂුනමගේ ම කෘත්‍යයකැයි ද සැක කළාහු ය. මේ සැකය මුත පරිසඞ්කිත නමි.

අනුද්ධංසෙය්‍ය- තෙමේ හෝ අනුන් ලවා හෝ චෝදනාකරන්නේය. 'අනු පුබ්බ ධංස පධංසනෙ' ධාතුයි. චොදෙති– පරිජ් ඇවතට පැමිණියෙහැයි තෙමේ චෝදනා කෙරෙයි. චොදාපෙති– තෙමේ දෙලොස්රියනක් ඇතුළත සිටගෙණ අන් භික්ෂුවක් ලවා චෝදනා කරවයි. දෙලොස් රියනකින් ඈත්ව සිට කරණ චෝදනාව ගණනට නො ගැණේ. පරම්මුඛ චෝදනාව ඇවතට කරුණු නොවන හෙයිනි. චෝදනා කරවන්නාව ඔහුගේ වචනගණනින් සඞ්ඝාදිසෙසාපත්තිය සිදුවේ. චෝදකයා මා විසින් දක්නාලද්දේය, අසන ලද්දේයයි චෝදනා කෙරේනම් ඔහුගේ වචන ගණනින් දෙදෙනාව ම සඟවෙසෙස් ඇවැත් සිදුවේ. තං ඛණං වා ඛණං– චෝදකයා විසින් කියනලද ඒ වස්තුවෙහි; සමනුග්ගාහියමානො-විමසනු ලබන්නේ; න කෙනචි වුච්චමානො– අනුවිජ්ජකයා විසින් හෝ අන්කිසිවෙකු විසින් හෝ නො කියනු ලබන්නේ; අධිකරණං– විනිශ්චය යි. (අධිකරීයති එත්ථාති) මෙහි සමථයකට පැමිණේනුයි අධිකරණ නමි. විවාදාධිකරණං– (භූඛ භික්ඛු විවදන්ති ධම්මොති වා අධම්මොති වා විවාදො, විවාදො චෙව අධිකරණං,

විවාදාධිකරණං) අෂ්ටාදශභේදකර වස්තූන් නිසා උපන් විවාදයයි; අනුවාදාධිකරණං- (ඉධ භික්ඛූ භික්ඛුං අනුවදන්ති සීලවිපත්තියා වා) සිවු විපත් ඇසුරු කොට ගෙණ උපන් අධිකරණයයි; ආපත්තාධිකරණං- මාතිකාවෙහි සඳහන් ආපත්තිස්කන්ධ පස, විභඞ්ගයෙහි ආ ථුල්ලච්චය, දුබ්භාසිතය යන දෙකත් සමග වන සප්තාපත්තිස්කන්ධය ආපත්තාධිකරණ නම්. කිච්චාධිකරණං- (යා සඞ්ඝස්ස කිච්චයතා කරණීයතා අපලොකනකම්මං, ඤත්තිකම්මං, ඤත්තිදුතියකම්මං, ඤත්තිචතුත්ථකම්මං) යි දක්වනලද සඞ්ඝයා විසින් කටයුතු චතුර්විධ කර්‍මය කිච්චාධිකරණ නම්. අදිට්ඨස්ස හොති- (අදිට්ඨො අස්ස) චොදකයා විසින් මේතෙමේ පරිජ් ඇවතකට පැමිණියේය යි නො දක්නාලද්දේ වෙයි. දිට්ඨෙ වෙමතිකො- දුටුමෙහි විමති ඇත්තේ; මෙය දස්සන වෙමතික, පුග්ගල වෙමතික වශයෙන් දෙ පරිදි වේ. මා විසින් දක්නාලද්දේද නැතහොත් නො දක්නාලද්දේදැ යි ඇතිවන විමතිය දර්‍ශනයෙහි වේ, මා විසින් දක්නාලද්දේ මේ තෙමේ ද අනිකෙක්දැයි ඇති වන විමතිය පුද්ගලයා කෙරෙහි වේ. නො කප්පෙති- නො අදහයි. නස්සරති- අසවල් ගමෙහිදී අසවල් කාලයෙහිදී යයි සිහි නො කෙරෙයි. පමුට්ඨො- යමෙක් තෙමේ ඒ ඒ උපායවලින් සිහිකරණු ලබන්නේද සිහි නොවන්නෙක් වෙයි. මේ ශික්ෂාපදය කායචිත්ත වාචාචිත්ත කායවාචාචිත්ත යන තුණින් සමුට්ඨානය වේ. උපසම්පන්නභික්ෂුවීම, පිරිසිදු අදහස් ඇතිබව, අදිට්ඨාදි වශයෙන් අමූලක බව, සම්මුඛ චොදනය, එකෙණෙහි දැනගැණීමය යන අඞ්ග පසකින් යුක්ත ය.

පඨම දුට්ඨදොස සික්ඛාපද ගැටපදය නිමි.

---

හන්ද මයං ආවුසො ඉමං ඡගලකං දබ්බං මල්ලපුත්තං නාම කරොම- ඇවැත්නි, අපි මේ එළුවාට දබ්බමල්ලපුත්‍රය යි නම කරමු; මොවුහු ප්‍රථම වස්තුවෙහිදී තමන්ගේ මනොරථය සිද්ධකරගන්ට නො හැකිවූවාහු නිග්‍රහයට පැමිණියෝ 'දූත් දනිමු'යි ඊට සුදුසු වස්තුවක් සොයමින් හැසුරුණාහුය. එක් දවසක් ඊට සුදුසු වූවක් දූහ අතිශයින් තුටුපහටු වූවෝ මෙසේ කථාකළාහුය. ඇවැත්නි, මේ එළුහට දබ්බමල්ලපුත්‍රයයි නම තබමු. මේ එළුදෙන 'මෙත්තියා' නම් භික්ෂුණිය වන්නේය. තෙ භික්ඛූ මෙත්තියභුම්මජකෙ භික්ඛූ අනුයුඤ්ජිංසු- ඒ භික්ෂූහු මෙත්තිය භුම්මජක භික්ෂූන්ගෙන් මෙසේ විචාළාහුය. ඇවැත්නි තොප විසින් මෙත්තියා භික්ෂුණිය හා දබ්බමල්ලපුත්‍ර ස්ථවිර තෙමේ කොහිදී දක්නාලද්දේද? ගිජුකුළු පව්වෙහිදී ය. කවර නම් වේලාවකදී ද? පිඬු පිණිස හැසිරෙද්දී ය. ඇවැත්නි! දබ්බය, මේ භික්ෂූහු මෙසේ කියති. එකල්හි ඔබ කොහි සිටියෙහි ද? වේළුවනාරාමයෙහි බත් උදෙසුවෙමි. ඔබ එහි සිටි බැව් කවුරු දනිත් ද? ස්වාමීනි භික්ෂුසඞ්ඝයා දනියි. දබ්බමල්ලපුත්‍රයා අසවල් වේලාවෙහි වේළුවනයෙහි සිටි බැව් නුඹවහන්සේ දන්නාහුද? ඇවැත්නි, අපි දනිමු. මේ ස්ථවිර තෙමේ භත්තුද්දෙසක සම්මුතිය ලත් තැන් පටන් වේළුවනයෙහි ම

වැඩසිටිති. ඇවැත්නි, මෙතන්හි කුම්මජකයෙහි, ඔබවහන්සේලාගේ කථාව නො හැලපෙයි. කිම? ඔබ කිසියම් ව්‍යාජයක් හඟවා කියන්නහුද? ඇවැත්නි, එසේය යි පවසා සියල්ල ඇතිසැටියෙන් ඔවුහු සැලකළාහුය. **අඤ්ඤභාගියස්ස**- මනුෂ්‍යජාති භික්ෂුභාව කොට්ඨාසයෙන් අන්‍ය වූ තිරශ්චීනජාති ඡගලකාකාවාදි කොටස් ඇති; 'අඤ්ඤභාගො අස්ස අත්ථීති අඤ්ඤභාගියං' අස්ත්‍යර්ථයෙහි 'ඉය' ප්‍රත්‍යය වී සිද්ධය. 'අධිකරණ' ශබ්දාපෙක්ෂාවෙන් නපුංසකලිඞ්ග වීය. 'චූදිතකානං අඤ්ඤස්ස'යි වජිරබුද්ධියෙහි දක්වේ. චූදිතයාගෙන් අන්‍ය වූ චෝදක පක්ෂයෙහි සිටියහුට ය යනු එහි අර්ථයි. **අධිකරණස්ස**-දබ්බමල්ලපුත්‍රාදි නාමකරණයට වස්තු වූ ඡගලකාදීහුගේ; **කිඤ්චිදෙසං ලෙසමත්තං**- ජාත්‍යාදි යම්දෙශ ලෙශමාත්‍රයක්; **උපාදාය**- චෝදනාකරණු පිණිස ගෙණ; **ආමකමණ්ඩනාව**-අයොපාත්‍රයකට බඳු සටහන් ඇති පිටත මනා සිනිඳු වූ කළුපැහැය ඇති මැටි පාත්‍රයකි; **කුම්භකපණ්ණකා**- ප්‍රකෘති මැටිකා පාත්‍රය; සමුට්ඨානය පළමු ශික්ෂාපදයෙහි මෙනි. පළමු ශික්ෂාපදයෙහි සඳහන් අඞ්ගයන්ට කිඤ්චිදෙශලෙශමාත්‍ර ග්‍රහණය අධික වේ.

දුතිය දුට්ඨදොස සික්ඛාපද වණ්ණනා නිමි.

---

**යාවජීවං ආරඤ්ඤකා අස්සු**- ජීවිතාන්තය තෙක් භික්ෂූහු අරණ්‍යෙහිම වාසය කෙරෙත්වා; **යො ගාමන්තං ඔසරෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය**- යම් මහණෙක් වනය හැර විසීම පිණිස ගම්වදී නම් වරදක් ඒ මහණහු ස්පර්ශ කෙරේවා; ඒ භික්ෂූහට ඇවතක් නියමකරණ සේක්වා යනු අදහසයි. **ජනං සඤ්ඤාපෙස්සාම**- අපගේ අල්පෙච්ඡ බව ජනයාට හඟවන්නෙමු; නොහොත් ජනයා පහදවන්නෙමු; මේ පඤ්චවස්තූන් ඉල්ලවන්නා වූ දෙවදත්තයාගේ වචන ඇසූ බුදුරජානන් වහන්සේ සඞ්ඝභෙදය කරණු කැමැත්තේ මෙසේ ඉල්ලායයි දත්සේක. මෙය බොහෝ කුලපුත්‍රයන්ගේ මාර්ගාන්තරාය පිණිස පවත්නේය යි දැන ප්‍රතික්ෂෙප කොට; **යො ඉච්ඡති සො ආරඤ්ඤකො හොතු**- යම් මහණෙක් කැමැති නම් හෙතෙමේ අරණ්‍ය වසන්නෙක් වේවා; උතුම් අදහස් ඇති, මහත් උත්සාහ ඇති ඇතැම් මහණෙක් ග්‍රාමාන්ත සෙනසුන හැර වෙනෙහි වැස දුක් කෙළවරකරන්ට හැක්කෙක් වෙයි, දුර්වලවූ මන්දෝත්සාහී වූ එක් භික්ෂුනමක් අරණ්‍යෙහි වසන්ට නො හැකිවූයේ ග්‍රාමාන්තයෙහි ම වසන්ට හැක්කෙක් වෙයි. එක් නමක් උත්සාහවත් වූයේ ඉවසීමෙන් සමත්වූයේ අරණ්‍යෙහි හෝ ග්‍රාමාන්තයෙහි වසන්ට හැක්කෙක් වෙයි. එක් භික්ෂුනමක් අරණ්‍යෙහිදී හෝ ග්‍රාමාන්තයෙහි දී හෝ දුක් කෙළවර කරන්ට අසමර්ථවූ පදපරමයෙක් වෙයි. යමෙක් තෙමේ මහාබල ඇත්තේ ස්ථිර අදහස් ඇත්තේ ග්‍රාමාන්තය හැර වනසෙනසුන් කරා පැමිණ දුක් කෙළවරකරන්ට සමර්ථවේද හෙතෙමේ අරණ්‍යෙහිම වෙසේවා, කැමැති නම් සද්ධිවිහාරියාදීන් ද අරණ්‍යෙහි වසනලෙස සික්මවාවා; යමෙක් දුර්වලවේද හෙතෙමේ ග්‍රාමාන්තයෙහිදී

දුක් කෙළවර කරන්ට සමර්ථයෙක් වේනම් අරණට නො පැමිණ ග්‍රාමාන්තයෙහි ම වාසය කෙරේවා, ඔහුගේ සද්ධිවිහාරිකයෝද ඔහු අනුව ම වාසය කෙරෙත්වා, මෙසේ වදාරා භාග්‍යවතුන් වහන්සේ දෙව්දත්හුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. තිකොටිපරිසුද්ධං— දිට්ඨාදිවූ තෙකොළවරින් පිරිසිදු වූ; දිට්ඨාදී වූ අපිරිසිදු කරුණු තුණින් තොරය යන අර්ථයි. මෙහි 'කොටි' ශබ්දය 'කාරණාර්ථයෙහි' පවතී. අදිට්ඨං අසුතං අපරිසඞ්කිතං— භික්ෂූන්ගේ ප්‍රයොජනය පිණිස සතුන් මරන්නහු නො දක්නාලද්දේ අදිට්ඨ නම්. භික්ෂූන්ගේ ප්‍රයොජනය පිණිස මැරූ සතුන්ගේ මසක්යයි නො අසනලද්දේ අසුත නම්. අපරිසඞ්කිතය වනාහි දිට්ඨ, සුත, තදුභය යි තෙවැදෑරුම් වේ. දැල් කෙමින් උගුල් ආදියද රැගෙණ ගමින් පිටත් ගොස් වනයෙහි හැසිරෙන්නෝ භික්ෂූන්ට දකින්ට ලැබෙති. පසුදින පිඩුපිණිස වැඩි ඒ භික්ෂූන්ට පිඩු හා මස් මාලු ආදිය ද ලැබේ. එසේ කල භික්ෂූන්ට තමන් උදෙසා ම මරණලද සතුන්ගේ මසක්දැයි සැක උපදී නම් ඒ දිට්ඨපරිසඞ්කිත නම්. එසේ සැක උපන්කල එය වළඳන්ට නො වටී. ඉදින් මනුෂ්‍යයන් පැමිණ කුමක් හෙයින් නො වළඳනා සේක්දැයි විචාළකල්හි භික්ෂූන් තමන්තුළ උපන් සැකය ඔවුන්ට දැන්විය යුතුයි. සවාමිනි මෙය අපගේ හෝ රජුන්ගේ හෝ ප්‍රයොජනය පිණිස කරණලද්දක්යයි ඔවුහු කියත් නම් ඒ මස් භික්ෂූන්ට වළඳන්ට වටී. මිනිසුන් දැල් මලපුඩු ආදියත් රැගෙණ අරණවැදුනු බැව් භික්ෂූන්ට දැනගන්ට ලැබුනි. එහෙත් ඒ කිසිවෙකු භික්ෂූහු නුදුටුවාහු ය. දෙවෙනි දිනයෙහි එහි පිඩු පිණිස වැඩි භික්ෂූන්ට වැලඳීමට මස් පිළිගැන්වූහ. ඒ භික්ෂූහුද ඇසීම් පමණින් භික්ෂූන් උදෙසා මැරූ සතුන්ගේ මස්දැයි සැක කළාහු ය. මේ සුතපරිසඞ්කිත නම්, එසේ කලද වළඳන්ට නො වටී. භික්ෂූන් උදෙසා මරණලද්දක් නො වේයයි මිනිසුන් කියත් නම් පිළිගන්ට වටී. ඒ ගමෙහි මිනිසුන් සතුන් මරන්ට ගිය බවක් නො ඇසූහ. එසේ ම ඒ පිණිස යන්නවුන් ද නුදුටුවාහු ය. එහෙත් මත්ස්‍ය මාංශ පිළිගැන්වූ කල්හි භික්ෂූන් උදෙසා කරණලද්දක්දැයි සැකකළාහුය. මේ තදුභයවිමුක්ත පරිසඞ්කිත නම්, එය ද පිළිගන්ට නො වටී. අප හෝ රජුන් උදෙසා කරණ ලද්දක්ය, නැතහොත් කැපවූ වික්කායික මාංසයක් ලැබ භික්ෂූන්ගේ ප්‍රයොජනයට සුදුසු සේ කරණලද්දක් යයි මිනිසුන් කී කල්හි පිළිගන්ට වටී. භික්ෂූන් උදෙසා නො කරණ ලද යම් මසක් වේද, එසේ ම භික්ෂූන්ගේ විමතියකුත් එහි නොමැති වේද ඒ මස භික්ෂූන්ට කැපය. අන් විහාරයක භික්ෂූන්උදෙසා කරණ ලද්දක් නමුත් ඒ භික්ෂූහු නො දනිත් නම් වැලඳීමට සුදුසුය. භික්ෂූන් උදෙසා කරණ ලද්දැයි දන්නා භික්ෂූන්ට ඒ මස අකැප ය.

එක් අයෙක් භික්ෂූනමක උදෙසා මැරූ සතෙකු පිස ඒ භික්ෂූහට පාත්‍රය පුරවා පිළිගැන්වීය. ඒ භික්ෂුව ද දැන දැන ම එය පිළිගෙණ විහාරයට ගෙණ ගොස් අන් නමකට දුනි. හෙතෙමේ විමති රහිතව ම එය වැළඳීය. ඒ දෙනමට ම ආපත්තියි. කැපමසක් පිළිගැනීම

ආපත්තිකර නොවේ. උදෙසා කරණ ලද්දක් නමුත් නො දැන වැළඳූ භික්ෂුහට පසුව දැනගත් නමුත් ඇවැත් දෙසාගැනීමක් උවමනා නැත. උදෙසා කරණලද්ද දැන වළඳන භික්ෂුහට ම ඇවැත් සිදුවේ. එහෙයින් ආපත්තිශ්රැංකා භික්ෂුව විසින් විචාරම මස් වැළඳීම් කළයුතුයි. අකැප මස් නො දැන පිළිගන්නහුට ඇවතක් නැත. නො දැන වළඳන්නහුට ඇවැත් සිදුවේ. හට්ඨා උදග්ගා– තුටුවූයේ එසේ ම ප්‍රීතිවේගයෙන් ඔසවාගත් කය හා සිත් ඇත්තේ; වසක් අනුභවකොට නසිනු කැමැත්තෙකුට ඒ වස ඉදිරියට ම ලැබුනු කල්හි යම්සේ පහදීද, එපරිද්දෙන් දෙව්දත් තෙමේ බුදුරදුන් මේ පංචවස්තූන් නො අනුදත් කල්හි දැඩිව පහන්වූයේ දැන් සංඝභෙදය පහසුවෙන් කටහැකි යයි කෝකාලිකයාට ඉඟිබිඟි කොට පිරිසත් කැඳවාගෙණ යන්ට නික්මිනි. තෙ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහි සමාදාය වත්තාම– ඒ අපි මේ පඤ්චවස්තූන් සමාදන වශයෙන් ගෙණ පවතිමූ. මෙහි 'ඉමානි පඤ්චවත්ථූනි' යි කියයුතු තැන 'තෙ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහි ජනං සඤ්ඤාපෙස්සාම' යි පුරුදු අදහස පරිදි විභක්ති විපර්‍යාසය නො සලකා 'තෙ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහි' යි කීය. ධුතා– කෙලෙසයන් කම්පාකරණ ප්‍රතිපත්තියෙන් යුක්තවූ හෙයින් ධුත නම්වූ. සල්ලෙඛවුත්තිනො– කෙලෙස් ලිවීමේ ප්‍රතිපත්තියෙන් යුක්ත වූවෝ; 'සල්ලෙඛා වුත්ති එතෙසං ති සල්ලෙඛවුත්තිනො' යනු වාක්‍යය යි. බාහුලිකො– චීවරාදීන්ගේ බහුල බව ඇත්තේ; 'චීවරාදීනං පච්චයානං බහුලභාවො බාහුල්ලං, බාහුල්ලං අස්ස අත්ථීති බාහුලිකො' මෙහි බාහුල්ල ශබ්දයාගේ එක් ලකාරයකට ලොප් වී ය. බාහුල්ලාය චෙතෙති– බහුලබව පිණිස සිතයි. කෙසේ නම් මගේ සවුවන්ට චීවරාදීන්ගේ බහුලබව වන්නේදැයි උත්සාහවත් වූයේ යනාර්ථයි. චක්කභෙදාය– ආඥාභෙදය පිණිස, මෙහි 'චක්ක' ශබ්දයෙන් අණසක කියැවේ. ධම්මිං කථං කත්වා– (ඛන්ධකයෙහි කී ක්‍රමයෙන් "අලං දෙවදත්ත මා තෙ රුච්චි සංඝභෙදො, ගරුකො ඛො දෙවදත්ත සංඝභෙදො. යො ඛො දෙවදත්ත සමග්ගං සංඝං භින්දති කප්පට්ඨිතියං කිබ්බිසං පසවති; කප්පං නිරයම්හි පච්චති ; යො ච ඛො දෙවදත්ත භින්නං සංඝං සමග්ගං කරොති බ්‍රහ්මං පුඤ්ඤං පසවති කප්පං සග්ගම්හි මොදති" යනාදි ක්‍රමයෙන් දෙව්යන්හට ද අනුගත භික්ෂූන් වද ඊට සුදුසු වූ දැහැමි කථාකොට; සමග්ගස්ස– සිතින් හා කයින් වෙන් නුවූවහුට; සමානසංවාසකො– සිතින් වෙන් නුවූයේ; සමාන සීමායං ඨිතො– කයින් වෙන් නුවූයේ; 'සමාන සංවාසක' යන්නෙන් ලද්ධිනානාසංවාසක කම්මනානාසංවාසකයන්ගෙන් වෙන්වීම දක්වයි. උක්ඛිත්තානුවත්තකයෝ ලද්ධිනානාසංවාසක නම්. උත්ක්ෂෙපණීය කර්ම කරණලද්දෝ කම්මනානාසංවාසක නම්. භෙදනසංවත්තනිකං– සංඝභෙදයට කාරණවූ පවත්නාවූ; අට්ඨාරසභෙදකර වත්ථූනි– ඛන්ධකයෙහිදී විස්තරවේ. පග්ගය්හ– ප්‍රකට කොට, දැඩිකොට ගෙණ; තිට්ඨෙය්‍ය– සමාදන් වූ පරිදි දැඩිකොට ගෙණ සිටින්නේය; භික්ඛූහි එවමස්ස වචනීයො– අන්‍යවූ ලජ්ජී භික්ෂූන් විසින් මෙසේ කියයුත්තෙක් වන්නේය. යෙ පස්සන්ති– යම් කෙනෙක් ඉදිරියෙහි දැකීකොට

ගෙණ සිටින්නහු දැක්ක ද; ගය ගුණකාරි- ගම් කොණෙක් (අසවල් විහාරයෙහි භික්ෂූහු සඞ්ඝභේදයට කාරණ වූ අධිකරණයක් ගෙණ සිටිත් යයි) අසත් ද; සමග්ගානඤ්හි සඞ්ඝස්ස- ආයුෂ්මත් තෙමේ සඞ්ඝයා සමග එකතු වෙව, එකලබ්ධිය ඇත්තෙක් වේවා; සමග්ගො හි සඞ්ඝො- එවුනොවුන් සිලාදී සම්පත්තියෙන් මනාකොට සතුටු වන්නේ; අවිවදමානො-('මේ ධර්මය වෙයි, මේ ධර්මය නොවෙයි' යනාදී වශයෙන්) විවාද නො කරන්නේ; එකුද්දෙසො-එකට පැවසි පාමොක් උදෙසීම ඇත්තේ; ඵාසු විහරති- සැපසේ වාසය කෙරෙති. ඉදානි න මුද්ධනි ආසනානි ධූතාඞ්ගෙන- ගම් ගෙතෙනක් අන්‍යා නො කියත් ද, ඔවුන්හට ද දුකුළා වේ. එක ම විහාරයෙහි නම් කවර කතා ද, ගාව්පස අඩයොදුනක් ඇතුළත වස්නා භික්ෂූහු ද නමින් ම හොස් ඇමැත්තනී සඞ්ඝභේදය කරැයි; සඞ්ඝභේදය කැණ වැයම් නොකරව යයි කියා වැළැක්විය යුත්තෝයි. යැකැයි අකිලන්නු විසින් දුරට ද යායුතුයි. අසම්පජ්ජමානම්පි ආකඩ්ඪිත්වා-(ඉදිත් පළමු ක්‍රමයෙන් කියනු ලබන්නෝ තමන්ගේ දෘෂ්ටිය නො හරී නම් අත්පාවලින් ගෙණ) සඞ්ඝ මැදට පමුණුවා 'මා ආයස්මා' යනාදී ක්‍රමයෙන් තැවත ද තුන්වරක් කියයුතුයි. සො චෙ භික්ඛු සමනුභාසියමානො-තුන්වන වර තෙක් සමනු භාෂණ කර්මය කළ යුතුයි. එය 'සො භික්ඛු භික්ඛූහි සමනුභාසිතබ්බො' යනුවෙන් පදභාජනයෙහි දක්වකලදී. ධම්මකම්මෙ ධම්මකම්ම සඤ්ඤී- ඒ සමනුභාෂණ කර්මයම ධම්මකම්ම නම්. එහි ධර්මකර්මය යන හැඟීම ඇත්තේ; අසමනුභාසියමානස්ස-සමනුභාෂණ කර්මය නො කරණු ලබන්නහුට; මෙහි වූ 'අනාප' ප්‍රත්‍යය කාර්කාරකයෙහි සිද්ධය. පටිනිස්සජ්ජන්තස්ස-(අදහත්ගෙන් පෙර හෝ අදහති කරණයෙහි හෝ අදහති කෙලවර හෝ පළමුවැනි අනුශාවකයෙහි හෝ දෙවෙනි හෝ තුන්වැනි අනුශාවකයෙහි හෝ 'යස' කාරයට පැමිණෙන්නට පළමු තමන්ගේ දෘෂ්ටිය) හරින්නහුට අනාපත්ති වේ. මේ ශික්ෂාපදය කායවාචාචිත්ත වශයෙන් එකසමුට්ඨානය ය. සඞ්ඝභේදය පිණිස උත්සාහකිරීම, සමනුභාෂණ කර්මකිරීම, කම්මවාචාපරියොසානය, දෘෂ්ටිය අත් නොහැරීම යයි අඞ්ග සතරකින් යුක්තය.

දශම සඞ්ඝභෙද සික්ඛාපද ගැටපදය නිමි.

---

අනුවත්තකා-(ඔහුගේ දෘෂ්ටිය-ක්ෂාන්තිය-රුචිය ගැණීමෙන්) අනුව යන්නෝ; වග්ගවාදකා- කලහකාරක පක්ෂයට ගිනවූ වචන කියන්නෝ; 'කලහකාරක වවකං ඉධ වග්ගනාසි වුච්චති' යනු පිකායි. තස්ස ඡන්දඤ්ච රුචිඤ්ච- ඒ සඞ්ඝභේදය පිණිස ව්‍යායාම කරන්නහුගේ ශුද්ධකර්ම පිණිසද, පක්ෂවාදයි පිණිස ද සිටි හෝ වෙත්. ජානාති නො- අපගේ ඡන්දාදිය දනියි; භාසති- මෙසේ කරමු' යි අප සමග කියයි. අම්හාකම්පෙතං ඛමති- මෙතෙම යමක් කෙරේද එය අපට ද රුචිවේ. සමනුභාසිතබ්බා- ආයුෂ්මතුන්ගේ සිත

සඞ්ඝයා සමග එකී භාවයට යේම; සමුට්ඨානාදිය පළමු ශික්ෂාපදය හා සමය. මේ ශික්ෂාපදයෙහි අඞ්ග වසයෙන් දක්වූ භේදය පරකතම භාණ්ඩය හැරදමා ඒ වෙනුවට අනුවත්තකය යොදාගත යුතුයි.

දුතිය සඞ්ඝභෙද ශික්ඛාපද ගැටපදය නිමි.

---

අනාචාරං ආචරති- නත් අයුරින් කායවචීද්වාර ව්‍යතික්‍රමය කෙරෙයි. ඛිය්‍යනධම්මා නාම- මෙය ගරහ වචනයකි. අහං ඛො නාම- තමන් උසස් බැව් හැඟවීම පිණිස යෙදූනකි. තුම්හෙ වදෙය්‍යං-(මෙය කරව මෙය නො කරවයයි) මම තොපට කියන්නට සුදුස්සෙක් වෙමියි දක්වයි. කුමක් හෙයින් ද? යත්; අපගේ බුද්ධරජානන් වහන්සේ කාලය නම් අසුපිට නැගී මා සමගම ගොස් පැවිදිවූහ. එහෙයිනි; අම්හාකං ධම්මො- චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මය අපගේ ය. ඒ බුද්ධරජානන් වහන්සේ විසින් ප්‍රතිවෙධ කරණලද්ද හෙයින් මෙසේ කීයයි. සඞ්ඝයා තමන් වෛරිපක්ෂයෙහි ලා සලකන හෙයින් අපගේයයි නො කියයි. තිණකට්ඨපණ්ණසටං- ඒ ඒ තැන පතිතවූ තණ වියලි දඬු හා වියලි කොළ; 'සට' ශබ්දය පතිත ශබ්දය හා සමානාර්ථ වූවකි. විශෙෂණයාගේ පරනිපාතය කොට මෙසේ කියනලදී. උස්සාදෙය්‍ය- රැස් කරන්නේ ය. සන්දෙය්‍ය- උපතයකින් හටගන්නාවූ නදිය; නද සැඩ පහරින් යුක්තවූවක් බැව් මෙයින් හඟවයි. සඞ්ඛසෙවාලපණකං- දිය්මුල් හා කොල ඇති සෙවෙල් සඞ්ඛ නම්. නිල්පැහැය ඇති සෙවෙල් සෙවාල නම්. උදකපප්පටාදිය පණක නම්. එකතො උස්සාදිතා- එකට රැස්කරණලදී. දුබ්බචජාතිකො- දුර්වච සභාව ඇත්තේ; දුර්වචබවට හෙතුවූ පාපෙච්ඡාදි එකුන්විසි ධර්මයන්ගෙන් යුක්තවූ තමන් කෙරෙහි පැවැත්වූ අනුශාසනා නොපිළි ආදර බුහුමන් ඇතිව නොගන්නේ ද දුර්වච නම්. 'දුක්ඛං වචො එතස්මිං පුග්ගලෙති දුබ්බචො' යනු විග්‍රහයි. දොවචස්සකරණෙහි- දුර්වච බව කරන්නාවූ; දුර්වච කරණීය ධර්ම අනුමාන සූත්‍රයෙහි මෙසේ සඳහන් වෙත්. ලාමක බලාපොරොත්තු ඇති බව, තමන් උසස් කොට අනුන් පහත් කොට සලකන බව, කිපෙනසුලු බව, නැවත නැවත වෛරබඳින බව, බද්ධවෛරය ඇති බව, ක්‍රෝධයට ඉවහල් වචන කථාකරණ බව, චෝදකයාට ප්‍රතිවිරුද්ධව සිටින බව, මෝඩයාගේ කථාවෙන් මට කවර ප්‍රයෝජනදැයි චෝදකයා හා ගැටීම, ඔබද ආපත්තිකයෙක, පළමුකොට ඊට ප්‍රතිකර්ම කරවයි, චෝදකයාට ඇවැත් ආරෝපණය කිරීම, අන් කරුණකින් හෝ වචනයකින් චෝදනාව මැඩීමෙන් යුක්තව හැසිරෙණබව, තමන් පිළිබඳ යම් යම් දේ උපදවා චෝදනාව ඔප්පු කරන්ට ඉඩ නොදීම, පරගුණයන් මැකීම සවභාව කොට ඇති බව හා අනුන්ගේ ගුණයන් බැහැරගෙණ තමන්ගේ ගුණ හා සමකොට සිතන බව, අනුන්ගේ සම්පත් නො ඉවසන බව හා තමන්ගේ සම්පත් සඟවන බව, කෛරාටික ගුණයෙන් හා මායාවෙන් යුත් බව, මානයෙන් පිරවූ භස්ත්‍රාවක් මෙන් තද බව, නගුලක් ගිලගත් පිඹුරෙකු මෙන් නො නැමෙන ගතියෙන් යුත් අත්මානී බව, සන්දිට්ඨි

පරාමාස බව, ගත් දෙය දූෂිවසයෙන්.ගන්නා සුළු බව සහ තමන්ගේ ලබ්ධිය නොහරණ බව, යන මේ එකුන්විසි ධර්මයෝයි. අක්ඛමො-අවවාදය නො ඉවසන්නේ; අපදක්ඛිණග්ගාහී- අනුශාසනය ප්‍රදක්ෂිණා වශයෙන් නො ගන්නේ; තෙපි මට කවරහෙයකින් කියව්ද, මම කැප නො කැප දෙය, වරද නිවරද දෙය, වැඩ අවැඩ දෙය නො දන්නෙම් දැයි කියයි. සහධම්මිකං වුච්චමානො- සකාරුණු කොට කියනු ලබන්නේ; 'සහධම්මිකං' යනු කරණාර්ථයෙහි දුතියායි. විරමථායස්මන්තො මම වචනාය-ආයුෂ්මත්වරුනි, මට කීමෙන් වළකිනු. මෙහි 'වචනාය' යනු අවධි අර්ථයෙහි සම්ප්‍රදාන විභක්තියි. වදෙනු සහධම්මෙන- සහධම්මිකවූ ශික්ෂාපදයෙන් හෝ අන්‍ය වූ ප්‍රසාදවහ ගුණයෙන් යුත් වචනයෙන් හෝ කියාවා; සමුට්ඨානය පඨම සඞ්ඝභෙද ශික්ෂාපදය හා සමව ලැබේ. අඞ්ග ද එසේම ය. භෙදය පරක්කමවනය වෙනුවට අවචනීය කරණතාඞ්ගය යොදගත යුතුයි.

දුබ්බච සික්ඛාපද ගැටපදය නිමි.

---

කීටාගිරිස්මිං-කීටාගිරිය නම් සැවැත්නුවරට දෙව්රමට ආසන්නයෙහි පිහිටි නියම්ගමකි. 'න අස්සජි පුනබ්බසුකෙහි භික්ඛූහි කීටාගිරිස්මිං වත්ථබ්බං' යන වචන හෙයින් ඒ ආසන්න ජනපදයද කීටාගිරි නාමයෙන් ප්‍රකට විය. අලජ්ජිනො පාපභික්ඛු-නිර්ලජ්ජ ලාමක භික්ෂූහු; සැවැත්නුවරැ පණ්ඩුක ලොහිතක මෙත්තිය භුම්මජක අස්සජි පුනබ්බසුක යන යහළුවන් සදෙන සිසෑම් ආදිය කරදර හෙයින් 'අපි සස් නෙහි මහණවෙමු' යි දෙඅග සවුවන් ලඟ මහණවූහ. මහණවූ පස්වස් ඇති ඔවුහු මාතිකාව ප්‍රගුණකොට ගෙණ මෙසේ මන්ත්‍රණය කළාහුය. ජනපද නම් හැමකල්හි සුභික්ෂ නොවෙති. එහෙයින් අපි වෙන්වී තුන් පලක වසමු යි; පණ්ඩුක ලොහිතක දෙනම සැවැත්නුවර ද, මෙත්තිය භුම්මජක දෙනම රජගහනුවර ද, අස්සජි පුනබ්බසුක දෙනම කීටාගිරියෙහිද, අඹ කොස් පොල් ආදිය වවමින් කුලසඞ්ග්‍රහය කරමින් විසූහ. මොවුන් එක් එක් නමට දෙසියපණස බැගින් පිරිවරද වූහ. මින් පණ්ඩුක ලොහිතක දෙනම සිල්වත්තු ය. එසේ ම බුදුරජානන් වහන්සේ සමග චාරිකාවෙහි ද හැසිරෙති. මොවුහු අමුතු අමුතු වැරදි කරති පණවනලද ශික්ෂාපද නො මඩිති. අතික් සිවුදෙන නොකට යුතුකම්ද කරති. පණවනලද සිකපද ද මඩිති. අනාචාරං ආචරන්ති- නො කටයුතු දේ කරත්. මාලාවච්ඡං රොපෙන්ති රොපාපෙන්ති-කුල සඞ්ග්‍රහය පිණිස මල් පැල තුමූම රොපණය කරත්. අනුන් ලවාද රොපණය කරවත්. සිඤ්චන්ති සිඤ්චාපෙන්ති-තුමූ ද ජලය ඉසිත්, අනුන් ලවාද ඉස්වත්. මෙහිදී වනාහි අකප්පියවොහාර, කප්පියවොහාර, පරියාය, ඔභාස, නිමිත්තකම්ම යන පස දතයුත්තාහුයි. 'අකප්පිය වොහාර' නම් නො මල තණ බිම් තෙලීම, තෙලවීම, ආවාට කැණීම, කැණවීම, මල්පල රුක් රොපණය කිරීම, කරවීම, මියර කැනීම, කැනවීම, ජලය ඉසීම, ඉස්වීම යනාදියයි. කප්පියවොහාර'නම් මෙහි රුකක් දතගණුව, ආවාට

යක් දැහැගැන්නුව; මල්ගොමුවක් දැහැගැන්නුව, යනාදියයි. 'පරියාය' නම් නුවණැත්තවුන් විසින් මල්පල රුක් මතුදියුණුව පිණිස රෝපණය කට යුතුයි. යනාදි වශයෙන් පැවසීමයි. 'ඔභාස' නම් කූඩං කෑති උදලු ආදිය ද, මල්පැලද සමීපයෙහි තබාගෙණ බලාසිටීමයි. 'නිමිත්තකම්ම' නම් උදලු කුඩං වෑ පොරෝ ආදිය ගෙණ ගොස් පැමිණියෙකු ලඟ තැබීමයි. මේ පසම කුලසඞ්ග්‍රහය පිණිස නොවටී. කප්පියාකප්පියවශ ඵලපරිභොගය පිණිස නොවටී. තමන් තමන්ගේ පරිභොගය පිණිස වටී නම් එය අන්‍යයාගේ ද සඞ්ඝයාගේ ද චෛත්‍යයන් පිළිබඳවද වටීයයි මහාපච්චරියෙහි දක්වේ. ආරාමාදිය පිණිස රොපිත රොපාපිත වෘක්ෂයන්ගේ ඵලමල් ප්‍රයොජනයට ගැණීම නිවරද ය. එකතොවණ්ටිකං- නැටි එක පසකට සිටින සේ ගෙතූ මල්දම්; උභතොවණ්ටිකං- නැටි දෙපසට සිටිනසේ ගෙතූ මල්දම්; මඤ්ජරිකං- පොකුරු සිටිනසේ කළ මල්දම්; විධූතිකං- කූරක හෝ ඉරටුවක අමුනා කළ මල්දම්; වටංසකං- තනමත පැලඳීම පිණිස කළ මල්දම්; ආවෙලං- කණාභරණ සේ කළ මල්දම්, නැතහොත් මල්මාලා බොහෝ ගණනක් එකට එකතුකොට කළ මල්දම්; උරච්ඡදං- මුතුහර මෙන් උරමත පැලඳෙන මල්දම්; ගන්ථිම, ගොප්ඵිම, වෙධිම, වෙඨිම, පූරිම, වායිම යයි පුෂ්පවිකෘති සයක් වේත්. මල්දමු හෝ නැටි එකට බැඳ කරණලද්දේ 'ගන්ථිම' නම්. මෙය භික්ෂුභික්ෂුණීන්ට කිරීමට ද, අකැප වචනයෙන් කරවීමට ද නො හැකිය. සියඳ කෙඳිවලින් හෝ නූල්තුවලින් දසමන් ඈදී මල් නැටි එක්පසකට හෝ දෙපසට සිටිනසේ ගෙතූ මල්දම් 'ගොප්ඵිම' නම්. සියඳ කෙඳි හෝ නූල් ගුණ කොට ගෙණ බක්මී මල් ආදිය එහි ප්‍රවෙශ කොට කරණලද්ද ද 'ගොප්ඵිම' නම්. නැටි සහිත සමන්මල් ආදිය නැටිවලද නැටි රහිත මුණමල් ආදිය සිදුරෙහිද ඉරටු ආදියකින් අමුනා කරණලද්ද 'වෙධිම' නම්. යට බලාසිටි කළස් වැනි මල්පොකුරු සිටිනසේ කරණලද්ද ද, අට හෝ සොළස බැගින් මකතෙල්මල් මිටි ගෙණ හුයින් හෝ සියඳ කෙඳි වලින් බැඳ කරණලද පුෂ්පභාජනක ද 'වෙඨිම' නම්. මල්දම්වල හෝ මල්වත්වල පමණට වැඩි කොටස් විසුරුවා හැර පිළිවෙළ කරගැණීම 'පූරිම' නම්. සරසින් ලිහාදැමීම 'වායිම' නම්. එකපාලිකො- එකම බඳුනෙහි; තුවට්ටෙන්ති- තුරුළුකරගෙණ හොවිත්; එකත්ථරණා- එකම ආස්තරණය ඇත්තෝ; එකපාවුරණා- එක පොරෝණය ඇත්තෝ; ලාසෙන්ති- ප්‍රීතියෙන් කුල්මත් වූවාහු බමර මෙන් කරකැවෙත්; නැතහොත් මෙසේ නටව යි සවිනා අසුරු දක්වත්. නච්චන්තියාපි නච්චන්ති- නාටක ස්ත්‍රීන් නටනකල ඇගේ ඉදිරි පසින් හෝ පිටිපසින් නටමින් යෙත්. ගායන්තියාපි ගායන්ති- නාටක ස්ත්‍රීන් නටන කල්හි නැටිම් අනුව යෙත්. අට්ඨපදෙ දසපදෙපි කීළන්ති- අටැස් දහැස් ඇති දාදුපෙළෙහි කෙළිත්. ආකාසෙපි- මේ දාදුකැටය අසවල් පදයට වැටෙන සේ මා විසින් දමනලදැයි අහස්ගත දාදුකැටය සමග කථාකෙරෙමින් කෙළිත්. පරිහාරපථෙ- බිම නොයෙක් ඉරි

ඈනී මඬුල්ලක් කොට එහි සාම්හන් පිඩින් ආරක්ෂා කළ්පුතු ඕංගීය ආරක්ෂා කරමින් කෙළිත්. සන්තිකාය- එකතැන සබකළද ගල් අතරෙහි එම ගල් නොසැලෙනසේ නියෙන් ඉදි ඇඳ එකකින් අනිකට වැදෙන සේ තට්ටුකරත්. ඉදින් අනික් ගලක් සෙලවී නම් ඔහු පරාජයට පැමිණෙත්. එසේ නැත දිනත්. එයින්; ඛලිකාය-තුන් අඟල් පමණ වූ දුරුදන්තමයාදිවූ පාස දෙකක් ගෙණ සතර පැත්තෙහි එක දෙක තුණ සතර බැගින් ක්‍රමයෙන් බින්දු ලකුණුකොට පුවරුවම වැටෙනසේ උඩදමා පතිතවූ කල එහි මතුභාගයෙහි පෙණෙන බින්දු ගණනට ගල් තමන් අයත්කර ගැණීම් වශයෙන් කෙළින ක්‍රීඩාවෙන්; ඝටිකාය- දිග් ලීයකින් කොට ලිහබකට ගැසීමෙන් කරණ ක්‍රීඩාවෙන්; සලාකහත්ථෙන- ලාදියෙන් හෝ පතඟිකාසටින් හෝ පිරිවතුරෙන් හෝ ඉරට්ටු මිටියක් තෙමා කවර නම් රූවක් සලකුණු කරමිදැයි විචාරා බිම හෝ බිත්තියෙහි හෝ ඇත් අස් ආදී රූ දක්වමින් කරණ ක්‍රීඩාවෙන්; අක්ඛෙන-ගුළුකෙළියෙන්; පඞ්ගචීරෙන-කොළ ආදියෙන් කළ නලා පිඹීමෙන්; වඞ්කකෙන- ගම්දරුවන් කෙළින කුඩා නගුලින් මොක්ඛචිකාය-කරණම් පැනීමෙන්; චිඞ්ගුලකෙන- තල්කොළ ආදියෙන් කළ හුලං පෙති කරකැවීමෙන්; පත්තාළ්හකෙන- කොළගොට්වලින් වැලි ආදිය මැනීමෙන්; රථකෙන- කුඩා රියවලින්; ධනුකෙන- කුඩා දුනුවලින්; අක්ඛරිකාය- අහසෙහි හෝ පිටෙහි අකුරු ලියා කියවන්ට සැලැස්සීමෙන්; මනෙසිකාය- සිතින් සිතූ දෙය කීමෙන්; යථාවජ්ජෙන-අඳ ගොළු පිළු බිහිරන්ගේ සැටි පෙන්වීමෙන්; හත්ථිස්මිං- ඇතුන් නිමිති කොට ඇති ශිල්පයෙහි; ථරුස්මිං-ඛඩ්ග ශිල්පයෙහි; උස්සොළ්හෙන්ති-සිවුරුවම් කරත්; අප්පොඨෙන්ති-අත් පොළත්; ධාවන්ති- පිටපැත්තෙන් යමින් දුවත්; ආධාවන්ති- ඉදිරියට දුවත්; නිබ්බුජ්ඣන්ති- මල්ලව පොර බදත්; රඞ්ගමජ්ඣෙ- රඟමඬුලු මැද; නලාටිකම්පි දෙන්ති- යහපත යහපත සැහැතිය යි කියමින් තමන් නලලෙහි ඇඟිල්ල තබා ඈගේ නලලෙහිද ඇඟිල්ල තබත්; අභික්කන්තෙන- යාමෙන්; පටික්කන්තෙන-නැවතීමෙන්: ආලෝකිතෙන- ඉදිරි බැලීමෙන්; විලෝකිතෙන- එහා මෙහා බැලීමෙන්; සම්මිඤ්ජිතෙන- අතපය හැකිලීමෙන්; පසාරිතෙන- දිගහැරීමෙන්; ඔක්ඛිත්තචක්ඛු-යට හෙලනලද ඇස් ඇත්තේ; ඉරියාපථසම්පන්නො- දුටුවන් පහදවන සුලු ගමන් තිමන් ඇති හෙයින් සුදුසු වූ ඉරියව් ඇත්තේ; අබල අබලොවිය- ඉතා මෝඩයෙකු මෙන්; මෙහි විනය ආමෙණ්ඩිතාර්ථයෙහි ය. මන්දමන්දො විය- අතිකකනතාදියෙහි සන්නුත්තෙකු බැවින් ඉතා මෝලොක් ගති ඇත්තෙකු මෙන්; මෙසේ ගුණයම දෙස් වශයෙන් දක්වත්. භාකුටික භාකුටිකමුඛොවිය- යට හෙළනලද ඇස් ඇති බැවින් රකුසු කරගත් මුහුණු ඇත්තෙකු මෙන්; සණ්හා- (මැනියෙනි, පියානනි, සොහොයුරිය යි. මෙසේ ප්‍රියවචන පවසා උමසු ජනයා ග්‍රහණ සඬානයෙහි තැබීමෙහි) දක්ෂය; සඛිලා- මිහිරිය; සුඛසම්භාසා- මිහිරි පිළිසඳර කථා ඇත්තෝය; මිහිතපුබ්බඞ්ගමා-පළමු කොට සිනාසී පසුව කථාකරන්නෝය; එහි ස්වාගතවාදිනො-උමසු

වෙතු දූත එනු මැනව, තුඹට ස්වාගතයක් වේවා යනාදීන් පවසන් නෝය. අභාකුටිකා- බැම හකුළා රකුසු කරගත් මුහුණු නැත්තෝය. උත්තානමුඛා- ඇස් දල්වා බලන හෙයින් බිම නො බැලූ මුහුණු ඇත්තෝ වෙත්; පුබ්බභාසිනො- අමම, තාත යයි පළමු කොට බණින්නෝ වෙත්; එහි භන්තෙ ඝරං ගමිස්සාම- ස්වාමීනි, වඩිනු මැනවි, ගෙට යමු; ඒ උපාසක තෙමේ 'න ඛො ආවුසො පිණ්ඩො ලබ්භතී'යි තෙරුන් කී කල්හි ඔබවහන්සේලාගේ භික්ෂූන් විසින් ම මෙය කරණ ලදී. ගම මුළුල්ල හැසිරෙන්නෝත් නො ලැබුවාහුදැයි කියා පිඬු දෙනු කැමැත්තේ මෙසේ කීය. කිමෙක් ද? මෙය පසුතතවාවා නො වේද? යත්, නොවේම ය. ඇසූ ප්‍රශ්නයකට දුන් පිළිතුරු හෙයිනි. අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු කියන්ට වටී. එහෙයින් පෙරවරු හෝ පස්වරු හෝ ඇතුළුගම් වැදුනු භික්ෂුවගෙන් කිසිවෙක් 'කුමක් හෙයින් ස්වාමීනි ගමෙහි හැසිරෙහි දැයි විචාළේ යමක් නිසා හැසිරේ නම් එය දන්වා, ලදද නො ලදදැයි විචාළකල්හි, නො ලැබී නම් නො ලද්දැයි කියයුතු. හෙතෙමේ යමක් දේ නම් එය පිළිගන්ට වටී. දුෂ්ටො-පුද්ගලයා වශයෙන් දුෂ්ටවූවෙකි. දානපථානි- නිබඳ දෙන දන්; උපච්ඡින්නානි- සිඳින ලද්දහුය, ඔවුහු ඒ දන් දූත් නො දෙත්ය යන අර්ථයි. භික්ඛුකානි- වඩීත්; සණ්ඨානගතා-මනාව පිහිටන්නේ ය. ඒ භික්ෂු තෙමේ සැදැහැති උවසුහුගේ ගසුත සතුටින් පිළිගත්තේ ය. මෙබඳු ගසුත් ගෙණයාම භික්ෂූන්ට නැපය. ගිහි පටිසංයුක්ත නොවන හෙයිනි; කුතො ච ත්වං භික්ඛු ආගච්ඡසි- මහණ තුඹ කොහි සිට එහි ද; 'ආගච්ඡසි' යනු සමීපාතීතයෙහි වර්තමාන වචනයි. පබ්බාජනීය කම්මං- කුලදූෂක භික්ෂූන් ඒ අරමින් නෙරණු පිණිස වදාළ කර්මය; මේ කර්මය කරණු ලැබූ භික්ෂුව ඒ ගමෙහි හෝ විහාරයෙහි හෝ නො වැසිය යුතුයි. දූෂණය කාන කුල ඇති ගමින් පිඬු හෝ නො ලැබිය යුතුයි. පසුව ගුණදම් පුරා රහත්වූ කල්හි ද ඒ ගමින් පිඬු නො ලැබිය හැකිය. 'ස්වාමීනි, මේ දන් පිළිගැන්නීම ඔබවහන්සේගේ දූත් පවත්නා සිල ගුණය නිසා පැහැදීමෙන් යයි දායකවරු කියත් නම් පිළිගන්ට වටී. "න උපසම්පාදෙතබ්බං, න නිස්සයො දාතබ්බො, න සාමණෙරො උපට්ඨාපෙතබ්බො, න භික්ඛුනොවාදක සම්මුති සාදිතබ්බා, සම්මතෙන භික්ඛුණියො න ඔවදිතබ්බා, යාය ආපත්තියා සංඝෙන පබ්බාජනීයකම්මං කතං හොති සා ආපත්ති න ආපජ්ජිතබ්බා, අඤ්ඤා වා තාදිසිකා, තතො වා පාපිට්ඨතරා, කම්මං න ගරහිතබ්බං, කම්මිකා නගරහිතබ්බා, න පකතත්තස්ස භික්ඛුනො උපොසථො ඨපෙතබ්බො, න පවාරණා ඨපෙතබ්බා, න සවචනීයං කාතබ්බං, න අනුවාදො පට්ඨපෙතබ්බො, න ඔකාසො කාරෙතබ්බො, න චොදෙතබ්බො, න සාරෙතබ්බො, න භික්ඛූහි සම්පයොජෙතබ්බං" යන මේ අටළොස් වත පබ්බාජනීය කර්මය කරණුලැබූ භික්ෂූන් විසින් සම්පූර්ණ කොට, ඒ කර්මයෙන් නිදහස් වීම පිණිස සඞ්ඝයා යාච්ඤා කටයුතු. සඞ්ඝයා විසින් ද එය පිළිගත යුතුයි. න සම්මා වත්තන්ති- (අස්සජි පුනබ්බසුකයෝ මේ අටළොස්

වත්ති) මනාව නො පිහිටත්. ඝනවරණ න්‍යාය වශයෙන් අසජ්ජී පුනබ්බසුක දෙනම් ආශ්‍රයකරණ භික්ෂූහු ද මිට ඇතුළත් වෙති. න ලොමං පාතෙන්ති- අනුලොම් පැවතුම් ඇත්තෝ නොවෙත්. න නෙත්ථාරං වත්තන්ති- අනුලොමවත්ත සඞ්ඛ්‍යාත නිස්සරණෝපායයෙහි නො පිළිපදිත්. භික්ඛූ න ඛමාපෙන්ති-(සවාමීනි, අප විසින් කරණ ලද්දේ දුශ්කෘතයකි. නැවත මෙසේ නො කරමු. අපට ක්ෂමාවුව මැනවයි භික්ෂූන් ක්ෂමාකරවා ගැණීම නො කෙරෙත්. අක්කොසන්ති-(කාරක සඞ්ඝයාට දශවිධ ආක්‍රෝශ වස්තුවලින්) ආක්‍රෝශ කෙරෙත්. දශවිධ ආක්‍රෝශවස්තු නම්:- ජාති, නාම, ගොත්ත, කම්ම, සිප්ප, ආබාධ, ලිඞ්ග, කිලෙස, ආපත්ති, හීන යන මොහු වෙත්. පක්කමන්ති-(අසජ්ජී පුනබ්බසුකයන්ගේ පන්සියයක් පිරිවර අතුරෙන් ඇතැම් කෙනෙක්) ඒ ඒ දිග්බලා යෙත්. විබ්භමන්ති-ඇතැම් කෙනෙක් ගිහියෝ වෙත්. ගාමං වා- ගමකට; නගරය ද මෙහි ගාම ශබ්දයෙන් ම ගතයුතුයි. නිගමො- පවුරුවලින් වටකිරීමක් නොමැති ආපණශාලාවලින් යුක්තවූ පෙදෙස. කුලදූසකො- කුලයන් දූෂ්‍යකරන්නේ, මෙහි අසුචිකදීමාදියෙන් කරණ දූෂණය නොව තමන්ගේ දුෂ්ප්‍රතිපත්තියෙන් සැදැහැවතුන්ගේ ප්‍රසාදය විනාශකිරීමයයි ගතයුතුයි. පුප්ඵදානෙන වා- මල් දීමෙන් හෝ; තමන් සන්තක මල් කුලසඞ්ග්‍රහය පිණිස දේද දුකුළා වේ. අනුන් සන්තක මල් වුවද දෙන්නහුට දුකුළා වේ. ඉදින් සොරසිතින් දේනම් වටිනාකම අනුව ඇවැත් නියමකළ යුතුයි. ජඞ්ඝපෙසනිකෙන- ගිහියන්ගේ දූතකම් කිරීම්, ඔවුන්ගේ හසුන් ගෙණයාම් ආදිය කිරීමෙන්; ගිහියන් සතු හසුන් ගෙණයන භික්ෂූහට පියක් පියක් පාසා දුකුළා වේ. ආපජ්ජාචාරණ- මල්රුක් රෝපණය කිරීම් ආදි ලාමක හැසිරීම් ඇත්තෝ; මේ හෙතුවෙන් ලැබුනු දන් වළඳන්නහුට පිඩක් පිඩක් පාසා දුකුළා ඇවැත් සිදුවේ. සමුට්ඨානාදිය පඨම සඞ්ඝභෙද ශික්ෂාපදයෙහි මෙනි. අඞ්ගයන්හි 'තතුපරක්කමනං' යන්න වෙනුවට 'ජන්නදීඝිපාපනං' යන්න යොදාගත යුතුයි.

කුලදූසක සික්ඛාපද ගැටපදය නිමි.

---

පඨමාපත්තිකා- (පඨමං ආපත්ති ආපජ්ජනං එතෙසං) ව්‍යතික්‍රම අවස්ථාවෙහිදී ම සිදුවන ඇවැත් ඇත්තෝ පඨමාපත්තික නම්. යාව තතියකා- (යාව තතියෙ සමනුභාසනකම්මෙ හොන්ති) තුන්වැනි සමනුභාෂණකර්මයෙහි දී සිදුවන ඇවැත් ඇත්තෝ; අකාමා පරිවත්ථබ්බං- (ප්‍රතිකර්ම නො කරණලද ඇවතින් ස්වර්ගමොක්ෂාවරණය කෙරෙණ හෙයින්) නො කැමැත්තෙන් ම පිරිවෙස් සමාදන්ව විසිය යුතුයි. විජානං මානත්තාය භික්ඛු අබ්භානාරහො- වැස නිමවූ මානත්ත ඇති භික්ෂු තෙමේ අබ්භානකම් කටයුතුයි. මෙහි 'යො භික්ඛු චිණ්ණමානත්තො සො භික්ඛු අබ්භෙතබ්බො' යි භික්ඛු ශබ්දය දෙවරක් ම යොදාගත යුතුයි පාලිවිවරණ- වත.

සාරත්ථ මඤ්ජූසා නම්වූ විනය ගැටපදයෙහි තෙරෙළස් සඟ වශෙෂස් ගැටපදය ගෙවෙකොකින් නිමියේය.

එකකා– මනුෂ්‍යයන් විසූ පුරුෂයෙකු නැතිව හුදකලා වූයේ; ඒකාය– එසේ ම හුදකලාවූ ස්ත්‍රිය හා; රහොගතා– කෙනෙකු නො පෙනෙන තැන්හි වූ; පටිච්ඡන්නා– කවාට කුඩ්‍යාදීන් මුවහවූ; අලං කම්මනියෙ– මෛථුන සේවනයට යොග්‍යවූ; ආසනෙ– අස්නෙහි; කාලයුත්තං සමුල්ලපමානො– (අන්‍යයන් ලඟ නැති බැව් දැන 'කිම උකටලී වෙහිද, කලාන්ත වෙහි ද, බඩසගින් සිටිනෙහි ද,' යනාදි වශයෙන් ගෙහසිත ප්‍රේමයෙන් යුත් කථා කරන්නේ; කාලයුත්තං ධම්මං භණන්තො– (කිසිවෙකු ලඟට පැමිණෙනකල හෝ ලඟින් ගමන්කරණකල) ඒ කාලයට සුදුසු සේ පෙහෙවස් රකින්නෙහි ද, ලඟ දන් දෙන්නෙහිද, යනාදි දැහැමි කථා කරන්නේ; බහුපුත්තා– බොහෝ දූ පුතුන් ඇත්තී; 'බහු ධීතරො ච පුත්තා ච අස්සා'ති බහුපුත්තා,' මෙහි 'ධීතු' ශබ්දය ලොප් කොට 'පුත්ත' ශබ්දය පමණක් එකශෙෂ කොට දැක්වීය. විශාඛාවට පුතුන් දසදෙනෙක් ද දූනියන් දසදෙනෙක් ද වූහ. යඤ්ඤෙසු– කුඩා මහත් දන්දීම් වලදිද: ඡණෙසු– ආවාහ විවාහ මඞ්ගල්‍යාදි මගොත් සවයන්හි දී ද ඒ අතර පවත්නා කුඩා උත්සවයන්හි දී ද, උස්සවෙසු– මසසුපගමන පවාරණ පූජෝත්සවයන්හි දී ද, නැකත්කෙළිවල දී ද, පඨමං භොජෙන්ති– (තම තමන්ගේ දරුවෝ ඔබට සමාන ආයු ඇත්තෝද එසේ ම නිරෝගයෝ ද වෙත්වායි) ආයාචනය කරන්නාහු පළමුකොට ඇයුතව කරවත්. සෑදූනැති එසේ ම පත්වූවෝ භික්ෂූන් වලදවා ඉක්බිති සියල්ලන්ට පළමුව ඈට අනුභව කරවත්. න ආදියි– ඈගේ වචනය පිළිනොගන්නේය. නැතහොත් ඊට ගරුසරු නො කෙළේය. නිසජ්ජං කප්පෙය්‍ය– හුන්නේය; චක්ඛුස්ස රහො– චක්ෂුසට අනාබිතඛණනාදිය නො පෙනෙන තන්හි; සොතස්ස රහො– අශ්‍රෝතද්වාර වශයෙන් පියවි කථා නො ඇසෙන තැන; වසනලද කවුළු ඇති ගර්භාරයෙහි හුන් නුවණැති පුරුෂ තෙමේ ඇවත නො වළකායි. නො වසනලද කවුළු ඇති ගර්භාරයෙහි හුන් පුරුෂ තෙමේ ඇවත වලකායි. දෙලොස් රියනකින් ඇතුළත හුන් පුරුෂතෙමේ ද ඇවත වළකාමය. දෙලොස් රියනකින් ඇතුළත කපිතින්දෙන් නිදනා පුරුෂ තෙමේ ද ඇවත වලකායි. ඇස් ඇති පුරුෂයෙකු නමුත් තද තින්දෙන් නිදන කල්හි ඇවැත් වැලකීමට කරුණක් නැත. සියගණන් ස්ත්‍රිහු ද අනාපත්තියට කරුණු නොවෙත්. සානිපාකාර– තිරය හෙවත් රෙදි වලින් කළ ආවරණය; කොට්ඨලිකා– ලෑලිවලින් කළ ආවරණය; ආගතඵලා– සෝවාන්ඵලයට පැමිණියාවූ; මෙයින් ආර්‍ය්‍යශ්‍රාවිකාවක් කියැවේ. අභිසමෙතාවිනී– සෝවාන් මාර්ගයෙන් ප්‍රතිවෙධ කරණලද චතුරාර්‍ය්‍යසත්‍යය ඇත්තී; විඤ්ඤාතසාසනා– අවබෝධ කරණලද ශික්ෂාත්‍රය සඞ්ඛ්‍යාත ශාසනය ඇත්තී; නිසජ්ජං භික්ඛු පටිජානමානො– රහසින් හිඳීම ප්‍රතිඥාකරණ මහණ තෙමේ; එසේ ප්‍රතිඥා නො කරණ අලජ්ජී මහණහට ඇවැත් ආරෝපණය නො කටයුතුයි. පිරිසිදු බැව් හෝ ප්‍රකාශ නො කළ යුතුයි.

එක් දවසක් මලාරාම විහාරයෙහි එක් රහත් නමක් උපස්ථායක කුලයකට පැමිණ ඇතුළුගෙහි වැඩහිඳියේය. උපාසිකා තොමෝ ද

ශයනාසනය ළඟ හිඳිනාය. පිඬු පිණිස හැසිරෙන එක් භික්ෂු නමක් දොරකඩ සිටියේ මෙය දැක සත්විරතෙමේ උපාසිකාව සමඟ ඒකාසන යෙහි සිටියේයයි සැලකිය. ඒ බැව් දත් රහත් තෙර තෙමේ බත්කිස කොට විහාරයට ගොස් තමන්.වසන තැනට පැමිණ ගබඩාව ඇතුළෙහි ම වැඩහුන්නෝය. පිණ්ඩචාරික භික්ෂු තෙමේ තෙරුන්ට චෝදනා කරණු කැමැත්තෙන් එහි පැමිණ ශබ්ද කොට ගබඩාවෙහි දොර විවෘත කොළේය. සත්විර තෙමේ ඒ භික්ෂුවගේ සිත දැන අහසට පැන නැඟී කුළුගෙයි කැණිමඬල ළඟ පර්යංකයෙන් වැඩසිටියේ ය. පිණ්ඩචාරික භික්ෂු තෙමේ එහි පැමිණ මටසිට බලා නොදැක උඩබැලීය. එසේ අහසෙහි හුන් තෙරුන් දැක, ස්වාමීනි මෙසේ ඍද්ධිමත් තුඹ වහන්සේ මාගමක් සමඟ ඒකාසනයෙහි සිටිසේක් කුමක් හෙයින්දැයි ඇසීය. ඇවැත්නි, එය ගෙහි දෙෂයක; තුඹට අදහාගන්ට හැකිවනසේ මම මෙසේ කොළෙම්. මා ආරක්ෂාකරගණුවයි කියමින් බිමට බැස්සේය. නිසජ්ජාය කාරෙතබ්බො - හිඳීම් මාත්‍රයෙන් යම් ඇවතකට පැමිණිය හැකිනම් එයින් ඇවැත් ආරෝපණය කටයුතුයි.

භික්ෂු නමක් මාගමක සමීපයට යාම පිණිස ඇස අඳුන් ලා ද දුකුළා වේ. හඳනාය අඳී ද, කාබාන බඳී ද, සිවුර පොරවා ද, සියලු තන්හි පියොවක් පියොවක් පාසා දුකුළා වේ. ස්ත්‍රියගේ පැමිණීම සිදුවූ කල්හි පචිතිවේ. ඉදින් ස්ත්‍රිය නැඟිට නැඟිට හිඳිද වාරගණනින් පචිති වේ. බොහෝ ස්ත්‍රීහු වෙත් නම් ස්ත්‍රීන් ගණනින් පචිති වේ.

සමුට්ඨානය ප්‍රථමපාරාජිකා ශික්ෂාපදයෙහි මෙනි. යම් ඇවතක් පිළිත කෙරේ ද ඒ ඇවත් වසයෙන් අඞ්ගභෙදය සැලකිය යුතුයි.

ප්‍රථමානියත ශික්ෂාපද ගැටපදය නිමි.

---

දෙවෙනි අනියත ශික්ෂාපදයෙහි ද සැලකියයුතු අමුත්තක් නැත.

සාරත්ථ දීපනී නම්වූ විනය ගැටපදයෙහි අනියත කාණ්ඩයට ලියූ ගැටපද වර්ණනාව මෙතෙකින් නිමියේ ය.

---

ගොතමකෙ චෙතියෙ - ගොතමක නම් යක්ෂයාගේ චෛත්‍යස්ථාන යෙහි කරවනලද විහාරයෙහි; තිචීවරං අනුඤ්ඤාතං - අඳනය, උතුරු සළුව, සඟළය යන තුන් සිවුර පරිභොග කරන්ට අනුදන්නාලදී. බුදුරජාණන් වහන්සේ ගහපති චීවරය අනුදැන වදාළ කල්හි භික්ෂූන්ට බොහෝ සිවුරු ලැබෙන්ට පටන්ගත්තෝ ය. භික්ෂූහු ඒ සිවුරු මිටි බැඳ ගෙණ පිට උඩ ද කර උඩ ද තබාගෙණ ගමන් කරන්ට වන්හ. එය දුටු බුදුරජාණන් වහන්සේ පරිභොගය පිණිස මේ තුන් සිවුර අනුදැන වදාළසේක. අනුඤ්ඤාතනිව තිචීවරන්ති කාමං සම්පන්නාති- අතික් ම තුන් සිවුරකින් ගම්වදිති; එවනම සිවුරු විහාරයෙහි දී පරිභොග කෙරෙති. වෙනම සිවුරු නානතොටට යාමෙහි දී පරිභොග කෙරෙති. මෙසේ දිනපතා අලුත් සිවුරු ම පරිභොග කරන්ට වූහ.

උප්පන්නං හොති - අනුප්‍රඥප්තියකට ඉඩ සැලසෙන සේ බොහෝ සිවුරු ප්‍රතිලාභ වශයෙන් උපන්නේ වෙයි. එක්තරා බමුණෙක් පැමිණ බුදුන්වහන්සේට ද, සඞ්ඝයාට ද, පිදීම පෙනෙයි. ධර්මයට පිදීමක් නො පෙනෙයි. මීට කාරුණු කවරේදැයි බුදුරජාණන් වහන්සේගෙන් විචාළේ ය. 'බමුණ, බහුශ්‍රැත කමකට යම් පිදීමක් කෙළේ නම් ධර්මයට පිදීමද එය ම වන්නේය'යි වදාළසේක. එසේ නම් ස්වාමීනි, කවර නමක් බහුශ්‍රැත දැයි විචාළේ ය. ආනන්ද ස්ථවිර තෙමේ බහුශ්‍රැතයයි වදාළසේක. බමුණු තෙමේ ලක්ෂයක් අගනා සිවුරක් ආනන්ද ස්ථවිර යන් වහන්සේට පිදී ය. මේ ප්‍රතිලාභ වශයෙන් ලැබුනකී. ආයස්මතො සාරිපුත්තස්ස දාතුකාමො හොති - ආයුෂ්මත් වූ ආනන්ද ස්ථවිර තෙමේ ඒ සිවුර සැරියුත් තෙරුන්ට දෙනු කැමැත්තේ වෙයි. බුදුරජාණන් වහන්සේ හැර ගුණ විශිෂ්ට වූ අන් පුද්ගලයෙක් සැරියුත් තෙරුන්ට වඩා නැතැයි ආනන්ද තෙරුන්ගේ හැඟීම ය. නවමං වා භගවා දිවසං දසමං වා - භාග්‍යවතුන් වහන්සේ, නවවැනි දවසෙහි හෝ දස වැනි දවසෙහි; සැරියුත් තෙරණුවෝ චාරිකාවෙහි වඩිනසේක් මම අසවල් දිනයෙහි ආපසු එන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අප්‍රමාද වෙවයි ආනන්ද තෙරුන්ට දන්වා ම වඩිනසේක. ඉදින් දුරවූ සෙනසුනක වස් එළඹියේක් නම් මගේ වචනයෙන් භාග්‍යවතුන් වහන් සේගේ පා වඳිව්යයි භික්ෂූන් හෝ යවති. මම අසවල් දවසෙහි එන්නෙ මියි ආනන්ද තෙරුන්ට හෝ දන්වා යවති. එසේ නැතහොත් ආනන්ද ස්ථවිර තෙමේ ම 'සැරියුත් තෙරණුවෝ මෙපමණ කලක් බුදුන් වහන්සේ නො දක වැඩ නො සිටිත් යයි ද අසවල් දවසෙහි නොවරද වාම වඩිත් යයි ද දනියි. මෙහි 'නවමං, දසමං' යනු ආධාරාර්ථයෙහි කර්මයි. එහෙයින් 'නවමෙ දසමෙ'යි අර්ථ ගතයුතුයි. නිට්ඨිත චීවරස්මිං - ගණ්ඨිපාස ද බැඳ සිවුර කොට නිමිකල්හි; 'නිට්ඨිතෙ චීවරස්මිං' හි වියයුතු තැන පූර්වපදයෙහි ආධාර විභක්තියට ලොප්වී මෙසේ සිද්ධවිය. චීවරං කතං හොති - සූචිකර්ම පරියෝසානය කිරීමෙන් සිවුර කරණ ලද්දේ වෙයි; ඉදිකටුවෙන් කටයුතු සියලු දෙය නිමකරලීම සූචිකම්ම පරියොසාන නම්. නට්ඨං - චෞරාදීන් ගත්; විනට්ඨං - උපචිකාදීන් කා වෙසෙසින් නැසූ; දඩ්ඪං - ගින්නෙන් දා; චීවරාසා වා උපච්ඡින්නා - 'අසවල් කුලයෙන් සිවුරක් ලබමියි චීවරයෙහි උපන් ආශාව හෝ උපච්ඡින්න ද යත; උබ්භතස්මිං කඨිනෙ - (සඞ්ඝයා විසින් යම් කඨින සිවුරක් 'ඉමාය සඞ්ඝාටියා කඨිනං අත්ථරාමි' යනාදීන් ඇතිරිත ද) ඒ කඨින සිවුර උදුලූ කල්හි: අට්ඨන්නං මාතිකානං - ('අට්ඨිමා භික්ඛවෙ මාතිකා කඨි නස්ස උබ්භාරාය, පක්කමනන්තිකා, නිට්ඨානන්තිකා, සන්නිට්ඨානන්තිකා, නාසනන්තිකා, සවණන්තිකා, ආසාවච්ඡෙදිකා, සීමාතික්කන්තිකා, සහුබ්භාරා යන) මාතිකා අට අතුරෙන්; (කඨිනක්ඛන්ධකය බලනු) දසාහ පරමං - දසාහය අධිකකොට ඇති කාලය. 'දසාහ පරමං' යනු අත්‍යන්ත සංයෝගයෙහි ද්විතීයා විභක්තියි. අතිරෙක චීවරං - නො ඉටූ නො විකැපූ සිවුර; ඡන්නං චීවරානං අඤ්ඤතරං - (ඛොම, කප්පාසිකා

කොසෙය්‍ය, කම්බල, සාණ, භඞ්ග යන නම්) සය අතුරෙන් එක්තරා සිවුරකි. කොමුගසෙහි පට්ටාවලින් කළ සිවුර කාරණෝපචාර වශයෙන් 'ඛොම' නම්. කපුහුයින් කළ පිළි කප්පාස නම්. පණුකොෂයෙන් කළ පිළි කොසෙය්‍ය නම්. මිනිස් ලොම් වාල ලොම් හැර සෙසු ලොමින් කළ පිළි කම්බල නම්. සණවැහැරියෙන් කළ පිළි 'සාණ' නම්. ඛොමාදි පස්හු මුසුකොට කළ සිවුරු භඞ්ග නම්. දුකූල, පත්තුණ්ණ, සොමාර පට්ට, චීනපට්ට, ඉද්ධිජ, දෙවදින්න යන සයද අනුලොම් සිවුරු වෙත්. විකප්පනූපග පච්ඡිමං- (අනුජානාමි භික්ඛවෙ ආයාමෙන අට්ඨඞ්ගුලං සුගතඞ්ගුලෙන චතුරඞ්ගුල විත්ථතං පච්ඡිමං චීවරං විකප්පෙතුං) දිගින් සුගත් අඟලෙන් අට අඟලක්වූ ද පුළුලින් සතර අඟලක්වූ ද චීවරය පච්ඡිම විකප්පනූපග චීවරයයි. මධ්‍යම පුරුෂයෙකුගේ තුන් වියතක් සුගත් වියතකි. හැකහොත් වඩුරියන් එකහමාරකි. එකල සුගත් අඟල් අටක් දුන් වඩුරියනක ප්‍රමාණය වේ. තං අතික්කාමයතො- ඒ චීවරය හෝ කාලය ඉක්මවන්නහුට; නිස්සග්ගියං- නිසගි වේ. ආපත්ති දෙසනාවට පූර්වභාගයෙහි කළයුතු විනයකර්මයට මේ නමකි. එකාදසාහෙ අරුණුග්ගමනෙ-එකොළොස් වැනි දින අරුණ නැගී මෙහි; 'දසාහ පරමං' යි පළමුවෙන් වදාරා නැවත 'එකාදසාහෙ' යි වදාළේ පූර්වාපර සංසන්දනය පිණිසය. චීවරුප්පාද දිනයෙහි ඉක්ම ගිය අරුණ සමග එකොළොස් අරුණ ගණන්නත යුතුයි. මෙසේ නියමකල් ඉක්මයාමෙන් බොහෝ සිවුරු එකට බැඳී පොදියක් නම් එක් ඇවතක් ද, වෙන් වෙන්ව තිබේ නම් සිවුරු ගණනින් ද ඇවැත් සිදුවේ. නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා- සිවුර නිස්සජ්ජනය කොට ඇවැත් දෙසිය යුතුයි. ඇවැත් අවන් භික්ෂුව සඞ්ඝයා කරා එළඹ උතුරුසළුව එකස් කොට ගෙණ වැඩිමහලු භික්ෂූන්ගේ පා වැද උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳගෙණ, 'අහං භන්තෙ ඉත්ථං නාමං ආපත්තිං ආපන්නො තං පටිදෙසෙමි' යි පැවසිය යුතුයි. ඉදින් නිසගිවූයේ එක් සිවුරක් නම් "එකං නිස්සග්ගියං පාචිත්තියං" යි ද, දෙකක් නම් 'වෙ' යයි ද බොහොමයක් නම් 'සම්බහුලානි' යි ද පැවසිය යුතුයි. නිස්සජ්ජනයෙහි දී ද එක් සිවුරක් නම් 'ඉදං මෙ භන්තෙ චීවරං' යි ද, ඊට අධික නම් 'ඉමානි මෙ භන්තෙ චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි, ඉමානාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමි' යි දෙශනා කටයුතුයි. පාලියෙන් කියන්නට අසමත් භික්ෂූන් විසින් තමන්ට කැමැති ක්‍රමයකින් නමුත් අදහස නො වරදවා කිම නිවරද ය. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන ආපත්ති පටිග්ගහෙතබ්බා-ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුවක විසින් ඛන්ධකයෙහි කී ක්‍රමයෙන් ඇවත පිළිගත යුතුයි. ඒ ව්‍යක්ත භික්ෂුව විසින් මෙසේ දන්විය යුතුයි. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථං නාමො භික්ඛු ආපත්තිං සරති විවරති උත්තානිං කරොති දෙසෙති යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ඉත්ථං නාමස්ස භික්ඛුනො ආපත්තිං පටිග්ගණ්හෙය්‍යං' යනුයි. ඉක්බිති ඇවැත් පිළිගන්නහු විසින් 'පස්සසි' කියා ද, දෙශක භික්ෂුව විසින්

'ආම පස්සාමි' කියා ද, නැවත ප්‍රතිග්‍රාහක භික්ෂුව 'ආයතිං සංවරෙය්‍යාසි' කියා ද, දෙශක භික්ෂුව 'සාධු සුට්ඨු සංවරිස්සාමි' කියා ද වරින්වර පැවසිය යුතුයි. දසාහාතික්කන්තක අතිරෙකචීවරස්සාදි– දසාහං තික්කන්තක චීවරයෙහි ඉක්මවූ දස දවස ඇති සිවුරක යන හැඟීම ඇත්තේ; මීටම වෙමතිකයා ද අනතික්කන්තක සඤ්ඤී ඇත්තහුද ඇතුළත් වෙත්. අඤ්ඤවෙඨකවෙඨසඤ්ඤී– නොනට කල්හි ද නටුයේය යන හැඟීම ඇත්තේ; තමන්ගේ සිවුර සමග අනුන්ගේ බොහෝ සිවුරු එක තැන තිබුනි. එයින් බොහෝ සිවුරු සොරු ගෙණ ගියාහුය. තමන්ගේ සිවුර එහි සෙසව තිබියදීත් එය ද සොරු ගෙණ ගියාහු යයි හැඟීම ඇත්තේ; අච්ඡින්නකා– බලාත්කාරකම් කොට උදුරා ගෙණ නො ගිය කල්හි; 'නාටය' නම් සොරකම් කරගෙණ යාමයි 'විලුත්ත' නම් බලාත්කාරයෙන් ගෙණ යාමයි. අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස– නිස්සජ්ජනය නො කොට පරිභොග කෙරේ ද ඒ භික්ෂුහට දුකුළා ඇවැත් වේ. වරක් හැන්දහුට හෝ පෙරවූවහුට දවස මුළුල්ලේ ම නුමුඳු හැඳි පෙරවී නමුත් එක් දුකුළා ඇවතක් සිදුවේ. වරින්වර මුඳ මුඳා හැඳි පෙරවී කල්හි පියෝ ගණනින් දුකුළා වේ. පරිභොග නො කරන්නහුට අනාපත්තිය; එය පරිභොග කරණ අනික් භික්ෂූන්හට ද අනාපත්ති වේ. අනාපත්ති අන්තොදසාහං අධිට්ඨෙති විකප්පෙති– දස දවස ඇතුළත අධිෂ්ඨානය කෙරේ ද, විකප්පනය කෙරේ ද ඒ භික්ෂුහට අනාපත්තිය. අධිට්ඨානුපග විකප්පනූපග සිවුර මෙසේ දතයුතුයි. "අනුජානාමි භික්ඛවෙ තිචීවරං අධිට්ඨාතුං න විකප්පෙතුං, නිසීදනං අධිට්ඨාතුං න විකප්පෙතුං පච්චත්ථරණං අධිට්ඨාතුං න විකප්පෙතුං, කණ්ඩුප්පටිච්ඡාදිං යාව ආබාධා අධිට්ඨාතුං තතො පරං විකප්පෙතුං, මුඛපුඤ්ඡන චොළං අධිට්ඨාතුං න විකප්පෙතුං පරික්ඛාරචොළං අධිට්ඨාතුං න විකප්පෙතුං" යනුයි. සඟළය හා උතුරු සළුව සුගත් සිවුරට ප්‍රමාණයෙන් අඩුවූවක්ම විය යුතුයි. එහෙත් යටත් පිරිසෙයින් දිගින් මුෂ්ටිපඤ්චකයක් ද සරසින් මුෂ්ටිත්‍රිකයක් ද විය යුතුයි. අන්තරවාසකය දිගින් මුෂ්ටිපඤ්චයක් ද සරසින් දෙරියනක් ද වූයේ වපී. 'මුට්ඨිනා උපලක්ඛිතං පඤ්චමං මුට්ඨිපඤ්චකං, චතුහත්ථමිතීනං පඤ්චමං මුට්ඨිං කත්වා මිනිතබ්බං' සිවු රියනක් මැන පස්වැන්නට මිටිරියනක් ගතයුත්තේ 'මුට්ඨිපඤ්චක' නම්. ඇතැම් කෙනෙක් 'මුට්ඨිහත්ථානං පඤ්චන්නං මුට්ඨිපඤ්චකං' යි මිටිරියන් පසක් ම ගතයුතුයයි කියති. මෙහි කියනලද පමණින් අඩු හෝ වැඩි වූ වස්ත්‍ර පරික්ඛාර චොල නාමයෙන් අධිෂ්ඨාන කටයුතුයි. චීවර අධිෂ්ඨානය කරන්නහු විසින් කාය වචනය දෙවිධියෙන් කවර ලෙසකින් නමුත් කළහැකියි. පුරාණ සඟළ සිවුර 'ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි' යි පච්චුද්ධරණය කොට අලුත් සඟළ සිවුර අතින් ගෙණ 'ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි' යි සිතින් සලකා කාය විකාර කරන්නහු විසින් කයින් අධිෂ්ඨානය කටයුතුයි. මේ කයින් අධිෂ්ඨානය කිරීම ය. එය වනාහි යම්කිසි ශරීරාවයවයකින් ස්පර්ශකොට ම කළයුතුයි. වචනයෙන් අධිෂ්ඨාන කිරීමෙහි දී වාග්භෙද කොට (වචනයෙන්) අධිෂ්ඨාන කටයුතුයි. මෙය වනාහි සම්මුඛ පරම්මුඛ

වශයෙන් ද දෙපරිදි වේ. ඉදින් අත්පසෙහි නම් 'ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි' යි ශබ්ද පවත්වා සම්මුඛ වශයෙන් අධිෂ්ඨාන කළයුතුයි. මෙහි අත්පස යන්නෙන් දොළොස් රියනකින් ඇතුළත පෙදෙස ගතයුතු යයි ද, දොළොස්රියනකින් ඇතුළත පිහිටි සිවුර සඳහා නම් 'ඉමං' කියා ද එයින් ඈත් වූ කල 'එතං' කියා ද වාක්‍යයෙහි යෙදිය යුතුයයි සාරාර්ථ දීපනියෙහි කියති. ඇතුල් ඕවරකයෙහි හෝ මතුමහලෙහි හෝ සාමන්ත විහාරයෙහි හෝ තිබුණු තැන සලකා පරම්මුඛ වශයෙන් "එතං සඞ්ඝාටිං අධිට්ඨාමි'යි වාග්භෙද පවත්වා අධිෂ්ඨානය කටයුතුයි. උත්තරාසඞ්ග අන්තරවාසක අධිෂ්ඨානය ද මේ ක්‍රමයෙන් ම කළයුතු යි. එහෙත් නාමකීර්තනය අමතක නො කටයුතුයි. පරිෂ්කාර චොල වශයෙන් අධිෂ්ඨාන කළ වස්ත්‍රයෙන් කළ සහළු සිවුර පඬුපෙවීම් කප්බින්දු තැබීම් ආදිය නිමකොට "ඉමං පච්චුද්ධරාමි" යි පච්චුද්ධරණය ද කොට නැවත අධිෂ්ඨානය කළ යුතුයි. අධිෂ්ඨාන කළ සිවුරට එකතු කොට ඊට වඩා මහත් වූ කඩක් පෝරුවක් කොට තබා මැහූ කල්හි නැවත ද එය අධිෂ්ඨාන කළ යුතුයි. සම හෝ කුඩාවූ කල්හි නැවත අධිෂ්ඨාන කෘත්‍යයක් නො මැති ය.

පරිෂ්කාර චොළයන්හි සීමා නියමයක් නැත කැමැති පමණක් අධිෂ්ඨාන කළහැකියි. වැසිසළුව වැසි සිවුමසෙහි අධිෂ්ඨාන කොට ඉන්පසු පච්චුද්ධරණය කොට විකප්පනය කටයුතුයි. නිසීදනය වනාහි ප්‍රමාණ වත් වූවක් ම අධිෂ්ඨාන කටයුතුයි. පච්චත්ථරණය කොබඳු වූවක් වුවත් අධිෂ්ඨාන කටහැකියි. කස්පිළිසන ද රොගය පවත්නාතුරු ප්‍රමාණ යෙන් යුක්තවූවක් ම අධිෂ්ඨානය කටයුතුයි. රොගය සංසිඳුනු කල්හි පච්චුද්ධරණය කොට විකප්පනය කටයුතුයි. මුව පිස්නා දෙකක් ම අධිෂ්ඨාන කටයුතුයි. එකක් සේදූ කල්හි අනික පරිභොග කිරීම පිණිස ය. පිරිකර පිණිස දුන් සෙනසුන් පිළිබඳව අධිෂ්ඨාන කෘත්‍ය යක් නැත. චීවරාධිෂ්ඨානය වනාහි අන්සතු කිරීමෙන් ද, බලාත්කාර යෙන් ගැණීමෙන් ද, විශ්වාස ග්‍රාහයෙන් ද, ලාමකබවට පැමිණී මෙන් ද, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙන් ද, කාලක්‍රියා කිරීමෙන් ද, ලිඞ්ග පරිවර්තනයෙන් ද, පච්චුද්ධරණයෙන් ද, සිදුරු ඇති වීමෙන් දැයි යන නව අයුරකින් නැසේ.

සම්මුඛ පරම්මුඛ වශයෙන් විකල්පනය ද දෙවැදෑරුම් ය. සිවුරු පිළිබඳ එකක් හෝ බොහෝ බව ද, දුර ළඟ බවද දැන, මේ සිවුර හෝ සිවුරු හෙල සිවුර හෝ සිවුරු 'තුය්හං විකප්පෙමි' යි දෙසිය යුතුයි. මේ සම්මුඛ විකල්පනයයි. මෙ පමණකින් තැන්පත් කොට තබන්ට වටී. පරිභොගකරන්ට හෝ අන් තැනකට දෙන්ට හෝ අධිෂ්ඨානය කරන්ට හෝ නො වටී. "මා සතු දෙය පරිභොග කරව, නැතහොත් අන් තැන කට දෙව, කැමති පරිදි කරව"යි මෙසේ කීකල්හි පච්චුද්ධරණය සිද්ධවෙයි. එතැන් පටන් පරිභොග කරණු කැමැත්තේ නම් අධිෂ්ඨානය ද කට යුතුයි. ඉදින් නො කැමැති නම් නො කටයුතුයි. පරම්මුඛ විකල්ප නය නම්:- සිවුරු පිළිබඳ එක බහුභාවය ද, දුර ළඟ බව ද දැන, මේ

සිවුරය, නැතහොත් මේ සිවුරුයි කියා හෝ තෙල සිවුරක්ය නැතහොත් සිවුරුය කියා හෝ 'තුය්හං විකප්පනත්ථාය දම්මි' කියා කිය යුතුයි. තුම්බවහන්සේගේ මිත්‍ර හෝ සන්දිට්ඨ තෙමේ කවරේදැයි විචාළ කල්හි තිස්ස භික්ෂුවය, තිස්සා සාමණේරියය කිය යුතුයි. නැවත ඒ භික්ෂුව විසින් තිස්ස භික්ෂුවට හෝ තිස්සා සාමණේරියට හෝ දෙමියි දෙසිය යුතුයි. මේ පරම්මුඛ විකප්පනයයි. මේ ශික්ෂාපදය කායවාචා කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨාන වේ. සිවුර තමන් සතුබව, ජාතිප්‍රමාණයන්ගෙන් යුක්ත බව, ඡින්නපලිබොධාදිය නැතිබව, අතිරේක චීවර බව, දසාහාතික්කම බව යයි අංග පසකින් යුක්ත ය.

කඨින සික්ඛාපද සැටහන නිමි.

---

සන්තරුත්තරෙන- (සහ අන්තරෙන උත්තරං සන්තරුත්තරං) සඳනා පොරෝණා'පමණින්; කණ්ණකිතානි- දහඩියෙන් වැකුනු තැන්වල හටගත් සුදු ලප ඇති වෙත්. අද්දසා ඛො ආයස්මා ආනන්දො, සෙනාසනචාරිකං ආහිණ්ඩමානො- සෙනාසන චාරිකාවෙහි හැසිරෙන්නාවූ ආනන්ද ස්ථවිර තෙමේ මෙය බැලීය. බුදුරදුන් දිවාවිහරණය පිණිස ගඳකිළියට වැඩි කල්හි ආනන්ද ස්ථවිරතෙමේ ඒ අවසරයෙහි නුසුදුසු සේ විසිර දමූ ලබඩු මැටි බඳුන් තැන්පත් කොට තබමින්, කොහැමදි තැන් හමදිමින්, ගිලන් භික්ෂූන් සමග පිළිසඳර කථාකරමින්, ඒ භික්ෂූන්ගේ සෙනාසුනට පැමිණියේ මෙය දිටි. අවිප්පවාස සම්මුතිං දාතුං- අවිප්පවාස සම්මුතිය හෙවත් විප්‍රවාස ප්‍රත්‍යයෙන් සිදුවනු ලබන ඇවතින් වැළකීම පිණිස දෙනු ලබන සම්මුතිය දෙන්ට; 'අවිප්පවාසෙ සම්මුති' 'අවිප්පවාස සම්මුති' 'අවිප්පවාසෙ' යනු නිමිත්තාර්ථයෙහි ආධාරයි; මේ සම්මුතිය ලත් භික්ෂුව ඒ සිවුරෙන් වෙන්ව අරුණුගත කළත් ඒ හෙතුවෙන් සිදුවන නිස්සග්ගි පචිත්තියට හිමි නොවේ. තිචීවරෙන- අදිටන්කළ තුන් සිවුරුවලින් යම් සිවුරකින්, එකකින් වෙන්ව අරුණ නැගුයේ ද තිචීවර විප්පවුත්ථ සඞ්ඛ්‍යාවට ගැණේ. එක් දෙසක් දූ වස්ත්‍රය නමුත් 'පටො දඩ්ඪො' යි සමුදාය ව්‍යවහාරය ලබත්තාක් මෙනි. එකකුලස්ස ගාමො- එක් රජෙකුට හෝ ගම්මුදලියෙකුට අයිති ගම; පරික්ඛිත්තො- යම්කිසි පවුරකින් හෝ වැටකින් හෝ අගලකින් හෝ හාත්පස පිහිටි නදීතලාකාදී ජලයකින් හෝ පිරිකෙව් කරණ ලද්දේ; අන්තොගාමෙ වත්ථබ්බං- (මෙබඳු වූ ගමෙහි සිවුර තැන්පත් කොට තබා) ඇතුළුගම් කැමති තැනක විසිය යුතුයි. හත්ථපාසා වා න විජහිතබ්බං- ගෙය හාත්පස අත්පසින් නො හැරිය යුතුයි. මෙහි අත්පසට දෙරියන් හමාරකින් ඇතුළත පෙදෙස ගැණේ. යම්කිසි සාදිමත් භික්ෂුවක් අත්පස ඉක්මවා අහසෙහි නමුත් අරුණ නැගුයේ නම් ඒ භික්ෂුහට නිස්සග්ගි පචිති වේ. ඝරං පන- යම් ගෙයක; එක් කුලයකට අයත් නිවාසස්ථානය මෙහි ඝර වශයෙන් සැලකේ; සභාගෙ- බොහෝ දෙනෙකුගේ වාසය පිණිස කරණ ලද ශාලාවෙකි; 'සභා' ශබ්ද පර්‍යාය වූ

'සභාය' ශබ්දයක් ඇත. එය නපුංසක ලිංගිකය. 'සභායං ගච්ඡන්ති' යනු 'සභං ගච්ඡන්ති' යන්නට සමානවූ යෙදුමකි. මාරමූලෙ-නුවර දොර සමීප යෙයි; එයි නිබඳ විසීම අපහසු නම් පහසු තැනක වැස අරුණ නැගෙන්ට පළමු එයි පැමිණ සභාවාරයෙහි අත්පස නො ඉක්මවා විසිය යුතුයි. හත්ථපාසෙ- අත්පසෙහි; අත දිගහැර මෙහි තබවයි සුදුසු තැනක සිවුරු තැන්පත් කරවා ශාලාවෙහි හෝ මාරමූලයෙහි අත්පස නො හැර විසිය යුතුයි. ඔවරකො-මෙය කාමරයට ම පර්‍යාය නාමයකි. උද්දොසිතො- යානවාහනාදි බඩු තබන ශාලාව; අට්ටො- විරුද්ධ රජවරුන් මැලැක්වීම පිණිස ගඩොලින් තැනූ ගනකම් බිත්ති වලින් යුක්තවූ මහල් කීපයක් ඇති මුර ගෙවල්; මාළො- එක් කැණි මඬුලු ගත් සිවුරැස් ගේ; පාසාදො-දිග්ගෙය; හම්මියං මතුයෙහි යදලු සහිත තව කළ මුණ්ඩච්ඡදන ප්‍රාසාදය; සත්ථං- ජඞ්ඝසත්ථ සකටසත්ථ වසයෙන් දෙවැදෑරුම්වූ සත්වාමුළු; ඛෙත්තං-කුඹුරු ඈ කෙත්; ධඤ්ඤකරණං- කලවිට; ආරාමෝ-පුෂ්පාරාම ඵලාරාම; විහාරො-නම් එක ගෙනසුනකි. රුක්ඛමූලං- හිරු අහස් මැදට පැමිණි කල්හි ගසේ ඡායාව පැතිර සිටි තැන; සමන්තා සත්තබ්භන්තරා-මැද සිටියහු හාත්පස අබතුරු සතක්; එක් කෙළවරක සිට අනික් කෙළවරට දුර අබතුරු තුදුසක් වෙයි. අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස-නිස්සජනය නො කොට පරිභොග කෙරේ ද ඒ භික්ෂුහට දුකුළා ඇවැත් වේ. යොගාවචර මහණ තෙමේ මූළුරැය වීයඹීකොට අලුයම් කාලයෙහි නාම්සී ගඟාව බටුයේ ය. එහිදීම අරුණ නැගුණි. සිවුරු අත්පසෙහි නුවූ හෙයින් නිසගි විය. නැවත ඔහුට නිසගි සිවුරු පරිභොග කළහොත් දුකුළා වේ. එකල්හි ඒ භික්ෂුව එයින් එක් සිවුරක් පමණක් හැඳගෙණ සෙසු සිවුරු අතින් ගෙණ විහාරයට පැමිණ සී තයින් විනයකර්මය කටයුතුයි. ඉදින් විහාරය දුරයෙහි පිහිටියේ ද අතරමග ජනාකීර්ණත් වේද, එකල්හි එක් සිවුරක් හැඳගෙණ එක් සිවුරක් පොරවා ගෙණ සෙස්ස අතින් ගෙණ ගොස් විනයකම් කළයුතුයි. මෙය ද පඨමකඨින සමුට්ඨානයෙන් යුක්තය. අධිට්ඨිත සිවුරක් බව, නො ඇතුරු කඨින ඇති බව, නො ලත් සම්මුති ඇති බව, රත්තිවිප්පවාසය යි අඞ්ග සතරකින් යුක්ත ය.

උද්දොසිත සික්ඛාපද ගැටපදය නිමි.

---

උස්සාපෙත්වා පුනප්පුනං විමජ්ජන්ති- ඔසවා නැවත නැවත මඩියි. රැලි දිගහැර රෙද්ද දිගුපුළුලින් විශාලකරගන්ට හැකිවේයයි කල්පනා කොට ජලයෙන් තෙමා එක් කොනක් පයින් මැඩ අනික් කොන අතින් ඔසවා පිටෙහි ගටයි. එහෙත් එය අමුණෙහි ලූ කල්හි පළමු තරමට ම වෙයි. බුදුරජානන් වහන්සේ ගඳකිළියෙහි වැඩහුන් සේක් මෙය දුක චාරිකාව්‍යාජයෙන් එහි වැඩිසේක. ඒකාදසමාසෙ- ඉල්මස හැර සෙසු එකොළොස් මසෙහි; සත්තමාසෙ- ඉල්මස ද, හෙමන්ත කාලික සිවුමසදූයි යන පස්මස හැර සෙසු සත්මස් කල්හි; කාලෙපි ආදිස්සදීයමානං- සඞ්ඝයාට හෝ පුද්ගලයෙකුට 'මෙය අකල් සිවුරකැ'යි

උද්දෙසා දෙනලද්ද; **සඞ්ඝතො**- තමන්ට අයිති කොටස වශයෙන් සඞ්ඝයාගෙන් ලැබුනු දෙය; **ගණතො**-(මෙය සුත්තන්තිකයන්ටය මෙය ආභිධම්මිකයන්ටයයි ලැබුනු දෙයකින්) ගණයාගෙන් තමහට ලැබුනු කොටස; **අත්තනො වා ධනෙන**- තමහට ලැබුනු කපුනුල් ආදි ධනයකින්; **තවාසා සාපෙක්ඛා**- පච්චාසා චීවරයලද දින හැර නවදවසකින් කටයුතුයි. **සාගතො වෙ උපනජ්ජිං නික්ඛිපෙය්‍ය**-මසක් පරමකොට ඇති කාලයෙන් මත්තෙහි බහා තබන්නේ නම්, (නිසගි පචිති වේ.) **විසභාගෙ උප්පන්නෙ මූලචීවරෙ**- මූලචීවරය හා පච්චාසා චීවරය තුනී දළ වශයෙන් විෂමව උපන් කල්හි; මූලචීවරය තුනී ද, පච්චාසාචීවරය දළද එකල්හි ඒ රෙදි දෙක එකට නො ගෙදිය හැකි ය. ඉදින් කල්ද ඉතිරිව තිබේනම් අනික් පච්චාසා චීවරය ලැබ කල් ද නො ඉක්මවා කටයුතුයි. මූලචීවරය දළ ද පච්චාසාචීවරය තුනී ද, එකල්හි පරික්ඛාර චොල වශයෙන් මුල් සිවුර ඉටා, පච්චාසාචීවරය මූලචීවරය කොට තැබිය යුතුයි. එකල තව මසක් පරිහාරය ලැබියහැකි වෙයි. මෙසේ කැමැති තාක් කල් ඒ සිවුරු දෙක මාරුකිරීමෙන් තබාගත හැකිමෙයි. සමුට්ඨානාදිය පඨමකඨින ශික්ෂාපදයෙහි මෙනි. අඞ්ග ද එසේම ය. එහෙත් එහි සඳහන් දසාහාතික්කමය, මාසාතික්කම වශයෙන් යොදාගත යුතුයි.

**තතිය කඨින සික්ඛාපද සැමසදය නිමි.**

---

**භත්තවිස්සග්ගං**- දත් මැලදීම්කිස; 'භත්තස්ස උදරෙ විස්සජ්ජනං පවෙසනං භත්තවිස්සග්ගං' යනු විග්‍රහයි. **තඵ නාම්බඬං**-තුඹ ඇ ලවා; **යාව සත්තමා පිතාමහයුගා**- සත්වන මීමුතුන් යුගළුව දක්වා; මවුපිය දෙදෙන යුගලාභීයෙන් 'යුග' නමි. එසේ හෙයින් පිතාමහයුගය දක්වා වූවෝ 'පිතාමහ' යයි ගතයුතු. මෙහි සඳහන් 'පිතාමහ' ග්‍රහණයෙන් ම පිතාමහී, මාතාමහා, මාතාමහී යන මොහු ද ගැණෙති. 'අඤ්ඤාතක' නම් සත්තමයුගයෙන් අන්‍ය වූවෝයි. **මාතිතො වා පිතිතො වා**- තමාගේ හෝ ඇගේ හෝ මවුගේ හෝ පියාගේ හෝ අන්වයෙහි උපන්; **උභතො සඞ්ඝෙ**-භික්ෂුණී සඞ්ඝයා කෙරෙහි ඥත්තිචතුත්ථකම්ම වශයෙන් හා, භික්ෂු සඞ්ඝයා කෙරෙහි ඥත්තිචතුත්ථකම්ම වශයෙන් දූයි අෂ්ටවාචික විනයකර්මයෙන් උපසපන් බැව් ලැබුවෝ; භික්ෂුභාවයෙහි සිට ලිඞ්ගපරිවර්තනයෙන් භික්ෂුණී භාවයට පැමිණියෝ ද මෙයින් ගැණෙති. **සකිං නිවත්ථම්පි සකිං පාරුතම්පි**- පඬු පොවා කප්බින්දු ඔබා එක්වරක්වත් හැඳි හෝ පෙරවි සිවුර යටත්පිරිසෙයින් පරිභොගකිරීම් වශයෙන් දසරුවෙහි හෝ මුදුනෙහි කොට මග ගියේ වේද, හිස යටට තබාගෙණ සැතපුනේ ද, ඒ සිවුර පුරාණචීවර සඞ්ඛ්‍යාවට ගැණේ. ඉදින් පසතුරුණුවලට යටවනසේ ඇඳෙහි එලා සැතපුනේ ද, හිස මතුයෙහි වියනක් සේ සපයා නො තරමින් ගෙණ ගියේද එය පරිභොගකිරීම සඞ්ඛ්‍යාවට නො ගැණේයයි ද කියති. **ධොවාපෙය්‍ය නිස්සග්ගියං**-දෙවූයේ නිසගිවේ. භික්ෂුනුයේ අණපරිදි භික්ෂුණිය උදුනා සඳ, දර රැස් කෙරේ ද, ගිනිමොලවාද, ජලය ගෙණේ ද,

මෙසේ භික්ෂුණියගේ හැම පියොවක් පාසා භික්ෂූහට දුකුළා ඇවැත් වේ. දෙවූ එසමූ කල්හි ම නිසගි වේ. රජකාතොටනයෙහි දී ද මේ ක්‍රමය මය. අවුසකා ධෝවති- නො කියනලද්දී දෙව්යි, අවවාද දීම පිණිස පැමිණි භික්ෂූහුගේ සිවුර තුබූතැනින් ගෙණ, සවාමිනි, මෙය ධෝවනය කරම්යි සෝද හෝ පඬු පොවා දෙයි. අන්තමසෝ පරික්ඛාරං- වත්හන් කසු ආදි අන් පිරිකර.

පුරාණ චීවර ධොවන සික්ඛාපද ගැටපදය නිමි.

---

අන්ධවනං- සැවැත්නුවර සමීපයෙහි පිහිටි වනයකි. සැරියුත් තෙරණුවෝ පුණ්ණ තෙරුන්ට. මෙහිදී සප්තවිශුද්ධි ක්‍රමය දෙසූහ. කතකම්මා- සොඬි බිඳීම් ආදියෙන් අනුන්ගේ දෙය පැහැරගන්නෝ; චොරගාමණිකො- සොර දෙටු තෙමේ; හේ ස්ථවිරිය පෙර හඳුනයි. එහෙයින් ඉදිරියෙහි යමින් 'මේ මගින් නො යව, මේ මගින් එව' යි පිරිවර සොරුන් ද කැඳවා ගෙණ අන් මගකින් ගියේ ය. සමාධිම්හා වුට්ඨහිත්වා- සමාධියෙන් නැගිට; ස්ථවිරිය නියම කරගත් වේලාවෙහි ම සමාධියෙන් නැගී සිටියාය. එකෙණෙහි ම සොරුගේ වචනය ඇසී, මෙතැන්හි මා හැර අන් මහණෙක් හෝ මෙහෙණක් නැතැයි සලකා මස හැරගති. ඔහිතපෙසො- වාරය පැමිණි හෙයින් හුදෙකලාව ජීයාර ගෙහි සිටියේ; සචෙ ඉමං ඛණ්ඩං අනන්තරවාසකං දජ්ජෙයාසි- ඉදින් තුඹ මට අඳනය දෙන්නෙහි නම්; මේ අඳනය වනාහි ඉතා සියුම් රෙද්දකින් මැසුනකි. එහෙත් මේ භික්ෂුහට අඳනය කෙරෙහි අධික ආශාවක් ද නැත. මේ භික්ෂුණියගේ දුකුම්කළු සිරුර දුකීමෙ බලාපොරොත්තුවෙන් මෙසේ අඳනය ඉල්ලීමට රිසි උපන. අකාමං පසාදමං චීවරං- භික්ෂුණීන්ට අයත් පස් සිවුරු අතුරෙන් පස්වැනි හෙයින් මේ පැසුළු සිවුර ය. විකල්පනය කොට හෝ පච්චුද්ධරණය කොට තැබූ අන් අඳනයක් නැති හෙයින් නො දෙමි දුන්විය. ලොභ වසයෙන් නො වෙයි. නිප්පීළියමානා- උපමා දුස්විමෙන් දුඹිව පෙළෙනු ලබන්නී; අන්තරවාසකං දත්වා අගමාසි- සංකච්චිය හැඳ අඳනය දී අසපුවට ගියාය. හස්තතලය හැර අන්කිසි ශරීරාවයවයක් දකින්ට නො ලැබුනු හෙයින් ඒ භික්ෂුහුගේ මනොරථය ද සම්පූර්ණ නොවිය. පාරිවත්තකං- (පරිවත්තනකබ්බං පරිවට්ටං, පරිවට්ටමෙව පාරිවට්ටකං,) හුවමාරුවට දියයුතු දෙය; ඨපෙත්වා පාරිවත්තකං- ගැණීම පිණිස වූ හස්ත ප්‍රසාරණාදි සියලු ප්‍රයොගයන්හි දුකුළා ඇවැත් වේ. පටිලාභෙන- පිළිගැණීමෙන්; අතින් අතට හෝ පිළිගන්වා ද, පාමුල හෝ තබා දේද, ඉදින් එය ඉවසා නම් පිළිගන්නා වැහිය; මේ ශික්ෂාපදය ජනසමුට්ඨානය, විකප්පනුපගා සිවුරක් බව, පාරිවට්ටකාභාවය, නෑනෑ භික්ෂුණියක අතින් ගැණීමය යන අංග පසකින් සමන්විත වේ.

චීවර පටිග්ගහණ සික්ඛාපද ගැටපදය නිමි.

**උපනන්දො සක්‍යපුත්තො**- අසූදහසක් ශාක්‍යකුලවලින් නික්ම පැවිදිවූවන් අතුරෙන් මේ තෙමේ තිගීතයෙකි. එසේම ලාමකයෙකි. **පට්ඨො**-(පටුඑව පට්ඨො)කීමෙහි සමර්ථවූ මධුරස්වරයෙන් යුක්තයෙකි. **කිස්මිං විය**- හිරිඔතප් බලවත් හෙයින් කරදරයක් වැනිය යන අර්ථයි; **ධම්මනිමන්තනා**- ධර්මයට උපචාර වසයෙන් කරණලද පැවරීම; දෙනු කැමැත්තෙන් ම කරණලද්දක් නොවෙයි. **සාකෙතං**- සැවැත් නුවරට සත්යොදුනක් දකුණු දිගින් පිහිටි මේ නගරය බුද්ධකාලයෙහි කොසොල් රජහු විසින් ඉදිකරණ ලද්දකි. දඹදිව පිහිටි මහානගර සයෙන් ද එකකි. **අද්ධානමග්ගං**- දීර්ඝ මාර්ගයට; **තෙ භික්ඛූ අච්ඡින්දිංසු**- ඒ භික්ෂූන් අච්ඡින්දනය කළාහුය. ඒ භික්ෂූන්ගේ පා සිවුරු පැහැර ගත්තාහුය යන අර්ථයි. **අනුඤ්ඤාසි**- භික්ෂුභාවය දැනගැණීම පිණිස විචාරව; **අනුයුඤ්ජියමානා**- පැවිදි උපසම්පදා පත්‍රචීවර අධිට්ඨානාදිය විචාරණු ලබන්නෝ; **තිණෙන වා පණ්ණෙන වා පටිච්ඡාදෙත්වා ආගන්තබ්බං**- යන්නෙන් මෙබඳු තැන්වලදී භූතගාමපාතව්‍යතාවය අනුදන්නාලදී. **විහාරචීවරං**- සේනාසන චීවරය, මනුෂ්‍යයෝ ආවාස කරවා එහි වසන භික්ෂූන්ට සිවුපසය පිළිගැන්නීම ද ඔවුන්ට ඇයිතියයි සලකා තුන් සිවුරු සකස් කොට තමන් කරවූ ආරාමයන්හි තබති. මෙසේ තැබූ සිවුරු විහාරචීවර නමි. **උත්තරත්ථරණං**- ශයනාසන මතුයෙහි අතුරණු ලබන පසතුරුණු; **භුම්මත්ථරණං**-බුමු තුරුණු; පිරියම්කළ භූමිය ආරක්ෂාකරණු පිණිස අතුරණු ලබන තාලාල් ආදිය; **භිසිච්ඡවි**-ඇඳ පුටු කිසිවල උර; මෙය පරිභොග කොට නැවත යථාස්ථානයෙහි ම තබමියි ගෙණ පරිභොගකිරීම නිවරදය. **පරිභොගජිණ්ණං**- යම් සිවුරකින් සිරුර වසාගන්ට නො හැකිවේ ද ඒ සිවුර පරිභොගජිණ්ණ නම්. **පවාරිතානං**- සඞ්ඝ පවාරණයෙන් පැවරූ දෙය සියලු සඞ්ඝයාට සාධාරණ හෙයින් අධික වසයෙන් විඤ්ඤාපනය කරන්ට නො වටී. පුද්ගලික පවාරණයෙහි දී යමක් යමක් පවරා නම් ඒ ඒ දෙය විඤ්ඤාපනය කරන්ට වටී. මේ ශික්ෂාපදය ඡසමුට්ඨානය, විකප්පනූපග චීවර භාවය, සමයාභාවය, අඤ්ඤාතක විඤ්ඤත්තිය, එයින් ලැබීමය යන අඞ්ග සතරකින් යුක්ත ය.

අඤ්ඤාතක විඤ්ඤත්ති සික්ඛාපද වැනුම නිමි.

---

**පූගගණ්ඨිසාලං**- රෙදිපිළි වෙළඳුන්ගේ මෙළඳහල; **අභිහට්ඨුං**- හැරගන්ට; මෙහි 'අභි' ශබ්දයෙහි විශෙෂාර්ථයක් නොමැතියි. 'හර හරණෙ' ධාතුයි; **සන්තරුත්තරපරමං**- නිවාසනය සමග පොරෝණය පරමකොට ඇත්තක්; 'ස අන්තරං උත්තරං පරමං අස්ස චීවරස්සා'ති යනු විග්‍රහයි. **අස්ස චීවරස්ස**-මේ ඉවසියයුතු සිවුර පිළිබඳව; **තතො චීවරං සාදිතබ්බං**- ඒ අභිහට සිවුරුවලින් මෙපමණ සිවුරක් ගතයුතුයි. ඉන් මැඩියක් නො ගත යුත්තය යන අර්ථයි. **සචෙ තීණි නට්ඨානි හොන්ති**- ඉදින් තුණම නටුවාහු වෙත් නම්; ඒ පිළිබඳ විනිශ්චය මෙසේයි. සිවුරු තුණම නටහල්හි දෙකක් ඉවසියයැකි වෙත්. එක්

සිවුරක් හැඳගෙණ එක් සිවුරක් පොරවා ගෙණ ගොස් අනික් සිවුර සභාග ස්ථානයෙන් සොයන්නේ ය. දෙකක් නට කල්හි එකක් ඉවසිය හැකියි. ප්‍රකෘති වශයෙන් සිවුරු දෙකකින් ගම්වදින භික්ෂුව විසින් දෙකම නට කල්හි දෙකම ඉවසිය හැකිය. එකක් නටකල්හි එකක් ඉවසිය යුතුය. භික්ෂුණීන් පිළිබඳ සිවුරු පසම නටකල්හි දෙකක් ද, සතරක් නටකල්හි එකක් ද ඉවසිය හැකිය. කෙසේ නමුත් අඳනය හා පොරෝණය දෙකෙන් අධිකයක් නො සෙවිය යුතුයි. **සෙසකං ආහරිස්සාමි**- සෙසු ඉතිරිකඩ පසුව ඇරදෙමියි බොහෝ ගෙණ යන්නා හට ද; **සෙසකං තුය්හඤ්ඤෙව හොතු ති**-සෙසු ඉතිරි ද තුඹටම වේවා යයි කියන ලද්දහුහටද; **න අච්ඡින්නකාරණා**- බාහුසච්චාදි ගුණ වශයෙන්; මේ ශික්ෂාපදය තමන් පිළිබඳ ඉවසීම ප්‍රධාන කොට ගෙණ පවත්නා හෙයින් 'අඤ්ඤස්සත්ථාය' යයි කියන්ට අවකාශයක් නැතැයි ග්‍රන්ථිපදයන්හි කියායයි කියති. මේ ශික්ෂාපදය ඡසමුට්ඨානය; එසේ ම තතුත්තරිය බව, අච්ඡින්නකාරණ බව, අඤ්ඤාතක විඤ්ඤත්තිය, එයින් ලැබීමය යන අඞ්ග සතරකින් යුක්ත ය.

**තතුත්තරිය සික්ඛාපද ගැටපදය නිමි.**

---

**අඤ්ඤතරො එවං හොති**- (අපි මෙ අයා එවං හොති) ආර්යයන් වහන්ස, මැලි මගේ මෙබඳු අදහසක් වෙයි. **භික්ඛුං ආරම්මණං කරිත්වා**- භික්ෂුව තරුණු කොට; **අඤ්ඤාතකස්ස ගහපතිස්ස**- නොනෑ ගැහැවියෙකු විසින්; **චීවරචෙතාපන්නං**- සිවුරු මිල; 'චීවරං චෙතාපෙන්ති පරිවත්තෙන්ති එතෙනාති, චීවරචෙතාපනං' 'න' ආගම කොට 'චීවරචෙතාපන්නං' යි කියනලදී. **උපක්ඛටං හොති**- රැස්කොට තබන ලදී. 'උපස්කර' ධාතුයි. **අච්ඡාදෙස්සාමි**- අසවල් මහණහට දෙමි; **විකප්පං ආපජ්ජෙය්‍ය**- අධික විධානයට පැමිණෙන්නේ නම්; **සාධු**- ආයාචනාර්ථයෙහි නිපාතයකි; **වත**- පරිවිතක්කාර්ථයෙහි නිපාතයකි; **කල්‍යාණකම්‍යතං උපාදාය**-සුන්දරකාමිතාව සිතින් ගෙණ; **මහග්ඝං චෙතාපෙතුකාමස්ස අප්පග්ඝං චෙතාපෙති**- මානැගි සිවුරක් දෙනු කැමැත්තහුට මෙතරම් වටිනාකමින් යුත් සිවුරකින් මට නම්නැත අප්පග්ඝ සිවුරක් දෙවයි කියයි; සමුට්ඨානාදිය තතුත්තරිය ශික්ෂාපදයෙහි මෙනි, චීවරයෙහි භිය්‍යොකාමිතාවය, අඤ්ඤාතක විඤ්ඤත්තිය, එයින් ලැබීමය යන අඞ්ග තුණකින් යුක්තවේ.

**පඨම උපක්ඛට සික්ඛාපද ගැටපදය නිමි.**

---

**පච්චෙක චීවරචෙතාපන්නං**- වෙන් වෙන් වශයෙන් නියමකරණ ලද සිවුරු මිල; **උභොව සන්තා එකතො**- දෙදෙනෙක් එකතුවී.

**දුතිය උපක්ඛට සික්ඛාපද ගැටපදය නිමි.**

**උපාසකං සඤ්ඤාපෙත්වා**–(මේ මිලයෙන් සිවුරක් ගෙණ තෙරුන්ට දෙවයි) උවසුහට දන්වා; **පඤ්ඤාසං බද්ධො**– පණසක් දඩයයි නියම කරණ ලද්දේ වෙයි. 'පඤ්ඤාසං බන්ධො' යනු ද පාඨයි. පණසක් කහ වණු පැරදි හෙයින් දියයුතුය යන අර්ථයි. **අජ්ජණ්හො භන්තෙ ආගමෙහි**– ස්වාමීනි, අද එක දවසක් අප වෙනුවට ඉවසුව මැනවි. 'අජ්ජ නො' යි කියයුතු තැන 'හ' ආගම ද 'න' හට 'ණ' ආදෙශ ද කොට 'අජ්ජණ්හො' යි දක්වනලදී. **පරාමසි**– ගත්තේය; **ජිතොසි**– (ජිතො අසි) පරදවන ලද්දෙක් විය. **රාජභොග්ගො**– රජහු කෙරෙන් අනුභව කටයුතු බත්වැටුප් ආදි ඉසුරු ලබන්නෙක්; 'රාජභොගො' යනු ද පාඨයි. **පහිණෙය්‍ය**– යවන්නේය. **ආභතං**– ගෙනෙනලදී. **කාලෙන කප්පියං**–යම් කලෙක අපට ප්‍රයොජන වේද, ඒ කාලයෙහි කැප සිවුරු ගණිමු' යන අර්ථයි. **වෙය්‍යාවච්චකරො**– කප්පියකාරක තෙමේ; **ඨානං භඤ්ජති**– පැමිණි කරුණ ද විනාශවෙයි. චොදනා තුණක් හා සිටීම් සයක් කටහැකි වෙත්. චොදනාකිරීම් පමණක් නම් සවරක් චොදනා කිරීමද, චොදනා නොකොට සිටීම් පමණක් නම් දොළොස්වරක් සිටීම ද කටහැකිය. සිටීම් දෙකක් එක්වරක් චොදනා කිරීම වැනිය. චෝදනා තුණක් නම් සිටීම් සයක් ද, චොදනා දෙකක් නම් සිටීම් අටක් ද, චොදනා එකක් නම් සිටීම් දසයක් ද කටයුතු වෙත්. එක්වරක් වත් චොදනා නො කොළොක් දෙළොස් වරක් පෙණිසිටීම කළහැකි වෙයි. එසේ ම සිවුවරක් සිටීම්කළ කල්හි චොදනා කළහැක්කේ සිවුවරකි. දෙවරක් පෙණී සිටියොත් චොදනා පසක් කළහැක. කොහෙත්ම පෙණී නො සිටියහොත් චොදනාව සවරක් කළහැකි වෙයි. කයින් හෝ වචනයෙන් චොදනා කරන්ට පැමිණි භික්ෂුව විසින් ඒ තැනැත්තනුගේ වැඳීම් ආදියක් වත්, ඔහු පැණවූ අසුන්වල වැඩහිඳීමක් වත්, ඔහුගේ දුන් පිළිගැණීමක් වත්, නො කළයුතු ය. **න තං තස්ස භික්ඛුනො කිඤ්චි අත්ථං අනුභොති**– ඒ සිවුරු මිලය ඒ මහණහට ස්වල්පමාත්‍ර වූ ඵලයක්වත් සිදු නො කෙරේ. **යුඤ්ජන්තායස්මන්තො සකං**– යුෂ්මත්හු තමන්ගේ ධනය ගණිත්වා; **මා වො සකං විනස්ස**– තොප සතු ධනය නො නාසීවා; යමෙක් තෙමේම නොයා ද, දූතයකු හෝ නොයවා ද වතභෙද දුකුළාවට පැමිණේ.

කැපකරුවෝ නිද්දිට්ඨ අනිද්දිට්ඨ වසයෙන් දෙපරිදි වෙත්. භික්ඛුනා නිද්දිට්ඨ, දූතෙන නිද්දිට්ඨ යයි නිද්දිට්ඨ කැපකරුවෝ දෙවැදෑරුම් වේ. අනිද්දිට්ඨයෝ ද මුඛවෙවටික පරම්මුඛයයි දෙවැදෑරුම් වේ. සම්මුඛ එකෙකු හා අසම්මුඛ තිදෙනෙක්දැයි භික්ඛුනා නිද්දිට්ඨයෝ සිවුවැදෑරුම් වේ. දූතෙන නිද්දිට්ඨයෝ ද එසේ ම සිවුවැදෑරුම් වේ. කිසිවෙක් දූතයෙකු අත භික්ෂූහට සිවුරක් පිණිස යයි අකැප දෙයක් යවයි. දූතයා පැමිණ මෙය අසවලා විසින් තුඹවහන්සේට සිවුරක් පිණිස එවූ ධනයකැයි පිළිගැන්වූ කල්හි භික්ෂු තෙමේ මේ මට අකැප යයි ප්‍රතික්ෂෙප කෙරේ. ඉක්බිති දූතතෙමේ සඞ්ඝයාගේ වතාවත් කරු

වෙක් සිටිද්දී පිළිවිසියි. මේ සඞ්ඝයාගේ වතාවත්කරු යයි ලඟ සිටියෙකු පෙන්වූ කල්හි දූතතෙමේ මේ ධනයෙන් මුන්වහන්සේට සිවුරක් කොට පිළිගන්වනු මැනවයි ඔහුට අකැප වස්තුව දී යෙයි. මේ භික්ඛුනා සම්මුඛ නිද්දිට්ඨයායි. සමීපයෙහි කිසිවෙකු නොමැති කල්හි අසවල් ගමෙහි වූ අසවලා භික්ෂූන්ගේ වතාවත්කරු යයි භික්ෂුව දැන්වූ කල්හි, දූතතෙමේ එහි පැමිණ ඔහුගේ අකැප වස්තුව තබා මේ මිලයෙන් තෙරුන්ට සිවුරක් ගෙණ පිළිගන්වනු මැනවයි දන්වා, පෙරළා අවුත් භික්ෂුහට ද ඒ බැව් දන්වා යෙයි. මේ පළමුවැනි භික්ඛුනා අසම්මුඛ නිද්දිට්ඨයායි. ඉදින් දූතයා භික්ෂුව සලකුණු කිනැතැත්තාට පෙරසේ ම මුදල් දී භික්ෂුව කරා පෙරළා නො පැමිණ ඒ බැව් අනිකෙකු ලවා දන්වා එවයි. මේ දෙවෙනි භික්ඛුනා අසම්මුඛ නිද්දිට්ඨයායි. ඉදින් දූතතෙමේ ඔහු කරා යන ගමන්ම ස්වාමීනි, නුඹවහන්සේට සිවුරක් පිණිස ඔහුට මුදල් දී නැවත මෙහි නො පැමිණම යන්නෙමියි කියා යයි. මේ තුන්වැනි භික්ඛුනා අසම්මුඛ නිද්දිට්ඨයායි. දූතයෙකු විසින් විචාරණලද භික්ෂුනමක් අපලඟ කැපකරුවෙක් නැතැයි දන්වයි. එකල්හි දූතතෙමේ එකෙණෙහි එතනට පැමිණියෙකුට සිවුරු මිලදී මොහුගෙන් සිවුරක් ලැබගත මැනවයි දන්වා යයි. මේ දූතෙන සම්මුඛ නිද්දිට්ඨයායි. අසම්මුඛ නිද්දිට්ඨ නිඳනා ද පෙරකී නයින්ම දතයුත්තාහුයි.

දූතයෙකු විසින් විචාරණලද භික්ෂුව අප ලඟ කැපකරුවෙක් නැතැයි කීකල්හි, ඒ නුදුරෙහි සිටියෙක් 'පින්වත සිවුරු මිල මට දුන මැනවී. මම ආයුෂ්මතුන් වහන්සේට සිවුරක් පිළියෙල කොට පිළිගන්වන්නෙමියි කියයි, දූතතෙමේ ඔහුට සිවුරු මිලදී සිවුරක් පිළිගන්වනු මැනවයි කියා ඒ බැව් භික්ෂුහට නො දන්වා ම යෙයි. මේ මුඛවෙවටික කැපකරු තෙමේයි. අනිකෙක් භික්ෂුහුගේ උවටැන් කරුට හෝ අනිකෙකුට අකැප ධනයක් දී තෙරුන්ට සිවුරක් පිළිගන්වවයි නික්ම යෙයි. මේ පරම්මුඛ කප්පියකාරක තෙමේයි. මේ දෙදෙනාම අනිද්දිට්ඨ කප්පියකාරකයෝ නම් වෙත්. මොවුන් කෙරෙහි අඤ්ඤාතක අප්පවාරිත යන් කෙරෙහි මෙන් පිළිපැදිය යුතුයි. ඉදින් ඔවුහු සිවුරක් ගෙණැවිත් දෙත් නම් පිළිගත යුතුයි. නො දෙන කල්හි ද කිසිත් චෝදනාවක් නො කටයුතුය. පිණ්ඩපාතාදිය පිණිස දුන් දෙයෙහි ද මෙසේ ම පිළිපැදිය යුතුයි.

යමෙක් රන් රිදී ආදී කිසිවක් ගෙණවුත් 'මෙය සඞ්ඝයාට දෙමි ආරාමයක් හෝ චෛත්‍යයක් හෝ භොජනශාලාදියක් කරව්' යයි කියයි. මෙය ද පිළි නොගත යුතුය. අනුන්ගේ ප්‍රයෝජනය පිණිස නමුත් පිළිගන්නහුට දුකුළා වේයයි මහාපච්චරියෙහි කියති. ඉදින් භික්ෂූන් පිළිගත නො හැකියයි කී කල්හි 'එය කරවීම පිණිස කම්මකාරාදීන්ට දී ඔබවහන්සේ මෙය මදක් පරීක්ෂා කළ මැනවැයි කියා යේනම් එය පිළිගන්ව වටි. සඞ්ඝගණ පුද්ගලාදීන්ගේ නමක් නොකියා 'මේ රන් චෛත්‍යයට පුදමු, විහාරයට පුදමු, නවකර්ම සඳහා දෙමු' යි

කියත් ද, එකල ප්‍රතික්ෂේපකරන්ට නො වටී. මොහු මෙසේ කියත් යයි කැපකරුවන්ට දැන්විය යුතුයි. චෛත්‍යාදියේ ප්‍රයොජනය පිණිස ඔබවහන්සේ භාරගෙණ තබන්නු මැනවයි කියත් නම් එය අපට පිළිගන්ට නො හැකියයි දැන්විය යුතුයි.

යමෙක් බොහෝ රන්රුවන් ගෙණවුත් 'මෙය සඞ්ඝයාගේ සිවුපසය පිණිස පරිත්‍යාගකරමියි දේද, එය පිළිගතහොත් පිළිගැණීමෙහි දීද, පරිභොගයෙහි දී ද, දුකුළා වේ. උපාසක තෙමේ මෙය සඞ්ඝයාට අකැපය, එහෙයින් මට ම වන්නේයයි රැගෙණම යේද, සෙසු භික්ෂූන් විසින් අසවලා සඞ්ඝයාට ලැබුනු ලාභය නැතිකොළේයයි චොදනා නො කටයුතුයි. යමෙක් චොදනා කෙරේ නම් චොදනා කරන්නහුට ම ඇවැත් සිදුවේ. ඉදින් මහතෙමේ ඒ මිල කැපකරුවන් සතුව හෝ මගේ මිනිසුන් සතුව හෝ මා සතුව තිබෙයි. ඔබවහන්සේලා සිවුපස පරිභොගය ම ඉවසත්වායි කියා නම් පිළිගන්ට වටී. සිවුපසය පිණිස පරිත්‍යාග කරණලද්ද යම්පසයකින් ප්‍රයොජන වේද ඒ පිණිස යෙදිය හැකියි. සිවුරු පිණිස දෙනලද්ද සිවුරු පිණිස ම යෙදිය යුතුයි. සිවුරුවලින් ප්‍රයොජන නැතිකල්හි පිණ්ඩපාතයෙන් ප්‍රයෝජන ඇති කල්හි පඩු පිණිස ද යෙදිය හැකියි. සෙනසුන් පිණිස යයි දුන් මිල ගරුබඩු හෙයින් සෙනසුන් පිණිස ම යෙදිය යුතුයි. භික්ෂූන් සෙනසුන් හැරදමා ගිය කල්හි සෙනසුන් පිණිස දුන් දෙය භික්ෂූන්ගේ පරිභොගය පිණිස වුවද යෙදිය හැකිය. එහෙත් එයින් කටහැකි වන්නේ සෙනසුන්වලම කරදර නොවන අයුරු භික්ෂූන් පිළිබඳ යාපනමාත්‍රයක් පමණි. රන් රිදී පමණක් නොව කෙත්වත් ආදිය ද අකැප වස්තූහු වෙත්. එහෙයින් පිළිනොගත යුත්තාහුය. මා සතු තටාකය සඞ්ඝයාට දෙමියි යමෙක් කියයි. එය සඞ්ඝයා පිළිගණී ද, පිළිගැණීමෙහි දී ද, පරිභොගයෙහි දී ද ඇවැත් සිදුවේ. සඞ්ඝයාට තටාක පිළිගැණීම අකැපයයි කී කල්හි, "ස්වාමීනි, අසවල් අසවල් පොකුණු කෙසේ සඞ්ඝයා පිළිගත්සේක්දැයි හේ විචාරයි. ඒ කැප කොට දුන් හෙයිනැයි පැවසිය යුතුයි. කෙසේ දුන් කල්හි කැපදැයි හේ අසා. ඒ පොකුණු සිවුපසය පිණිස ලැබුනාහුයයි පැවසිය යුතුයි. එසේ නම් මේ පොකුණ ද සිවුපසය පිණිස දෙමියි කියා නම් පිළිගන්ට වටී. නැතහොත් භික්ෂූන්ගේ උදකපරිභොගය පිණිස ද, භාණ්ඩ ධොවනය පිණිස ද මෘගපක්ෂීන්ගේ ජලපානය පිණිස ද වේවායි කියා පොකුණ පරිත්‍යාග කෙරේනම් එය ද පිළිගන්ට වටී. 'මගේ මේ පොකුණ සඞ්ඝයාට දෙමි'යි කී කල්හි 'යහපත උපාසකය, සඞ්ඝයා එහි උදක පරිභොගය කෙරේ'යයි පවසා පිළිගන්ට වටී. මේ ශික්ෂා පදය ඡසමුට්ඨානය. භික්ෂූන් විසින් නිදදිටක කැපකරුවන් ඇතිබව, දූතයෙකු විසින් දෙනලද බව, තතුත්තරිවායාමය, ඒ වැයමින් ලැබීම යයි අඞ්ග සතරකින් යුක්ත වේ.

රාජ සික්ඛාපද දසවැනි නිමි.

---

පළමුවැනි චීවරවර්ගයයි.

ආලවියං– අලව්නුවර සොහොල් දනව්වෙහි සැවැත්නුවරට යොදුන් තිහක් ඈතින් පිහිටා තිබේ. මේ කාලයෙහි මෙහි ආධිපත්‍යය හත්‍ථාලවක රජතෙමේ ඉසිලීය. කොසියකාරකෙ– තිසිරි වාහන්, තිසිරි වියන්නවුන්; 'පාණකානං කොසතො නිබ්බත්තං කොසියං, තං කරොන්තීති කොසියකාරකා; සංඝාතං– විනාශය; සන්ථරිත්වා කතං හොති– සම බිමක කොසෙය්‍ය නූල් මතු මතු අතුට කැඳවතුර ඉස ඉස කරණලද්දේ වේයි. එකෙනාපි කොසියංසුනා මිස්සෙත්වා– සිහිරිපතහු (=කොසෙය්‍ය) අනෙකිනුදු මිශ්‍රකොට; වාතයෙන් පැමිණි කොසෙය්‍ය මාත්‍රයක් හා මිශ්‍රව කරණ ලද්දේද;

මේ සික්ඛාපදය ඡසමුට්ඨානය, කොසෙය්‍යනූ හා මිශ්‍රබව, තමන්ගේ ප්‍රයොජනය පිණිස සන්ථතයකරණ කරවන බව, ලැබීමය යන අංග තුනකින් යුක්ත ය.

කොසිය සික්ඛාපද ගැටපදය නිමි.

---

වෙසාලියං– විසල්පුරය වනාහි වජ්ජිජනපදයේ අගනුවරය. 'වජ්ජිගාම' යනුද මීටම නමෙකි. ගඞ්ගානදියට තුන්යොදුනක් උතුරෙන් මේ නගරය පිහිටියේ ය. රජගහනුවර සිට ද මීට යොදුන් අටකි. මෙහි වූ මහවනය හිමාලයතෙක් පැතිර සිටියේ ය. බුදුරජාණන් වහන්සේගේ මෙහි පිහිටි ගඳකිළිය කූටාගාර නමින් ප්‍රසිද්ධ ය. සුද්ධකාළකානං– ජාතියෙන් හෝ රජනෙන් හෝ හුදුකළු හෙවත් සෙසු පැහැ ඇති එළුලොම් හා නුමුසුවූවන්ගේ;

සුද්ධකාළක සික්ඛාපද ගැටපදය නිමි.

---

අන්තෙ ආදියිත්වා– සන්ථතයාගේ කෙළවර සුදුපාටින් තුවාවක් මෙන් පෙන්වා; ගොචරියානං– කිඹුල්වන්. එළුලොම් සම්බන්ධ; දෙභාගා සුද්ධකාළකානං– කළු එළුලොම් පිළිබඳ දෙකොටසක්; කළු එළුලොම් පිළිබඳ නියම ප්‍රමාණයෙන් එක් ලොමක්වත් වැඩිවූකල ඒ සන්ථතය නිස්සග්ගි වේ. සෙසු ලොම් කියනලද පමණින් අධිකවුවද වටී. සන්ථතය නම් එළුලොම් සොද ඉතා තුනීවනසේ ගෙත්තම් කොට ගත් ගුදිරි විශේෂයකි. සමුට්ඨානාදිය කොසිය සික්ඛාපදයෙහි මෙනි.

දෙභාග සික්ඛාපද ගැටපදය නිමි.

---

ඔහදන්තිපි උම්මිහන්තිපි– මල හා මූත්‍ර පහකෙරෙත්; ('හද' පුරීසොස්සග්ගෙ, 'මිහ සෙචනෙ' යනු ධාතුයි.) අනුවස්සං– අවුරුද්දෙක් අවුරුද්දෙක්; දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො සන්ථත සම්මුති– සංඝයා විසින් අසවල් භික්ෂුහට සන්ථත සම්මුතිය දෙනලදී. මෙසේ ලබනලද සම්මුති ඇති භික්ෂුව විසින් රොගය නොසංසිඳෙන තුරු ගිය ගිය තැන්තැන්හිදීම එය ලැබිය හැකිය. ඉදින් ඒ රොගයෙන් මිදී නැවත මූලව්‍යාධියෙන් හෝ ගිලනෙක් වීනම් ඒ භික්ෂුහට නැවත

සම්මුති ලැබීම් කිසත් නුවුවමනාය. ඡබ්බස්සානි ධාරෙති- අවුරුදු සයෙන් සයෙන් කරයි. පවුරුණු පොහොය ගිය පැලවිය දිනයෙහි සන්ථතයක් කරවා සවසක් සම්පූර්ණ වූ කල්හි නැවතත් පවුරුණු පොහොය ගිය පැලවිය දිනයෙහි කරවයි. සඞ්ඝසම්මුතිං දෙති-(ගිය ගිය තැන සතවුරුද්දක් ඇතුලත සන්ථත කොට ගන්නට හැකි දෙවන කම්වදතින්) මේ සම්මුතිය දෙති. ගිලානස්ස- සන්ථතය ගෙනයා නොහෙන ගිලන් මහණ තෙමේ; සමුට්ඨානාදිය කොසිය සික්ඛාපදයෙහි මෙනි.

ඡබ්බස්ස සික්ඛාපද ගැටපදය නිමි.

---

ඉච්ඡාමහං පටිසල්ලීයිතුං- තුන්මසක් මුවල්ලෙහි ප්‍රතිසල්ලීනය කරන්ට; බුද්ධරජානන් වහන්සේ මේ තෙමාස මුවල්ලෙහි ධර්මාවබෝධය කටහැකි වූ කිසිවෙකු නුදුටු සේක. එහෙයින් මා ප්‍රතිසංලීනය කළ කල්හි, ඒ ඉඩෙහිදී භික්ෂූහු අධාර්මික කතිකාවක් කරගණිති. උපසෙන තෙමේ එය බිඳ දමන්නේ ය. ඊටපසු මම භික්ෂූන් දැකීමට අනුදනිමි. එහෙයින් මා දකිනු කැමති බොහෝ භික්ෂූහු ධුතඟ සමාදන් වෙත්. මම ඒ භික්ෂූන්ට හැරදමතලද සන්ථතයන් ගැන සිකපද පණවමියි මෙසේ ද සිතූසේක. භගවතො අවිදූරෙ නිසීදෙය්‍යාථ- බුදුරදුන් ලඟ හුන්නේ; වතින් ඇතිවූ පිරිසිදු බව හෙයින් කිසි සැකයක් නො මැතිව කසුන් පව්වක් ලඟ හුන් සිහරදෙකු මෙන් බුදුරදුන් ලඟ හුන්නේ; පඤ්ඤායිස්සති- හැඟෙන්නේය; මනාපානි තෙ භික්ඛු පංසුකූලානි- මහණ තුඹට මේ පංසුකූලයෝ මනාප වෙත් ද? න ඛො භන්තෙ මනාපානි- ස්වාමීනි, මනාප නොවෙති. සිය කැමැත්තෙන් පිළිගන්නා ලද්දේ නො වෙති. ග්‍රීවය අල්ලාගෙණ හිසට පහරදෙන කල්හි මෙන් නො කැමැත්තෙන් පිළිගනිමි. පිහෙන්තා- පතන්නෝ; සන්ථතානි උජ්ඣිත්වා-(විපර්‍යාස කැණීම් ඇති බැවින්) සන්ථතයන් හැරපියා; ධම්මිං කථං කත්වා- දැහැමි කථාවක් වදරා; භාග්‍යවතුන් වහන්සේ විප්‍රකීර්ණ වූ සන්ථතයන් දැක සද්ධාදෙය්‍ය විනිපාතනය නුසුදුසුයයි සලකා පරිභොගුපායක් දක්වනසේක් භික්ෂූන් ඇමතූ සේක. සක්කං නිවාසෙතුම්පි සක්කං පාරුපිතුම්පි-එක්වරක් හඳිනු හුන් හෝ හොත්; නිසීදන සන්ථතය හෙයින් මෙහි නිවාසන පාරුපන කියක් නො දැක්වූහ. සාමන්තා- එක් පසකින්; වට හෝ සිවුරැස් කඩක් සිදගත් තැන් කියයි. මෙය වටත්පිරිසෙයින් සුගත් වියතක් පමණ වියයුතුයි. නැත වියත් ආදිය නට ප්‍රයොජනයක් කල්හි අනාපත්තියයි දැක්වූ හෙයින් නිප්පජ්ජනය පිණිස වූයේ ඇමැත් සිදුකෙරේම ය. "නිසීදන සන්ථතං නාම නිසීදන චීවරමෙව නාඤ්ඤානි" කෙචි නිසීදන චීවරං පන ඡන්නං චීවරානං අඤ්ඤතරෙන කතං අධිට්ඨානුපගං, තං කාරෙන්තො ච නානාකානි සන්ථරිත්වා සන්ථත සදිසං කාරෙන්තීති වදන්ති විමංසිත්වා ගහෙතබ්බං" යි සාරත්ථදීපනියෙහි දැක්වේ. සමුට්ඨානාදිය වෙහාස සික්ඛාපදයෙහි මෙනි.

නිසීදන සන්ථත සික්ඛාපද ගැටපදය නිමි.

උපසඤ්ඤණ්ඩසුං - (උ පූර්වක බ්‍රාතුයි) කිඤ්ඤකාණ්ඩුය. උදයො - ලාභය; සීඝංකොව අධුමති- සිවිවනම ගෙලිය; යම්සේ මිනිස්සු වසංගෙන් මහත් දර බරක් ගෙණවුත් කලාතනවූවේ නො නැමුණෙත් ම බිම හෙලත් ද, එසේ හෙලී ය. බහි තිමුශාපිසං භාගයි- තුන් යොදුන කින් පිටත හෙලයි; ඉසිලියයුතු අන් කෙනෙකු නැති කල්හි තුන් යොදුනක් ඇතුළත ගෙණයන්නහුට ඇවතක් නැත. එහෙත් සීමාව ඉක්මවූ කෙණෙහිම ලෝම ගණනින් නිසගි පවිති වේ. ඉදිනා තුන් යොදුන ඉක්මවා දමූ පොදිය ගසක හෝ කැපි ආපසු පැන තියොදුන ඇතුළත නැවතුනහොත් ගෙණගිය භික්ෂුහට අනාපත්තිය; බිම පතිත වූ පොදිය අතින් හෝ පිටකින් සීමාව ඇතුළට අදනහුට ඇවැත් සිදුවේ. එකට බැඳුන පොදි දෙකෙන් එකක් සීමාවෙන් ඇතුළත ද, අනික සීමාවෙන් පිටත ද වූ කල්හි එය නො වෙන්ව තිබෙනතුරු ම ඇවතින් මිදේ. කඩ්ඩකාණ්ඩං- එළු ලොමින් කළ බඩු; කම්බිලි කොප්පා දිය එළු ලොම් ඇලුනු භූයකින් බැඳගෙණ යන්නහුට හෝ පටන්පිරි සෙයින් කන් සිදුරුවල බැහු එළුලොම් ඇතුව තුන්යොදුන් මග ගෙවා යන්නහුට හෝ ඇවැත් සිදුවේ. මේ ශික්ෂාපදය කාය, කායචිත්ත වසයෙන් සමුට්ඨානය වේ. අකටකාණ්ඩභාවය, පඨමපටිලාභය, තමන් ගෙණ හෝ නො දන්නහුගේ යානක තබාගෙණ හෝ ගොස් තුන් යොදුන ඉක්මවීම, ආහරණ පච්චාහරණය, අවාසාධිප්පාය යයි අඞ්ග පසකින් යුක්ත ය.

එළකලොම සික්ඛාපද ගැටපදය නිමි.

---

කපිලවත්ථුස්මිං - කිඹුල්වත්පුරය වනාහි මෙකල 'තොහානා' නමින් ප්‍රසිද්ධ වූ රොහිණී නදිය අසබඩ පිහිටියේ ය. ශාක්‍ය ජනපදයන්ගේ අගනුවර වූ මෙය කපිල ඍෂිහුගේ වාසස්ථානයෙහි කළහෙයින් කපිල වත්ථු නමින් ප්‍රකටවිය. සැවැත්නුවර සිට මේ නගරයට යොදුන් පසළොසකි. රජගහනුවර සිට යොදුන් සැටකි. කපිලවත්ථුපුරය මෙකල 'පදරියා' නමින් ප්‍රකටය. විසුම්භකි-අසාපසු කරන්; උද්දෙස පරිපුච්ඡා දියෙහි යෙදෙන්ට නො හැකි වෙත්. සමුට්ඨානාදිය පූර්ණ චීවර ධොවන ශික්ෂාපදයෙහි මෙනි.

එළකලොම ධොවාපන සික්ඛාපද ගැටපදය නිමි.

---

ජාතරූපං-රන්; රජතං-රිදී; සත්ථුවණ්ණො-රන්; සත්ථුවණ්ණො විය වණ්ණො අස්සාති සත්ථුවණ්ණො' මධ්‍යපදලොප සමාසයයි; කහාපණො-රනින් හෝ රිදියෙන් කළ කාසිය; මෙය මසුරුසක් වටිනාසී සමහරු කියති. ලොහමාසකො-තඹ හෝ ලෝහාදියකින් කළ මස්ස; දාරුමාසකො-ලී හරකින් හෝ උණලි පතුරකින් හෝ පටත්පිරි සෙයින් තල්කොල කඩකින් හෝ යම්කිසි රූමක් සිටින සේ තනාගත් මස්ස; ජතුමාසකො-ලාකඩින් හෝ යම්කිසි ඉටියකින් රූමක් තනා

කළ මගිස; යෙ යෙ වොහාරං ගච්ඡන්ති- යමක් යමක් යම් යම් ජනපදයක යම් කාලෙක්හි ගණුදෙනුවට පැමිණෙත් ද; එසේ ව්‍යවහාරයට පැමිණි ඇට, සම්, රුක්පල බීජමය වූ සියල්ල යම්කිසි රුවකින් යුක්තවූයේ හෝ නුවූයේ හෝ මීට ඇතුළත් වේ. **උග්ගණ්හෙය්‍ය වා-** ගන්නේය; **සහං ගණ්හාති නිස්සග්ගියං පාචිත්තියං-** (තමන්ට ලැබුනක් හෝ සම්තැනක තිබුනක් හෝ) තෙමේ ගැණීනම් ගන්නහුට නිසගි පචිති වේ. ජාතරූප රජතයන්ගෙන් යමක් හෝ කහවණු මසුවලින් යමක් හෝ ගන්නහුට ද, ගන්වන්නහුට ද එකම ඇවතකි. දහසක් නමුත් එකට ගණී ද, ගන්වා ද වස්තු ගණනින් ඇවැත්වේ. බැඳීම ලිහිල්ව පැවති පොදියක් ගැණීමෙහි දී එහි වූ රූපගණනින් ඇවැත් සිදුවේයයි ද, ඝනව බැඳුනු පොදියක් ගැණීමෙහිදී එකම ඇවතක් සිදුවේයයි ද මහාපච්චරිය හා කුරුන්දිය අටුවාවන්හි කියති. උවසුවෙක් පැමිණ කහවණු සියයක් හෝ දහසක් මෙය නුඹවහන්සේට යයි භික්ෂුවකගේ පාමුල්හි තබයි. භික්ෂුව ද මෙය අපට අකැප යයි නොපිළිගණියි. ඉන්පසු උවසුතෙමේ මෙය නුඹවහන්සේට ම වේවායි හැරදමා ගියේය. එකෙණෙහි පැමිණි අනිකෙකු කහවණු ගැණ විචාළ කල්හි ඔහුට සියලු පවත් පැවසිය යුතුයි. ඉන්පසු හෙතෙමේ මේ ආරක්ෂා කටයුතු දෙයකැයි ආරක්ෂාස්ථානයක් විචාළේ නම් මෙතැන සුදුසු තැනකැයි ඔහුට පෙන්විය යුතුයි. එහි එය තැබූ කල්හි දොරවල් වසා ප්‍රවේශම් කළයුතුයි. පසුදින පැමිණි වෙළෙන්දෙකු පාසිවුරු ගන්වායයි කී කල්හි, මට පාසිවුරු නම් වුවමනාය. ඒ පිළිබඳව දියයුතු ධනය ද ඇත. එහෙත් කැපකරුවෙකු නැතැයි කියන්ට වටී. 'ස්වාමීනි, මම කැපකරුවා වෙමි'යි වෙළෙන්දා කියා නම් ඔහුට ඒ ධනය තිබෙන තැන පෙන්විය යුතුයි. ඉක්බිති වෙළෙන්දා සිවුරු දී ඒ නොවටිනාතරම් මුදල් ගණී නම් අපට මේ බඩු තුරුවියයි ආපහු ඔහුට භාරදිය යුතුයි. **සඞ්ඝමජ්ඣෙ නිස්සජ්ජිතබ්බං-** (උපායෙන් පරිභොගය දුක්විම පිණිස) සඟමැද නිස්සජනය කටයුතුයි දක්වූහ. **තඤ්චෙ පිසං ආවිකාතබ්බං ඉදං ඛො-** (පැවිද්දන්ට) ගිතෙල් හෝ තෙල් කැපයයි කිවයුතුයි. **රූපිය පටිග්ගාහකං ඨපෙත්වා සබ්බෙහෙව පරිභුඤ්ජිතබ්බං-** රූපිය පටිග්‍රාහකයා හැර සියල්ලන් විසින් පරිභොග කටයුතුයි. රූපිය පටිග්‍රාහකයාට අනිකෙකු ලැබූ කොටසින් සවලසයක්මත් පරිභොගකරන්ට නොවටී. ඒ මිලයෙන් ගන්නාලද ගිතෙලින් දල්වූ පහන් එලිය ඇති තැනක නිදන්ට හෝ හිඳ කිසුණු පිරියම් කරන්ට හෝ උද්ග්‍රහණාදියක යෙදෙන්ට හෝ නොහැක. ඒ මුදලින් ගත් ඇඳ පුටු ආදියක හිඳින්ටවත් හැතපෙන්ටවත්, ඒ ධනය වියදම් කොට කරවූ භොජනශාලා උපොසථාගාරාදිය පරිභොග කරන්ටවත්, ඒ රූපියපටිග්ගාහක භික්ෂුහට අකැපය. ගටත්පිරියෙහීත් ඒ ගෘහච්ඡායාවන්හි හිඳින්ට ද නො හැකිය. එසේම ඒ මිල වියදම් කොට කරවූ මගක හෝ සෙතක ගමන්කරන්ට ද, ඔරු හඟුළු ආදියකින් එතෙර වෙන්ට ද, වැව් පොකුණු ආදියකින් දිය පානය කරන්ටද නො හැකිය. ඡායාපි ඡාගොණාති- ඉදින් හොතාගම් කිසිතැනක දමයි;

විසි නො කොට හෙතෙමේ ගෙණයා නම් නො වැලැක්විය හැකිය. නො ච ඡන්දාගති- ඡන්දය නො කෙරේද, හෙතෙමේ, මට මේ ව්‍යාපාරයෙන් කිනම් වැඩක්දැයි කැමැති සේ බැහැරයේ ද, ඉන්පසු කියනලද ලකුණු ඇති රූපිය ඡඩ්ඩකයෙක් සම්මත කටයුතුයි. අනිමිත්තං කාතබ්බං-(ඇස් වසාගෙණ) අසවල් දිගයයි නො සලකා, අසුචි පිඩක් ඉවත ලීමෙහි දී මෙන් මදකුදු අපේක්ෂාවක් නො කොටයයි සේයි; මේ ශික්ෂාපදය ඡසමුට්ඨානය, ජාතරූප රජතබව, අත්තුද්දේසික බව, ගැණීම් ආදියෙන් එක්තරා එකක් බව යයි අඞ්ග තුණකින් යුක්තය.

රූපිය සික්ඛාපද ගැටපදය නිමි.

---

රූපිය සංවොහාරං- රන් රිදී පෙරළිකිරීම. සිඞ්ගපනං- සිඞ්ගාලඞ්කාරය; සන්තකානං- ඉටංකාදිය; මේ ශික්ෂාපදය ඡසමුට්ඨානය රූපිය භාවයද, පෙරළිකිරීමදැයි යන අඞ්ග දෙකකින් යුක්තය.

රූපිය සංවොහාර සික්ඛාපද ගැටපදය නිමි.

---

කතිහිපිත්‍යායං-(කතිතෙ අයං) තුඹගේ මේ දිරූ සඟළය කීදවසක් පවත්නේද? මෙහි 'හි' පදපූරණයෙහිය; 'පි' නිපාතයෙහිය; ඤත්වා- හොඳින් පිරික්සාදැනුව. ඉදින් නො හොඳයයි පසුව පෙරළාදෙන්ට නො හැකිය; කයවික්කයං- අනුන්ගේ බඩුගැණීම කය නම්. තමන්ගේ බඩු දීම වික්කය නම්. වස්ත්‍රයකට වස්ත්‍රයක් හෝ බතකට බතක් දෙවයි කියා නම් දුකුළාවේ. තමන් දෙය අනුන් අතට ද අනුන් දෙය තමන් අතට ද පැමිණී කල්හි නිස්සග්ගි වේ. මවුගෙන් හෝ පියාගෙන් යමක් දෙවයි ඉල්ලන භික්ෂුහට ඇවැත් නොවේ. මෙය ගණුවයි මවුපියන්ට දෙන භික්ෂුහට ද සද්ධාදෙය්‍ය විනිපාතය නොවේ. අදත් මයට පිළිපන් සහල් සහිත භික්ෂුවකහට බත්මුලක් සහිත මිනිසෙකු හමුවිය. උපාසකය මා ළඟ සහල් තිබේ. එයින් මට දන් පලක් නැතැයි කී කල්හි ඒ මිනිසා බත්මුල දී සහල් ගණීනම් නිවරදය. අරමකට පැමිණි භික්ෂුකෙකුට මේ බත අනුභව කොට මේ මේ දෙය කරව'යි කියා නම් වස්තු ගණනින් නිස්සග්ගි පවිතිවේ. අඝං පුච්ඡති- අගය විචාරයි; උපාසකය තුඹේ මේ පාත්‍රය කොතෙක් අගීද? මෙපමණ අගීයයි ඔහු කී කල්හි මගේ මේ කප්පියභාණ්ඩ ඊට වඩා අගනේය. එබැවින් තුඹේ පාත්‍රය අනික් තැනකට දෙවයි භික්ෂුව කී කල්හි එසේ නම් සවාමීනි අනික් තලියක් ද දෙමියි කියා නම් ගන්ට වටී. නැත හොත් උපාසකය, මේ පාත්‍රය බොහෝ අගනේය. මගේ කැප දෙය අගනේ සවල්ප මිලකැයි සවකීය පාත්‍රයෙහි අගය නොදත් උවසුහට දන්විය යුතුයි. එසේ නො දන්වා ඔහු රවටා තමන්ගේ නො අගනා බඩු දී ඒ මාහැඟි පාත්‍රය ගන්ට නො වටී. එසේ ගත් කල්හි ඒ භික්ෂුහට වටිනාකමින් දඬුවම් නියමකළ යුතුයි. ඉදින් පාත්‍ර හිමියා 'එසේ නම් සවාමීනි, ඉතිරි වටිනාකමේ හැටියට මට පිංලැබේය'යි කියා නම් හැරගන්ට වටී. අපස්සියනාරකාසස ආවිකතා හි- (මෙයින් මේ නම් දෙයක්

ගෙණ දෙමයි) කැපකරුහට කියයි. ඔහු විවාදකරමින් එය ගන්ට නැත්කරණ කල්හි නිශ්ශබ්දව සිටිය යුතුයි. කැපකරු අඥයෙක් නම් ඔහු රවටා හෝ වටිනා දේ දෙන්ට වෙළඳ නැත්තෙරේ නම් බඩු නොගත යුතුයයි කැපකරුහට දැන්විය යුතුයි. මෙය ඡ සමුට්ඨානය. කප්පිය වස්තුවක් බව, සහධම්මික නොවන බව, ක්‍රයවික්‍රයසමාපජ්ජන බව යයි අඞ්ග තුණකින් යුක්තය.

ක්‍රයවික්‍රය ශික්ෂාපද දසමපදය නිමි.

---

සන්නිචයං- රැස්කිරීම; පත්තවණිජ්ජං- (ගම්නියම්ගම්හි හැසිර කරණ) පාත්‍ර වෙළඳාම; ආමත්තිකාපණං- (අමත්තානි යෙසං භණ්ඩං ඉත ආමත්තිකා, ආමත්තිකානං ආපනං ආමත්තිකාපනං) මැටිබඳුන් විකුණන සල්පිල; තයො පත්තස්ස වණ්ණා- පාත්‍ර ප්‍රමාණ තුණකි; 'වණ්ණ' ශබ්දය වනාහි සණ්ඨාන, ජාති, රූපායතන, කාරණ, ප්‍රමාණ, ගුණ, පසංසා යන අර්ථයන්හි වැටේ. මෙහි ප්‍රමාණාර්ථයෙහිය; අඩ්ඪාළ්හකොදනං ගණ්හාති- මගධ නැළියෙන් සහල් දෙනැළියක බත අල්ලයි. සතරමිටක් කුඩුබයකි. කුඩුබ සතරක් නැළියකි. එසේ සොළොස් නැළියක් ද්‍රෝණයකි. ද්‍රෝණයහට මගධ නැළියෙන් නැළි දොළොසකි. දමිළ නැළියෙන් නැළි දෙකක් මගධනැළි එකකි. දමිළ නැළි තුණක් පැරණි සිංහල නැළි එකකි. මහට්ඨකථාවෙහි පෙණෙන හැටියට මගධනැළි එකහමාරක් පුරාණ සිංහල නැළි එකකි. චතුත්ථභාගං ඛාදනං- බතින් සිවුවැනි කොටසක් ඛාදනසංඛ්‍යාත මුගසූපය වේ. තදූපියං බ්‍යඤ්ජනං- ඒ බතට සැහෙන පමණවූ මස් මාලු පලා ආදීවූ ව්‍යඤ්ජනය; මගධනැළියෙන් දෙනැළියක සහල්වලින් පිසූ බත් ද, ඒ බතින් සතරෙන් කොටසක් පමණැති තුහීනුවූ ඉතා ඝනත්නුවූ මුං ව්‍යඤ්ජනයක් ද; වරිමාලොපයට ද ප්‍රමාණවත්වූ ව්‍යඤ්ජනයක් ද, පාත්‍රයට බෙදූකල්හි පාත්‍ර මුවවිට යටරාජිය හා සමව සිටිද, නැතහොත් පාත්‍රයෙහි මුවවිට මැදින් එක් කෙළවරක සිට අනික් කෙළවරට ඇල්ලූ හූලේ යටින් ආහාර පිහිටියේ ද මෙබඳුවූ පාත්‍රය උක්කට්ඨ නම්. බත් මුදුන රාජිය ඉක්මවා පිහිටියේ ද මේ උක්කට්ඨොමක නම්. රාජියට නොපැමිණ ඉදින් ඇතුළතම ආහාර පිහිටියේ නම් මෙය උක්කට්ඨුක්කට්ඨ නම්. නාළිකොදනං- මගධනැළියෙන් එක් සහල් නැළියක බත; පත්ථොදනං- මගධනැළියෙන් නැළි භාගයක බත; උක්කට්ඨ-මජ්ඣිම-ඔමක ආදි පාත්‍ර නවයෙන් උක්කට්ඨුක්කට්ඨ-ඔමකොමක යන පාත්‍රද්වය හැර අනික් සතම අධිෂ්ඨාන විකප්පන වසයෙන් පරිභොග කටහැකියි. මේ සතද දසදවස ඉක්මයාමෙන් නිසගිවේ. නිස්සග්ගියං පත්තං අනිස්සජිත්වා පරිභුඤ්ජති- නිසගි වූ පාත්‍රය නිසගි නොහැර පරිභොග කෙරේ ද: කැඳ හෝ පානය කොට ආහාර හෝ අනුභව කොට දෙවූ කල්හි ඒ මහණහට ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුකුළාවේ. අනාපත්ති අන්තො දසාහං අධිට්ඨෙති විකප්පෙති- දස දවස ඇතුළත අධිෂ්ඨාන කෙරේද, විකප්පනය කෙරේද, ඒ මහණහට අනාපත්ති වේ. අයොමය

පාත්‍රය පක්වපාකයකින්ද, මැටි පාත්‍රය විපාකයකින්ද පිසනලද්දේ අධිෂ්ඨානූපග වෙයි. එක් පාකයකින් උතුම්වූ නැතහොත් කාකණිකා මාත්‍ර ප්‍රමාණවූත් මිල නො ගෙවා ඉතිරිවූ පාත්‍රය අධිෂ්ඨානූපග නො වෙයි. පාත්‍රමිල කුඹිවහන්සේට පහසු දිනක ගෙවුව මැනව. පාත්‍රය අධිෂ්ඨාන කොට පරිභොගකළ මැනවැයි පාත්‍ර හිමියා කියතත් ඒ පාත්‍රය අධිෂ්ඨානූපග නොවෙයි. නියමපාක ප්‍රමාණයෙන් උතුම්වූ පාත්‍රය පාත්‍රසඞ්ඛ්‍යාවට නො පැමිණේ. එසේම නියම මිල ගෙවනතුරු ද ඒ පාත්‍රය තමහට අහිමිය. එහෙයින් ඒ පාත්‍රවයම අධිෂ්ඨානූපග විකප්පනූ පග නොවෙත්. පාත්‍ර පිසන්නෙක් පැමිණ ස්වාමීනි අසවල් දිනයෙහි පාත්‍රය නිමකරවා එවමියි මුදල් ද රැගෙණ ගියේය. එම පාත්‍රය නියම දිනට ලැබුනත් නො ලැබුනත් නියම දිනයෙහි පටන් දසදිනක් ඉක්ම යාමෙන් නිසගි වේ. පාත්‍ර පිසන්නා 'ස්වාමීනි කුඹවහන්සේට පාත්‍රය කොට දන්වා එවමියි කියා ගොස් නියම් දවසට දන්වා එව්ය. එහෙත් ඒ භික්ෂුහට ඒ පතිවිඩය නො ලැබුනි. මේ කාරණය අන්කෙනෙකු ගෙන් භික්ෂුහට දැනගන්ට ලැබුනත් නියම පතිවිඩකරුගෙන් දැන ගන්නාතුරු පාත්‍රය නිසගිවීමට කරුණු නොවේ. එතැන් පටන් දස දවස ඉක්මගියකල පාත්‍රය නිසගි වේ. කයින් කරණ අධිෂ්ඨානය, වචන යෙන් කරණ අධිෂ්ඨානයයි. පාත්‍රාධිෂ්ඨාන දෙකකි. 'ඉමං පත්තං පච්චුද්ධරාමි'යි හෝ 'එතං පත්තං පච්චුද්ධරාමි' යි සම්මුඛයෙහි හෝ අසම්මුඛයෙහි වූ පැරණි පය පච්චුද්ධරණය කොට අන් තැනකට දී අභිනව පාත්‍රය අතින් පිරිමදිමින් 'ඉමං පත්තං අධිට්ඨාමි' යි සිතින් ආභොග කොට කායවිකාර කරන්නහු විසින් අධිෂ්ඨානය කටයුතුයි. මේ කයින් කරණ අධිෂ්ඨානයයි. නැතහොත් වාග්භෙද පවත්වා වචන යෙන් අධිෂ්ඨානය කටයුතුයි. මේ වචනයෙන් කරණ අධිෂ්ඨානයයි.

පය අත්පසෙහි විනම් 'ඉමං පත්තං අධිට්ඨාමි' කියාද නැතහොත් ඔවරකණයෙහි හෝ පහය මතුයෙහි හෝ සාමන්ත විහාරයෙහි හෝ වීනම් තිබූතැන සලකා 'එතං පත්තං අධිට්ඨාමි' යි කියාද වාග්භෙද පැවැත්විය යුතුයි. අධිෂ්ඨානය කරන්නහු විසින් හුදෙකලාව හෝ අධිෂ්ඨාන කටහැකිය, කෙනෙකු ලඟදී හෝ අධිෂ්ඨාන කටහැකිය. දශපාත්‍රයක් ලැබූ භික්ෂුව ඉදින් දශපාත්‍රයම අධිෂ්ඨානයෙන් පරිභොග කරන්ට කැමැතිවන්නේ නම් ඒ භික්ෂුව විසින් එක්වරම අධිෂ්ඨාන නො කොට පළමු දිනයෙහි එක් පාත්‍රයක් අධිෂ්ඨාන කොට දෙවෙනි දිනයෙහි එය පච්චුද්ධරණය කොට දෙවෙනි පය අධිෂ්ඨාන කටයුතුයි. මේ ක්‍රම යෙන් සියක් වසක් නමුත් පරිහරණය කටහැකිය.

"දිනන විකප්පනපච්චක්ඛා-කාලකිරිය කතෙන ච
ලිඞ්ගපච්චුද්ධරා චෙව-ඡිද්දෙන භවති සත්තමං"

යනු හෙයින් යම් කෙනෙකුගේ පාත්‍රය පරිත්‍යාග කිරීමෙන්ද, සිවුරු හැරයාමෙන් ද, සික්ඛාපච්චක්ඛානයෙන් ද, කළුරිය කිරීමෙන් ද, ලිඟු පෙරළීමෙන් ද, පච්චුද්ධරණයෙන් ද, සිදුරුවීමෙන් ද පාත්‍රාධිෂ්ඨානය බිඳේ. සම්මුඛ පරම්මුඛ වසයෙන් විකප්පනය ද දෙපරිදියි. 'ඉමං පත්තං

(=ඉමෙපතෙත) තුය්හං විකප්පෙමි' යි කීම සම්මුඛ විකප්පනයයි. මෙප මණකින් පාත්‍රය ආරක්ෂාකොට තබන්ට හැකිය. පරිභොගකිරීම හෝ පරිභොගයෙන් වෙන්කිරීම හෝ අධිට්ඨානයකිරීම හෝ නො කටහැකි වෙයි. "මය්හං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථා පච්චයං කරොහි වා" මෙසේ කී කල්හි පච්චුද්ධරණය වේ. එතැන්පටන් පරිභොගාදිය කිරීම වටී. සමුට්ඨානාදිය පඨම කඨින සික්ඛාපදයෙහි මෙනි.

පඤ්ච සික්ඛාපද ගැටපදය නිමි.

ඌනපඤ්චබන්ධනෙන- සම්පූර්ණනුවූ බැඳුම් පසකින් යුක්තවූ; 'ඌනානි පඤ්චබන්ධනානි අස්සාති ඌනපඤ්චබන්ධනො' යනු විග්‍රහයි. ඉත්ථම්භූතාර්ථයෙහි කරණ විභක්තියි. ධබ්ධුලාරාජි න හොති-මුවවිටින් යට දෙ අඟලක් පමණවූ ගැස්මක් නොමැති වේද; යස්ස ද්වඞ්ගුලා රාජි හොති- යම් පාත්‍රයක දෙ අඟුල් ගැස්මක් වේද; ඒ ගැස්මෙහි යට කෙළවර පාත්‍ර විදිනා කටුවකින් විද සමකොට හුයකින් හෝ තිගඳ කෙන්ඳකින් හෝ ඊයමින් හෝ බැඳ, ආමිස නො ලැගීම පිණිස ඊයමින් හෝ එබඳු ඉටි විශෙෂයකින් වසාදැමිය යුතුයි. පසුව පාත්‍රය අධිට්ඨාන කොට පරිභොගයට ගතහැකියි. කුඩා සිදුරු කොට හෝ බැඳිය යුතුයි. පැණියෙන් පිසගත් ගල්කුඩු මිශ්‍රණයෙන් හෝ පිළියම් කටයුතුයි. දෙ අඟුල් පමණවූ රේඛා දෙකක් හෝ සතරඟුල් පමණ එක් හිරක් වේනම් එහි බැම් දෙකක් තැබියහැකියි. එබඳු රේඛා තුණක් හෝ සාඟුල් එක් රේඛාවක් හෝ වූකල බැම් තුණක් ද, දැඟුල් රේඛා සතරක් හෝ අටඟුල් එක් රේඛාවක් හෝ වූකල බැම් සතරක් තැබියහැකිය. දැඟුල් රේඛා පසක් හෝ දසඟුල් එක් රේඛාවක් හෝ ඇතිකල එය අපාත්‍ර සඞ්ඛ්‍යාවට ගැණේ. එහෙයින් අතික් පාත්‍රයක් විඥපනය කටයුතුයි. ඡෙරෙ වත්තබ්බො- ("සවාමීනි මේ පාත්‍රය ප්‍රමාණ යුක්තය, සුන්දරය, තෙරුන්ට සුදුසුය, පිළිගත මැනවැ) යි තෙර තෙමේ දන්විය යුත්තෙකි. න ගණ්හෙය්‍ය- නො ගණී නම්; එසේ අනුකම්පාවෙන් නො ගන්නහුට දුකුළා වේ. මට අතික් පාත්‍රය කින් කිම්දැයි සතුටු සිතින් නො ගණීනම් එකල ඇවැක් නැති. පත්තපරියන්තො- අතින් අතට පෙරළිකිරීමෙන් කෙළවර සිටි පාත්‍රය; අදෙය්‍යො- නුසුදුසු තැන්හී; ඇඳ පුටු සත් නාඳත් ආදිය අදෙසයි. එහි පාත්‍රය තැබීමට නුසුදුසුය. එහෙයින් ඛන්ධකයෙහි "අනුජානාමි භික්ඛවෙ ආධාරකං" යි වදාරණලදී. අභොගෙන-නුසුදුසු පරිභොගයෙන්; කැඳ පිසීම් පඩු සිඳවීම් ආදිය පිණිස පාත්‍රය නො යෙදිය යුතුයි. අතරමගදී ලෙඩක් වැළඳුන කල්හි, අන් බඳුනක් සපයා ගත නො හැකිනම් පාත්‍රයෙහි මැටි ආලේපකොට එහි කැඳ පිසීම හෝ වතුර හුණුකරගැණීම නිවරදය. න විස්සජ්ජෙතබ්බො- කිසිවෙකුට නො දියයුතුයි. ඉදින් සද්ධිවිහාරිකයෙක් හෝ අතෙවාසික යෙක් හෝ පැමිණි ඉම් පශ සුදුසු තෙරුන්ට ය මට තෙරුන්ගේ

'පාත්‍රය වටනේයයි ගණිතම් කියයුත්තක් නැත. අනිත් භික්ෂුනමක් හෝ එය ගෙණ තමන්ගේ පාත්‍රය තෙරුන්ට පිළිගන්වා නම් එසඳ තිවර දෙය. **පවාරිතානං**- පැවරූවන්ට; මේ ශික්ෂාපදය ෂට්සමුට්ඨානය. උනු පස්බැඳුම් ඇති බවය, අත්තුද්දෙසික බවය, අකට විඤ්ඤත්ති බවය, එයින් ලැබීමය යන සිව් අඟකින් යුක්තය.

**ඌනපඤ්චබන්ධන සික්ඛාපද** ගැටපදය නිමි.

---

**අත්ථො භන්තෙ**- ස්වාමීනි ප්‍රයොජන වේද; රජතෙමෙ තෙරුන්ගේ ප්‍රයොජනය පිණිස ලෙන සුද්ධකිරීමෙහි උත්සාහවත්වූ භික්ෂූන් දුක ආරාමිකයෙකු දෙනු කැමැත්තේ මෙසේ පිළිවිසීය. **ආරාමිකො**- භික්ෂූන්ට කටයුතුවත් සපයාදීම පිණිස අරමෙහිම නියුක්ත තැනැත්තෝ; මෙය බුදුරජානන් වහන්සේ විසින් ආරාමික නාමයෙන් දාසපරිග්‍රහය භික්ෂූන්ට අනුඥාත තැනකි. **පිලින්දගාමකො ගාමො**- අන් ගමක්; **ආරාමිකගාමො**- ආරාමිකයන්ගේ ගම; මේ ගමෙහි ආරාමිකකුල පන්සියය හැර අන් කෙනෙක් නුවූහ. **මාලාකිතා**- මල්මාලා දරන් තවුන්; **තිණණ්ඩුපකං**- තණ කැරැල්ලක්; තණවලින් සාළ දරණුවක්; **පටිමුඤ්චි**- නැබීය. 'පටි පූර්ව මුච' ධාතුයි. මෙහි 'පටි' යන අව්‍යයපදය ධාත්වර්ථය බාධාකරයි. **සා අහොසි සුවණ්ණමාලා**- ඒ දූරිය රන්පියුම් මල්දමක් දරන්නිය විය. මෙය තෙරුන්ගේ අධිෂ්ඨානය ලෙස සිදුවූවකි. ඇගේ හිසෙහි තණ සුඹුලුව පතිතවත් ම ස්ථවිරතෙමේ එය 'සුවණ්ණ මාලා හොතු' යි අදිටන් කෙළේය. **සුවණ්ණකානි අධිමුච්චි**- ඝනය රන් මුවා වේවායි ඉටීය. මෙහි 'අධිමුච්චි' යනු 'අධිට්ඨාසි' යන අර්ථයෙහිය. **කොළුම්බ**-පතුල් මුවයුත් සැළියෙහි; **ඝටෙ**- කළගෙහි; **ඔලීනවිලීනානි**- යට ද දෙපසෙහි ද ඉතිරා වැගිරගියාහු; **ඔකිණ්ණවිකිණ්ණා**- (ගිතෙල් සුවඳින් බිම කතිත්තාවූ මීයන්ගෙන් ද, බිත්ති කතිමින් වහලෙහි හැසිරෙන්නාවූ මීයන්ගෙන් ද) විහාරයෙහි ආකීර්ණවූවෝ; ඔකිණ්ණ නම් බිම කතින මීයන්ගෙන් ගහනවීමයි. විකිණ්ණ නම් බිත්ති කතිමින් උඩ හැසිරෙණ මීයන්ගෙන් ගහනවීමයි. **අයොනා කොට්ඨාගාරිකා**- විහාරය ඇතුළත පිහිටුවාගත් කොටුගුළු ඇත්තෝය; **පටිසායනීයානි**- අනුභව කටයුතුවූ; **භෙසජ්ජානි**- ඔසු; බෙහෙත් කිස කෙරෙත්වා, නැතහොත් නො කෙරෙත්වා මෙවුහු 'භෙසජ්ජ' නාමයෙන් ප්‍රකටයහ. **යෙසං මංසං කප්පති**- යමෙකුගේ මස් කැපවේද; මෙය බැඳෑරලිය යුතු සත්ත්වයන් දක්වයි. මිනිසතාදීන්ගේ මස් නැප හෙයින් ඔවුන්ගේ ගිතෙල් ද කැපය. මස් අකැප සතුන්ගේ ගිතෙල් ආදිය ද අකැපය. මිනිස් කිරි කැපය. එහි ගිතෙලුත් කොයින් ද; 'යෙසං ඛීරං අත්ථි සප්පිපි තෙසං අත්ථි' යන මෙම වෙහුගය වචනයෙන් දෙශනා කරණලදී. **සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි**- සතරත්තක් කොට තබා අනුභව කටයුතු දේ; පෙරබත් කල පිළිගත් ගිතෙල සාමිසවූව ද නිරාමිසවූව ද පෙරබත්කල ම වටී. පසුබත්කල සිට සත්දිනක් මුළුල්ලෙහි නිරාමිසව වැලඳිය යුතුයි, පිළිගත් දින පටන් සත්දවස ඉක්ම

ගිය කල්හි බඳුන් ගණනින් නිසගි වේ. පෙරබත්කල හෝ පසුබත් කල කෙනෙකුගෙන් නො පිළිගෙණ පරිභොගය පිණිස තමන්ම ගෙණ තැන්පත්කොට තැබූ දෙය ඒ භික්‍ෂුහට අනුභව කිරීමට නුසුදුසුය. ඇඟ ගැල්වීම් ආදියෙහිදී නිවරදය, සත්දවස ඉක්මගිය ද වරදක් නැති; අනුපසම්පන්නයෙක් පෙරබත්කල පිළිගත් වෙඬුරෙන් ගිතෙල් කොට භික්‍ෂුවකට පිළිගන්වයි. එය පෙරබත්කල ඒ භික්‍ෂුහට සාමිසව වටී. තමන් නිපදවාගත් ගිතෙල සත්දවසක් මුළුල්ලෙහි නිරාමිසව වටී. පසුබත්කල පිළිගත් වෙඬුරින් යම්කිසිවෙකු විසින් නිපදවූ ගිතෙල සත්දවසක් මුලුල්ලෙහි නිරාමිසව වටි. පෙරබත්කල පිළිගත් කිරෙන් හෝ දීයෙන් අනුපසම්පන්නයෙකු විසින් කරණලද ගිතෙල පෙරබත්කල සාමිසව වටී. තමන් විසින් කරණලද්දේ නම් නිරාමිසව වටී. **වසාතෙලං**– වුරුණු තෙල, "අනුජානාමි භික්ඛවෙ වසානි අච්ඡවසං, මච්ඡවසං, සුසුකාවසං, සූකරවසං, ගද්‍රභවසං" යි පස් වුරුණු තෙලක් අනුඥාතය, 'අච්ඡවසං' යන්නෙන් මිනිතෙල් හැර සියලු ම අකැප මස් පිළිබඳ වුරුණු තෙල් නියමිතය. මනුස්‍ය, හස්ති, අශ්ව, සුනඛ, අහි, සිංහ, ව්‍යාඝ්‍ර, දීපි, අච්ඡ, තරච්ඡ යන මොවුන්ගේ මස අකැප වේ. මිනිස් තෙල් හැර සියලු තෙල් වගී කැප වේ. සියලු කිරිවගී ම කැපය. **මධුනාම මක්ඛිකා මධු**- මී නම් මීමැසි බඹරු ආදීන් විසින් කරණලද මීයි; පෙරබත්කල පිළිගත්තාලද්ද පෙරබත්කල සාමිස පරිභොගයෙන් ද, පසුබත්කල පටන් සත්දිනක් ඇතුළත නිරාමිස පරිභොගයෙන්ද වටී. සත්දින ඉක්මගිය කල්හි වත්තුගණ නින් නිසගිවේ. **ඵාණිතං නාම උච්ඡුම්හා නිබ්බත්තං**– අවස්තුකවූ උක්රසය පැණි නම්. කසට නොමැති උක්රසය සත්තාහකාලික වේ. උක්දඬු හෝ රසය හෝ කසට සහිත වූයේ යාවකාලිකය; නිකසටවූ උච්ඡුරසය උදකසම්භින්නවූයේ යාවකාලික වේ. අසම්භින්නවූ උක්රසය සත්තාහකාලිකය, පුඩු කසටය වනාහි යාවජීවිකය. **ඕයාපෙෂ්ති**– (ස්සිංවකුට නොදී බලාපොරොත්තු රහිතව) විසිකරයි. **විනාසෙති**– අපරිභොගයට ගෙනයි; **වළඤ්ජති**– (යම් සිවුරක් බෙහෙත් හැරදමන ලද්දේද) ඒ සිවුරත්; මෙ ශික්‍ෂාපදය කඨින සමුට්ඨානය; ගිතෙල් ආදිය පිළිගත් බවය, තමන් සතුබවය, සත්දවසක් ඉක්මීමයයි අඞ්ග තුණකින් යුක්ත වේ.

**භෙසජ්ජ සික්ඛාපද ගැටපදය නිමි.**

---

**වස්සික සාටිකා අනුඤ්ඤාතා**– වැසිසළුව (චීවරක්ඛන්ධකයෙහි විසාඛාවස්තුවෙහිදී) අනුදන්නාලදී. **පටිකච්චෙව**–පළමුකොට ම; **මාසසෙසො ගිම්හානං**– ගිම් සිවුමසින් පැසුළු මස ඉතිරි වූයේ; **කත්වා**– (ගෙත්තම් කිරීමය, රැඳීමය, කප්බින්දු තැබීමය යන මොවුන්) සීම කොට; එකක් ම වස්සාන කාලයෙහි අධිෂ්ඨාන කාමයුතුයි දෙකක් අධිෂ්ඨානකරන්ට නො වටී. **අඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති**– ගිම්හානයෙහි අතිරේක මාසයක් ශේෂව ඇති කල්හි; වැසිසළුව පිළිබඳ

පරියෙසනක්ඛෙත්ත, කරණක්ඛෙත්ත, නිවාසනක්ඛෙත්ත, අධිට්ඨානක්ඛෙත්ත යන මොහු මෙසේ දතයුත්තාහුය. පොසොන් පුරපස ලොස්වක ගිය පැසුළු පාටිපදිකයේ පටන් එම අමාවකිය තෙක් අතරවූ අඩමස පර්යෙෂණක්ෂෙත්‍රය ද, කරණක්ෂෙත්‍රය ද වෙයි. මේ අතර කාලයෙහි වැසිසළුව නො ලබනලද නම් සොයන්ට ද ලබන ලද නම් කරන්ට ද වටී. නිවාසන අධිට්ඨාන දෙකට මේ කාලය නුසුදුසුය. වජිරබුද්ධියෙහි, "මාසෙ සෙසෙ ගිම්හානං" යි වදාළ හෙයින් මේ කාලයතුළ නො ලබනලද්ද පර්යෙෂණය කරන්ට පමණක් වටී යයි ද, කරණනිවාසන අධිට්ඨානයන්ට නුසුදුසුයයි ද දක්වයි. කාලපක්ඛපොසථයාගේ පශ්චිමපාටිපදියෙහි පටන් ඇසළ පුණුපොහොය තෙක් පැවැති මේ අඩමස පර්යෙෂණ කරණ නිවාසනයන්ට ක්ෂෙත්‍ර වෙයි. අධිට්ඨානයට නුසුදුසු වෙයි. ඇසළ පුණුපොහොය ගිය පශ්චිම පාටිපදියෙහි පටන් ඉල් පුණුපොහොය තෙක් ඇති මේ සිවුමස පර්යෙෂණ, කරණ, නිවාසන, අධිට්ඨාන යන සතරටම ක්ෂෙත්‍රවෙයි. මේ කාලයෙහි නො ලැබුනක් සපයාගන්ට ද, ලැබුනක් පිළියෙල කර ගන්ටද, එසේ ම හඳින්ට ද, අධිට්ඨාන කරන්ට ද හැකිවෙයි. නග්ගො කායං ඔවස්සාපෙති ආපත්ති දුක්කටස්ස- නග්නවූයේ ස්නානය කෙරේද දුකුළා ඇවැත්වේ. මෙහි ඇවැත් නැ දියබිඳු ගණනින් නියම නොකොට පරියොසාන කිරීම් වශයෙන් නියමකළ යුතුයි. පියඹි අගින් වැටෙන දියෙන් නහන තැනැත්තහුට ද, එසේ ම වැව් පොකුණු ආදියෙහි කළවලින් දිය ඇද නහන්නහුටද අනාපත්ති වේ. වස්සං උක්කඩ්ඪියති- වස්සානය පිළිබඳ ප්‍රථම මාසය ඉදිරියට ගණු ලැබේ; වැසිසළු කොට නිමිකල්හි, ගිම්හානයාගේ පැසුළු මස ගෙවිගියකල්හි, අධික මාස පතනයෙන් වස්සාන ඍතුහුගේ ප්‍රථම මාසය ගිම්හාන ඍතුහුගේ පැසුළු මාසය කොට වස්සුක්කඩ්ඪනය කෙරෙති. එකල වැසිසළුව සෝදා නවා තැබිය යුතුයි. අනධිට්ඨිත අවිකප්පිත වැසිසළුව දෙමසක් කල් තබාගත හැකිවෙයි. නැවත වස්එළඹෙන දිනයෙහි අධිෂ්ඨානය කටයුතුයි. නො සිඟියෙන් හෝ නො පොහොනා හෙයින් නො කළ වැසිසළුව මුල් දෙමස හා වස්සාන ඍතුහුගේ සාරමසදූයි සමසක් මුළුල්ලෙහි තබාගතහැකි වෙයි. ඉල්මසෙහි කඨිනය අතුරණු ලැබී නම් අතික් සාරමසදූයි දසමසක් ම පරිහාරය ලබයි. ඉන් මතුද බලාපොරොත්තු ඇති කල්හි මූලචීවරය කොට තබන්නහුට එක් මසක්දූයි එකොළොස්මසක් පරිහාරය ලැබේ. අච්ඡින්නචීවරස්ස- නට සෙසු සිවුරු ඇත්තහුට; මේ භික්ෂුහට වැසිසළුව නොකල්හි සෙවීම් හැඳීම් ආදියෙන් අනාපත්ති වේ. ආපද- සොරුන්ගෙන් වන උවදුරු; මේ ශික්ෂාපදය ඡසමුට්ඨානය. අනාදෙශක බවය, නො සමයෙහි සෙවීම් බවය, එයින් ලැබීමයයි අඞ්ග තුණකින් යුක්තවේ.

වස්සිකසාටික සික්ඛාපද ගැටපදය නිමි.

**යම්පිතාහං**- (යම්පි තෙ අහං) යම් කාරණයක් නිසා තුඹට මම; ඇවැත්නි මා සමග ජනපද චාරිකාවෙහි හැසිරෙයි යන කාරණ හෙතුකොට ගෙණ තුඹට මම සිවුරක් දුනිම්. එයම නො කෙරෙහි යයි කිපියේ නො සතුටු සිත් ඇත්තේ දුන් සිවුර උදුරාගනී තමන්ගේය යන හැඟීමෙන් ගත් හෙයින් පරිජි ඇවැත් සිදු නොවේ. කරදර කොට ගත් හෙයින් ඇවැත් සිදුවේ. **සයං අච්ඡින්දති නිස්සග්ගියං පාචිත්තියං**- තෙමේ උදුරාගණිනම් නිසගි පචිති වේ. එකම සිවුරක් හෝ එකට බැඳි සිවුරු මිටියක් හෝ උදුරන්නහුට එකම පචිතියකි. වෙන් වෙන්ව තිබූ බොහෝ සිවුරු උදුරන්නහුට වස්තුගණනින් ඇවැත් සිදුවේ. මා දුන් සියලු සිවුරු ගෙණඑව' යි කියන්නාහුට එකම වචනයෙන් බොහෝ ඇවැත් සිදුවේ. **අඤ්ඤං ආණාපෙති ආපත්ති දුක්කටස්ස**- 'සිවුරු ගණුව' යි අනිකෙකුට අණකෙරේ නම් දුකුළා ඇවැත් වේ. 'සිවුර උදුරාගණුව' යන ආපත්තියට එකම සිවුරක් විෂයවන හෙයින් බොහෝ සිවුරු ගත් නමුත් අණ කළ තැනැත්තහුට සිදුවන්නේ එක ම ඇවතකි. **අඤ්ඤං පරික්ඛාරං**-අන් පිරිකරක්; විකප්පනූපග පචිම චීවරය හැර අතික් ඉඳිකටුව ඔතාතිබූ රෙදිකඩ නමුත් පැහැරගන්නහුට වස්තුගණනින් දුකුළා වේ. බැම් ලිහිල්ව තිබූ මිටියක් පිළිබඳවද ඇවැත් සිදුවන්නේ වස්තුගණනින්යයි මහාපච්චරියෙහි කියති. **සො වා දෙති**- හෙතෙමේ හෝ පරිභොග කෙරෙයි. ස්වාමීනි, තුඹවහන්සේට මෙය සරුප්යයි පරිත්‍යාග කොට දෙනලද්දක් නමුත් නැවත උදුරාගන්නහුට භණ්ඩග්ඝ වශයෙන් ඇවැත් නියම කළ යුතුයි. මෙය කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. විකප්පනූපග පැසුළු සිවුරක් බවය, තමන් දෙනලද්දක් බවය, තමන්ගේය යන හැඟීම් ඇතිබවය, උපසම්පන් බවය, ක්‍රොධ වශයෙන් ඉදිරීම හෝ ඉදිරවීම යයි මෙය අඞ්ග පසකින් යුක්තවේ.

**චීවර අච්ඡින්දන සික්ඛාපද තැමඤදශ නිමි.**

---

**ඛොමං**- කොමු වැහැරියෙන් කළහු; **කප්පාසිකං**- කපු පුළුනින් කළහු; **කොසෙය්‍යං**- කොසිය කෙදිවලින් සැපයූහු; **කම්බලං**- එළු ලොමින් කළහු; **සානං**- හන කෙඳිවලින් කළහු; **භඞ්ගං**- තියඳ කෙඳිවලින් කළහු: ඛොම, කප්පාසික, කොසෙය්‍ය, කම්බල, සාන යන පස්වචයින් එකට මිශ්‍රකොට කළහු යයි ඇතැම් කෙනෙක් කියත්. **වායාපෙති පයොගෙ පයොගෙ දුක්කටං**- වියවා නම් ප්‍රයොගයෙක්හි ප්‍රයොගයෙක්හි දුකුළා වේ. සිවුර වියවන භික්ෂුහට පෙහෙරාගේ හැම ප්‍රයොගයක් පාසා දුකුළා වේ. පෙහෙරු එය දිගින් වියතක් පමණ ද සරසින් රියනක් පමණ ද වියා නිමකළ කල්හි භික්ෂුහට නිසගි පචිති වේ. **වායාපෙය්‍ය**- (ඇවැත, මට සිවුරක් වියවයි අකැප වචන වචනයෙන් කියා) වියවන්නේ නම්; තමන් විනවාගත් හූ ද අයැපය. නෑ ආදීන්ගෙන් ලැබුනක් නම් කැපවෙයි. පෙහෙර තෙමේ ද අඤ්ඤාතක අප්පවාරිත වේ. **විඤ්ඤත්තියෙන්** ලැබුනක් නම් ශේද අකැපය.

අන්‍යූ කැපවෙත්. අකැප නූලින් අකැප පෙහෙරෙකු ලවා වියවා නම් නිසගි පචිති වේ. කැප නූලින් අකැපතන්තවායහු ලවා වියවන භික්‍ෂු හට ද නිසගි පචිතිවේ. අනාපත්ති චීවරං සිබ්බේතුං- සිවුරු මැහීම පිණිස නූල් වීනවන්නහුට අනාපත්ති වේ. මේ ශික්‍ෂාපදය ඡසමුට්ඨානය. නූල් අකැප බවය, තමන් උදෙසා කළ බවය, අකැප පෙහෙර විසින් අකැප විඤ්ඤත්තියෙන් කළ බව යයි අඞ්ග තුණකින් යුක්තවේ.

සුත්ත විඤ්ඤත්ති සික්ඛාපද ගැටපදය නිමි.

---

සුත්තං ධාරයිස්සථ-(වියනු ලබන වස්ත්‍රයට සැහෙනසේ) හූ ප්‍රමාණය කොට; අප්පිතං- ඝන; සුවීතං- සියලු තැන් සමව සිටිනසේ වියූ; සුප්පවායිතං-සියලු තැන් සමව සිටිනසේ හූ එලූ; සුවිලෙඛිතං-ලෙඛනියෙන් මනාව ඉරිඇදී; සුවිතච්ඡිතං- කොස්සෙන් ගසා මනාකොට සෝදා පිරිසිදුකළ; කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාම- දහම් දෙසීම් පමණකින් හමුදු කිසි සංග්‍රහයක් කරන්නේ නම්; පටිබද්ධං- විකලවෙව; තානෙන- හූ; මෙයින් දග අතට එලූ හූ ගැණේ; තත්‍ර චෙ සො භික්ඛු- පෙහෙරහු යම් ගමක හෝ යම් ගමක වෙසේ නම් එහි වසනා මහණතෙමේ; නැතහොත් යම් භික්‍ෂුවක් උදෙසා සිවුර වියාතම් ඒ මහණතෙමේ; විකප්පං- අධික විධානය; ධම්මම්පි භණති- බණකතාවක් හෝ කියාද; පුබ්බෙ අප්පවාරිතො- සිවුරු හිමියන් විසින් පෙර නො පවරණලද්දේ; මෙය ඡසමුට්ඨානය; අධික විධානයට පැමිණීම බව, සිවුර අන්‍යාතෝද්දෙසිකබව, ඔහුගේ බසින් නූල් වැඩිකිරීම, චීවර ප්‍රතිලාභයයි අඞ්ග සතරකින් යුක්තවේ.

මහා පෙසකාර සික්ඛාපද ගැටපදය නිමි.

---

පවාසං- තොරට විසීම; දසාහානාගතං- (දස අහානි දසාහං, තෙන දසාහෙන අනාගතං) දසදිනකින් පවාරණය නො පැමිණි කල්හි; භුම්මාර්ථයෙහි උපයොග වචනයයි. 'පවාරණය' යනු තුමුත්‍රා බව පිණිස යෙදූනු අනුප්‍රයොග වචනයකි. කත්තිකතෙමාසික පුණ්ණමං- වප් පුණුපෝයෙහි; මෙයද භුම්මාර්ථයෙහි උපයොග වචනයි; අච්චෙක චීවරං- ඉක්මන් සිවුර; යමක් කරණකොටගෙණ සිවුරක් දෙනු කැමැත්තහු විසින් දූතයෙකු එවා හෝ තමා පැමිණ හෝ 'වස්සාවාසිකං දස්සාමි'යි ආරොචනය කොට දෙනලද්ද අච්චෙකචීවර නම්. වප්පුර පසළොස්වකයෙහි පවත් එම පුණුපොහොය තෙක් වස්එළඹි භික්‍ෂූන්ට වස්සාවාසික වශයෙන් ලැබෙන ඉක්මන් සිවුරු අච්චෙක චීවර සංඛ්‍යාවට ගැණේ. පසළොස්වකයෙන් පෙර ලැබූ සිවුරු ද පංචමියෙහිදී බෙදා වෙන්කොට ගත් කල්හි අච්චෙක චීවර පරිහාරය ලබයි. සඤ්ඤාණං කත්වා නික්ඛිපිතබ්බං-ලකුණක් කොට තැබිය යුතුයි. මෙසේ අච්චෙක චීවරය පිළිගත්තහු විසින් වස්සච්ඡෙදය නො කටයුතුයි.. ඉදින් වස් සිඳුනේ නම් ඒ සිවුර සඟසතුවෙයි. අච්චෙකචීවර සඤ්ඤී- අච්චෙක චීවරයක යන හැඟීම ඇත්තේ; මෙය බෙදා වෙන්කොට ගත් සිවුර සඳහා කියනලදී. නො බෙදනලද්ද, සාඞ්ඝික භාණ්ඩාගාරයෙහි වූ

සිවුරුද චීවර සමය ඉක්මගියකල්හි ඇවැත් නොකෙරෙති. අති

රෙක චීවරය පිළිබඳ පරිහාරය දසදිනකි. නොසාළු මැසියළුව පිළිබඳ පරිහාරය කඨිනය නො ඇතිරූ කල්හි පස්මසකි. වස්සිකසාටිකය කාලකල්හි සිවුමසකි. කඨිනය ඇතිරූ කල්හි අතික් සිවුමසත්ද, හේමන්ත පශ්චිමදිනයෙහි මූලචීවරාධිෂ්ඨාන වශයෙන් ලැබෙන ඉතිරි මසක්දැයි එකොළොස් මසකි. මූලචීවරය පිළිබඳ පරිහාරය එක් මසකි. අච්චේකචීවරය පිළිබඳ පරිහාරය කෙළින් උදුළුකල්හි එකාදශදිවසාධික පස්මසකි. කෙළින් නුදුළුකල්හි එකාදශදිවසාධික එක් මසකි. මින් ඔබ්බෙහි එක් දවසක්වත් පරිහාරය නො ලැබේ. අච්චේක චීවරෙ- අත්‍යායිකචීවර සඳැහැවූ අතිකෙත්හි; මේ ශික්ෂාපදය කඨින සමුට්ඨානය, විකප්පනූපග පශ්චිමචීවර ප්‍රමාණවූ අච්චේකචීවරයා තමන් සතු බවය, දසදිනකින් නො පැමිණි වප්පුණ්ණපොහොයෙහි උපන්බවය, අනධිෂ්ඨිත අවිකල්පිත බවය, චීවරකාලාතික්‍රමයයි අඞ්ග සතරකින් යුක්තවේ.

අච්චේකචීවර සික්ඛාපද ගැටපදය නිමි.

---

වුත්ථවස්සා ආරඤ්ඤකෙසු සෙනාසනෙසු- වැස නිමවූ වස් ඇත්තෝ අරණ සෙනසුන්හි; මේ භික්ෂූහු පෙර ද ආරණ්‍යකයෝය. සිවුරු දුර්ලව ගිය බැවින් ප්‍රත්‍යය පහසුව පිණිස ග්‍රාමාන්ත සෙනසුන්හි වස් එළඹ නිමකරගත් සිවුරු ඇත්තෝ පළිබෝධයන්ගෙන් වෙන් වූවෝ මහණකම කරමුයි අරණ විසීමට ගියාහුය. කත්තිකචොරකා- ඉල්මස් කාලයෙහි හැසිරෙණ සොරු; පරිපාතෙන්ති-උවදුරු කෙරෙත්; එහා මෙහා දුවපැන ගියගත්වා පලවාහරිත්. අනුජානාමි භික්ඛවෙ ... අතුළුනම්හි තබන්ට; දුහැමින් සෙමෙන් ලැබිය හැකි පසය දුර්ලභවේ. යෝගී භික්ෂූහු මවුගෙන් නමුත් ඉල්වන්ට කැමැති නොවෙත්. එහෙයින් සිවුරු පරෙස්සම්වීම පිණිස අන්තරඝරයෙහි තබන්ට අනුදත් සේක. අරණ්‍යවාසය භික්ෂූන්ට සුදුසු හෙයින් ප්‍රතික්ෂේප නො කළසේක. උපවස්සං පනා-වස් එළඹ වනාහි; 'උපවස්සං' යන තන්හි අනුනාසික ලොප, 'උපගම්පජ්ජං' යන තන්හි මෙන් පැමිණියේකි. පශ්චිමකාර්තික පෞර්ණමිය අවසන් කොට ඇතිකාලය මුඳුල්හිලෙහි වන සෙනසුන් භය සහිතය. එබඳු සෙනසුන්වල වසන භික්ෂූන් ඉසින් කැමැතිනම් තුන් සිවුරින් එක්තර සිවුරක් අන්තරඝරයෙහි තැබියහැකි වෙයි. යම්හෙයකින් යම් භික්ෂුනමක් වස් එළඹ ප්‍රථම කාර්තික පෞර්ණමිය තෙක් වෙසේ ද, හෙතෙමේ වස්වැස නිමවූවන්ගේ සංඛ්‍යාවට ඇතුලත්වේ. වුත්ථ වස්සානං- වැස නිමවූ වස් ඇති භික්ෂූන් අතුරෙන්; සාසඞ්ක සම්මතානි- සාසඞ්කයයි සම්මතවූ; එහි සොරුන් වසන බැව් දත් හෙයිනි. සප්පටිභයානි- වල් මෘගයන් වසන හෙයින් බිය සහිතවූ; සමන්තා ගොචරගාමං නික්ඛිපෙය්‍ය-වන සෙනසුන භාත්පස වූ දිගුන් අතුරෙන් යම් දිගක පිහිටි තමන් කැමති ගොදුරුගමක අඞ්ග සම්පූර්ණවූ කල්හි තබන්නේය. මෙයි අඞ්ග නම්:- පෙරවස් එළඹ මහා පවාරණයෙන් පවාරිතයෙකු වීම, ඉල්මස් කාලයවීම, සෙනසුන පංචධනුසතිකවීම, සාසඞ්කසප්පටිභය වීමය යන මොහුයි. අඤ්ඤත්‍ර

භික්ඛුසම්මුතියා - භික්ඛු සම්මුතියකින් වෙන්ව; උද්දෙසිත සික්ඛාපද යෙහි නොසම්බන්ධ සම්මුතිය අනුදන්නාලදී. එසේ සම්මුතියක් ලත් භික්ෂුහට සරුයකට අභිනවූ කාලයක් නමුත් විප්‍රවාසය වටී. පුරාණගාම සීමං ගතස්ස තුච්ඡා - නැවත ග්‍රාමසීමාවට නො පැමිණ; කොදුරුගමින් නැගෙනහිර දිගෙහි සෙනසුන වෙසි මහණ තෙමේ පැසුළුදිගට ගියේ සෙනසුනට පැමිණ යන් [illegible] අරුණ ගතකරන්ට නොහැකි වෙයි. එහෙයින් ගාමූපචාරයෙහි යම්කිසි තැනක වැස සිවුරෙහි තොරතුරු විමසා යන්නට හැකිය. මේ ශික්ෂාපදය කායවාචා, කායවාචාචිත්ත වසයෙන් සමුට්ඨානය වේ.

සාසඞ්ක සික්ඛාපද ගැටපදය නිමි.

---

පූගස්ස - සමූහයාගේ; පටියත්තං - පිළියෙල කරණලදී; බහු සඞ්ඝස්ස භන්දු - සඞ්ඝයාට ලාභ වැඩෙන හඳවූ බොහෝ වාරයෝ වෙත්. සඞ්ඝයාට පිරනිමක් නැත යන අර්ථයි; ඔණමෙත්වා - දුනමා නැවී; සඞ්ඝයා උදෙසා පිළියෙල කොට තැබූ දෙයක් ඉල්ලාගැනීමෙන් පයුත්තවාචා ශික්ෂාපදයෙන් සිදුවන ඇවතට ඉඩක් නැත. ලාභං - ලැබියයුතු වස්තුව; පරිණතං - සඞ්ඝයාට පිරිණැමුනු දෙය; [illegible] - (සඞ්ඝයාට පිරිණැමුනු දෙයක් තමන්ට පිරිණැමෙන සේ) ප්‍රයෝග කිරීමෙහිදී දුකුලාවේ තම අතට හසුවූ කල්හි නිසගිවේ. සඞ්ඝයාට දුන් දෙයක් තමන් නොගෙණ සඞ්ඝයාටම දියයුතුයි. යම් භික්ෂුනමක් ආරාමිකයන්ට එකතුවී එය පරිභොග කෙරේ නම් ඒ භික්ෂුහට භණ්ඩගඝ වසයෙන් ඇවැත් ආරොපණය කටයුතුයි සඞ්ඝසතු දෙය මේ භික්ෂුහට දෙවයි අනිකෙකුහට පිරිනමන්නහුට ද පචිති ඇවැත් සිදුවේ. සංඝස්ස පරිණතං අඤ්ඤසංඝස්ස - එක් විහාරයකදී සඞ්ඝයාට පිරිණැමුනු දෙය අනික් විහාරයක් උදෙසා අසවල් විහාරයෙහි සඞ්ඝයාට දෙනුයි දෙවයි. චෙතියස්ස - සඞ්ඝයාට දීමෙන් කිම? චෛත්‍යයට පුදව් යයි මෙසේ චෛත්‍යයට හෝ පිරිණමවයි. චෙතියස්ස පරිණතං - චෛත්‍යයකට පිරිණැමුනු දෙය; එක් සෑයක් පිණිස රොපණය කරණලද මල්ගස්වල මල් ද අනික් සෑයකට පිරිණමන්ට නොවටී. මෙය පරිණතය සඳහා කියනලද්දක් බැවින් එක් සෑයකට ධජපතාක ආරොපණය කොට සිටියහු දුටු සෙස්ස අන් සෑයකට ආරොපණයකරවයි කියන්ට වටී. පුග්ගලස්ස පරිණතං - යටත්පිරිසෙයින් සුනඛයෙකුට නමුත් පරිණාමිත දෙය; 'මේ සුනඛයාට නො දෙව' මොහුට දෙවයි අන්කෙනෙකුට පිරිණමවාද ඒ භික්ෂුහට දුකුළා ඇවැත් වේ. ඉදින් දායකයන් අපි සඞබතක් දෙනු කැමැත්තෝ වෙමු. නුඹවහන්සේගේ රුචිය පරිද්දෙ එය දීමට අපගේ කැමැත්තවේයයි කීකල්හි කැමැති තැනකට දුනමැනවයි දුන්මය යුතුයි. නුඹවහන්සේගේ රුචිය පරිදියයි දුන්වූ හෙයින් අසවලාට දෙවයි කීකල්හිද වරදක් නැතැයි විමතිවිනොදනියෙහි කියති. මේ ශික්ෂාපදය කායචිත්ත වාචාචිත්ත, කායවාචාචිත්ත වසයෙන් සමුට්ඨානය වේ. සඞ්ඝයාට පිරිණැමුනු බව, එය දැන තමන්ට පිරිණමාගැනීම, ලැබීමයයි අඞ්ග තුණකින් යුක්තවේ.

පරිණත සික්ඛාපද ගැටපදය නිමි.

---

විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය පණ්ඩිත වේරගොඩ අමරමොළි
ස්ථවිරයන් විසින් ලියූ සාරාර්ථමඤ්ජරී නම්වූ විනය ගැටපදයෙහි
පරිජි සඟවෙසෙස් නිසගි පිළිබඳ ගැටපදය
මෙතෙකින් නිමියේය.

# පාචිත්තිය පාළි.

**හත්ථකො-** ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ අසූදහසක් භික්ෂූන් අතුරෙන් මේ එක් නමකි. **වාදක්ඛිත්තො-** පරවාදීන්ගේ සමීපයට යැවූයේ; යම් යම් තැනක වාදයක් වේද ඒ ඒ තන්හි පෙණේනුයි වාදක්ඛිත්ත නම්. 'ඛිප' ධාතුකොරෙන් 'ත' පසව සිද්ධයි. **අවජානිත්වා පටිජානාති-** තමන්ගේ වාදයෙහි යම්කිසි දොසක් සලකා 'මෙය මාගේ වාදය නොවේය'යි වළහා, නැවත එහි අනුසසක් දැක 'මාගේ වාදයත් මෙම' යයි පිළිගණියි. **පටිජානිත්වා අවජානාති-** කිසියම් වචනයක අනුසසක් දැක 'මේ මාගේ වාදය' යි පිළිගෙණ, ඉක්බිති දොසක් දැක 'මාගේ වාදය මේ නොවේ' යයි වළහයි. **අඤ්ඤේනාඤ්ඤං පටිචරති-** අනික් කරුණකින් අනික් කරුණක් වසයි. "රූපං අනිච්චං ජානිතබ්බතො" යි පැවසූ කල්හි, එසේ නම් නිර්වාණය ද අනිත්‍යවන්නේන් යයි පරවාදීන් පැවසූ කල්හි, මා විසින් කියනලද්දේ "ජානිතබ්බතො" කියා නොවෙයි. 'ජාතිධම්මතො' යි කියා වෙයි. තොපගේ කන් බිහිරි හෙයින් මෙසේ වරදවා ඇසූහයි පවසයි. තැකගොස් අන් කරුණක් වැසීම පිණිස "කො ආහ, කිං. ආහ, කිස්මිං ආහ' යනාදි වසයෙන් පිළිතුරක් දෙන්ට ඉඩනොදී කථාකරයි. **සම්පජානමුසා භාසති- විසංවාදෙති-** කල්වේලා ආදිය නියමකොට ගෙණ පසුව මුසාබණියි. අසවල් පෙර බත්කල හෝ පසුබත්කල හෝ අසවල් තැනදී වාදකරමුයි පළමු නියමකොට ගෙණ පසුව නියමයන් වළහා පැමිණ "පින්වත්නි, බලනු මැනව' ඔවුහු නො පැමිණියාහුය. එහෙයින් පැරැද්දෙතුම' යයි පෙරළා යයි. **සම්පජානමුසාවාදෙ-** දැන දැන දන්නාහුට මුසා බිණීමෙහි; **විසංවාදන පුරෙක්ඛාරස්ස-** (විසංවාදෙනකි එතෙනාති විසංවාදනං) විසංවාදන චිත්තය පෙරදැරිකොට කියන්නහුගේ; **වාචා=** කිස් වචන යන්ගෙන් ගැලපූනාවූ වචන පහළකරණ චෙතනාව; **ගිරා=**ඒ චෙතනාවෙන් නඟනලද ශබ්දය; **බ්‍යප්පථො-** වචන මාර්ගය; දෘෂ්ටානුගතියට පැමිණෙන්නාවූ අන්‍යයන්ට ද මාර්ගයක් වන හෙයින් වචනය ව්‍යප්පථ නම්. **අනරියවොහාරා-** අනාර්‍යවූ බාල පෘථග්ජනයන්ගේ ව්‍යවහාර යකි; **අදිට්ඨං දිට්ඨං මෙ-** ඇසින් නුදුටු දෙය මා විසින් දක්නාලද්දේය; මෙසේ කියන්නහුගේ වචනය හෝ ඒ නිසා ඇතිවූ චෙතනාව හෝ එක් අනාර්‍ය ව්‍යවහාරයකි. **අසුතං-** කණින් නො ඇසූ දෙය; **අමුතං-** ඝ්‍රාණ ජිව්හා කාය යන තුන් ඉන්ද්‍රියයන්ගෙන් නොගත් අරමුණ; **අවිඤ්ඤාතං-** පසිඳුරන් හැර පිරිසිදු මනින්ද්‍රියයෙන් ගත් අරමුණ; **භණසාභණති-** වේග වසයෙන් (නො සොයා නො විමසා) ඇසින් දක්නාලද දෙයද මා විසින් නො දක්නාලදැයි කියයි. **අඤ්ඤං භණිස්සාමීති අඤ්ඤං භණති-** අනිකක් කියන්නෙමි යි අනිකක් කියයි. ජඩගති ඇතිහෙයින් පැකිළෙන්නේ 'චීවරං' කියා කියයුතු තැන 'චීරං' යි කියයි; සොරණෙකු 'සාමිනි, මාගේ උපාධ්‍යායයන් වහන්සේ දුටුදැයි විචාළකල්හි කෙළි වසයෙන් "තොපගේ උපාධ්‍යාය

යන් වහන්සේ දුව ගැලක් ගොදගෙණ ගියානුය"යි කියයි. සිවල් නාද යක් අසා සවාමීනි, අසවල් හඬ නාගේදැයි විචාළ කල්හි "තොපගේ මවු ගාතාවකින් ගමන්කරණ කල්හි මඩෙහි එරුණාවූ ඒ ගැල්සක ඔසවත්තවුන්ගේ හඬයයි කියති. මෙසේ නොයෙක් වසයෙන් කියන්න හුට ද ඇවැත් සිදුවේ. උත්තරිමනුස්සධම්ම රොචනය පිණිස මුසා බණින්නහුට පරාජිකා ඇවැත්ද, අමූලිකවූ පරිජි ඇවැතින් චෝදනා කරන්නහුට සඞ්ඝාදිසෙසාපත්තියද, සඞ්ඝාදිසෙසාපත්තියෙන් චෝදනා කරන්නහුට පචිති ඇවතද, ජනපාදින් ගටා කෙළි කවටකම් කරන්න හුට දුබ්භාසිතාපත්තියද, සිදුවේ. මේ ශික්ෂාපදය කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත යන සචිත්තකත්‍රයයෙන් සමුට්ඨානය වේ.

මුසාවාද සික්ඛාපද ගැටපදය නිමි.

ඔමසති- විදිත්; නොමනා බස් බණින්නෙහි කණ්කටුක හෙයින් කණෙහි බස් නමැති හුල් අනිති. ඛුංසෙති- ආක්‍රොශ කෙරෙත්; වම්භෙති- අභිභවනය කෙරෙත්. නන්දිවිසාලො- 'නන්දි' යනු ඒ ගොණාගේ නමයි. විසාල අංදෙකක් ඇති හෙයින් මෙනම් විය. ඒ කාලයෙහි මේ බෝධිසත්වතෙමේයි. බමුණා කැඳබත් ආදිය දීමෙන් ඒ ගොණාට හොඳින් උපස්ථානකරයි. අබ්භුතං කාරෙසි- පරදිනබව; සකටසතං අතිබද්ධං පවට්ටෙසි- ගැල් සියයක් පිළිවෙළින් පිහිටුවා යටින් දණ්ඩක් තබා එකාබද්ධ කොට වෙළා මුං මෑ ආදියෙන් පිරවූ ඒ ගැල් සියයම එක්වර ඇදින්නේ ඉදිරි ගැල පිහිටි තැන පසු ගැල පිහිටුවාලිය. තෙන මනාපෙන අහු- බමුණාට ධනය ලැබීම හෙතු කොටගෙණද තමන්ගේ සපත්කම ප්‍රකටවීම හෙතුකොට ගෙණද නන්දිවිසාල තෙමේ අතිශයින් සතුටුවිය. අක්කොසෙන- ආක්‍රොශ කිරීමෙන්; හීන උක්කට්ඨ වශයෙන් ආක්‍රොශය දෙවැදෑරුම් වේ. අඤ්ඤකුම- කුළු අදුව; වෙනස්සු- උසුලව; වෙණජාති-වඩුකුලය; නෙසාද ජාති- වැදිකුලය; රථකාරජාති-සම්කරු කුලය; පුක්කුසජාති-ගැඩිමළ අදනා කුලය; මේ හීන වශයෙන් ආක්‍රොශකිරීමය; ඔඤ්ඤාතං- නින්දා වශයෙන් සැලකූන; පීළිතං- පිළිකුල් කරණලද; පරිභූතං- මොහු ගෙන් කිම්දැයි පරිභව කරණලද; අචිත්තීකතං- ගරු නොකරණලද; කොට්ඨකම්මං- ගල් කැපීම් ආදි වඩුකම; මුද්දා- ඇඟිලි නැමීමෙන් ගණන්කිරීම; ගණනා- (එක්තැනක දෙතැනක සතැනක ආදි වශයෙන් බෙල්ලන් ගණන්කොට තබා නැවත ගොඩ ගොඩ වසයෙන්) ගණන්කිරීම; ලෙඛා- අකුරු ලිවීම; මධුමෙහාබාධො- මුත්‍රවල සීනි ගතිය අධිකවීමෙන් වැළඳෙන විසිවැදෑරුම් ප්‍රමෙහාබාධයන්ගෙන් එකකි මෙය වේදනා මන්දත්වාය හෙතුකොට ගෙණ උත්කෘෂ්ඨය; පාටිකඞ්ඛා- කැමතිවියයුතු; යකාරෙන වා භකාරෙන වා- 'යභ' මෙථුනෙ' යන වචනහෙයින් යකාරභකාරයන් එකමඑකතුකිරීමෙන් සෑදෙන මෛථුන සෙවනය යන අර්ථවත්වූ වචනයෙන්; කාට කොටච්ඡිකාය- 'කාට' යනු පුරුෂනිමිත්තය, 'කොටච්ඡිකා' යනු ස්ත්‍රීනිමිත්තය, මෙහින් කරණු ලබන ආක්‍රොශයද හීනාක්කොසයි, ඕමසනං සහාසනාසංඝො-ගරහා නෙද

නැතිකරණු කැමැත්තේ; දවකම්‍යතා- කෙළි කවටකම් අදහසින් කරණබව; අත්ථ පුරෙක්ඛාරස්ස- පෙළ අරුත් බණන්නහුගේ; අනුසාසති පුරෙක්ඛාරෙ- අනුශාසනාවෙහි පිහිටියෙක් වූයේ; මෙකල ද සැබෑ ලෙස, එහෙයින් පව් නොකරව, තමෝතම පරායණ නොවෙව" යනාදි ක්‍රමයෙන් අනුශාසනා කරන්නේ; ධම්ම පුරෙක්ඛාරෙ- පාලි ධර්මය කියවන්නේ; මෙය කායචිත්ත වාචාචිත්ත කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. ආක්‍රොශ ලබන්නහු උපසම්පන්නයෙකු වීම, ජාති ආදීන් ගටා කිරීම, මට ආක්‍රොශ කෙරේයයි ඔහුගේ දැනගැනීම, අත්ථ පුරෙක්ඛාරාදීන්ගේ අභාවය යන අඞ්ග සතරකින් යුක්තවේ.

ඔමසවාද සික්ඛාපද ගැටපදය නිමි.

---

භණ්ඩන ජාතානං- (භණ්ඩනං ජාතං එතෙසං) කලහයාගේ පූර්වභාග සඞ්ඛ්‍යාත භණ්ඩනයෙන් යුක්තවූවන්ගේ; "මොහු විසින් මේ මේ දෙය මට කරණලද්දේය, මෙසේ කී කල්හි මෙසේ මෙසේ කියන්නෙමි"යි සවකීය පක්ෂයෙහි කරණුලබන සම්මන්ත්‍රණය භණ්ඩන නම්. කලහො- හස්තපරාමර්ශනාදි වශයෙන් සිදුවන ආපත්තිගාමික කායවාචා ව්‍යතික්‍රමය; විවාදාපන්නානං- අනාපත්තිගාමික විරුද්ධවාද සඞ්ඛ්‍යාතවූ විවාදයට පැමිණියවුන්ගේ; පෙසුඤ්ඤං- (පිසතීති පිසුණා, තාය සමන්නාගතො පිසුණො, පිසුණස්ස කම්මං පෙසුඤ්ඤං) ඔවුනොවුන් කෙරෙහි ප්‍රියබව ශූන්‍යකරණ කේලාම් බස්; දශවිධ ආක්‍රොශයන්ට වස්තු වශයෙන් කේලාම්බස් කියන්නාහුට පචිති ඇවැත් සිදුවේ. පියකම්‍යස්ස- (මෙසේ කල මම ඔහුට ප්‍රියයෙක් වන්නෙමියි) තමන්ගේ ප්‍රියබව පතන්නහුට; භෙදාධිප්පායස්ස- (මෙසේ කළ කල මේතෙමේ මොහු සමග භෙදවන්නේයයි) අනුන්ගේ අනුන් සමග වූ භෙදය කැමති වන්නහුට; හුදෙක් පාපයට ගැරහීම් වශයෙන් බෙණෙන්නහුට අනාපත්තිවේ. මේ ශික්ෂාපදය කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. යමෙකුගේ ගැරහීමක් අසා එය අන් භික්ෂුනමක්හට රහසිගතව දැනුම්දීම, එයින් තමන් කෙරෙහි ප්‍රියබව හෝ ඔවුනොවුන්ගේ භෙදය කැමතිවීම, ඇසූ භික්ෂුව එය දැනගැනීම යයි අඞ්ග තුණකින් යුක්තය.

පෙසුඤ්ඤ සික්ඛාපද ගැටපදය නිමි.

---

අප්පතිස්සා ආදරරහිතයෝ; යටත් පහත් පැවතුම් නොමැත්තෝ; අසභාගවුත්තිකා- විසභාග පැවතුම් ඇත්තෝ; භික්ෂූන් කෙරෙහි පැවතියයුතු අයුරින් නොපවතින්නෝ; පදසො ධම්මං වාචෙය්‍ය- අනුපසම්පන්නයන් සමග කොටස් කොටස් වශයෙන් ධර්මය කියන්නේ නම්; පදං- එක් ගාථා පදයකි. අනුපදං- ගාථාවෙහි දෙවැනි පදය; අන්වක්ඛරං- එක් එක් අකුර; අනුබ්‍යඤ්ජනං- අවිභක්ත වූ අක්ෂර සමූහය; අනුපසම්පන්නයෙකු සමග එකට කියන්ට පටන්ගෙණ එකට නැවතීම කෙරේද, ඒ මහණහට පදගණනින් පචිති ඇවැත් සිදුවේ.

තෙරුන් 'මනොපුබ්බඞ්ගමා' යි කීකල්හි, අනුපසම්පන්නයා පළමු පදය නො කියා, "මනොසෙට්ඨා මනොමයා" යි බණේ. එකල තෙරුන්ට "මනොපුබ්බඞ්ගමා" යන පදය නිසා ඇවතක් සිදු නොවේ. එහෙත් එකට කියූ පදගණනින් ඇවැත් සිදුවේ. බුද්ධභාසිතො– බුදුන් වදාළ ධර්මය; සියලු විනයපිටකය, අභිධම්මපිටකය, ධම්මපදය, චරියාපිටකය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, සුත්තනිපාතය, විමාන වත්ථුය, පෙතවත්ථුය, බ්‍රහ්මජාලාදි සූත්‍රයෝය යන මොහුයි; සාවකභාසිතො– සිවුපිරිසට අයත් සවුවන් විසින් වදාළ දහම් කොටස්; සැරියුත් තෙරුන් වදාළ අනඞ්ගණ, සම්මාදිට්ඨි, මහාවෙදල්ල යන සූත්‍රද, මහමුගලන් තෙරුන් වදාළ අනුමාන සූත්‍රයද, ධම්මදින්නා සප්විරිය වදාළ චුල්ලවේදල්ල සූත්‍රයද යනා මොහු සවුවන් වදාළ ධර්මයෝයි; ඉසිභාසිතො– බාහිර පිරිවැජියන් විසින් වදාළ පරිබ්බාජක වග්ගද, බාවාරිය අතවැස්සන්ගේ සොළසවිධ ප්‍රශ්න ද ඉසිභාසිත නම්; දෙවභාසිතො– දෙවියන් විසින් කියනලද දහම් කොටස්; එය දෙවතා සංයුත්ත, දෙවපුත්ත සංයුත්ත, මාරසංයුත්ත, බ්‍රහ්මසංයුත්ත, සක්ක සංයුත්ත යනාදි සංයුත්සඟියට අයත් දහම් කොටසි; අත්ථූපසංහිතො– අටුවා කථාවන් ඇසුරු කළ දහම්; පෙර මගදබසින් වදාරණලද ධර්ම සඞ්ග්‍රහයන්ට අයත්වූ දහම් කොටස් මිට ඇතුළත් වේ. බුද්ධඝොෂාචාර්යයන් විසින් පෞරාණික අර්ථකථා ආශ්‍රයෙන් වදාරණලද සියල්ල ද මිට ඇතුළත්වේයයි ඇතැම් කෙනෙක් කියති. ධම්මූපසංහිතො– උදානවර්ගී සඞ්ඛාරාදි නිර්වාණයට උපනිශ්‍රිතවූයේ; සඞ්ගීතිත්‍රයට ඇතුළත්වූ ධර්මයම කියන්නහුට ඇවැත් සිදුවේ· නානාභාෂා වශයෙන් බඳිනලද ගාථාශ්ලෝකවලින් යුක්තවූ නිර්වාණෝපනිශ්‍රය ධර්මය නමුත් අනුපසම්පන්නයන් සමග කියන්නහුට ඇවැත් සිදුවීමක් නැත. එකතො උද්දිසාපෙන්තො– අනුපසම්පන්නයන් සමග උදෙසීම් වසයෙන් එකට කියන්නහුට අනාපත්ති වේ.

උපසම්පන්නයෙක් ද අනුපසම්පන්නයෙක් ද එකට හිඳ හැදෑරීම කරති. ආචාර්ය තෙමේ හුන්නවුන්ට කියමියි ඔවුන් සමග එකට කියයි. ආචාර්යවරයාට ම ඇවැත් සිදුවේ. අනුපසම්පන්නයා සමග එකට කියන අනික් භික්ෂුහට අනාපත්තිය. භික්ෂුව හුන් කල්හි අනුපසම්පන්නයා සිටි කල්හි හුන්නවුන්ට කියමියි ඔවුන් සමග එකට කියන ආචාර්යවරයාහට අනාපත්තිය. බොහෝ භික්ෂූන් අතර එක් තෙරණෙක් ද හුන්නේ වෙයි. එසේ හුන් කල්හි පදවසයෙන් දහම් කියවන්නාවූ ආචාර්යවරයාහට අචිත්තකාපත්තියක් වේ. යෙභුය්‍යෙන පගුණං ගන්ථං භණන්තං ඔපාතෙති– බොහෝ සෙයින් ප්‍රගුණවූ ග්‍රන්ථයක් කියන්නහුට මෙසේ කියවයි එකට කියයි; ප්‍රගුණවූ ගාථාවක් කියාගණ ගිය තෙරණහට එක් පදයක් අමතකවිය. ඒ පදය මෙසේ කියවයි එකට කියන ඇදුරුහට අනාපත්තිය. ඔසාරෙන්තං ඔසාරෙති– පිරිස් මැද කීමට සැතකරණ තෙරණහට මෙසේ කියවයි කියයි. එසේ කියන භික්ෂුහට ද අනාපත්ති වේ. මා සමග එකට නො කියව යි තෙරුන්

කියද්දීම හෙරණ එකාට කියානම් තෙරුන්ටත් අනාපත්තිවේ. මේ ශික්ෂාපදය වාචා වාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. අනුප සම්පන්න බවය, ධර්මය පද වශයෙන් එකට කීමය, සමග කීමයයි අඞ්ග තුණකින් යුක්තවේ.

පදසෝ ධම්ම සික්ඛාපද ගැටපදය නිමි.

---

මුට්ඨස්සති- (සිත නින්දට බැසගත් හෙයින්) මුළා සිහි ඇත්තෝ; අසම්පජානා- (සිත භවාඞ්ගයට බැසගත් හෙයින්) නො දන්නාහු; විකූජමානා- කත්දෙඩන්නාහු; කාකච්ඡමානා- ගඬන්නාහු; හෙවත් නාසයෙන් පිඹිමින් හිස් ශබ්ද පවත්වන්නාහු; එතදවොචුං- (ඇවැත් රාහුලය භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපදයක් පණවනලද්දේ' යි භික්ෂූහු ශික්ෂාගෞරවයෙන්) මෙය කීවාහුය. රාහුල ස්ථවිර තෙමේ ශික්ෂාකාමියෙකි. තමන් කරා පැමිණෙන භික්ෂූන්ට සිදීමට එහි තිබෙන ඇඳ හෝ පුටුව පිළිසෙළකොට තමන්ගේ සිවුරම තමා හිස තැබීමට තබා සැතපෙන්ට දෙයි. ඇතැම් භික්ෂූහු ක්‍රීඩාවශයෙන් ඉදිරියෙහි එන රාහුලයන් දූක, මුසුන් හුදළු, ආදිය නොසරුප් තැන්වල තබත්. කැළිකසළ තැන් තැන්වල විසුරුවාහරිත්. මේ කාගේ කටයුත්තක් දැයි සෙසු භික්ෂූන් විචාළකල 'අපි නො දනිමු, රාහුලයෝ නම් මෙහි හැසුරුණාහුයයි කියති. රාහුලස්ථවිර තෙමේ ද ස්වාමීනි, මෙය මාගේ කටයුත්තක් නොවේයයි නො කියාම මුසුන් ආදිත් තැන්පත්කර තබා කුණුකසළ හැද පිරිසිදුකර දමා භික්ෂූන් ක්ෂමා කරගණියි. වච්චකුටියා සෙය්‍යං කප්පෙසි- (බුදුරජානන් වහන්සේගේ) වැසිකිළියෙහි ශයනය කළේ ය. බුදුරජානන් වහන්සේගේ වැසිකිළිය වනාහි දොරකවුළුවලින් යුත් සුවඳකැවූ ගෙයකි. එය චෛත්‍යස්ථානයක් මෙන් සලකන හෙයින් අන්‍ය භික්ෂූන් විසින් අපරිභොගාහීය. උත්තරිං දිරත්ත තිරත්තං- දෙතුන් රැයකට වඩා; මෙහි 'තිරත්ත' ග්‍රහණය වචනාලඞ්කාරය පිණිස යෙදුනකි. තුන් රැයක් ඉක්මවා සතර වන රැය සැතපෙන්නහුට ම ඇවැත් සිදුවේ. බුදුරජානන් වහන්සේ කුලදරුවන් මඟණකරවා අනුග්‍රහ නො කරන්ට නුසුදුසු හෙයින් තුන්දිනක් නිදහස දුන්සේක. සබ්බච්ඡන්නා- පංචවිධ ඡදනයන් අතුරෙන් යමකින් සෙවුනාලද්දී; උළු, ගල්, හුණු, තණ, පත් යන මොහු පංචවිධ ඡදනයෝයි. බිම පටන් ඡදනය තෙක් පවුරකින් හෝ රෙදිවලින් හෝ යම්කිසිවකින් වැසුනක් ම වියයුතුයි. යටත්පිරිසෙයින් හාත්පස එක්රියන් හමාරක් පමණවූ පවුරකින් පරික්ඛිත්තාවූයේ ද සබ්බච්ඡන්නා සඞ්ඛ්‍යාවට ගැණෙයි යයි කුරුන්දට්ඨකථාවෙහි කියයි. යෙභුය්‍යච්ඡන්නා-ඡදනය බොහෝ සෙයින් සෙවුනේ, හාත්පස සම්පූර්ණ පරික්ෂෙපයකින් තොරවූයේ යෙභුය්‍යච්ඡන්නා නම්: අනුපසම්පන්නෙන නිපජ්ජනෙ- අනුපසම්පන්නයෙකු හොත් කල්හි; භික්ඛු නිපජ්ජති-භික්ෂුව හොවියි. හොවීම් මාත්‍රයෙන් ම භික්ෂුහට පචිත් ඇවැත්වේ. ඉදින් එහි බොහෝ හෙරණුන් වෙත් ද එක් භික්ෂුනමකහට

වේද; තෙරණුන්ගේ ගණනින් භික්ෂූහට පචිති ඇවැත්වේ ඒ තෙරණෝ නැගිට නැගිට නැවත නිදද්ද, ඔවුන්ගේ ප්‍රයෝග ගණනින් භික්ෂූහට පචිති ඇවැත් වේ. **භික්ඛුං ඨපෙත්වා අවසෙසො අනුපසම්පන්නො නාම**-භික්ෂූ හැර සෙසු සියලුදෙනාම අනුපසම්පන්න නම්. තිරිසන් ගතයන් සමග එක සෙනස්නෙහි විසීමෙන් ද පචිති ඇවැත් සිදුවේ. එහෙයින් තලගොයි, බලල්, මුගටි ආදීන් සමග ද සහසෙය්‍ය වශයෙන් තුන්රැය ඉක්මීම නුසුදුසුය. යම් තිරිසන් සත්වයෙක් සිදුරකින් ගෙය තුළට පැමිණ බිත්ති හෝ බල්ක මත රෑ ශයනය කොට රාත්‍රියෙහි ම ගේනම් උඩ කරණකොට ගෙණ එහි වසන භික්ෂූන්ට ඇවැත් සිදු නො වේ. බිත්තියෙන් පිටත වසන්නවුන්ගෙන් ඇවිතක් නැත. මේ ශික්ෂාපදය කාය, කායචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. පචිතියට සුදුසු වූ සෙනසුනක් වීම, අනුපසම්පන්නයෙකු සමග ශයනයකිරීම, සිවුවැනි දින ඉරබැසීමය යන අඞ්ග තුණකින් යුක්තවේ.

සහසෙය්‍ය සික්ඛාපද ගැටපදය නිමි.

---

**කොසලෙසු**- බටහිරින් පසල් රටද, දකුණෙන් අඩගානම් නදියද, නැගෙනහිරින් ගණ්ඩකී නදියද, උතුරෙන් නේපාලිය කඳුපෙලද කොසොල්රටෙහි සීමාවෝයි. මෙකල 'අවුද්' නමින් ප්‍රකට පෙදෙස පැරණි කොසොල්රටට අයිති ය. මෙය උත්තර කොසලය, දක්ෂිණ කොසලයයි ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත ය. උත්තරකොසල යෙහි අගනුවර සැවැත් ය. දක්ෂිණ කොසලයෙහි අගනුවර කුසාවතීය වෙයි. **ආවසථාගාරං**-ආගන්තුකයන් වසන ගෙය; **උද්දිස්සකතං**-පින් කැමති බැවින් කරවා තබනලද්දේ වෙයි. **ගන්ධගන්ධිනී**-කොකුම් අගිල් ආදි සුවඳින් සුවඳවත්වූවා; **සාටකං නික්ඛිපිත්වා**- (මේ විප්‍රකාර බලන්නහුට රාගය උපන්නේනම් මැනවයි)සළුව ලිහාදමා; **නික්ඛිපිත්වා**-සටහෙලා; **අච්චයො**- අපරාධය; **මං අච්චගමා**- මා මැඩගෙණ පැවැත්තේ වෙයි. පළමු ශික්ෂාපදයෙන් සිවුවැනි දිනයෙහි ඇවැත් සිදුවේ. මේ ශික්ෂාපදයෙන් එදිනෙහි ඇවැත් සිදුවෙයි. සමුට්ඨානය පළමු ශික්ෂාපදයෙහි මෙනි. පාචිත්තියවත්ථුක සෙනසුනක්වීම එහි මාගමක් සමග ශයනයකිරීම, ඉර බැසයාමයයි අඞ්ග තුණකින් යුක්තය.

දුතිය සහසෙය්‍ය සික්ඛාපද ගැටපදය නිමි.

---

**ඝරණී**-(ඝරං නෙතීති ඝරණී)ගෙහි අධිපතිස්ත්‍රිය; **නිවෙසනද්වාරෙ**-තෙහි ප්‍රධාන දොරටුවෙහි; **ඝරසුණ්හා**-ඒ ගෙහි ලේලිය; **ආවසථද්වාරෙ**-කාමරයේ දොරකඩ; **විස්සට්ඨේන**- මනාව පැතුරුණු ශබ්දයෙන් යුක්තව; **විඤ්ඤෙන**- මනාකොට ඇසෙන අයුරින් යුතු; **ධම්මො දෙසෙතබ්බො**-සරණසීලාදි ප්‍රභේදගතවූ ධර්ම දෙශනා කටයුතුයි; **අඤ්ඤාතුං**-දැනගැණීමට; **අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන**- ශ්‍රවණාවාර යෙහි සිටි නුවණැති මිනිස්පුරුෂයකුනු නැතිව; **යක්ඛ** ප්‍රේත තිරශ්චාන

ශතයන් සමග සිටියහුට දෙශනාකරන්ට නොවටී. **ඡප්පංච වාචාහි**- සපස් පෙදෙකින් මත්තෙහි; **අක්ඛරාය දෙසෙති**- (සපස් පදකෙනෙ කුත්ව වඩා) අකුරකින්වත් දෙශනාකොරේද; **තස්මිං දෙසෙති**- ඇට දෙශනාකෙරෙයි. 'තස්මිං' යනු සම්ප්‍රදනාර්ථයෙහි භුම්ම වචනයි. **මාතුගාමාය**- එක් ස්ත්‍රියකට දහම්දෙසා නැවත පැමිණි අන් ස්ත්‍රියකට ද ධර්මය දෙශනා කෙරෙයි. මෙසේ එක් අනුනෙහි හුන්නේ ම මාගමුන් සියයකට නමුත් දෙශනා කෙරෙයි යන අර්ථයි. **පඤ්හං පුච්ඡති**-(ස්වාමීනි දීඝනිකාය කුමන අර්ථයක් ප්‍රකාශකෙරේදැයි) ප්‍රශ්න විචාරයි. **පඤ්හං පුට්ඨො කථෙති**- මෙසේ ප්‍රශ්න විචාළ භික්ෂුතෙමේ සියලු දීඝනිකාය විස්තරකොට කියයි. ඒ භික්ෂුහට අනාපත්තිය, මේ ශික්ෂාපදය වාචා, වාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. සපස් පෙදෙකින් මත්තෙහි දහම්දෙසීම, කියනලද ලකුණුවලින් යුක්ත මාගමක් වීම, ඉරියවු නො පෙරළීම්බව, නුවණැති පුරුෂයෙකු නොමැති බව, ප්‍රශ්න නො විචාරීමයයි අඞ්ග පසකින් යුක්තය.

ධම්මදෙසනා සික්ඛාපද සත්මපදය නිමි.

---

**අද්ධා මෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං**- (යම් කෙනෙක් උතුරුමිනිස්දම් පිළිබඳ ගුණවැණුවාහු ද) ඒ භික්ෂූහු ම බුදුරජනන් වහන්සේට සැලකළාහුය. **කථං හි නාම තුම්හෙ භික්ඛවෙ උදරස්ස කාරණා**- මහණෙනි, තෙපි කුමක් හෙයින් බඩනිමිත්තෙන්; තෙපි ඔවුනොවුන්ට බඩනිමිත්තෙන් උතුරුමිනිස්දම් වැණුවහු ද? බුදුරජනන් වහන්සේ මොවුන් ආශ්‍රීයන් හා මිශ්‍රවූ පිරිසක් හෙයින් 'මොඝපුරිස' වාදයෙන් නො ඇමතූ සේක. ඔබවහන්සේ සොවාන් සේක්දැයි මිනිසුන් විසින් විචාරණලද්දාහු ශික්ෂාපද නො වදාළ හෙයින් ආදීනව නො දක්නෝ පිරිසිදු සිත් ඇති බැවින් තමන්ගේ ද අනුන්ගේ ද විශෙෂාධිගමය ප්‍රකාශකළාහුය. මෙසේ බඩනිමිත්තෙන් උතුරුමිනිස්දම් ප්‍රකාශකොට පිඬුලැබූහ. ඇති දෙයක් ම දක්වූ හෙයින් මේ භික්ෂූහු පචිති දුකුළා ඇවැත්වලට වෙන වෙනම පැමිණියාහුය. **උපසම්පන්නස්ස භූතං ආරොචෙති**-(පිරිනිවන්පානා කල්හි හෝ ඊට පූර්වයෙහිදී හෝ ස්වාමීනි, නුඹවහන්සේ විසින් කවර විශෙෂ ධර්මයක් අධිගතදැයි පිළිනයකරණු ලබන්නහු විසින්) උපසපන් භික්ෂුහට අධිගත ගුණ ආරොචනය කරයි; එය වටී. සුතපරියත්ති සීලගුණය වනාහි අනුපසම්පන්නයාහට ද ආරොචනයකිරීම නිවරද ය. මේ ශික්ෂාපදය කාය, වාචා, කායවාචා වශයෙන් තිසමුට්ඨානය; උත්තරිමනුස්ස ධර්මයාගේ භූතත්වය, අනුපසම්පන්නයෙකුට ආරොචනය කිරීම, එකෙණෙහි ම දැනගැණීම, අනඤ්ඤාපදෙසයයි අඞ්ග සතරකින් යුක්තවේ.

භූතාරොචන සික්ඛාපද අටමපදය නිමි.

**දුට්ඨුල්ලා නාම ආපත්ති**- (දුට්ඨුභිතං දුට්ඨුල්ලං, වරදම හිතවූයේ දුට්ඨුල්ල නම්.) සඞ්ඝාදිසේසාපත්තිය; **අත්ථි භික්ඛුසම්මුති ආපත්තිපරියන්තා**- ඇවැත් කෙළවරකොට ඇති භික්ඛුසම්මුතියක් ඇතැ යි ගත යුතුයි. යම් මේ භික්ඛුසම්මුතියක් කියනලදද එය කිසිතැනක නො ආයේ ය. මෙහි කියනලද හෙයින් අභිණ්හාපත්තිකවූ භික්ෂුවක් දැක, මෙසේ මේතෙමේ අනුන් කෙරෙහි හිරිඔතප් ඇතිකර ගැණීමෙන් ආයතිසංවරයට පැමිණෙන්නේයයි ඒ භික්ෂුව පිළිබඳව පැවති හිතේසිකමින් තුන්වරක් අපලෝකනය කොට සඞ්ඝයා විසින් භික්ඛුසම්මුතිය කටයුතුයි. **අදුට්ඨුල්ලං ආපත්තිං ආරොචෙති**- පසැව ආපත්තිස්කන්ධයන් ආරෝචනය කෙරේ; පරිජී ඇවත ආරෝචනය කරන්නහුට ද දුකුළං ඇවැත් වේයයි මහාපච්චරියෙහි කියයි. **අනුපසම්පන්නස්ස දුට්ඨුල්ලං වා අදුට්ඨුල්ලං වා අජ්ඣාචාරං**- අනුපසම්පන්නයෙකුගේ දුට්ඨුල්ලවූ හෝ අදුට්ඨුල්ලවූ හෝ ඉක්මවා පැවැත්ම; පාණාතිපාත, අදින්නාදාන, කාමෙසුමිච්ඡාචාර, මුසාවාද, සුරාමෙරයමජ්ජපමාදට්ඨාන යන සික්ඛාපද පස අතික්‍රමණයකිරීම අනුපසම්පන්නයාගේ දුට්ඨුල්ල අජ්ඣාචාර නම්. විකාලභෝජන, නච්චගීතවාදිත විසූකදස්සන, මාලාගන්ධවිලෙපන, උච්චාසයන මහාසයන, ජාතරූපරජත පටිග්ගහන යන පස ඉක්මවීම ඔහුගේ අදුට්ඨුල්ල අජ්ඣාචාර නම්. **වත්ථුං ආරොචෙති**- (මේ තෙමේ සුක්කවිස්සට්ඨියට පැමිණියේය යනාදි වශයෙන්) වස්තුව ආරෝචනය කෙරේ, **ආපත්තිං ආරොචෙති**- (මේතෙමේ පරිජී ඇවතට පැමිණියේය යනාදි වශයෙන්) ඇවත ආරෝචනය කෙරේ; මේ තෙමේ සුකුරු මිදීමෙන් සඞ්ඝාදිසේසාපත්තියට පැමිණියේයයි වස්තුව සමග ඇවත ආරෝචනය කරන්නාහුට ම ඇවැත් සිදුවේ. මේ ශික්ෂාපදය කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත වශයෙන් තිසමුට්ඨාන ය, අනතිම වස්තුවට නො පැමිණි මහණහුගේ සවත්ථුක සඞ්ඝාදිසේසය වීම, අනුපසම්පන්නයෙකුට ආරෝචනයකිරීම, භික්ඛුසම්මුතියක අභාවයයි අඞ්ග තුණකින් යුක්තවේ.

**දුට්ඨුල්ලාරොචන සික්ඛාපද ගැටපදය නිමි.**

---

**අප්පපාසාණාදිසු**- (අප්පං පාසාණා එත්ථාති අප්පපාසාණං) මඳවූ පහන් ඇති තැන් ආදියෙහි; මිටින් ගතයුතු පමණ ඉක්මවා පැවැත්තේ පාසාණ නම්. **සක්ඛරා**- මිටින් ගතහැකි කැටගල්; **කඨලා**- කැබලිති; **මරුම්බා**- බොරළුකැට; **වාලිකා**- වැලි; **ජාතපඨවි**- පස්, මැටි, සක්ඛර, කඨල, මරුම්බ, වාලුක යන ආදියකින් යුක්තවූ නොදැ පොළොව; වැලි, මැටි ගොඩවල් නමුත් යටත්පිරිසෙයින් සිවුමසක්වත් වැසි සුලංවලට අසුවිද ඒ ජාතපඨවිසඞ්ඛ්‍යාවට යෙයි. පස් මැටි ආදියට අයත්වූ දැවුනු පොළොව ද, සිවුමසක් නො ඉක්මුනු පස් හා මැටි ගොඩවල් ද .අජාතපඨවි සඞ්ඛ්‍යාවට ගැණේ. **සයං ඛනති ආපත්ති පාචිත්තියස්ස**- තෙමේ කනීද පහරක් පහරක් පාසා පචිති ඇවැත් වේ. **සකිං ආණත්තො බහුකම්පි ඛනති**- වරක් අණවූයේ බොහෝවේලා

මක් කනී; ඇණවූවහුට සිදුවන්නේ එකම පචිත්තියකි. ඒ පිළිබඳ විනිශ්චය මෙසේ දතයුතුයි. පොකුණක් කැනව කිම භික්ෂුහට සුදුසුය. මෙතැන සාරණු, මෙතැන පොකුණක් කනිත්තුයි කියන්ට නුසුදුසුය ඇලකනිත්නු, මූලකනිත්නුයි අනියම් වශයෙන් කියන්ට වටී. මේ වැල සාරණුයි නියමකොට ම කියන්ට නුසුදුසු ය. පොකුණක් ඉසින්නහු විසින් තුනිවූ මඩ දිය සමග මිශ්‍රකොට භාජනයකින් ගතහැකිය. එහෙත් ඝනවූ මඩ නො ගතයුතුය. අවුවෙන් වියලී පැලී ගැලවී ගිය මඩ පිටත දැමියහැකි වෙයි, එසේ ම පොකුණේ ඉවුර බිඳී එහි පතිතවූ පස් මැටි සිවුමසක් පසුව යනතුරු ගතහැකි වෙයි. ගොඩකණ්ඩකහත කඳීමය භූමිය හා සම්බන්ධ හෙයින් ඉවත්කරන්ට නුසුදුසු ය. පැරණි සෙනසුන් බිම්ද ඡදනය නොමැති හෙයින් තෙමිතෙමී සිවුමසක් ගතවූ කල්හි ජාතපඨවි සඞ්ඛ්‍යාවට ගැණේ. එහෙයින් විකොපනය කරන්ට නුසුදුසු ය. ඉට්ඨකපාකාරය කැමැති පරිදි විකොපනය කරන්ට හැකි වෙයි. බොහෝසෙයින් කැට කැබලිති ගල් ආදියෙන් යුක්ත හෙයිනි. අභ්‍යවකාශයෙහි සිටුවනලද කණුවක් නමුත් ජාතපඨවිය බිඳෙනසේ එකාමෙහං චලනය කොට උදුරන්ට නුසුදුසු ය. චලනය නො කොට ගතහැකිනම් එසේ කිරීම සුදුසු ය. නවකම් කරන්නහු විසින් දැව කඳක් හෝ පහණක් පෙරළාගෙණ යන කල්හි ජාතපඨවිය බිදුනේද එබඳු අදහසක් නොමැති හෙයින් අනාපත්ති ය. දරපැළීම් ආදියෙහි දී ද මේ නයම සැලකිය යුතුයි. ජාතපඨවියෙහි ඉනි උල් ඇන ආදිය පොළොව බිඳෙන සේ සිටුවන්ට නුසුදුසු ය. යම්ත්පිරිසෙයින් ධාරා නිපාතයෙන් පොළොව බිඳෙනසේ මුත්‍රකරන්ට ද පොළොව බිඳෙන සේ සැරයටිය අනින්ට ද, විෂමතැන් සමකරමියි මුස්නෙන් පොළොව බිඳෙනසේ හමදින්ට ද, පියපහර පෙණේවා යි සක්මන් කරන්ට ද, අතපය කැසීම් පිණිස පොළොව බිදීයනසේ උලන්ට ද නුසුදුසු ය. එසේ ම ජාතපඨවියෙහි ගිනිදැල්වීම ද නො කටයුතුය. දිරූ කසල වලට ගිනිතැබීම පොළොවට ආසන්නවූ කල්හි නිවාදමන්නෙමියි යන අදහසින් යුක්තව නම් වටී. පසුව නිවාගත නො හැකිවුවත් වරදක් නැත. තණහුලක් ගෙණයන කල්හි අත දැවෙතැම් බිම දැමීම නිවරද ය. ඒ වැටුන තැන නැවත දර බහාලීමෙන් ගිනිදල්වාගත ද නිවරද ය. මේ කණු ට වළක්වුව මැනව. මැටිපිඩක් උවමනාය, මැටි ගෙණෙව, වැලි ගෙණෙව, මේ පස කැපකරව යනාදි කැප වහරින් යම් යම් දේ කරවන්ට වටී. මේ ශික්ෂාපදය කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. පඨවියක යන හැඟීම් ඇති බව, ජාතපඨවියක් වීම, ඛනන ඛනාපනයන් අතුරෙන් යමක් ඉටුවීම යයි අඞ්ග තුණකින් යුක්තවේ.

පඨවිඛනන ශික්ෂාපද ව්‍යාඛ්‍යාව නිමි.

---

අනාදියනෙතා- ඒ දෙව්දුවගේ වචනය නො ගන්නේ; දාරකස්ස බාහුං ආකොටෙසි- පුතුගේ බාව සින්දේය. භික්ෂුව ඒ රුක සිඳින්ට පටන්ගත් කල්හි එහි පහළවූ තරුණ පුතෙකු ඇති දෙව්දුවක් සිය පුතු

ඇකයෙන් වඩාගෙණ, "ස්වාමීනි, මගේ විමානය නො සිඳනු මැනවි. පුතුද වඩාගෙණ විමානයක් නොමැතිව වාසයකරන්ට නො හැක්කේ වෙමි. එසේ ම අන්තැනකින් මෙවැනි රුකක් ද ලබාගන්ට නො හැක්කේ වෙමි" යි ඒ භික්ෂුව යදින්ට පටන්ගති. නැවත ද ඕතොමෝ මේ දරුවා බලාවත් රුක සිඳීම හරියයි සැකකොට ඒ ගසේ අත්තක් උඩ පුතු තැබිය. ඒ භික්ෂුව ද ගසට ගැසීමට එසවූ පොරෙවපහර නවත්වාගන්ට නො හැකිවූයේ පුතුගේ බාහුව අංශය සමඟම සිඳ දැමීය. ගස මුදුනෙහි පහළවන විමාන වෘක්ෂ පිළිබඳ හෙයින් රුක්ඛට්ඨ විමාන නම්. ගසේ සකල ශාඛාවන් ආශ්‍රයකොට නෙණ පවත්නේ සාඛට්ඨ විමානයයි. රුක්ඛට්ඨ විමානය වනාහි වෘක්ෂයාගේ මුල පවතින තුරුම පිහිටා සිටියි; සාඛට්ඨ විමානය වනාහි අතුබිඳෙන කල්හි බිඳී බිඳී ගොස් සියලු අතුබිඳී නිමවූ කල්හි ම විමානය ද බිඳීයෙයි. මේ විමානය වනාහි සාඛට්ඨය, එහෙයින් ගස අතු සිඳුන කල්හි විමානය ද සම්ප්‍රකාරයෙන් සිඳීගියේය. ඉන්පසු ඒ දෙව්දුව බුදුරජුන්ගේ නියමයෙන් ලැබූ අන් විමානයක විසුම් ගත්තීය. රුක්දෙවියන්ගේ සිරුරු අවයව සිඳියහැකි වෙයි. චාතුර්මහාරාජික දෙවියන් ආදි කොට ඇති අන්‍ය දෙවතාවන්ගේ ශරීරාවයව එසේ වෙන් නො කොට හැකි ය. **න ඛො මෙතං පතිරූපං** - මෙය මට සුදුසු නො වෙයි. පක්ෂ දිනයන්හි හිමාලයෙහි දේවතාවන්ගේ සන්නිපාතය වෙයි. තුඹ වෘක්ෂධර්මයෙහි සිටියෙහි ද නො සිටියෙහිදැයි ඒ රැස්වූවන් වෙතින් විචාරති. වෘක්ෂ ධර්මය නම් ගස සිඳෙන කල්හි නො කිපී සිටීමයි. එය කඩකළවුන්ට නැවත දේවසමාගමයට පිවිසීමක් නො ලැබේ. ඒ දෙව්දුවට මේ ආදීනවය පෙණුනි. බුදුරජානන් වහන්සේ හමුවෙහි අසනලද ධර්මදේශනානුසාරයෙන් සිහිකරන්නී ඡද්දන්තකාලයෙහි වූ පූර්වචරිතය සිහිකළාය. **යන්නූනාහං භගවතො එතමත්ථං ආරොචෙය්‍යං** - භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ දන්වන්නෙම් නම් ඉතා යෙහෙකි. කුමක්හෙයින්ද යත්; මේ භික්ෂුහුගේ මේ වැරදි හැසිරීම අසා, එය සීමාකොට බුදුරජානන් වහන්සේ ශික්ෂාපද පණවන සේක. එහෙයිනි. **සඤ්චෙය්‍යාභි-රුස්කරන්තෙහිය**; **අඤ්ඤතරස්මිං ඔකාසෙ රුක්ඛො විවිත්තො** - අයවල් තැන පිහිටි රුක හිස්වූවකි. එය දෙව්රම පවුර ඇතුළත පිහිටියකි. එහි අරක්ගෙණ සිටි දෙව්දුව චුතවීය. එහෙයින් එය විවිකත වූවකි. එතැන් පටන් ඒ දෙව්දුව ඒ රුක්විමනෙහි වසන්නී බුදු උවැසියක් ද වූවාය. **භූතගාම පාතබ්‍යතාය** - භූතසමූහයන්ගේ රුක්ලිය කාලකිරවීම නිමිතිකොට වූ ඡේදනභේදනාදි යථාරුචිපරිභොගයෙන්; "භවන්ති අභුවන්ති චාතිභූතා, වැඩෙත්ය" යන අර්ථයි. 'ගාම' ශබ්දය රාශ්‍යර්ථයි. "භූතානං ගාමො, භූතගාමො" 'පාතබ්‍යතා' 'පා' ධාතුකෙරෙන් 'තව්‍ය' ප්‍රත්‍යයය. 'පාතබ්‍යස්සභාවො පාතබ්‍යතා' ඡේදනභේදනාදි වශයෙන් රුචිපරිදි පරිභුඤ්ජිතව්‍ය බවය යන අර්ථයි. නිමිත්තාර්ථයෙහි සප්තමී විභක්තියි. භූතයන්ට නිවාසස්ථානවන හෙයින් ද භූතගාම නම්. **භූතගාමො නාම පඤ්චබීජජාතානි** - පංචවිධ බීජයන්ගෙන් හට

ගැණුනේ භූතගාම නම්. මූලබීජ, ඛන්ධබීජ, ඵළුබීජ, අග්ගබීජ, බීජබීජයයි බීජවර්ගී පසකි. අල පැලවෙනගතිය ඇති කහ ඉඟුරු වදකහ ආදිය මූලබීජ නම්. කඳ පැලවෙනගතිය ඇති ඇහැටු නුග ආදිය ඛන්ධබීජ නම්. පුරුක පැලවෙනගතිය ඇති උණ, බට, උක් ආදිය ඵළුබීජ නම්. කරවිය පැලවෙනගතිය ඇති ඉරිවෙරිය ආදිය අග්ගබීජ නම්. ඇටපැලවෙනගතිය ඇති පුබ්බණ්ණ අපරණ්ණ ධාන්‍යවර්ගී බීජබීජ නම්. ලියරුක් ආදිය ථලට්ඨ ජලට්ඨ යයි දෙපරිදිවේ. ජලයම උත්පත්තිස්ථාන කොට ඇති සෙවෙල් ආදිය උදකට්ඨ නම් උදකපප්පට ද මේ සංඛ්‍යාවට අයත්වේ. ගොඩ උපදින ලියරුක් ආදි සියල්ලම ථලට්ඨ නම්. මෙසේ දෙපරිදි වූ භූතගාමයන් විකොපනයකරණ, අකැප වචනයෙන් විකොපනය කරවන භික්ෂුහට පචිති ඇවැත් සිදුවේ. සෙවෙල් ආදිය එහා මෙහා කොට සනාතයකරණ භික්ෂුහට ඇවතක් නැත. එහෙත් සෙවෙල් ජලයෙන් වෙන්කරවීම නො වටී. කපා බිම හෙළූ රුක්වල නැගෙන අංකුර ද භූතගාම සංඛ්‍යාවට අයත් වේ. තල් පොල් ආදිය බීජගාම ගණනට ගැණේ. කොසෙල්වල නො පිදූනුගසේ කඳ භූතගාම වශයෙන් ද, පිදූනු ගසේ කඳ බීජගාම වශයෙන් ද ගැණේ. ඉඳුසල් ආදිය සිඳ සිඳ රාශිකළ කල්හි ඒ දඬුකැබලිවලින් රතන ප්‍රමාණවූ අංකුර නැගේ. ඒ අංකුර බීජගාම වශයෙන් ද, එසේ ම එය බිම සිටුවා මුල් ඇදගත් කල්හි භූතගාම වශයෙන් ද සැලකේ. මුං අංකුරවල කොල හටගත් කල්හි ද, වීවල ඇදුන අංකුරය නිල්වන් වූ කල්හි ද භූතගාම සංඛ්‍යාවට ගැණේ. තල් පොල් ආදියෙහි අංකුරය නිල්වනතුරු බීජගාම වශයෙන් ද, නිල්වූ තැන් පටන් භූතගාම වශයෙන් ද සැලකේ. ගෙබිත්ති හා පවුරුවල වැඩෙන සෙවෙල් දෙතුන් පතක් වැඩෙනතුරු අග්ගබීජ සංඛ්‍යාවට අයත් වේ. එබැවින් එය වැසෙනසේ ආලේපකරන්ට නො වටී. අනුපසම්පන්නයෙකු විසින් පළමු අලෙවි දුන් තැනක නම් වටී. නිදඝකාලයෙහි බිත්තිවල පවත්නා වියළුනු සෙවෙල් මුස්නෙන් උලා බැහැරකිරීම අනාපත්තිකරය. බිම්මල් මුකුළු කල්හි සිඳින්ට නො වටී. අඹුහස්වල හටකත් හතු සිඳින්නාහට ද පචිති වේ. මල් නෙලීමට හෙරණුන්ට අතුනමා දීම නිවරද ය. එසේම හෙරණුන් ඔසවා මල් නෙලවා ගැණීම ද නිවරද ය. යම්කිසි ගසක් හෝ වැලක් අනුපසම්පන්නයන් සමග එකතුවී බීම ඇද දමන්ට ව්‍යායාම්කිරීම නුසුදුසු ය. ඔවුන්ට උත්සාහ දූනවීම පිණිස රැහැන අගින් අල්ලාගන්ට නම් වටී. 'අනුජානාමි භික්ඛවෙ පඤ්චහි සමණකප්පෙහි ඵලං පරිභුඤ්ජිතුං, අග්ගිපරිචිතං සත්ථපරිචිතං නඛපරිචිතං අබීජං, නිබ්බට්ටබීජං, යන පස් අයුරින් කැපවූ ඵල උපසපන් භික්ෂූන් විසින් වැළඳියහැකි වෙයි. මේ ශික්ෂාපදය කායචිත්ත වාචාචිත්ත කායවාචාචිත්ත වශයෙන් ත්‍රිසමුට්ඨාන වෙයි. භූතගාම සංඛ්‍යාවට අයත් බව, භූතගාම යන හැඟීම් ඇතිබව, විකොපනය යන අංග තුනකින් යුක්ත වේ.

භූතගාම සික්ඛාපද ගැටපදය නිමි.

අනාචාරං ආචරිත්වා- අනාචාරයෙහි හැසිර; කායවචීවාරයන්හි ඇවැත්වලට පැමිණ; අඤ්ඤේනඤ්ඤං පටිචරති- අනික් වචනයකින් අනික් වචනයක් වසයි. චෝදකයා චූදිතකයාගේ දොෂවිභාවනය පිණිස යමක් කීකල්හි ඊට සාක්පසින් ම විරුද්ධවූ චෝදනාවකින් එහි අමූලිකභාවයක් හෙලිකරමින් එය වැසීමට මෙසේ තැත්කරයි.

"තුඹ මෙතම් ඇවතකට පැමිණියෙහි ද?"

"එහෙමයි, මම පැලලුප් නුවරට ගියෙමි."

'අපි තුඹගේ පැලලුප් ගමනක් නො විචාරමු. මෙතම් ඇවැතකට පැමිණියෙහිද?

"එසේය, එහින් රජගහනුවරට ගියෙමි."

"රජගහනුවරටත් යව, පැලලුප් නුවරටත් යව, මෙනම් ඇවතකටය් පැමිණියෙහිදැයි කියව."

"එසේය, මට එහිදී හූරුමසක් ලැබුනේය."යි

මෙසේ අනිකක් අනිකක් කියා කරුණ වළකාලිම අනික් කරුණකින් අනික් කරුණක් වසාලීම නම්. කො ආපන්නො- කවරෙක් පැමිණියේද, යම්කිසි භික්ෂුවකගේ ආපත්තිව්‍යතික්‍රමයක් සඟමැද විචාරන්නේ,

"ඇවැත්නි, තුඹ අසවල් ඇවතට පැමිණියෙහි ය."

"කවරෙක් ද? ඇවතට පැමිණියේ"

"තුඹයි"

"මම කවර ඇවතකට පැමිණියෙම්ද?"

"පචිත්තිය කටයි"

"කවර වස්තුවකින්ද?"

"අසවල් වස්තුවෙති."

"කෙසේ කුමක් කරමින් පැමිණියෙම්ද?"

"මෙනම් දෙයක් කරණකාලය"

"තෙපි කුමක් කියව්ද?"

"ඒ ඇවත ගැණ කියමි"

"කා ගැණ කියව්ද?"

"තුඹ ගැණ කියම්" යි

මෙසේ අවුල්කරයි. භික්ෂූන් "තුඹ අතේ කහවණුවක් වෙයි. කුමක් හෙයින් එසේ කොරෙහිදැ" යි විචාළ කල්හි, "සවාමීනි, එය සැබවය, එහෙත් එය කහවණුවක් නො වෙයි. ඊනම් පොත්තකි.

"තුඹ සුරාපානය කොළෙහිය, කුමක් හෙයින් එසේ කොළෙහිදැයි විචාළ කල්හි, සවාමීනි, තුඹවහන්සේ දක්නාලද්දේ සැබවකි එහෙත් එය සුරාවක් නොවෙයි. බෙහෙත් අරිෂ්ටයකි."

"තුඹ මාතෘගාමයක් සමග රහසිනතව කථාකළෙහිය. කුමක්හෙයින් එසේ කොළෙහිදැ? සවාමීනි, එය සැබවකි. එහෙත් එහි තුඹුණෑනි පුරුෂයෙක් සිටියේය."

"නුඹ මෙබන්දක් නුදුටුවෙහි ද?"
"මම එබන්දක් නො ඇසුවෙමි"යි

ඇසූ ඇසූ දෙය අන් අන් අයුරින් වසයි. අඤ්ඤවාදකෙ විහෙසකෙ පාචිත්තියං- අනික් කරුණකින් අනික් කරුණක් වැසීමෙහිදී ද විචාල දෙයට පිළිතුරු නොදී තුෂ්ණීම් භාවයෙන් සිටීමෙහි ද පචිති ඇවැත් වේ. අඤ්ඤවාදකං රොපෙන්තු- අන්‍යවූ වාදකර්මයක් ආරෝපනය කෙරේවා; විහෙසකං රොපෙන්තු-විහෙසකභාවය ආරෝපනය කෙරේවා; ගිලානො වා න කථෙති- (මුඛයෙහි කථාකරගන්ට නොහැකි ආබාධයක්වූ හෙයින්) ගිලන්වූයේ නො කියයි. සඞ්ඝස්ස භණ්ඩනං වා-(සඟමැද කිකල්හි) සඞ්ඝයාගේ විවාදයක් හෝ වෙයි. එසේ යමක් නො වේවායි කථා නො කෙරෙයි. මේ ශික්ෂාපදය කායචිත්ත වාචාචිත්ත කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. ධර්මකර්මයෙන් ආරෝපනය කරණලද බව, ආපත්තියෙන් හෝ වස්තුවෙන් හෝ අනුයුඤ්ජනය කටයුතු බව, අඤ්ඤේනඤ්ඤං පටිචරණය හෝ තුණ්හීභාවයයි අඞ්ග තුණකින් යුක්තය.

අඤ්ඤවාදක ශික්ෂාපද ගැටපදය නිමි.

---

දබ්බං මල්ලපුත්තං භික්ඛූ උජ්ඣාපෙන්ති- දබ්බමල්ලපුත්‍ර ආයුෂ්මත් තුන් ගැණ භික්ෂූහු ලාමක වශයෙන් සිතත්. ඡන්දාය- ('ඡන්දෙන' යි වියයුතු තැන ලිඞ්ගවිපල්ලාස වශයෙන් 'ඡන්දාය' යි යොදනලදී.) පක්ෂපාත කමින්; තමන්ගේ කුලූපග භික්ෂූන්ට ප්‍රණීත ප්‍රණීත දෙය පිළියෙලකොට දෙයි. උජ්ඣාපනකෙ- අවමන්වන බස් කීමෙහි; ඛීයනකෙ- සියලු තැන නුගුණ පතළකොට කීමෙහි; ධම්මකම්මෙ- (ඒ භික්ෂු පිළිබඳව කරණලද උපසම්පදා සම්මුතිකර්ම සංඛ්‍යාත) ධර්මකර්මයෙහි; අනුපසම්පන්නං උජ්ඣාපෙති- අන්‍යවූ අනුපසම්පන්නයෙකු ලවා අවමන් කරවයි. උපසම්පන්නං සඞ්ඝෙන අසම්මතං- කර්මවාක්‍යයෙන් අසම්මතවූ උපසම්පන්නයෙකුට; එහෙත් "මේ භාරය නුඹට අයිති"යි සඞ්ඝයා විසින් ආරෝපිත භාරය භික්ෂූන්ගේ පහසුව පිණිස උසුලන්නහුට; අනුපසම්පන්නං සඞ්ඝෙන සම්මතං වා අසම්මතං වා- සඞ්ඝයා විසින් සම්මතවූ හෝ අසම්මතවූ හෝ අනුපසම්පන්නයෙකුට; අනුපසම්පන්නයෙකුට පෙරසම්මුතියක් කිසිසේත් දෙන්ට නොවටී. එහෙත් හේ උපසම්පන්න කාලයෙහි ලත් සම්මුතිය ඇතිව පසුව අනුපසම්පන්න භාවයෙහි සිටියෙකි. ඒ නිසා 'සඞ්ඝෙන සම්මතං" යි යොදනලදී. ව්‍යක්ත වූ හෙරණෙකුහට සඞ්ඝයා විසින් හෝ භික්ෂුවක් විසින් හෝ 'නුඹ මෙනම් දෙය කරව' යි භාරකරණ ලද්දේය. ඒ නිසා 'අසම්මතං' යි යොදනලදී. මේ ශික්ෂාපදය කායචිත්ත වාචාචිත්ත කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. දැහැමිකැමින් සම්මතබවය, උපසම්පන්නබවය, අගතියට නොයෑම බවය, ඔහුට අවමන් කිරීමෙහි කැමත්තබවය, යමෙකු ලඟ කියා නම් ඔහුගේ උපසම්පන් බවය, උජ්ඣාපනය හෝ ඛීයනයයි අඞ්ග සයකින් යුක්ත වේ.

උජ්ඣාපන ශික්ෂාපද ගැටපදය නිමි.

හෙමන්තිකකාලෙ- හිම වැටෙන කාලයෙහි; ඉල්මස කාලපක්‍ෂයෙහි පටන් මැදින් මස අවපෑලවිය දක්වා අතර කාලය හෙමන්තික කාලයයි; කායං ඔතාපෙන්තා- (ඇඳ පුටු ආදියෙහි හිඳ බාලාර්කරශ්මියෙන්) කය උණුසුම් ගන්වන්නෝ; ඔවට්ඨං-හිමවැස්සෙන් තෙමුනක්; අවස්සික සඞ්කෙතෙ- වැසි ලකුණු නැති; හෙමන්තික සිවුමසය ගිම්හික සිවුමසය යන අටමස මීට ගතයුතුවුවද හෙමන්තික සිවුමසෙහි ද වැස්ස පවත්නා හෙයින් එය අත්හැරදමා ගිම්හික සිවුමස ම අවස්සික සඞ්කෙත කාලය වශයෙන් ගතයුතු වේ. එහෙයින් වස්සාන කාලයෙහි හා ගිම්හාන කාලයෙහි අභ්‍යවකාශයෙහි අසුන් පණවා නො තැබිය යුතුයි. කවුඩන් හෝ අන් පක්‍ෂීන් නිති වසන රුක්මුල්වලද අසුන් පණවා තබන්ට නුසුදුසු ය. අබ්භොකාසික ධුතඞ්ගය දරන්නහු විසින් පුද්ගලික ඇඳ පුටු ආදිය ම ශයනය පිණිස පණවාගත යුතුයි. සාංඝික දේ ගතයුතුනම් වේවැලින් හෝ නියඳින් වියූ අසුන් ම ගත යුතුයි. අරණෙහි වසන භික්‍ෂූන් කෙරෙහි පැහැදුනු සිත් ඇත්තෝ "ස්වාමීනි, සාංඝික පරිභොගයෙන් පරිභොගකිරීම පිණිස යයි අභිනව ඇඳ පුටු ආදිය පිරිණමති. අරණ වාසය අත්හැර යන්නාවූ ඒ භික්‍ෂූන් විසින් ඒ ඇඳ පුටු ආදිය සාමන්ත විහාරවල වාසයකරණ භික්‍ෂූන්ට භාරකොට යායුතුයි. සභාග භික්‍ෂූන් නො ලබන්නවුන් නො තෙමෙන සේ නො නැසෙන සේ තැන්පත්කොට යායුතුයි. සෑ මිදුල් බෝජුන් හල් ආදිය හැමදීම පිණිස මුසුන් ගතහොත් අවසන්හි එය සම්මජ්ජනී මාලකයෙහි ම තැන්පත්කොට තැබිය යුතුයි. මඤ්චකො-හැඳපය විද වල ඇවුනු ඇඳ; බුන්දිකාබද්ධො-වලින් ඇඳ පය ඔබවා කළ ඇඳ; කුළීර පාදෙ- කකුළුවන් පා සේ පා ඇති ඇඳ; ආහච්චපාදෙ- ඇදවාලම විද පාසිළුවද්දා ගැසූ පෝරු ඇඳ; අනෙනා සංවෙඨෙත්වා බද්ධං හොති- උඩ යට දෙකොන පුළුල්වනසේ මැද සිහින්වනසේ පනාබෙර සටහනින් බැඳගත් බුරුසු විශෙෂයක් වෙයි. ලෙඩ්ඩුපාතං- ථාමමජ්ඣිම පුරුෂයෙකු දමාගැසූ ගල වැටෙන දුර ප්‍රමාණය; චිමිලිකං- සුණු පිරියම් කරණලද බිම පැහැය නො නැසෙන සේ ඊමත අතුරණු පිණිස රෙදි කැබලි එකතුකොට මසාගත් ඇතිරිලි ආදිය; උත්තරත්ථරණං- ඇඳ පුටු මත අතුරණ ඇතිරිලි; භුම්මත්ථරණං- බුමුතුරුණු; බිම අතුරණ කලාල හෝ ලනුපැදුරු; තට්ටිකං- තල්කොලින් හෝ නියඳින් ගෙතූ පැදුරු; චම්මඛණ්ඩං- සම්කඩ; "න භික්ඛවෙ මහාචම්මානි ධාරෙතබ්බානි" යි වදාළ හෙයින් සිංහ ව්‍යාඝ්‍ර දිවි ආදීන්ගේ සම් ඇඳ පුටු මත අතුරා පරිහරණයකිරීම භික්‍ෂූන්ට අකැපය. බුමුතුරුණු වශයෙන් පරිභොගකිරීම නිවරද වෙයි. එසේ භුම්මත්ථරණ වශයෙන් පරිභොග කරණු ලබන්න ද තමන් සතුකොට ගෙණ ඒ ඒ විහාරයට ගෙණ ගොස් පරිභොගකරන්ට නො වටී. පාදපුඤ්ඡනී- වැල් ආදියකින් හෝ කඩමාලුවලින් ගෙතූ පාපිස්නා කිලි; ඵලකපීඨං- පුවරුවලින් තැනූ පුටුව; ඔකාසෙනෙනා ගච්ඡති-මඤ්චාදිය අවුසාමින් ඊට ආපනු පැමිණ තැන්පත් කොට තබමියි යෙයි. සෙනාසි පලිබුද්ධං හොති-

සෙනසුනට කිසිවෙකු විසින් උවදුරක් කරනලද්දේ වේද; ඉදින් යක්ෂයෙක් හෝ ප්‍රේතයෙක් හෝ පැමිණ එහි හිඳිති. නැතහොත් කිසි යම් අධිපතියෙක් පැමිණ ගණිති. සිංහ ව්‍යාඝ්‍රාදීහු හෝ ඒ පෙදෙසට පැමිණ සිටිත්. මෙසේ පලිබොධ ඇතිකල්හි සෙනසුන් සකස් නො කොට යත්තහුට අනාපත්ති ය. ආපදාසු- ජීවිතයට හෝ බ්‍රහ්මචර්‍ය්‍යායට අනතුරු ඇති කල්හි; මේ ශික්ෂාපදය කායවාචා, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. මඤ්චාදීන්ගේ සඟසතුබවය, කියනලද ලකුණින් යුත් පෙදෙසෙහි සන්ථරණය හෝ සන්ථරාපනය, පලිබොධ රහිත බවය, ආපදාදීන්ගේ අභාවය, ලෙඩ්ඩුපාතාතික්කමය යි අඞ්ග පසකින් යුක්ත වේ.

### පඨම සෙනාසන සික්ඛාපද ගැටපදය නිමි.

---

භිසි- බිස්ස, ඇඳ පුටු ආදියෙහි ගුදිරි හෝ, බුමුතුරුණු ආදියෙහි ගුදිරි හෝ, පාපිස්නා භිසි හෝ මෙහි භිසි වශයෙන් සැලකිය යුතුයි. මඤ්චභිසි, පීඨභිසි, භුම්මත්ථරණභිසි, චඞ්කමනභිසි, පාදපුඤ්ඡනභිසි යයි යෙදෙන තැන් වශයෙන් පංචප්‍රකාරය. එසේ ම උණ්ණාභිසි, චොලභිසි, තිණභිසි, පණ්ණභිසි යයි නිපදවීම් අයුරින් ද පංචප්‍රකාර වේ. මෙහි විස්තර ගරුභණ්ඩ විනිශ්චයෙන් දතහැකියි. නිසීදනං- දවලු සහිතවූ හිඳිනා ඇතිරිලි; පච්චත්ථරණං- ලොම් දිගට ඇති පාවාර කොජව නම් ඇතිරිලි; මඤ්චපීඨාදියෙහි ඇතිරියයුතු ඇතිරිලියයි දැරණී ගණ්ඨිපදවල දක්වයි. තිණසන්ථාරෝ- කුසතණ විසුරුවා කල ශයනාසනය; පණ්ණසන්ථාරෝ-පත් එලා කල සන්ථරණය; පරික්ඛෙපං- පවුරු ඈ පරික්ෂේප; අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය- ආපුච්ඡා නොකොට යන්නේ නම්; භික්ෂුනමක් ඇති කල්හි ඒ භික්ෂුහට දන්වා යායුතුයි. එසේ නැත හෙරණසටද, නැත්නම් ආරාමිකනටද, දන්වා යායුතුයි. එසේත් නැති කල්හි විහාරය කරවූ තැනැත්තහුට හෝ ඒ කුලයෙහි වූවෙකුට හෝ දන්විය යුතුයි. දන්වියහැකි කිසිවෙකු නොමැති කල්හි ගල්සතරක් මතුයෙහි ඇඳක් තබා, ඒ මත සෙසු ඇඳපුටු තැන්පත් කොට එහි දශවිධ ශය්‍යාවන් රැස්කොට තබා, ලී බඩුද මැටි බඩුද තැන්පත්කොට තබා, දොරද කවුළුද වසාදමා, ගමිකවත් සම්පූර්ණ කොට යායුතුයි. ඉදින් සෙනසුන වැස්වට කල්හි තෙමේනම් තෙමෙන තැන් පිළිසකර කරවිය යුතුයි. එසේ නොකටහැකිනම් නො තෙමෙන තැන්වල ඇඳ පුටු ආදිය තැන්පත් කටයුතුයි. සියලු ආවාසය ම තෙමේ නම් ඇතුළු ගමෙහි ගෙයක ඒ ගරුපිරිකර සියල්ල සුරැකිව තැබිය යුතුයි. එසේත් ඉඩක් නොමැති නම් අභ්‍යවකාශයෙහි හෝ තණපත් ආදියකින් ආවරණය කොට යායුතුයි. විහාරස්ස උපචාරෙ-විහාරය පිළිබඳ පරික්ෂේපාභ්‍යන්තරයෙහි; උපට්ඨානසාලායං- විහාර පරික්ෂේපාභ්‍යන්තරයෙහි පිහිටි බොජුන්හලෙහි; රුක්ඛමූලෙ- විහාර භූමියෙහි වූ රුක්මුල; විහාරෙ-ඇතුළු කාමරය හෝ හැමලෙසින් ඇවුරු සෙනසුන; මණ්ඩපෙ- ඇවුරූ හෝ නොඇවුරූ බොහෝ

දෙනා රැස්වන ශාලාවෙයි; ආසනානි දුස්සාධියන- දුකුලා ඇවැත් වේ. දශවිධ ශය්‍යාවන් ඇතුළුනැප් ආදි ගුප්ත ස්ථානයන්හි පණුවා යන්නනුව ශය්‍යාවන් වේයන් කැමෙන් නො විනාශවියන්ට ඉඩ ඇති හෙයින් පවිතියක් වදාළසේක. උලඩ්ගිත්වා ගච්ඡති- (අතුල ශය්‍යාවන් වේයන් නො කන සේ) නගා තබා යෙයි: ඕයලුම ඇඳ පුටු ඇතිරිලි කවුළු රෙදි ආදිය ඉවත්කොට නමා විවරවංසයෙහි එල්වා තබා යායුතුයි. පසුව පැමිණි භික්ෂූන් විසින් ද නැවත ඒ ඇඳපුටු ආදිය පණුවා ශයනය කොට යන්නවුන් එය පෙරසේ ම තැන්පත් කොට යායුතුයි. ඇතුළු නෙයින් පිටතට පරිභොගය පිණිස ගත් සෙනසුන්ද යන්නනු විසින් තිබූ සැටියෙන් ම තැන්පත් කොට යායුතුයි රාත්‍රිස්ථාන දිවාස්ථාන ආදියෙහි තබංගත් ඇඳ පුටු ආදිය ද පෙරසේ ම තැන්පත් කොට යායුතුයි. ආපුච්ඡිත්වා ගච්ඡති- ආපුච්ඡා කොට යෙයි; ලී කණු සිටුවා කළ ගෙය වේයන් නැගෙණ නැතකි. එහෙයින් එයින් බැහැරයන්න වුන් විසින් විචාරා ම යායුතුයි. ගල්ලෙන්හි සුණු පිරියම්කළ සෙන සුන්හි වසන්නවුන් බැහැරයන කල්හි වේයන්ගෙන් සිදුවියහැකි උවදුරු ගැණ සැක නොමැති නම් ආපුච්ඡාකොට හෝ නො කොට යාහැකියි. එහෙත් විචාරා යාම සුදුසු වෙයි ආගන්තුක නේවාසික දෙදෙනාගෙන් ආපුච්ඡා නො කොට යාමෙහි වරද නේවාසික භික්ෂුව කරා පැමිණේ. දෙතුන්නමක්ව අසුන් පැණවූ කල්හි ආපුච්ඡාකොට යාමෙහි භාරය දෙතුන්නම සාරම පැමිණේ. නැවති සිටින භික්ෂූහු ආරක්ෂා කෙරෙත්යයි හැඟීම් ඇතිකල්හි පළමුවෙන් එයින් නික්මෙන භික්ෂුහට වරදක් නැත. මේ ශික්ෂාපදය කායවාචා කායවාචිත්ත වසයෙන් සමුට්ඨානය වේ. කියනලද ලකුණු ඇති සෙනසුනක් වීම, එය සාංඝිකවීම, කියනලද ලකුණු ඇති විහාරයෙහි සන්ථරණය හෝ සන්ථරාපනය කරවීම, පළිබොධ රහිතබව, ආපදාවන්ගේ අභාවය, අපෙක්ෂා රහිතවූවන්ගේ දිශාපක්කමනය, උපචාරසීමාතික්‍රමණයයි අඞ්ග සතකින් යුක්තවෙයි.

දුතිය සෙනාසන සික්ඛාපද ගැටපදය නිමි.

---

පලිබොධභාවෙ- පළිබොධ කෙරෙත්; පළමුවෙන් පැමිණ පාසිවුරු විදහා තබා අසුන් අවුරා සිටිත්; පෙරහැර භික්ෂූ උපඛාපෙතකාවි-(ඇවත මේ අසුන අපට අයිතියයි වශයෙන ගණන්කොට) ස්ථවිර භික්ෂූන් නගාසිටුවත්. අනුපඛජ්ජ ... - (ස්වාමීනි, නුඹවහන්සේ ට ද අයිති ඇඳ තබානැණිවට තැනක් පමණය, සියලු විහාරය අයිති නැත අපට මෙතැන දෙවයි) ලබා පාමිණ ඇඳ පුටු පණුවා හිඳිත්, හොවිත්, හඳරත්; ... - මේ ස්ථානයෙන් නො නැගිටවිය යුතුයයි දන්නේ; වෘද්ධ භික්ෂුව වෘද්ධ හෙයින් ද, ගිලනා ගිලන් හෙයින් ද, නො නැගිටවිය යුත්තාහ. එසේ ම සංඝයාගෙන් ලැබූ භාණ්ඩාගාරික ධම්මකථික, විනයධර, ගණවාචක, ආචාර්ය ස්ථවිරයන් වහන්සේ ද ගුණවිශිෂ්ටතා හෙයින් නො නැගිටවිය යුත්තාහ. උපචාර- සෙල

රියනක්වූ සම්පයෙහි; විහාරයෙහි පා සෝදා නික්මෙන්නහුට ද මලමූ කිස පිණිස නික්මෙන්නහුට ද මාර්ගය පිණිස ඇඳ පුටු අතර හෝ, පමණින් මහත්වූ විහාරය හාත්පස සෙලරියනක් උපචාරය තැබිය යුතුයි. එම උපචාරයෙහි ශයනාසනවීමට අපුන් පණවන භික්ෂුහට දුකුලා ඇවැත් වේ. අභිනිසීදති වා අභිනිපජ්ජති වා-හිඳී ද නැත හොත් හොවීද එපමණකින් ම ඇවැත් සිදුවේ. හිඳීම් හොවීම් කිස්දෙක ම කෙරේනම් ඒ භික්ෂුහට පචිති ඇවැත් දෙකකි- නැගිට නැගිට හිඳීමෙහි හෝ හොවීමෙහි ප්‍රයොගගණන පරිදි පචිති ඇවැත් වේ. අඤ්ඤත්‍ර පුග්ගලිකා- විශ්වාසකයාගේ පුද්ගලික දෙයෙහි; ආපදාසු- (පිටත වසනකල ජීවිතයට හා බඹසරට අනතුරුයවේද) එබඳු ආපදා වන් ඇතිකල්හි; මේ ශික්ෂාපදය සමුට්ඨාන වශයෙන් පඨමපාරාජික ශික්ෂාපදය හා සදෘශය. සාංඝික විහාරයක් වීම, අනුට්ඨාපනීය භාවජානනය, සම්බාධකරන්ට කැමැතිබව, උපචාරයෙහි නිසීදනය හෝ නිපජ්ජනයයි අඞ්ග සතරකින් යුක්ත ය.

අනුපඛජ්ජ ශික්ඛාපද ශැටපදශ නිමි.

---

එකෙන පයොගෙන බහුකෙපි ද්වාරෙ අතික්කාමෙති- එක් ප්‍රයොගයකින් බොහෝ සෙනසුන්හි පවා නො නවත්වා බැහැර කෙරේද; සිවු බුමු හෝ පස්බුමු හෝ පායක වසන්නකු හෝ දොර කොටු සතඅටකින් එහා වසන්නෙකු හෝ ග්‍රීවයෙන් හෝ අතින් නෙණ නො නවත්වා බැහැර කරන්නහුට එක් පචිත්තියක් වේ. නවත්ව නවත්වා බැහැරකරන්නහුට වාරගණනින් පචිති ඇවැත් සිදුවේ. අතින් නො අල්ලා වචනයෙන් බැහැරකරන්නහුට ද මෙසේ ම ඇවැත් සිදුවේ. 'නික්මෙව' යන වචනය අසා තමන්ගේ රුචියෙන් නික්මයේ නම් අනාපත්ති ය. අඤ්ඤං ආණාපෙති- (මොහු බැහැරකරවයි) අනිකෙකුට අණවයි. මෙසේ අණකළ පමණින් ම ඒ භික්ෂුහට දුකුලා ඇවැත් වේ. වරක් අණලැබූ තැනැත්තේ බොහෝ දොරකොටුවලින් බැහැර කෙරේද, ආණාපකයාහට එකම පචිති ඇවතක් සිදුවේ. මෙපමණ දොරකොටු ගණනකින් බැහැරකරවයි නියමකොට ඇණ වූයේ නම් ආණාපකයාහට දොරකොටු ගණනින් පචිති ඇවැත් සිදුවේ. තස්ස පරික්ඛාරං- ඔහුට අයත් පාසිවුරු ආදී පිරිකර; නික්කඩ්ඪනය කරන්නහුට වස්තු ගණනින් දුකුලා ඇවැත් සිදුවේ. දැඩි වශයෙන් එකට බැඳ තිබූ බඩු පොදියක් නික්කඩ්ඪනය කරවන්නහුට සිදුවන්නේ එකම දුකුලාවකි. අලජ්ජිං නික්කඩ්ඪති- අලජ්ජි මහණ බැහැර කෙරෙයි. අලජ්ජි ආදීනු තමන් වසනා තැනින් බැහැර කටයුත්තාහුය. සියලු සඟරමින් ම බැහැරකරවන්ට නොවටී. භණ්ඩනකාරක කලහකාරකාදීහු සියලු සඟරමින් ම නික්කඩ්ඪනය කටයුත්තාහුය. ඉන් පක්ෂබලය ලැබ භණ්ඩනය කිරීම ද කරන්නේ ය. බැහැරකරන්නහුට මද කොපලවයක් ඇතිවූයේ ද ඒ භික්ෂුහට අනාපත්තිය. මේ ශික්ෂා

පදය කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත යන සචිත්තක ත්‍රිකයෙන් සමුට්ඨානය වේ. සාඞ්ඝික විහාරයක් වීම, උපසම්පන්නවූවහුගේ භණ්ඩන කාරකභාවාදියෙන් විනිර්මුක්ත බව, කොපයෙන් බැහැරකිරීම් හෝ කරවීම යයි අඞ්ග තුණකින් යුක්ත වේ.

නික්කඩ්ඪන සික්ඛාපද ගැටපදය නිමි.

---

**උපරි වෙහාසකුටියා**-මත්තෙහි පෝරු නො අතුළා වූ තලාඳ මත ඇති මහල්වට කුටියෙහි; **මඤ්චං සහසා අභිනිසීදි**-හැදෙහි වහා හුන්නේය., 'මඤ්චං' යනු භුම්මාර්ථයෙහි උපයෝග වචනයි. 'අභිනිසීදි' යන තන්හි 'අභි' යනු ශොභනාර්ථයෙහි වූ උපසර්ගයකි. **නිප්පතිත්වා**-නික්මී; එහි මත ඇණ නො ගැසූ හෙයින් ගැලවී, යනුයි. **විස්සරමකාසි**-බැගෑ හඬක් කෙළේය. **වෙහාසකුටි නාම මජ්ඣිමස්ස පුරිසස්ස අසීසඝට්ටා**- වෙහාසකුටිය නම් මධ්‍යම පුරුෂයෙකුගේ හිස මතු තලාඳයේ යට නො ගැටෙන්නකි. මත්තෙහි නුසුන්තල ඇති මහල් සහිත කිළිය වෙහාසකුටි නම්. 'අසීසඝට්ටා' යනුවෙන් එහි උසේ ප්‍රමාණය දක්වීය. **අවෙහාසකුටියා**- බිම කරණලද කුටියෙහි; **සීසඝට්ටාය**-හිස ගැටෙන්නාවූ වෙහාසකුටියෙහි; මෙවැනි කිළියක නිසජ්ජ, දිය කරන්නාහට අනාපත්ති වේ. **හෙට්ඨා පරිභොගං හොති**-(යම් වෙහාසකුටියක) යටතලය පරිභොගාර්හ නො වේද; **උපරිමතලං**-මතුමාල; **පදරසඤ්චිතං හොති**- (මතුමාල) පෝරු අතුරණලද හෝ වේද; **ආහච්චපාදකෙ**- හැඳවල් හිස විද පාසිළුගන්වා සිළුම්දුනෙහි ඇණ නොගැන්වූ හැඳෙහි; **පටාණි**-හැඳ පාසිළු නො ගිලිහෙන පිණිස පිටසැ හොවා තබන ඇණ; **ගණ්හාති වා ලග්ගෙති වා**- උඩ බැඳි කිසිවක් ගන්නේ හෝ වේද, උඩබැඳි අඞ්කුසාදියේ යම් පිරිකරක් එල්වන්නේ හෝ වේද; මේ ශික්ෂාපදය කාය කායචිත්ත වසයෙන් සමුට්ඨානය වේ: සාඞ්ඝිකවිහාරයක් වීම, අසීසඝට්ට වෙහාසකුටියක් වීම, යට පරිභොග සහිතවීම, පාසිළුවල ඇණ නුදුන් ආහච්චපාදක නම් අසුනක හිඳීම හෝ හොවීම යයි අඞ්ග සතරකින් යුක්ත වේ.

වෙහාසකුටි සික්ඛාපද ගැටපදය නිමි.

---

**යාව ද්වාරකොසා**- ද්වාරකෝසය දක්වා; ද්වාරකෝසය නම් දොරබා අබියෙස යෙලරියනක් පමණ ප්‍රදේශයයි ද, ද්වාරයාගේ දෙපස කවුළු පමණතැන් යයිද, දක්වති. කවාට ප්‍රමාණය නම් යෙලරියනක, හෝ දෙරියනක් හෝ දෙරියන් හමාරක් හෝ පැතිර පැවැති පෙදෙසයි. බිත්තිය දක්වා වාර අබියෙස වාරකෝෂ නමැයි වජිරබුද්ධියෙහි දක්වයි. **පිට්ඨසඞ්ඝාටස්ස සාමන්තා**-දොරබියලී පල්ල පමණ දොරබා අබියෙස; **අග්ගළට්ඨපනාය**- උළුඛ්‍රිපත සහිතවූ දොරපෝරුයෙන් දොරබාව නිශ්චලවනු පිණිස; **ද්වාරට්ඨපනාය**- යනුද මේ අර්ථය පිණිසම පදභාජනයෙහි යොදනලදී. විවෘතකරණ කාලයෙහි මඳක් විවෘතකලකල

දොර බිත්තියේ හැපෙයි. වසන කාලයෙහි දොර දොරබාවෙහි හැපෙයි. එසේ හැපීමෙන් බිත්තිය සෙලවෙයි. එසේ හෙයින් මැටි බුරුල්වෙයි. එසේ බුරුල්වූ මැටි වැටෙන්ට පටන්ගණියි. පුනප්පුනං ඡාදාපෙසි පුනප්පුනං ලිම්පාපෙසි - නැවත නැවත ඡාදනය කරවීය, ලේපනය කරවීය. වාරයාගේ දෙපසද ඉත්තෙහිදූයි තුන්දිසාවෙහි දෙරියන් වියත් පමණ තැන් උපචාරය වෙයි. මෙය දොරබාව නිශ්චලවනු පිණිස ලේපනය කටයුතුයයි වදාරණලදී. වාරයාගේ යට පෙදෙසෙහි ද ඉදින් උපචාරය වේනම් එය ද ලේපනය කටයුතුයි. ආළොකසන්ධි පරිකම්මාය - වාතපාන කවාටයන්ගේ සපිරකමය පිණිස; වා කවුළු හරිණ කල්හි එහි හාත්පස වියතක් පමණ හෝ ඊට වැඩියක් බිත්තියෙහි හැපෙයි. එහෙයින් සියලු දිසින් කවුළුවට ප්‍රමාණ තැන් ලේපනය කටයුතුයි. මෙසේ ලේපනය කිරීම තුන්වර තෙක් කටහැකියි. සිවුවැනි වාරයෙහිදී ඇවැත් සිදුවේ. ඔතාපිඡ්ඡදනස්ස පරියායං - ඡදනයාගේ දෙතුන් සෙවිලිතක්; අධිට්ඨෙතබ්බං - වදාරා කියා; ඡදනය නම් පියැස්සයි, පියැසි මත සෙවෙයකිරීම් දෙකක් හෝ තුනක් අධිට්ඨාන කටහැකියි. මෙසේ සෙවෙති කරන්නේ බොහෝකලක් නො තෙමී පවතියි යන අදහසිනි. වජිරබුද්ධියෙහි - "ඡදනුපරිති එත්ථ පඨමං තාව එකවඡ්ඡදනං අපරිසෙසං ඡාදෙත්වා පුන ඡදනදණ්ඩකෙ බන්ධිත්වා දුතියවාරං තථෙව ඡාදෙතබ්බං, තතියවාර චතුත්ථවාරෙ සම්පත්තෙ වෙමග්ගෙ අධිට්ඨහිත්වා තතියමග්ගං ආණාපෙත්වා පක්කමිතබ්බන්ති තං පුනප්පුනං ඡාදාපෙසීති ඉමිනා යුජ්ජති." "පියැසි මතුයෙහි පළමු කොට එක්වරක් සම්පූර්ණයෙන් ම සෙවෙති කොට නැවත ගොණැස් සවිකොට දෙවෙනි වරක් ද පෙරසේම සෙවෙති කටයුතුයි. තෙවෙනි වරද එසේ ම කරවයි අණකොට බැහැර යායුතුයි. පුනප්පුනඡාදනය නම් මෙසේ කිරීම හා සැසැදෙයි" යනුයි. අප්පහරිතෙ ඨිතෙන - ධාන්‍යා දිය නො වපුළතැන සිටයහු විසින්; මෙහි 'හරිත' යන්නෙන් සාලිවීහි ආදි සප්තවිධ ධාන්‍ය හා මුං, මෑ, තල, කොල්ලු ලබු, කොමඩු අපරණ්ණ ද ගතයුතුයි. මෙහි 'අප්ප' ශබ්දය අභාවාර්ථයෙහි වෙයි, හරිතෙ ඨිතො - වපුල ධාන්‍ය ඇති කෙතක සිටියේ; යම් කෙතක වපුල ධාන්‍ය වගී තවම පැල හටනොගත්තේද, වැසිවට කල්හි පැල නැගේ ද ඒ කෙත ද හරිතසඞ්ඛ්‍යාවට යැයේ. එබඳු කෙතක සිට අධිට්ඨානය නො කටයුතුයි. පැල නො නැගී, වැසිවට කල ද පැල නො නැගෙන කෙතක සිට ම අධිට්ඨානය කටයුතුයි. සිටින්නහු පිළිබඳ පරිච්ඡේදය මෙසේ දතයුතුයි. වහළ පසෙක හෝ කුළුණෙහි කැරැල්ලෙහි හෝ හුන්නහුට සෙවෙති කෙළවරින් යම් බිම් පෙදෙසක සිටියහු පෙනේ ද, යම් බිම් පෙදෙසක සිටියහුට ඡදනය මත හුන්නහු පෙනේ ද, ඒ බිම් පෙදෙස අධිෂ්ඨානය කරන්නහුගේ සීමාවයි. අහරිත වූයේ ද ඉන් ඇතුළත සිට අධිෂ්ඨානය නො කටයුතුයි. මග්ගෙන ඡාදෙන්තස්ස - ඡදන මාර්ගයෙන් සෙවෙති කරන්නහුට; "සබ්බස්මිං විහාරෙ එකවාරං ඡාදිතෙ තං ඡදනං එකං මග්ගං" (සාරත්ථදීපනී) සියලු විහාරය එක්

වරක් සෙවෙනි කල කල්හි ඒ සෙවෙනිය එක් මඟකි. **ද්වෙ මග්ගෙ අධිට්ඨහිත්වා**- සෙවෙනිකිරීම් දෙකක් අධිෂ්ඨාන කොට; ඒ සෙවෙනි දෙක ම දුවජ්ජනා නම් මෙසේ සෙවෙනිකරවයි තෙවැනි සෙවෙනිය නියමකොට බැහැර යායුතුයි. **පරියායෙන**- පරික්ෂෙපයෙන්; නිමබ කොණයෙහි පටන් සෘජුව නො නොයා සිහාරවා සෙවීම පරික්ෂෙප නම්. **ඛාණො චෙ උත්තරිං**- තුන්මනකින් හෝ පරික්ෂෙපත්‍රයකින් මත්තෙහි වූ සිවුවැනි මගෙහි හෝ පරික්ෂෙපයෙහි; **හරිතෙ හරිතෙ**-තණ කැරල් ලෙස්හි කැරල්ලෙක්හි; මේ ශික්ෂාපදය ෂට්සමුට්ඨානය; ප්‍රමාණයෙන් අධික හෙයින් මහල්ලක නම් විහාරයක් බව, තමන්ගේ වාසය පිණිස කරණුලබන අගාරයක් බව, තුන්මගකින් හෝ පරික්ෂෙපත්‍රයකින් මත්තෙහිත් අධිෂ්ඨානයකිරීම යයි අඞ්ග තුණකින් යුක්ත වේ.

මහල්ලක විහාර සික්ඛාපද ගැටපදය නිමි.

---

**සිඤ්චෙය්‍ය සප්පාණකං**- මේ ජලය සප්‍රාණයයි හෙවත් පණුවන් සහිත යයි දන්නේ; **සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා**-සිඤ්චනය හෝ සිඤ්චාපනය කරවන්නේ; කළයෙන් දිය දහර නො සිඳෙනසේ ඉවත ලන්නහුට එක් ඇවතකි. වරින්වර ඉවත ලන්නහුට පියොවක් පාසා ඇවැත් සිදුවේ. දිය පවත්නා ඇල දිය පැවැත්වියැටි දිගට අභිමුඛ කෙරේද, එය දවසක් මුළුල්ලේ වූයේ ද එකම ඇවතකි. ඒ ඒ තැන බැඳ අතික් දිගකින් ගෙණ යන්නාහට පියොවක් පාසා ඇවැත් වේ. ගැලක් පුරලන තරම් තණ හෝ පත් එක් පියොවකින් දියෙහි බහන්න හුට එකම ඇවතකි. මේ මහා ජලසකන්ධයක් ගැණ කියුවක් නො වෙයි. තණ ආදිය දියෙහි වැටුනු කල්හි දිය කැලැත්වේද, සිඳීමට යේද, පණු ආදීහු මැරෙත් ද, එබඳු ජලය සඳහා කියනලද්දකි. **අජානන්තස්ස**- පණුවන් ඇතිබව නො දැන කළහුට; වධකචිත්තයෙන් වෙන්වූ දිය ඉසීම් ගැණ වදාළ හෙයින් මෙය පණ්ණත්තිවජ්ජ ය. වධක චිත්තය ඇති කල්හි ඇවැත් සිදුවන්නේ අනාපවූ ශික්ෂාපදයකිනි. මේ ශික්ෂාපදය කායචිත්ත වාචාචිත්ත කායවාචාචිත්ත වශයෙන් තිසමුට්ඨානය. ජලය ප්‍රාණීන් සහිත බව, ඉසීමෙන් ප්‍රාණීහු මැරෙත්යයි දන්නා බව, එම සුදුසු ජලයක් වීම, වධකචෙතනාවෙන් වෙන්ව කිසියම් කටයුත්තකින් තණපත් ආදිය බහාලීමයයි අඞ්ග සතරකින් යුක්තවේ.

සප්පාණක සික්ඛාපද ගැටපදය නිමි.

---

**ලාභිනො හොන්ති**- ලාභ ඇත්තෝ වෙත්; භික්ෂුණීහු වනාහි නො දෙත් නො දෙවත්. එහෙත් මේ භික්ෂුණීහු ප්‍රකට කුලවලින් නික්ම පැවිදි වූවෝයි. දූතිමට පැමිණි සවකිය තෑ මිහුරෝ "ආසීයන් වහන්සේ කාවුරුන් ලඟ උදෙසීම පිළිවිසීම් කෙරෙත්" දැයි විචාරති. අසවල් අසවල් තෙරනු අපට අවවාද අනුශාසනා කෙරෙත්යයි භික්ෂුණීහු උන්වහන්සේලාගේ ගුණවණකී. එයින් පහන්වූවෝ ඒ

තෙරුන් වහන්සේලාම චීවරාදි සිවුපසයෙන් මහත් සත්කාර කරත්' භික්ඛුනියො උපසඞ්කමිත්වා- භික්ෂුණීන් කරා එළඹ; ඡබ්බග්ගිය භික්ෂූන් කරා අවවාද ගැණීම පිණිස භික්ෂුණීහු නො පැමිණියාහුය. පක්ෂයෙහි සිටියාවූ ඔවුහුම ඒ භික්ෂූන් කරා ගියාහු ය. තිරච්ඡාන කථං- ස්වර්ගමාර්ගයන් අවුරන්නාවූ රාජකථාදි තිරශ්චීන කථා; භුගදබා- නමද්දනය; එසේම අශීලගාමීභාවයෙන් යුක්තය; අනුඤ්ඤාතම් ... අවණ්ණභණ්ඩා සඞ්ඝාටිකණ්ණං- මිහාශණයි, 'සිල්වා කොසි' යනාදි කාරුණ්‍ය අවකීර්ණ යුක්තවූ මහණ අබුදනිමි. තෙපි භික්ෂූන්ට අවවාද නො කරව'යි වදළසේක් නම් ඔවුහු බුදුරදුන් කෙරෙහි ආඝාත බැඳ මියගොස් නිරයෙහි උපදින්නාහුය. අතීත් උපායකින් වළක්වන සේක් මෙසේ වදළසේක. ඡබ්බග්ගිය භික්ෂූන් විසින් මේ කාරුණ්‍ය අව සිකිතෙනුත් නො ලැබිය හැකිය. පාතිමොක්ඛසංවරසංවුතො- පාතිමොක්ඛ සංවරයෙන් පිහිත කායවාග්ද්වාර ඇති; සිරිත් විරිත් විසින් දෙපරිද්දවූ ශික්ෂාපද සීලය යමෙක් රකීද, ඔහු අපායාදි දුකින් මුදවාලයි පාතිමොක්ඛ නම්. කායවාග් ද්වාරයන්ගේ අවිතික්‍රමය, සංවර නම්. ආචාරගොචරසම්පන්නො- ආචාරගොචර දෙකින් යුත්; කුලයන් පිණිස හුණදඬු ඈදිය දීමෙන් වෙන්ව, එසේ ම චාටුකම්‍යතා, මුග්ගසූපතා, පාරිභට්‍යතා යනාදි බුදුන් විසින් නිෂෙධ කොට වදළ මිථ්‍යාජීවයන්ගෙන් වෙන්ව ජීවත්වීම ආචාර නම්. ගොචරය වනාහි උපනිස්සය, ආරක්ඛය, උපනිබන්ධය යයි ත්‍රිවිධ වේ. කල්‍යාණ මිතුරන් ඇසුරුකොට ශ්‍රද්ධා, සීල, ශ්‍රුත, ත්‍යාග, ප්‍රඥා යන පඤ්චධර්මයන්ගෙන් යුක්තවීම උපනිස්සය ගොචර නම්. ගමට පිවිසි භික්ෂුහුගේ යට හෙළූ ඇසින් දිසා විදිසා නො බලමින් සංසුන්ව ගමන්කිරීමවූ ආරක්ඛ ගොචර නම්. සිවුවටන්හි සිත පිහිටුවාගැණීම උපනිබන්ධගොචර නම්. අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී-(නො දැන අවත් අකුසල චිත්තොත්පාදාදි ප්‍රභෙදවූ වරද අතුරෙන්) පරමාණුමාත්‍ර වරදද භයවශයෙන් දක්නා සුලුවූයේ; ඉතා ලඝුවූ දුබ්භාසිතය ද පර්වත ඇවතක් මෙන් දක්නා සුලුවූයේ; සමාදාය සික්ඛති සික්ඛාපදෙසු- අධිසීල සික්ඛාදි භෙදයෙන් ත්‍රිවිධවූ ශික්ෂාවන් අතුරෙන් යම්කිසි ශික්ෂාවක් මනාකොට ගෙණ එහි හික්මෙයි. සුතධරො- පර්යාප්ති ධර්මය දරණ; සසරදුකින් නිදහස්වනු කැමැත්තන් විසින් ඇසියයුතු හෙයින් පර්යාප්තිධර්මය ශ්‍රුත නම්. උගත් බුද්ධවචනය මතපොත් නො කොට දසවිසි අවුරුද්දක් ගතවූ නමුදු නො නස්නා යති ඇත්තේ ශ්‍රුතධර නම්. සුතසන්නිචයො- ඇසූ දෙය රන්බඳුනෙහි කෙසරතෙල් මෙන් නොනැසී පවත්නේ; ධාතා- ප්‍රගුණ; වාචොද්ගත; ඇතැමෙකුට ප්‍රගුණවූ දෙය දල් කාරුණ්‍ය අතුව යාමෙන් සිහියට එළඹෙයි. ඇතැමෙකුට ප්‍රගුණවූ දෙය කල්ගිය නමුත් එසාම සිහියට එයි. වචසා පරිචිතා- පාඨ වශයෙන් ද අර්ථවශයෙන් ද වචනයෙහි ප්‍රගුණකරණලද; දිට්ඨියා සුප්පටිවිද්ධා- (අර්ථවශයෙන් ද කාරණාවශයෙන් ද) නුවණින් මනාව ප්‍රතිවෙධ කරණලද; මනාව ප්‍රත්‍යක්ෂ කරණලද; මනසා අනුපෙක්ඛිතා- සිතින් කොටස් කොටස් මනසින් සිතනලද; සිතින් ආවර්ජනා

සාරත්නහුට ප්‍රදීපසහස්‍රයකින් ආලෝකවූ තලක් මෙන් පෙණේයයි. බහුස්සුතා හොති–බොහෝ ඇසූපිරූ තැත් ඇත්තේ; නිස්සයමුච්චනක, පරිසුපට්ඨාපක, භික්ඛුනොවාදකයයි බහුශ්‍රැතයා තෙපරිදි වේ. නිස්සය මුච්චනක බහුශ්‍රැත භික්ෂුව උපසම්පදාවෙන් පස්වස් ඇත්තෙකු විය යුතුයි. භික්ඛු භික්ඛුණී මාතිකා දෙක වාචොද්ගතකළ යුතුයි. පක්ෂදින යන්හි දහම් ඇස්වීම පිණිස සූත්‍රපිටකයෙන් බණවර සතරක් ද, පැමිණියවුන්ට පරිත්තනය පිණිස අන්ධකවින්ද, මහා රාහුලෝවාද, අම්බට්ඨසූත්‍ර සදෘශ එක් කථාමාර්ගයක් ද, සඟබත් මඟුල් අවමඟුල්වලදී අනුමෝදනය පිණිස දානානිසංස, මඞ්ගලසූත්‍ර, තිරොකුඩ්ඩසූත්‍ර ප්‍රතිසංයුක්තවූ ත්‍රිවිධ අනුමෝදනා ද, උපොසථ පවාරණාදිය දැන ගැණීම පිණිස පරිවාරවශාතයෙහි කම්මවග්ගයෙහි දක්වනලද කම්මා කම්මවිනිච්ඡය ද, ශ්‍රමණධර්ම මුදුන්පමුණුවා ගැණීම පිණිස සමථ වසයෙන් හෝ විපස්සනා වශයෙන් හෝ අර්හත්වය කෙළවර කොට ඇති එක් කම්මට්ඨානක්දැයි මෙපමණක් වත් උගත යුතුයි. පරියුපට්ඨාක බහුශ්‍රැත භික්ෂුව උපසම්පදාවෙන් දසවස් ඇත්තෙකු වියයුතුයි. පිරිස සියලු විනයපිටකයෙහි හික්මවීම පිණිස භික්ඛු භික්ඛුණී විභඞ්ගවාර වාචොද්ගත කටයුතුයි. එසේ නො හැකි වන්නහු විසින් පරිපූර්ණ වසයෙන් ඉගෙණීව කටයුතුයි. කම්මාකම්මවිනිච්ඡයා ද කදුවත් ද උගත යුතුයි. පිරිසට නාමරූප පරිච්ඡේදයෙහි පුහුණුවක් ඇතිකරලීම පිණිස මජ්ඣිම භාණකයෙකු නම් චූලපණ්ණාසකය ද, දීඝභාණකයෙකු නම් මහාවග්ගය ද, සංයුත්තභාණකයෙකු නම් සගාථක, නිදාන, ඛන්ධක යන වර්ගත්‍රයය හෝ මහාවග්ගය ද, අඞ්ගුත්තරභාණකයෙකු නම් මුලින් හෝ අගින් හෝ සගියේ අඩක් ද, නැතහොත් එක දුකතික නිපාත ද, ජාතක භාණකයෙකු නම් අටුවා සහිත ජාතක පාලිය ද, උගතයුතුයි. භික්ඛුණෝවාදකයා විසින් අටුවා කථා සහිත තුන්පිටකය ම උගතයුතුයි. නො හැකිවන්නහු විසින් සිවු නිකායයන් අතුරෙන් එක් නිකායක අටුවා කථාවක් වත් ප්‍රගුණ කටයුතුයි. එක නිකායක් නමුත් මනාව ප්‍රගුණකළ කල්හි සෙසු නිකායන් පිළිබඳ ප්‍රශ්නයන්ට ද පිළිතුරු දියහැකි වෙයි. සප්ත ප්‍රකරණයන් අතුරෙන් ප්‍රකරණ සතරක අටුවාව ප්‍රගුණ කටයුතුයි. විනයපිටකය වනාහි නානාත්ථ වෙයි. නානාත්ථය වෙයි. එහෙයින් සියලු විනයපිටකය අටුවා කථාව සමගම ප්‍රගුණ කටයුතුයි. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි–ඒ භික්ෂුහට භික්ෂුභික්ෂුණී ප්‍රාතිමෝක්ෂවය; අතාවූ සියලු කථාඛන ශාස්ත්‍රා ශාස්ත්‍රයෙහි බහුශ්‍රැත වූයේ නමුදු අටුවාකථා සහිත විනයපිටකය ප්‍රගුණ නොවන්නේ නාම නොවේ. විත්ථාරෙන– විභඞ්ගවය සමග විස්තර වසයෙන්; සුවිභත්තානි–මනාව බෙදනලද; සුප්පවත්තීනි–මනා ප්‍රගුණව පැවති; කල්‍යාණවාචො–කල්‍යාණ වචන ඇති; සිථිල ධනිතාදීන්ගේ විධානය පරිදි යාන කරණ සම්පත්තියෙන් ද ශික්ෂා සම්පත්තියෙන් ද අනූන වචන ඇති; කල්‍යාණවාක්කරණො–මධුරස්වරයෙන් යුත්; පටිබලො හොති භික්ඛුණියො ඔවදිතුං– යොවුන් මදින් මත් භික්ෂුණීන්ට සසර බියදනවා තැතිගැණීම් ඇතිකොට අවවාද දෙන්ට සමත්වෙයි. කාසාය

වස්සසතාය- කසාවත් හැදගත් තැනැත්තියක සමග; දුස්සීල භික්ඛුණී සික්ඛමානා සාමණේරින් සමග යයි ගතයුතුයි. ගරුධම්මං- මෙවුන්දම්; තමන් ගිහිකල ඒ භික්ෂුණී සමග කායසංසර්ගයක් හෝ සික්ඛමානා සාමණේරාදීන් කෙරෙහි මෙවුන්දම් සෙවීමක් හෝ නො කළ විරූ අයෙක් වියයුතුයි. මාගම සංවරයෙහි පිහිටියේ තමුදු පෙරකළ දූය සිහිකරන්නේ ධර්මදේශනාව කෙරෙහි ගෞරව නො කරයි. වීසති වස්සො-උපසම්පදාවෙන් විසිවස් හෝ අතිරේකවිසිවස් ඇත්තේ; මෙබඳු තැනැත්තේ විසභාග වස්තූන් සමග නැවත එක්වූයේ ද තරුණයෙකු මෙන් සීලවිනාශය කර නො ගණී. තමන්ගේ වයස් ගැණ මෙනෙහි කිරීමෙන් උපන් ඡන්දරාගය මැඩපවත්වා ගණියි. භික්ඛුණෝවාදක භික්ෂුව=සීලවා, බහුස්සුතො, උභයානි ඛො පනස්ස, කල්‍යාණවාචො, යෙභුය්‍යෙන භික්ඛුණීනං පියො, පටිබලො භික්ඛුණියො ඔවදිතුං න ඛො පනෙතං, වීසතිවස්සො" යන මේ කරුණු අටෙන් යුක්තයෙකු වියයුතුයි. ගරුධම්මෙහි- ගරුකටයුතු ධර්මයන් හෙන්; භික්ෂුණීන් විසින් ගෞරවතොට පිළිගන්නාලද හෙයින් මොවුහු ගරුධර්ම නමැයි යෙත්. ඒකතො උපසම්පන්නාය- භික්ෂුණීන්ගේ සමීපයෙහි එකට උපසපන්වූ භික්ෂුණියකට; පරිවෙණං සම්මජ්ජිත්වා- ආවාසය හැමද; උදෑසන හැමදි තැන හෝ නො හැමදි තැන හෝ නැවත තණපත් වැටීමකින් කිලුටු වූයේද, පා සහරින් විසිරගිය වැලි ඇත්තක් වූයේ ද ඒ තැන් හැමදියයුතු, නො හැමදි තැන් දුටුකල ආර්යතෙමේ තමන් ආශ්‍රයකරණ දහර භික්ෂූන් වත්පිළිවෙත්හි නො යොදා ධර්මය ම කියායයි විප්‍රතිසාරවූ ඒ භික්ෂුණීහු ධර්මය නො අසන්තියෝ වෙත්. පානීයං පරිභොජනීයං උපට්ඨපෙත්වා- පියයුතු පැන් පරිභොග කටයුතු පැන් එලවා තබා; ඇතුළුගමින් පැමිණෙන භික්ෂුණීහු පවසින් කලාන්තවූවාහු වෙත්. ඔවුහු පීමට පැන් ද අත්පා දෙවුනා පැන් ද බලාපොරොත්තු වෙත්. එබන්දක්වත් නොමැති කල්හි අගෞරව උපදවා නො අසනු කැමැත්තියෝ වෙත්. ආසනං- අසුන්; කුඩාවූ පුටු පුවරු පලස් කලාල් ආදි යම්කිසි හෝ යටත්පිරිසෙයින් අතු රිකිලි ආදියක් හෝ ඔවුන්ට අසුන් වසයෙන් පිළියෙලකරවා තැබිය යුතුයි දුතියං ගහෙත්වා නිසීදිතබ්බං- දෙවැන්නෙකු ගෙණ හිඳිය යුතුයි හුදකලා මාගම්හුට දහම්දෙසීමෙන් සිදුවන ඇවතින් නිදහස්වීම පිණිස දෙවැන්නෙකු කැඳවාගෙණ විහාර මධ්‍යයෙහි හෝ පොහොයගෙහි හෝ බොජුන්හලෙහි හෝ දොර සමීපයෙහි හෝ බොහෝදෙන හැසිරෙන තැනක හිඳිය යුතුයි. විහාර කෙළවර නො හිඳිය යුතුයි. සමග්ගත්ථා- සමගියෝවහුද? සම්මතවූ භික්ෂුහුගේ සමීපයට පාටිපදයෙහි අවවාද ගැණීම පිණිස සියලු භික්ෂුණීන් පැමිණියයුතු හෙයින් 'සමග්ගත්ථ,' යනුවෙන් සියලු භික්ෂුණීන්ගේ පැමිණීම විචාරයි. සමග්ගම්හ අය්‍යා-ආර්යයෙණි (=ස්වාමීනි) සමගි යම්හ. ගිලන් භික්ෂුණීන්ගේ නො පැමිණීම අනුදත් හෙයින් පැමිණියහැකි සියල්ලෝම පැමිණියාහුය යනු අදහසයි. වත්තන්ති-ප්‍රගුණවත් ද;

වාචොද්ගතානයෝ ද; **නිස්සාරණදසකබ්බො-** අවවාදප්‍රණය කටයුතුයි. **ඔකාසමඤ්ඤත්තබ්බො**-පෙළ කියාදියයුතුයි. **සාමීචිකම්මං**-පැන් පිළිවිසීම් ආදි සුදුසුවත්; මඟ තොරතුරු ඇසීම්, පවත් සැලීම්, පැන් පිළිවිසීම් ආදිය මෙහි වත් වෙති. භික්ෂුණිය විසින් භික්ෂූන්ට කටයුතු අභිවාදනය ඇතුළු ගමෙහිදී ද, පිට ගමෙහිදී ද, ඇතුළු වෙහෙරෙහිදී ද, පිට වෙහෙරෙහි දී ද, වීථියෙහිදී ද, වැසිවසින කල්හිද, මඩෙහිදී ද, සත්පානත් අත් ඇතිකල්හිද, ඈතුත් අසුන් ලුහුබඳින කල්හි ද, කටයුතුම ය. ඇතුළු ගම් ආදියෙහිදී පසඟ බිම පිහිටුවා නො වැඳියහැකිය. එහෙයින් සිටි යහු විසින් ම කය මදක් ඉදිරියට නමා 'ආය්‍යීයෙණි වඳිමි'යි පවසා ඇඳිලි බැඳ යන්නට වටී. එක පෙළට පිඩු හැසිරෙණ භික්ෂූන්ට එකවර ටම 'ආය්‍යීයෙණි වඳිමි'යි පවසා ඇඳිලිබැඳීමෙන් වැඳියහැකිය. ඉදින් දෙලොස්රියනකින් ලංවූකල්හි වෙන වෙනම වැඳිය යුතුයි. භික්ෂූන් දුටු හුනස්නෙහි හිඳිම නොහිඳීවත් නො කටහැකි වෙයි. සුදුසු තැනක් නම් පිළිසඳරද කළයුතුයි. **පූජෙතබ්බා**- (සත්කාර, ගරුකාර, මානන යන තුන්ක්‍රමයෙන්) පුදා, **අභික්ඛුකෙ ආවාසෙ**- භික්ෂූන් නොමැති ආවාසයෙහි; භික්ෂුණී ආශ්‍රමයෙන් අඩයොදුනක් ඇතුළත අවවාදදායක භික්ෂූහු නො වසත් නම් ඒ ආශ්‍රමය අභික්ඛුකය; එවැනි ආවාසයෙහි භික්ෂුණීන් විසින් වස් නො එළඹිය යුතුයි. ඉදින් නෑකෙනෙක්හෝ සැදැහැති උවසුවෙක් හෝ නුඹවහන්සේ මෙහි වසනු මැනවි. අපි භික්ෂූන් ගෙන්වන්නෙමුයි කියත් නම් වටී. ඉදින් කියනලද දුර ප්‍රමාණ ඇති පෙදෙසක වස් එළඹෙනු කැමැති භික්ෂූහු පැමිණ සාඛා මඩුල්ලෙහ සාමූත් එක් රැයක් වැස ගියාහුද, එපමණින් නමුත් එය සභික්ඛුක ආවාස නම් වෙයි. එහි වස් එළඹෙන්නට වටී. වස් එළඹෙනු කැමැති භික්ෂුණීන් විසින් පක්ෂය සම්බන්ධ තෙළෙස්වක් දිනයෙහි භික්ෂූන් කරා පැමිණ "ස්වාමීනි, අපි නුඹවහන්සේගේ අවවාදය බලාපොරොත්තු වෙන් වසන්නෙමු"යි යාච්ඤා කටයුතුයි. සෘජු මාර්ගයෙන් යන්නහුට අඩයොදුනක් තැන භික්ෂු අසපුව පිහිටියේ වෙයි. එහෙත් ඒ මගින් යන්නහුගේ ජීවිතාන්තරාය හෝ බ්‍රහ්මචරියාන්තරාය සිදුවනු නියතය. අනික් මගකින් යන්නහුට අඩයොදුනකට අධිකයක් ගමන් කරන්ට සිදුවෙයි. මෙය ද අභික්ඛුකාවාස සඞ්ඛ්‍යාවට නැඟේ. **අන්වද්ධමාසං**-අඩ මසෙක්හි අඩමසෙක්හි; **උපොසථපුච්ඡකං**-(උපොසථස්ස පුච්ඡනං, උපොසථපුච්ඡා, ක ප්‍රත්‍යය හා හ්‍රස්වකොට 'උපොසථ පුච්ඡකං'යි කියන ලදී.) පොහොය විචාරීම; පණ්ණරසී පොහොයෙහිදී තුදුස්වකද ද චාතුද්දසී පොහොයෙහිදී තෙළෙස්වකද ද විහාරයට පැමිණ පොහොය කවදාදැයි විචාරිය යුතුයි. භික්ෂුව විසින් හගිනිය, පොහොය හෙටයයි දැන්විය යුතුයි භික්ෂූහු කිසිකලෙක කිසියම් කාරණකින් පණ්ණරසිය චාතුද්දසිය කොට ද චාතුද්දසිය පණ්ණරසිය කොට ද පොහොය කෙරෙති. එසේ භික්ෂූන් පොහොයකරණ දිනෙහි ම භික්ෂුණීන්ගේ පොහොයකිරීම ද විය යුතුයි. එබැවින් භික්ෂුණිය විචාළකල නියම වශයෙන් ම එය දැන්විය යුතුයි. භික්ෂුණීන් පොහොය දිනයෙහි අවවාද පිණිස ද වස්එළඹි පාටිපදිකයෙහි පවත් ධර්මශ්‍රවණය පිණිස ද පැමිණිය යුතුයි.

උභතොසඞ්ඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බං - භික්ෂු භික්ෂුණී යන උභය සඞ්ඝයා කෙරෙහි ම දිට්ඨ ශ්‍රුත අපරිසඞ්කිත යන කාරණ තුණින් පැවරිය යුතුයි. භික්ෂුණීන් සමඟ වාතුද්දසියෙහිද, භික්ෂූන් කෙරෙහි උපොසථ දිනයෙහි ද පැවරිය යුතුයි. න භික්ඛුනියා කෙනචි පරියායෙන - භික්ෂුණිය විසින් භික්ෂුවට කිසිලෙසකින් ආක්‍රොශ නො කට යුතුයි ඔවටො - ප්‍රතික්ෂෙපකරනලද්දී. ඔවාදං න ගණ්හෙය්‍යාති - හඟියි යනු, මේ අවවාදයයි නොකියා; පඤ්හං පුච්ඡිතුං න ලභති - ගරු ධර්ම නිඃශ්‍රිතවූ හෝ සතකාදි නිඃශ්‍රිතවූ ප්‍රශ්නය භික්ෂුණිය විචාරණලද්දේ කියාද; අඤ්ඤත්ථ පුච්ඡිතුං ලභති - භික්ෂුව ඉදිරියේ රුදී අනොකාසක්‍රිතු පිණිස බෙණේද; මේ ශික්ෂාපදය වාචා වාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. අසම්මතබව, උභතොපසම්පන්න බව, අවවාද වශයෙන් අෂ්ටගරු ධර්මභණනය යි අඞ්ග තුණකින් යුක්ත වේ.

ඔවාද සික්ඛාපද ගැටපදය නිමි.

---

පරියායෙන - වරින්, පිළිවෙළින්; අධිචෙතසො - අර්හත්ඵල චිත්තයෙන් යුක්තයාහට; අප්පමජ්ජතො - අප්‍රමාදයෙන් කුශලධර්මයන් පිළිබඳ සතතක්‍රියාවෙන් යුක්තයාහට; මොනපථෙසු සික්ඛතො - අර්හත්මාර්ග ඥාන සඞ්ඛ්‍යාත මෞනයට පථවූ සප්තත්‍රිංශද්බොධිපාක්ෂික ධර්මයන්හි හෝ ත්‍රිවිධ ශික්ෂාවන්හි හික්මෙන්නාහුට; සොකා න භවන්ති තාදිනො - තාදිගුණයෙන් යුක්තවූ ක්ෂීණාශ්‍රව මුනිහට චිත්තශොකයෝ නො වෙත්; උපසන්තස්ස - රාගාදීන්ගේ සංසිඳීමෙන් ශාන්තවූවහුට; සදා සතිමතො - සති වෛපුල්‍යයෙන් යුක්ත හෙයින් හැමකල්ම සිහියෙන් යුක්තයාහට; ආකාසෙ අන්තලික්ඛෙ - අන්තලික්ඛ නම්වූ ආකාශයෙහි; කසිණුග්ඝාටිමාකාශයෙහි නො වේයයි කීසේයි. මෙහි 'අධිචෙතසො' යන්නෙන් අධිචිත්ත සික්ඛාවද 'අප්පමජ්ජතො' යන්නෙන් අධිසීල සික්ඛාවද, 'මුනිනො' යන්නෙන් අධිපඤ්ඤා සික්ඛාව ද, 'මොනපථෙසු සික්ඛතො' යන්නෙන් පුබ්බභාග පටිපදාව ද දර්ශිතය. වඩ්ඪෙන්තිපි - සක්මන් කෙරෙයි; ඒ භික්ෂුණීන්ගේ කථා අසා, මේ භික්ෂුණීහු 'මේ තෙමේ දන්නේ මෙපමණම'යයි මට නින්දා කෙරෙති. එහෙයින් දැන් මම මොවුන්ට මගේ ආනුභාවය දක්වමියි ධර්මබහුමානය උපදවා අභිඥාපාදක චතුර්ථධ්‍යානයට සම්වැද එයින් නැගිට මෙබඳු ප්‍රාතිහාර්යයක් දැක්වීය. අනොකාසකතම්පි - නො දැකීමටද යෙයි. ඒකතො උපසම්පන්නාය - භික්ෂුණී සඞ්ඝයා කෙරෙහි උපසපන් වූ භික්ෂුණියට; භික්ෂුසඞ්ඝයා කෙරෙහි උපසපන්වූවහුට අවවාදකරණ භික්ෂුහට පචිති ඇවැත් වේ. සමුට්ඨානය මුල් ශික්ෂාපදයෙහි මෙනි. හිරු අවරට ගියබව, පිරිපුන් උපසපන් ඇතිබව, අවවාද කිරීමයයි අඞ්ග තුණකින් යුක්ත වේ.

අත්ථඞ්ගත සික්ඛාපද ගැටපදය නිමි.

අඤ්ඤත්‍ර සමයා ඔවදෙය්‍ය- සමය හැර අෂ්ටගරුධර්මයෙන් අවවාද කෙරේද; ඒ භික්ෂුහට පචිති ඇවැත් සිදුවේ. අෂ්ට ගරුධර්ම හැර අනෙක් ධර්මයකින් අවවාද කරන්නාහුට දුකුළා ඇවැත් වේ. මේ ශික්ෂාපදය කායවාචා, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. අසපුවට පැමිණීම, පිරිපුන් උපසම්පන්න බව, සමයාභාවය, අෂ්ට ගරුධර්මයන්ගෙන් අවවාද කිරීමයයි අඞ්ග සතරකින් යුක්ත වේ.

භික්ඛුණුපස්සය සික්ඛාපද ගැටපදය නිමි.

න බහුකතා- නො කරණලද බොහෝමත් ඇත්තෝ; ධර්මබහුමාන නො කොට අවවාද කෙරෙත්; උපසම්පන්නානං සම්මතෙන අසම්මතානං- සම්මත භික්ෂුව විසින් හෝ සඞ්ඝයා විසින් හෝ භාරකොට තැබූ අසම්මත උපසම්පන්න භික්ෂුව; අඞ්ග අටින් යුක්ත සම්මතය ලැබූ භික්ෂුව විසින් ගණසඞ්ගණිකාවෙන් වෙන්වනු කැමැත්තෙන් මා පැමිණෙන තුරු භික්ෂුණීන්ට අවවාදකිරීම තුඹවහන්සේට භාරයයි භාරකරණලද භික්ෂූන් වහන්සේ අෂ්ට ගරුධර්මයෙන් හෝ අන් ධර්මයකින් භික්ෂුණීන්ට අවවාදයට සුදුසු වෙයි. අනුපසම්පන්නානං සම්මතානං වා අසම්මතානං වා- සම්මතවූ හෝ අසම්මතවූ හෝ කෙරණහු; භික්ෂුකාලයෙහි සම්මුතිය ලැබ ශ්‍රාමණෙර භූමියෙහි සිටියේ සම්මත නමි. සම්මතවූ සඞ්ඝයා විසින් භාරකරණලද බහුශ්‍රැත ශ්‍රාමණෙර තෙමේ අසම්මත නමි. මේ ශික්ෂාපදය කායචිත්ත වාචාචිත්ත කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. උපසම්පන්නබවය, ධර්මයෙන් ලත් සම්මුතිය ඇති බවය, අනාමිසන්තර බවය, නින්දාකරණු කැමැත්තෙන් මෙසේ කීමයයි අඞ්ග සතරකින් යුක්ත වේ.

ආමිස සික්ඛාපද ගැටපදය නිමි.

විසිඛාය- විථියෙහිදී; පිණ්ඩාය චරති- පිඬු සිගා නිතර නිතර හැසිරෙයි අඤ්ඤතරා- නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධ භික්ෂුවක්; සන්දිට්ඨා දැකීමෙන් මිත්‍රවූවෝ; සමුට්ඨානාදි සෙස්ස චීවරපටිග්ගහණ ශික්ෂාපදයෙහි කීලෙසින් දතයුතුය. ඒ ශික්ෂාපදයෙහි භික්ෂුණීය දෙන්නාවූ සිවුර පිළිගන්නා හෙයින් භික්ෂුතෙම ප්‍රතිග්‍රාහකයාය. මෙහි භික්ෂුණී තොමෝ ප්‍රතිග්‍රාහිකායි.

චීවරදාන ශික්ෂාපද ගැටපදය නිමි.

උදායී- ලාළුදායි ස්ථවිරතෙමේ; පට්ටො- සමර්ථයෙකි. අඤ්ඤතරා භික්ඛුණී- ඒ ලාළුදායි ස්ථවිරයන්ගේ ගිහිකල අඹුව සිටි භික්ෂුණිය; පටිභානචිත්තං-(තමන්ගේ) වැටහීම් අනුවකළ සිත්තමක්; සෙතෙමේ සිවුර රඳවා ඒ මැද අබාලකාරණලද මෙවුන්දම් සෙවුම් ඇති ස්ත්‍රී පුරුෂ දෙරූමක් නන්පැහැයෙන් කෙළේය. යථාසංහටං- හැකුළු පරිදිම; සකං සිබ්බති- තෙමේ ගෙත්තම් කරයි. මිහම්' යි නූල්ගසන්නාහුටද, සිඳින්නාහුට ද දුකුළා වේ. ගෙත්තම් කරන්නාහුට පචිති වේ. ආරපථෙ ආරපථෙ- සූචිවාගියෙහි, සූචිවාගියෙහි; මෙහි කිඳිකටුව පුරා සිදක් විටක් හැස්නාගා ඇද්ද ද එක් එක් ආරපථයෙක් නම් වෙයි. සකිං ආණත්තො- සිවුර මැහීම කරවයි වරක් අණවනලද්දේ; බහුකම්පි සිබ්බති- සියලු ම සුචිකම් නිමකරවාලයි; මෙසේ ඇතිකල සිදුවත්තෝ

එකම ඇවතකි. ඉදින් මේ සිවුර පිළිබඳ සියල්ල නිමකරවයි අණවන ලද්දේ සිවුර කෙරේද නියමය ලැබුවහුට සූචිමාර්ගයෙක්හි මාර්ගයෙක්හි එක් එක් ඇවත බැගින් සිදුවේ. ආණාපක භික්ෂුහට එක වචනයෙන් බොහෝ ආපත්තිහු සිදුවෙත්. **අඤ්ඤං පරික්ඛාරං**- (උපාහනත්ථවිකාදි) අන් පිරිකර; මේ ශික්ෂාපදය ඡසමුට්ඨානික ය. නොනෑ මෙහෙණක් සතුබව, හැඳීම් පෙරවීම්වලට සුදුසු බව, කිලෙස මැඩීම හෝ මැඩ්වීම යයි අඞ්ග තුණකින් යුක්ත වේ.

චීවර සිබ්බන සික්ඛාපද ෂෑමසදශ නිමි.

---

**සාකෙතෙ**- එනම් නුවරෙකි; මේ නගරය සැවැත්නුවරට සත් යොදුනක් ඇතින් අයොධ්‍යාව සමීපයෙහි පිහිටියේ ය. දඹදිව මහා නගරයන්ගෙන් මෙකද එකකි. **පච්ඡා ගච්ඡන්තීනං චොරා අච්ඡින්දිංසු**- පසුව ගමන්කරන්නාවූ ඒ භික්ෂුණීන්ගේ පා සිවුරු සොරු පැහැර ගත්තාහු ය. **දූසෙසුං**- සොරු ඒ භික්ෂුණීන් දූෂණය කළාහුය. **සංවිධාය**- (අද යම්හ සෙට යම්හයි යනාදීන්) එක්ව බැණගෙණ, කාලමග්ගවාරාදීන් සලකුණු කොට; **සිංඝාසා**- හෙවු; **සකර**- අතිද්දෑ; **ගාමන්තරෙ ගාමන්තරෙ**- අන්ගමෙක්හි අන්ගමෙක්හි; **කුක්කුටසම්පාදෙ**- කුකුල්තෙම යම් ගමකින් නික්මී පගින්ම අන් ගමකට පැමිණේ ද මේ කුක්කුටසම්පාද නම්. (සම්පදන්ති එත්ථාති සම්පාදො කුක්කුටානං සම්පාදො කුක්කුටසම්පාදො) 'කුක්කුටසම්පාතෙ' යනුද පාඨයි. යම් ගමක සෙවෙනි මත්තෙන් පැන්න කුකුළා අන් ගෙයක සෙවෙනි මත වැටෙයි. මෙය කුක්කුටසම්පාත නම්. කියනලද අයුරු ඇති ගම ඉතා සමීපයෙහි වූවකි. එහි උපචාරය නො ගතයුතුයි. **අද්ධයොජනෙ**- අඩයොදුනෙක්හි; අඩයොදුන ඉක්මවන්නහුට ප්‍රථම පාදයෙහිදී දුකුළා ද ද්විතීයපාදයෙහිදී පචිති ද වේ. **භික්ඛු සංවිදහති**- මහණතෙමේ සලකුණු කෙරෙයි. නාගරද්වාර කෙටී වීථියෙහි හෝ භික්ෂුණියක් දැක අසවල් ගමට ගිය විරුද්ධයි අසයි. ආර්යයන්වහන්ස නො ගිය විරූය. මම හෙට යමි. නුඹද එහි එනුයි කියයි. **භික්ඛුණී සංවිදහති**- මෙහෙණ සලකුණු කෙරෙයි. අතික් ගමක සැ වඩිනු පිණිස ගමින් නික්මෙන භික්ෂුව දැක 'ආර්යයතෙමේ කොහි වඩිද්ද'යි අසයි. 'අසවල් ගම සැ වැඩීමට ය, ඔබ ද එමි'යි මෙසේ භික්ෂුණිය ම සලකුණු කෙරෙයි. **විසංකෙතෙන**- කාල විසංකෙතයෙන්; පෙරවරු යමුයි සලකුණුකොට ගෙණ පස්වරු යෙත්ද, අද යමුයි සලකුණුකොට ගෙණ හෙට යෙත් ද මෙසේ කාලවිසංකෙතය වූකල්හි අනාපත්ති වේ. ද්වාරවිසංකෙත මාර්ගවිසංකෙතයෙහි ඇවැත් කෙරෙත්ම ය. **ආපදාසු**- රාෂ්ට්‍රවිප්ලවාදි ආපදාවන් ඇතිකල්හි; මේ ශික්ෂාපදය කාය, කායවාච, කායචිත්ත, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. දෙදෙනාම සංවිධානකොට ගෙණ මඟට පැමිණීම, කාල අවිසංකෙතය, සමයාභාවය, ආපදාවෙන් වෙන්ව අන් ගමකට පැමිණීම, අඩයොදුන ඉක්මවීමයයි අඞ්ග පසකින් යුක්ත වේ.

සංවිදහන සික්ඛාපද ෂෘමසදශ නිමි.

සංවිධාය-(ලොකාස්වාද වශයෙන් හෝ මිත්‍රසන්ථව වශයෙන් හෝ කෙළනා සිත් පෙරදැරිකොට) සලකුණු කොට ගෙණ; උද්ධගාමිනිං-නදියේ ඉහලට හෙවත් උඩුගංබලා යන; අධොගාමිනිං-යටිගං බලා යන; උජ්ජවනිකාය-උඩුගං බලා යන නැවකින්; ඔජවනිකාය-යටිගං බලායන නැවකින්; මෙහි 'නදිය'යි විශෙෂයෙන් කී සෙයින් සමුද්‍රයෙහිදී ඇවැත් සිදුවීමක් නැත. මේ ශික්ෂාපදයේ ද සමුට්ඨානාදිය පෙර මෙනි

නාවාභිරූහන සික්ඛාපද ගැටපදය නිමි.

---

මහානාගෙ නිවෙසිතෙ-ශ්‍රෙෂ්ඨයන් හෙවත් වැඩිමහල්ලන් ඇති කල්හි; නැතහොත් 'අදිස්වා' යන ශෙෂපාඨය යොදගත් කල 'නිවෙසිතෙ මහානාගෙ අදිස්වා' යි 'ඇති මහානාගයන් නොබලා' යන අර්ථ ගතයුතුයි. නවකෙ-දහරයන් හෙවත් තරුණයන්; අන්තරා කථා-පටන්ගත් අවසන් නුවූ හෙවත් අඩාලවූ කථාව; එවං මහානාගා ඛො ත්‍යා ගහපති-සැබව, ගෘහපතිය තුඹ විසින් මහානාගයෝ නිමන්ත්‍රණය කරණලදහ. අඩැසින් බලන්නී වසිත තෙරුන් දුන පෙර කියනලද්ද උන්වහන්සේලාට ඇසුනු බැව් සලකා මෙසේ කීය. භික්ඛුනී පරිපාචිතං- භික්ෂුණිය විසින් ගුණ හැඟීමෙන් සැපයු දෙය; පුබ්බෙ-පළමුවෙන්; ගිහිසමාරම්භා-ගිහින් විසින් භික්ෂූන්ගේ ප්‍රයොජනය පිණිස සපයනලද්ද; ඒ පිඬු වැලදීමෙන් භික්ෂූනට ඇවැත් සිදු නොවේ. පකති පටියත්තං-ප්‍රකෘතියෙන්ම (ඒ භික්ෂූනුගේ ප්‍රයොජනය පිණිස) පිළියෙළ කරණලද්ද; පඤ්ච භොජනානි ඨපෙත්වා සබ්බත්ථ අනාපත්ති-පස් බොජුන් හැර (භික්ෂුණී පරිපාචිත යාගුඛජ්ජකාදි) සියලු දෙයෙහි අනාපත්ති වේ. මේ ශික්ෂාපදය පඨමපාරාජික සමුට්ඨානය; භික්ෂුණියක විසින් පිළියෙළකරණ ලද්දක් බව, එසේ සැපයු බැව් දැනගැණීම, ගිහිසමාරම්භාභාවය, ඔදනාදිය අතුරෙන් යමක්වීම එය වැලඳීමයයි අඞ්ග පසකින් යුක්තය.

පරිපාචිත සික්ඛාපද ගැටපදය නිමි.

දසවැනි ශික්ෂාපදයෙහි සියලු විනිශ්චය දෙවෙනි
අනියත ශික්ෂාපදයෙහි මෙන් වේ.

---

ආවසථ පිණ්ඩො-පින් කැමැත්තයන්ගේ හිමි නැති බත්; හාත් පසින් පිරිකෙව්කළ අද්ධික ගිලාන ගබ්භිණී ප්‍රව්‍රජිත යන මොවුන්ට සුදුසු සේ පණවනලද අසුන් ඇති නානා ඕවරකයන්ගෙන් යුක්ත වූ ශාලය මෙහි ආවසථ නම්. එහි පින්කැමැතියන් විසින් යාගුභත්ත භෙසජ්ජාදීන් අතුරෙන් යමක් යමෙක් කැමතිවේනම් ඔවුන්ට දීම පිණිස පිළියෙළ කොට තැබූ පඤ්චභොජනාදිය 'පිණ්ඩ' නම්. භිය්‍යොපි-හෙටද; අපසක්කන්ති-පහවයෙත්; මනුස්සා උජ්ඣායන්ති-මිනිස්සු මහත් හඬින් දොසාකරත්; තීර්ථකයන් නො දක්නෝ ඔවුහු මේ භික්ෂූන් දුක පිටත ශිෂ්‍යහුයයි සිතා උසස් ලෙස දොෂාකරති.

**කුක්කුච්චායන්තා**-කුකුස් ඇතිකරන්නෝ; අකැපය යන හැඟීම ඇතිකරන්නෝ; **සක්කොති තාවමහා ආවසථා පක්කමිතුං**-ඒ ආවසථයෙන් යොදුනක් හෝ අඩයොදුනක් හෝ යන්ට හැකිවෙයි. එපමණ දුරක් නමුත් ගොස් පිඬු නො ලැබ ගිය කල්හි යළි මෙහි පැමිණ වැලඳිය හැකිය. **අනොදිස්ස**-නො උදෙසා, නියම නො කොට; මේ පාෂණ්ඩයන්ට යයි හෝ, මෙතෙක් පාෂණ්ඩයන්ට යයි හෝ, එක් සමයාන්තරයකටය'යි හෝ නියම නො කොට; **යාවදත්ථො**-(භොජන යද මෙතෙක් සාලේ බත් දියයුත්තේයයි පිරිසිඳීමක් නො කොට) හැකිපමණ ගැණීම පිණිස පණවනලද්දේ වෙයි. **සකිං භුඤ්ජිතබ්බං**-එක් දිනක් වැලඳිය යුතුයි. දෙවෙනි දිනයෙහි පටන් පිළිගැණීමෙදී දුකුළා වේ. පිඩක් පිඩක් පාසා පචිති වේ. නානා කුලිකයන් විසින් තැන් තැන්වල පණවන ලද්දෙහි දී එක්තැනක එක් දිනක් පමණක් වලඳන්ට වටී. **අනාපත්ති ගිලානස්ස** (නැවත එහි ලැග ලැග වලඳන) ගිලන් මහණහට අනාපත්ති වේ. **අගිලානො සකිං භුඤ්ජති**-අගිලන් මහණතෙමේ එක් දවසක් වලඳ; **ගච්ඡන්තො වා**-යන්නේ ගමික හෙයින් එයින් නැවත වලඳයි. මෙසේ අතරමගදී එක් දවසක් ඔහුම සන්තකය ආගන්තුකව වලඳයි. ගිය තැන එක් දවසක් ඔහුම සන්තකය ආගන්තුක හෙයින් වලඳයි. ඔවුන්ට ද අනාපත්ති වේ. **ආගච්ඡන්තො**-ගොස් පෙරළා එන්නේ අතරමගදී එක් දිනක් ද ආ තැනදී එක් දිනක් ද වලඳයි; ඒ භික්ෂුහට ද අනාපත්ති වේ ගච්ඡිස්සාමි යන්නෙමි; එක් දවසක් වැලඳුවහුට නදිය පිරී ඉතිරී ගිය හෙයින් යාගත නො හැකිවිය. නැතහොත් චෞරභයාදියක් පැමිණි හෙයින් යාගත නො හැකිවිය. එහි නැවතී යළි එක් දිනක් වලඳන්ට හැකිවෙයි. **ඔදිස්ස පඤ්ඤත්තො**-භික්ෂූන් උදෙසා සම්මතකරණලද ආහාරය; **න යාවදත්ථො පඤ්ඤත්තො** කුසපූරණය වන පරිද්දෙන් උපාසකයා විසින් සම්මත නො කරණලද ආහාරය; මද මද ලැබේද එබදු ආහාරය නිතිකල් ම වලඳන්ට හැකිවෙයි. **පඤ්චභොජනානි ඨපෙත්වා** පඤ්චප්‍රකාර භොජනය තබා; යාගුඛජ්ජක ඵලාඵලාදිය වැලඳීමෙහි අනාපත්ති වේ. එහෙයින් එය නිතිකල්ම වැලඳියහැකි වෙයි. මේ ශික්ෂාපදය කාය, කායචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. ආවසථ පිඩුබව, අගිලන්බව, එහි ලැග ලැග වැලඳීම යයි අඞ්ග තුණකින් යුක්ත වේ.

**ආවසථපිණ්ඩ සික්ඛාපද ගැටපදය නිමි.**

---

**පරිහීන ලාභසක්කාරො**-පිරිහුණු ලාභසත්කාර ඇත්තේ; දෙව්දත්හු අජාසත් කුමරුන් ලවා බිම්සර රජු මැරවීමද, බුදුන් මරවන්ට දුනුවායන් යෙදීම ද, බුදුන් ඇඟින් ලේ සෙල්ලීම ද තවම ලොවට අප්‍රකටය. බුදුන් මැරීම පිණිස යම් දිනක ධනපාල ඇතු මෙහෙයවීද, එදිනෙහි ඔහු කරවූ සියල්ල ලොවට ප්‍රකටවී ගියේය. දෙව්දත්හු පවිටෙකැයි යන ප්‍රසිද්ධිය ද පැතිර ගියේය. හේ මේ සියල්ල කරවූයේ අජාසත් රජහු පිටිවහල් කරගෙණයයි ද නාගරිකයන්ට දැනගන්ට

ලැබූහ. එහෙයින් නාගරිකයෝ රජතෙමේ කුමක් හෙයින් මේ ශාසන කණ්ටක වූ සොරෙකු ගෙණ හැසිරේදැයි විරුද්ධව නැගී සිටියාහුය. නුවර ඇලලීගිය බැව් දත් රජතෙමේ දෙව්දත්හු නුවරින් බැහැර කරවීය. එතැන් පටන් ඔහුට රජගෙයින් ලැබුනු බත්තලි පන්සියයද නැවතුනි. රජතෙමේ නැවත ඔහු වෙත උපස්ථානයට ද නො ගියේය. එහෙයින් පිරිහුණු ලාභසත්කාර ඇත්තෙකැයි කියනලදී. කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති-(දෙව්දත් තෙමේ මාගේ පිරිස නො බිඳේවායි පිරිස් රක්නේ "තුඹ එක් නමකට දෙව, තුඹ දෙනම කට දෙව"යි) විතව විතවා පිරිස් සහිතවූයේ කුලයන්හි අනුභව කරයි. චීවරං පරිත්තං උප්පජ්ජති-සිවුරු මඳව ලැබෙයි. පළමු පැණවූ සිකපද යට බියෙන් භික්ෂූහු බොජුන් භාරනොගත්හ. එසේ බොජුන් භාර නොගත් භික්ෂූන්ට සිවුරු නො දෙති. එහෙයින් සිවුරු ඉපදීම මද විය. චීවරකාරකෙ භික්ඛූ භත්තෙන නිමන්තෙන්ති- චීවරකාරක භික්ෂූන් බතින් පවරත්. ගමෙහි පිඬු හැසිර වළඳා කල්ගත කොට සිවුරු නිමකරණ භික්ෂූන් දැක 'මෙසේ කල වහා සිවුරු නිමකොට ගෙණ පරිභොග කෙරෙත්''යයි සිතා පින්කැමති බැවින් බතින් පවරත්. නානාවෙරජ්ජකෙ-නන්නත් රටින් පැමිණියවුන්; (විසදිසං රජ්ජං විරජ්ජං, විරජ්ජතො ආගතා වෙරජ්ජා, තෙ එව වෙරජ්ජකා) මොවුහු වනාහි කුලගොත්‍රාදි වශයෙන් නානාවිධ වූවෝ වෙත්; ගණ භොජනෙ-ගණභොජනයෙහි; නිමන්ත්‍රණයෙන් හෝ විඤ්ඤත්තියෙන් හෝ භික්ෂූන්ට ලැබුනු ඔදනාදී වූ පස් භොජනයන් අතුරෙන් අන්‍යතර භොජනයක් වේද ඒ ගණ භොජන නමි. (ගණස්ස භොජනං-ගණභොජනං) මෙහි ගණ නම් සතර නමක් හෝ ඊට අධිකවූ සඞ්ඝයායි ගණභොජනය දෙ අයුරකින් ලැබේ. එනම් නිමන්ත්‍රණයෙන් හා විඤ්ඤත්තියෙන් යන දෙවිධියෙනි. නිමන්ත්‍රණයෙන් කෙසේ ලැබේද යත්;යම්කිසි උපාසකයෙක් භික්ෂූන් සතරනමක් හුන්තැනකට පැමිණ "ස්වාමීනි, තුඹවහන්සේලා බතින් පවරමි. මගේ බත පිළිගණු මැනව, කැමතිවනු මැනව, ඉවසනු මැනව" යනාදීන් අතුරෙන් යම්කිසි පර්‍යායවචනයෙකින් පඤ්චවිධ භොජනයන්ට අයත් යම්කිසි නමක් යොදා පවරයි. මෙසේ එකට නිමන්ත්‍රණය කරණු ලැබුවෝ නියමිත කාලයෙහි එකට ම යෙත්, එකට ම පිළිගණිත්. එකට හිඳගෙණම වළඳත්. ඒ භොජනය ගණභොජන සඞ්ඛ්‍යාවට අයත් වේ. සියලු භික්ෂූන්ට ම ඇවැත් සිදුවේ. එකතැනදී නිමන්ත්‍රණය ලැබුවෝ එකට හෝ වෙන් වශයෙන් හෝ යෙත්, එකට පිළිගණිත්, වෙන් වෙන්ව හිඳ වළඳත්, එකලද ඇවැත් සිදුවෙයි. මෙහිදී පිළිගැණීමම ප්‍රමාණ වන හෙයිනි. එක තැනදී නිමන්ත්‍රණය ලැබුවෝ එකට හෝ වෙන්ව හිඳ වළඳත්, ඇවැත් සිදුවීමක් නැත. නානා තැනදී පවරණු ලැබුවෝ නැතහොත් පිය පුත් ආදි නානා අය විසින් පවරණලද භික්ෂූහු එකට හෝ වෙන්ව යෙත්වා, එකට හෝ වෙන්ව වළඳත්වා, එකට පිළිගැණීම පමණක් කෙරෙද්ද, ඒ පිළිගත් භොජනය ගණභොජන සඞ්ඛ්‍යාවට අයත්වේ. ඒ සියලු භික්ෂූන්ට ම ඇවැත් සිදුවේ. කෙසේ නම්

විඤ්ඤත්ති වශයෙන් ගණභොජනය ලැබේද? යත්; එක් තැනක සිටි භික්ෂූන් සිවුනමක් උපාසකයෙකු දැක, අප සතරනමට බත් දෙවයි ඉල්වත්ද නැතහොත් වෙන වෙනම 'මට බත් දෙව'යි ඉල්වාද, එසේ ඉල්වා එකට හෝ වෙන් වෙන්ව යෙත්වා එකට බත් පිළිගෙණ එකට හෝ වෙන්ව වළඳත්වා, ඉදින් එකට පිළිගැණීම කළ හෙයින් ඒ භොජනය ගණභොජන සඞ්ඛ්‍යාවට ගැණේ. සියල්ලන්ට ම ඇවැත් සිදුවේ. **පාදාපි ඵාලිතා** පාදයෝ පැළුනාහ; මහාසමෙන් යටැවූ සම පෙණෙන්ට විය. එහෙයින් වැලි හෝ කැටගල් හෝ හැපුනු කල්හි මහත් රිදීම් ඇතිවිය. ඇතුළගමෙහි පිඩු හැසිරෙන්ට ද නො හැකිවිය. මෙබඳු ගිලන්කමක් ඇතිකල්හි ගිලානසමයයයි වැළඳිය යුතුයි. සවල්ප මාත්‍ර ගිලන්බවකදී එසේ නොකට යුතුයි. **චීවරෙ කයිරමානෙ**-සිවුරක් කරණු ලබන කල්හි; මෙසේ චීවරකාරසමයෙහි ගණභොජනය වැළඳීමෙන් ඇවැත් සිදු නොවේ. **අද්ධයොජනං**-අඩයොදුනක්; යන්නහු විසින්ද ගියහු විසින් ද ගණභොජනය අනුභව කටහැකිය. **චතුත්ථෙ ආගතෙ**-සතරවැනි නමක් පැමිණිකල්හි; තුන්නමක් පිඩු සිගා වළඳන තැනට සතරවැනි නමක් පැමිණි කල්හි ඒ භික්ෂූහම දානය නො පෙණේ නම් මහාසමයයයි අදිටන් කොට ගණභොජනය වැළඳියහැකි වෙයි ආගන්තුක වශයෙන් පැමිණෙන සියයක් හෝ දහසක් වුවත් ඒ භික්ෂූන්ට ගණභොජනය කැපය. **අනාපත්ති සමයො**-සප්තවිධ සමයන් අතුරෙන් එක් සමයක් ඇතිකල්හි ගණභොජනය අනාපත්ති වේ. ග්ලාන, චීවරදාන, චීවරකාර, අද්ධානගමන, නාවාභිරූහන, මහාසමය, සමණභත්ත යන මොහු සප්තවිධ සමයයෝයි; **මෙ තයො එකතො**-යම් කෙණෙක් අකප්පිය නිමන්ත්‍රණයක් ඉවසා දෙතුන්නමක් එකතුවී වළඳති. ඔවුන්ට ද ඒ ශික්ෂාපදයෙන් අනාපත්ති වේ. අනිමන්තිත, පිණ්ඩපාත, අනුපසම්පන්න, පත්ත, ගිලානක යන පඤ්චචතුක්කයන්ගේ වශයෙන් විනිශ්චය ද දතයුතුයි. '**අනිමන්තිත චතුක්ක** -කිසිවෙක් 'සවාමීනි, බතක් පිළිගණු මැනව'යි භික්ෂූන් සිවුනමක් පැවරීය. එයින් තුන්නමක් එහි පැමිණියාහුය. එක් නමක් නො පැමිණියේය. දායක තෙමේ සවාමීනි, අනික් නම කොයිදැයි අසයි; ඒ නම නො පැමිණි බැව් දැන්වූ කල්හි එහි පැමිණි ආගන්තුක නමක් කැඳවා ඒ සිවුනමට දන් පිළිගැන්වීය එසේ වැළඳූ සිවුනමට ම ඇවැත් සිදුනොවේ. ආගන්තුක නම නිමන්ත්‍රණයට අසුනුවූ හෙයිනි. **පිණ්ඩපාතික චතුක්ක**-කිසිවෙක් අකැපවහරින් සිවුනමකට දන් පිණිස පැවරීය. ඉන් එක් නමක් පිණ්ඩපාතික නමකි. උන්වහන්සේ එය නො ඉවසූහ. එහෙත් වඩින කල්හි නො කැමැත්තෙන් ම එනු මැනවැයි කැඳවාගෙණ ගොස් සිවුනමට දානය දුනි. හෙතෙමේ එහි ගණභාවය වෙනස් කෙළේය. එහෙයින් සියලු භික්ෂූන්ට ම අනාපත්ති වේ. **අනුපසම්පන්න චතුක්ක**-හෙරණකු සමග සිවුනමක්වූ සඞ්ඝයා අකැපවහරින් කිසිවෙකු දානයකට පවරණු ලැබීය. එහිදී හෙරණ නම ගණයා බිඳි හෙයින් සියලුදෙනාට ම අනාපත්තිය. **පත්ත චතුක්ක**-එක් නමක් තෙමේ නොගොස් එහි පාත්‍රය පමණක් යැවීය. එයින් ගණයා

සිදුනේය. එහෙයින් සියලු භික්ෂූන්ට ම අනාපත්ති වේ. **ගිලානසමයෝති**-ගිලනෙකු සමග භික්ෂූන්ට දනයට ආරාධනාවක් ලැබුනි. ඒ පිණිස පැමිණි ගිලන් භික්ෂූනට අනාපත්ති වේ. නේ අතික් තුන් නමට ගණපූරකද වීය. ගිලනා ගණයා හෙදකිරීමට කරුණු නොවන හෙයින් සෙසු භික්ෂූන්ට ඇවැත් සිදුවේ. **නිච්චභත්තං**- ධ්‍රැවවශයෙන් දෙනුලබන බත; මේ ශික්ෂාපදය එළකලොම් සමුට්ඨානය, ගණබොජුන් බව, සමයාභාවය, අනුභවකිරීමයයි අඞ්ග තුණකින් යුක්තවේ.

**ගණභෝජන ශික්ෂාපද ගැටපදය නිමි.**

---

**භත්තපටිපාටි අට්ඨිතා**- කුල පිළිවෙළින් දියයුතු බත් පිළිවෙළ නො සිදී පැවැත්තේය. **න ඛො ඉදං ඔරකං භවිස්සති, යථා ඉමෙ මනුස්සා සක්කච්චං භත්තං කරොන්ති**-යම්සේ මේ මිනිස්සු සකස් කොට දන්දෙත්ද, එහෙයින් මේ සාසනය හෝ, බුදුන් ප්‍රමුඛකොට දෙන දනය සුලුවූවක් නොවන්නේය. **කිරපතිකො**-'කිර' යනු ඔහුගේ නාමයයි. අධිපති අර්ථයෙන් 'කිරපතික' යයි ඔහුට ව්‍යවහාර කෙරෙති. හෙතෙමේ අධිපති පුරුෂයෙකි. මාසයකු අවුරුදු ගණනින් වැටුප් ගෙවමින් කම්කරුවන් කර්මාන්තයන්හි යොදා කටයුතු කරවයි. **බදරපටියත්තා**- පිළියෙළකරගණු ලැබූ ඩෙබර; ව්‍යවහාර වශයෙහි. **බදරමිස්සෙන**- ඩෙබර (=මසන්) මිශ්‍රණයෙන් පිසගත් කැඳින්; ඩෙබර ගෙඩි බහා සකුරු ආදිය යොදා පිසගත් කැඳ බදරමිස්ස නාම්. **උස්සූරෙ**-ඉතා දවල්වූ කල්හි; **ඉම යාගු නිමන්තනෙ එකතො ආසිඤ්චි**-නිමන්ත්‍රණ වශයෙන් දෙතුන්පලකින් ලත් ආහාර පාත්‍රයෙහි බහා මිශ්‍රකොට වළඳයි දෙතුන් කුලයකෙනෙක් පමණ එක් තැනක වඩා හිදුවා, දන් ඒ ඒ තැනින් ගෙණවුත් පාත්‍රවලට බෙදත්. සූප ව්‍යඤ්ජන බෙදත්. සියල්ල එකම මිශ්‍රණයක් වෙයි. එය වැළඳීමෙහිදී අනාපත්ති වේ. ඉදින් මූලනිමන්ත්‍රණයෙන් ලත් බත පය පතුලෙහිද පසුව පසුව ලත් බත් මතු මතුයෙහිද වෙති. 'එය මත්තෙහි පටන් පිළිවෙළින් වළඳන්නහුට ආපත්ති වේ. අත පතුළට යවා පළමුනිමන්ත්‍රණයෙන් ලත් බතින් එක් පිඬක්වත් ගෙණ වැළඳූ තැන් පටන් අනාපත්ති වේ. ඉදින් ඒ බත් පයෙහි කිරි හෝ යම්කිසි රසයක් හෝ බහයි, ඒ කාරණකොටගෙණ ඒ පයෙහි ම බත් එකරස බවට පැමිණේ. එසේ කල කැමැති ලෙසකින් වැළඳිය හැකිය. කුලයෙහි ප්‍රධාන උපාසක තෙමේ භික්ෂූවකට නිමන්ත්‍රණයකරයි. භික්ෂුව ගෙට වැඩි කල්හි උන් වහන්සේගේ පයෙහි මහා උපාසක තෙමේ ද ඔහුගේ අඹුදරු සහෝදර සහෝදරී ආදීහුද තමතමන් සතු කොටස් බහාලති. මහාඋපාසක බෙදූ කොටස නො වළඳා පසු පසුව බෙදූ කොටස් වළඳන භික්ෂූනට ඇවැත් සිදුවේයයි මහ අටුවාවෙහි කියති. **සබ්බෙව ගාමිකා**-සියලු ගම්මුන් විසින්; ගම්වැසි සියල්ලන් විසින් එකතුව නිමන්ත්‍රණයකරණලද භික්ෂූනට කැමති සේ වැළඳිය හැකිවෙයි. ඇවතක් සිදුවන්නේ නැත. **නිමන්තියමානො භික්ඛං ගණ්හථාති වදති**-'බත් ගණුව' යි

නිමන්ත්‍රණය කරණලද්දේ "තොපගේ බතින් මට කම් නැත භික්ෂුව ගණිම්"යි කියයි. මේ ශික්ෂාපදය කායවාචා කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. පරම්පර බොජුනක් බව, සමයාභාවය, වැළඳීමයයි අඞ්ග තුණකින් යුක්තවේ.

**පරම්පරභොජන සික්ඛාපද ගැටපදය නිමි.**

---

කාණමාතා-එනම් උපාසිකාව; කාණා නම් දූරියගේ මවු; කාණා දූරිය උතුම් රූ ඇත්තියකි. ඇ බලන්නවුන්ගේ ඇස් අඳුරුබවට පැමිණේ; එහෙයින් ඇ කාණා නමින් ප්‍රකටවිය. ආගතං- පැමිණීම; කිඤ්චි විය-කෙබන්දක් මෙන්; ලජ්ජාවන්තනක් මෙන් යන අර්ථයි. රිත්තහත්ථං ගන්තුං-හිස් අත් ඇත්තෙකුව ගමනක් යාමට; පරික්ඛයං අගමාසි-සියල්ල නිමාවට පැමිණියේය. මෝතොමෝ ආර්‍ය්‍යශ්‍රාවිකාවකි. භික්ෂුවක් දුක ඇති දෙයක් නොදීමට ඇ අසමර්ථවූවා අවසන් වනතුරුම දුනි. ධම්මියා කථාය-දැහැමිවූ කථාවෙන්; කාණා තොමෝ මවුට දෙසූ දහම් අසන්නී දෙසුන් කෙළවර සොවාන්බවට පැමිණියාය. උට්ඨායාසනා පක්කාමි-අසුනෙන් නැගිට වැඩිසේක. කාණාවගේ හිමි තෙමේද බුදුරජනන් වහන්සේ ඇගේ ගෙට වැඩිසේකැයි අසා ඇ ගෙන්වා පළමු තනතුරෙහිම තැබීය. පූවො-කැවුම; මෙහි සතුටු පඬුරු පිණිස ගෙණයාමට පිළියෙලකළ අතිරස මුංකැරලි ආදි සියල්ලම පූව නමින් දැක්වුනි. පාථෙය්‍යත්ථාය- මාගෝපකරණ පිණිස; මන්ථං-අස්සුණු; මෙහි අග්ගල අස්සුණු තිල බැදිසහල් ආදි සියල්ලම මන්ථ නමින් දැක්විය. තතො ච උත්තරිං-ඉන් මත්තෙහි; පාත්‍රදෙකට වඩා; ද්වත්තිපත්තපූරෙ පටිග්ගහෙතබ්බා- මුවවිටෙක්හි යට හිර නො ඉක්ම පිරවූ පාදෙකක් හෝ තුණක් පිළිගෙණ; යට දෙපාත්‍රය ථූපිගත වූවද මේ සිඛයෙන් දොස් නො නැගේ. ථූපිගත සිඛයෙන් දොස් වෙයි යෙත්. අත්‍ර මයා ද්වත්තිපත්තපූරා-මෙහි මා විසින් පාත්‍රපූරදෙකක් පිළිගන්නාලදී. තුඹ එකක් ම ගණුව යි කියයුතුයි. පසුව පැමිණෙන භික්ෂුව දුක පළමු පැමිණි භික්ෂුව විසින් පාත්‍රපූර දෙකක් ද මා විසින් එකක් ද ගන්නාලදහ. එහෙයින් තුඹ පිළිනොගත යුතුයයි දැන්විය යුතුයි. පටික්කමනං හරිත්වා- බොජුන්හලට ගෙණගොස්; බොජුන් හලට යන්නහු විසින් භික්ෂූන් අත්හැර දැමූ ශාලාවකට නොගොස් මහාභික්ෂුසඞ්ඝයා වැඩසිටි තැනටම පැමිණිය යුතුයි. සන්දිට්ඨ සම්භත්ත යන්ට හෝ යවතිකායික භික්ෂූන්ට දීමටයයි අන් තැනකට නො පිවිසිය යුතුයි. ඉදින් නිතර පැමිණ වළඳන ස්ථානය දුරවූවද එහි යාම සුදුසුය සංවිභජිතබ්බං--බෙදිය යුතුයි; පාත්‍රපූර තුණක් ලත් නම් එකක් තමහට තබාගෙණ දෙකක් භික්ෂුසඞ්ඝයාට දියයුතුයි. දෙකක් නම් එකක් තමහට තබාගෙණ එකක් සඞ්ඝයාට දියයුතුයි. ගමිකස පටිප්පස්සද්ධ-(අතරමග උවදුරු හේතුවෙන්) ගමන වැලකුනු කල්හි; මේ ශික්ෂාපදය ෂට්සමුට්ඨාන වෙයි. කී ලකුණු ඇති පූ ආදිය ඇතිබව, නො වැලකුනු ගමන් ඇතිබව, ඥාතකාදීන් නොවන බව හා අතිරේක ප්‍රතිග්‍රහණයයි අඞ්ග පසකින් යුක්තය.

**කාණමාතු සික්ඛාපද ගැටපදය නිමි.**

**භුත්තාවී**-වැළඳූයේ; **පවාරිතො**-(බමුණ "කැමතිතාක් ගණුමැනවා" යි යාවදත්ථපවාරණයෙන් ද තෙමේ, 'ඇවත පමණි මඳ මඳ දෙව'යි පටික්ඛෙප පවාරණයෙන්ද) පැවරූයේ; පවාරණය සිවුවැදෑරුම් වේ. 'වස්සං වුත්ථපවාරණා, පච්චයපවාරණා, යාවදත්ථපවාරණා පටික්ඛෙප පවාරණා'යන මොහුයි. "අනුජානාමි භික්ඛවෙ වස්සං වුත්ථානං භික්ඛූනං තීහි ඨානෙහි පවාරෙතුං" මේ වස්සං වුත්ථපවාරණයයි "ඉච්ඡාමහං භන්තෙ සඞ්ඝං චාතුමාසං භෙසජ්ජෙන පවාරෙතුං" අඤ්ඤත්‍ර පුන පවාරණාය, අඤ්ඤත්‍ර නිච්ච පවාරණාය" යනු පච්චයපවාරණයයි. "පවාරිතො නාම අසනං පඤ්ඤායති, භොජනං පඤ්ඤායති, හත්ථපාසෙ ඨිතො අභිහරති, පටික්ඛෙපො පඤ්ඤායති" මේ පටික්ඛෙප පවාරණයයි. "පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි" යනු යාවදත්ථ පවාරණයයි. **සමන්තතො**- හාත්පස නෙවල වැස්සන්; **කාකොරවසද්දං**- එකතුවී හඬන කවුඩන්ගේ හඬ; **අලමෙතං සබ්බන්ති**-මේ සියල්ල පමණි; මෙහි 'ති' කාරය නොකියා 'අලමෙතං සබ්බං'' යි මෙපමණක් කියන්ට වටීයයි අටුවාවෙහි කියයි. 'ති' කාරය කී කල්හි 'නො කරණ ලද්දක් නොවේ'යයි ගණ්ඨිපදත්‍රයයෙහි කියන ලදැයි ද එහිම කියයි. **භුත්තාවී**- (යමෙකු විසින් පිළියෙල කරණලද හෝ නො කරණලද බතින් එක් බත්හුලක් තමුදු) අනුභවකරණලද තැනැත්තේ; **පවාරිතො**-කරණලද පවාරණය ඇත්තේ; මේ ප්‍රතික්ෂෙප මාත්‍රයෙන් නොව පඤ්චාඞ්ග සම්පූර්ණවීම වශයෙනි. **අසනං පඤ්ඤායති**- ආහාරය පෙණේ. **භොජනං පඤ්ඤායති**- පාත්‍රාදියෙහි භොජනය පෙණෙයි; **හත්ථපාසෙ ඨිතො**-දෙරියන් වියතෙකැ සිටියේ; **අභිහරති**- එලවයි; **පටික්ඛෙපො පඤ්ඤායති**- හත්ථපාසයෙහි සිටියහු විසින් එලවනලද භොජනයක් ප්‍රතික්ෂෙප කෙරේද එය පෙණෙයි. මේ එහි විනිශ්චයයි. 'අසන' නම් අත්පස සිටියහු විසින් එලවනලදින් ප්‍රතික්ෂෙපකල ඕදනය, කුම්මාසය, සත්තුය, මච්ඡය, මාංසය යන මොවුන් අතුරෙන් එක්තරා බොජුනකි. 'ඕදන' නම් හැල් ආදී සප්තවිධ ධාන්‍ය අතුරෙන් යම් ධාන්‍ය වර්ගයකින් පිසගණුලැබූ බතයි. කැඳද තිවුනු කල්හි හැන්දෙන් ගත් තැන් පෙණේ නම් එයද භොජන සඞ්ඛ්‍යාවට ගැණේ. අබැටක් සා මස්කඩක් හෝ නහරකඩක් හෝ බහා පිසගණු ලැබූ කැඳද පවාරණ යොග්‍යය. 'කුම්මාස' නම් යව පිටියෙන් පිසගණු ලැබූ රොටි ආදියයි. මෙසේ මුංපිටි ආදියෙන් පිසගත් දෙය පවාරණ යොග්‍ය නොවේ. 'සත්තු' නම් සප්තවිධ ධාන්‍යයන්ගෙන් යමක් බැද කුඩුකර පිළියෙල කොට ගත් අස්සුණු ආදියයි. විලඳ ;පිටිකොට කැනූ ගුලි පවාරණ යොග්‍ය නොවේ. ආහාර පිණිස ගණුලබන සියලු මත්ස්‍යමාංස වර්ග පවාරණ යොග්‍යය. **හත්ථපාසෙ ඨිතො**-අත්පසෙහි සිටියේ; හුන් භික්ෂුහුගේ අසුන් කෙළවර පටන් ද සිටි භික්ෂුහුගේ විලුඹ පටන් ද, සැතපුනු භික්ෂුහුගේ පාර්ශ්වාන්තය පටන් ද පිළිගන්වන්නාහුගේ දිගුකළ අත හැර ඉතා ලංව පිහිටි ශරීරාවයවයන් අතර දුර ප්‍රමාණය දෙරියන්හමාර නො ඉක්මවා සිටියේ; **අභිහරති**- (දෙරියන් වියතක් තුළ

සිටියේ)එලවයි. ලඟ හුන් භික්ෂුතෙමේ අතෙහි හෝ උකුලෙහි හෝ ආධාරකයෙහි හෝ තිබුනු පය එයින් නො නගාම බත් ගණුවයි ලඟ හුන් අතික් භිඤුහට කියයි. එය ප්‍රතික්ෂෙපකරණ භික්ෂුහට පවාරණය නොවේ. බත් බඳුන ගෙණැවිත් ඉදිරිපස තිමතබා බත් ගණුමැනවැයි කී කල්හි ඒ ප්‍රතික්ෂෙපකරණ භික්ෂුහට පවාරණය නොවේ. ථෙරාසනයෙහි හුන් ස්ථවිරතෙමේ දුරහුන් දහර භික්ෂුහට පය යවා මෙයින්බත් ගණුවයි කියයි. ගෙණ ගිය තැනැත්තෝ නිශ්ශබ්දව සිටියේ වෙයි. දහරතෙමේ 'මට කම්නැත' යි කියයි. තෙරුන් දුරසිටි බැවින් ද, දූතයාගේ අභිහරණය බැවින් ද එය පවාරණය නොවේ. පටික්ඛෙපො පඤ්ඤායති-ප්‍රතික්ෂෙපය පැණේ; වචනයෙන් එලවන ලද්දක් ප්‍රතික්ෂෙප කිරීමෙන් පවාරණය නො වේ. කයින් එලවනලද්ද කයින් හෝ වචනයෙන් හෝ ප්‍රතික්ෂෙපකරන්නහුට ම පවාරණය වෙයි. ඇඟිල්ල හෝ අත හෝ විජනිය හෝ සිරුරු කොණක් හෝ සොලවයි. බැම හෝ ඔසවයි. රවමින් හෝ බලයි. මේ කයින් කෙරෙණ ප්‍රතික්ෂෙපයයි. කම්නැත, නො ගණිමි, නො බෙදව, පසුවයනු මැනවැයි කියා ද මේ වචනයෙන්කෙරෙණ ප්‍රතික්ෂෙපයයි. අනතිරිත්තං– කැප නොකළ හෝ ගිලන්හට වැඩිනොවූ දෙය; කප්පියකතය, පටිග්ගහිතකතය, උච්චාරිතකතය, හත්ථපාසෙ ගහිතකතය, භුත්තාවිනාකතය, භුත්තාවිනා පවාරිතෙනකතය, ආසනා අවුට්ඨිතෙනකතය, අලමෙතං සබ්බන්ති වුත්තෙනකතය යන මේ සප්තවිධ විනයකර්මයෙන් කැප නො කරණ ලද්ද යම් භොජනයෙක් ගිලානාතිරිත්ත නොවේ ද ඒ සියල්ලම අනතිරිත්ත නම්. අකප්පියකතං-(නඛය, අග්ගිය, සත්ථය, නිබ්බට්ටබීජය, අබීජය යන පස් සමණ කැප්යෙන්) කැපනොකළ දෙයද අකැප මස් ද, අකැප බොජුන ද යන මේ සියල්ල අකප්පිය නම්. ඒ අකැප දූය "අලමෙතං සබ්බං" යි මෙසේ අතිරිත්ත සෙවත් කැපකරණලද්දේද් අකප්පියකත නම්. අපටිග්ගහිතකතං-භික්ෂුව විසින් නො පිළිගන්නා ලද්දම 'අලමෙතං සබ්බං'යි මෙසේ අතිරිත්ත හෙවත් කැපකරණ ලද්දේ අපටිග්ගහිතක නම්. අනුච්චාරිතකතං–කැපකරවන්ට පැමිණි භික්ෂුව විසින් මඳක් මැත්නොකොට හෝ ඒ දිගට නො නමා කැපකරණ ලද්දේ; අහත්ථපාසෙ කතං–(කැපකරවන්ට පැමිණියහුගේ) අත්පසින් පිටත සිටියකු විසින් කැපකරවනලද්ද; අභුත්තාවිනා කතං-පවාරණ පහොනක භොජනය නො වැළඳුවහු විසින් කැපකරණලද්දේ; යම් භොජනයෙක් අතිරිත්ත හෙවත් කැප නො කරණලදද යම් භොජනයෙක් ගිලානාරිත්ත නොවේ ද යන මේ දෙකම කැප නො කරණ ලද්දහු නම් වෙති. අතිරිත්තය වනාහි අනතිරිත්තයට ප්‍රතිපක්ෂ නයින් දතයුතුයි. මෙහි ප්‍රතිපක්ෂ නම් සත්විධ විනයකර්මයෙන් කැපකිරීමය, ගිලානාතිරිත්තය යන මොහුයි. භුත්තාවිනා කතං–(ලඟ වැඩහුන් සභාග භික්ෂුවගේ පාත්‍රයෙන් එක් බත්හුලක් හෝ මස් කැබල්ලක් හෝ) අනුභවකලනු විසින් කැපකරණලද්දේ; ගිලානාතිරිත්තං– ගිලානාතිරිත්ත බොජුන; ගිලනාගේ භුක්තාවශෙෂය පමණක්ම

ගිලානාතිරිත්තයයි නො ගතයුතුයි. අද හෝ හෙට මෙසේ යම් දවසක කැමති නම් එදා වළඳයි ගිලනා උදෙසා ගෙණෙනලද යම් කිසිවක් වේනම් ඒ සියල්ල ද ගිලානාතිරිත්ත සඞ්ඛ්‍යාවට ගතයුතුයි. පෙරබත්කල යාමකාලිකාදිය ආහාර පිණිස අනුභවකරණ අප්පවාරිතභාවට අනාපත්තිවේ. පවාරිත මහණහට වැලදීමෙහිදී පවාරණමූලක දුකුලාව පිඩක් පිඩක් පසා සිදුවේ. **සතිපච්චයෙ** ආබාධාදිප්‍රත්‍යය ඇති කල්හි; පවස ඇතිකල්හි එය නැසීම පිණිස යාමකාලිකය ද, ඒ ඒ දෙයින් සංසිඳෙන ආබාධ ඇතිකල්හි එය සංසිඳවා ගැණීම පිණිස සත්තාහකාලික යාවජීවිකයන් ද අනුභවකරන්නහුට ඇවැත් නැති. මේ ශික්ෂාපදය කායවාචා, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. පවාරිතබව, ආමිසයාගේ අනතිරිත්තබව, සුදුසු කාලයෙහි අනුභවකිරීම යයි අඞ්ග තුණකින් යුක්ත වේ.

**පඨම පවාරණ සික්ඛාපද ගැටපදය නිමි.**

---

**අනාචාරං ආචරති**-පණවනලද සිකපද කඩකිරීම් නැමති අනාචාරය කෙරෙයි. **උපනන්ධි**- (ඒ පුද්ගලයා කෙරෙහි) නැවත නැවත ආඝාත බැන්දේය **අභිහට්ඨුං**- එළවා; **පවාරෙය්‍ය**- (මහණ කිද කව, අනුභවකරවයි) මෙසේ පවරන්නේ නම්; **ජානං**-(පැවරූ බව) දන්නේ; මෙසේ පැවරීම "සාමං වා ජානාති, අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති, සො වා ආරොචෙති" යන තුන් අයුරින් සිදුවෙයි **ආසාදනාපෙක්ඛො**- චෝදනාකිරීම හෝ කරබනනාබව කැමැත්තේ; **පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස**-එළවූ දෙය ගෙතෙමේ පිළිගණී ද එළවූ භික්ෂුහට දුකුළා ඇවැත් වේ. මේ ශික්ෂාපදයෙන් සිදුවියයුතු සියලුම ඇවැත් සිදුවන්නේ අභිහාරක මහණහටය; මෙය කායචිත්ත, වාචාචිත්ත, කාය වාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ පවාරිතබව, පවාරිතසඤ්ඤී බව, **ආසාදනාපෙක්ඛ** බව, අනතිරිත්ත භෝජනයෙන් එළවා පැවරීම, භෝජනපරියෝසානයයි අඞ්ග පසකින් යුක්ත වේ.

**දුතිය පවාරණ සික්ඛාපද ගැටපදය නිමි.**

---

**ගිරග්ගසමජ්ජෝ**-යම්කිසි දෙවියෙකු උදෙසා කරණුලබන උතුම් කෘත්‍යයකි. මෙය මෙයින් සත්වැනි දිනයෙහි පවත්නේයයි පළමු කොට නුවර පතළ කෙරෙයි. නුවරින් පිටත පිහිටි සමබිමකවූ ගල් සෙවනැල්ලක මහජනයා රැස්වෙයි. එහිදී නන්වැදෑරුම් ගීතාළ පවත් වත්. එය බලන්නෝ මැසි උඩ මැසි බැඳ අසුන් පිළියෙල කරගණිති. **ඡබ්බග්ගියා**-එනම් භික්ෂුහු; මොවුහු සිකපද පණවන්ට පළමු වෙන් ඉතා බාලකලම උපසපන් වූවෝයි. මේ භික්ෂුහු කව් නළු බලන්නෙමුයි එහි ගියාහුය. ඉක්බිති ඔවුන්ගේ නෑයෝ අපගේ ආය්‍යයෝ පැමිණියාහුයි තුටු සිත් ඇත්තෝ ඇඟ උලා නහවා වළඳවා කැවිලි ආදිය ද කැවූහ. **විකාලෙ**-භික්ෂූන්ගේ භෝජනකාලය පසුවගිය

කල්හි; විකාලෙ නාම මජ්ඣන්හිකෙ වීතිවත්තෙ යාව අරුණුග්ගමනා-මජ්ඣන්තික කාලය පහව ගිය කල්හි අරුණුග්ගමනය දක්වා පැවති කාලය විකාල නම්. එදවසෙහි මධ්‍යාහ්නකාලයෙහි පසු භික්ෂූන්ට වළඳන්ට හෝ අනුභව කරන්ට හෝ නුසුදුසුය. කාලය පිළිබඳව කුකුස් ඇතිවූ කල්හිද අනුභව නො කටයුතුයි. අවසෙසං ඛාදනීයං නාම-යාමකාලික, සත්තාහකාලික, යාවජීවිකයන්ගෙන් තොරවූ පස්බොජුන් ඛාදනීය නම්. යාවකාලික, යාමකාලික, සත්තාහ කාලික, යාවජීවිකයයි කාලික සතරක් වෙති. අරුණොද්ගමනයේ පටන් මධ්‍යාහ්නය දක්වා පැවති කාලය යාවකාලික නම්. මේ කාලය ඇතුළත පිළිගත් පස්බොජුන් මේ කාලය තුළම වැළඳිය යුතුයි. එතැන්පටන් රාත්‍රියෙහි පැසුළුයම තෙක් පවත්නා කාලය යාමකාලික නම්. අනුලොම් පැන් හා අටපැන් මේ කාලයතුළ වැළඳිය හැකියි. සත් දවසක් පරම කොට ඇති කාලය සත්තාහකාල නම්. එහෙයින් පිළිගෙණ සත්දවසක් තුළ වැළඳියහැකි ගිතෙල් ආදි පස්බෙහෙත් සත්තාහකාලික වස්තුහු වෙත්. දිවි ඇතිතෙක් පැවැති කාලය යාවජීව කාල නම්. ඉඟුරු කසා ආදිය පිළිගෙණ දිවි ඇතිතෙක් පරිභොග කටහැකි හෙයින් යාවජීවික නම්. ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිගණ්හාති-කමියි බුදිමියි පිළිගණියි. යම් භික්ෂුනමක් විකාලයෙහි කෑ යුතු දෙයක් හෝ බුදියයුතු දෙයක් හෝ පිළිගණීද, පිළිගැණීමෙහිදී ම ඒ භික්ෂුහට දුකුළා වේ. මේ ශික්ෂාපදය කාය, චිත්ත වශයෙන් සමුට්ඨානය වේ. සෙස්ස පෙර මෙනි.

විකාලභොජන සික්ඛාපද ශෑමසදෘශ නිමි.

---

බෙලට්ඨසීසො-එනම් මහාස්ථවිර තෙමේ; මුන්වහන්සේ ජටිල දහසට අයත් වෙති. අරඤ්ඤෙ විහරති-දෙව්රම ආසන්නයෙහි පිහිටි පදන්ගෙහි එක් ආවාසයක වාසයකරයි. සුක්ඛකූරං-සූප ව්‍යඤ්ජන රහිත බත; හෙතෙමේ ඇතුළුගම වළඳා පසුව පිඬු හැසිර බත් ලැබ ගෙණ අවුත් වියළා තැන්පත්කර තබා ගණියි. හෙද අපිස් බැව්හි. ලොල්බවකින් නොවේ. මුන්වහන්සේ සත් දිනක් මුළුල්ලෙහි නිරොධ සමාපත්තියට සම්වැද වැඩහිඳ එයින් නැගී සිට අවුවෙහි වියළා තුබූ බත් දියෙහි ලා වළඳති. නැවත ද නිරොධසමාපත්තියට සම වදිති. මෙසේ දෙතුන් සතියක් ඉක්මගිය කල්හි පිඬු පිණිස නැවත ද හැසිරෙති. සන්නිධිකාරකං- පිළිගෙණ තුබූ යම්කැලි; යාමකාලික හෝ යාමකාලිකවූ පිළිගෙණ එක් රැයක් තුබූ දෑය; පටිග්ගණ්හාති ආහාරත්ථාය-(එසේ සන්නිධිබවට පැමිණි බොජුන අනුභවය පිණිස) පිළිගණීද, ඒ භික්ෂුහට දුකුළා ඇවැත් වේ. වැළඳීමෙහිදී පිඬක් පිඬක් පාසා පචිති වේ. දුධොත වූ හෝ බැමි අතරෙහි අහර සැබලි රඳා පවත්නාවූ පයෙහි දෙවෙනි දින උණු කැඳ වත්කොට වළඳන භික්ෂූහට ද පිඬක් පිඬක් පාසා පචිති වේ. එබැවින් පාත්‍රය මිනාව නො

සේදුව නැවත එහි වලඳන්නහුට මේ සිකයෙන් ඇවැත් සිදුවියහැක. භික්ෂූහු නිරපෙක්ෂකවූවාහු යමක් හෙරණුන්ට පරිත්‍යාග කරද්ද, එය හෙරණෝ පරෙස්සම් කොට තබා ඒ භික්ෂූන්ට ම නැවත පිළිගන්වති. ඒ සියල්ල වටී. තමන් පිළිගෙණ පරිත්‍යාග නො කරණලද්ද දෙවෙනි දිනයෙහි වලඳන්ට නො වටී. එයින් එක් බත්හුලක් නමුත් වලඳන්නහුට පචිති වේ. අකැප මස් අතුරෙන් මිනිමස් වැලඳීමෙහිදී ථුලසියක් සමග පචිතියකි. සෙසු මස් වැලඳීමෙහිදී දුකුලාව සමග පචිතියකි. සන්නිධිවූ යාමකාලිකය එබඳු කරුණක් ඇතිකල්හි පෙරවරු ද පස්වරු ද වලඳන්නහුට පචිති ඇවැත් වේ. ආහාර පිණිස වලඳන්නහුට දුකුලාවක් සමග පචිති වේ. ඉදින් නො වේලෙහි සන්නිධි භොජනය වලඳා නම් සන්නිධි වශයෙන් ද විකල් බොජුන් වශයෙන් ද පචිති ඇවැත් දෙකක් සිදුවේ. සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය-සන්නිහිත සත්තාහකාලික යාවජීවිකයන් ආහාර පිණිස පිළිගන්නහුට පිළිගැණීම් වශයෙන් පළමුකොට දුකුලා ඇවැත් වේ. වලඳන්නහුට ඉදින් නිරාමිස නම් පිඩෙක්හි පිඩෙක්හි දුකුලා වේ. පිළිගෙණ තැබූ ආමිසසංසට්ඨයක් නම් වලඳන්නහුට වස්තුව පරිදි පචිති ඇවැත් වේ. අනාපත්ති යාවකාලිකං-යාවකාලිකය වලඳන්නහුට අනාපත්ති වේ. ඛාදනීය භොජනීයාදිය මධ්‍යාන්තකාලය දක්වා වැළඳියයුතු හෙයින් යාවකාලික නම්. අනුලොම් පැන් සහිතවූ අටපැන් රස පැසුළු යමතෙක් වැළඳියයුතු හෙයින් යාමකාලික නම්. ගිතෙල් ආදි පස් බෙහෙත් සත්දවසක් මුළුල්ලෙහි තැබියයුතු හෙයින් සත්තාහකාලික නම්. දියහැර ඒ අයත් සෙසු දෑය පිළිගෙණ තබා සුදුසු කරුණක් ඇති කල්හි වැළඳියයුතු හෙයින් යාවජීවික නම්. අරුණෝදයෙහි පිළිගන්නාලද යාවකාලිකය සියවරක් නමුත් තබ තබා යම්තාක් කාලය නො ඉක්මයේද එතාක් ද, යාමකාලිකය එක්රැ දවාලක් මුළුල්ලෙහි ද, සත්තාහකාලිකය සත්රැයක් මුළුල්ලෙහි ද, යාවජීවිකය සුදුසු කරුණක් ඇති කල්හි දිවි ඇතිතාක් ද වලඳන්නහුට ඇවැත් සිදුනොවේ. මේ ශික්ෂාපදය කාය, චිත්ත වශයෙන් සමුට්ඨානය වේ. මෙය යව්කාලි යම්කාලි බව, සන්නිහිතබව හා එය අනුභවකිරීමයි තුන් අඟකින් යුක්ත වේ.

සන්නිධිකාර සික්ඛාපද ගැටපදය නිමි.

---

**පණීත භොජනානි-** (පණීත සංසට්ඨානි භොජනානි) සප්තවිධ ධාන්‍යයෙන් නිපදවූ උතුම් බොජුන්; **කාස්ස සම්පන්නං න මනාපං-** ප්‍රණීත දෙය කාහට ප්‍රිය නො වේද; **සාදුං-** රසවත් දෙය; **යො පන භික්ඛු එවරූපානි පණීතභොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය-** යම් මහණෙක් මෙබඳු ප්‍රණීතභොජනයන් නො ගිලන්ව තමා පිණිස ඉල්වාගෙණ වලඳා නම් පචිති ඇවැත් වේ. පිරිසිදු ගිතෙල් ආදිය තමන්ගේ ප්‍රයොජනය පිණිස විතවා අනුභව කරන්නහුට පචිති ඇවැත් නොවේ. මෙය සෙඛියාවෙහි සූපොදන

විඤ්ඤත්ති සිකපදයට අයත් හෙයින් දුකුළා ඇවැත් සිදුවේ. ඔදනය හා සංසට්ඨවූවක් ම ඉල්වා අනුභව කරන්නහුට පචිති ඇවැත් වෙයි යනු මෙහි අදහසයි. එහෙයින් සිකයෙහි 'පණීයානි' යනු නොකියා, 'පණීත භොජනානි' යනු කියනලදී. **ඔදකො**- (උදකෙ ජාතො) දියෙහි උපන්නේ; ප්‍රණීතභොජන විඤ්ඤාපනයෙහි ලා මේ විනිශ්චයයි. "සප්පිනා භත්තං දෙහි, සප්පිං ආකිරිත්වා දෙහි, සප්පිමිස්සකං කත්වා දෙහි, සසප්පිං දෙහි, සප්පිං ච භත්තං ච දෙහී"යි මෙසේ ඉල්ලන්නහුට විඤ්ඤත්තියෙහිදී දුකුළා වේ. පිළිගැණීමෙහිද දුකුළා වේ. අනුභවයෙහි පචිති වේ. **අගිලානො ගිලානසඤ්ඤී**- නො ගිලන්වූයේ ගිලනෙක යන හැඟීම් ඇත්තේ; බෙහෙත් පිණිස පස්බෙහෙත් විත වයි. මෙහි අගිලානෙන භික්ඛුනා චාතුමාසපච්චය පවාරණා සාදිතබ්බා අඤ්ඤත්‍ර පුනපවාරණාය, අඤ්ඤත්‍ර නිච්චපවාරණාය, තතො චෙ උත්තරිං සාදියෙය්‍ය පාචිත්තියං" යන මහානාම ශික්ෂාපදයෙහි එන පරිදි ඇවැත් කටයුතු වේ. අගිලනෙක් ගිලනෙක යන හැඟීම ඇතිව පස්බෙහෙත් ඉල්වන්නේ භෙසජ්ජ කරණීයයෙන් බෙහෙත් ඉල්වන්නෙක් නම් නො වෙයි. එහෙයින් පචිති ඇවැත් නොවීමට ඉඩක් නැත. මේ ශික්ෂාපදය, කාය, කායවාචා, කායචිත්ත, කායවාචාචිත්ත වශයෙන් චතුසමුට්ඨානයයි. ප්‍රණීත භොජනභාවය, අගිලන්බව, අසට විඤ්ඤත්තියෙන් වූ ප්‍රතිලාභය, අනුභවයයි සිවුඅඟකින් යුක්ත වේ.

පණීත භොජන සික්ඛාපද හැටපදය නිමි.

---

**සබ්බපංසුකූලිකො**- සිවුපසය ම පංසුකූලවශයෙන් වූයේ; යටත් පිරිසෙසින් දැහැටි ද පංසුකූලිකාවූවක් ම වළඳයි. හෙතෙමේ අනාලයව දමූ බඳුනක් ම පාත්‍රය වශයෙන් පරිභොගකරයි. අනාලයව සොහොනෙහි දමූ රෙදි මාලු එකතුකොට සිවුරක් කොට ගෙණ, සොහොනෙහිම අතහැරදමූ ඇඳපුටු ද ගෙණ තොස් පරිභොගකරයි. **ඤාතකෙවාසා විනානි**- පිතෘදනයන්; මිනිස්සු කළුරියකළ නෑයන් උදෙසා, ඔවුන්ට සජීවකාලයෙහි යමක් ප්‍රියවීද, ඒ ඒ දෙය පිඬු පිඬු කොට "අපගේ නෑයෝ අනුභව කෙරෙත්වා" යි සොහොන්වල තබත්. මේ භික්ෂු තෙමේ ඒ ඒ දෙය ගෙණ ගොස් වලඳයි. දෙනුලබත ප්‍රණීතදෙය වළඳක් වයි. **උම්මාරෙ**- (සොහොන්ගෙහි සෝ කමන් ගෙයි වූ) එළිපතෙහි; **ථූලො**-සතවූ මසින් යුක්තයෙක; **ඩඞ්ගරො**-සැපුලවූ සිරුරු ඇත්තෙක; **මනුස්සමංසං මඤ්ඤෙ ඛාදති**-මිනිමස් කායයි සඟිමි; මිනිමස් බුදින්නෝ මෙබඳු සිරුරු ඇත්තෝ වෙත්යයි මොවුන්ගේ අදහසයි. **උදකදන්තපොනෙ කුක්කුච්චායන්ති**-දිය හා දැහැටි කෙරෙහි ද කුකුස් උපදවත්. මේ භික්ෂූහු "අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය" යන පදයාගේ අර්ථය මනාකොට නො සලකන්නෝ අනාහාරවූ උදකය ආහාර සංඥාවෙන් ද, දැහැටි මුවතුළ පිවිසීම නුසුදුසුය යන හැඟීමෙන් ද කුකුස් කළාහුය. දිය වනාහි සිත්සේ පානය කටහැකි වෙයි. දැහැටි

දන්තපොන පරිභෝගයෙහි පරිභෝග කටහැකි වෙයි. නො ගිලන්නු විසින් දැහැටි හෝ වේවා අනිකක් හෝ වේවා මුවතුළ බහන්ට හැකිය. එහෙත් එහි රසය ගිලීම නුසුදුසුය. අදින්නං-කයින් හෝ කය පිළිබඳ වූවකින් නුදුන් දෙය; මුඛද්වාරං-මුවතුළ පිහිටි ගලනාළිය; තැහැයෙහි පිවිසි දෙයද මුවකිලෙහි පිවිසි සේ ගැණේ. ආහාරං- පිඩුකොට ගිලිය යුතුවූ කාලික ආහාරය; ජලය බෙහෙත් සංඛ්‍යාවට අයත් හෙයින් අකාලිකය; කායෙන-හස්තාදි කය පිළිබඳ අවයවයකින්; යටත්පිරිසෙයින් පා ඇඟිල්ලෙන් දුන් දෙයද කයින් දුන් දෙයක්ම වෙයි. පිළිගැණීමෙහිද සිරුර පිළිබඳ කිසි අවයවයකින් පිළිගත් දෙය කයින් පිළිගත් දෙයක්මය. නැහැයෙහි නැහැබරුයෙන් දෙනු ලබන යමක් ද එය නො ගිලන් වූයේ මුයෙන් පිළිගණී, මෙහිදී 'පිළිගණීම්' යන සිතම ප්‍රමාණය; කායපටිබද්ධෙන- හැඳි ආදි යම්කිසි උපකරණයකින්; දුන් දෙග ද සිරුරු අවයවයකින් දුන් දෙයක් සේම ගැණේ. පිළිගැණීමෙහි දීද මෙසේමය; නිස්සග්ගියෙන-නිසසජන පියොවින්; කයින් හෝ කය පිළිබඳ වූවකින් මුදා අත්පසෙහි සිටියහුගේ කයින් හෝ කය පිළිබඳ වූවකින් හෙලනු ලබන්නේ නිසසජන පියොවින් දෙනුලබන්නක් වෙයි. අඩග පසකින් යුක්තවූ කල්හි පිළිගැණීම පිරිසිදු වේ. එසවීම ද, අත්පසැ වීමද, අභිහාරය ද යන මෙයින් යුක්තව දෙවියෙක් හෝ මිනිසෙක් හෝ තිරිසන්ගතයෙක් හෝ භික්ෂුහට පිළිගන්වයි, එය භික්ෂුතෙමේ කයින් හෝ කය පිළිබඳ වූවකින් හෝ පිළිගණීයි. මෙසේ ඇතිකල ඒ පිළිගැණීම හොඳින් ඉටුවෙයි. මෙහි අත්පස පවාරණ සිකාපදයෙහි කී ලෙසට ය; යම්කිසිවෙක් බත් හා ව්‍යඤ්ජන බඳුන් හිසෙහි තබාගෙණ භික්ෂුසඟුන් ලඟට පැමිණ සිටියේ පිළිගණු මැනවැයි කියයි. ඔහුගේ කය අවනතවීම නො පෙණෙනතුරු නො පිළිගත යුතුයි. ඔහු මඳක්වත් කය නැමූ කල්හි භික්ෂුව විසින් අත දිගු කොට යටම බඳුන එක් දෙයකින් සපශී කළයුතුයි මෙ පමණකින් සියලු බඳුන් ම පිළිගත්තාලද්දේ වෙයි. සැදින් බත් ගෙණ එන්නේ කය මදක් නතුකොට පිළිගන්වයි නම් මැනවි. දෙකොණෙහි බැඳි සිතෙල් කළයක් හා උක්සකුරු කළයක් ඇති තිස්රියක් උණයටක් වෙයි. එක් දෙසකින් පිළිගණු ලැබූ එය සියල්ල ම පිළිගණු ලැබූවක් වෙයි. උක්යන ඔරුයෙන් වැගිරෙණ රසය පිළිගණු මැනවැයි කියාද, නතුබවක් නො පෙණෙන හෙයින් නො ගතයුතුයි. ඉදින් කසට හැරදමා අනිත් මදක් රැස්කොට දේනම් පිළිගත යුතුයි. අත්පස ඉක්මවා සිටියේ දික්මිටක් ඇති සැන්දකින් කැඳ හෝ බෙදයි. ඔහුට අත්පසට පැමිණ පිළිගැන්වුව මැනවැයි දැන්විය යුතුයි. එවනාය නො අසා හෝ නොගෙණ හෝ පයෙහි වගුරුවයි. නැවත එය පිළිගන්වා ගතයුතුයි. පාපසියෙන් බැහැරකරණු ලබන පයෙහි රජස් සුණුවෙත්. එය දිය ඇතිකල්හි දෙවියයුතුයි. නොමැති කල්හි රජස් පිස හෝ නැවත පිළිගන්වාගෙණ පිඬු පිණිස හැසිරිය යුතුයි. පිඬු පිණිස හැසි ඉරද්දී පඡයහි රජස් වැටුනි. නැවත ද පය පිළිගන්වා ගෙණ පිඬු ගත

යුතුයි. භික්‍ෂුවක්හට දෙනුලබන්නක් බිම හෝ වැටේ ද එය තමන්ම ගෙණ පරිභෝගකරන්ට වටී. "අනුජානාමි භික්ඛවෙ යං දීයමානං පතති, තං සාමං ගහෙත්වා පරිභුඤ්ජිතුං තං කිස්සහෙතු? පරිච්චත්තං තං භික්ඛවෙ දායකෙහි" දෙනු ලබන්නාවූ යමක් බිම පතිතවේද එය නැවත ගෙණ අනුභවකරන්ට අනුදනිමි. ඊට හෙතු කවරේද? මහණෙනි එය දායකයන් විසින් පරිත්‍යාග කරණලද්දේය. යමක් සරජ භූමියෙහි පතිතවීද එය ගෙණ රජස් පිස හෝ දෙව හෝ නැවත පිළිගන්වා ගෙණ හෝ වැලඳිය යුතුයි. ඉදින් පතිතවූ දෙය පෙරළී අනික් භික්‍ෂුවක් ලඟට පැමිණේද, ඒ භික්‍ෂුව විසින් එය ගෙණ පෙරසේ වැලඳිය යුතුයි. නැතහොත් උන්වහන්සේගේ නියමයෙන් තමන් හෝ ගතයුතුයි. මේ ශික්‍ෂාපදය කාය, කායචිත්ත වශයෙන් සමුට්ඨාන වේ. නො පිළිගත්බව, අනනුඥාතබව, අජ්ඣොහරණ නොමන්නාවූ ධූමාදිගත්හුගේ නොවීම යයි සිවුඅඟකින් යුක්ත වේ.

දන්තපොන සික්ඛාපද ගැටපදය නිමි.

---

උස්සන්නං- බහුලව ලැබෙන්නක්; විඝාසාදීනං- යාචකාදීන්ට; ඡිණ්ණ-සොර සැමියා; පරිවෙසනං- (පරිවිසන්ති එත්ථාති පරිවෙසනං) අනුභවකරණ තැන; පරිබ්බාජකසමාපන්නො-පැවිද්දකට පැමිණියේ; ද්වෙ ආපත්ති පාචිත්තියස්ස-දේනම් පචිති ඇවැත් වේ. සමතිත්තික වූ කැඳපයක් එක්වරකට දේද, එකම පචිතියකි. හාඩ කාඩ කොට දේනම් පියෝගණතින් පචිති වේ. තිත්ථියෙ අතිත්ථිය සඤ්ඤී-තීර්ථිකයා කෙරෙහි අතීර්ථිකය යන හැඟීම ඇත්තේ; මවු හෝ පියා හෝ තීර්ථිකයන් ලඟ මහණවෙයි. මවුය පියාය යන හැඟීමෙන් ඔවුන්ට දෙන්නනුට ද පචිති වේ. දාපෙති-අනුපසම්පන්නයෙකු ලවා දෙවයි; උපනික්ඛිපිත්වා දෙති-ලඟ තබා දෙයි; සුදුසු බඳුනක බහා ඒ බඳුන ඒ තීර්ථිකයන් සමීපයෙහි බිමතබා දෙයි. ඔවුන්ගේ භාජනය හෝ බිම තබවා එහි බහා දෙයි. පාත්‍රය ආධාරකයෙහි හෝ බිම හෝ තබා මෙයින් ගණුවයි කියන්ට වටී. මෙය කාය, කායචිත්ත වශයෙන් සමුට්ඨාන වේ. අඤ්ඤතිත්ථියයෙකුබව, අනනුඥාතබව, ආහාරය අනුභව කිරීම පිණිස සියතින් නො එලවූ බඳුනෙහි තැබීමයයි අඞ්ග තුණකින් යුක්ත වේ.

අචෙලක සික්ඛාපද ගැටපදය නිමි.

---

උපකට්ඨෙ කාලෙ-පිඩු සිඟීමට සුදුසු කාලය පැමිණි කල්හි; පටික්කමනෙ-අසුන්හලෙහි; (පටික්කමන්ති එත්ථාති පටික්කමනං) මෙහි 'පටි' යන උපසර්ගයෙන් ධාත්වර්ථය වැළැක්වී. භත්තවිස්සග්ගං- බත් කිස; න සම්භාවෙසි- නො ලැබීය; අනාචාරං-හසකාදි අනාචාරය; දස්සනූපචාරං වා සවණූපචාරං වා විජහන්තස්ස-දස්සනූපචාරය හෝ සවණූපචාරය අත්හරින්නහුට; සිටියේ හෝ හුන්නේ හෝ පිටත්

කොට යටියි. යමෙක් පිටත්කොට හරිණුලැබීද, හෙතෙමේ දස්සනූපචාරය හෝ සවණූපචාරය ඉක්මවයි. එසේ යන්නහුට ඇවැතක් නැත. ඔහු උපචාරය ඉක්මවන කල්හිම අනික් භික්ෂුව විසින් උපචාරය හරිණ ලද්දේ මය. එහෙයින් එහි වූවහුට ම ඇවැත් සිදුවේ. උපචාරබ්භ්‍යන්තරයෙහි එක පියක්වත් තිබෙනතුරු පචිති ඇවැත් නොවේ. එතෙක් සිදුවන්නේ දුකුලා ඇවතකි. සීමාව ඉක්මවූ කෙණෙහි ම පචිති ඇවැත් සිදුවේ. දස්සනූපචාරය දොළොස් රියනකි. සවණූපචාරය ද එසේම ය. ඉදින් භිත්ති දොර පවුරු ආදියක් අතර වේනම් එහි ඇතුලත දොළොස් රියනක් වූමද නුවූවද උපචාර වශයෙන් සැලකේ. න අඤ්ඤො කොචි පච්චයො හොති-අනාචාරය හැර අන්කිසි කරුණක් නොවෙයි. කලිසාසනං ආරොපෙතුකාමො- (බාණ්ඩු විය තිට්ඨන්ති පුනබොධිය තිසීදති යනාදීවූ) දුරුකතවචන ආරොපණය කෙරෙයි. 'කලි' නම් ක්‍රෝධයයි, ක්‍රෝධ වශයෙන් ඨානනිසජ්ජාදියෙහි දෙස් පෙන්වා අමනාප වචන කීයයි. මේ ශික්ෂාපදය කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. අනාචාරයෙහි හැසිරෙනු කැමතිබව, එයම කරුණු කොට ගෙණ උපසම්පන් භික්ෂුහුගේ උය්‍යොජනය, උය්‍යොජිතයාගේ උපචාරාතික්කමයයි අංග තුණකින් යුක්ත වේ.

උය්‍යොජන ශික්ෂාපද ගැටපදය නිමි.

---

සයනීඝරෙ-ශයනයකට යුතු ගෙහි; යෙන අඤ්ඤස්ස භික්ඛාදිකාන-ආයතීයන් වහන්සේට යම්හෙයකින් භික්ෂාව දෙනලද්ද, පැමිණියහු විසින් යමක් ලැබියයුතුද, එය නුඹවහන්සේ විසින් ලබනලදී; යනු මෑනාව යන අදහසයි. පරියුට්ඨිතෙන-රාගයෙන් මැඩගත් සිත් ඇත්තේ; මෛවුන්දම් සෙවීම් අදහසින්ය යන අර්ථයි. සභොජනෙ-මෛථුන රාගයෙන් යුත් අඹුසැමි දෙදෙනෙකු ඇති ගෙහි; (සහ උභොහි ජනෙහි සභොජනං) මෙහි 'උභය' ශබ්දයාගේ උකාරයට ලොප්කොට භකාරයට ඔකාරයකට ලොප් නො කොට අලුප්තසමාස ලෙසින් කීහු. (භොජනෙන සහවත්තනීති සභොජනං) මෙහි 'උභය' ශබ්දය හැරදමා භොජන ශබ්දය හා සමාසය කීහු. භොග සහිත කුලෙහි; මෛථුනරාගයෙන් යුත් මාගම් පිරිමින් ඇති ගෙයි යන අර්ථයි. මහල්ලකෙ සෙරෙ- ප්‍රමාණය ඉක්මවූ හෙයින් මහල්ලක නම් වූ නිදන ගෙහි; චතුස්සාලා ආදියෙහි කල ගෙය මහල්ලක නම්. පස් රියනකින් උඩු පුළුලින් යුත් ගෙය ඛුද්දක නම්. ඛුද්දකබව ඉක්මවූයේ මහල්ලක නම්. පිට්ඨසඞ්ඝාටස්ස හත්ථපාසං විජහිත්වා-(නිදන ගෙයි) දොරබාවේ පටන් දෙරියන් සමාරත්වූ අත්පස මූද; ඇතුළත ශයනාසනය ආසන්නයෙහි හිඳියි යන අර්ථයි. පිට්ඨිවංසං අතික්කමිත්වා- මුදුන් වහලසීමාව ඉක්මවා; මෙයින් ගෙමැද ඉක්මීම දක්වයි. පසඩුවහසන ප්‍රමාණවූ නිදන ගෙහි දොරබාවේ පටන් දෙරියන් වියත් පමණ තැන මධ්‍යස්ථානය වෙයි. මේ මධ්‍යස්ථානය ඉක්මවා හුන්නේ පිට්ඨිවංසය අතික්‍රමණය කොට

හුන්නේ නම්. මෙය පඨමපාරාජික සමුට්ඨානයි. නොසන්හුන් රාග ඇති මාගම් පිරිමින් දෙදෙනාගේ එක්වැ හුන්බවය, නිදන ගෙයක් බවය, දුතිය භික්ෂුවකගේ අභාවය, අනුපඛජ්ජ නිසීදනායයි අඞ්ග සතරකින් යුක්ත වේ.

සභොජන සික්ඛාපද ගැටපදය නිමි.

සතරවැනි පස්වැනි සිකපදයන්හි කියයුතු වෙසෙසක් නොමැතියි.

---

ඡඩ්ඩාවුසො භත්තං-ඇවැත්ති ආහාර දෙව; මෙහි ඒ බත එලවා තබතලද්දක් විය. අනතිහට කල්හි මෙසේ කියන්නට නො හැකි වෙයි. පයුත්තවාචා වන හෙයිනි. නෙතසි පටිගාහෙත්වා සිත්ථිකඨ-එයේ විනාම පිළිගෙණ තබව්; භාග්‍යවතුන් වහන්සේ කුලයාගේ ශ්‍රද්ධාව රැකීම පිණිස මෙය වදාළසේක. මෙය පිළිගෙණ බෙද අනුභව කරව්යයි බුදුරජානන් වහන්සේ වදාළසේක් නම් මිනිසුන්ගේ ප්‍රසාදයට හැලලක් වන්නේය. උස්සාදියිංසු-ආපසු ගෙණගියාහුය. එය ගෙණ ගෙට ම ගියාහුය යන අර්ථයි. සක්කං සික්ඛුං-ශ්‍රද්ධෛශ්වර්‍ය්‍යයෙන් ඇතුළත හෝ පියවි වදත් ඇසෙනගේ හුන් භික්ෂුව; අජ්ඣාරාමෙ-ඇතුළුගම්හි පිහිටි විහාරය; සම්බහුලා වනං-අනුන්හල; භත්තංගෙහං-නිත්තෙන් බත්දෙන ගෙය; දායකාදීන් සලාකබත් ආදිය පිළිගන්වන ගෙය; ආපදාසු-දිවියට හෝ බඹසරට අනතුරු ඇතිකල්හි; මෙසේකල ගමන්කරන්ට වටී. කිරියාකිරියං-ක්‍රියා නම් ගාමයි. අක්‍රියා නම් නො පිළිවිසීමයි. මේ ශික්ෂාපදය කායවාචා, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. පස් බොජුන් අතුරෙන් යමකින් කරණලද නිමන්ත්‍රණය ඉවසීම, භික්ෂුව ඇතිකල්හි ආපුච්ඡා නො කිරීම, නිත්තෙන් බත් දෙන ගෙයින් අන්ගෙයකට පැමිණීම, මධ්‍යාන්තය නො ඉක්මවීම, සමයාගේ හෝ ආපදාවන්ගේ අභාවයයි අඞ්ග පසකින් යුක්ත වේ.

චාරිත්ත සික්ඛාපද ගැටපදය නිමි.

---

මහානාමො-එනම් රජ; මේ රජතෙමේ බුදුරජාණන් වහන්සේගේ සුළුපියවූ සුක්කොදන රජුගේ පුතෙකි. බුදුරජුන්ට වඩා මහකින් වැඩිමහල්ලෙකි. අනුරුද්ධ ස්ථවිරතෙමේ මොහුගේ සහෝදරයෙකි. එසේම සකදාගාමී ආර්‍ය්‍යශ්‍රාවකයෙකි. භෙසජ්ජං උස්සන්නං හොති-බෙහෙත් (=ගිතෙල්) බොහෝ රැස්වූයේ වෙයි. ශාලෙන් නිතර නිතර ගෙණෙන්ට සිදුවූ හෙයිනි. සාදියිතබ්බා-ඉවසිය යුත්තේය; මෙකල රෝගයක් නැතැයි ප්‍රතික්ෂෙප නො කටයුතුයි. රෝගයක් වැලඳුනුකල දන්වන් නෙම්හි ඉවසිය යුතුයි. චතුමාසං-සාරමසක්; පච්චයපවාරණා-ගිලාන ප්‍රත්‍යයෙන් පැවරීමයි. මෙහි සප්පිනවනීතාදි ; භෙසජ්ජ පංචකය ම ගතයුතුයි. සෙසු භෙසජ්ජය මෙහි නො ගතයුතුයි. පුන පවාරණා-නැවත සාරමසකට බෙහෙතින් පැවරීම; නිච්ච පවාරණා-යාවජීව

යෙන්ම භෙසජ්ජං බෙහෙදින් පැවරීම; අජ්ජණ්හො ආගමෙථ-අද එක් දිනකට ඉවසනු මැනවි. 'අජ්ජතනං'යි ද 'දක්වති. එතල 'අද අපගේ' යන අර්ථය ගතයුතුයි. කාලං හරිස්සථ-හෙට බෙහෙත් හරින්නහුය යන අර්ථයි. ඤාතකා වෙ උඤාතකං සාදියෙය්‍ය-නූන් මත්තෙහි ඉවසත් නෝනම්; ඉදින් එයි රාත්‍රිකණ්ඩිකින් හෝ බෙහෙය් ගණිතින් පිරිසිදි ඔක් වේනම් එය නො ඉක්මවා විඥපතාය කටයුතුයි. ඒත්තකෙහාකි ගහසලේෂ්ඨි පවාරෙමි-ගිතෙල් තලතෙල් ආදී මේ පමණ බෙහෙත් හෝ නැලියක පතක යනාදී මේ පමණ ගණනින් හෝ පවරමි; අඤ්ඤං භෙසජ්ජං විඤ්ඤාපෙසි-සතුරු ආදි අනික් බෙහෙතක් විනාවයි. ගිතෙලින් පැවරූයේ තලතෙල් ඉල්වයි. නැළියකින් පැවරූයේ ද්‍රෝණයක් ඉල්වයි. න භෙසජ්ජෙන කරණීයෙන- බෙහෙතින් කටයුත්තක් නැතිකල්හි; මිශ්‍ර බතින් යැපෙන්ට යැකිවූවහුට බෙහෙතින් කම්නැත පවාරිතානං-පුද්ගලික පවාරණයෙන් පැවරූවන්ට; පුද්ගලික පවාරණයෙන් ප්‍රවාරිතයෝ වෙත්ද, ඔවුන්ට පවාරිතානුරූප වශයෙන් විනාවීමෙන් අනාපත්තිවේ. මේ ශික්ෂාපදය ෂසමුට්ඨානය. ගඩ්ඩපවාරණතා, භෙසජ්ජ විඤ්ඤත්තිය, අගිලානත්ථවය, රාත්‍රි හෙසජ්ජ දෙදෙනාගේ පරිච්ඡේදය ඉක්මීමයයි අඩ්ග සතරකින් යුක්තා වේ.

චාතුමාස සික්ඛාපද ගැටපදය නිමි.

---

අබ්භුය්‍යාතෝ-පරසෙනාව ඉදිරියට යමිණි නුවරින් නික්මුණෝ; උය්‍යුත්තං-කරණලද උයෝගා ඇත්තේ; සටනට සන්නද්ධව නුවරින් නික්මුණේ; ද්වාදස පුරිසො හත්ථි-(ද්වාදස පුරිසාඅස්ස අත්ථිති)ද්වාදශ පුරුෂ නම් හස්ථියයි, පිට නැගෙන්නෝ සිවුදෙනෙක් ද, පාරකින්නෝ අට දෙනෙක්දයි දොළොස්දෙන ඔහුගේ පිරිවර කෙසිනි. ති පුරිසො අස්සො-තිපුරුෂයෙකු ඇත්තේ අශ්ව නම්. අශු පිට නැගෙන්නෙක් ද, ආරක්ෂකයන් දෙදෙනෙක් ද යන තිදෙන වෙත්. චතුපුරිසො රථො-සිවු පුරුෂයකෙනෙකු ඇත්තේ රථ නම්. එක් රියැදුරෙක්ද, එක් යොධයෙක්ද ඇණි රකින්නන් දෙදෙනෙක්දයි යන සිවුදෙන වෙත්. චත්තාරො පුරිසා සරහත්ථා-ආයුධ ගත් පුරුෂයන් සිවුදෙනෙකු ඇත්තේ පත්ති නම්. මේ සිවුඅඟින් යුක්තවූ ඉතා කුඩා සෙබළ මුළුකි. මෙබඳුවූ සෙනාවක් දක්ම පිණිස යන්නහුට පියක් පියක් පාසා දුකුළා වේ. දස්සනූපචාරං-යම් තැනක සිටියේ දකීද ඒ ස්ථානය දස්සනූපචාර නම්. විජහිත්වා-තමා පළමුකොට සිටියාවූ ස්ථානය විජහනාය කොට; එකමෙකං-එක් ඇතරුවෙකු නැගුනු ඇතු හෝ හරගත් එක් පුරුෂයෙකු; මෙයි දුමඩයිනී නිමවඩිනී වූ සෙනාගදස්සනමෙවයේ. ආපදාසු-දිවියට හෝ බඹසරට අනතුරු ඇතිකල්හි; මෙහි ගියකල එයින් නිදහස ලබන්නෙමියි යන්නහුට අනාපත්ති වේ. මේ ශික්ෂාපදය එළකලෝම සමුට්ඨානය ය. උය්‍යුත්ත සෙනාවක් වීම, දැකීමට යාම, අනුනොදන් දස්සනූපචාරදී අවකාශයෙන් එක්තරා තැනෙක සිට බැලීමය යන අඩ්ග සතරකින් යුක්ත වේ.

උය්‍යුත්තසෙනා සික්ඛාපද ගැටපදය නිමි.

අත්ථඞ්ගතෙ සූරියෙ සෙනාය වසති - ඉරගල වැටුනු කල්හිද සෙන හෙති වසාද; මෙහි සිටීම්, ඉඳීම්, සැතපීම් ආදිය කෙරේද, ඒ ඉදිරි අහසෙහි හෝ ඉරියව් පවත්වාද ඒ සියල්ලෙම ඒ භික්ෂුහට පචිත්තියට කරුණු වේ. පටිසෙනාරුද්ධාය - සතුරු සෙනාගින් වැළලුනු සේනායෙහි; කෙනචි පළිබුද්ධො - අධිපති වෛරී ආදී කිසිවෙක්හුගෙන් උපද්‍රව ඇත්තේ; ඊශ්වරජනයා විසින් 'වලඳ ගිය මැනවැ' යි කීකල නො වලඳ ගියහොත් උපද්‍රව කෙරෙණ හෙයින් ඔවුන්ගෙන් මෙසේ පළිබුද්ධයාහට ද අනාපත්තියි. මෙහි එළකලොම සමුට්ඨානයි. තුන්රැයක් ඉක්මවීම, හිරු බැසයාම හා ගිලානය, ගිලානකරණීයය, සතුරු සෙනාගින් වැළකීමය, උපද්‍රවය, ආපදාය, උමතු ආදිය යන මොවුන්ගේ අභාවය යන අඞ්ග තුණකින් යුක්ත වේ.

සේනාවාස සික්ඛාපද ගැටපදය නිමි.

---

උය්‍යොධිකං - (උග්ගනන්ති උය්‍යනන්ති එත්ථ යුජ්ඣනති) සටන්කරණ තැන; බලග්ගං - (බලස්ස අග්ගං ජානන්ති එත්ථ) සේනාගණිතස්ථානය; සේනාබ්‍යූහං - සේනාවගේ (රථාකාරයෙන් සකටාකාරයෙන් පද්මාකාරයෙන්) සිටීම; තයො හත්ථී පච්ඡිමං හත්ථානීකං - ද්වාදශපුරුෂ සඞ්ඛ්‍යාත ඇතුන් තුන්දෙනෙක් ඇත්තේ පැසුළු ඇත් ඇණියකි; කති තෙ ලක්ඛානි ලද්ධානි - තුඹ විසින් කීදෙනෙක් විදින ලද්දාහුද, සමුට්ඨානය උය්‍යුත්ත සික්ඛාපදයෙහි මෙනි. උය්‍යොධිකාදිය දැකීමට යාම, අනුසඞ්ග නොහාසයෙන් අන් තැනකදී දැකීම, තථාරූපප්පච්චය ආපදාවන්ගේ අභාවයයි අඞ්ග තුණකින් යුක්තය.

උය්‍යොධික සික්ඛාපද ගැටපදය නිමි.

---

චෙතියෙසු - චෙතියරටෙහි; මෙය කුරුරට සමීපයෙහි කොසොල් රටට බටහිරින් යමුනා ගංතෙර පිහිටියේය. මෙකල මෙය බුන්දෙල් ඛන්ඩ් නමින් ප්‍රකටය. අජපාලකා - එළුපල්ලෝ; භද්දවතිකා - එනම් ගම, මේ ගම මහා වැටකින් පිරිකෙව්ලත් හෙයින් මෙනම් විය. පථාවිතෙනා - මෑගියෝ; තෙජසා තෙජං - තමන්ගේ තෙදින් නයිදුගේ තෙද; කාපොතිකා - පරවියන්ගේ පා මෙන් රතුපැහැය ඇති; පසන්නා - සුරාමණ්ඩය; ඉදඛිමුගෙන - දියනයෙකු සමග; පිට්ඨසුරා - සහල්පිටි ආදියෙන් කළ මද්‍යය; පූවසුරා - පූ බඳුනක බහා උණුදිය වත්කොට අල්ලා කළ මද්‍යය; කිණ්ණපක්ඛිත්තා - ඖෂධාධතුරාදි සුරාබීජයන් බහා කරනන්නාලද මද්‍යය; සම්භාරසංයුත්තා - අඹ ආදී නානාසම්භාරයන් යොදා කරනන්නාලද මද්‍යය; පුප්ඵාසවො - මී තල් පොල් ආදී මල්රස පැසවා කළ මද්‍යය; ඵලාසවො - පනසාදී ඵලරස පැසවා කළ මද්‍යය, මධ්වාසවො - මිදිරසය පැසවා කළ මද්‍යය; ගුළාසවො - උක්රසය පැසවා කළ මද්‍යය; අන්තමසො කුසග්ගෙනාපි පිවති - යමෙක් පරිසෙයින් තණපත් අගින් නමුත් පානය කෙරේද; අමජ්ජං ච හොති

මජ්ජවණ්ණං මජ්ජගන්ධං මජ්ජරසං- මජ්ජවණ්ණ ගන්ධරස ඇත්තාවූ ලෝණසෝවීරකාදි අමද්‍ය ද්‍රව්‍ය වෙති. සූපසම්පාකෙ- සූපද පත්වනු පිණිස මදක් මද්‍යරසය යොදා පිසගත් සූප විශේෂයෙහි; මෙහි ඇවතක් නැත; මද්‍යයාගේ වර්ණය, ගන්ධය, රසක ප්‍රකටව පෑණේ නම් එය ආපත්තිකර වෙයි. අවජ්ජං අරිට්ඨං- අරිෂ්ට මද්‍යසඞ්ඛ්‍යාවට අයත් නොවේ. එහෙයින් එහි අනාපත්ති වේ. මෙහි එළකලෝම සමුට්ඨානය වෙයි. මද්‍යභාවය, එය පානය කිරීම් යයි මේ දෙ අඟකින් යුක්තය.

සුරාපාන සික්ඛාපද ගැටපදය නිමි.

---

අඞ්ගුලිපතොදකෙ- ඇඟිලි තැබැවින් විදීම නිමිත්තකොට ගෙණ සිරිත් කැවීමෙහි; උත්තසන්තො- බොහෝ කොට සිමෙන් පීඩිතවන්නේ; අනස්සාසකො- වැළකුනු අස්සාසපස්සාස සංචාර ඇත්තේ; අනුපසම්පන්නං කායෙන කායං- අනුපසම්පන්නයෙකු තම කයින් ඔහුගේ කය; මෙහි භික්ෂුණිය ද අනුපසම්පන්නාව යෙහි සිටියා වෙයි. එහෙයින් ක්‍රීඩාභිප්‍රායයෙන් සපශීකරන්නහුට දුකුලා වේ. මෙය පඨමපාරාජික සමුට්ඨානය. අනුපසම්පන්නබව හා උපසම්පන්නයකුගේ කයින් කායසංසග්ගීනාග යි මේ දෙඅඟකින් යුක්තවේ.

අඞ්ගුලිපතොදක සික්ඛාපද ගැටපදය නිමි.

---

අචිරවතියා නදියා- එනම් නදියෙහි; දඹදිව පංචමහානදීන්ට අයත්වූ මේය සැවැත්නුවර ආසන්නයෙහි පිහිටියේය. අපඤ්ඤත්තෙ සික්ඛාපදෙ- (භාග්‍යවතුන් වහන්සේ විසින්) පැණවූ සිකපද නො දත්තෝ; උදකෙ හසධම්මං- ජලක්‍රීඩාවෙහි; උපරිගොප්ඵකෙ- වළලුකරක් දියට අධිකවූ දියෙහි; හසාධිප්පායො- කෙළි අදහස; නිමුජ්ජති වා- කිමිදීත් වේද, උම්මුජ්ජති වා- නිය නගාද; පිලවති- එතෙරවේ; කිමිදීම පිණිස දියට බසින්නහුට පියවරක් පාසා දුකුලා වේ. නිමුජ්ජනුම්මුජ්ජනයන්හි පියොවක් පාසා පචිති වේ. ඉවුරෙන් හෝ රුකකින් හෝ ගඟට පනින්නහුටද පචිතිවේ. අතින් පිහිනන්නහුට හස්තවාර ගණනින්ද, පාදයෙන් පිහිනන්නහුට පාවාරගණනින් ද, පචිති ඇවැත් වේ. නාවාය කීළති- නැවින් කෙළියි. නැවින් කෙළීම නම් පලුපත් ආදියෙන් නැව පැදවීමයි. එසේ කරන්නහුට පියෝ ගණනින් දුකුලා ගෙමි. හත්ථෙන වා- අතින් හෝ; දියෙහි අතින් විදිනලද කැබලිතිකඩ ප්‍රහාර උස්පත්ත ගැහමවාරයක් පාසාම දුකුලා ඇවැත් සිදුවේය යන මතය නො ගතයුතුයයි ද එක් පියොවක් හෙයින් එකම දුකුලාවක් සිදුවේයයි ද අටුවාවෙහි දක්වේ. මෙය පාරාජික සමුට්ඨානයයි. වළලුවක් දියට අධිකබව හා හසාධිප්පායෙන් කෙළීමයයි මේ දෙ අඟකි.

හසධම්ම සික්ඛාපද ගැටපදය නිමි.

සාධ්‍යාං නක්ඛමාය-මේ ධර්මය, මේ තනතිය, මේ ප්‍රවේණිය, කෙසේ නම් නැසෙන්නේ ද; පඤ්ඤත්තෙන-බුදුන් විසින් පණවන ලද ශික්ෂාපදයෙන්; උපසම්පන්නෙන- උපසම්පන්නයක්හු විසින්; තං වා න සික්ඛිතුකාමො- ඒ ප්‍රඥප්තියෙහි නො හික්මෙනු කැමැත්තේ; අපඤ්ඤත්තෙන-බුදුන් නො පැණවූව ද සූත්‍රයෙහි හෝ අභිධර්මයෙහි පැණෙන පණතකින්; එවං අම්හාකං ආචරියානං උග්ගහො- අපගේ ආචාර්යයන්ගෙන් අසා එන පාලික්‍රමය මෙසේය: ඇදුරන්ගේ වූවද ගැරහියයුතු උද්ග්‍රහණය නො ගත යුතුයි. සඞ්ගීති කාලයෙහිපටන් පරම්පරාවෙන් ගෙණෙන ලද්දම මෙහිදී අදහස් කෙරේ. ඉන් මෑත හුන් අව්‍යක්ත ඇදුරන් විසින් උගන්නාලද්දක් අදහස් නො කෙරේ, මේ ශික්ෂාපදය කායචිත්ත; වාචාචිත්ත, කායවාචාචිත්ත වශයෙන් තිසමුට්ඨානයය උපසම්පන්නයෙකු විසින් බුදුන් වදාළ සිකපදයෙන් මය, අනාදරකිරීමයයි දෙ අඟකින් යුක්ත වේ.

අනාදරිය සික්ඛාපද ශැටපසදශ නිමි.

---

පස්වැන්නෙහි කියයුත්තක් නැත.

භග්ගෙසු- එනම් ජනපදයෙහි; අවන්තිරටට උතුරෙන් යමුනා නදීතීරයෙහි පිහිටි මෙය වංසරටට අයත්වේ. සුංසුමාරගිරෙ-භග්ග ජනපදයෙහි ප්‍රධාන නගරයකි. එහි පිහිටි භෙසකලාවනයෙහි බුදුරජාණන් වහන්සේ අටවැනි වස විසූසේක. නගර නිර්මාණාරම්භයෙහිදී කිඹුලෙකුගේ හඬක් පළමුකොට ම අසන්ට ලැබුනු හෙයින් ද කිඹුලෙකුගේ හැඩහුරුකම් ඇති කඳුවැටියක් එහි පිහිටි හෙයින්ද 'සුංසුමාර ගිර' යයි මීට නම්කළහ. 'භෙසකලා' නම් පැලෑටි විශේෂය මෙහි බහුතර වශයෙන් පවත්නා හෙයින්ද 'භෙස' නම් බිලිපුජා යකෙකු මෙහි පතිත වූ හෙයින්දෙ මීට භෙසකලාවනය යි නාම තැබූහ. සුසිර රුක්ඛං-සුඹුලුරුකක්; සමාදහිත්වා-ගිනිදල්වා; විසිබ්බෙන්තු-තැප්පාහුය; සම්පාපෙසි-ලුහුබැන්දේය; සයං සමාදහති-තෙමේ ගිනිදල්වයි, මෙහි ගිනිදල්වන්ට කැමැත්තෙන් ගිනිදඬු සැපයීම් ආදිය පටන් ගිනිදුල් නැගීම දක්වා සියලු ප්‍රයෝගයන්හිදීම දුකුළා ඇවැත් සිදුවේ. පදීපෙපි-පහන් දැල්වීමෙහිද; ජොතිකෙපි- පාත්‍රපිසීම් ඩහගැන්වීම් ආදියට ගිනි දැල්වීමෙහිද; තථාරූපප්පච්චයා-පහන් දැල්වීම් ආදි පසයෙන්; පටිලාතං උක්ඛිපති- පෙණෙහෙල්ල නගයි. දා බැයගිය නො නිවි පෙණෙහෙල්ල යථාස්ථානයෙහි තබන්නාහට දුකුළා වෙයි. ආපදාසු-දුට්ඨවාළමිග අමනුෂ්‍යයන්ගෙන් උවදුරු ඇතිකල්හි; මේ ශික්ෂාපදය ඡසමුට්ඨානය; නො ගිලන්බව, අනුඤ්ඤාතකාරණභාවය, තපිනු කැමතිබව, දැල්වීමයයි අඞ්ග සතරකින් යුක්ත වේ.

ජෝති සික්ඛාපද තැටසදශ නිමි.

කාලසෘශෙද-එනම් නදියෙහි; රජගහනුවර මැදින් ගලාබස්නා මේ නදිය උණුදිය උල්පත් ප්‍රභවකොට පවත්නෙකි. මෙනදෙ මේ නදිය අපිරිසිදු පටු ඇලක කතාවය උසුලයි. නාගරමානුපෙ එකිශෙන- නුවර දොර වැසූ කල්හි; සහතු කැමැත්තෙන් බොහෝ වේලාවක් සිටි රජු විසින් "මම පිට උයනෙහි කරණලද ආරක්ෂා ඇතිව වසමි, නුවර දොර වසා ආරක්ෂාකරව්" යයි අණලද්දේ දොර වැසූහ. අසම්භිතෙන ගතෙන-තො නැසිනු; විගලිතෙන-විලවුන්වලින් යුක්තව; කිසියම් ආභරණයක් නො පැලඳ නින්දෙන් පිබිදි වනමිය යන අර්ථයි. ඔරෙනද්ධමාසං නහායෙය්‍ය-පළමු නෑ දිනපටන් අඩමසක් නො පිරිපුන් කල නහන්නේනම්; ඌණකො වා ඔනාතිකාස වා-සුන්නෙන් හෝ මැටියෙන් හෝ; ඇඟගෑම පිණිස සුණු මැටි පිළියෙළකිරීමෙහි පටන් සියලු ප්‍රයෝගයන්හි දුකුළා වේ. සරජවාතෙන ඔකිණ්ණා-රජස් සහිත වාත යෙන් ගැවැසුනෝ; වෙතිණි වා උදකඵුසිතානි- දෙතුන් ජලබින්දු කෙනෙක්; කායං තෙමෙන්ති නහායති-නදියෙහි පරතීරයට යන්නේ නායි; නදිය පියලුනු කල්හි එහි කැනූ ආවාටයන්හි නෑත්ට වටී; ආපදාසු-(බමරුන් ලුහුබැඳීම් ආදි) ආපදා ඇතිකල්හි, දියෙහි කිමිදින්ට වටී. මෙය එළකලොම සමුට්ඨානයි. මධ්‍යදේශය වීම; උනු අඩමසින් නෑම; සමය නොමිශෙෂ දියෙන් එතරවීම ආපදාව යන මොවුන්ගේ අභාවයයි අඞ්ග තුණකින් යුක්ත වේ.

නහාන සික්ඛාපද ශාමපදය නිමි.

---

නවං පන භික්ඛුනා චීවරලාභෙන-('නවං චීවරං ලාභෙන'යි කිය යුතු තැන අනුස්වාරලෝපය කොට 'නවං චීවරලාභෙන'යි කියනලදී.) හඳනාට පොරෝනාට අලුත් සිවුරු ලත් මහණහු විසින්; නවචීවර නම් කප්බින්දු නො එබූයේයි. 'පන' යනු මෙහි නිපාතමාත්‍රයි; චීවර යන් නෙන් හැඳීමට පෙරවීමට සුදුසු සිවුරම ගත යුතුයි. කංසනීලං වා-ලොහොමල හෝ; 'පියවිනිල' යයිද කියත්. සම්කරුවෝ දියෙහි ඒයම්බලද, අයමලද බහා තැනූ සායමින් සම් කළුපැහැය කෙරෙති. ඒ සම්කරුතෙල හෝ පලාසනීලං- කිසියම් පත්තිලකි; දුබ්බණ්ණ කරණං-නපුරු පැහැයකිරීම; ආදාතබ්බං-ගතයුතුයි. මෙය කප්බිඳු එබීම සඳහා කියනලදී. නීලාදි පැහැයකින් සියලු සිවුර දුර්වර්ණකිරීමක් සඳහා නොවේ. කප්බිඳු තබන්නහු විසින් සිවුර මනාව රඳවා සිවුකොණෙහි ම හෝ තුන්කොණක දෙකොණක එක්කොණක මයුර අක්ෂියෙහි තාරකාමණ්ඩලය පමණ හෝ මකුණුපිටක් පමණවූ දුර්වර්ණ කරණය තබයුතුයි. මණ්ඩලාකාරයෙන් සිටීම වටී. අනාදානෙ-මැඩිලි ලීමෙහි; කපපකතය හා එක්කොට අකපපකතය ගෙත්තම්කල කල්හි නැවත කප්බිඳු එබීම් කිසක් නැත. මෙය එළකලොම සමුට්ඨානයි. නියමිත පරිදි සිවුරෙහි නො කළ කප්බිඳු ඇතිබව, නො නට සිවුරු ඇතිබව, නිවාසන පාරුපන අතුරෙන් ගමක්බව යයි අඞ්ග තුණකින් යුක්තයි.

දුබ්බණ්ණකරණ සික්ඛාපද ශාමපදය නිමි.

අපච්චුද්ධාරකං-චීවර ප්‍රතිග්‍රාහකයා විසින් නො පසුදුන්; මා සතුවූ මෙය පරිභෝගකරව නැතහොත් විසිදුවයි යනාදි වශයෙන් නො පසුදුරුවා; තස්ස වා අදින්නං-(පරිභෝග කරම්, අන්‍යම හෝ දෙව නැතහොත් සුදුස්සක් කරවයි කියා) සිවුරු හිමියාට නො දෙනලද්ද; තස්ස වා අවිස්සසන්තො-(යමෙක් විසින් විනයකර්ම සඞ්ඛ්‍යාත ප්‍රතිග්‍රහණය කරණලද්ද) ඔහු අවිස්වාස කරන්නේ; ඔහු විසින් දෙනලද්ද ඔහුගේ විස්වාසින් හෝ අවිස්වාසින් හෝ පරිභෝග කරන්නාහුම අනාපත්තිවේ. මෙහි කායවාචා, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. තමන් විකප්පනයකරණ ලද්දහුගේ අපච්චුද්ධාරය, විකප්පනූපග සිවුරත්බවය, පරිභෝගකිරීමයයි අඞ්ග තුනකින් යුක්ත වේ.

විකප්පන සික්ඛාපදය නැවෙනදය නිමි.

---

අපනිධෙන්තස්ස-පසෙකොට (සඟවා) තබන්නේ; හසාපෙක්ඛො පි-කෙළි කැමැත්තේ; මෙහි 'අපි' ශබ්දයෙන් ක්‍රොධ වශයෙන් කරදරකරණු කැමැත්ත ද, නින්දා උපදවනු කැමැත්ත ද සඞ්ග්‍රහයට යේ. අඤ්ඤං පරික්ඛාරං-(පසුම්බි හෝ පෙට්ටිත) පත්තත්ථවිකාදි අන් පිරිකරක්; ධම්මං කථං කථෙන්තො-(මහණුන් විසින් නම් නො නැවු පිරිකර ඇත්ත වූත් මත්ව සුදුසුයයි) මෙසේ දහම්කථා කියා; මෙය තිසමුට්ඨානය; උපසම්පන් මහණුන් සතු පාත්‍රාදින් අතුරෙන් යමක් සඟවා තැබීමය, වෙහෙස කරණු කැමැත්ත හෝ හාස්‍යාපෙක්ෂායයි අඞ්ග දෙකකින් යුක්ත වේ.

චීවරාපනිධාන සික්ඛාපදය නෑමපදය නිමි.

---

ඉයසාමෙසා-(උපුං යරං අසාත් බ්‍රාපති) දූහුසිප් ඇදුරු; ජීවිතා වොරොපිතා-දිවියෙන් තොරකරණ ලද්දේ; වොරොපෙය්‍ය-වෙන් කරන්නේය; මෙය ව්‍යවහාර වශයෙනි; ඔවුන්ගෙන් මිදුනු රජ හිසක් මෙන් දිවියෙන් වෙන්වූ ප්‍රාණියෙක් නම් කොහිත් ලැබේද? පාණො-තිරිසන්ගත සත්වයෙක්; ප්‍රාණීහුගේ බුද්ධතමගතකතාවය මරන්නාහුට සිදුවන ඇවත වෙනස්කිරීමට සමර්ථනොවෙයි. හස්ති අශ්වාදි මහත් සතුන් කෙරෙහි උපක්‍රම මහත් බැවින් අකුසලය මහත්වන්නේය. පාණෙ පාණසඤ්ඤී-ප්‍රාණීන් කෙරෙහි ප්‍රාණීහුය යන හැඟීම් ඇත්තේ; යටත්පිරිසෙයින් ඇද පුටු පිරිසිදු කරන්නේ මත්කුණබීජය කෙරෙහි තමුත් පණ ඇත යන හැඟීම ඇතිව කරුණාරහිත බැවින් එය බිඳිමින් වෑවහල ද ඒ මකුණකට මේ පචිත්තිය සිදුවේ. එබැවින් මෙබඳු තැන් වලදී ද කරුණු සිත උපදවා අප්‍රමාදවූවනු විසින් වත් සම්පූර්ණ කළයුතුයි. සමුට්ඨානාදිය මනුස්සවිග්ගහ සිකපදෙහි මෙනි.

සඤ්චිච්චපාණ සික්ඛාපදය නෑමපදය නිමි.

සප්පාණකං- යම් ප්‍රාණීකෙනෙක් පරිභෝගයෙන් මියෙද්ද ඔවුන් කරණකොටගෙණ සප්‍රාණිකවූ ජලය; එබඳු දිය පරිභොගකරන්නහුට පියෝ ගණනින් පචිති වේ. පයක් පුරාලන තරම් ජලය නමුදු එක් පහරින් පානය කරන්නහුට එකම ඇවතක් සිදුවේ. එම දියෙන් සාම්පාත්‍රය සෝදන්නහුට ද, හුණු හුළුකැන්බඳුන් සිතිල්ගන්වන්නහුට ද, එසේම ඉසගෙණ නාන්නහුට ද, පියොවක් පාසා පචිති වේ මේ ශික්ෂාපදය තිසමුට්ඨානය, අඞ්ග සිඤ්චන සිකපදයෙහි මෙනි.

සප්පාණක සික්ඛාපද ගැටපදය නිමි.

---

යථාධම්මං-ධර්මවූ පරිද්දෙන්; පුන කම්මාය-නැවත කිරීම පිණිස; උක්කොටෙය්‍ය ඉති-උගුළුවත්; නිහතාධිකරණං-(නිහතං අධිකරණං) සන්හිඳුවනලද අධිකරණය; උක්කොටෙන්ති-(ඒ ඒ භික්ෂූන් ලඟට පැමිණ 'අකතං කම්මං' යනාදිය කියමින්) අවුල්කරත්. පළමු තැබූ පරිදි තිබෙන්ට නොදෙත්. ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී-(යම් කර්මයකින් ඒ අධිකරණය සංහිඳුවනලදද එය ධර්මකර්ම නම්.) ඒ ධර්මකර්මය ධර්මකර්මයයි යන හැඟීම ඇත්තේ; මේ ශික්ෂාපදය තිසමුට්ඨානය, ධර්මවූ පරිදි නියතබව, දැනගැණීම, උක්කොටනයයි අඞ්ග තුණකින් යුක්තවේ.

උක්කොටන සික්ඛාපද ගැටපදය නිමි.

---

දුට්ඨුල්ලා නාම ආපත්ති-අදුහුඩාර වශයෙන් සතරපරිජි දුට්ඨුල්ල නම් ඇවැත් වෙත්. එසෙයත් මෙහිදී සඞ්ඝාදිසෙසාපත්තිය අදහස්කරණ ලදී. එය ඡාදනය (=සැඟවීම) කරණ භික්ෂුහට පචිති ඇවැත සිදුවේ. ධුරං නික්ඛිත්තමත්තෙ-'ධුරනික්ෂෙපයකළ මාත්‍රයෙහි; ආරොචනය කරමි' යන අදහස අත්හළ කල්හි යයි සේයි. ධුරනික්ෂෙපයෙන් පසු ආරොචනයකළ ද පචිතියෙන් නොමිදේ. ධුරනික්ෂෙපය නොට අනෙකක්හට සඟවනු පිණිස යයි ආරොචනය කෙරෙයි. හෙතෙමේ ද අනෙකක්හට එසේම කියයි. මෙම ක්‍රමයෙන් කෙළවර නොවිනාමි සියගණන් භික්ෂූන්ට ම ඇවැත් සිදුවේ. යම්හෙයකින් තුන්වැනිම ඇසුයේ නැවති ඇබින් අවත් විතිය නැතැත්තහුටම කීකල්හි කෙළවර වූයේ නම් වෙයි. අදුට්ඨුල්ලං ආපත්තිං-(පාරාජික සඞ්ඝාදිසෙස යන ආපත්තිසක්ඛන්ධය හැර) සෙසු පඤ්චාපත්තිසක්ඛන්ධය අදුට්ඨුල්ල ආපත්ති නම්. අනුපසම්පන්නස්ස දුට්ඨුල්ලං වා අදුට්ඨුල්ලං වා අජ්ඣාචාරං-අනුපසම්පන්නයාගේ සුක්කවිමොචනය හා කායසංසග්ගය සමග පාණාතිපාතාදි පස දුට්ඨුල්ල අජ්ඣාචාර නම්. විකාලභොජනාදිය අදුට්ඨුල්ල අජ්ඣාචාර නම්. මෙය දුට්ඨුල්ලාරොචන සිකපද හා සමනොවෙයි. එහි අනුපසම්පන්නයාහට මුල පටන් සිකපද පස දුට්ඨුල්ල නමැයි ද සෙසු සිකපද අදුට්ඨුල්ල නමැයි ද ගෙන්. මෙය කාය, වාචා, චිත්තවශයෙන් සමුට්ඨානය වේ. උපසම්පන්නයාහට දුට්ඨුල්ලාපත්ති ජානනය, සඟවනු කැමැත්තෙන් සැලනොකරන්නෙමියි ධුරනික්ෂෙපයයි සෙද අඟකින් යුක්ත වේ.

දුට්ඨුල්ල සික්ඛාපද ගැටපදය නිමි.

ලෙඛං-ලිවීම; අඞ්ගුලියො දුක්ඛා භවිස්සන්ති- අකුරු ලියන්නහුගේ අඞ්ගුලීහු කරදරයට පැමිණෙන්නේයයි සිතූහ. උරස්ස දුක්ඛා- හෘදයට දුක්වේයි. ගණනයෙහි හික්මෙන්නාහු විසින් බොහෝ දෙය සිතියයුතු වෙයි. එහෙයින් ඔහුගේ හෘදයට පීඩා ඇතිවන්නේයයි සිතූහ. අක්ඛීනි දුක්ඛා භවිස්සන්ති-ඇස් කරදරවෙති. රන්කරුසිප්හි හික්මෙන්නහු විසින් කහවණු පෙරළ පෙරළා බැලියයුතු වන්නේය, එයින් ඔහුගේ ඇස්වලට පීඩාවන්නේයයි සිතූහ. දුක්ඛිතානං- දුකින් ඉවසියයුතුවූ; තිබ්බානං- තොල්වූ; ඛරානං- තියුණුවූ; කටුකානං- පරුෂවූ; අමනාප බැවින් සාප්‍රකරයය වැසිවූ; අසාතානං- අමධුරවූ; පාණහරානං- දිවිහැරගන්නාවූ; සීමං සම්භින්දන්ති- අලුත් සීමාවක් සම්මතනොකෙරෙති. පරිපුණ්ණවීසතිවස්සො- පිළිසඳගැන්මේසි පටන් පිරිපුන් විසිවස් ඇත්තේ; මවුගැබෙහි විසූ කාලයද එකතුකොට විසිවස් සම්පූර්ණකරගතහැකි වෙයි; මහාවිහාරිකා භික්ෂූහු මෙසේ ගැබෙන් සත්මසක් එකතුකරගැනීම දැනසූහ. එක් වසකට චාතුද්දසී පොහොය සයක් වේ. එකල විසිවසකට චාතුද්දසී එකසිය විස්සක් වෙයි. එහෙයින් විසිවසකට දිනගණනින් දින එක්සිය විස්සක් හෝ සිවුමසක් උනුවිය යුතුය. දැනැම් රජුන් විසින් තෙවසකට එක්මසක් අධික වශයෙන් ගතයුතුයයි වස්සුක්කඩ්ඩන යිසණුන්ට දක්වනලදි. එබැවින් විසිවසකට වස්සුක්කඩ්ඩන හෙතුවෙන් සමසක් අධිකව ලැබේ. මෙයින් චාතුද්දසිය සිසා ඌනවූ පැවති සිවුමස සම්පූර්ණ කරගතහැකිවෙයි. ඉතිරිවන මාසයද උපසපන්වීමේදී විසිවස් සම්පූර්ණකරලීම පිණිස යොදාගතහැකි වෙයි. එකූනවීසති වස්සං- එකුන් විසිවස් ඇත්තහු; මහාපවාරණයේදී ගැබින්ගත් කාලය සමග විසිවස් ඇත්තේ ගිහිවී මෙන් එකුන්විසිවස් ඇත්තෙකි. අනුපසම්පන්නො ඌනවීසති වස්සං පරිපුණ්ණසඤ්ඤී- පිරිපුන් විසිවස් ඇත්තෙක යන හැඟීම ඇති උපාධ්‍යාය තෙමේ උනු විසිවස් ඇති කෙරණහු උපසපත් කෙරේද, උන්වහන්සේට අනාපත්ති වේ. එහෙත් උපසපත් බැව් ලැබූ තැනැත්තේ අනුපසම්පන්නයෙක්ම ය. නියමිත වශයෙන් දැනගත් කල්හි නැවත උපසපත් කරවියයුතුයි. නො දැන විසූකාලය ඔහුට සඟමෙංකඩනාරාය පිණිස නො පවත්නේය. මේ ශික්ෂාපදය තිසමුට්ඨානයය, උනු විසිවස් ඇතිබව, ඌනයය යන හැඟීම් ඇතිබව, උපසපත්කිරීමයයි අඞ්ග තුණකින් යුක්ත වේ.

ඌනවීසතිවස්ස ශික්ෂාපද හැමසඳෙස නිමි.

---

පටියාලොකං-පැසුළුදිග; සුඞ්කං-සුංවක්; පරිහරිස්සාම- වළහා යන්නෙමු; කම්මිකා-සුංවක් අයකැමියෝ; පරියුට්ඨිංසු-රැකවල් කලාහුය; ථෙය්‍යසත්ථෙන-සොර වෙළඳුම් හැල්සාත්තුව හා; පලිබුද්ධිත්වා-දෙස් පවරා; රඤ්ඤො වා ථෙය්‍යං ගච්ඡන්ති-රජහු රවටා තීරුවක් නොගෙන නැවත නො දෙමුයි යත්; විසඞ්කෙතෙන- කාලවශයෙන් හෝ දවස් වශයෙන් සංකේත වරද්දගැනීමෙන්; මෙසේ යන්නාහුට අනාපත්තිවේ.

එහෙත් මග අටවී සමෙහත මර්දදනැගැණීමෙන් යන්හනුට ඇවැත් සිදුවේ. කායවිඤ්ඤත, කායවාචිත්ත වශයෙන් මෙය සමුට්ඨානක වේ. ථෙය්‍ය සත්ථබව, ඒ දැනගැණීම, සමාම බැණගෙණයාම, අවිසංකෙතයෙන් ගමන්කිරීම යයි අඞ්ග සතරකින් යුක්ත වේ.

**ථෙය්‍යසත්ථ සික්ඛාපද ගැටපදය නිමි.**

---

සබ්බඤ්ඤුතඤ්ඤාණා-තමහට ම නිඥකරගණිමින්; න අඤ්ඤත සො ගිහනු මං නිප්පාතෙසි-ආය්‍යීයෙණි, මේ මහණතෙමේ මා ගෙණ නො ගියේය.

**සංවිධාන සික්ඛාපද ගැටපදය නිමි.**

---

ගද්ධබාධි පුබ්බස්ස- පෙර ගිජුලිහිණියන් මැරූ කුලෙහි උපන්නහුට; අන්තරායිකා- සගමොක් දෙකට බාධාකරණ ධර්මයෝ; ඔවුහු කම්ම, කිලෙස, විපාක, උපවාද, ආණාවීතික්කම වශයෙන් පස්වැදෑරුම් වෙත්. කම්ම නම්:-පඤ්චානන්තය්‍යීකර්මය හා භික්ෂුණීදූෂක කර්මයයි. එයින් භික්ෂුණීදූෂක කර්මය මොක්ෂාන්තරාය ම කෙරෙයි. ස්වර්ගාන්තරාය නො කෙරේ. කිලෙස නම්;- නියත මිථ්‍යාදෘෂ්ටි කර්මයෝයි; විපාක නම් - අහෙතුක ප්‍රත්‍යයෙන් උපන් පණ්ඩක උභතොව්‍යඤ්ජනක ජාත්‍යන්ධ ජාතිබධිර තිරශ්චීනගත යන මොහුයි. උපවාද නම්:- ආර්‍ය්‍යොපවාදයයි. පඤ්ඤත්තිවීතික්කම නම්:-බුදුන් විසින් පණවනලද සප්තාපත්ති ස්කන්ධ ව්‍යතික්‍රමයයි. මේ භික්ෂුතෙමේ බහුශ්‍රුතයෙකි, එසේ ම ධර්මකථිකයෙකි. සෙසු අන්තරායයන් දනී. විනයෙහි අකොවිද හෙයින් පඤ්ඤත්තිවීතික්කම අන්තරාය නො දනී. යෙ ඉමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා-භාග්‍යවතුන් වහන්සේ විසින් යම් යම් අන්තරායකර ධර්මකෙනෙක් කියනලදහු ද; තෙ පටිසෙවතො-ඒ අන්තරායකර ධර්මයන් සෙවුනාහට; නාලං අන්තරායාය-අනතරායට සුදුස්සෝ නො වෙතියි. හෙතෙමේ රහසිගතවූයේ මෙසේ සිතීය. පඤ්චකාමගුණයන් පරිභොගකරන්නාවූ සෝවාන් වූ සකෘදාගාමිවූ අනාගාමිවූ අගාරිකයෝ වෙති. එහෙයින් භික්ෂූන් ද මනාපිකවූ රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බයන් අනුභව කිරීමට සුදුස්සෝ වෙති. කුමක් හෙයින් ස්ත්‍රීන් පිළිබඳ රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බයන් විඳීමට නුසුදුස්සෝ වෙත් ද; මෙසේ අනවද්‍යවූ ප්‍රත්‍යය පරිභොගරසය හා සාවද්‍යවූ කාම ගුණ පරිභොගරසය සමඟ සච්ඡන්දපරිභොගය ද නිච්ඡන්දපරිභොගය ද එකක් කොට සලකා, මහමෙරට අබැටක් සමානකොට පෙන්වන්නාක්මෙන් ලාමක දෘෂ්ටීන් උපදවා, මෙවුන්දම් සෙවීමෙහි දෙසක් නැතැයි ජිනචක්‍රයට පහරගැසීය. අට්ඨිකඞ්කලූපමා-(කාමූපසෙවනය බඩසයින් පෙළෙන සුනඛයෙකුට ලැබුණු) ඇටකටුවක් උපමාකොට ඇත්තේය. මංසපෙසූපමා-(ආය්‍යීශ්‍රාවකයෝ කාමූපසෙවනය ගිජුලිහිණියෙකුට ලැබුණු) මස් පිඬක් මෙන් සලකති. තිණුක්කූපමා-(ආය්‍යීයෝ කාමූපසෙවනය ප්‍රතිවාතයෙහි ගමන්කරන්නෙකු අතෙහිවූ) ගිනි

හුලක් වැනියයි සලකත්. අඞ්ගාරකාසූපමා-(ආයතීයෙහි කාමූපසෙවනය) දිලියෙන ගිනිඅඟුරු වළකට හෙලුවෙකු වැනියැයි සලකත්. සුපිනකූපමා-(ආයතීයෙහි කාමූපසෙවනය) නින්දෙහි දුටු සිහිනයක් වැනියයි සලකත්. යාචිතකූපමා-(කාමූපසේවනය) පිරුළෙන් ගත් අබරණ වැනියයි සලකත්. රුක්ඛඵලූපමා-මිහිරි ඵලයන්ගෙන් යුත් රූකක්වැනියයි සලකත්. අසිසූනූපමා-ගෙරිමස් කොටන කැත්තක් හා කොළොම්බු සාබක් වැනියයි සලකත්. සත්තිසූලූපමා-විනිවිදගන අර්ථයෙන් තියුණු අඩයටිහුලක් වැන්නයි සලකත්. සප්පසිරූපමා-(බිය ගෙණදෙන අර්ථයෙන්) සර්හිසක් වැන්නැයි සලකත්. අග්ගික්ඛන්ධූපමා-(දුක් උපදවන අර්ථයෙන්) ගිනිසිලක් වැන්නැයි සලකත්. ථාමසා-දිට්ඨිථාමයෙන්; පරාමාසා-දිට්ඨිසඞ්ඛ්‍යාතවූ දැඩිගැත්මෙන් ගෙණ; අභිනිවිස්ස-මෙහි මෙයම සත්‍යයයි බැසගෙණ; වොහරති-දක්වයි. එවං ව්‍යාඛො-මෙසේ මෙන් වනාහි; මෙහි 'ව්‍යා' යනු 'විය' යන අර්ථයෙහි පවත්නා නිපාතයකි. තමන්ගේ ලබ්ධිය සඟවනු කැමැත්තෙන් නැතැයි කියනු කැමැතිවූයේ ද බුදුන්ගේ ආනුභාවයෙන් පිළිගණියි. බුදුන් ඉදිරියෙහි දෙපරිදි කථාවක් කරන්ට සමර්ථයෙක් නැත. යතො ඛො තෙ භික්ඛූ-යම් කලෙක්හි ඒ භික්ෂූහු; කස්ස ඛො නාම ත්වං මොඝපුරිස-තුච්ඡපුරුෂය තුඹ ක්ෂත්‍රියාදී කවර නම් කෙනෙකුට වනාහි; යථා යෙමෙ-මෙහි 'යථා' යනු 'අනතුරුයට යම්සේ සමර්ථ නොවේද යන අර්ථයෙහි ය. අසමනුභාසියමානස්ස-සමනුභාෂණකර්මය නො කරණ ලද්දහුට; ආදිකම්මිකස්ස අනාපත්ති-ආදිකම්මිකයාහට අනාපත්තිවේ. එහෙත් අරිට්ඨ භික්ෂුහට සමනුභාෂණකර්මය කොට උත්ක්ෂෙපණීයකර්මය කල හෙයින් මේ සිඛයෙහි ආදිකම්මිකයාහට ද ආපත්තිවෙයි. එහෙයින් 'අනාපත්ති' යනු නො යෙදෙයි. වජිරබුද්ධියෙහි:- 'පාලියං ආදිකම්මිකස්ස අනාපත්තීති මූලාරුළ්හවසෙන වුත්තන්ති වෙදිතබ්බං' යි කීහ. මෙහි 'මූලාරුළ්හං' යනු බුදුරදුන් සඳහා කියන ලද්දකැයි නො ගතයුතුයි; කාය, වාචා, චිත්ත වශයෙන් මෙහි සමුට්ඨානය සිදුවේ. ධම්මකම්මභාවය, සමනුභාසනය, අප්පටිනිස්සජ්ජන යයි අඞ්ග තුණකින් යුක්ත වේ.

අරිට්ඨ සික්ඛාපදය හැටඅටදෙන නිමි.

---

තථාවාදිනා-එසේම කියනයුලු; අකටානුධම්මෙන-ඔසාරණය නො කළ භික්ෂූන් සමග; උක්ඛිත්ත භික්ෂුව වෙත භික්ෂූන්ට අනුකූලවූ පැවතුම් දක්ක සඞ්ඝයා විසින් කරණලබන කර්මය ඔසාරණ නමි. දෙති වා පටිග්ගණ්හාති වා-දේද පිළිගණීද; එකම ප්‍රයොගයෙන් බොහොමයක් දෙන්නහුට හෝ පිළිගන්නහුට එකම පචිත්තියකි. කඩ කඩ කොට දෙන්නහුට හෝ ගන්නහුට පයෝගගණනින් පචිති වේ. මෙය තිසමුට්ඨානය. අකතානුධම්ම භාවය, දූනගැණීමය, සම්භොගාදි කරණයයි අඞ්ග තුණකින් යුක්ත වේ.

උක්ඛිත්තසම්භොග සික්ඛාපදය හැටනවදෙන නිමි.

දිට්ඨිගතං උප්පන්නං-ලාමක දෘෂ්ටිගතයක් උපනි; අරිට්ඨභික්ෂුහට මෙන් තුනුරුවනෙහි ගැලෙන්නාවූ මොහුට ද මේ දෘෂ්ටිය උපන්නේය; අමාමක-මාගේයයි මමත්වයක් නැත්තව; නාසේතු-නසාවා; නාසනා තුනකි. සංවාසනාසනා, ලිඞ්ගනාසනා, දණ්ඩකම්මනාසනා යන මොහුයි. උත්ක්ෂේපණීය කර්මය කිරීම සංවාසනාසනා නම් වේ. භික්ෂුණී දූෂකයා නැසිය යුත්තේය. මෛත්‍රීයා නම් මෙහෙණ නසවයි යන මෙය ලිඞ්ගනාසනා නම්. ඇවැත් වූ සමණුද්දේසය තා විසින් අද පටන් කොට භාග්‍යවත් වූ ශාස්තෘතෙම මාගේ ශාස්තෘයයි නොම කියයුත්තේය යනු දණ්ඩකම්මනාසනා නම් වේ උපලාපෙය්‍ය- තලවත්තේය; උපට්ඨාපෙය්‍ය-ඔහු ලවා තමන්ට උපස්ථාන කරවාගන්නේද; සමුට්ඨානාදිය අරිට්ඨසික්ඛාපදයෙහි මෙනි.

කණ්ටක සික්ඛාපද ගැටපදය නිමි.

---

එතස්මිං සික්ඛාපදෙ-තොප කියනලද මේ ශික්ෂාපදයෙහි; යමක් කියනලදද එය, විනයධර වූ ව්‍යක්තවූ අන් භික්ෂුවකගෙන් යම්තාක් නො විචාරන්නෙම් ද එතාක් හික්මීම් වශයෙන් භාර නොගන්නෙම් යන අර්ථයි. ආපත්ති පාචිත්තියස්ස- (අනාදරයෙහි භයඇතිව ලෙශයෙන් 'යාව න අඤ්ඤං භික්ඛුං' යනාදිය කියන්නාහට වචනයක්පාසා) පචිති ඇවැත් වේ. සික්ඛමානෙන භික්ඛවෙ භික්ඛුනා- අවවාදය සිසින් පිළිගෙණ හික්මෙනු කැමති භික්ෂුව විසින්, වස්තුනිදාන පුග්ගලාදියද පරිපුච්ඡාදිය ද කටයුතුයි. තුලයිතබ්බං-(අර්ථපරීක්ෂාකිරීම් වශයෙන් සූත්‍රය, සූත්‍රානුලෝමය, ථෙරවාදය, අත්තනොමතිය යන මේ සතරපදයෙහි ලා) සමකටයුත්තේයි. මේ ශික්ෂාපදය තිසමුට්ඨානය. උපසම්පන්නහට පඤ්ඤත්ත වශයෙන් කථනයකිරීම, නො හික්මෙනු කැමැත්තෙන් කීමයයි අඞ්ග දෙකකින් යුක්ත වේ.

සහධම්මික සික්ඛාපද ගැටපදය නිමි.

---

විනයකථං කථෙති- කප්පියාකප්පිය ආපත්ත්‍යනාපත්ති සංවර පහාණ යන මොවුන් පිළිබඳ වූ කථාවන් කෙරෙයි. විනයස්ස වණ්ණං භාසති-පස්වැදෑරුම්වූ ද සත්වැදෑරුම්වූ ද ආපත්තිස්කන්ධයන්ගේ වශයෙන් මාතිකා තබා පදභාජන වශයෙන් වර්ණනාව කෙරෙයි. විනයපරියත්තියා වණ්ණං භාසති-විනය හදාරන්නවුන්ට විනයපර්‍යාප්තිමූලකවූ වර්ණනාව කෙරෙයි. විනයධර පුද්ගලයා කෙරෙහි අනුසස් සයකි. තමන්ගේ ශීලස්කන්ධය සුගුප්ත හා සුරක්ෂිත වේ. කුකුස් උපදවන්නවුන්ට පිළිසරණ වේ. සඟමැද විශාරදයෙක් වෙයි. සතුරන් විසින් කරුණු සහිතව ගන්නාලද්දම ද නිග්‍රහකෙරෙයි. සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස පිළිපන්නෙක් වෙයි යන මොහුයි. ආදිස්ස ආදිස්ස නැවත නැවත කියවයකොට, වෙන් වෙන් කොට; ආයස්මතො උපාලිස්ස වණ්ණං භාසති-විනයපර්‍යාප්තිය නිසා ආයුෂ්මත් වූ උපාලිතෙරුන්ගේ ගුණය ප්‍රකාශකෙරෙයි. කුමක්හෙයින්ද, මාගේ ගුණවැසීම අසා භික්ෂූහු

"අපි උපාලි තෙරුන් ලඟ විනය උගණිමු"යි හඟින්නාහුය. එසේ ඇති කල්හි මේ ශාසනය චිරස්ථායි වන්නේය. සන්දහසක් අවුරුදු පවතින්නේය. බහූ භික්ඛූ - එහි බොහෝ භික්ෂූහු; බුදුරදුන්ගේ මේ වර්ණනය බොහෝ භික්ෂූහු අසා මේ අනුසස සූත්‍රාන්තිකයෝ ද ආභිධම්මිකයෝද නො ලබත්යයි සලකා ඒ උසස් අනුසස් ලබනු කැමති වූ ථෙර මජ්ඣිම නවක යන බොහෝ භික්ෂූහු උපාලි තෙරුන් ලඟ විනය හදරති. මෙහි 'ඉධ' යනු නිපාතමාත්‍රයකි. උද්දිස්සමානෙ - ආචාර්යයන් විසින් අන්තෙවාසිකයාට උදෙසනු ලබන කල්හි; ඛුද්දානුඛුද්දකෙහි - ඛුද්දානුඛුද්දක ශික්ෂාපදයන්ගෙන්; ඛුද්ද නම් ථුල්ලච්චයයි. අනුඛුද්ද නම් පාචිත්තියයි. මෙමැ නියායෙන් පඤ්චලහුකාපත්තීහු ඔවුනොවුන් හා ඛුද්දානුඛුද්දක නම් වෙත්. යාවදෙව - ඒ ඛුද්දානුඛුද්දක ශික්ෂාපදයන්ගේ සීම පිරිසිඳීම නොවේ; නැතහොත් 'යාවදෙව' යනු නිපාතයයි. අතිශයින් නිශ්චයකිරීමෙහි හෝ වැටේ. කුක්කුච්චාය - කුකුසට; විහෙසාය - වෙහෙසට; විලෙඛාය - සිත් නො සිලුටු කිරීමට; සංවත්තන්ති - වැටෙත්; උපසම්පන්නස්ස විනයං විවණ්ණෙති - උපසපනෙකු ලඟ ඔහුට එහි විමති උපදවනු කැමැත්තේ විනය ධර්මයට ගර්හාකෙරෙයි. ඉඞ්ඝ - එබැවින්; සුත්තන්තං වා - සූත්‍රාන්තයක් හෝ; ගාථායො වා - ගාථාවක් හෝ; අභිධම්මං වා - අභිධර්මය හෝ; තාව පරියාපුණස්සු - පළමුකොට හදරව; පච්ඡා - පසුව; විනයං පරියාපුණිස්සසි - විනය හදරව; සෙසය කියනලද්ද වැනිය. ගරහන්ට කැමතිබව හා උපසපනෙකු ලඟ සිකපදයන්ට නින්දාකිරීමදැයි දෙ අඟකින් යුක්ත වේ.

විලෙඛන සික්ඛාපද තෑවපදය නිමි.

---

අන්වද්ධමාසං - පිළිවෙළින් අඩමසෙක්හි අඩමසෙක්හි; යම්හෙයකින් එය පොහෝදිනයෙහි ම උදෙසනු ලැබේද, එහෙයින් 'අනුපොසථිකං'යි පදභාජනයෙහි කියනලදී. උද්දිස්සමානෙ - පාතිමොක්ඛුද්දෙසක යන් උදෙසන කල්හි; යං අනාචාරං ආචරිත්වා - යම් ව්‍යතික්‍රමයක් කොට; යං ච තත්ථ ආපත්තිං ආපන්නො - ඒ පුරුදුවූ අනාචාරයෙහිදී යම් ඇවතකට පැමිණියේද; යථාධම්මො කාරෙතබ්බො - බුද්ධවචන සංඛ්‍යාත ධර්මය වූ පරිදි ද, චොදනා සාරණා සංඛ්‍යාත විනයවූ පරිදිද කටයුතුයි. නුනුවණින් පිළිපන් හෙයින් ඔහුට ඒ ඇවතින් මිදීමක් නැත. ඉදින් දෙශනාගාමී ඇවතකට පැමිණියේ නම් දෙශනාකරවිය යුතුයි. ඉදින් උට්ඨානගාමී ඇවතකට පැමිණියේ නම් එයින් නැඟී සිටවිය යුතුයි. ආරොපෙතබ්බො මොහො - මෝහය ආරෝපණයකළ කල්හි; මොහෙති - නැවත නැවත භික්ෂූන් මුළාකෙරේද; අනාරොපිතෙ මොහෙ - මෝහාරෝපණය නො කළ කල්හි; අට්ඨිකත්වා - ප්‍රයෝජන ඇත්තෙක් කොට; ධම්මකම්මෙ - මෝහාරෝපණ කර්මයෙහි; විත්ථාරෙන න සුතං හොති - විස්තර වශයෙන් ප්‍රාතිමෝක්ෂය නො අසනලද්ද; ඌනකද්වත්තික්ඛත්තුං වා විත්ථාරෙන සුතං - උනුවූ දෙතුන්වරෙකැ විස්තර විසින් අසනලද්ද; මෙහි උනුවූ දෙතුන්වරෙකැ විස්තරයෙන්

ඇසීම නම් දෙවරෙක විස්තරයෙන් නො අසා තුන්වැනිවර නිමවා ඇසීමයි. මෙසේ අසනලද්දහුට අනාපත්ති වේ. න මොහෙතුකාමස්ස-භික්ෂූන් මුළාකරණු නො කැමැත්තාහට මෙය තිසමුට්ඨානය; මොහාරොපණය, භික්ෂූන් මුළාකරණු කැමැතිබව, කියනලද ක්‍රමයෙන් අසනලදබව, මොහනයයි අඞ්ග සතරකින් යුක්ත වේ.

මොහන සික්ඛාපද ගැටපදය නිමි.

---

පහාරං දෙන්ති-('ඇවැත්නි, අසුන් පණවනු, පා දොනා පැන් තබනු' යනාදිය කියා නො කරන්නහුට) පහරදෙත්; පහාරං දෙති ආපත්ති පාචිත්තියස්ස-යමෙක් පහරදේද, ඒ මහණහට පචිති ඇවැත් සිද්ධවේ. යසනු කැමැති සිතින් පහරදුන් කල්හි ඔහු එයින් මළේ නමුදු පචිතියම සිද්ධවෙයි. පහරින් අත හෝ පය හෝ බිඳේද හිස හෝ පැලේ ද පචිතියමැයි. විරූපකිරීම් අදහසින් කණ හෝ නැහැය හෝ කපාද ඒ මහණහට දුකුළා ඇවැත් වේ. අනුපසම්පන්නස්ස-ගිහි පැවිදි හැහැණු මිනිස් කාහට හෝ යටත්පිරිසෙයින් තිරිසනෙකුට හෝ (පහරදේද ඒ භික්ෂුහට දුකුළා ඇවැත් වේ.); කායසංසග්ග රාගයෙන් යුක්තව ස්ත්‍රියකට පහරදුන් කල්හි ඒ භික්ෂුහට සඞ්ඝාදිසෙසාපත්තිය වේ. කෙනචි විහෙඨියමානො-මාතුගාමාදී කිසිවෙකු විසින් වෙහෙස කරන ලද්දේ; මොක්ඛාධිප්පායො- වෛරාදීන් උපද්‍රැතව ඔවුන් කෙරෙන් ගැලවෙනු කැමැත්තේ; පහාරං දෙති-කායින් හෝ කාය පිළිබඳ වූවකින් හෝ පහරදේද; ඒ භික්ෂුහට අනාපත්ති වේ. ඉදින් අතරමගදී තමහට පහරදීමට සූදානම් වූ සොරෙකු හෝ සතුරෙකු දැක, 'උපාසකය, තවතුව' යි කීකල්හි නො නැවත එන්නහුට 'කොල, යව' යි මුගුරකින් හෝ කැතසින් හෝ පහරදී ගැලවියන්නහුට අනාපත්තියිවේ. ඉදින් ඒ පහරින් මළේද ඒ භික්ෂුහට එයින් ඇවතක් නොවේ. මෙය පඨම පාරාජික සමුට්ඨානය ය. කුපිතබව, ගැලවෙනු පිණිස නොවන බව, උපසම්පන්නකුට පහරදීම්බව යන අඞ්ග තුණකින් යුක්ත වේ.

පහාර සික්ඛාපද ගැටපදය නිමි.

---

තලසත්තිකං උග්ගිරන්ති- අත්සත් ඔසවා පාති, අත්තෙලෙන් කියකොරෙති; ඔහු පහාර සමුච්චිතා රොදන්ති-පහරනා පුරුදු වූ ඔවුනු හඬත්; පෙර පහර ලැබූ හෙයින් දුනුදු පහරදෙත්යයි හඟින්නෝ බියට පැමිණ හඬතියයි සේයි. උග්ගිරන්ති ආපත්ති පාචිත්තියස්ස-යසනු කැමැත්තෙන් අමෝරා ද පචිති ඇවැත්වේ. අමෝරා වැරද පහරදේද, නො යසනු කැමැත්ත පහරදුන් හෙයින් දුකුළාවමැයි. මොක්ඛාධිප්පායස්ස-උපද්‍රැතව එයින් මිදෙනු කැමැත්තෝ; සමුට්ඨානාදිය පෙරමෙනි; කුපිතබවය, මිදෙනුකැමැත්තාගේ නැතිබවය, උපසම්පන්නකුට තලසත්තික උග්ගිරණයයි අඞ්ග තුනෙකින් යුක්ත වේ.

තලසත්තික සික්ඛාපද ගැටපදය නිමි.

අනුද්ධංසෙස්සති - චෝදනා කෙරෙත්; ඔවුහු වනාහි තමන් දෙස දූෂිත හෙයින් මෙසේ කල ඒ භික්ෂූහු අපට චෝදනා නො කරන්නාහු යයි තමන්ගේ ආරක්ෂාව බලාපොරොත්තුවන්නෝ, පළමුකොටම භික්ෂූන්ට අමූලක වූ සඞ්ඝාදිසෙසයෙන් චෝදනා කෙරෙත්. මේ ශික්ෂාපදය තිසමුට්ඨානය; උපසම්පන්නබව, සඞ්ඝාදිසෙසයාගේ අමූලකබව, අනුද්ධංසනය, එකෙණෙහි දැනගැනීම යයි අඞ්ග සතරකින් යුක්ත වේ.

අමූලක සික්ඛාපද සැටපදශ නිමි.

---

ඌනවීසති වස්සා - උනු විසිවස් ඇත්තෝ; උපදහන්ති - උපදවත්; කුක්කුච්චං උපදහති ආපත්ති පාචිත්තියස්ස - කුකුස් උපදවයිද ඒ භික්ෂූහට වචනයක් වචනයක් පාසා පචිති ඇවැත්වේ. අනුපසම්පන්නස්ස - සෙරණකුහට; මෑසමින සමග ත්‍රිවිධරත්නයට හුන්නෙහිය, කොහු තෙහිය, කෑම්පිවි කොහොත්‍රීය යනාදි ක්‍රමයෙන් සගමැද කුකුස් උපදයි නම් ඒ මහණහට වචන ගණනින් දුකුළු ඇවැත් වේ. සමුට්ඨානාදිය පෙර මෙනි. උපසම්පන්නබව, අපගත්‍ය කැමැතිබව, කුකුස් උපදවීම යන අඞ්ග තුනකින් යුක්ත වේ.

සංචිච්ච සික්ඛාපද සැටපදශ නිමි.

---

අධිකරණජාතානං - භණ්ඩනකලහ දෙකින් වැඩුනාවූ විවාදාධිකරණයට පිළිපන් භික්ෂූන්ගේ; උපස්සුතිං - බස් ඇසෙන දුර; මන්ත තෙපුල් ඇසියහැකි තැන; 'සුණිස්සාමිති සුති, තස්ස සමීපං උපස්සුති, සුණාතීති සුති, තස්ස සමීපං උපස්සුති, මෙසේ සැලකුකල්හි බස් අසන්නහු සමීපයෙහි අන්හැනක සිටියයි අර්ථ ගතහැකිසි. එය නො ගතයුතු සේ පෙණේ. ගච්ඡති ආපත්ති දුක්කටස්ස - බස් ඇසෙන තැනට යේද ඒ මහණහට පියක්පාසා දුකුළු ඇවැත් වේ. මන්තෙන්තානං - අනිකෙකු සමග අනිකෙක් මන්ත්‍රණයකරණකල්හි; මෙය භුම්මාර්ථයෙහි උපයෝග වචනයි. වූපසමෙස්සාමි - සංසිඳීමට යන්නෙමි. කලහ නො කරන්නෙමි. අත්තානං පරිමොචෙස්සාමි - තමන්ගේ අකාරකභාව පවසා නිදහස්වන්නෙමි. මේ ශික්ෂාපදය කායචිත්ත, කායවාචාචිත්ත වශයෙන් ද්විසමුට්ඨානය වේ. උපසම්පන්නබව, චෝදනාරකත්ව ඇසී කැමැත්ත, ඇසීමයයි අඞ්ග තුණකින් යුක්ත වේ.

උපස්සුති සික්ඛාපද සැටපදශ නිමි.

---

සචෙ ච මයං ජානෙය්‍යාම - ඉදින් අපි දන්නෙමු නම්; මෙහි 'ච' යනු නිපාතමාත්‍රයි; ධම්මිකානං - ධාර්මිකවූ (චතුර්විධ) කර්මයන්ගේ; අපලොකනකම්මං - ඔසාරණ, නිස්සාරණ, භණ්ඩුකම්ම, බ්‍රහ්මදණ්ඩ, කම්මලක්ඛණ යන මොහු අපලෝකනකර්ම නම් වෙති. ඤත්තිකම්ම - ඔසාරණ, නිස්සාරණ, උපොසථ, පවාරණ, සම්මුති දානපටිග්ගහණ, පච්චුක්කඩ්ඩන, කම්මලක්ඛණ යන මොහු ඤත්තිකම්ම නම් වෙත්. ඤත්තිදුතියකම්ම -

ඔසාරණ, නිස්සාරණ, සම්මුති, දූත, උද්ධාර, දෙසනා, කම්මලක්ඛණ යන මොහු ඤත්තිදුතියකම්ම නම් වෙත්. ඤත්තිචතුත්ථකම්ම- ඔසාරණ, නිස්සාරණ, සම්මුති, දූත, නිග්ගහ, සමනුභාසන කම්මලක්ඛණ යන මොහු ඤත්තිචතුත්ථකම්ම නම් වෙත්. විනයෙන-චොදනාසාරණායෙන්; සත්ථුසාසනෙන-ඤත්තිඅනුසාවණාදි සම්පත්තියෙන්; අනුසාවණ නම් කම්මවාක්‍යයයි. 'පච්ඡාසුය්‍යතෙ ඉති අනුසාවණං' ඛීයනධම්මං-බුම්මුනන ස්වභාවය; ආපජ්ජනස්ස- කරන්නාහට හෝ බුම්මුනනබව්ව පැමිණෙන්න ගුට; මේ ශික්ෂාපදය තිසමුට්ඨානය; ධම්මිකම්බව, ධම්මිකම්මයයි දැනීම, ඡන්දය දී බුම්මුනනබවට පැමිණීමයයි අංග තුණකින් යුක්ත වේ.

කම්මපටිබාහන සික්ඛාපද ගැටපදය නිමි.

---

වත්ථුං වා ආරොචියමානං-චොදක චුදිතයන් විසින් තමතමන්ගේ කථා සැලකරණලදී. මෙහි 'ආරොචිත වත්ථු' යන්නෙන් ඤත්තිය නො තබා කෙරෙණ කම්මගතයුතුයි. විනිච්ඡය කථාය වත්තමානාය-සනිටු හනට නිසිතෙපුල පවතිමින් සිටියදී; ආරොචිත වස්තුව විනයධරයන් විසින් විනිශ්චයකරමින් සිටිද්දීයයි සේයි· මේ ශික්ෂාපදය කායවාචා චිත්ත වසයෙන් සමුට්ඨානය වේ. විනිශ්චය කථා පැවතෙනබව, ධම්මකම්මිබව, ධම්මකම්මය යන හැඟීම් ඇතිබව, සමාන සීමාවක සිටීම් බව, සමාන සංවාසකබව, කම්මකොපය කරණු කැමැත්තෙන් හපදාන විජහනයයි අංග සයකින් යුක්ත වේ.

ඡන්දං අදත්වා ගමන සික්ඛාපද ගැටපදය නිමි·

---

යථා මිත්තතා-යහලුකම් පරිදි; මාසමග යමෙක් මිත්‍රවේනම් ඔහුට දෙයි යන අර්ථයි. මෙය තිසමුට්ඨානය, උපසම්පන්නබව, දැහැමින් ලත් සම්මුති ඇතිබව, සඞ්ඝයා සමග චීවරපත්‍ර ච්චරදනය, පසුව කැමැත්තෙන් ඛීයනබව යයි සිවුඅංගයින් යුක්ත වේ.

දුබ්බල සික්ඛාපද ගැටපදය නිමි.

---

පරිණාමන සික්ඛාපදයෙහි සියලු විනිශ්චය තිංසග්ගි කාණ්ඩයෙහි "යො පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං අත්තනො පරිණාමෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං" යන මේ ශික්ෂාපදයෙහි කී පරිද්දෙන් දතයුත්තේයි. ඒ පරිණාමන ශික්ෂාපදයෙහි තමහට පරිණාමිත හෙයින් නිසග්ගි පචිති වේ. මේ ශික්ෂාපදයෙහි තමහට නො වන හෙයින් සුද්ධ පාචිත්තිය වේ.

සහධම්මික වග්ගය නිමි.

---

ඔරකො-සමීපයෙහි; උම්මාරාතො ඉන්‍ද්‍රඛීලතො- මාලිගයෙහි මතු මහල්තලයට නැගුනේ; අගාරානං වාසනා- ආයසීයන් පිළිබඳ කාරණු; ඉමමහං සකං වා සාජිස්සති-මොවුන් විසින් මෙවුන්දම් සේවනය කරණ ලද්දේය; මොවුහු මෙවුන්දම් සේවනයකරන්නා

තුය. මෙහි 'ඉමෙසං' යන්න 'ඉමෙසි සතං' කියා ද, 'ඉමෙ සාරිස්සන්ති' කියාද විභක්ති විපරිනාම වශයෙන් යොදාගත යුතුයි. රතනං – මිණි රුවන් ආදීන් අතුරෙන් යමක්; පුත්තං පත්ථෙන්ති-(මඳ ඉවයක් දූත) පියා ද මරන්ට කැමැතිවෙයි. හත්ථිසම්මද්දං – ඇතුන්ගෙන් සම්බාධය; රජනීයානි – ඇලුම් කටයුතුවූ මෙබඳු රූ; මුද්ධාවසිත්තස්ස – මුදුනෙහි නෑවූ අභිෂෙකජලය ඇති; ඛත්තියස්ස – මාතෘ පිතෘ දෙපක්ෂයෙන්ම ක්ෂත්‍රියවූ රජහට; අනික්ඛන්තරාජකෙ-(න නික්ඛන්තො රාජා ඉතොති රජතෙමේ මේ සයනිඝරයෙන් නො නික්මුනේනුයි) අනික්ඛන්තරාජක නම් වූ ඒ සයනිඝරයෙහි; අනිග්ගතරතනකෙ- (අනිග්ගතං රතනං ඉතොති, නො නික්මුනාවූ ස්ත්‍රීරත්නය මෙ සයනිඝරයෙන්නුයි) අනිග්ගතරතනක නම් වූ සයනිඝරයෙහි; උභතො සුජාතො- මවුපිය දෙපසින් පිරිසිදු ජාති ඇත්තෙක; මෙහි 'සුජාත' ශබ්දය 'ජාති' වාචක වෙයි. සංසුද්ධගහණිකො-ඉතා පිරිසිදුවූ මවුකුස ඇත්තෙක; 'සංසුද්ධා ගහණී අස්සාති' සංසුද්ධගහණිකො; 'ගහණි' යනු ගර්භාශය නම්වූ මාතෘකුක්ෂි ප්‍රදෙශයයි. පුරුෂාන්තර සම්භව ස්පර්ශ නොවීම් හෙතුයෙන් පිරිසිදු වූ මවුකුස ඇත්තෙක යනාර්ථයි. අක්ඛිත්තො- (ඉමං බැහැර කරව, මොහුගෙන් කුමන ප්‍රයොජනයක්දැයි) වංශයෙන් නො නෙරපණ ලද්දාවූ; අනුපක්කුට්ඨො-ආක්‍රොශයක් හෝ නින්දාවක් හෝ නො ලදුවිරූ; උම්මාරං-එළිපත; අසංවිදිතො- නො දන්වා ලද්දේ; මේ ශික්ෂාපදය කායවාචා, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. ක්ෂත්‍රියබව, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂිකතොදකයක් හල බව, දෙදෙනම සයනිඝරයෙන් නික්මුනුබව, තමා එන බැව් නො ප්‍රවිසිබව, ඉන්ද්‍රඛීලාතික්කමය යි අඞ්ග පසකින් යුක්ත වේ.

රාජන්තෙපුර සික්ඛාපද වණ්ණනා නිමි.

---

විස්සරිත්වා-අමතක කොට; පුණ්ණපත්තං- තුටුපඬුරු; බඩුවේ වටිනාකමින් විස්සෙන් කොටසක් වූ අහුලං කැමතිව ප්‍රවෙශම් කොට දුන් අයට දීම පෙර සිරිතයි. ආභරණං ඔමුඤ්චිත්වා-නවකෙළක් අගනා වූ මහලිය පලඳනාව ගලවා; පතිකුලයට යන්නාවූ විශාඛාවට පියා තෙමේ මේ කරවා දුනි. මෙහි දියමන්ති සිවුනැළියක්, මුතු එකොළොස් නැළියක්, පබලු දෙවිසි නැළියක්, මිණි තෙතිස්නැළියක්, මෙය පැලඳී කල්හි හිස පටන් දෙපතුල තෙක් කාය වසා සිටී. ඇතුන් පස්දෙනෙකුට බල ඇත්තියක විසින් මෙය ඉසිලියහැකි වෙයි. උපභොග-ශරීරස්පර්ශී ලදින් අනුභවනීය දෙය; පරිභොග-ශරීරස්පර්ශී නොලදින් අනුභවනීය දෙය; පරික්ඛිත්තස්ස-වත් ආදියකින් පරික්ෂිප්ත විහාරයාගේ; අජ්ඣාරාමෙ-ඇතුළු අරමෙහි හෝ අන්තැනක හෝ පිහිටි තමන් වසන තැන; උපචාරෙ-ගෙහි සිට දමූ මොහොල යම්තැනක පතිතවේද මේ අතර; මෙසින් පිටත වූ රත්නය හෝ රත්නසම්මතය ගන්නාහට පචිති වේ. උග්ගණ්හාති-තමන්ගේ ප්‍රයොජනය පිණිස ගණීද අනුන්ලවා ගන්වා ද; ඒ භික්ෂුහට නිසැගි පචිති වේ. සබ්බත්ථ දුක්කටමෙවාතිය

සම්මන්තනාදීන්ගේ ප්‍රයෝජනය පිණිස නම් දුකුළා ඇවැත් වේ. අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා-(හෝරුපාදීන්ගේ පවෙස නිවාරණය පිණිස කරණලද වති ආදිය ඇති) ආරාමයෙහි හෝ, හෝරුපාදීන්ගේ පවෙස නිවාරණය පිණිස කරණලද වති ආදිය ඇති ගෙහි හෝ; මෙසේවූ ආවරණාදියකින් ඇතුලත තුබූ දෙය පිළිගෙණ ප්‍රවේශම්වනසේ තැබියයුතුයි. මහාජනයා හැසිරෙණ තැනක තුබූ දෙයක් නම් නො ගතයුතුයි. රූපෙන වා නිමිත්තෙන වා සඤ්ඤාණං කත්වා-රූපිය ගණන් හෙයින් හෝ වස්ත්‍ර නීලාදි වශයෙන් හෝ සලකුණු කොට; පොදිය ඇතුළෙහිවූ බඩු රූපිය නම්. එහෙයින් පොදිය ලිහා ගණන්කොට මෙපමණ කහවණුය, රන්ය, රිදීයයි ගණන සැලකිය යුතුයි. මැටි, ලා ආදියකින් කරණලද සලකුණ නිමිත්ත නම්. එය ද සැලකිය යුතුයි. සම්පාදෙසි-පළමු බලාතුබූ සලකුණු හා සමකොට කියයි නම්; දාතබ්බං-දියයුතුයි. නො චෙ-ඉදින් සලකුණු හා සම්කොට සම්පාදනය නො කෙළේවීනම්; විචිනාහි ආවුසොති වත්තබ්බො-සොය යි කියයුත්තේයි. භික්ඛූ පතිරූපා-සුදුසු මහණකෙණෙක්; ලොල සවභාවය ඇති භික්ෂූන්ගේ සමීපයෙහි තබන්ට නුසුදුසුය. යමෙක් ඒ ආවාසයෙන් නො යේද, හිමියන් හෝ නො දකීද; එසේ නමුත් තමන්ගේ චීවරාදිය පිණිස නො යෙදියයුතුයි. තිර සෙනසුනක් හෝ සෑයක් හෝ පොකුණක් හෝ කරවිය යුතුයි. ඉදින් බොහෝකලක් අයාමෙන් හිමියා පැමිණේ ද ඔහුට "උපාසකය ඔබගේ දෙයින් මෙනම් දෙයක් කරවනලදී; එහි පින් අනුමෝදන් වෙව"යි කියයුතුයි. ඉදින් අනුමෝදන් වීනම් එය මැනවි. අනුමෝදන් නො වේද, මං සතු දෙය දෙව යි චොදනා කෙරේද, අනික් තැනකින් හෝ නියමය පරිදි ඉල්වාගෙණ දියයුතුයි. රතනසම්මතං විස්සාසං ගණ්හාති-රතනසම්මතවූ දෙය හා විශ්වාසග්‍රාහ දෙය ගණී; මෙහි රතන සම්මතය නම් ආමාසවූ රත්නසම්මතයයි දතයුතු. අනාමාස දෙය නො වටීමය. මේ ශික්ෂාපදය ඡසමුට්ඨාන වේ. අනනුඤ්ඤාත දෙයක්වීම, අනුන්සතු බව, විස්සාසගාහ පංසුකූලසඤ්ඤාවන්ගේ අභාවය, නැඟීම හෝ ගැන්වීමයයි සිවුඅඟකින් යුක්ත වේ.

### රතන සික්ඛාපද ගැටපදය නිමි.

---

තිරච්ඡාන කථං- සගමොක් වලකන කථාව; රාජකථං-රජුන් ඇරැබ උපන් කථාව; භයකථං-රජ සොර සතුරු ආදීන්ගෙන් සිදුවන බිය හෝ අමනුෂ්‍ය දුර්භික්ෂ කාන්තාරාදියෙන් ඇතිවන බිය පිළිබඳ වූ කථාව; විසිඛා කථං-අසවල් වීථිය මනාය නො මනාය යනාදි වශයෙන් කෙරෙණ වීථි පිළිබඳවූ කථාව; කුම්භට්ඨාන කථං-පැන්තොට හෝ දිය දූස්සන් පිළිබඳවූ කථාව; පුබ්බපෙත කථං-මළවුන් පිළිබඳවූ කථාව; නානත්තකථං-නන් නන් දේ පිළිබඳ වූ නිරර්ථක කථාව; ලොකක්ඛායිකා කථං-ලොව මෙහෙසුරු විසින් හෝ බඹහු විසින් මැවුනේය. ඇට සුදු බැවින් කවුඩෝ සුදුය. ලේ රත්පැහැය බැවින් කොක්කු රතුය යනාදි විසින් කෙරෙණ ලෝකායත කථාව; ඉතිභවාභවකථං-භව නම් සස්සතය, අභවනම් උච්ඡේදය, භව නම් වුද්ධිය,

අභව නම් හානියය, භව නම් කාමසුඛය, අභවනම් අත්තකිලමථානුයොගාදි වූ සමුදුරුම් කථාව; සන්තං භික්ඛුං අනාපුච්ඡා-දෙලොස් රියනකින් ඇතුළත හුන් භික්ෂුව නො පිළිවිස; බොහෝ භික්ෂූන් නො කල්හි ගම්වදිස් නම් "විකාලෙ ගාමප්පවෙසනං ආපුච්ඡාමි" යි සියලු භික්ෂූන් විසින් ඔවුනොවුන් පිළිවිසිය යුතුයි. ඒ ගමෙහිදී ඒ කටයුත්ත සිදු නො වීනම් අතික් ගමකට ය අතික් ගමකටයයි ගම් සියයකට තමුත් යෙත් නමුත් නැවත විචාරීම් කිසක් නැත. අන්තරාරාමං- ඇතුළු අරම; නො පිළිවිස යාම පමණක් නොවෙයි නාබාන නො බැඳද සඟළසිවුර නො පොරවා ද ඇතුළු අරමෙහි යන්නහුට අනාපත්ති ය. ආපදාසු-සිහ වග වලස් ආදීන්ගෙන් උවදුරු ඇති කල්හි; මෙය කාය වාචා, කායවාචාචිත්ත වශයෙන් සමුට්ඨානය වේ. හුන් භික්ෂුව නොපිළිවිසීම, අනුඤ්ඤාතකරණාභාවය, විකාලයෙහි ගාමප්පවෙසනයයි අඞ්ග තුනකින් යුක්ත වේ.

විකාලෙගාමප්පවෙසන සික්ඛාපද ගැටපදය නිමි.

---

භෙදනකං-එනම් පාචිත්තියාපත්තිය; භෙදනය ම භෙදනක නාම්. ස්වාර්ථයෙහි කප්‍රත්‍යයයි. ඒ භෙදනය මේ පාචිත්තියාපත්තියට ඇත්තුයි භෙදනක නම්. පළමුකොට බිඳදමා පසුව දෙසියයුතු වූ ඒ බිඳීම මේ ඇවතට අයිතිනුයි භෙදනක ශබ්දයා කෙරෙන් අසත්‍යර්ථයෙහි අප්‍රත්‍යය වී මෙය සිද්ධවී. අරණිකෙ- අරණි දුන්නෙහි; විධෙ-පටිමූව විට සිටිනා වීය්යෙහි; වාසිජටෙ වෑදඬු නො ගැලවෙන පිණිස ලන අටසිදනා විසාණමය පිලියෙහි; මෙය ඡසමුට්ඨානය ය; සූචිඝරබව, අට්ඨිමයාදිබව, තමන්ගේ ප්‍රයොජනය පිණිස කිරීම හෝ කරවා ගැනීම යයි අඞ්ග තුනකින් යුක්ත වේ.

සූචිඝර සික්ඛාපද ගැටපදය නිමි.

---

ආසයතො යෙව මොඝපුරිසො වෙදිතබ්බො- අදහස් වශයෙන් මේ තුච්ඡපුරුෂයෙකැයි දතයුතුයි. ඡෙදනකං-එනම් පාචිත්තියාපත්තිය, (ඡෙදනමෙව ඡෙදනකං, තං අස්ස අත්ථීති ආපත්ති ඡෙදනකං)යි විග්‍රහ හෙයින් භෙදනකාපත්තිය හා සමවෙයි. මසාරකො-හැදපය විද ඇවුනු ඇඳ; බුන්දිකාබද්ධ-වලින් හැදපය බහවා කළ හැඳ; කුළීරපාද- කකුළුවන් පාසේ පා ඇති ඇඳ; ආහච්චපාද-හැඳවලම විද පා සිළුවද්දා ගැසූ පෝරු ඇඳ; පීඨෙ-පුටුවෙහි; හැඳ පිළිබඳ යම් ප්‍රභෙදයක් දක්වන ලද නම් පුටුව පිළිබඳවද ඒ එසේම දතයුතුයි. ඡින්දිත්වා පරිභුඤ්ජති- අධිකය කපාදමා පරිභොගකෙරෙයි. නො සිඳිනු කැමැත්තහු විසින් වළකැනැ එහි ලා ඇණැබහාලා අනුභව කටයුතුයි. නැතහොත් උඩුබල්ලා පෙරළා පියා අනුභව කටයුතුයි. අටුකොටු උඩ බැඳ අනුභව කටයුතුයි. මෙය ඡසමුට්ඨානය ය; පමණ ඉක්මවූ ඇඳපුටු බව, තමන්ගේ ප්‍රයොජනය පිණිස කොට හෝ කරවා පිළිගැනීම යයි අඞ්ග දෙකකින් යුක්ත වේ.

මඤ්ච සික්ඛාපද ගැටපදය නිමි.

තූලොනද්ධං-පුලුන්එව; යට කඩරෙදි අතුට පුලුන් බහාලා මත් තෙහි කඩරෙද්දකින් වලදනාලද; පොටකිතූලං-තෘණ හෝ පැලෑටි විශෙෂයකින් ලබාගත් පුලුන්; බිම්බොහනං-මාවුලාව; එය ශිෂ්ප්‍රමාණ වූයේ වරී. මෙය ඡසමුට්ඨානය ය. පුලුන් එවකල ඇඳපුටු බව, තමන්ගේ ප්‍රයොජනය පිණිස කොට හෝ කරවා පිළිගැණිමයයි අඞ්ග දෙකකින් යුක්ත වේ.

**තූලොනද්ධ සික්ඛාපද ගැටපදය නිමි.**

---

නිසීදනං අනුජානාං-නිසීදනය අනුදන්නා ලදී; "අනුජානාමි භික්ඛවෙ කායගුත්තියා චීවරගුත්තියා සෙනාසනගුත්තියා නිසීදනං"යි චීවරක්ඛන්ධකයෙහි පණීතභොජන වස්තුවෙහිදී අනුදන්නාලදී. සුගත් වියතින් දෙවියතක් දික්වූ යෙල වියතක් පුළුල්වූ එසේම එක්වියත් පුළුල්සේ දෙතැනකින් පලා කරණලද තුන්දරයකින් යුක්තවූ පරිෂ්කාරයව නිසීදනයයි කියනු ලැබේ. සන්ථතං පුරාණාසි කොට්ඨාසා-පැරණි සම්කරුවෙක් යම්සේද; සම්කරුතෙමේ යම්සේ සමක් ගෙණ පුළුල්කරන්නෙමියි එහා මෙහා අදීද, මෙසේ ඒ උදායි ස්ථවිරතෙමේ ඒ නිසීදනය ද අදින්ට පටන්ගති. නිසීදනං නාම සදසං වුච්චති-නිසීදනය නම් දසා සහිතයක් යයි කියනුලැබේ. මෙය ඡසමුට්ඨානය; නිසීදනයාගේ ප්‍රමාණාතික්‍රාන්තබවය, තමන්ගේ ප්‍රයොජනය පිණිස කොට හෝ කරවා පිළිගැණීම යයි දෙඅඟකින් යුක්ත වේ.

**නිසීදන සික්ඛාපද ගැටපදය නිමි.**

---

කණ්ඩුපටිච්ඡාදි-කස්පිළිසන; චීවරක්ඛන්ධකයෙහි බෙල්ලට්ඨිසීස වස්තුවෙහිදී "අනුජානාමි භික්ඛවෙ යස්ස කණ්ඩු වා පිළකා වා අස්සාවො වා ථුල්ලකච්ඡු වා ආබාධො කණ්ඩුපටිච්ඡාදිං"යි අනුදන්නාලදී. මෙහි ප්‍රමාණය දිගින් සුගත් වියත් සතරකි. පුළුලින් දෙවියතකි. යස්ස අධො නාභි උබ්භජාණුමණ්ඩලං-යම් භික්ෂුවකගේ නැබෙන් යට දන මඩලින් මත්තෙහි; කණ්ඩු-කැසිව; කණ්ඩුතිය; පිළකා-පොලය; අස්සාවො-අරිසස් භගන්දර ප්‍රමෙහාදීන්ගේ වසයෙන් නිති අපිරිසිදු දෙය (ලේ) වැගිරෙන්නක්; ථුල්ලකච්ඡුවා ආබාධො-මහකස් ආබාධය; මහා පිළිකාබාධය; පටිච්ඡාදනත්ථං-වැසීම පිණිස; මෙය ඡසමුට්ඨාන වේ. අඞ්ග සත්වැන්නෙහි මෙනි.

**කණ්ඩුපටිච්ඡාදි සික්ඛාපද ගැටපදය නිමි.**

---

නවවැනි දසවැනි ශික්‍ෂාපදයන්හි යමක් කියයුතු නම් ඒ සියල්ල මුල් ශික්‍ෂාපදවලදී කියවුනි.

**රාජවග්ගය නිමියේය.**

පවිසනසමයකාලෙ-පිඩුහැසිර පෙරළා එනකල්හි; සබ්බෙව අභග භෙසි-පිඩු සියල්ලම හැරගති. උපසඞ්කමෙය්‍ය කාලෙ-විකාලය එලඹසිටි කල්හි; පණ්ඩනයි-වෙවුලන්නී; අපෙති-පහවෙව; ගාරය්හං ආවුසො-

ඇවත නිඝ්‍ර කටයුතු; අසප්පායං- සවගීමොක්ෂයන්ට අහිත; රථිකා-වීථිය; ව්‍යූහං-කෝවේ කණ; සිඞ්ඝාටකං-සතරමංසන්ධිය හෝ තුන්මංසන්ධිය; ඝරං-කුලගෙය; මේ තැන් අතුරෙන් යම්කිසි තැනක සිට පිළිගන්නහුට ගැණීමෙහිදී දුකුළා ඇවැත් ද, අනුභවකිරීමේදී පිඩු ගණනින් පාටිදෙසනීයාපත්තිය ද සිදුවේ. දාපෙති- නොනෑ මෙහෙණක් අන්කිසිවකු ලවා දෙවයි. එය පිළිගන්නහුට අනාපත්ති වේ. උපනික්ඛිපිත්වා දෙති-අතින් අතට නොදී බිමතබා, 'ඉදං අය්‍ය තුම්හාකං දම්මි'යි දෙයි. එය 'සාධු භගිනි'යි පිළිගෙණ ඒ භික්ෂුණිය ලවාම හෝ අන්කෙනෙකු ලවා හෝ පිළිගන්වාගෙණ වළඳන්ට වටී. අන්තරඝරෙව-ඇතුළු අරමෙහි; භික්ඛුණුපස්සයෙ- මෙහෙණවරෙහි; තිත්ථියසෙය්‍යාය-තිත්ථියාරාමයෙහි; පටික්කමනෙ-ආසනසාලායෙහි; ගාමතො නීහරිත්වා-ගමින් පිටතට ගෙණ ගොස්; සතිපච්චයෙ පරිභුඤ්ජ- ප්‍රත්‍යයක් ඇති කල්හි අනුභවකරව; මෙය එළකලෝම සමුට්ඨානයය. පිරිපුන් උපසපන්බව, නොනෑ මෙහෙණක්බව, අන්තරඝරයෙහි සිට අතින් අතට පිළිගැණීම, යාවකාලිකබව, අනුභවකිරීම යයි අඞ්ග පස කින් යුක්තවේ.

පඨමපාටිදෙසනීය සික්ඛාපද ගැටපදය නිමි.

---

වොසාසන්තියො භික්ඛුණියො- ඇණවන මෙහෙණ; අනුපසම්පන්නාය-අනුපසම්පන්නයා කෙරෙහි; උපසම්පන්නසඤ්ඤිනො- උපසම්පන්නය යන හැඟීම ඇත්තාහට; වෙමතිකො-අනුපසම්පන්නයා කෙරෙහි උපසම්පන්නයෙක්හෝ අනුපසම්පන්නයෙක්හෝයි විමති ඇත්තේ; සික්ඛමානාය-සික්ඛමානාව; වොසාසන්තියා- විධාන කරණ කල්හි; මෙය කඨිනසමුට්ඨානය; පිරිපුන් උපසපන්බව, පස්බොදුනට අයත්බව, අන්තරඝරයෙහිදී අනුදත් ප්‍රකාරයෙන් අන් පරිද්දකින් කරණ වොසාසනය, නො වැළැක්ම, අනුභවයයි අඞ්ග පසකින් යුක්ත වේ.

දුතිය පාටිදෙසනීය සික්ඛාපද ගැටපදය නිමි.

---

උභතො පසන්නං-උපාසක උපාසිකා යන දෙපසින් පැහැදුනක්; මේ දෙදෙනාම සෝවාන්පෙළෙහි පිහිටියෝ වූහ. භොගෙන හායති- සම්පත්තියෙන් පිරිහෙයි. මේ අසූකෙළක් ධනය ඇති කුලයකි. දෙදෙනාගේ ම ධනය සැපයීමෙහි හෝ ආරක්ෂාකිරීමෙහි අදහසක් නොමැත. එහෙයින් මෙසේ සම්පත්තියෙන් පිරිහෙන්ට විය. න මත්තං ජානිත්වා-ශක්ති නො බලා; ඝරතො නීහරිත්වා-ගෙත් ගෙණගොස්; අසුන්හලට හෝ විහාරයට ගෙණවුත් පිළිගන්වති. සෙඛසම්මතෙ- සෙඛසම්මතය ලද; මෙය එළකලෝම සමුට්ඨානය ය. සෙඛසම්මතය ලදබව, පෙර නො පවරණලදබව, නො ගිලන්බව, ඝරූපචාරයට බැස ගැණීම, නිතිබත් හැර අනික් ආමිෂයක් ගෙණ වැළදීම යයි අඞ්ග පසකින් යුක්ත වේ.

තතිය පාටිදෙසනීය සික්ඛාපද ගැටපදය නිමි.

**අවරුද්ධා හොන්ති**- ප්‍රතිවිරුද්ධයෝ වෙත්; **පච්චන්තං පටිසංවිදිතං**-පස්සැහැදූමියන් අතුරෙන් යමෙකු යවා අපි ඛාදනීය භොජනීය දෙය ගෙණ එන්නෙමුයි පළමුවෙන් දන්වනලද; **ආරාමං ආරාමූපචාරං ඨපෙත්වා**- ආරඤ්ඤික සේනාසනාරාමය ද එහි උපචාරය ද හැර. උපචාරයෙන් නික්මුනු අතරමග දුටු භික්ෂුවට හෝ ගමට පැමිණියහුට හෝ පැවරීම කරණලද නමුත් එය අප්පටිසංවිදිතමය. **සචෙ සාසඞ්කං හොති සාසඞ්කන්ති ආවිකාතබ්බං**-ඉදින් ගම සැකසහිත නම් සැකසහිතයයි දන්විය යුතුයි. අරමෙහි සොරුන් වසන කල්හිත් අපට නො කිවාහුය යන දෙෂාරොපණයෙන් මිදීමටය; **චොරා වත්ථබ්බා මනුස්සා ඉධූපචරන්ති**- මිනිස්සු මෙහි හැසිරෙත්යයි සොරු ද කියයුත්තෝය. තමන්ගේ උපස්ථායකයන් ලවා අපගන්වත්ය යන දෙෂාරොපණයෙන් මිදීමට ය. **යාගුයා පටිසංවිදිතෙ තස්සා පරිවාරං ආහරියන්ති**-කැඳින් පැවරූවන්ට බත් ආදිය ද ගෙණඑනු ලැබෙයි. ඒ සියල්ල ම පටිසංවිදිත සඞ්ඛ්‍යාවට ගැණේ. **ගිලානස්ස**-(නො පවරණ ලද්දෙයි ද) ගිලනාට අනාපත්ති වේ. **පටිසංවිදිතෙ වා ගිලානස්ස වා සෙසකං**-එක නමකට යයි කියා හෝ ගිලනෙකුටයයි කියා හෝ පවරා ගෙණ එන ලද්දෙහි ඔහුගේ ශෙෂය අනිකෙකුට ද වළඳන්ට වටී. සතරනමකට හෝ පස්නමකටයයි පවරා ගෙණ එන ලද්ද බොහෝ වූකල අන්‍යයන්ට ද දෙන්ට කැමතිවෙත් නම් එය වටී. අධිකයක් වේදසන්නිධිකාරකනුවූ ඒ දෙය පසුදිනයෙහි ද වළඳන්ට වටී. යමක් නො පවරා ගෙණ එනලද්දේ නම් එය අරමෙන් පිට යවා පටිසංවිදිත කරවා ගෙන්වාගත යුතුයි. **තත්ථ ජාතකං**-ඒ අරමෙහි ම උපන් දෙය; මූලඛාදනීයාදිය අනිකෙකු කැපකොට දුන්කල්හි වළඳන්ට වටී. මේ ශික්ෂාපදය කඨිනසමුට්ඨානය. දුනු පන්සියයක් හෝ ගවුවක් ඇති සෙනසුනක් බව, යාවකාලික වස්තුහුගේ එහි නූපන්බව, නො ගිලන් බව, අගිලානාවශෙෂකබව, අප්පටිසංවිදිතබව, ඇතුළු අරමිහිදී පිළිගැණීම, අනුභවයයි අඞ්ග සතකින් යුක්ත වේ.

**චතුත්ථ පාටිදෙසනීය සික්ඛාපද ගැටපදය නිමි.**

---

සෙඛියා යනු හික්මිය යුතුවූ, එසේ ම චාරිත්‍රක්‍රම දක්වීම් වශයෙන් වදාළ දහම් කොටස්ති. මෙහිදී අසවල් ඇවත සිදුවේයයි නියම නො කරණලදී. එහෙත් අනාදරියකරණයෙහි සියලු තැන්හිදීම දුකුළා ඇවැත් සිදුවේ. **පරිමණ්ඩලං**-සිසාරු වටකොට; **නාභිමණ්ඩලං**-නාභි මණ්ඩලයෙන් මතුද, **ජාණුමණ්ඩලං**- දණමඩලින් යට පෙදෙසද; ජඞ්ඝට්ඨියේ පටන් යට අටඟුලක් පමණ තැන් වැසෙනසේ හඳනාය හැඳියයුතුයි. දනින් යට සතරඟුල් පමණ තැන් වැසිය යුතුය යනු මහාපච්චරිමතයයි. එසේකල අදනය දිගින් මුට්ඨිපඤ්චකයක්ද, පුළුලින් (දෙරියනක් හෝ) දෙරියන් හමාරක් වියයුතුයි. **ඔලම්බෙන්තො නිවාසෙති ආපත්ති දුක්කටස්ස**-ඉදිරියෙන් පස්සෙන් එල්වමින් හඳියි. ඒ භික්ෂූහට දුකුළා ඇවැත් වේ. බන්ධකයෙහි විස්තරවන පරිදි ගිහියන්

සේ හඳින්නහුට ද දුකුළා ඇවැත් වේ. අසඤ්චිච්ච-නො දැන; ඉදිරියෙන් හෝ පස්සෙන් හෝ එල්වා අඳිමියි නො දැන; හඳින්නහුට ද පරිමණ්ඩලයම හඳිමියි වැරද අපරිමණ්ඩල සේ හඳින්නහුට ද අනාපත්ති වේ. අසතියා-නො සිහියෙන්; අන්‍යවිහිත වූ එසේ හඳින්නහුට ද අනාපත්තිවේ. අජානන්තස්ස-නොදන්නහුට; නිවාසන වත නො දන්නහුට මේ ඇවතින් මිදීමක් නැත; ගිලානස්ස-ගිලන්හට; යමෙකුගේ ජඞ්ඝායෙහි හෝ පාදයෙහි ව්‍රණයක් වේද එකල්හි අඳනය නගා හෝ බහා අඳින්ට වටී. ආපදාසු-උවදුරු ඇතිකල්හි; මෙය පඨමපාරාජික සමුට්ඨානයි. අනාදරිය, අනාපත්තිකාරණාභාවය, අපරිමණ්ඩලවූ නිවාසනයයි අඞ්ග තුනකින් යුක්ත වේ. පරිමණ්ඩලං පාරුපිතබ්බං-වටකොට පෙරවියයුතු; ගිහියන්සේ නො පොරවා දෙකන් සමකොට හාත්පසින් පිරිමඬුලු සිටිනා සේ පාරුපණය කටයුතුයි. බුද්ධොපස්ථානාදිය කරණ කාලයෙහි විහාරයෙහිදී ද එසේම අන්තරඝරයෙහිදී ද පිරිමඬුලු සිටිනා සේ පාරුපණය ද නිවාසනය ද කටයුතුයි. කායං විවරිත්වා-දසරුව ද ලයද විවෘතකොට; සුපටිච්ඡන්නෙන-මනාකොට හැද පෙරවූවහු විසින්; ගණ්ඨිය අමුනා තුවා කෙළවරින් ග්‍රීවය වසා දෙකොන් සමකොට හකුළා මණිබන්ධය දක්වා පිළිසන්කොට පෙරවූවහු විසින් අන්තරඝරයෙහි පිවිසිය යුතුයි. දෙවෙනි සිකපදයෙහි.- ගලවළයෙහි පටන් හිස ද මණිබන්ධයෙහි පටන් අත් ද පිඩුමස පටන් පාදයන් ද විවරකොට පෙරවූවහු විසින් හිඳිය යුතුයි. වාසූපගතස්ස-රෑ එහිම වෙසෙමියි පැමිණියහුට; දවල්කාලයෙහි හෝ රෑ කල්හි කය විවෘතකොට හෙවත්විහාරයෙහිදී මෙන් එකාංශපාරුපණයෙන් යුක්තව හිඳීම අනාපත්තිකර වේ; සුසංවුතො-මනාකොට සන්හුන්නේ; ඔක්ඛිත්තචක්ඛු-යට බලා හෙලූ ඇස් ඇත්තේ; යුගමත්තං පෙක්ඛමානො-අභිමුඛයෙන් වියක් පමණ හෝ සතරරියනක් පමණ භූමිභාගය බලන්නේ; යො අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තො- යමෙක් අනාදරිය පිණිස ඒ ඒ දිගුන් බලමින්; ගමන්කෙරේද දුකුළා ඇවැත් වේ. එක් තැනක සිට ඇත් අස් ආදීන්ගෙන් උවදුරු රහිතබව බලන්ට වටී. හුන්නහු විසින් ද යට බලා හෙලනලද ඇස් ඇතිවම හිඳියයුතුයි. උක්ඛිත්තකායා-එක් පසකින් හෝ දෙපසින් නගාගත් සිවුරින් යුත් කාය ඇත්තෝ; පරික්ෂිප්ත ග්‍රාමයාගේ ඇතුළු එළිපත සිටැ මෙසේ නො යායුතුය. අපරික්ෂිප්ත ග්‍රාමයාගේ පරික්ෂේපාර්හස්ථානයෙහි සිට නොයා යුත්තේය. පරික්ෂේපාර්හස්ථානය නම් ලෙඩ්ඩුපාත දෙකකි.

සෙඛියා ප්‍රථමවර්ගයෙහි ගැටපදය නිමි.

---

උජ්ජග්ඝිකාය-මහ සිනාසිනාසෙමින්; හසනීය වත්ථුස්මිං-සිනාසියැ යුතු කරුණක් ඇති කල්හි; මිහිතමත්තං-සතුටු පමණක්; අප්පසද්දො අන්තරඝරෙ-ඇතුළුගමෙහි දොළොස්රියනින් මත්තේ නො ඇසෙන හඬ ඇත්තේ; උච්චාසද්දො-උස්වූ ශබ්ද ඇත්තේ; මහාසද්දො-පැතුරුණු ශබ්ද ඇත්තේ; කායප්පචාලකං-කය සලසලා; කායං පග්ගහෙත්වා-කය නිශ්චලකොට; සෘජුවූ කයින් සමවූ ඉරියවුවෙන් යායුතුයි. බාහුං පග්ගහෙත්වා-බාහුව නිශ්චලකොට; සීසං පග්ගහෙත්වා-හිස සෘජුව තබා.

ද්විතීය වර්ගයෙහි ගැටපදය නිමි.

ඛම්භකතො - උකුලෙහි තබනලද අත් ඇත්තේ; ඔගුණ්ඨිතො- හිස් සහිතකොට පෙරවූයේ, හිස වසා පෙරවූයේ; උක්කුටිකාය-අක් පල්ලෙන් හෝ විලුඹින් යන ගමන් ඇත්තේ; 'උක්කුටිකාය' යනු ඉත්ථම්භූතාඛ්‍යානයෙහි කරණ වචනයි. පල්ලත්ථිකාය-අකවටුවෙන්; හත්ථ පල්ලත්ථිකාය-අතින් ඇකවටු නැගීමෙන්; දුස්ස පල්ලත්ථිකාය-සළුය තිමහෙලා එහි ඇකවටුවෙන්; ආකිරයනෙ-පිඬුදෙන්නවුන්; සක්කච්චං- සකස්ව සිහිඑළවා; පත්තසඤ්ඤී-(පත්තගණනසංඥා තොමෝ ඒ මහණ හුව ඇත්තුයි ඒ මහණ තෙමේ) පත්තසඤ්ඤී වූයේ. තමාගේ භාජන යෙහි බත් ඇවිසිනාසඳ අනාදර පිණිස ඔබඔබ නො බලා පාත්‍රයෙහි ආභොගසංඥා ඇතිව යන අර්ථයි. සමසූපකො-බතින් සතරවැනි කොටස පමණ වූ මුද්ගසූපාදි සූප ඇත්තේ; හත්ථහාරියො- අතින් ගෙණයාහැකි වූයේ; රසරසෙ-රසරසයෙහි, රසරස යනු මූගමාංස දෙසු පයත් තබා අවශෙෂයට නම්. සමතිත්තිකං-පිරුණු මුවවිටින් යට රේඛාව හා සමකොට පිරීගියාවූ; ථූපීකතං පිණ්ඩපාතං-ථූපයක්මෙන් කරණලද පිණ්ඩපාතය; මුවවිටින් යට රේඛාව ඉක්මවා කරණලද්ද; මෙසේ කරණලද පාත්‍රය නො පිළිගෙණ ඇතුළ මුවවිටින් යට රේඛාව සමකොට පූරවනලද පාත්‍රය පිළිගත යුතුයි. පාත්‍රයෙහි කැවුම් උක්දඬු එළඵලාදිය බැහුකල හාත්පස ඉඩසිටින බැවින් ද, අතින් ඔබා යටට තදකරන්ට සිදුවන බැවින් ද එය ථූපීකත සඞ්ඛ්‍යාවට නො යෙයි. එසේම පාත්‍රමතුයෙහි තැබූ කැවුම්ද, අත් බඳුනක තබා පිළිගැන්වූ බොජුන් ද ථූපීකත සඞ්ඛ්‍යාවට නො අයත්වන හෙයින් ඉවසන්ට වටී. ථූපීකත බොජුන වනාහි ගිලනාහට ද නො වටී.

### තෘතීය වර්ගයෙහි ගැටපදය නිමි.

---

සපදානං-ඒ ඒ තන්හි හිරි නො දක්වා තමා දියායෙන් පනාතීන්; තමා දිසායෙහි පටන් පිළිවෙළින්; 'අපෙතං දනතො, අපදනං, දනය නම් සීමා දක්වීමයි. 'අපදන' නම් අනවඛණ්ඩනයයි. සහ අපදනෙන- සපදනං'; ආකිරණෙනා- වත්කරන්නේ; උත්තරිභඞ්ග-(උත්තරිං භඤ්ජිතබ්බො) මාළුයෙහි; ථූපකතො-මුදුනෙන්; ඔමද්දිත්වා-හනා; පරිත්තකෙ සෙසෙ-වලඳා ශෙෂව ගිය දෙය; එකතො සංකඩ්ඪිත්වා- එක්කොට ඇද, ඔමද්දිත්වා- මැඩ; භීයො කාම්‍යතං උපාදය- වැලිඳු කැමැති බව නිසා; පටිච්ඡාදෙත්වා දෙනති- බතින් වසා දෙත්; අසඤ්චිච්ච-'ගිලිමි' යි නො දන; මුවතුළ බහා පසුව විපිළිසර වීමෙන් ඉවත ලන්නහුට අනම්බෙන් යමක් ගිලේද ඔහුට; අසතියා-නො සිහියෙන්; එකතැන තුබූ විඤ්ඤත්ත අවිඤ්ඤත්ත බොජුන්වලින් යමක් වහා ගෙණ අනුභව කරන්නහුට ද අනාපත්ති වේ. උජ්ඣානසඤ්ඤී- තිපිසිත් ඇත්තේ;(උජ්ඣානෙ සඤ්ඤා=උජ්ඣානසඤ්ඤා; සා අස්ස අත්ථීති උජ්ඣාන සඤ්ඤී; මෙහි 'සඤ්ඤා' ශබ්දයෙන් චිත්තයම ගත්හු); නාති මහන්තො කබළො- ඉතා මහත්නුවූ ආලොපය; මයූරණ්ඩය අති

මහත්තාය කුක්කුටණ්ඩය අතිබුද්ධකය යි කී හෙයින් ඒ පමණ නො වට තේය; ඔවුන් දෙදෙනාගේ මධ්‍යම ප්‍රමාණවූ ආලොපය ගෙණ වළඳත් වටී. බජ්ජකෙ-ඛාද්‍යයෙහි; මූලඛාදනීයාදි සියල්ල ගතයුතුයි. ඵලාඵලෙ-කුඩා මහත් ඵලයෙහි; ඵලනම් කරඹ ආදී ක්‍ෂුද්‍ර ඵලයි. අඵල නම් පනස ලබුජ ආදි වූ මහාඵලයි.

චතුර්ථ වර්ගයෙහි ගැටපදය නිමි.

---

කබළෙ-ආලොපය; අනාහටෙ-මුවට නො එළවූසඳ; සබ්බං හත්ථං-සියලු අත; 'හත්ථ' ශබ්දය එකදෙශවාචී වෙයි. මෙහි ඇඟිල්ල ද හත්ථ ශබ්දයෙන් ගැණේ. එහෙයින් එක් ඇඟිල්ලක් නමුදු මුවතුළ බහන්ට නො වටී. සකබළෙන මුඛෙන-අකුරුපුරා නො කියහැකි පිඩු සහිත මුවෙන්; යම් පමණ දෙයක් මුඛයෙහි තුබූකල වචනය අපරිපූර්ණවේද එපමණ දෙයක් මුඛයෙහි ඇතිකල්හි බණන්නාහට දුක්කටාපත්ති වේ. අරළුකඩක් හෝ වැල්මී කඩක් හෝ මුවතුළ බහා දහම්දෙසන්ට වටී. යමක් මුවතුළ බහාලූකල වාක්‍යසම්පත්තිය අතිකවේද එබන්දක් මුවෙහි බහාළිම නිවරදය. පිණ්ඩුක්ඛෙපකං-ආලොපය මුවතුළ බහබහා; කබළාවච්ඡෙදකං- ආලොපය කඩකඩ කොට; අවගණ්ඩකාරකං-කොල රැස්කොට කොට හෝ කොපුලැ පිඩුරැස්කොට කොට; හත්ථනිද්ධුනකං-අත සලසලා; සිත්ථාවකාරකං-බත්හුළු වගුරුව වගුරුවා; කචවරං-කසල; ඡඩ්ඩෙන්තො-ඉවතලන්නේ; සිත්ථං-බත්හුළු ද; ඡඩ්ඩීයති-ඉවත දමනු ලැබේ. ජිව්හා නිච්ඡාරකං-දිව නෙරනෙරා; චපුචපු කාරකං-චපු, චපු යන හඬ ඇතිකොට කොට.

පඤ්චම වර්ගයෙහි ගැටපදය නිමි.

---

සුරුසුරුකාරකං-සුරුසුරු යන හඬ ඇති කොට කොට; සීතීකතො-සීතයෙන් පෙළුණේ; දවං-පරිහාසය; හත්ථනිල්ලෙහකං-අත ලෙව ලෙව; වළඳන්නහු විසින් අඞ්ගුලිමාත්‍රයකුදු ලෙවනට නො වටී. ඝන බවට පැමිණි කැද පැණි කිරි ආදිය ඇඟිල්ලෙන් ගෙණ මුවතුළ බහා අනුභවකරන්ට වටී. පත්තනිල්ලෙහකං-පාත්‍රය ලෙව ලෙව; ඇඟිල් ලෙනුදු පාත්‍රය නො ලෙවිය යුත්තේයි. ඔට්ඨනිල්ලෙහකං- දිවින් පිරිතොල් ලෙව ලෙව; එක තොලකුදු දිවින් නො ලෙවිය යුත්තේයි. ඔට්ඨ මාංසයෙන් ම ඇතුළුමුවට ප්‍රවෙශකරන්නට වටී. කොකනදෙ-එනම් පහයෙහි; මේ පහය බොධිරාජ කුමාරයන් විසින් කරවනලදී. 'කොකනද' යනු පියුම් විශෙෂයකි. මේ පහය ද පියුමක් වැනිව තැනුනු හෙයින් හෝ අහසට පියාසරකරන්ට සැරසුනු ගුරුළෙකු වැනි හෙයින්ද මෙසේ නම්කරණලදී. සාමිසෙන හත්ථෙන- ආමිෂ ඇති අතින්; පානීයථාලකං-පැන්තලිය; මේ ශික්ෂාපදය උපාසකවරුන් පිළිකුල්කරණ හෙයින් පණවනලදී. එහෙයින් සාඞ්ඝික පුද්ගලික ගිහි සන්තක වූ සඞ්ඛාදි සියල්ලම ආමිෂ සහිත අතින් නො ගතයුතුයි.

අතෙහි පිරිසිඳු තැනකින් සපයීකිරීම නිවරදය. **සසිත්ථකං පත්තධොවනං**-හිඳුල් හුළු සහිත පාදෙව් දිය; **උද්ධරිත්වා**-බත්හුළු දියෙන් ගෙණ; එක්තැනක රැස්කොට ජලනදමයි. **භින්දිත්වා**-බත්හුළු සිඳ බිඳ දියකතික කොට; **පටිග්ගහෙ**-(මුව සොදන්නාවූ මලායෙන් පිළිගන්න වුන්ගේ) මලායෙහි; **දමයි. නීහරිත්වා**- (උපාසකවරුන්ගේ පවිත්‍රව තිබෙන ඇතුළ්ගෙය ආදියෙන්)පිටතට නෙණ හැරදමයි; උන්ගේ කසළ ගොඩැ වුවත් දෙස්නැත. **ඡත්තපාණිස්ස**- කුඩගත් අත් ඇති; **සෙතච්ඡත්තං**-වස්ත්‍ර පළිගුණ්ඩිතවූ ශුද්ධකුඩය; ජිනකකුඩය හි ද යෙත්. **කිලඤ්ජච්ඡත්තං**-හුනපතුරුවලින් කළ කුඩය; කඩරෙදි කලාල්කඩ ආදියෙන් කරණලද්ද යසි ද යෙත්. **පණ්ණච්ඡත්තං**- තල්පත් ආදියෙන් කළ කුඩය; **මණ්ඩලබද්ධං**-දික්කුරුවල සරසට වලයාකාරයෙන් කුරුතබා හුයින් බඳනාලද්ද; **සලාකබද්ධං**-එනම් ඡත්‍රය; දිගට ද සරස ට ද කෙළින් කුරුතබා දූඩිකොට බැඳ නැවීම දිගහැරිම්වලට පුදුසු සේ සත්දණ්ඩ හා සමඟ හුයින් බඳනාලද්ද; දණ්ඩ සමනම සිඳගත් තල්පත් ආදීයෙන් කරණලද එකපණ්ණච්ඡත්‍රය ද ඡත්‍රසඩ්ඛ්‍යාවට ම අයත් වේ; **දණ්ඩපාණිස්ස**-දඬුගත් අත් ඇත්තහුට; සතරරියනක් පමණවූ මුගුර දඬු නම්. **සත්ථපාණිස්ස**-කඩු ආ ශස්ත්‍ර ගත් අත් ඇත්තහුට; කඩු බැඳගෙණ සිටියේ ද සත්ථපාණි සඩ්ඛ්‍යාවට නො යෙයි. **ආයුධපාණිස්ස**-ශරය හා සමඟ දුන්න ගෙණ සිටියහුටද, හුන්නහුටද; ශරය නැතිව දුන්න පමණක් අල්වාගෙණ සිටියාහටද, හුන්නාහටද, දුන්න නැතිව ශරය පමණක් අල්වාගෙණ සිටියාහටද, හුන්නාහට ද, දහම් දෙසනට නො වටී. දුන්න කර බහාලූවහුට එසේ කර බහාලූ දුන්න යම්තාක් අතින් නොගණී ද ඒතාක් ධර්මය දෙසත් වටී·

ඡට්ඨම වග්ගෙහි ගැටපදය නිමි.

---

**පාදුකාරූළ්හස්ස**-පයළු මිරිවැඩි ඇත්තහුට; **අක්කන්තස්ස**-(ඝිකම්) මැඩ ගෙණ සිටියාහට; ඇත්දඬෙහි ඇඟිලිගස්ස ප්‍රවෙශ නො කොට හුදෙක් ඇක්මුනාට; **පටිමුක්කස්ස**-පයළුවාහට; **ඔමුක්කො**-මිලුම් වැටිය මුදා සිටියේ; **යානගතස්ස**-හිදෙළු ගැල් යනාදියෙහි හුන්නහුට; දෙදෙනාම එකම යානෙහි සිටිත් නම් අතිකාට දහම්දෙසන්ට වටි. උස් යානෙහි හුන්නහු විසින් මිටි යානෙහි හුන්නහුට දහම් දෙසන්ට නැකිය. පළමු යානේ හුන්නහු විසින් පසු යානෙහි හුන්නහුට වටී. පසු යාන උච්චතරවුව ද පළමු යානෙහි හුන්නහුට දහම් දෙසන්ට නො හැකිය. **සයනගතස්ස**- (යටත්පිරිසෙයින්) බිම හෝ හොත්තහුට; පියවි බිමෙහි හෝ බිම එලාලූ කලාලයක හෝ හොත්තහුට උස් ඇඳක හෝ පුටුවක හෝ බිම හෝ සිටියහු විසින් හුන්නහු විසින් දහම්දෙසන්ට නො වටී. උස් වූ හෝ සම ප්‍රමාණවූ සයනක හොත්තහු විසින් සයනගත වූවහුට දහම් දෙසන්ට වටී. හොත්තහු විසින් සිටියහුට ද හුන්නහුට ද, හුන්නහු විසින් හුන්නහුට හෝ සිටියහුට ද, සිටියහු විසින් සිටියහුට ද දහම් දෙසන්ට වටී. **පල්ලත්ථි**

කාය නිසින්නස්ස-ඇකවටු ගැන්වීම් ඇතිව හුන්නහුට; වෙඨිතසීසස්ස-කෙසාන්තය නො පෙණෙන සේ පිළි ආදීන් වෙළනලද හිස් ඇත්තහුට; ඔගුණ්ඨිතසීසස්ස-හිස් වසා පෙරෙවියාහට; යට සිතයෙන් හිස පමණක් වෙළාගෙණ සිටියා ගත්හ. මේ සිතයෙන් සෙසු සිරුර හා එක්කොට හිසවසා පෙරෙවියා ගත්හ. ඡමායං නිසින්නස්ස-බිම හුන්නහු විසින්; ආසනෙ නිසින්නස්ස- ආසනයෙහි හුන්නහුට; යටත් පිරිසෙයින් වස්ත්‍රයක් හෝ තෘණ හෝ එලා හුන්නහු ද ආසනයෙහි හුන්නහු වනයෙන් සැලකේ. ඡවකස්ස-සැඩොල්හට; ඡවකී-සැඩොල් දුව; නිලීනො ගුහො- සැඟවුනෙක් වී; සඤ්ඤී නාම- යමෙක් නම්; සබ්බමිදං චරිමං කතං-(අප තිදෙනා විසින් කරණලද) මේ සියල්ල ලාමකය, සීමාව ඉක්මවූවකි, අධාර්මිකය; තත්ථෙව-එහිම; පපති-පැන්නේය. උභො අත්ථං න ජානන්ති-දෙදෙනාම පෙළ අරුත් නො දනිත්. උභො ධම්මං න පස්සරෙ-මේ දෙදෙනා ගරුකිරීමට සුදුසු පෞරාණික ධර්මය නො බලත්. යො චායං මන්තං වාචෙති-යම් මේ අයෙක් මිටි අසුනෙහි හිඳ ධර්මය කියාදේද; යො චායං ධම්මෙන ධීයති-යමෙක් උසසුන හිඳ හදාරද යන දෙදෙනායි. සුචිමංසූපසෙචනො-පිරිසිදු වූ තන්වැදෑරුම් වූ මංසරසාදියෙන් සොමුනු; සාලීනං ඔදනො භුත්තො-හැල්සාලේ බත අනුභව කරණ ලද්දේය. තස්මා ධම්මෙ න වත්තාමි-(මම රජුගේ බත අනුභව කෙළෙමි. අතික් බොහෝ දේද ලැබුවෙමි) එහෙයින් ධර්මයෙහි නො පවතිමි; ධම්මො අරියෙහි වණ්ණිතො-මේ ධර්මයතෙම ආර්‍යයන් විසින් වර්ණිත ය. බ්‍රාහ්මණ බමුණ; යා වුත්ති-(ධනලාභ යසොලාභ සඞ්ඛ්‍යාත) යම් වෘත්තියක්වීද, විනිපාතෙන-අපායෙහි විවශව පතිතවීම් හෙතුවෙන්ද; අධම්මචරණෙන-අධර්මයෙහි හැසිරීම් හෙතුවෙන් ද, තං ධනලාභං-ඒ ධනලාභයට ද; යසලාභං ච- යසොලාභයට ද; ධිරත්ථු- නින්දාවේවා; මහාබ්‍රහ්මෙ-මහ බමුණ; පරිබ්බජ-මෙතනින් පහවයනු මැනවි; අඤ්ඤෙපි පාණිනො-අනික් සත්වයෝ ද; පචන්ති-පිසත්; අස්මා-පහණතෙමේ; කුම්භං ඉව-ඝටය මෙන්; ආචරිතො-පුරුදුකරණලද; අධම්මො-අධර්මය තෙමේ; ත්වං-තුඹ; මා අභිදා-නො නසාවා; උච්චෙ ආසනෙ නිසින්නස්ස- උස් ආසනයෙහි හුන්නහුට; බිමවුව ද උස්තැන සිට දහම් දෙසන්නහුට අනාපත්තිය. ඨිතො නිසින්නස්ස-සිටියහු විසින් හුන්නහුට; උපස්ථානයට එලඹි දහරභික්ෂුවගෙන් අසුනෙහි හුන් මහාස්ථවිරයන් වහන්සේ ප්‍රශ්න විචාරති. සිටියහු විසින් හුන්නහුට දහම් කියාදෙන්ට නුසුදුසු හෙයින් පිළිතුරු නො දියයුතුයි. නැගිට අසනු මැනවැයි ද ගෞරව දක්වියයුතු හෙයින් තෙරුන්ට නො කියහැකියි. එසේ කල පසුපස සිටියහුට කියමි යන සිතින් පිළිතුරුදීම වටී. පච්ඡතො ගච්ඡන්තෙන-පස්සෙහි යන්නහු විසින්; ඉදිරියෙහි ගමන්කරන්නහු විසින් පස්සෙහි ගමන්කරන්නහුගෙන් ප්‍රශ්න විචාළකල්හි ද පෙරසේම පස්සෙහි එන භික්ෂුහට කියමියි කියන්ට වටී. අසඤ්චිච්ච-නොදැන; පිළිසන් හැනකම් යන්නහුට වහා මළමූත්‍ර නික්මුයේද; ඒ භික්ෂුහට නොදැන

මලමූත්‍ර නික්මුනු හෙයින් අනාපත්ති වේ. හරිතෙ-නිල් තණ ආදියෙහි; නොමල ගසෙකි හිම දිනේ විහිදීගිය අතුද හරිතසඞ්ඛ්‍යාවට ගැණේ. කදෙහි හුන්නහු විසින් අප්පහරිතස්ථානයෙහි මලමූත්‍ර පහ කරන්ම වටී. සුදුසු තැනක් පිරික්සන්නහුට වහා නික්මේ නම් ඔහු ගිලන්සඞ්ඛ්‍යාවට ගැණේ. එහෙයින් අනාපත්තිය. අප්පහරිතෙ-නිල් තණ ආදිය නොමැති තැන; අප්පහරිතස්ථානයක් නො ලබන්නහු විසින් තණ කැරැල්ලක් හෝ පිදුරු කැරැල්ලක් තබා මලමූත්‍ර කරණ ලද්දේ නම් වටී. උදකෙ-පරිභොග ජලයෙහි නො වටී. වැසිකිළිවල වූ ජලයෙහි ද, සමුද්‍රාදියෙහි ද නිවරද ය. වැසිකල්හි අනොදකස්ථානයක් නො ලබන්නහු විසින් උදකස්ථානයෙහි වුවද නිවරදයයි කියති.

සෙඛිය වග්ගයෙහි ගැටපදය නිමි.

---

භික්ඛු විභඞ්ග වණ්ණනාවට පණ්ඩිත වේරගොඩ අමරමෞලි සාමීන් විසින්
ලියූ සාරාර්ථමඤ්ජරී නම්වූ විනය ගැටපදය
මෙතෙකින් නිමියේ ය.

---

# මහාවග්ගපාලි ගැටපදය.

"තෙන සමයෙන බුද්ධො භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ බොධිරුක්ඛමූලෙ පඨමාභිසම්බුද්ධො" "තෙන සමයෙන" එසමයෙහි; මේ ය ශබ්ද ත ශබ්දයන්ගේ නිත්‍ය සම්බන්ධය හෙයින් "යෙන සමයෙන ආයස්මතො සාරිපුත්තත්ථෙරස්ස සික්ඛාපද පඤ්ඤත්තියාචන හෙතුභූතො පරිවිතක්කො උදපාදි" යනු හා සම්බන්ධ කටයුතුයි. විනයරීති අනුගමනයකිරීම් වසයෙන් භුම්ම වචනය වළක්වා කරණ වචනයෙන් යොදන ලදී. උරුවෙලායං-උරුවෙල්දනව්වෙහි; මෙහි 'උරු' ශබ්දය 'මහත්' අර්ථවාචීය; 'වෙලා' ශබ්දය 'තීර' පර්යායය ය; තැනින්තැන ඉවුරු මෙන් උස්ව සිටි වැලිතලා ඇති බැවින් මේ ගමට මෙසේ ව්‍යවහාරප්‍රාප්ත විය. බුදුරජානන් වහන්සේ මේ ගම නොදුරු ගම් කොට ගෙණ නො විසූසේක. එහෙයින් වාලුකාරාසි සමීපයෙහි වූ බෝරුක්මුල වැඩවිසූ බැව් හඟවනු කැමති බුද්ධඝොෂාචාර්යයෝ 'මහන්තො වාලුකරාසිම්හි' යි කීහයි සැලකියහැකියි. බෞද්ධ සංස්කෘත ග්‍රන්ථයන්හි මේ ග්‍රාමය 'උරුවිල්වා' නමින් ප්‍රකටව ඇත. 'මහත් බෙලි ඇත' යනු එහි අදහසයි. එහෙයින් 'උරුවිලවා' යන්නෙන් 'උරුවෙල' යි ආයේය යනු ද මතයකි. මෙකල මේ ප්‍රදේශය 'බුද්ධගයා' නමින් ප්‍රකටව පවතී. ගයා දුම්රියපලේ සිට හුත්ගව්වක් ඇතින් පිහිටා තිබේ. බුදුරදුන් ලොව පහළවෙන්ට පළමු දසදහසක් කුලපුත්‍රයෝ තවුස් පැවිද්දෙන් පැවිදිව මෙහි වසන්නෝ මෙසේ කතිකා කොට ගත්හ. "කායවාක්කර්ම සියල්ල ම ප්‍රකටව පැණේ. මනඃකර්ම අප්‍රකටය. එහෙයින් මනඃකර්ම සඞ්ඛ්‍යාත වූ කාමවිතර්කාදිය සිත්තුළ ඇතිවූ කෙණෙහි ම කොලගොටුවලින් වැලි ගෙණවුත් මෙහි දමිය

පුතුය'' යනුයි. මෙසේ තවුසන් විසින් ගෙණැවිත් ලූ වැලිවලින් මෙ පෙදෙස ආකීර්ණව ගියේයයි කියති. නජ්ජා නෙරඤ්ජරාය තීරෙ- එනම් ගංඉවුරෙහි; 'නෙලංජලාය' යි කියයුතු තන්හි 'ල' හට 'ර' කොට 'නෙරඤ්ජරාය' යි කියනලදී. මඩ සෙවෙල් ආදියෙන් තොරවූ පිරිසිදු ජලයෙන් යුක්තාය යන අර්ථයි. බොධිරුක්ඛමූලෙ-'බොධි' නම් මාර්ග ඥානයයි. භාග්‍යවත් තෙමේ මෙහිදී බොධිසඞ්ඛ්‍යාත ඥානය ලැබූසේක. එහෙයින් එහි වූ රුක බොධිරුක්ඛ නමින් ප්‍රකටවිය, පලගත්තා රුක, 'පලරුක' යි හැඳිනගත්තාක් මෙනි. පඨමාභිසම්බුද්ධො- අභිසම්බුද්ධව හැමටම පළමුකොට; 'පඨමං අභිසම්බුද්ධො' යි වියයුතු තැන අනුනාසිකලොපයෙන් මෙසේ වීය. බුද්ධත්වයට පැමිණි දිනත් සමග අටදිනක් බෝමැඩ වැඩහුන් බැව් මෙයින් පැහැදිලි වේ. අථඛො-මෙහි 'අථ' යනු 'මේ කාලයෙහි' යන අර්ථය දක්වයි. නිපාත යන් අනෙකාර්ථ බැවිනි. සත්තාහං-සත්දිනක් මුළුල්ලෙහි, අත්‍යන්ත සංයොගයෙහි උපයොග වචනයි. එකපල්ලඞ්කෙන- (වෛශාඛ පෞර්ණමී දිනයෙහි හිරු අස්තයට නො පැමිණි කල්හි ම අපරාජිත පල්ලඞ්ක වශයෙන් වජ්‍රාසනයෙහි හුන්කල් සිට පටන් වරක්වත් නො නැගිට මුලින් බැඳගත් පරිදි වූ (එකම පර්‍ය්‍යඞ්කයෙන්; විමුත්ති සුඛපටිසංවෙදී-ඵලසමාපත්තිසුවය විඳින සුලුවූයේ; අථඛො- ඉක්බිති; අධිකාරාන්තර දර්ශනයෙහි පවත්නා නිපාතයකි. විමුක්තිසුව විඳීම අතහැරදමා පටිච්චසමුප්පාදධර්මයන් මෙනෙහි කිරීමෙහි නියැලුනු බැව් දක්වයි. පටිච්චසමුප්පාදං- අවිද්‍යාදි ප්‍රත්‍යයාකාරධර්ම; අනුලොමං- 'අවිජ්ජා පච්චයා සඞ්ඛාරා' යනාදි ක්‍රමය අනුව පවත්නාවූ අනුලොමය. පටිලොමං-'අවිජ්ජායත්වෙව අසෙස විරාගනිරොධා සඞ්ඛාරනිරොධො' යනාදි වශයෙන් පිළිලොම්ව පවත්නාවූ පටිලොමය. අවිජ්ජා- දුක්ඛාදීන්හි නො දැනීම; 'අන්තවිරහිතෙ සංසාරෙ භවාදීසු සත්තෙ ජවාපෙතීති අවිජ්ජා' අනවරාග්‍රවූ සංසාරයෙහි භවාදීන්හි සත්වයන් දුවවානුයි අවිජ්ජා නම්. සඞ්ඛාරා- ලෞකික කුශලාකුශල චෙතනා රාශිය; විඤ්ඤාණං-ලෞකික විපාකය; නාමං- ලෞකික වෙදනාදි ස්කන්ධත්‍රය; රූපං- භූත උපාදාය වශයෙන් ප්‍රභෙදව පවත්නාවූ රූපස්කන්ධය; සළායතනං- පසාදවිඤ්ඤාණ සමූහය; වෙදනා- පූර්ව කුශලාකුශල කර්මයන්ගේ විපාකය වූ සකලස්පර්ශය; තණ්හා-රාගය; උපාදානං-බලවත් රාගයයි කියනලද කාම, භව, දිට්ඨිත්‍රය; භවො- කාමාදිවූ සාශ්‍රව කුශලාකුශල චෙතනාරාශිය හා උපාදානස්කන්ධය; ජාති-උත්පත්තිය; ජරා-පැසීම: මරණ-බිඳීම; සොක- ජරාමරණයන් හෙතුකොට ගෙණ ඇතිවන කනස්සල්ල; පරිදෙව-හැඬීම; දුක්ඛ- කායික දුක් වෙදනාව; දොමනස්සං-චෛතසිකවූ දුක් වෙදනාව; උපායාස-දැඩිවූ ශොකය; අසෙසවිරාග නිරොධා-විරාග සඞ්ඛ්‍යාතවූ මාර්ගඥානයෙන් ඉතිරි රහිතව නිරුද්ධවීම් හෙතුවෙන්; සඞ්ඛාර නිරොධො-සංස්කාරයන්ගේ අනුප්පාද නිරොධය වෙයි. කෙවලස්ස- සියළුම; දුක්ඛක්ඛන්ධස්ස-දුක්ඛ සමූහයාගේ; නිරොධො-අනුත්පාදය

වෙයි. ඡන්දං අදාසිං-මම (අභිජ්ඣාදීන්ගේ වශයෙන් සඞ්ඛාරාදීන්ගේ හටගැනීම ද අභිජ්ඣා නිරොධාදි වශයෙන් සඞ්ඛාරාදීන්ගේ නිරොධය ද මේ තැන) මේ කාරණ; විදිත්වා-මාගේ ඥානයෙන් දැන; උදානං උදානෙසි-(සොතුහුගේ ද හෙතුසම්පන්න ධර්මයාගේ ද දැනීමෙන් සොම්නසින් යුක්තවූ ඥානසමුට්ඨාන වූ) ප්‍රීතිවාක්‍යය පැවැත්වූසේක. යදාහවෙ-යම් කාලයෙක්හි; මෙහි 'හවෙ' යනු ව්‍යක්තාර්ථයෙහි නිපාත යති. ඇතැම් කෙනෙක් 'හවෙ'- 'කෙලශමාරයා සමග යුද්ධකරණ කාලයෙහිය'යි අරුත් පවසත්. ආතාපිනො-('ආතාප' යනු කෙලශ සන්තාපනාර්ථයෙන් වීර්‍ය්‍යයට නමි.) එබඳු කෙලෙශ තවන වීර්‍ය්‍යයෙන් හෙබවත් සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ; ඣායතො- ආරම්මණ ලක්ඛණ උපනිජ්ඣාන වශයෙන් ධ්‍යාන කරන්නාවූ; ආරම්මණූප නිජ්ඣාන නම් අෂ්ටසමාපත්තීහුයි. ලක්ඛණූපනිජ්ඣාන නම් විදර්ශනාමාර්ග ඵලයෝයි; බ්‍රාහ්මණස්ස-බාහිත පාපීවූ ක්ෂීණාශ්‍රවයාහට; ධම්මා-අනුලොම ප්‍රත්‍යයාකාර ප්‍රතිවෙධය සිද්ධකරන්නාවූ සත්තිස්බොධිපාක්ෂික ධර්මයෝ; පාතුභවන්ති-පහළවෙත්. යදා-යම්හෙයකින්; සහෙතු ධම්මං-අවිද්‍යාදී හෙතුවෙන් හටගත්තාවූ සංස්කාරාදි දුඃඛස්කන්ධධර්මය; පජානාති-ප්‍රතිවෙධය කෙරේද; සබ්බා කඞ්ඛා-සොළොස් වැදෑරුම්වූ සැක; වපයන්ති-නිරුද්ධවෙත්; යස්මා-යම්හෙයකින්; පච්චයානං-ප්‍රත්‍යයධර්මයන්ගේ; ඛයං-ක්ෂය සඞ්ඛ්‍යාතවූ නිර්වාණය; අවෙදි-ප්‍රතිවෙධ කළසේක්ද, එහෙයිනි, සුරියොව-සූර්‍ය්‍යයා තෙමේ; අන්තලික්ඛං-අහස; ඔභාසයං ඉව- අඳුරු දුරුකරමින් බබුළුවන්නේම; තිට්ඨති-සිටීද; එසේම ක්ෂීණාශ්‍රව තෙමේ; මාරසෙනං-මාරසේනාව;

"කාමා තෙ පඨමා සෙනා-දුතියා අරති වුච්චති,
තතියා ඛුප්පිපාසා තෙ-චතුත්ථී තණ්හා පවුච්චති,
පඤ්චමී ථිනමිද්ධං තෙ-ඡට්ඨී භීරූ පවුච්චති,
සත්තමී විචිකිච්ඡා තෙ-මක්ඛො ථම්භො ච අට්ඨමො
ලාභො සිලොකො සක්කාරො-මිච්ඡාලද්ධො ච යො යසො,
යො චත්තානං සමුක්කංසෙ-පරෙ ච අවජානාති
එසා නමුචිසෙනා තෙ-කණ්හස්සාභිප්පහාරිණී,
න නං අසූරො ජිනාති-ජෙත්වා ච ලභතෙ සුඛං"

යන මොහු මිථ්‍යාසෙනා වෙත්. විධූපයං-විධ්වංසනය කරමින්; තිට්ඨති-සිටියි.

බොධිකථා ගැටපදය නිමි.

---

සත්තාහස්ස අච්චයෙන-පර්‍ය්‍යවසානයෙහි වැඩහුන් සත්දවස පසුව යාමෙන්; තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා-(නැඟිට පසු) අර්හත්ඵල සමාපත්ති සමාධියෙන් කාලපරිච්ඡේදය පිරිදී නැඟිසිට; බොධිරුක්ඛමූලා-බෝරුක් මුලින්; යෙන අජපාලනිග්‍රොධො-අජපාල නුගරුක යම් තැනෙක්හි ද, එහි පස්වැනි සතියෙහිදී වැඩසේක. දෙවෙනි සතිය බෝමැඩ ආසන්නයෙහිම වජ්‍රාසනය පිහිටි තැනින් මදක් නැගෙනහිරදිග ඈතුරුකොට වැඩසිට බෝරුක ද වජ්‍රාසනයට ද අනිමිස ලොචනයෙන් පුදමින් හුන්සේක. එතැන අනිමිසලොචන

චෛත්‍යස්ථානය නමින් දනුදු ප්‍රකටය. ඉක්බිති වැඩසිටි තැනට ද බෝරුකට ද මධ්‍යයෙහි නැගෙනහිර සිට බස්නාහිරට විහිදී යනසේ දෙවියන් මැවූ රුවන්සක්මනෙහි සක්මන් කරමින් තෙවැනි සතිය ගතකළසේක. එතැන රතනචංකමන නමින් දනුදු පවති. එතැනින් පශ්චිමදිශාභාගයෙහි දෙවියන් මැවූ රුවන්ගෙහි පලක්බැඳ වැඩසිටි සේක් සමන්තපට්ඨානය මෙනෙහි කරමින් සිවුවැනි සතිය ගතකළසේක. විමුක්තිසුඛ ප්‍රතිසංවේදී-ධර්ම පරීක්ෂා කරමින්ම අතර අතර විමුක්තිසුවද විඳිසේක. "ධම්මං විචිනන්තොපි විමුත්තිසුඛං ච පටිසංවෙදෙන්තො" යන අට්ඨකථා පාඨය සුදුසුයයි ද උදානට්ඨකථාවෙහිත් එයම පෙණේයයි ද සාරත්ථදීපනියෙහි දක්වති. මෙහි 'ධම්ම' යන්නෙන් අභිධර්මය ගතයුතුයි. අඤ්ඤතරො බ්‍රාහ්මණො-(නාම ගොත්‍ර වශයෙන් අප්‍රකටවූ) එක් බමුණෙක්; හුහුංකජාතිකො-(සියලු හීන ජාතිකයෝ මා හැර දොස් පැමිණෙත්වායි (මාන වශයෙන් ද, ලඟට පැමිණියවුන්ට වහා ඉවත්වෙවයි ක්‍රෝධ වශයෙන් ද) 'හුහුං' යන අනුකරණ ශබ්ද පැවැත්වීම ස්වභාව කොට ඇත්තෙක්; ගොතමාති-ගෞතමයන් වහන්සැයි; මේ බමුණා පැමිණි කෙණෙහි ම බුදුරජානන් වහන්සේගේ නාමය කෙසේනම් දනානත්තේද? යත්; පස්වග මහණුන්ගේ උපස්ථානය ලබමින් සවසක් දුෂ්කරක්‍රියාකරණ කාලයෙහිද, ඒ දුෂ්කරක්‍රියාව හැරදමා උරුවේල්දනව්වට පැමිණ සේනානි නම් නිගමයෙහි හුදකලාව පිඬුසිගැරෙණ කාලයෙහි ද, මේ බමුණා මුන්වහන්සේ හොඳින් අඳුනයි. ඒ කාලවලදී විචිත්වර කථාසල්ලාප කොට ද ඇත්තෙකි. එහෙයින් පස්වගමහණුන් විසින් ඒ කාලයේදී බුදුරදුන්ට ව්‍යවහාර කරණලද නාමය වූ 'ගෞතම' යන නාමය බමුණා අසා ඇත්තේය. එසේ ලත් පුරුද්දෙන් මෙසේ ගෞතම නාමයෙන් කථා කෙළේය. බ්‍රාහ්මණකරණා-බ්‍රාහ්මණභාවය කරන්නාවූ; එතදවොච උදානෙසි-'යො බ්‍රාහ්මණො' යනාදී ප්‍රීතිවාක්‍යය ප්‍රකාශකළසේක. ඒ බමුණාට දහම්දෙසීමක් නොකළසේක. ධර්මදෙශනාවට නොකල් වන හෙයිනි. එය ඇසූ බමුණාට ධර්මාභිසමය නූවූයේ ද එහෙයිනි. යො-යමෙක් තෙමේ; බාහිතපාපධම්මො-දුරුකරණලද පව්කම් ඇත්තේ; නිහුහුංකො-මාන වශයෙන් හා ක්‍රෝධ වශයෙන් පවත්වනලද හුහුංකාර නැත්තේ; නික්කසාවො-රාගාදී කසට නැත්තේ; යතත්තො-භාවනානුයොගයෙහි ඇලුණු සිත් ඇත්තේ; වෙදන්තගූ-චතුර්මාර්ගඥාන සංඛ්‍යාත වේදයෙහි පරතෙරට පැමිණියේ; වුසිතබ්‍රහ්මචරියො-වැස නිමවනලද මාර්ගබ්‍රහ්මචර්ය ඇත්තේ; යස්ස-යමෙකුට; ලොකෙ-සකලලෝක සන්නිවාසයෙහි; කුහිඤ්චි-කිසියම්; උස්සදා-(රාග, දෝෂ, මෝහ, මාන, දිට්ඨි වශයෙන් පවත්නා) උස්සද කෙනෙක්; නත්ථි-නැත්තාහු ද; සො බ්‍රාහ්මණො-ඒ බමුණු තෙමේ; බ්‍රහ්මවාදං-'මම බ්‍රාහ්මණයෙක්මි'යි යන වාදය; ධම්මෙන-දැහැමින්; වදෙය්‍ය-කියන්නේය; බ්‍රාහ්මණයෙක් වන්නේ බාහිතපාපිත්වයෙන් මිස දුෂ්ටමඞ්ගලිකත්වයෙන් නොවේයයි වදාළසේක

අජපාල කථා හැමපදය නිමි.

මුචලින්දමූලෙ-බක්මීගස මුල, මිදෙල්ලයයි ද කියති. මෙය බෝමැඩින් ප්‍රාචීන දිග්භාගයෙහි පිහිටියේය. මුචලින්දො-එනම් නාගරාජයා; මේ තෙමේ මුචලින්දරුක සමීපයෙහි පිහිටි පොකුණෙහි උපන් මහත් ආනුභාවයකින් යුක්ත නාරජෙකි. අකාලමෙඝො-නොකල් වැස්සක්; මෙය ගිම්හාන ඍතුහුගේ පශ්චිම මාසයෙහි ඇතිවූවක් හෙයින් අකාල මේඝ නමින් ප්‍රකාශිතය. සත්තාහවද්දලිකා-සත්දිනක්ම නොකඩකොට පවත්නා වැස්ස; 'වුට්ඨි' යන්න අපෙක්ෂාකොට 'වද්දලිකා'යි ස්ත්‍රීලිඞ්ගික වශයෙන් යෙදූනි. සීතවාතදුද්දිනී-(සීතවාතෙන දූසිතං දිනං එතිස්සා වද්දලිකායාති ඒ සත්තාහවද්දලිකාය හාත්පස හමන්නාවූ දියබිඳු ගැබ් මෙන්) සියිල්වූ සුළඟින් දූෂිතවූ දිවස ඇති; මේ චාතුර්ද්වීපික මහාමේඝය බුදුකෙනෙකුන්ගේ ලොව පහළවීමක් හෝ සක්විත්තෙකුගේ පහළවීමක් නිමිත්තකොට පවත්නාකි. සකභවනා-සවකීය නාගභවනයෙන්; සත්තක්ඛත්තුං භොගෙහි පරික්ඛිපිත්වා- සත්වරක් සවකීය දරණ ගැබින් බුදුරජුන්ගේ සිරුර වටකොට ගෙණ; උපරිමුද්ධනි මහන්තං ඵණං කරිත්වා- බුදුරජුන්ගේ හිස මත්තෙහි තමන්ගේ විශාලවූ පෙණය විහිදුවා; මෙසේ නාගරාජයාගේ දරණගැබින් පරික්ෂිප්තවූ ප්‍රදෙශය ලෝහප්‍රාසාදයෙහි භාණ්ඩාගාරය තරම් වූවකැයිද, මජ්ඣිමට්ඨකථාවෙහි මෙය ලෝහප්‍රාසාදයාගේ යට මාලය තරම්වූව කැයි ද කියති. බුදුරජාණන් වහන්සේට එහි කැමැති ඉරියව්වකින් වැඩසිටිය හැකිවිය. මා භගවන්තං සීතං-සීතය බුදුරජාණන් වහන්සේ නො පෙළාවා; විද්ධං-උපක්ලේශ විගමනයෙන් ඉඳුනිල්මිණක් මෙන් බබළන්නාවූ; විගතවලාහකං- පහවගිය මෙඝය ඇත්තක් වූ; දෙවං-අහස; විදිත්වා-(දූන් අහස විගතවලාහකය, බුදුරජුන්ට සීතාදි උවදුරක් දූත් නැතැයි) දැන; විනිවෙඨෙත්වා-හකුළා, ඉවත්කොට; සකවණ්ණං- තමන්ගේ නාරුව; පටිසංහරිත්වා- අතුරුදන් කොට; මාණවකවණ්ණං- කුමාරවෙශයක්; සුඛො විවෙකො- නිර්වාණ සඞ්ඛ්‍යාතවූ උපධි විවේකය; සුඛො-සැප වේ; තුට්ඨස්ස-චතුර්මාර්ගඥාන සන්තොසයෙන් සතුටුවූ; සුතධම්මස්ස විශ්‍රැත ධර්ම ඇත්තාවූ; පස්සතො-(බැලිය යුතුවූ; යම් විවේකයක් වේද ඒ සියල්ල තමන්ගේ වීර්‍ය්‍යබලාධිගතවූ ඥානචක්ෂුසින්) බලන්නහුගේ; අබ්‍යාපජ්ජං- අකුපපන සවභාවය; සුඛං- සැපයි. මෙයින් ප්‍රථමමාර්ගීය දර්ශිතය. ලොකෙ-ලෙවිහි; පාණභූතෙසු- සත්ත්වයන් කෙරෙහි; සංයමො-අවිහිංසන සවභාවය; සුඛො- සැපයි; මෙයින් ද්විතීය මාර්ගීය දර්ශිතය. කාමානං-කාමයන්ගේ; සමතික්කමො-සමතික්‍රමණයයි කියනලද; විරාගතා- යම් වීතරාගබවක් වේද; සුඛා-සැපයි; මෙයින් තෘතීය මාර්ගීය කථිතය; අස්මිමානස්ස-අස්මිමානයාගේ; යො විනයො- පස්සද්ධි වශයෙන් යම් හික්මීමක් වේද; වෙ-ඒකාන්තයෙන්; එතං-මෙය; පරමං සුඛං-පරමසුවයයි. මෙයින් අර්හත්මාර්ගීය කථිතය.

මුචලින්ද කථා ගැටපදය නිමි.

මුචලින්දමූලා-මිහබෝමැඩින් නැගෙනහිරදිග පිහිටි මුචලින්ද වෘක්ෂ මූලයෙන්; රාජායතනං-(දකුණුදිග පිහිටි) කිරිපළුරුක; තෙන ඛො පන සමයෙන- (රාජායතන මූලයෙහි සත්දවසක් මුළුල්ලෙහි එකම පර්‍යංකයෙන් වැඩහිඳ නැගිසිටි දිනයෙහි බුදුරජුන්ට අරුණෝදගමන වේලාවෙහි, සක්දෙව්රජ තෙමේ ඔබෙහෙත් අරළු හා දැහැටි ද පිළිගැන්වීය. බුදුරජ තෙමේ එය වළඳා මුඛප්‍රක්ෂාලනාදී ශරීරකෘත්‍යය කොට එහි ම වැඩහුන්සේක.) ඒ කාලයෙහි; තපුස්සභල්ලිකා වාණිජා-තපස්සු භල්ලික නම්වූ [illegible] වෙළෙන්දෝ දෙදෙන; මොවුහු සින්ධුනදී ශාඛාවක්වූ සුවාස්තී නදිය අසබඩ පිහිටි පුෂ්කරවතී නගරයෙහි වූ සාර්ථවාහකයෙකුගේ පුත්‍රයෝ දෙදෙනෙක් වෙත්. මොවුන්ගේ ජන්මභූමිය අසිතාංජන නගරය වේයි. උක්කලා-උක්කල නම් ජනපදයෙන්; මේ ජනපදය උත්තරපථයෙහි පිහිටියේය. තපස්සු භල්ලික දෙදෙනා කේශධාතු නිදන්කොට එහි චෛත්‍යයක් ද බැඳවූහ. තං දෙසං-ඒ මධ්‍යදේශයට; නැගෙනහිරින් කජංගල නම් නිගම්ගමද; ගිනිකොණින් සලලවතී නදියද, බස්නාහිරින් ථූනනම් බමුණුගමද, උතුරෙන් උසීරධ්වජ නම් පර්වතය ද මධ්‍යදේශයට සීමාවෝයි. බුදුවරුන්ගේ උත්පත්තිය මේ මධ්‍යදේශයෙහි ම සිදුවේ. ඤාතිසාලොහිතා දෙවතා-ඔවුන්ට පෙර නෑවූ දෙව්දුවක්; එතදවොච-(ඕතොමෝ ඒ වෙළෙඳුන්ගේ ගැල් ගමන්කරවන්ට නො හැකි අයුරක් දක්වීය. එසින් බියවූ වෙළෙන්දෝ මාර්ගයෙහිදීම ඒ ඒ දෙවියන්ට යදින්ට පටන් ගත්හ. ඉක්බිති ඕ අහසෙහි වෙළෙඳුන්ට පෙනෙනසේ සිට) මෙය කීය. මන්ථෙන ච මධුපිණ්ඩිකාය ච-අග්ගුන්කෙන් හා මීපිඬුයෙන්; මීපිඩු නම් ගිතෙල් මීපැණි යොදා පිඩුකරණලද අග්ගලා විශේෂයකි. පතිමානෙථ-පුදව්, උපස්ථානකරව්; වො-තොපට; තං- ඒ ප්‍රතිමානනය හෙවත් උපස්ථානය; යං- යම් පිළිගැණීමක්; භගවතො එතදහොසි-(පධානතුයෙන කාලයෙහි යම් පාත්‍රයක්විද, එය සුජාතාව කිරිපිඬු දෙන්ට පැමිණෙන කල්හි ම අතුරුදන්විය. බුදුවරු ඒ ඒ දෙය අතට පිළිගැණීම නො කෙරෙති. කෙසේ නම් මම මෙය පිළිගණිම්ද යන) මේ සිත විය. චතුද්දිසා- සිවුදිගින්; පච්චග්ඝෙ- එකෙණෙහි නිපන් බැවින් අභිනවවූ; වෙන වෙසම මහාඝීවූයයි ද කියති. මහාඝී පාත්‍රපරිභොගයක් බුදුවරුන්ගේ නොමැති හෙයින් එසේ කීම නොමැනවැයි ටීකාවල දක්වති. ඔබ්ධාධිට්ඨා-වචනවශයකින් උමස්සුබම්ට පැමිණියෝ; ඉක්බිති තපස්සු භල්ලිකයෝ අද පටන් අපි නාගට අභිවාදන ප්‍රත්‍යුපස්ථානාදිය කරමුදැයි බුදුරජාණන්වහන්සේට දැන්වූහ. බුදුරජාණන් වහන්සේ ඉන්පසු තමන්වහන්සේගේ හිස පිරිමැද් සේක. කෙශධාතුහු අතෙහි ලැගුණාහුය. ඒ කෙශධාතු සුභ කෙණ මෙයට උපස්ථානකරව් යයි ඔවුන්ට දුන්හ. ඔවුහු තොහෙළ ලැබ අමෘතයෙන් අභිෂේකලද්දවුන් මෙන් වැද නික්ම ගොස් උත්තරාපථයෙහි උක්කලා නගරයෙහි ඒ කෙශධාතූන් නිදන්කොට සෑයක් කළහ.

රාජායතන කථා ගැටපදය නිමි.

**පරිවිතක්කො උදපාදි**-කල්පනා කටයුත්තක් පහළවිය. මෙසේ විතර්කකිරීම සියලු බුදුවරුන් වහන්සේගේ ම ධර්මතාවයකි. **අධිගතො ඛො මයායං ධම්මො**-මා විසින් චතුරාර්‍ය්‍යසත්‍යධර්මය අධිගමනයකරණ ලදී. **ගම්භීරො**-මහාසමුද්‍රයමෙන් ගැඹුරුය. **දුද්දසො**-ගැඹුරු හෙයින් ම දුකසේ දක්කයුතුය. **දුරනුබොධො**-දුද්දස හෙයින් සුවසේ අවබොධ නො කටහැකි වෙයි. **සන්තො**-(අනුපශාන්ත ස්වභාවවූ ක්ලේශයන්ගේ ද සංස්කාරයන්ගේ ද අභාවය හෙයින් සංසිඳුනාවූ සියලු රාගාදි දූවිලි ඇති බැවින්) නිවියේ වෙයි. **පණීතො**-තෘප්තියකට නො පැමිණෙන හෙයින් ප්‍රණීතය. **අතක්කාවචරො**-උත්තම ඥානයට විෂයවන හෙයින් තර්කයෙන් හෝ ආකාර පරිවිතර්කයෙන් හෝ බැසගත නො හැකිවෙයි. **නිපුණො**-සියුම් නුවණින් දතයුතුහෙයින් සණ්හසුඛුම වෙයි. **පණ්ඩිතවෙදනීයො**-අඥයන්ට අවිෂය හෙයින් සම්‍යක් ප්‍රතිපදාවෙහි යුක්ත වූවන් විසින් ම දතගතයුතු වෙයි. **සබ්බසඞ්ඛාර සමථො**- සියලු සංස්කාරයන්ගේ සමථය වෙයි. **ආලයරාමා**-ආලය සඞ්ඛ්‍යාත පඤ්චකාම ගුණයන් කරණකොට ගෙණ අභිරමණය කරන්නෝ වෙත්. **ආලයරතා**-පඤ්චකාමගුණයන්හි ඇලුනෝ වෙත්. **ආලයසම්මුදිතා**- පඤ්චකාමගුණයන්හි ප්‍රමුදිතවූවෝ වෙත්. **ඉදං**- (යො අයං) යම් මෙ යන අර්ථය දතයුතුයි. **ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො**-(ඉමෙසං පච්චයා, ඉදප්පච්චයා; ඉදප්පච්චයා එව ඉදප්පච්චයතා; ඉදප්පච්චයතාච පටිච්චසමුප්පාදො චාති ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො) අවිජ්ජාදි හෙතු ධර්මයන්ගේ ශක්තිය හෙතුකොට ගෙණ සඞ්ඛාරාදි ඵලධර්මයන්ගේ හට ගැණීම; **ඨානං**-පටිච්චසමුප්පාදය; **සබ්බසඞ්ඛාරසමථො**-(යත්‍ථ සබ්බෙ සඞ්ඛාරා සමමන්ති එතථාති සබ්බසඞ්ඛාර සමථො; යම් තැනකට පැමිණ සියලු සංස්කාරයෝ සංසිඳෙත් ද ඒ) නිර්වාණය; **සබ්බූපධිපටිනිස්සග්ගො**-(යම් තැනකට පැමිණ සියලු උපධීනු සමුච්ඡෙද වශයෙන් පරිත්‍යාග වෙත් ද ඒ) නිර්වාණය; **තණ්හක්ඛයො**-(යම් තැනකට පැමිණ සියලු තෘෂ්ණාව ක්ෂයවේද ඒ) නිර්වාණය; **කිලමථො**-කායගෙලන්‍යය; **විහෙසා**-කයට වෙහෙස; බොහෝ වේලාවක් එකතැන හිඳීමෙන් පිටරිදීම් ආදිවූ කායගෙලන්‍යය ද, බොහෝ වේලාවක් කථාකිරීමෙන් තලු වියලීම් වශයෙන් වන වෙහෙස ද ඇතිවන්නේය. **අපිස්සු**-මෙබඳු අදහස පමණක් ඇතිවූයේ නොවෙයි. මේ සම්පිණ්ඩනාර්ථයෙහි නිපාතයකි; **භගවන්තං**-භාග්‍යවතුන් වහන්සේට; පටියොග සාමි අර්ථයෙහි උපයොග වචනයි. **මං**-මා විසින්; **කිච්ඡෙන**-දුකසේ පාරමිත් සම්පූර්ණකිරීමෙන්; දුඃඛප්‍රතිපදාවෙන් යයි නො ගතයුතුයි බුදුවරුන්ගේ සිවුමඟම සුඛපටිපදාවෙයි. පෙරුම්දම් පුරද්දී බොධිසත්ත්වයෝ සරාගී සදොසී සමෝහීවූසේක් ම, ඒ ඒ දිගින් පැමිණියවුන්ට සරසා පිළියෙල කළ හිස් සිඳ දී, ලේ මුදා දී, ඇස් උපුටා දී, අඹුදරුවන් දී; අනිකෙකු විසින් නො කළහැක්කක් ම කළහ. අප්‍රමාණ වධබන්ධන ඉවසූහ. මෙසේවූ බොධිසත්ත්ව චර්‍ය්‍යාව සලකා දුකසේයයි කියනලදී. **අධිගතං**- අවබොධකළ ධර්මය; **ඉදානි**- දැන්; **පකාසිතුං**- දෙශනාකරණලද්දේද;

හලං - ඒකාන්තයෙන් නිෂ්ප්‍රයෝජන වේ. කුමක්හෙයින් ද, රාග දෝස පරේතෙහි - රාග දෝස මෝහයන් විසින් මැඩනලද සිත් ඇත්තවුන් විසින්; අයං ධම්මො මේ ධර්මය තෙමේ; න සුසම්බුධො - සුවසේ අවබෝධ නො කටහැක්කේ වෙයි. එහෙයිනි; ගම්භීරං - සමුද්‍රය සේ ඉතා ගැඹුරුවූ. දුද්දසං - දුකසේ දක්නාහැකිවූ; අනුං - (සියැස්වර පැලූ අස්වලෙක් මෙන්) ඉතා සියුම්වූ. පටිසොතගාමිං - (අනිච්ච, දුක්ඛ, අනත්ත, අසුභ, යන ලකුණු අනුව පවත්නා හෙයින්) පටිසොතගාමී නම් වූ චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මය; රාගරත්තා - (කාමරාග භවරාග දිට්ඨිරාග යන මේ) රාගයන් කරණකොට ගෙණ පඤ්චකාමයෙහි ඇලුනෝ; තමොඛන්ධෙන ආවටා - (එසේම) අවිජ්ජා රාශියෙන් මැඩගත් සිත් ඇත්තෝ; න දක්ඛින්ති - (අනිත්‍ය දුඃඛ අනාත්ම යන මොවුන්ගේ ස්වභාවය පරිදි) නො බලන්නාහුය. අප්පොස්සුක්කතාය - (ධර්මයෙහි ගම්භීරත්වය ප්‍රත්‍යවෙක්ෂාකිරීම් වසයෙන්ද, බ්‍රහ්මාරාධනයට අවකාශ තැබීම් වසයෙන් ද) මන්දෝත්සාහීබවට; සහම්පතිස්ස - සහම්පති නම් බ්‍රහ්මරාජයාට; මේතෙමේ කාශ්‍යප බුදුරදුන් කාලයෙහි සහක නම් තෙර නමක් වීය. එහිදී ප්‍රථම ධ්‍යානය උපදවා සැව ප්‍රථමධ්‍යාන භූමියෙහි කල්පායුෂ්ක බ්‍රහ්මයෙක්ව උපනි; බඹලොවදී මොහු සහම්පතී නමින් හැදිනගත්හ. පඨවියං නිහන්ත්වා - පොළොවෙහි දත ඔබාගෙණ; අප්පරජක්ඛජාතිකා - නුවණැසෙහි මඳවූ රාග දෝස මෝහ රජස්හති ඇත්තෝ; අස්සවණතා - (කාරණාර්ථයෙහි පවත්නා වචනයි.) ශ්‍රවණය නො කිරීම හෙතුකොට ගෙණ; පරිහායන්ති - විශෙෂාධිගමයෙන් පිරිහෙත්. ධම්මස්ස අඤ්ඤාතාරො - (පෙර බුදුවරුන් ලඟ කරණලද අධිකාර ඇති, එහෙයින් ම මේරූ කුසල් මුල් ඇති එක් ගාථාපදයක් නමුත් ශ්‍රවණයකිරීම් මාත්‍රය කින්ම) ධර්මය අවබෝධ කිරීමෙහි සමත්වූවෝ වෙත්. පුබ්බෙ - මේ බුදුරදුන් ලොව පහළවන්ට පෙර; සමලෙහි - රාගාදි කෙලෙස්මල සහිතවූ පූරණකස්සපාදී ශාස්තෘන් සදෙනා විසින්; චින්තිතො - සිතනලද්දවූ; අසුද්ධො ධම්මො - මිථ්‍යාදෘෂ්ටි ධර්මය; මගධෙසු - මගධ ජනපදයන්හි; පාතුරහොසි - පහළවීය. මොවුහු බුදුරදුන් ලොව පහළවන්ටත් පෙර ඉපද, බුද්ධකෝලාහලයේ පටන් ලොව පැවැති 'බුද්ධ' නාමයේ එල්බී ගෙණ, 'අපි බුදුවරුවෙමු' යි ලෝවැස්සා රවටා මුලුමහත් දඹදිව විෂ පතුරුවන්නාක් මෙන් මිථ්‍යාදෘෂ්ටිය පැතිරවූහ. ඒතං - මේ කාශ්‍යප බුදුරදුන්ගේ ශාසනාන්තර්ධානය පටන් පිහිතවූ; අමතස්ස ද්වාරං - ආර්යමාර්ග සංඛ්‍යාත නිර්වාණද්වාරය; අවාපුර - (ධර්මදෙශනා නමැති අතින්) විවෘතකළ මැනව. විමලෙන - (රාගාදි මලයන්ගේ අභාවය කාරණකොටගෙණ) නිර්මලවූ තථාගතයන් වහන්සේ විසින්; අනුබුද්ධං - අවබෝධකරණලද චතුරාර්‍ය්‍යසත්‍යධර්මය; සුණන්තු - (මේ සත්ත්වයෝ) ශ්‍රවණය කෙරෙත්වා; සෙලෙ යථා පබ්බත මුද්ධනිට්ඨිතො - එක ඝනවූ ශෛලමය පර්වත මුදුනෙහි යම්සේ සිටියේද; එසේ සිටියහුට හාත්පස පිහිටි ඒ ඒ දෙය දැකීම පිණිස ගෙල එසවීමක් උවමනා නො කෙරේ. සෑමැති පරිදි පෙණෙන හෙයිනි; සමන්තතො - හාත්පස; ජනතං - ජනසමූහයා; යථාපි පස්සෙ - යම්සේ දකීද; තථූපමං - ඒ ශෛලමය

පර්වතය උපමාකොට ඇත්තාවූ; ධම්මමයං-ලොකොත්තර ධර්මමය වූ; පාසාදං-පහයට; ආරුය්හ-නැගී; සුමෙධ-සුන්දරවූ ප්‍රඥාව ඇති, සමන්තචක්ඛු-භාග්‍යවතුන් වහන්ස; අපෙතසොකො-පහවූ සොක ඇතිසේක්; සොකාවතිණ්ණං-ශෝකයෙහි බැසගත්තාවූ; ජාතිජරාභිභූතං-ජාතිජරාවන් විසින් මැඩගත්; ජනතං-ජනසමූහයා; අවෙක්ඛස්සු-බලනු මැනවි. වීර-සතර සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ; විජිතසඞ්ගාම-දෙවපුත්ත, මච්චු, කිලෙස, අභිසඞ්ඛාර යන සිවුමරුන් දිනූ; සත්ථවාහ-ජාතිකාන්තාරාදියෙන් විනේජනයන් එතරකිරීමෙහි සමත්වූ හෙවත් නිර්වාණ නැමැති ක්ෂෙමභූමියට සත්වයන් පැමිණවීමෙහි සමත්වූ; අණණ- කාමච්ඡන්දාදි ණයරහිතවූ; භගවා:- භාග්‍යවතුන් වහන්ස; උට්ඨාහි-(මේ අසුනෙන් කයින් ද, මනොත්සාහයෙන් සිතින් ද, ධර්මදෙශනාකිරීම පිණිස) නැගීසිටිනු මැනවි. ලොකෙ-ලෙව්හි; විවර-හැසිරෙණු මැනවි. ධම්මං-ධර්මය; දෙසස්සු-දෙසනු මැනවි. අඤ්ඤාතාරො-ධර්මය අවබොධකරන්නෝ; භවිස්සන්ති- වන්නාහුය. අජ්ඣෙසනං-(ඉතා යටත්පහත්ව ලඟට පැමිණ ගරුතර ප්‍රයොජනයක් සලකා කළ) ආරාධනය; බුද්ධචක්ඛුනා-(ඉන්ද්‍රිය පරොපරියත්ත, ආසයානුසය ඥානසඞ්ඛ්‍යාත) බුදුඇසින්; අප්පරජක්ඛෙ-ප්‍රඥා නැමැති ඇසෙහි මඳවූ රාගාදි රජස් ඇති; මහාරජක්ඛෙ-ප්‍රඥා නැමැති ඇසෙහි බොහෝ වූ රාගාදි රජස් ඇති; තික්ඛින්ද්‍රියෙ-තියුණු වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියන් ඇති; මුදින්ද්‍රියෙ-මෘදුවූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇති; ස්වාකාරෙ-සුන්දරවූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇති; සුවිඤ්ඤාපයෙ-සුවයෙන් හඟවන්ටහැකිවූ; පරලොකවජ්ජභයදස්සාවිනො- පරලොවද වරදද භයවසයෙන් දක්නාසුලුවූ; උප්පලිනියං-(උප්පලානි එත්ථ සන්තීති) උපුල් විලක; පදුමිනී-හෙල පියුම්; පුණ්ඩරීකිනී-රත්පියුම්; උදකානුග්ගතානි- ජලයෙන් මතු පිටට නො පැමිණී; අන්තොනිමුග්ගපොසීනි දිය ඇතුළතම වැඩෙන; සමොදකං-දිය හා සමවූ; උදකා අච්චුග්ගම්ම- ජලය ඉක්මවා; තිට්ඨන්ති-(සූර්‍ය්‍යරශ්මි ස්පර්ශය බලාපොරොත්තුවෙමින්)සිටිත්. උදකෙන අනුපලිත්තානි-ජලයෙන් අලෙව් නුදුන්; මෙසේ උද්ඝටිතඥ, විපචිතඥ, ඥෙය, පදපරම යන පුද්ගලයන්ගේ වසයෙන් පද්මොපමාව දක්වන ලදී. සහම්පතිං ගාථාහි-සහම්පති බ්‍රහ්මයා නිමිත්තකොට වදාළසේක. පගුණං-ප්‍රගුණවූ; පණීතං-උතුම්වූ; ධම්මං-ධර්මය; විහිංසසඤ්ඤී-කාය වාක් ක්ලමථය පමණයැයි ඇතිවේය යන හැඟීම් ඇත්තේ; මනුජෙසු-සත්වයන් කෙරෙහි; න භාසිං-දෙශනාකරන්ට නො සිතුවෙමි. බ්‍රහ්ම-මහාබ්‍රහ්මය; සොතවන්තො-ඇසීමට කැමැත්තාවූ; යෙ-යම්කෙනෙක් වෙත්නම් ඔවුහු; සද්ධං-ශ්‍රද්ධා නැමැති භාජනය; පමුඤ්චන්තු-විවෘත කෙරෙත්වා; තෙසං-ඒ උපනිඃශ්‍රය සහිත සත්වයන්ට; අමතස්ස අමෘත සඞ්ඛ්‍යාත නිර්වාණයාගේ; ද්වාරා-ආර්‍ය්‍යමාර්ගසඞ්ඛ්‍යාත වාරයෝ; අපාරුතා-විවෘතයහ. අන්තරධායි- බුදුන්වහන්සේට හඳින් මලින් පුදා) අතුරු දන්වී බඹලොවට ගියේය.

බ්‍රහ්මායාචන කථා ගැටපදය නිමි.

**එතදහොසි-** (කවරෙකුට මම පළමුකොට ධර්මය දෙශනාකරන් නෙම්ද යන) මේ තර්කය පහළවිය. **ආළාරකාලාමො-** එනම් තවුසා; මේ තෙමේ උස්වූ සිරුරක් හා පිගුවන් ඇස් ඇත්තෙකි. 'ආළාර' යනු මොහුගේ නමයි. 'කාලාම' යනු ගොත්‍රයයි. **පණ්ඩිතො-**පාණ්ඩිත්‍ය යෙන් යුක්තයෙකි; සමාපත්ති ප්‍රතිලාභයෙන් සිද්ධවූ අධිගම බාහුසච්ච සංඛ්‍යාතවූ පාණ්ඩිත්‍යය මොහුට ඇත්තේය. **ව්‍යත්තො-**ව්‍යක්තයෙකි; සමාපත්තිප්‍රතිලාභයට පසයවූ පාරිහාරික ප්‍රඥාසංඛ්‍යාත ව්‍යක්තබව මොහුට ඇති; **මෙධාවී-**ස්ථානොචිත ප්‍රඥාවෙන් යුක්තයෙකි; **අප්පරජක්ඛජාතිකො-** (සමාපත්තියෙන් විෂ්කම්භිත කෙලෙස් හෙයින්) නිඃකෙලශී ස්වභාව ඇති පිරිසිදු අයෙකි. **ආජානිස්සති-** ප්‍රතිවෙධ කරන්නේය. **ඤාණං-**සර්වඥතාඥානය; **මහාජානියො-**මහත් පිරිහීම් ඇත්තෙකි; සත් දවසක් ඇතුළත ලැබියයුතු මාර්ගඵලයන්ගෙන් පිරිහුණෙකි. 'මහතී හානි යස්ස සො මහාජානි' මෙහි 'හානි' ශබ්දයාගේ 'හ' හට 'ජ' ආදෙශ විය. **උද්දකො රාමපුත්තො-** එනම් තවුසා; 'උද්දක' යනු ඔහුගේ නමයි. 'රාම' නම් තැනැත්තහුගේ පුත් හෙයින් 'රාමපුත්ත' නමි. **අභිදොසකාලකතො-** ඊයේ රාත්‍රියෙහි ප්‍රථම යාමයෙහිදී කළුරිය කරණලද්දේය. **බහූකාරා-**බොහෝ උපකාර ඇත්තෝය. **පධානපහිතත්තං-**ප්‍රධාන වීර්‍ය්‍යය පිණිස යොදනලද ආත්මභාවය ඇති; **උපට්ඨහිංසු-** (හුන් තැන් හැමදීමෙන්ද, පාසිවුරු ගෙණ පසුපස යාමෙන්ද, දැහැටි හා මුවදෝනා පැන් එළවීමෙන් ද) උපස්ථාන කළාහුය. **බාරාණසිං-**බරණැස් නුවරෙහි; මෙය කසීරටේ අගනුවරය. වරණා-අසී යන නදී වය අතර පිහිටි හෙයින් මේ නම විය. මහ බෝමැඩ සිට මේ නගරයට යොදුන් අටළොසෙකි. දම්සක් පැවැත්වූ තැන දම්සෝ රජතුමන් විසින් පිහිටුවනලද ශිලාස්තම්භයෙකි කොටසක් දැනුදු ශෙෂව තිබේ. **අන්තරා ච ගයං අන්තරා ච බොධිං-**ගයාවටද බෝමැඩට ද අතර; ගයාව, බෝමැඩින් තුන්ගව්වක් තැන නෙරඤ්ජරා නදිය බඩ පිහිටියේය. බ්‍රාහ්මණයන්ගේ පුණ්‍යතීර්ථස්ථානයක් ගයාව අසල නෙරඤ්ජරාවෙහි පිහිටියේය. එතැන 'ගයාතීර්ථ' නමින් ප්‍රකටය. අජාසත් රජහු විසින් දෙව්දත්තෙර හට කරවා දුන් විහාරයක් ද මෙහි පිහිටියේය. එය 'ගයාශීර්ෂ' නමි; **අද්ධානමග්ගං-** දීර්ඝ මාර්ගය; අඩයොදුනක් ඇති මඟ ද අද්ධානමග්ග සංඛ්‍යාවට වැටේ. ගයාවේ සිට බෝමැඩට දුර තුන්ගව්වකි. එහෙයින් 'අදන්මඟ'යි යෙදිනි. **විප්පසන්නානි-**මනා ප්‍රසන්නයහ. **ඉන්ද්‍රියානි-**මනස සවැනි කොට ඇති ඉන්ද්‍රියයෝ; **සබ්බාභිභූ-**සියලු ත්‍රෛභූමික ධර්මයන් අභිභවනය කොට සිටියේ; **සබ්බවිදූ-**සියලු චාතුර්භූමික ධර්මයන් දන්නා සුල්ලෙක් වූයේ; **සබ්බෙසු ධම්මෙසු-** සියලු ත්‍රෛභූමික ධර්මයන්හි; **අනූපලිත්තො-** රජ්ජන, දුස්සන, මුය්හන ආදීවූ කෙලශ ආලෙපයෙන් ආලෙප නොකරණලද්දේ; **සබ්බඤ්ජහො-** සියලු ත්‍රෛභූමික ධර්මයන් දුරුකොට සිටියේ; **තණ්හක්ඛයෙ විමුත්තො-** නිර්වාණය කෙරෙහි අරමුණුකිරීම් වශයෙන් මිදුනේ; **හමස්මි-**වෙමි. **සයං අභිඤ්ඤාය-**(සියලු චාතුර්භූමික ධර්මයන්) තෙමේ ම දැනගෙණ; **කමුද්දිසෙය්‍යං-**(මාගේ ගුරුවරයායයි)

අන් කවරෙකු උදෙසම්දැ? **මෙ**-මට; **ආචරියො න අත්ථි**-(ලොකොත්තරධර්ම විෂයෙහි) ඇදුරෙක් නම් නැත. **මෙ**-මට; **සදිසො**-සදෘශයෙක්ද; **න විජ්ජති**-විද්‍යමාන නොවෙයි. **සදෙවකස්මිං ලොකස්මිං**-දෙවියන් සහිත ලෝවැස්සා අතුරෙහි; **මෙ**-මට; **පටිපුග්ගලො**-සීලාදි ගුණයන් ගෙන් තුල්‍ය ස්වරූපවූ පුද්ගලයෙක්ද; **නත්ථි**-නැත; **අහං හි**-මම වනාහි; **ලොකෙ**-ලෙව්හි; **එකො**- හුදකලාවූ; **අරහා**- ක්ෂීණාශ්‍රවයා වෙමි; **සත්ථා**-ශාස්තෘවරයා වෙමි; **අනුත්තරො**- නිරුත්තරයා වෙමි. **සම්මා සම්බුද්ධො**- මනාකොට හෙතුක්‍රමයෙන් චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මය ස්වයං බුද්ධ වෙමි. **සීතිභූතො**-සියලු කෙලෙස් ගිනි නිවීයාමෙන් සිහිල්වූයෙක් වෙමි. **නිබ්බුතො**- කෙලශයන් නිවියග හෙයින් නිවියෙක් වෙමි. **අන්ධභූතස්මිං**- අවිද්‍යාවෙන් අන්ධවූ; **ලොකස්මිං**- ලෝවැස්සා කෙරෙහි; **ධම්මචක්කං**- දහම්සක; **පවත්තෙතුං**- පවත්වන්නට; **අමතදුන්දුභිං**- අමාබෙරය; **ආහඤ්ඡිං**- ගසන්නෙම් යි; **කාසිනං පුරං**- බරණැසට; **ගච්ඡාමි**-යමි. විනෙය්‍යජනයන්ට අමෘතාධිගමය පිණිස උද්ඝොෂණය කෙරෙණ හෙයින් සද්ධර්මදෙශනාව අමතදුන්දුභි නම්. **අරහසි අනන්තජිනො**-අනන්තජිනයයි වන්නාටද සුදුස්සෙහිය; 'අනන්තජින' යනු ඔහුගේ මුල් ශාස්තෘවරයාගේ නාමයයි. **ආසවක්ඛයං පත්තා**-ආශ්‍රවක්ෂයට පැමිණියාවූ; **යෙ ජිනා හොන්ති**-යම් ජිනකෙනෙක් වෙත්ද; **තෙ**-ඔවුහු: **වෙ**-ඒකාන්තයෙන්; **මාදිසා**-මා වැනියෝ වෙත්. **මෙ**-මා විසින්; **පාපකා ධම්මා**-ලාමක අකුශලධර්මයෝ; **ජිතා**-දිනනලද්දාහුය. **උපකා**- උපකය; **තස්මා**-එහෙයින්; **අහං**-මම; **ජිනො**- ජින වෙමි. **හුවෙය්‍ය පාවුසො**-(හුවෙය්‍ය අපි ආවුසො) ඇවැත්නි, මෙසේද වන්නේය; මෙබඳු රූපකාය රත්නය මෙවැනි නුවණකින් ද යුක්තවිය යුතුය යනු අදහසයි. මෙය ම ඔහුට පැවිද්දට පසයවිය. ඒ තෙමේ වනාහි පෙර බුදුන්කල කරණලද අධිකාර ඇත්තෙකි. එහෙයින් බුදුරජානන් වහන්සේ ඔහු හා සමාගමය පිණිස පයින් ම ඒ මගට පිළිපන්සේක. **සීසං ඔකම්පෙත්වා**-මදක් කම්පාකොට, වනා; **උම්මග්ගං**-අන්මගක්; **පක්කාමි**-(වඞ්ගහාර ජනපදයට) ගියේය. මේ දනව්ව වනාහි වඞ්ගදෙශයේ ප්‍රත්‍යන්තයකි. උපක තෙමේ ඒ දනව්වෙහි වූ වැදිගමකට පැමිණ 'අභීපාල' නම් රහතෙකැයි තමා හඟවා එහි දෙටු වැදිපුරුෂයාගෙන් උවැටන් ලැබීය. ඉක්බිති මදකලකින් ඔහුගේ දුවද සරණපාවාගති. නැවත ඈ කෙරෙහි කලකිරී බුදුරදුන් කරා එළඹ පැවිදිවී විදසුන් වඩා අනාගාමී ඵලයට පැමිණියේ එයින් සැව අවිහ නම් බඹලොව උපනි. උපන් සොණෙහි ම රහත්බවට පැමිණියේය. **සණ්ඨපෙසුං**- (නොවැඳියයුතුය යනාදි වශයෙන්) නියමකරගත්තාහුය. **බාහුලිකො**- චීවරාදි ප්‍රත්‍යයන්ගේ බහුලභාවය පිණිස පිළිපන්නෝ; **පධාන විබ්භන්තො**-ප්‍රධාන වීර්‍ය්‍යයෙන් හෙවත් දුෂ්කරක්‍රියාවෙන් පිරිහුණේ; **ආවත්තො බාහුල්ලාය**- චීවරාදීන්ගේ බහුලබව පිණිස වැටුනේ; **අපි ච ඛො ආසනං ඨපෙතබ්බං**- එහෙත් උසස් කුලයෙහි උපන් මොහුට අසුනක් පමණක් තැබිය යුතුයි. **අසණ්ඨහන්තා**-(බුද්ධානුභාව

යෙන් බුද්ධතෙජසින් අභිභූතවූවාහු) සවකීය කතිකාවෙහි සිටින්ට නො හැකිවූහ; නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරන්ති-ගෞතම යන නාමයෙන් ද ඇවත යන වචනයෙන් ද කථාකරත්. ඇවැත් ගෞතමය, දුෂ්කරක්‍රියා කාලයෙහි අපි තුඹගේ පාසිවුරු ගෙණයමින් හැසුරුණෙමු. මුවදෝනා පැන් හා දැහැටිදඬු එලවා දුනිමු. ආවාසයත්හි කැළිකසළ හැමැද්දෙමුයි කථාකරත්. න චිරස්සෙව-නොබෝකල කින් ම; කුලපුත්තා- කුලපුත්‍රයෝ; ජාතිකුලපුත්ත ආචාරකුලපුත්ත වසයෙන් කුලපුත්‍රයෝ දෙදෙනෙකි. මොවුහු වනාහි දෙපරිද්දෙන් ම කුලපුත්‍රයෝමය. අගාරස්මා- කුලගෙයින්; අනගාරියං-ශාසනයෙහි; අගාරස්ස හිතං අගාරියං' කුටුම්බපෝෂණයයි. 'නත්ථි එත්ථ අගාරියං'ති අනගාරියං' ශාසනයයි; බ්‍රහ්මචරියපරියොසානං- මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යා වගේ පර්‍ය්‍යවසානය වූ අර්හත්ඵලය; දිට්ඨෙව ධම්මෙ-මේ අත්බැව්හි; සයං අභිඤ්ඤා සච්ඡිකත්වා-පරප්‍රත්‍යය රහිතව ස්වකීය ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට; ඉරියාය-දුෂ්කරක්‍රියාව පිළිබඳවූ ඉරියව්වෙන්; පටිපදාය-ඒ ප්‍රතිපත්තියෙන්; දුක්කරකාරිකාය-(පසත පසත මුගුපුසාදිය ගැණීම් සඞ්ඛ්‍යාත) දුෂ්කරක්‍රියා කරණයෙන්; උත්තරිමනුස්සධම්මා-මනුෂ්‍ය සවභාවයෙන් මත්තෙහිවූ; අලමරියං-ආර්‍ය්‍යභාවයට සුදුසුවූ; ඤාණ දස්සනං-(දිබ්බචක්ඛු, විපස්සනා, මග්ග, ඵල, පච්චවෙක්ඛණඤාණ, සබ්බඤ්ඤුතඤාණ සඞ්ඛ්‍යාත) ඥානදර්ශන විශෙෂය; අභිජානාථ මෙ නො-(අභිජානාථ නො මෙ) තොප-මාගේ; අභිජානාථ නු-නො දන්නහු ද? එවරූපං භාසිතමෙතං-මෙබඳුවූ මේ වාක්‍ය ප්‍රභෙදය; නො හෙතං භන්තෙ-(ඔවුහු ඒ වචනමාත්‍රයෙන් සිහිකළැබූවෝ භක්තියෙන් යුක්තවූ සිත් ඇත්තෝ ඒකාන්තයෙන් ම මේ තෙමේ බුද්ධත්වයට පැමිණියේයයි ඇදහූවෝ) නැත ස්වාමීනියි කීවාහුය. අන්තා-භාගයෝ; මෙය වදාරණකල පැවැති නිර්ඝෝෂය යටින් අවීචිය තෙක්ද, උඩින් භවාග්‍රය තෙක් ද පැතිර සිටියේය. පබ්බජිතෙන ගිහි බැඳුම් සිඳ පැවිදිවූවහු විසින්; කාමෙසු කාමසුඛල්ලිකානුයොගො- වස්තුකාම විෂයෙහි ක්ලෙශකාම සුඛයාගේ අනුභවය; මෙහි ප්‍රථම කාම ශබ්දයෙන් වස්තු කාමය ද ද්විතීය කාම ශබ්දයෙන් ක්ලෙශකාමය ද ගතයුතුයි. හීනො-ලාමකය; ගම්මො-ග්‍රාම්‍යය; ගම්වැසියන් විසින් යෙවියයුතු ය; පොථුජ්ජනිකො-පෘථග්ජන සඞ්ඛ්‍යාත අඳබාල් ජනයන් විසින් පුරුදු කරණ ලද්දකි; අනරියො-ශ්‍රෙෂ්ඨ නුවූවකි, අනත්ථසංහිතො- හිත සුව එළවන කාරණයක් ඇසුරු නොකරණලද්දකි; අත්තකිලමථානු යොගො-තමාහට දුක් උපදවන්නාවූ කණ්ටකසයනාදීන්ගේ අනුයොගය; දුක්ඛො-දුක් එළවන්නකි. උභො අන්තෙ-දෙ අන්තය වෙත; ලොභය හෝ සස්සතය එක් අන්තයකි; ද්වෙෂය හෝ උච්ඡෙදය එක් අන්තයකි; මජ්ඣිමා පටිපදා-මධ්‍යම ප්‍රතිපදාව; දෙ අන්තයට නො පැමිණ මධ්‍යයෙහි වූ හෙයින් මජ්ඣිම නම්. සතරදුකින් එතෙරවනු කැමැත්තවුන් විසින් පිළිපැදියයුතු හෙයින් පටිපදා නම්. ආර්‍ය්‍යමාර්ගය සඳහා කියනලදී. චක්ඛුකරණී-පැණැස ඇතිකරණී; චතුරාර්‍ය්‍යසත්‍ය යන් දැකීම පිණිස පවත්නුයි පැණැස චක්ඛු නම්. 'ඤාණකරණී' යනු ද

මීට ම පර්‍යාය වචනයි. උපසමාය-කෙලෙසුන්ගේ ව්‍යුපසමය පිණිස; අභිඤ්ඤාය- චතුරාර්‍ය්‍යසත්‍යයන් දැනගැනීම පිණිස; සම්බොධාය- චතුරාර්‍ය්‍යසත්‍යයන්ගේ මනා අවබෝධය පිණිස; නිබ්බානාය-නිර්වාණය ප්‍රත්‍යක්‍ෂකිරීම පිණිස; හෙවත් අනුපධිශෙෂ නිර්වාණය පිණිස; 'උපසමාය' යන්නෙන් උපධිශෙෂ නිර්වාණය ගතයුතුයි. සම්මාදිට්ඨි- ඥානය; සම්මා සංකප්පො-විතර්කය; සම්මාවාචා-(සම්මාවදන්ති එතාය) සම්‍යක් වචනය; සම්මා කම්මන්තො-(සම්මා කරෙති එතෙන) සම්‍යක් කර්මාන්තය; සම්මා ආජීවො (සම්මා ආජීවන්ති එතෙන) සම්‍යක් ආජීවය; සම්මා වායාමො-(සම්මා වායමන්ති) සම්‍යක් ව්‍යායාමය; සම්මාසති- සම්මා අනුස්සරතීති සම්‍යක් ස්මෘතිය; සම්මාසමාධි-(සම්මාසමාධියති චිත්තං එතෙන) සම්‍යක් සමාධිය; ජාතිපි දුක්ඛා- (ඒ ඒ සත්ත්ව භවයෙහි උපදිනු ලබන්නාවූ සත්වයන්ගේ හැමට පළමුවෙන් ඇතිවන රූපාරූප ධර්මයන්ගේ පැවැත්ම ජාතිනමු. ඒ) ජාතිය වනාහි ඒ ඒ භවයෙහි ඇති වන දුක්ඛාදීන්ට වස්තුවන බැවින් දුක්වෙයි. සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා- උපාදානස්කන්ධ පස; දුක්ඛදුක්ඛ, විපරිණාම, සංඛාරදුක්ඛ වශයෙන් දුක්ය; පොනොබ්භවිකා-(පුනබ්භව කරණං පුනබ්භවො, මෙහි උත්තර පදලෝපය වීය. පුනබ්භවො සීලං එතිස්සාති පොනොබ්භවිකා) නැවත භවය ගෙණදීම ස්වභාවකොට ඇති; නන්දිරාගසහගතා- නන්දිරාගය සමග යෙදුනේ; රූපාදීන් කෙරෙහි සිත ඇලවීම නන්දි නම්. ඒ සිත් ඇලවීම ම රාගයනුයි නන්දිරාග නම්. මෙය භාවප්‍රධාන වශයෙන් අරුත් ගතයුතුයි. තත්‍ර තත්‍ර- ඒ ඒ භවයෙහි; කාමතණ්හා- රූපාදි ආරම්මණෙහි කාමාස්වාද වශයෙන් පවත්නා ආශාව; භවතණ්හා- ශාස්වත දෘෂ්ටිය සමග පවත්නා ආශාව; විභවතණ්හා-උච්ඡෙද දෘෂ්ටිය සමග පවත්නා ආශාව; අසෙසවිරාගනිරොධො-(අසෙසාය සබ්බාය තණ්හාය විරාගො ච නිරොධො ච යෙන හොති සො) නිර්වාණය; ඉතිරි රහිත කොට සියලු තෘෂ්ණාවන්ගේ විරාගය ද නිරොධය ද යමක් කාරණකොට ගෙණ සිදුවේ නම් එයයි; චාගො-(යස්මා ච තං ආගම්ම තණ්හං වට්ටං ච වජතීති) නිවණ; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු- මෙයින් පෙර නො අසනලදවිරූ චතුරාර්‍ය්‍යධර්මයන්හි; චක්ඛුං-ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දැකීම් අර්ථයෙන් ඥානයම චක්ඛු නම්. ආලොකො- මොහාන්ධකාරය නසා ආලොකකරණාර්ථයෙන් ඥානය ම ආලොක නම්. යාවකීවඤ්ච- යම් පමණ කලක්; තිපරිවට්ටං- (සච්චඤාණ, කිච්චඤාණ, කතඤාණයයි කියනලද) ත්‍රිපරිවර්තනයන්ගේ වශයෙන්වූ ඥානදර්ශනය; දුක්ඛාදි චතුරාර්‍ය්‍යසත්‍යය විෂයෙහි පවත්නා යථාභූත ඥානය සච්චඤාණ නම්. පරිඤ්ඤෙය්‍ය, පහාතබ්බ, සච්ඡිකාතබ්බ, භාවෙතබ්බ යන ක්‍රමයෙන් ඒ ඒ සත්‍යය පිළිබඳව කටයුතු දෙය දැනීම් වශයෙන් පවත්නා ඥානය කිච්චඤාණ නම්. පරිඤ්ඤාත, පහීණ, සච්ඡිකත, භාවිත වශයෙන් ඒ ඒ කෘත්‍යයන් කොට නිමකළ බැව් දැනීම් සඞ්ඛ්‍යාත ඥානය කතඤාණ නම්. ද්වාදසාකාරං-(ඒ එක එක සත්‍යයක් තුන් තුන් අයුරින් පවත්නාවූ) අයුරු දොළස; ඤාණදස්සනං-

(මේ තිපරිවට්ට වාදසාකාරයන් දැනීම් සඞ්ඛ්‍යාත) ඤාණය; අනුත්තරං සම්මා සම්බොධිං-ප්‍රසස්තවූ සම්‍යක්සම්බෝධිය; බුදුරදුන්ගේ අර්හත් මාර්ගය මෙයින් අදහස්කරණලදී. ශ්‍රාවකයන් පිළිබඳවූ අර්හත්මාර්ගය අනුත්තර සඞ්ඛ්‍යාවට ඇතුළත් නොවේ. සියලුම ගුණවලින් අපරිපූර්ණ හෙයිනි. ඇතැම් සවුවන්ට අර්හත්මාර්ගය අර්හත්ඵලය පමණක් ගෙණ දෙයි. ඇතැම් කෙනෙකුන්ට ත්‍රිවිද්‍යාවන් ද, ඇතැම් කෙනෙකුන්ට අභිඤ්ඤා ද, කිසිකෙනෙකුන්ට චතුපටිසම්භිදා ද, ඇතැම් කෙනෙකුන්ට ශ්‍රාවකපාරමී ඤාණය ද ගෙණදෙයි. පසේබුදුවරුන්ට පච්චෙක බොධිඤාණය පමණක් දෙයි. ලොවුතුරා බුදුවරුන්ට සියලු ගුණ සම්පත්තිය සලසාදෙයි. අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං-'මම අභිසම්බුද්ධ වෙමි'යි පිළිපන කෙළෙමි. ඤාණං ච පන මෙ දස්සනං උදපාදි- සියලු අධිගත ගුණයන් දැනීමට සමත්වූ පච්චවෙක්ඛණඤාණය ද පහළවිය. අකුප්පා මෙ චෙතො විමුත්ති-මාගේ අර්හත්ඵල විමුත්තිය ප්‍රතිපක්ෂයන් විසින් කොපතය නොකටහැකිය යන ඤාණය ද පහළවිය. අන්තිමා-පශ්චිම; නත්ථිදානි පුනබ්භවො-දැන් නැවත අනික් භවයක් නම් නැත; ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං-මේ නිර්ගාථක සූත්‍රය; 'නිග්ගාථකං ච සුත්තං පුච්ඡා විස්සජ්ජන සහිතං වෙය්‍යාකරණන්ති වුච්චති' පුච්ඡාවිස්සජ්ජන සහිතවූ වෛය්‍යාකරණය නිගාථකසූත්‍ර නම්. භඤ්ඤමානෙ-දෙශනාකරණලබන කල්හි; විරජං-අපායගමනීය රාග රජස් ආදීන්ගේ විගමනය වූ; වීතමලං- අනවශෙෂ දිට්ඨි විචිකිච්ඡා මලාපගමනය වූ; ධම්මචක්ඛුං-(චතුරාර්යසත්‍ය ධර්මයන් අතුරෙන් චක්ෂුස් කෘත්‍යයකරණ හෙයින්) ශ්‍රොතාපත්තිමාර්ග ඥානය; සද්දමනුස්සාවෙසුං-(නානා මිථ්‍යාපටල නමැති අඳුරු දුරුවීයාමෙන් ලබකළද ආලොකය ඇත්තාහු, එසේම අපායභය පහවීයාමෙන් ආස්වාදය පතන්නාහු) එකපැහැර සාධුකාර දුන්හ. ඔභාසො- (සර්වඥතාඥානානුභාවයෙන් පැවැත්තාවූ චිත්තපච්චය උතුසමුට්ඨානවූ දශසහස්‍ර ලොකධාතුවෙහි පැතිරසිටි ආලොකය; මෙය දෙවියන්ගේ දෙවානුභාවය ද ඉක්ම පැවැත්තේය. දිට්ඨධම්මො-(දිට්ඨො අරියසච්ච ධම්මො එතෙන) දක්නා ලද චතුරාර්යසත්‍යය ධර්මය ඇත්තේ; තිණ්ණවිචිකිච්ඡො- තරණය කරණලද විචිකිච්ඡා ඇත්තේ; වෙසාරජ්ජප්පත්තො- (සාරජ්ජකරවූ පාපධර්මයන් ප්‍රහීණවූ බැවින්ද, තත්ප්‍රතිපක්ෂවූ ශීලාදි ගුණධර්මයන්හි පිහිටි බැවින්ද) විශාරදබවට පැමිණියාවූ; අපරප්පච්චයො- (තමන් ප්‍රත්‍යක්ෂ වශයෙන් අධිගත හෙයින් අයලින් බලාපොරොත්තු වියයුතු යමක් නොමැති; එහි-ලැබගණුව; ආයාචිත පැවිදි උපසම්පදාවන්ට අනුමත බැව් හෙලිකරණ වචනයකි. චර බ්‍රහ්මචරියං-උපරිමාර්ගත්‍රය සඞ්ඛ්‍යාත බ්‍රහ්මචර්යය අධිගමනය කරව; උපසම්පදා-ලෞකික සම්පත්තියෙන් උපරිභාවයෙහි සිටි ශ්‍රෙෂ්ඨවූ සම්පත්තිය; නීහාරභත්තො- (භික්ෂූන් විසින් ගමින්) ගෙණවුත් දෙනලද ආහාර ඇත්තේ; ඡබ්බග්ගො-බුදුරදුන් හා පස්වග භික්ෂූන්දැයි යන සතම; අනත්තා- (අවසානයෙහි පවත්නා හෙයින්ද, අස්වාමික අර්ථයෙන්ද, ශූන්‍යාර්ථයෙන්ද, ආත්ම ප්‍රතික්ෂෙපාර්ථයෙන්දැයි යන සතර කරුණින්) අනාත්

මිය; උපන් රූපය වැඩීමට නොයේවා, වැඩුණු රූපය නො දිරාවා, දිරූ රූපය නො බිඳේවා, උදයව්‍යය වශයෙන් නො පෙළේවායි මෙවැනි කිසිවෙකුගේ වසිබව්කොට නො පැමිණේ. ස්වාමිවූ කිසිවෙක් ද නැත. කාරකවේදකයෙකු නොමැති බැවින් ශූන්‍යතා වෙයි. පරපරිකල්පිත ආත්මස්වභාවාභාවයම ආත්මප්‍රතිපක්ෂාර්ථකර වෙයි. විපරිණාමධම්මං-ජරාමරණාදි වශයෙන් පෙරළෙන සුලු; කල්ලංනු- සුදුසු දැ? එතං මම-'මෙය මාගේ'යයි තෘෂ්ණා වශයෙන් ද; එසො හමස්මි-'මේ මම වෙමි' යි මානවශයෙන් ද; එසො මෙ අත්තා'-මේ මාගේ ආත්මය'යි දිට්ඨි වශයෙන්ද; අතීතානාගත පච්චුප්පන්නං- අතීතානාගත පච්චුප්පන්න ප්‍රභෙදවූ; අතීතරූපය අද්ධා, සන්තති, සමය, ඛණ වශයෙන් චතුර්විධ වේ. අනාගත පච්චුප්පන්න වයද මෙසේම ප්‍රභෙදවෙත්. රූපය පිළිබඳවූ එක් භවයක ප්‍රතිසන්ධියෙන් පූර්වයෙහි වූයේ අතීතාද්ධය ය. චුතියෙන් මත්තෙහි වූයේ අනාගතාද්ධය ය. මෙදෙපුරෙහි වූයේ පච්චුප්පන්නාද්ධය ය. රූපයාගේ සන්තති වශයෙන් ඍතුසමුට්ඨාන සහ ආහාරසමුට්ඨාන වය පුබ්බාපරිය වශයෙන් පවත්නේ පච්චුප්පන්න නම්. ඉන් පූර්වයෙහි විසභාගවූ ඍතු ආහාරසමුට්ඨාන වය අතීත නම්. මතුවන්න අනාගත නම්. එකවීථි එකජවන එකසමාපත්ති සමුට්ඨානවූ සිය වර්තමාන නම්. ඉන් පූර්වයෙහි වූයේ අතීත නම්. මතුවන්නා අනාගත නම්. කර්මය පිළිබඳව පවත්නා අතීතාදි භේදයක් නොමැත්තේය. අජ්ඣත්තං-ආධ්‍යාත්මිකවූ රූපය; චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය යන පසාදරූපය මෙහි ඇතුළත්වේ. බහිද්ධාරූපං-එයින් බාහිරවූ රූපය; සුවිසිරූපයන්ගෙන් අන්‍යවූ සොළොස; ඔළාරිකරූපං-ඖදාරිකරූපය; චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, රූප, සද්ද, ගන්ධ, රස, පඨවි, ආපො, තෙජො, වායො යන දොළොස; සුඛුමරූපං-සියුම් රූ; ඖලාරිකයන්ගෙන් අන්‍යවූයේ සුඛුමරූප නම්. හීනං පණීතං-අකනිට්ඨක බඹුන්ගේ රූපයට වඩා සුදස්සී බඹුන්ගේ රූපය හීනවෙයි. සුදස්සී බඹුන්ගේ රූපයට වඩා අකනිට්ඨක බඹුන්ගේ රූපය ප්‍රණීත වෙයි. හීනප්‍රණීත භෙදය මේ ක්‍රමයෙන් සැලකිය යුතුයි. තැනකොත් යම් රූවක් අරමුණුකොට ගෙණ අකුශල විපාක විඥානය උපදීද එය හීනරූප නම්. යම් රූවක් අරමුණුකොට ගෙණ කුශලවිපාක විඥානය උපදීද, ඒ ප්‍රණීත නම්. දූරෙ- (අඳුනා නොගතහැකි තරම්) දුරෙහි පිහිටියේ; සන්තිකෙ-(සුවසේ අඳුනාගතහැකිතරම්) සමීපයෙහි පිහිටියේ; නිබ්බින්දති-කලකිරෙයි; මෙහි උට්ඨානගාමිනී විපස්සනාව කියනලදී. විරජ්ජති-නො ඇලෙයි. මෙයින් චතුර්විධ මාර්ගය කථිතය; විමුච්චති-මිදේ; පටිප්පස්සද්ධි විමුක්තිය මෙහි කියනලදී. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං-මිදුනු කල්හි මිදුණේය යන ඥානය; මෙහි ප්‍රත්‍යවෙක්ඛණඥානය කියනලදී. ඛීණා-ක්ෂය කරණලදී. [illegible]-දුනී; මාර්ගභාවනාවෙන් ප්‍රහීණවූ ක්ලේශයන් [illegible] විද්‍යමානවූ කර්මය මත්තෙහි ප්‍රතිසන්ධිය ගෙනදීමට සමර්ථ නොවේයයි දතියි; වුසිතං බ්‍රහ්මචරියං-මාර්ගබ්‍රහ්මචර්‍යය; කල්‍යාණ පෘථග්ජනයන් සමග සප්තවිධ

මෙහෙසුන්ගේ මාගීබුහමචයසීවෙයි හැසිරෙත්. කතං කරණීයං-කටයුතු දෙය කරණලදී. චතුරාය්‍යසත්‍යයන්හි සිවුමගින් කටයුතු වූ පරිඥා ප්‍රහාණ, සච්ඡිකිරියා, භාවනා වසයෙන් දුය්වෙත සොලොස් වැදෑරුම් කිස නිමවිකලදී. නාපරං ඉත්ථත්තාය-මේ බව පිණිස අන් කිසක් නැත. සොලොස් වැදෑරුම් කිස පිණිස හෝ කෙලෙශයන්ගේ ක්ෂයකිරීම පිණිස හෝ මාගීභාවනා කිසක් මට නැත යන අරුතයි. හෙමන්තිකො-(හෙමන්තං අරහතීති) හෙමන්ත කාලයෙහි විසීමට සුදුසුවූ; ඉල් අවපෑල විය පටන් මැදින් අව පැලවිය දක්වා අතර සිවුමස හෙමන්තකාලය වේ. ගිම්හිකො-ගිම්හාන කාලයෙහි වාසයට සුදුසුවූ; මැදින් මස අව පෑල විය පටන් ඇසල අවපෑලවිය දක්වා අතර සිවුමස ගිම්හාන කාලයයි. වස්සිකො-වස්සාන කාලයෙහි විසීමට යොග්‍යවූ; ඇසල අවපෑලවිය පටන් ඉල් අවපෑලවිය දක්වා අතර සිවුමස වස්සාන කාලයයි. නිප්පුරිසෙහි-පුරුෂයන් විරහිතවූ; තූර්‍ය්‍යවාදනය පමණක් නොවෙයි. දෙවාරිකාදී සියලු කිසම එහි ස්ත්‍රීහු කරති. පරිචාරයමානො-ඒ ඒ කාමගුණයෙහි ඉන්ද්‍රියයන් හසුරුවන්නහුට; කණ්ණෙවෙඨ-කිසිල්ලෙහි; ආලම්බරං පතාබෙරය; විකිණ්ණකෙසිකං- මිදුනු හෙවත් අවුල්වූ කෙශ කලාපය ඇති; විකොබ්බලිකං-මුව දෙකොණින් ගලන කෙළදලු ඇති; විප්පලපන්තියො-වියරු දෙඩන්නියෝ නොහොත් අඩන්නියෝ; සුසානං මඤ්ඤෙ- අමුසොහොනක මෙන්; අද්දස-(පරිජනයා) දිටී. උදානං උදානෙසි-සංවෙගයට අනුකූලවූ තෙපුල් කියමින. උපද්දුතං-ක්ලෙශාදිවූ කෙලෙශයන් විසින් උපද්‍රුතය; උපස්සට්ඨං-දුකින් මිශ්‍රය; ඉදං මෙ යස- යසකුලපුත්‍රය තිවණ වනාහි; ආදීනවං-දොෂය; ඔකාරං-ලාමකබව; සංකිලෙසං-කෙලෙසිලි සහිතබව; කල්ලචිත්තං-(කාමච්ඡන්ද නීවරණයෙන්) නිරෝගවූ සිත් ඇති; මුදුචිත්තං-(ව්‍යාපාද නීවරණයෙන්) මෘදුවූ සිත් ඇති; විනීවරණචිත්තං-(උද්ධච්ච කුක්කුච්ච නීවරණයෙන්) නො මැඩුනු සිත් ඇති; උදග්ගචිත්තං- (ථිනමිද්ධ නීවරණ යෙන්) නො හැකුළුනු සිත් ඇති; පසන්නචිත්තං-(විචිකිච්ඡා නීවරණ යෙන් සම්‍යක් ප්‍රතිපත්තියෙහි බැසගත් හෙයින්) ප්‍රසන්නවූ සිත් ඇති, සාමුක්කංසිකා-තමන් විසින් ම ඔසවා තබන ලද්දවූ; ධම්මදෙසනා-චතුරාය්‍යසත්‍ය ධර්මදෙශනාව; අපගතකාලකං- පහවගිය කාලුෂ්‍යය ඇති; රජනං-නිලපීතාදි රඞ්ගජකය; සම්මදෙව ආහණෙ-ඒ නිසජ්ජාපෙනකිදීම; දෙ ආභ භූතා-අපූත් නැගි භූතයන්; ඉද්ධාභිසංඛාරං-ඍද්ධික්‍රියාවක්; අභිසංඛරි-කොළේය; පච්ඡාසමයගමනසි- අත්හළේය. එහි හුන් සිටු ගැහැවි තොමෝ යම්සේ එයිම හුන් යසකුලපුත්‍ර දකීද එසේ අධිෂ්ඨාන කෙළේය.

යස පබ්බජ්ජා කථා වැණුම්දෙස නිමි.

---

ගිහිසහායකා ප්‍රාණිං- පෑතුමෙයන් ගත් අත් ඇති; වලඤ්ජා පංසෙම පිරිසිදු කොට තබා වැඩිහුන්; සෙට්ඨානුසෙට්ඨීනං කුලානං- සිටුවරුද අනුසිටුවරුද ඇති කුලවල මහතොස් පිළිවෙළින් සිටුතනතුරු ලැබූ කුලවල; ඔරකස්මිං-පහත් රැවුල්: කාසායානි වත්ථානි- (බඹසර හැසිරෙන්නාවුන්ට අනුදන වදාළ) කසට පෙවූ වත්.

යස සහායක පබ්බජ්ජා කථා වැණුම්දෙස නිමි.

මා එකෙන ද්වෙ අගමිත්ථ- එක මගකින් දෙනමක් ගමන් නො කරව්; එක් මගකින් දෙනමක් ගියකල්හි, එක් නමක් දහම්දෙසන කල්හි එක් නමක් නිශ්ශබ්ද වියයුතු හෙයිනි. මාරො-මාරතෙමේ; තමන් විෂය ඉක්මවන්නට පිළිපන්නවුන් නසාතුයි මාර නම්. පාපිමා- පව් ඇති; පවෙහි තමන් ද යෙදී අනුන් ද යොදවාතුයි පාපිමතු නම්. දිබ්බා-දිව්‍ය කාමගුණ සඞ්ඛ්‍යාතවූද; මානුසා-මනුෂ්‍ය කාමගුණ සඞ්ඛ්‍යාතවූද; යෙ-යම් කෙලෙශපාශයෝ වෙත්ද; සබ්බපාසෙහි-ඒ සියලු පාශයන්ගෙන්; (ත්වං-ඔබ); බන්ධනො අසි- බැඳුනෙක් වෙහිය; මහාබන්ධන බන්ධනො අසි- මහත්වූ කෙලෙශ බන්ධනයෙන් බැඳුනෙක් වෙහිය; සමණ-ශ්‍රමණය; (ත්වං-ඔබ); මෙ-මාගේ; න මොක්ඛසි- (විෂයෙන්) නො මිදෙන්නෙහිය; 'මොක්ඛසි' යනු 'මුච' ධාතුවෙන් නිපන් අනාගත රූපයි; අන්තක-මාරය; ත්වං-තුඹ; නිහතො අසි- පරදවනලද්දේ වෙහිය; යො අයං පාසො-යම් මේ පාශයෙක්; මානසො-සිතෙහි හට ගත්තේ වේද; අන්තලික්ඛචරො-අහසෙහි හැසිරෙණ (පඤ්චාභිඥාවන්ද බැඳේනුයි) ඒ රාගපාශය; තෙන-ඒ රාගපාශයෙන්; තං-තා; බාධයිස්සාමි-පෙළන්නෙමි; ජිනාති-දිනියි.

මාරකථා ශ්‍රමණද්වය නිමි.

---

නානාදිසා- නන්දිගින්; පබ්බජ්ජාපෙක්ඛෙ- පැවිදි පතන්නවුන්; පරිවිතක්කො උදපාදි-විතර්කයක් පහළවිය. එහි භික්ෂුභාවයෙන් පැවිදි වීමට හෙතු සම්පත් නැත්තවුන්ට ද පැවිද්දෙහි ආශා උපදින්නේය. බුදුවරු ඔවුන් පැවිදි නො කරත්. එහෙයින් ඔවුන්ට ද පැවිදිවීම් ක්‍රමයක් දක්වන්නට මෙසේ විතර්ක කළසේක. අනුජානාමි භික්ඛවෙ තුම්හෙව දානි තාසු තාසු දිසාසු තෙසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ- මහණෙනි, තෙපිම ඒ ඒ දිසාවලදී ඒ ඒ ජනපදවලදී පැවිදිකරව් යයි දත් අනුදනිමි; පඤ්චාබාධයෙන් යුක්ත පුද්ගලයෝ ද, එසේම අන්ධ බධිරයෝ ද මහණ නොකට යුත්තාහුය. මවුපියන් අනුදතනයෝම මහණකළ යුත්තාහුය. පැවිද්ද වනාහි කෙස් රැවුල් සිඳීම, කහවත් ඇඳීම, සරණදීම යයි අඞ්ග තුණකින් යුක්ත වේ. මෙයින් කහවත් හැඳවීම්, සරණදීම යන අඞ්ගද්වය එක් භික්ෂුනමක් විසින්ම කටයුතුයි. මය්හං ඛො-මා විසින් වනාහි; යොනිසො මනසිකාරා- උපාය මනසිකාරයෙන්; අනිත්‍යාදි වස්තූන් අනිත්‍යාදි වශයෙන් මෙනෙහිකිරීමෙන්; යොනිසො සම්මප්පධානා- උපායවීර්‍ය්‍යයෙන් අනුප්පන්න වූ කුසලානුප්පාදනාදි විධියෙන් පැවැති වීර්‍ය්‍යයෙන්; විමුත්ති-අර්හත්ඵල විමුක්තිය; අනුත්තරං විමුත්තිං අනුපාපුණාථ- අනුත්තරවූ අර්හත්ඵල විමුක්තිය අනුව කල්යවව්, අපි රහත්බවට පැමිණියෝ වෙමු; එබැවින් සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෙන් දූත් කිම්ද?" යි යසර පුරුදු වසයෙන් නො පිළි පැද මනසෙනපුන්හි ඵලසමාපත්තියෙන් කල්යැවීම පිණිස

අවවාද කාලයෙහි. සද්දවිගතිගො සදුවිගතිය රජකුමාරවරු; සමාධිනු චතාංති රූපයෙහි ද සිත් වසයෙන් ද සදෘශයෝය. සම්භවනායෙන් ම සැසිරෙත්. එහෙයින් සමාධියුක්ත සදුවිගතිය යන නම විසුවණාරවිය. ආණිසා-සැදවාගෙණ එහ ලද්දීය.

ද්‍විතීය භාණවර ශ්‍රැමණ්‍යදය නිමි.

---

ඨිතාසනකො-(ඨානං විහෙති, අත්තනො ලද්ධිං ඨපෙති) නාමින් නත් ලබ්ධියෙහි තිත්මවන්නාවූ; සුබුමො- පූජිතම වූ; පාසාදිකො-පිරිසිදු තුවණ ඇති හෙයින් උතුම්වූ; අගරු- බරක් නොවන්නේ නම්; අග්‍යාගාරෙ-අගනිශාලාවෙහි; එකංසාකාම- වසන් කොට; (එකං ච අතං ච වසෙසාතාම) මෙසේ කාරණ දෙකක් එක්කොට සැලකීමෙහිදී පරපුරුෂ බහුවචනය යෙදීම ශාස්ත්‍රානුකූලය වෙයි. නො කං මා විහෙඨෙසි-තෙතෙමේ තුඹ නො පෙළාවා; මෙසි ප්‍රාණී නාශය මා යෝගයෙන් සිද්ධය; තීක්ෂණසතුරකං- තණ ඇතිරියක්; පණ්ණාය-පිහිටුවා; පබ්බජාසි-දුමත්ව විය; සමන්තා පත්තසිඤ්චා-පාත්‍රයෙහි බහා; නැසුනු නොද ඇති තාරජනු බම්දෙශනාවෙන් සසතාපී ණය කොට සරණසීලයන්හි පිහිටුවා අගනිශාලාව නාක්පස රැස්ව සුත් නවුසන්ට පෙන්වීම පිණිස පාත්‍රයෙහි බහාගෙණ; ගච්ඡතා-බුදුරදුන්ගේ තෙදින්; තෙජෝ- ඔහුගේ තෙද; පරියාදියෙ- මඩිතලදී. අජ්ජුණ්හා-අද මේ දවස; අගනිශාලමයි-ගිනිගල්ගෙහි; ඉතිං-බුද්ධ සාමියා; සුමනා ඉතණා- (සුමනානං පුබ්බබුද්ධානං මනසා සදිසො මනො අසස) පෙර බුදුවරුන්ගේ සිතට සමාන සිත් ඇති; අභිමනෝ-මහාකරුණාදියෙන් මැඩනත් සිත් ඇති; ඉඤ්ඣං-තෝපය; තෙජෝ ධාතුකුසලො-තෙජෝකසිණ සමාපත්තියෙහි දක්ෂවූ; උදිච්ච්ඡර-බැලූක; නැතහොත් පිරිවැරූක. අනෙකවණ්ණා අච්චියො-නන් නන් පැහැයෙන් යුත් රැස්; නෙවත් සුවණ්ණ රැස්; ඵලිකවණ්ණා අච්චියො-පලිඟු වන් රැස්; පත්තමහි ඔදහිතා- පාත්‍රයෙහි බහා; අහං තෙ බුද්ධ හසනතන-('පතිමානනං කරිස්සාමි' යනු පාඨයෙකි.) මම තුඹට නිති බතින් පිදීම කරන්නෙමි. අභික්කන්තාය රත්තියා- (මෙහි 'අභික්කන්ත' ශබ්දය ක්ෂයාර්ථයෙහිය.) රැය අඩක් ගෙවුනු කල්හි; බුදුරදුන් කරා හේ මහසවුවන් කරා දෙවියන්ගේ පැමිණීම මැදුම්යාම සිය; අභික්කන්තවණ්ණා-මනාපවූ ඡවිවණ්ණයෙන් යුක්තවූවාහු; මිනිස් ලොවට පැමිණෙන්නාවූ දෙවියෝ පියවිවෙය හැර ඔළාරික වෙසක් මවාගෙණ වස්ත්‍රාලඞ්කාරයන්ගෙන් ඔභාසය පතුරුවමින් පැමිණෙති. කෙවලකප්පං ඡතවණං-නාත්පසු සිංහලූ වනලැහැබ; මෙහි 'කෙවල' ශබ්දය අනවශෙෂාර්ථයි. ඔභාසෙත්වා- ආලෝකකොට; වස්ත්‍රාලඞ්කාරයන්ගේ ආලෝකයෙන් හා ශරීර රශ්මියෙන් චන්ද්‍රසූර්යයන් මෙන් එකපජ්ජෝත කොට; දෙවියන්ගේ ශරීරාලොකය දනදෙලොස් ගෞවු තක් තැන් පැතිර පවති. චතුද්දිසා-සිවුදිගෙහි; අග්ගි-යමෙකු තරු; නකෙවල ඔබා අරහා ගඵා අහං-මං මෙත් රතහෙත් තොවෙයි අර්ගත්

නම් මම ම යැයි හඟිමින් කියයි. අඩ්ඪමගධා - අඩු මගද දෙරට වැස්සෝ; අඩු මගද දෙරට චම්පානදියෙන් වෙන්වෙන්. මෙකල 'භාගල්පූර්' නම් නුවරෙහි පිහිටි 'චම්පාපුරය' ගෙ අඟරටය. 'චම්පා' නදියට මෙකල 'චාන්දන්' යයි ව්‍යවහාර කරති. උතුරෙන් ගංගානදිය ද නැගෙනහිරින් චම්පානදිය ද, තිරිතෙහි විනිධ්‍යා කඳුවැටිය ද, බටහිරින් සෝන නදිය ද, මගධරාජ්‍යය සීමාවෝ වෙත්. රජගහනුවර මගධරටේ අගනුවර වෙයි. ඉද්ධිපාටිහාරියං - (සං. නං. විං. සනනසිතං පටිච්ච හරිතබ්බං පච්චනීකහරිතබ්බං පාටිහාරියං, ඉද්ධිඑව පාටිහාරියං, ඉද්ධිපාටිහාරියං) ඍද්ධිප්‍රාතිහාර්යය; ආදේසනාපාටිහාරිය හා අනුසාසනී පාටිහාරිය මෙහි නො කියනලදි. 'ඉධ භික්ඛු එකෝපි හුත්වා බහුධා හෝති, බහුධාපි හුත්වා එකෝ හෝති, ආවිභාවං තිරෝභාවනති' ආදි වශයෙන් විස්තරවන්නේ ඍද්ධිප්‍රාතිහාර්යය නම් වෙයි. සුසිමාණි චරණණිහාති - පළමු ගින්හෙයි පැහැයට වඩා; පකිණ්ණකා - හොට්ය; පංසුකූලං ලක්ඛණං - පංසුකූල වස්ත්‍රයක් ලැබුනේ වෙයි පුණ්ණදාසියගේ සිරුර ඔතා ඉවත ලූ ගසතුල්වලින් කළ, පණුකැදලිවලින් ගසනලු මේ වස්ත්‍රය පංසුකූල වශයෙන් බුදුරදුන්ට ලැබුනේය. එදු දවසක බුදුරජානන් වහන්සේ මහාකාශ්‍යප තෙරුන්ගේ සිවුර ගෙන උන්වහන් සේට මේ සිවුර දුන්සේක. පාණිනා පොක්ඛරණිං ඛණිත්වා - අතින් පොකුණක් සෑත; අතින් බිම පහගී කළ කල්හි ම ඒ පොකුණ නැති සියේය. ආලම්බිත්වා - එල්බගෙන; සාඛාභඞ්ග - කුඹුක්ගසේ; ආමලකී - නෙල්ලි; හරීතකී - අරළු; විජ්ඣාපෙතුං - (ගිනි) නිවන්නට; අනන්තරට්ඨකෙ හිමපාත සමයෙ - අනන්තරට්ඨකයෙහි හිම වැටෙන කාලයෙහි; හවම්මස අවසානයෙහි සිවුදින ද මැදින් මස මුල් සිවුදිනදුයි අට දිනය අනන්තරට්ඨකය නමි. උම්මුජ්ජනානි - (එහිවූ ප්‍රාණ්‍යන්තිති සම්මතවූ දියෙහි පළමුවෙන් නිමග්න කළ සියලු සිරුරු ඇත්තෝ) එයින් ඉල්පෙන. එකුම්මුජ්ජනයෙන් ම පාපශුද්ධිය වේය යන දෘෂ්ටි ඇත්තෝ එක්වරක් දියෙන් මතුවීම පමණක් කොට යෙත්. නැවත නැවත උම්මුජ්ජන නිමුජ්ජනය කිරීමෙන් පාපශුද්ධිය වේය යන දෘෂ්ටි ඇත්තෝ කලින්කල උම්මුජ්ජන නිමුජ්ජනයන් කොට යෙත්. මෙහි 'උම්මුජ්ජනය' පළමුවෙන් කියනලද්දේ එසේ උම්මුජ්ජනය කරන්නවුන්ගේ බහුලභාවය දක්වීම පිණිසය. පඤ්චමත්තානි මණ්ඩමුඛිසතානි - පන්සියයක් පමණ ගිනිකබල්; මහා උදකවාහනකා - මහත් ජලප්‍රවාහයක්; රේණුගතාය - දුලියෙන් ආකීර්ණවූ; උදකෙන වුල්ලෙසා - ජලයෙන් ගසාගෙණ යනලද්දේ; නාවාය - පහුරකින්; නාපසඞ්ඝයිකති - නො මඟින්නේය. නෙව ඛො ත්වං කස්සප අරහා - කාශ්‍යපය, තුඹ රහතෙක් නොවෙහිය. මෙයින් කාශ්‍යපයාගේ අශෛක්ෂභාවය ප්‍රතික්ෂෙප කෙරෙත්. නා පි අරහත්තමග්ගං සමාපන්නො - අර්හත්මාර්ගය පිණිස පිළිපදින්නෙක් ද නොවෙහිය. මෙයින් මොහුගේ ශෛක්ෂභාවය ප්‍රතික්ෂෙප කෙරෙති. පටිපදා - සීලවිසුද්ධිය ආදිකොට ඇති ෂඩ්විසුද්ධීහු; මොවුන් කරණකොට ගෙණ පිළිපදිතුයි ආර්‍යමාර්ගය ද පටිපදා නම්. අස්සසි - වන්නෙහි නම්; චිරකපිබා - බොහෝකලක පටන්;

නාග දමනයෙහි පවත්ය යන අර්ථයි. කෙසමිස්සං-(කෙසාවළම් සහිත මිස්සං) කේශය; ජටාමිස්සං-ජටාව; ඛාරිකාජමිස්සං-තවුස් පිරිකරක අ; ගිනිගාන දණ්ඩ, කමණ්ඩලුය, කෙක්ක යනාදී තවුස් පිරිකර ඛාරි නම්. අග්ගිහුත්තමිස්සං-හැන්ද ආදිවූ අග්ගිපූජෝපකරණ; උපසග්ගො-උවදුරක්; අඩ්ඪුඩ්ඪානි පාටිහාරිය සහස්සානි- තුන්දහස් පන්සියයක් ප්‍රාතිහාර්යයෝ; නාගදමනාදිවූ ප්‍රාතිහාර්ය සොළස මෙහිදී ගණනට නොගත්සේ පෙණේ. ඔවුන් සමග නම් සොළසාතිරේක අඩ්ඪුඩ්ඪ පාටිහාරිය සහස්සානි' යි කියයුතුයි. ගයාසීසං-ගයාගමට ආසන්නයෙහි පිහිටි ගයාසීස නම්වූ ගල්තලාව; 'ගයා' නම් නදිය ආසන්නයෙහි පිහිටි හෙයින් ගම ද 'ගයා' යි ප්‍රසිද්ධවිය. මෙම ග්‍රාමය මහබෝමැඩට තුන් ගවුවක් ඈතින් නේරඤ්ජරා නදීබඩ පිහිටියේය. මේ ගමට නුදුරැතන්හි 'ගය' නම් පුෂ්කරණියක් ද වෙයි. එය පුණ්‍යතීර්ථයක් වශයෙන් සැලකෙත්තකි. ගයාසීස නමින් හැඳින්නෙන්නාවූ මෙම ශෛලපර්වතය ඇත්කුඹකට සමානවෙයි. දහසක් භික්ෂූන්ගේ සුඛවිහරණයට ද යෝග්‍යවූවකි. සබ්බං ආදිත්තං-සියල්ල ගින්නෙන් ජ්වලිතය. චක්ඛුං-ඇස; මෙය ඤාණචක්ඛු, මංසචක්ඛු වශයෙන් දෙපරිදි වේ. එයින් ඥානචක්ෂුස වනාහි බුද්ධචක්ඛු, ධම්මචක්ඛු, සමන්තචක්ඛු, දිබ්බචක්ඛු, පඤ්ඤාචක්ඛු වශයෙන් පඤ්චවිධ වේ. චක්ඛුසම්ඵස්ස පච්චයා-ඇසගැටීම් පසයෙන්; චක්ඛුවිඤ්ඤාණ වීථිචිත්තයන්හි සෞමනස්ස දෞමනස්ස උපෙක්ඛා වේදනා මුඛයෙන් සෙසු අරූපස්කන්ධයන්ගේ ද ආදිත්තභාවය දක්වයි. මනෝ-භවාඞ්ගචිත්තය; මනෝවිඤ්ඤාණං-මනොද්වාර වීථිත්ට ඇතුළත්වූ ජවනය.

තතියක භාණවාර ගැටපදය නිමි.

---

ලට්ඨිවනෙ-තල් උයනෙහි; සුප්පතිට්ඨෙ චෙතියෙ-එක්තරා නුග රුකක්මුල; ද්වාදසනහුතෙහි- දොළොස් නහුතයක් සමග; දසදහස නහුතයකි. අප්පෙකච්චෙ භගවන්තං අඤ්ජලිං පණාමෙත්වා-ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද ඒ දිගට ඇඳිලි බැඳගෙණ; මොවුහු උභතොපක්ඛික අදහස් ඇත්තාහුය. තෙපි කුමක් හෙයින් ශ්‍රමණභවත් ගෞතමයන්ට වැන්දහුදැයි විචාළකල ඇඳිලිබැඳීම වැඳීමක්දැයි පිළිතුරු දෙති. කුමක්හෙයින් නොවැන්දහුදැයි විචාළකල සිම, සිමවැටී වැඳීම පමණක් වැඳීමට අයිතිදැයි පවසති. නාමගොත්තං සාවෙත්වා-(භාග්‍යවතුන් වහන්ස, මම අසවලාගේ පුත්‍රවූ දත්ත නම්, මිත්ත නම්'යි) නම් ගොත් අස්වා; මොවුහු දූප්පත් කුලපුත්‍රයෝය. තුණ්හීභූතා නිසීදිංසු-නිශ්ශබ්දවූවෝ හුන්හ. මොහු කෛරාටිකයෝය. ඉල්ලාවට බැසීමෙන් විස්වස්වූකල දනාදීය දියයුතු වන්නේයයි සලකා මෙසේ හුන්හ. අජ්ඣභාසි-(මොවුන්ගේ සැක දුරුකිරීම පිණිස) වදාළේක. උරුවෙලවාසි කිසකොවදානො- උරුවෙල්දනව්වාසී තවුසේක. කුමක් දැන්ට අවවාද අනුශාසනාකාරන්නෙක් වූයේ; කිං දිස්වා එව- කුමක් දැකම; අග්ගිං-ගින්න; පහාසි-හැරියෙහි දැ? තව-තුඹගේ; අග්ගිහුත්තං-

අග්ගිපරිවරණය; කථං-කෙසේ; පහීනං-ප්‍රහීණ ද? රූපෙ-රූපවස්තු හුද; සද්දෙ-ශබ්දවස්තුහුද; රසෙ- රසවස්තුහුදැයි යන; කාමෙ- කාම සැපයම හිතවස්තුහුද; ඉත්ථියො-ස්ත්‍රීහුද; යඤ්ඤා- යාග හෙතුවෙන්; අභිවදන්ති- ලැබෙත්යයි කියත්. එතං-මේ රූපාදි කාමගුණය; උපධීසු-ස්කන්ධොපධීන් කෙරෙහි; මලං ඉති-මලයයි; ඤත්වා-දැන; (යම් හෙයකින් ඉටඅනුත ප්‍රභෙදවූ යඥයෝ මලහෝයයි කියත්ද,) තස්මා-එහෙයින්; යිට්ඨෙ- මහායාගයෙහි ද; හුතෙ- දිනපතා කරණලබන අග්ගිපරිවරණයෙහි ද; න අරඤ්ජිං-සිත් නො ඇලූයෙමි. අථ කො චරහි-වැලි කොහි හැසිරෙහිද? සන්තං-ශාන්තවූ; අනුපධිකං-කාමාදි උපධිරහිතවූ; අකිඤ්චනං- රාගකිඤ්චනාදීන්ගෙන් තොරවූ; කාමභවෙ අසත්තං-කාමභවයෙහි නො ඇලුනාවූ; අනඤ්ඤථාභාවිං- ජාතිජරා මරණයන්ගේ අභාවය වූ; අනඤ්ඤනෙය්‍යං-තමන් වැඩූ මගකින් හැර අනුන් වැඩූ මගකින් අධිගමනය නො කටහැකිවූ; පදං- නිර්වාණ පදය; දිස්වා=දැක; අයාසකා= ප්‍රාර්ථනා; සිඞ්ගීනික්ඛසවණ්ණා- නිෂ්කප්‍රමාණවූ සිඞ්ගීසුවර්ණයෙන් කරණලද රන්පටක් වැනි පැහැය ඇති; ධරණ සතරක් හෝ මාස සොළසක් සුවර්ණනිෂ්කයකි. සුවර්ණ පෑක් (රෑ. අටක්) නිෂ්කයකි. සිඞ්ගීසුවර්ණ ජම්බුනද සුවර්ණයටත් වඩා අගනේය. දසඞ්ගුපෙතා-වැය තිමවනලද දශවිධ ආර්යවාස ඇති; ආර්ය වාස දශය:- "ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චඞ්ගවිප්පහීනො, ඡළඞ්ගසමන්නාගතො, එකාරක්ඛො, චතුරාපස්සෙනො පනුණ්ණපච්චෙකසච්චො, සමවයසට්ඨෙසනො, අනාවිලසංකප්පො, පස්සද්ධකායසඞ්ඛාරො, සුවිමුත්තචිත්තො, සුවිමුත්තපඤ්ඤො හොති" යනු මෙනුයි. පඤ්චඞ්ගවිප්පහීනො- කාමච්ඡන්දාදි පඤ්චනීවරණ ප්‍රහීණකරණලද්දේ, ඡළඞ්ගසමන්නාගතො- චක්ෂුරාදි ෂඩින්ද්‍රියන්ට රූපාදී ආරම්මණ ලැබ සතුටු නොවන්නෙක් ද, දුක් නොවන්නෙක්ද වූයේ උපෙක්ෂාවෙන් යුක්තවෙයි. එකාරක්ඛො- සිහියෙන් ආරක්ෂා කරණලද සිත් ඇත්තෙක් වෙයි. චතුරාපස්සෙනො- සඞ්ඛාය සෙවනා අධිවාසනා, පරිවජ්ජනා, විනොදනා යන සිව් අපස්සෙනයන්ගෙන් යුක්ත වෙයි. පනුණ්ණපච්චෙකසච්චො- ඒ ඒ දෘෂ්ටිගතයන් විසින් වෙන වෙනම ගන්නාලද දෘෂ්ටිසත්‍යයන් ප්‍රහීණකරණලද්දේවෙයි. සමවයසට්ඨෙසනො- කාමෙසනා, භවෙසනා බ්‍රහ්මචරියෙසනා යන ත්‍රිවිධ එෂණාවන්ගේ අභාවය කරණලද්දේ වෙයි; අනාවිලසංකප්පො- කාම සංකප්ප, ව්‍යාපාද සංකප්ප, විහිංසාසංකප්ප ප්‍රහීණකරණලද්දේ වෙයි. පස්සද්ධකායසඞ්ඛාරො- චතුර්ථධ්‍යානය හා යෙදීමෙන් ප්‍රහාවූ දරථ ඇත්තේ වෙයි. සුවිමුත්තචිත්තො- රාග ද්වෙෂ මොහයන්ගෙන් මිදුනු සිත් ඇත්තේ වෙයි. දසබලෙහි- කායබල දශයකින් හා ඥානබල දශයකින් යුක්තවූ; දසධම්මවිදූ- දශවිධ කර්මපථයන් දන්නාවූ; දසභි චූපපන්නො- (දසහි අසෙඛා සම්මාදිට්ඨි — පෙ — අසෙඛො සම්මාසමාධි අසෙඛං සම්මාඤාණං අසෙඛා සම්මාවිමුත්ති යන) දසවැදෑරුම් අශෛක්ෂ අඞ්ගයන්ගෙන් යුක්තවූ; සබ්බාභිභූ- සියලු ඉන්ද්‍රියයන් විෂයෙහි ම දමුනාවූ; බුදුරදුන්ගේ චක්ෂුරාදීන් අතුරෙන් නො දමුනාවූ කිසිවක් නැත. අමිතාභං- බුද්ධාභිවාදනයෙන් හා ධර්මශ්‍රවණයෙන් ප්‍රයොජන ඇත්තවුන්ට;

අභික්කමනීයං-පහසුවෙන් යා හැකි; අප්පකිණ්ණං-ආකීර්ණ නුවූ; අප්පසද්දං-අසලින් ගමන් කරණ මිනිසුන්ගේ හඬින් ශබ්ද කෝලාහල නුවූ; අප්පනිග්ඝෝසං-නුවර වැසියන්ගේ ඝෝෂණයෙන් නිර්ඝෝෂවූ; විජනවාතං-අනුව හැසිරෙණ ජනයාගේ ශරීරවාතයෙන් තොරවූ; මනුස්සරාහස්සෙය්‍යකං-මිනිසුන්ගේ රහස් කටයුතු දෙයට සුදුසු; පටිසල්ලානසාරුප්පං- විවේකයට අනුරූපවූ; අභික්කන්තේන- ගමනින්; පටික්කන්තේන- නැවතීමෙන්; ආලෝකිතේන- ඉදිරි බැලීමෙන්; විලෝකිතේන- ඔබමොබ බැලීමෙන්; සම්මිඤ්ජිතේන-(අතපා ආදිය හැකිළීමෙන්; පසාරිතේන-(අතපය ආදිය) දිගහැරීමෙන්; මෙ සියලු තන්හි ඉත්ථම්භූතයෙහි කරණ විභක්තියි. ඔක්ඛිත්තචක්ඛු-යට හෙළනලද ඇස් ඇති; ඉරියාපථසම්පන්නො- ප්‍රසාද එළවන අභික්කන්තාදියෙන් සම්පූර්ණවූ ඉරියව් ඇත්තේ; අත්ථිකේහි උපඤ්ඤාතං මග්ගං- අර්ථිවූ අප විසින් නිර්ණය අනුමාන ඥානයෙන් දන්නාලදී. ඒ අනුමානයෙන් දන්නාලද්ද ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකීම පිණිස මේ භික්ෂුව පිටිපසින් පිටිපසින් ලුහුබඳින්නෙම් නම් යෙහෙකි. පිණ්ඩපාතං ආදාය පටික්කමි-පිඬු ගෙණ ගියේය. දනපතීන්ගේ කෙවල භික්ෂූන් පිණිස පැණවූ අසුන් ඇති මහාශාලා වෙත්. කැපවූ ජලය ද එහිම පිළියෙල කොට ඇත. පැවිද්දෝ පිඬුහැසිර එහි පැමිණ වළඳති. ඉදින් කැමති නම් ඒ දනපතීන්ගේ ගෙයින් ද පිඬු ලබාගණිති. මේ භික්ෂුතෙමේද එබඳු ශාලාවක පිහිටි කිසි මුල්ලක් ආශ්‍රය කොට ගෙණ දන් වළඳන්ට පැමිණියේය. න තාවාහං සක්කොමි-(න තො අහං සක්කොමි.) තුඹට (විස්තර වශයෙන් දහම් දෙසන්ට) නො හැක්කේ වෙමි. මොහුගේ සිත ධර්මය කෙරෙහි දැඩි වසයෙන් නමන්නෙමියි සියලු බුද්ධවිෂයෙහි අවිෂයභාවය ගෙණ මෙසේ කීය.

අප්පං වා බහුං වා භාසස්සු-මදවූ හෝ බොහෝවූ හෝ යමක් දෙශනාකරන්නු මැනවි. මම උපතිස්ස වෙමි, තුඹ ශක්ති පරිදි දෙසූ දෙය ක්‍රම සියයකින් හෝ ක්‍රම දහසකින් හෝ ප්‍රතිවෙධකිරීම මට භාරයයි සිතමින් මෙසේ කීය.

යෙ ධම්මා හෙතුප්පභවා-හෙතුව ප්‍රභවකොට ඇති යම් ධර්ම කෙනෙක් වෙත්ද, ඒ පඤ්චස්කන්ධයයි, මෙයින් දුඃඛසත්‍යය කියැවේ. තෙසං හෙතුං තථාගතො ආහ-තථාගත තෙමේ ඒ දුඃඛයට හෙතුව වදාළසේක. එයින් සමුදය සත්‍යය කියැවේ, තෙසඤ්ච යො නිරොධො-ඒ සමුදය වූ තෘෂ්ණාවගේ යම් නිරොධයක් වේද; මෙයින් නිරොධ සත්‍යය ද, මාර්ගසත්‍යය ද කියැවේ.

එසෙව ධම්මො යදි තාවදෙව-මා ලැබූ සෝවාන්මගින් මත්තෙහි වූ අවශේෂ මාර්ගඵල නැරත්; මා විසින් ගවේෂණය කරණලද්ද නිර්වාණ ධර්මය නම් මේ මය. බහුකෙහි කප්පනහුතෙහි-බොහෝ කල්ප නහුත ගත්තෙනුත්; කොටිප්‍රකොටි ලක්ෂසියයක් නහුත නම්, අදිට්ඨං-නො දක්නාලද; අබ්භතීතං-ඉක්මගියාවූ; අසොකං-ශෝකයෙන් තොරවූ; පදං-ඒ නිර්වාණපදය, පච්චබ්‍යත්ථ-(තුඹවහන්සේ) අවබෝධ කළහුය. තුඹ විසින් පැමිණෙනලද්දී යනු අර්ථයි.

ගම්භීරෙ-ගැඹුරුවූ; දුද්දසෙ-ගැඹුරුවූ නුවණට ම විෂය වූ; අනුත්තරෙ-නිරුත්තරවූ; උපධිසඞ්ඛයෙ-නිර්වාණයෙහි; විමුත්තා-(එය අරමුණුකොට ගෙණ සෝවාන්ඵල විමුක්තියෙන්) අධිමුක්තවූ; තෙ-ඒ සැරියුත් මුගලන් දෙනම; වෙනයිකා-හික්මවනාරුම්යට; අපත්තනා-නො පැමිණිලවුන්; (දුක) ඛ්‍යාහාසි- (මේ මාගේ ශ්‍රාවකයුගලයයි) ප්‍රකාශකළ සේක.

අපුත්තකතාය- (යම් කෙනෙකුන්ගේ පුත්‍රයෝ මහණවෙත් ද ඔවුන්ගේ) අපුත්‍රකබව පිණිස; වෙධබ්‍යාය- (යම් ස්ත්‍රීන්ගේ හිමියෝ මහණවෙත් ද, ඔවුන්ගේ) කනවැන්දුම්බව පිණිස; කුලුපච්ඡෙදාය- (මේ දෙයාකාරයෙන්) කුලය නැසීම පිණිස; ගිරිබ්බජං- පර්වතවලින් ගංපත් වටවී ගාලක්මෙන් පිහිටි හෙයින් ගිරිබ්බජ නම්වූ රජගහ නගරයට; සඤ්ජයානෙ-සඤ්ජය නම්වූසාගේ අතවැස්සන්; නෙත්වා-පමුණුවා; මහාගිරා-මහත් මියුරිවත්වූ; තථාගතා- තථාගතවරයෝ; සද්ධම්මෙන-සදහම් නමැති මගින්; නයන්ති-පමුණුවත්. ධම්මෙන-ධර්මයෙන්; නයමානානං-නිවණට පමුණුවන්නාවූන් කෙරෙහි; අවිජානතං-නො දන්නාවූන්ගේ; කා උසූයා කවර නම් දෙස් පහළකිරීමක් ද?

චතුත්ථ භාණවාර ගැටපදය නිමි.

---

අනුපජ්ඣායකා-(වජ්ජාවජ්ජං උපනිජ්ඣායතීති උපජ්ඣායො, නත්ථි උපජ්ඣායො එතෙසන්ති) උපාධ්‍යායවරු නැත්තෝ; කුඩා මහත් වරද පෙන්වාදෙමින් අනුශාසනාකරණ ආචාර්‍ය්‍ය තෙමේ උපාධ්‍යාය නම්. එසේවූ උපාධ්‍යායරහිත වූවෝ; අනනුසාසියමානා--අනුශාසනා නො ලබන්නෝ; දුබ්බිනීතා-වරදවා හැන්දේ; අනාකප්පසම්පන්නා- ශ්‍රමණසාරූප්‍ය ආචාරවිධිවලින් වෙන්වූවෝ; උපනිභොජනා-බොජුන් මත්තෙහි; උපනිධාපෙක්ඛනං-පිඬුපිණිස හැසිරීමෙහිදී ගෙණයනු ලබන පාත්‍රය. මේ පාත්‍රය ඉඳුල්යයි භික්ෂූ සලකති. එහෙයින් උපනිධය නම්. උපනාමෙන්ති-නමා තබත්. භාජනෙ-දන්යාලෙහිදී; පුත්තචිත්තං-මේ මාගේ පුත්‍රයෙක යන මෛත්‍රියෙන් යුක්තවූ චිත්තය; සගාරවා-(ගරුභාවො ගාරවං, සහගාරවෙන වත්තන්ති) පහත් යටත් සිත් ගරුවයෙන් සලකන ගතිය ඇත්තෝ; සප්පතිස්සා- දෙව්‍ර යාන්ති තබා සලකන ගති ඇත්තෝ; සම්මාසම්මුපටිපන්නා- සමාගම් පැවතුම් ඇත්තෝ; සාධු-සුන්දරය; ලහු-නො බරය; තුඹට උපාධ්‍යාය මිමෙහි මට බරක් නම් නැතැයි සේයි. ඔපායිකං-උපාය ප්‍රතිසංයුක්තය; මේ උපායෙන් තුඹ මට මෙතැන් පටන් භාරවූයේ වෙහිය. පතිරූපං- තුඹගේ උපාධ්‍යායග්‍රහණය සුදුසුය. පාසාදිකෙන-ප්‍රසාද ඵලවත්තාවූ කායවාක් ප්‍රයොගයෙන්; සම්පාදෙහි-ත්‍රිවිධශික්ෂාව නිෂ්පාදනයකරව; පාරිපූරිං-(කසකම්ුප්‍රාදීය පෙන්වන්නේ) කඩින් කඩවයි. සම්මා වත්තනා- මනා පැවතුම්; කාලෙ අසව උමවාය උපාසකා ඔබුකුවිනවා-අලුයම් කාලයෙහිම නැගිට (යත්මත්කිරීම පිණිස කෝ

සෙද්දූ පිය ප්‍රවේශම් කරගැනීම පිණිස ලා තබා) වහන් ගලවා; දන්තකට්ඨං දාතබ්බං-දැහැටිදඬු දියයුතුයි; මහන්ත මජ්ඣිම ඛුද්දක වසයෙන් ත්‍රිවිධවූ දැහැටිදඬු තුනක් පළමු දිනයෙන් පටන් එළවා තැබිය යුතුයි. එයින් යම් ප්‍රමාණවූ දැහැටියක් තුන් දිනයෙහි ම නොවළකා ගණීනම් එතැන්පටන් එබන්දක් පිළිගැන්විය යුතුයි. පිළිගැණීමේදී ප්‍රමාණය ගැණ සැලකිල්ලක් නොදක්වන සේ පෙණෙණ නම් ප්‍රමාණවත්වූ තමන්ට පහසුවෙන් සැපයියහැකි දැහැටියක් පිළිගැන්විය යුතුයි. මුඛොදකං දාතබ්බං-මුවදෙනා පැන් පිළිගැන්විය යුතුයි. සිසිල් පැන් හා උණු පැන් තුන් දවසක්ම එළවා තැබිය යුතුයි. තුන් දිනෙහි ම නියම වසයෙන් යම් පැනක් පරිභොගකරණු දැකී නම් සිව්වන දිනෙහි පටන් එබඳු පැනක් ද පරිභොගයෙහි විශෙෂයක් නොසැලකේ නම් ලැබුනු පැනක් ද එළවා තැබිය යුතුයි. උක්ලාපො හොති- කසළින් ගැවසුනු තැන; සගුණං කත්වා-සඟළිය හා පොරෝණය එකතුකොට; නාතිදූරෙ නාච්චාසන්නෙ-ඉතා දුරෙහි හෝ ඉතා ආසන්නයෙහි; උපාධ්‍යායයන් වහන්සේගේ හා තමන්ගේ අතරවූ ප්‍රමාණය මිටියන් එකක් හෝ දෙකක් පිටිපසේ ගමන්කිරීම නාච්චාසන්න නාතිදූර නම්. පත්තපරියාපන්නං-පිඬු සහිත පාත්‍රය; උපාධ්‍යායයන් සමග පිඬු සිඟන [illegible] විසින් පිඬු ලැබීමෙන් බරවූ හෝ උණුසුම්වූ පාත්‍රය තමන් ඉල්ලා ගෙණ තමන්ගේ පාත්‍රය උන්වහන්සේට පිළිගැන්විය යුතුයි. න උපජ්ඣායස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා-(ඇතුළු ගෙහිදී හෝ අන්තැනකදී උපාධ්‍යායයන් කරණ කථාව තමන්ට අප්‍රියවුවත්) අතර අතර අනිත් කථා නො ඉපදවිය යුතුයි. ආපත්තිසාමන්තා භණමානො-(පදසො ධම්මං වාචෙන්ති ආදි වසයෙන්) ආපත්තිකර වචන කථා කරන්නේ; නිවාරෙතබ්බො-(ඇවැත් නි, මෙවැනි දෙය කථාකිරීම ආපත්තිකර නොවන්නේදැයි පිළිවිසීම් ආදියෙන්) වැළැක්විය යුතුයි. නැතහොත් මහල්ල, මෙසේ කථා නොකරවයි කියන්ට නොවටී. පඨමතරං ආගන්තබ්බං- (යම් ආසන්නයෙහි පිහිටියේ වේද, විහාරයෙහි පිලන් නිසුණු වේනම්ද,) ගමින් පළමුවෙන් පැමිණ; ඉදින් ගම්දුරයෙහි වේද, උපාධ්‍යායයන් සමග පැමිණෙන්නට අන්කෙනෙක් නැත්තේ ද, එකල්හි උපාධ්‍යායයන් සමගම ගමින් නික්ම ඌරුකටු නොවෙහි පාත්‍ර බැඳගෙණ අතුරු මගකින් පළමුවෙන් පැමිණිය යුතුයි. එසේ පැමිණ අසුන් පැනවීම ආදි සියලු වත් කටයුතුයි. සින්නං හොති-ඩහයෙන් තෙත්වූයේ වේද; සංහරිතබ්බං- හැකිළිය යුතුයි. චතුරඞ්ගුලං කණ්ණං උස්සාරෙත්වා-කොනක් සතරඟුල් පමණ අධිකකොට තබා; මා මජ්ඣෙ භඞ්ගො අහොසි- මැද දුර්වල නොවේවා; හැමකල්හි දෙකොන සමකොට තබා සිවුර නැමූකල්හි මැද දුර්වලබවට පැමිණෙයි. එසේ දුර්වලවීම වැළැක්වීම පිණිස මෙසේ වදාළසේක. ඔභොගෙ කායබන්ධනං කාතබ්බං-කායබන්ධන හකුළා චීවරභොගයෙහි බහා තැබියයුතුයි. සචෙ පිණ්ඩපාතො හොති-ඉදින් තමන් සතුවූ පිණ්ඩපාතයක් වේද; ඡන්දානුරක්ඛනා-(කලාල් සම්බන්ධ ආදින් ලැබුනේ) යම්කින් නො

ඇතිරූ, වැලි පස් මිශ්‍රවූ භූමියෙහි; රජස් නොවැටී පුණු පිරියම්කළ පිරිසිදු බිමක තැබීම් ඕවරදය. වැලි පස් සහිත බිමෙහි යම්කිසි පත්‍රයක් හෝ ආධාරයක් හෝ තබා ඒමත්තෙහි පාත්‍රය තැබිය යුතුයි. චීවරවංසං (සිම බඹුල දෙසයෙහි එසිත දැලදෙන රැයනිවාරණය පිණිස) සිවුර බහාලන ස්ථානය. එය දුරෙන් වැසුනු තැනක හෙයින් චීවරය වෙළෙනවා තිසුණු දැමිණ සිවුරු පසෙකතබා ගිනිරැස් වැලැක්වීම පිණිස මුහුණෙහි මැටි අලෙව්කොට සිරුර ඇතිතාක් ඛයනත්වං සැවත පුණු ආදියකින් උලා නාහති. චුණ්ණං සන්නෙතබ්බං-පුණු දියෙන් තෙමා පිඩු පිඩු කොට තැබියයුතුයි. මත්තිකා තෙමෙතබ්බා-මැටි තෙමා බුරුල්කොට තැබිය යුතුයි. එකමන්තං නික්ඛිපිතබ්බං-දුම් නො වැදෙන එක් පසෙක තැන්පත්කොට තැබිය යුතුයි. උදකෙපි පරිකම්මං-ඇඟ පසඟ ඉලීම් ආදී උදකයෙහිදී කටයුතු පිරියම්; සාඛියසා ඤාමිපතනබ්බං-(ජන්තාඝරයෙහිදී උණුසුමින් පෙළීමෙන් පවස් ඇතිවියහැකි වෙයි. එහෙයින්) පැතින් පිළිම්පිය යුතුයි. උපාලොලකා-කැලිකසළින් ගැවසුනෝ; සචෙ උස්සහති-ඉදින් උත්සාහ කෙරේනම්; අගිලන්වූ සැටවයස්පිරි සද්ධිවිහාරිකයා විසිනුදු උපාධ්‍යාය වත් කටයුතුය. ඔලුම්ලලනකා-පඩික්කම; සකායානකං-ධුණු කැදලි, මකුළුදැල්; උලොලලාකා-උපරිභාගයෙහි කෙවත් වහලයෙන්; ඔහොමර හාකම්-පිසදැමිය යුතුයි. ආලොක සන්ධිකණ්ණභාගා- වාතපාත කවුළුවගන්ගේ අතර හා සිව පෙදෙස් ද, ගබඩාගෙහි සිවුමුල්ද; සචෙ සංඝක්ඛතා සසනකපනකං-පණුවා හිඹු පරිද්දම පැණවිය යුතුයි. එය අමතකවුවහොත් විසින් ගාත්‍රය බිත්තියෙහි දෙපතුන් අහළකින් මෙහා පැණවිය යුතුයි. ඉදින් කාලයෙහි විකාලවේනම් අධිකය සාපාදම්, නො ලිහෙහාසේ තොහොත් සමන්විත පැණවියයුතු. එසේ සමන්තකන්තම නො දන්නාහු විසින් කොහේ නො සැටිය යුතුයි. ආචමනකුම්භියං-වැසිකිලියෙහි වූ පරිභොග දියබඳුනෙහි; සූපසාවෙසතාසක්ඛා-අනායැ තොක්ස් දැම්මවිය යුතුයි. සූපසාසෙසනාසක්ඛා-තෙරුන් සැදමා නෙණ අහතැහයට යවී, අන් සිසුවක් යෙදිය යුතුයි. විනොදෙතබ්බං-දුරු කළයුතුයි. උපජ්ඣායං සාසාතබ්බ-උපදෙස ඇත්තෙක් කළයුතුයි. පරිභොජනය පිණිස එළඹ යාචිතයුතුයි. ඉදිය තෙමේ ප්‍රතිබල යෙක් නම් තමතාම දියයුතුයි. කාසන්නුඛො-කවර උපායකින් නමුත්; ලහුකාමං වා ගරුකාපත්ති-සැහැල්ලුවට පිණිස හෝ තමත්තේය. සද්ධිවිහාරිකයා උපාධ්‍යායන් වහන්සේට උත් සෙසපණ්ණකම්ය කරණුකැමැත් තොදැයි දනාහන් වනාව මෙත පෙරම සිසුහු තාරු එළඹ සොමිනි, අපමන් උපාධ්‍යායන් වහන්සේට උත්ක්ෂේපණීයකර්මය නොකළ මැනැවැයි යාච්ඤාකටයුතුයි. ඉදින් උත්ක්ෂේපණීයකර්මයකරණු කැමැත්තම සඞ්ඝයාගේ ඔවියාම එසේ නො කොට තර්ජනීය කර්මය හෝ නියස කර්මය හෝ සාරණීලය සඞ්ඝයාගෙන් ඉල්ලා සිටිය යුතුයි. තව අටඨිතනතා ඔධිමව සංඝායතිකාලසං වැසිපාද. නොනැඹුනු සල්හි නො යුතුයි. දෑසවැස ඔවිනන්දු සල්කි යායුතුයි වේ මෙයින් කීහ. තව වීසංඛාසං අනාපුච්ඡා එකවිච සස පනකා දුකනබ්බා- උපාධ්‍යායන්

මහත් නො විචාරා විඝාස පුද්ගලයන්ට පාත්‍රය නො දියයුතු. උපාධ්‍යායයන් වහන්සේට අවැඩ කැමති ලජ්ජී හෝ අලජ්ජී භික්ෂුහට පාත්‍රය නොදිය යුතුයි. උපාධ්‍යාය තෙමේ අලජ්ජියෙක් වූයේ අවවාදක්ෂම නොවේද? ලජ්ජිභික්ෂූහු ඔහුට විශ්වාසයෝය. එකල උපාධ්‍යායයන් හැර ලජ්ජීන් සමග ආමිෂපරිභොගාදිය කටයුතුයි. න උපජ්ඣායං අනාපුච්ඡා ගාමො පවිසිතබ්බො-උපාධ්‍යායයන් නො විචාරා ගම නො වැදිය යුතුයි. පිඬු පිණිස හෝ අන්කාරණයකින් ගම්වදිනු කැමැත්තහු විසින් උපාධ්‍යායයන් විචාරාම පිවිසිය යුතුයි. කලින් කැඳිට දුරයෙහි පිඬු පිණිස ගමන්කරණු කැමැති උපාධ්‍යායයන් විසින් දහර භික්ෂූහු පිඬු පිණිස යෙත්වායි අවසරය දී යායුතුයි. අවසරනොදී ගිය කල්හි ඔවරකනට ගොස් උපාධ්‍යායයන් නුදුටුවහු විසින් ගම්වදින්ට සුදුසුය. ඉදින් මඟදී උපාධ්‍යාය තෙමේ හමුවීද, එතැනදීම පිළිවිසීම කටයුතුයි. න සුසානං ගන්තබ්බං- පිසීම පිණිස හෝ දැකීම පිණිස සොහොනට ද නො යායුතුයි. උපලකුණු වසයෙන් මෙහි සොහොන යයි දැක්වූවද උපචාර සීමාවෙන් පිටත යන්නහු විසින් නො විචාරා නොයායුතුයි. න දිසා පක්කමිතබ්බා-කිසිම දිශක් නො විචාරා නො යායුතුය. පිටත යනු කැමැත්තහු විසින් යායුතු කිස දන්වා තුන්වනවර දක්වා යාච්ඤා කටයුතුයි. ඉදින් අනුදක්නම් මැනවි. නො අනු දනීනම් උන් ඇසුරුකොට විසීමෙන් ඔහුට උදෙසීමක් හෝ පිළිවිසීමක් හෝ කමටහනක් හෝ නො සැපයෙයි. උපාධ්‍යාය තෙමේ බාලවේද, අව්‍යක්ත වේද, හුදෙක් තමන් ළඟ තබත්වා ගනු කැමැත්තෙන් ම යන්ට නොදේද, එබඳු උපාධ්‍යායයන් මැළකූ නමුදු යායුතුයි. ගිලානො ආගමෙතබ්බං- උන්වහන්සේ ගිලන් බැවින් නැගිසිටීම බලාපොරොත්තුවිය යුතුයි. නො නැගිටිනතුරු නො යායුතුය යනු අදහසයි. ඉදින් අනික් උපස්ථායක භික්ෂුනමක් වේනම් බෙහෙත් ආදිය සපයා උන් අතට දී මුන්වහන්සේට මනාව උවැටන්කළ මැනවැයි භාරකොට යාහැකි වෙයි.

උපජ්ඣායවත්ත කථා ගැටපදය නිමි.

---

සංගහෙතබ්බො අනුග්ගහෙතබ්බො- උදෙසීමාදියෙන් ඔහුට සංග්‍රහය ද අනුග්‍රහය ද කටයුතුයි. ධර්මාමිෂවයයෙන් සංග්‍රහ අනුග්‍රහ නොකරණ ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්ට දුකුළා ඇවැත් සිදුවේ. "අදදන්තොපි ආපජ්ජති" යන පරිවාර පාඨයෙන් එය සුබාවබෝධය. ඔවාදෙන-(මේ දේ කටයුතුය මේ දේ නො කටයුතුයයි පෙන්වාදී කරණ) අවවාදයෙන්; අනුසාසනියා-නැවත නැවත කීම සඞ්ඛ්‍යාත අනුශාසනයෙන්; එක්වරක් කීම ඔවාද නමි. නැවත නැවත කීම අනුසාසනී නම්. උපජ්ඣායස්ස පත්තො හොති- උපාධ්‍යායයන් වහන්සේගේ අතිරෙක පාත්‍රයක් වේද; පරික්ඛාරො-අන් ශ්‍රමණ පිරිකරක්; චීවරං රජන්තෙන-(උපාධ්‍යායයන් වහන්සේගෙන් උපාය අසා) සිවුරු රදන්නහු විසින්.

සද්ධිවිහාරිකවත්ත කථා ගැටපදය නිමි.

න සම්මා වත්තන්ති- පැණවූ පරිදි උපාධ්‍යායවත් සම්පූර්ණ නො කරත්. වත් සැපයියයුතු කාලය, අවස්ථාව, නියම වශයෙන් නො දන්නා හෝ කොසජ්ජාදියට වශගවූවෝ ඒ උපාධ්‍යාය වත් නිසිපරිදි සම්පූර්ණ නො කරත්. උපාධ්‍යාය වත් මේ මේ යයි නො දැනීමෙන් නොකරණ මහණහට ද දුකුළා ඇවැත් සිදුවේ. න අධිමත්තං පෙමං හොති- (උපාධ්‍යායයන් වහන්සේ කෙරෙහි) අධිකමාත්‍රවූ මෛත්‍රීස්නේහය නොවේද; නාධිමත්තා භාවනා හොති- (උපාධ්‍යායයන් වහන්සේ කෙරෙහි) අධිකමාත්‍රවූ මෛත්‍රීභාවනා බලාපොරොත්තුවක් නොවේද; අලං පණාමෙතුං- අත්හැරදමන්නට සුදුස්සෙකි. අපණාමෙන්තො උපජ්ඣායො සාතිසාරො හොති- අත්හැර දමන්නාවූ උපාධ්‍යාය තෙමේ දොස් සහිතයෙක් වෙයි. එහෙයින් ම ඇවතට ද පැමිණේ. එහෙයින් උපාධ්‍යාය වත් නොකරණ නිසා මිදුනාහුව ද නො මිදුනාහුට ද ඇවැත් සිදුවේ. සද්ධිවිහාරිකයන් මනාව පවත්නාකල මනාව නො පිළිපන් උපාධ්‍යායයන්ට ද ඇවැත් සිදුවේ. "මට වත් පිළිවෙත් කරණ අන් කෙනෙක් වෙයි. තුඹ හැදෑරීම් ආදියෙහි යෙදෙනු" යන උපාධ්‍යායයන්ගේ වචනය නිසා උපාධ්‍යාය වත් නුපුරණ සද්ධිවිහාරිකයන්හට ඇවැත් සිදුවීමක් නැත. "උපාධ්‍යායයන් වහන්සේට කටයුතු වත් පිළිවෙත් මම කරමි"යි එක් කෙනෙක් භාරගත් කල්හි උපාධ්‍යායවත් නුපුරණ අනික් සද්ධිවිහාරිකයන්ට ඇවැත් සිදුවීමක් නැත.

න සම්මාවත්තනාදි කථා ගැටපදය නිමි.

---

කිසා- (ආහාරයෙහි නැපති මඳහෙයින් මස් ලේ සිඳීගිය) කෘශවූ ශරීර ඇත්තෝ; උප්පණ්ඩුප්පණ්ඩුකජාතා- (ඉදීගිය පත්‍රයක් මෙන්) පඬුවන්වූ සිරුරු ඇත්තෝ; මෙහි 'පණ්ඩු' ශබ්දයාගේ ද්විත්වය වීප්සා වෙයි. ව්‍යාප්තව පවත්නා පඬුපැහැය ඇත යන අර්ථයි. ධමනිසන්ථතගත්තා- (වියලීගිය මස් ලේ ඇති බැවින්) නහරින් ම වෙළීගියාක් වැනි සිරුරු ඇති; අභිසංඛාරං- සත්කාරය; කතඤ්ඤුනො- කරණලද උපකාරය දන්නෝ; කතවෙදිනො- කරණලද උපකාරය අමතක බැවී පෙරලා පෙරළා උපකාරකිරීමෙන් හඟවන්නෝ; ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන- ව්‍යක්තවූ ප්‍රතිබලවූ භික්ෂුවක් විසින්; අර්ථකථා සහිත සියලු විනයපිටකය වාචොද්ගත කෙළේද, එසේම යටත්පිරිසෙයින් ඤත්තිචතුත්ථ කර්මවාක්‍යයවත් වාචොද්ගත කෙළේද හේ ව්‍යක්ත නම්. කාශශ්වාසාදී ගිලන්කමින් තොර හෙයින් පදව්‍යඤ්ජන නොපිරිහෙළා ශබ්දතරමින් කර්මවාක්‍යය කථනය කරන්ට සමර්ථවූයේ පටිබල නම්. සඞ්ඝො ඤාපෙතබ්බො- සඞ්ඝතෙමේ දැන්වියයුතු වෙයි. සුණාතු මෙ භන්තෙ- වහන්ස, මා කියන්නක් අසනසේක්වා; යමක් තෙමේ සඞ්ඝයා දතයුතුවේද එය දැක්වීම පිණිස මෙය කියනලදී. උපසම්පන්නසමනන්තරං- උපසපත්බැඩි ලත් අනතුරුව; අනාචාරං ආචරති- ශික්ෂාපද විතික්‍රමය කෙරෙයි. උල්ලුම්පතුමං- මා උද්ධරණය කෙරේවා; අකුශලින් නගා කුශලෙහි පිහිටුවාවා; කෙරණ බැවින් නගා භික්ෂුභාවයෙහි

පිහිටුවන සේඛ්‍ය යන අර්ථයි. අනුකම්පං උපාදාය-මා කෙරෙහි අනුකම්පා කොට යන අර්ථයි. අට්ඨිතා භාති-හිඟි පවත්නෝ වෙති. චත්තාරො නිස්සයෙ-සිවුපසය; මේ කරණකොට ගෙණ දිවිපවත්නාහුයි නිස්සය නම්. පිණ්ඩියාලොප භොජනං-ජඞ්ඝාවෙහි පිඩුමත් බලයෙන් හැසිර ආලොප වශයෙන් ලත් භොජනය; අතිරෙකලාභො-සඞ්ඝ භත්තාදී අතිරෙකලාභය; සඞ්ඝභත්තං-සියලු සඞ්ඝයාට දියයුතු බත; උද්දෙසභත්තං-භික්ෂූන් කීපනමක් උදෙසා දියයුතු බත; නිමන්තනං-නිමන්ත්‍රණය කොට (පවරා) දියයුතු බත; සලාකභත්තං-ලහ ගත්වා දියයුතු බත; පක්ඛිකං-පක්ෂයකට වරක් දියයුතු බත; උපොසථිකං-පොහෝදිනෙහි දියයුතු බත; පාටිපදිකං-පෑලවිය දිනයෙහි දියයුතු බත; විහාරෙ-පවුරයකින් පිරිසිදිකළ සියලු ආවාසය; අඩ්ඪයොගො-දික්ගෙය; ගුරුළුතටුව බඳු සටහන් ඇති ප්‍රාසාදයද අඩ්ඪයොග නම්. පාසාදො-සිවුරැස් ගෙය; මහල් කීපයකින් යුත් ගෙයද පාසාද නම්. හම්මියං-(සඳවෙනි රහිතවූ) සඳලුතලින් යුත් ගෙය; ගුහා-පර්වතගුහා; පූතිමුත්ත භෙසජ්ජං-මූත්‍රයෙහි පරිපාචිත බෙහෙය; රන්වන්වූ කයවද පූතිකාය යි නම්කරන්නාක් මෙන් අභිනව මූත්‍රයද පූතිමුත්ත නම්.

පස්වැනි බණවර ගැටපදය නිමි.

---

ආචිණ්ණං-චරිතකි, අනුධර්මතාවකි. කච්චි භික්ඛු ඛමනීයං-මහණ, කිම් (තුඹගේ සිවුසතක් ඇති දෙරනාවයක් ඇති සිරුර) පරිහරණය කරන්ට හැකිද? 'ඉවසිය හැකිද? දුක්රහිතද? යන අර්ථයි. කච්චි යාපනීයං-කිම? (සියලු කටයුතු දෙයෙහි) යැපිය හැකි ද?; අනතුරු රහිතද' යන අර්ථයි. කාලං විදිත්වා-පුද්ගලයාත් දූත; අනෙකා සංඛිත්ත සෙතුසාපෙසා-(සෙතු නම් මාර්ගයයි; මාර්ගයක ලැබී මදිම අනතුරු) සංඛිත වචනයෙහි සමුච්ඡේදය විය. ධීතා කාරුණිකා-කාරුණ්‍ය දෙකකින්; ධම්මං වා භාසිස්සාමි-(අපේාර්ථ පනතිරට අනුරූපවූ) සූත්‍රධර්මය හෝ පෙර චරිතක් වූ ජාතකධර්මය හෝ දේශනාකරන්නෙමි. ඛවදිනයා-අඩිවාද කටයුත්තක් වෙයි. අනුසාසිතබ්බො-අනුශාසනා කටයුත්තෙක් වෙයි. අතිලහුං-ඉතා ශීඝ්‍ර වේ; යදිදං ගණිකාරාමතා-(ගණ බන්ධනතාස අර්ථයි) පොදිබඳින්නෙකු මෙන්; බාහුල්ලාය-බහුලවව පිණිස; ආවත්තො-බැඳගත්තෙක් වෙයි; අබ්භන්තරා-තුන්සඳවගය තනිවෙන් තොර තෙයින් අඳුවූ; සතබ සංඛාතනාදි-නිර්වාන පසයට බැසගත් කල්හි; උපජ්ඣායෙ පක්කන්තෙ-උපාධ්‍යායයන් අන දිගකට ගිය කල්හි; මෙසේ උපාධ්‍යායයන් අන් ප්‍රාන්තයකට පැමිණිකල්හි සද්ධිවිහාරිකයා විසින් එම විහාරයෙහි වූ හෝ අන් විහාරයක වසන්නාවූ හෝ ලජ්ජිතනෙකුන් වහන්සේ සමීපයෙහි නිසා සමාදන්වී වාසයකළ යුතුයි. අලජ්ජි කෙනෙකුන් ලඟ නිසා සමාදන් නොවියතුයුයි. මුල් උපාධ්‍යායයන් වහන්සේ ආපසු වඩින දිනයක් දැනගන්ට ලැබුනුකල්හි අන්තැනකට නොගොස් හෝ නිසා සමාදන් නොවී හෝ බලාපොරොත්තුව විසිය යුතුයි. එසේසින් මේ අයුරු කාලය නිසා සමාදන්ව නොවිහිමෙන් ඇවැත් සිදුවීමක් නොමැතියි.

යම්කිසි අමනාපයකින් "මෙහි නොවසව, තමාගේ පාසිවුරු හැර ගණුව, මට කිසි වතාවත්ද නො කරව, ගම්වැදීම් ආදියෙහිදී මා නොපිරිවරව"යි සද්ධිවිහාරිකයන්ට උපාධ්‍යායයන් කී කල්හි, සද්ධිවිහාරිකයා විසින් උපාධ්‍යාය තෙමේ තෙසේ තමුන් ක්ෂමාකරවා ගත යුතුයි. න අසෙඛෙන සීලක්ඛන්ධෙන (අසෙඛස්ස අයං අසෙඛො ලොකියලොකුත්තර සීලය අසෙඛ නම්.) ලෞකිකලෝකෝත්තර ශීලස්කන්ධයෙන් යුක්තයෙක් නොවේද; අසද්ධො- (තීසු වත්ථූසු සද්ධා එතස්ස නත්ථීති) රත්නත්‍රය විෂයෙහි පවත්නා ශ්‍රද්ධාව නැත්තේ; මේ ප්‍රත්‍යෙකපය ආපත්ත්‍යඞ්ග නිසා නොව අශ්‍රද්ධ හෙයින් කෙරුණකි. අධිසීලෙ සීලවිපන්නො-පාරාජික සඞ්ඝාදි සෙසාදි ඇවැත්වලට පැමිණියේ; අජ්ඣාචාරෙ ආචාර විපන්නො- සෙසු පඤ්චාපත්තිස්කන්ධයන්ට පැමිණියේ; අතිදිට්ඨියා දිට්ඨි විපන්නො-සම්‍යක් දෘෂ්ටියෙන් වෙන්ව ශාශ්වත උච්ඡේදාදි අන්තග්‍රාහික දෘෂ්ටියෙන් යුක්තවූයේ; අප්පස්සුතො- අල්පශ්‍රැතවූ; පිරිසක් පාලනය කරන්නනු විසින් ධර්මයකෙරෙහි මද ශ්‍රැතයකින් වත් යුක්තවිය යුතුයි. එබන්දකින් ද විරහිතවූයේ; දුප්පඤ්ඤො- ප්‍රඥාවිරහිතවූ; දතයුතු ඇවැත් ආදිය නො දන්නාවූ; මෙහි ද්‍රුළුව ත්‍රිකය අශ්‍රැත වශයෙන්ද, පශ්චිමය ආපත්ත්‍යඞ්ග වශයෙන්ද දෙශිතයහ. වූපකාසාපෙතුං-දුරුකරවන්ට; ආපත්තිං න ජානාති-ඇවැත් නො හඳුනයි. මේනම් දෙයක් මගෙන් සිදුවූයේයයි කීකල්හි, එසේනම් තුඹ පැමිණියේ මෙනම් ඇවතකටයයි කියන්ට නොදනී. වුට්ඨානං න ජානාති- ඇවතින් නැගිසිටීම නොදනී. වුට්ඨානගාමී වූ හෝ දෙසනාගාමීවූ හෝ ඇවතින් මෙසේ මෙසේ නැගී සිටීම වන්නේයයි පසඳදෙන්ට නො දනී. මෙහි ප්‍රථමය අශ්‍රැත වශයෙන්ද පශ්චිමත්‍රිකය ආපත්ත්‍යඞ්ග වශයෙන්ද දෙශිතයහ. ආභිසමාචාරිකාය සික්ඛාය- ආභිසමාචාරික සික්ඛාපදයෙන්, (අභිවිසිට්ඨො උත්තමො සමාචාරො, ආභිසමාචාරො) වත්පිළිවෙත් පිළිබඳවූ සීලය ආභිසමාචාරික නම්. ඒ වත් පිළිවෙත් අරභයා පණවනලද ඛන්ධක සික්ඛාපද ආභිසමාචාරික සික්ඛාපද නම්. ආදිබ්‍රහ්මචරියකාය සික්ඛාය- ආදිබ්‍රහ්මචරියක සික්ඛාපදයෙන්; (උභතො විභඞ්ග පරියාපන්නං ආදිබ්‍රහ්මචරියකං ඛන්ධකවත්තපරියාපන්නං ආභිසමාචාරිකං) මාර්ගබ්‍රහ්මචර්‍යයාමට කාරණවූ උභතොවිභඞ්ග සික්ඛා ආදිබ්‍රහ්මචරියක සික්ඛා නම්. අභිධම්මෙ-නාමරූප පරිච්ඡෙදයෙහි; කුශලත්‍රිකාදීන්ගේ වශයෙන් ප්‍රකාශිතවූ ජාති භූමි පුග්ගල සම්ප්‍රයෝග වත්ථු ආරම්මණ කම්ම ද්වාර ලක්ඛණ රසාදි භේද භින්නවූ වේදනාදි ස්කන්ධ චතුෂ්කය හා නිර්වාණය නාම නම්. භූතොපාදාය වශයෙන් ප්‍රභේදවූ රූපස්කන්ධය රූප නම්. මේ නාමරූපද්වය පිරිසිඳ දැක්වීම් හැකිවීම ප්‍රකාශක ග්‍රන්ථය නාමරූපපරිච්ඡෙද නම්. අභිවිනයෙ-සියලු විනයපිටකයෙහි; ධම්මතො විවෙචෙතුං-දහැමින් විසඳන්ට.

ශාලක පකිණ්ණක විනිශ්චය ගැටපදය නිමි.

අඤ්ඤතිත්ථියපුබ්බො- පෙර අන්‍යතීර්ථකයෙක් වූයේ; තස්ස චත්තාරො මාසෙ පරිවාසො දාතබ්බො- ඔහුට සිවුමසක් මුළුල්ලෙහි පිරිවෙස් සමාදන්කරවිය යුතුයි. මේ තිත්ථිය පරිවාසය නග්ගපරිබ්‍රාජකයාට ද, අචෙලකයාට ද, ආජීවකයාට ද දියයුත්තකි. අකිරියවාදී වූයේ ආජීවක නම්. කිරියවාදී නිගණ්ඨයෝ ද අචෙලක පක්ෂයට ගැණෙති. සළුවක් හෝ වාලකම්බිලියක් හෝ අන්‍යවූ තිත්ථියධ්වජයක් හැඳගෙණ පැමිණි ආජීවකයාට පිරිවෙස් සමාදන් නො කරවිය යුතුයි. පඨමං කෙසමස්සුං ඔහාරාපෙත්වා- පළමුකොට කෙස් රැවුල් හරවා; මෙසින් හෙරණ පැවිද්ද දක්වයි. අතිකාලෙන ගාමං පවිසති-භික්ෂූන්ට වත් කරන්ට නියමිත වේලාවෙහි ගමට පිඬු පිණිස වදියි. අති දිවා පටික්කමති-දවල් වත් කරණ කාලය ඉක්මවා විහාරයට පැමිණෙයි. මේ තෙමේ කුලගෙවල දරුවන් සමග ගෙහසිත ප්‍රෙමයෙන් යුත් කථාකරමින් හිඳ එහිදීම වළඳා, අන් භික්ෂූන් වත් සපයා අධ්‍යයන පරිපුච්ඡාදිය කොට හුන් කල්හි පැමිණෙයි. උපාධ්‍යාය වත් ආචාර්‍ය්‍ය වත් කිසිවක් නො කෙරෙයි. විධවා-හිමියන් මළ හෙයින් වැන්දඹුවූ ස්ත්‍රීහු; මොවුහු කවරෙකු සමග වුවද මිත්‍රසන්ථවය පතත්. ථුල්ලකුමාරිකා- යොවුන්වියට පත්වූ හෝ යොවුන්විය ඉක්මවා සිටි ස්ත්‍රීහු; මොවුහු කෙසේ නම් පුරුෂයෙකු ලබාගණිමුදැයි සිතමින් හැසිරෙන්නියෝය. පණ්ඩකා-උත්සන්නවූ කෙලෙසුන් ඇති, නොසන්සිඳුනු කාම දැවිලි ඇති නපුංසකයෝ; පරිලාහවෙගාභිභූතවූ ඔවුහු කවරෙකු සමග වුවද මිත්‍රසන්ථවය පතත්. භික්ඛුණියො-සමාන පැවිදි ඇති ස්ත්‍රීහු; උච්චාවචානි කිංකරණීයානි- කුදුමහත් කටයුතු දේ; ගෙඩිය ගසා රැස්වූ සඟිහි සඞ්ඝයා විසින් කටයුතුවූ සෑ හා පහය පිළිසකරකිරීම් ආදිය උච්චකරණීය නම්. කඳුවත්වූ ගිහිකල්ගෙය ආදියෙහි කටයුතු හා සිවුරුදෙවීම් ආදිය අවචකරණීය නම්. න දක්ඛො හොති-ඒ ඒ කටයුතු දෙයෙහි නොහික්මුනේ වෙයි. න අනලසො- උපාංගවීර්‍ය්‍යයෙන් යුක්තයෙක් නො වෙයි. භික්ෂුසඞ්ඝයා විසින් කටයුතු දෙය ඇතැයි දැනගත්කල්හි කලින් වළඳා ගෙට වැදී හැකිතාක් නිදා සවස් කාලයෙහි පිටවී යෙයි. තත්‍රූපායාය-ඒ ඒ කටයුත්තෙහි උපායසඞ්ඛ්‍යාං තවූ; වීමංසාය-යථොනොචිත වසයෙන් උපන් විමංසා ප්‍රඥාවෙන්; න අලං කාතුං න අලං සංවිධාතුං-සියතින් කරන්ට ද අසමත් වෙයි. (ගණු මැනව ස්වාමීනි, ගණුව හෙරණ, ඉදින් තෙපි නො කරන්නහු නම් අපි නො කරන්නෙමු නම් කවරෙක් මෙය කරන්නේදැයි උත්සාහ දනවා) අනුන් ලවා කරවන්ට ද සමර්ථයෙක් නො වෙයි. උද්දෙසෙ-ප්‍රගුණකිරීමෙහි; පරිපුච්ඡාය-අරුත් ඇසීමෙහි; සංකෙතනා-මෙහි පැමිණියෙක්; තස්ස සත්ථුනො- ඒ තීර්ථායතන ස්වාමිහුගේ; ආදෙය්‍යස්ස-ගැණීමෙ; අවණ්ණෙ භඤ්ඤමානෙ- නිදිබස් කියනුලබන කල්හි; අනභිරද්ධො-නො පිරිපුන් චිත්තසංකල්පනා ඇත්තේ; ඉදං භික්ඛවෙ සඞ්ඝාතනියං අඤ්ඤතිත්ථියපුබ්බස්ස අනාරාධනියස්මිං- අඤ්ඤතිත්ථියපුබ්බයාගේ නො ඇල්මෙන් පිරිවෙස් පිරීමෙහි (ඔහුගේ

පූර්වශාස්තෘවරයාගේ ලබ්ධියේ නුගුණ කියනකල්හි 'කිමෙක්ද? මොවුහු අනුන්ට ගරහත්'යයි නො සතුටු අයුරු හඟවයි. මේ ලකුණුයි. එවං ඛො ආරාධකො—මෙසේ සතුටුකරන්නෙක් වූයේ; කල් නො ඉක්මවා ගම්වැදීමද, දවල් කල් නො ඉක්මවා ආපසු පැමිණීමද, වෙසඟනන් ඈසුරු නො කිරීමද, සබ්‍රම්සරුන් පිළිබඳ කටයුතුවල සමත්බව ද, උදෙසීම් ඈදියෙහි දැඩි ආශාව ද, තීර්ථකයන්ගේ නුගුණ පැවසීමෙහිදී සතුටුවීමද, බුද්ධාදී උතුමන්ගේ නුගුණ කීමෙහි නො සතුටුවීමදැයි යන අට වත් සම්පූර්ණකරන්නේ උපසම්පදා කටයුත්තෙකි. ඉදින් උපසම්පදාමංගලයෙහිදී මින් එක් වතක් මුත් බිඳපී නම් නැවත ඔහුට සිවුමසක් ඛණ්ඩ තීර්ථිය පරිවාස සමාදන් කරවියයුතුයි. විදසුන් වඩා සෝවාන්මගට හෝ පැමිණියහුට නැවත පිරිවෙස් විසීම කිසක් වුවමනා නො කෙරේ. එදිනෙහි ම උපසපන්කරවිය යුතුයි. උපජ්ඣාය මූලකං චීවරං පරියෙසිතබ්බං—උපාධ්‍යායයන් වහන්සේ අධිපතිකොට ඔහුට සිවුරු සැපයිය යුතුයි. උපාධ්‍යායයන් වහන්සේට අයත් පාසිවුරු වෙත් නම් ඔහුට දියයුතුයි. අන්කිසිවෙකු හෝ දෙනු කැමැත්කල්හි උපාධ්‍යායයන් වහන්සේගේ මාර්ගයෙන් ම ලබාදිය යුතුයි. තීර්ථකයෝ විලෝමවූවෝ වෙත්. සඞ්ඝයා පාසිවුරු දුන්කල්හි නුඹට අයිති දෙයින් මට කම් නැතැයි පවසා අවවාදානුශාසනාය ද නො ගන්නාහුය. කමින්ගේ දීම් උපාධ්‍යායයන් කෙරෙහි ගෙහින් උන්වහන්සේගේ වචනයෙහි පවතැති නොවන්නාහුය. එහෙයින් ඔහුගේ පාසිවුරු උපාධ්‍යාය මූලකයයි වදාරණලදී. අග්ගිකා—අග්නිපරිචරණය කරන්නෝ; ජටිලකා—ජටාවුන් පැවිද්දෙන් පැවිදිවූවෝ; කිරියවාදිනො—(කර්මය ඇත කර්මයට විපාක ඇතැයි) මෙසේ දෘෂ්ටි ඇත්තෝ; ආවෙණිකං—අනෙයන් විසින් නො ලැබියයුතු; පරිහාරං—ඉඩය; ශාක්‍යජාතියෙහි මහණවූවෝද අපගේ ඥාති ශ්‍රෙෂ්ඨයාගේ ශාසනයයි නො ගරහති.

අඤ්ඤතිත්ථිය වත්ථු කථා ගැටපදය නිමි.

---

කුට්ඨං—කුෂ්ඨය; රතුවූ හෝ කළුවූ හෝ දද පණුකැවිලි සියල්ලම මීට ඇතුළත්ය. සුලැඟිලි නිය සා වූ ද වැඩෙන පැහැයෙහි පිහිටි පණුකැවිල්ල පැවිද්ද වළක්වයි. සිවුරෙන් පිළිසන් තැනක පිහිටි නො වැඩෙන එබන්දක් ඇති කල්හි එය පැවිද්ද නො වළක්වයි. ගණ්ඩො—ගඩය; ඩෙබර ඇටයක්සාවූ වැඩෙන ප්‍රදෙශයෙහි පිහිටි මේදස් ගඩය, වාසිගෙඩි ද මීට ඇතුළත් වේ. කිලාසො—(සැරව නො වැගිරෙන, සිදීබිඳීයාමක් ද නොමැති සුදු හෝ රතු පියුම් පෙති බිඳු පැහැය ඇති කබරගොයෙකුගේ පැහැය වැනි සමකත් ඇති) කිලාස විශෙෂය; සොසො—ක්ෂය රෝගය; අපමාරො—(යක්ෂොන්මාද පිත්තොන්මාද වශයෙන් දෙපරිදිවූ) උන්මාදය.

පඤ්චාබාධ වත්ථු කථා ගැටපදය නිමි.

පච්චන්තං උද්දිනාති-පසල්රට මර්දනය කරමි; සොරුන් පලවා හැර ආරක්‍ෂා සංවිධාන කොට සීසෑම් ආදිය වර්ධනය කරවමි. මේ රජතෙමේ සෝරවාත් සෙයින් සොරුන් නසව් යයි නො අණවීය. උපජ්ඣායස්ස සෙදුම නිසං සජ්ඣායන්තිනං- දෙවසිනි, උපාධ්‍යායගේ නිය සිදිය යුතුය මෙය පැවිද්දෙනී උපාධ්‍යායයන් වහන්සේගේ ශ්‍රෙෂ්ඨත්වය හැඟවීම පිණිස ව්‍යවහාරයෙහි පැමිණියේයි. පැවිද්දෙනි උපාධ්‍යාය තෙමේ ශ්‍රෙෂ්ඨ වෙයි. ආචාර්ය තෙමේ ඉක්බිති ශ්‍රෙෂ්ඨය. ඉක්බිති ගණයා ශ්‍රෙෂ්ඨය. නිජ්ජා ධ්‍ර-රජ්ජහට් ගතෙමි; අවන්ති, සෝණකාදි රජයෙහි සහාතුරනාව පැමිණි නොබිත්දෙස් නමුදු රාජභට ශබ්දයෙන් ගැණෙනි. නතතුරක් නැතැයා රජ්ජමෙනතාගයන් ජීවිත්වත් ගෝද මෙහි ඇතුලත්වෙයි. රජුගේ අනුමිතිය ලත් කල්හි පැවිදි කළහැකි වෙයි. ධජබද්ධො--(ධජං බන්ධිත්වා විය විචරතියි) එසවූ ධජයක් මෙන් ප්‍රකටව හැසිරෙණ සොරනු; සිවාදීන් මෙන් ලොව පතලනු; බුදුරජානන් වහන්සේ අඟුල්මල් සොරු මහණකොට එබන්දන්ගේ මතු මහණවීම වළක්වනු පිණිස මේ ශික්ෂාපදය පැණවූසේක. ගම් පැහැරීම්, මංපැහැරීම සන්ධිච්ඡේදාදිය කරමින් හැසිරෙණ සොරුද මහණ නොකට යුතුයි. පසුව උවනු බැවින් සිටිකල ඔව්හුද මහණ කටයුත්තාහුය. කාරභෙදකො-බන්ධනාගාරාදියෙන් පැන ආ තැනැත්තෝ; ලිඛිතකො චොරො- “දුටුතැන ඇල්ලිය යුතුයි' නැත හොත් නැසිය යුතුයි” මෙසේ ප්‍රසිද්ධියට පත් සොරතෙමේ; කසාහතො කතදණ්ඩකම්මො- කසපහර ලත්, කරණලද දඬුවම් ඇති තැනැත්තෝ; දඬුවමින් වූ වණ පිළියල් සුවවූ කල පැවිදිකටහැකි වෙයි. ලක්ඛණාහතකො-(දඬුවම්කිරීම් වසයෙන් නලලෙහි හෝ කලවයෙහි හෝ යමකිසි තැනක ලකුණු එබූ තැනැත්තෝ; නිවඩුලු වසා ගදනය හැඳිනල්හි සුවයල වණය නොපෙණේ නම් හේ පැවිදිකළහැකි වෙයි. ඉණායිකො-ණයගැති තැනැත්තෝ; ඇතිනය යමෙකු 'මම ගෙනවම්'යි භාරගත් කල්හි හේ පැවිදි කටහැකිය.

අභාසූවන- ලබනලද අභය ඇත්තෝ; කම්මාර භණ්ඩු- මුඩු හිස් ඇති රන්කරු පුතෙක්; සඞ්ඝං අපලොකෙත්වා- භණ්ඩුකම්මාය- භණ්ඩුකම්ම හෙවත් කෙශච්ඡේදනය පිණිස සඞ්ඝයා විචාරන්ට; බද්ධ සීමාවෙහි හෝ උපචාර සීමාමෙහි හුන් භික්ෂූන් රැස්කොට ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකයා එහි යවුණුවා, ස්වාමිනි, මේ දරුවාගේ භණ්ඩුකම්මකාරන්ට සඞ්ඝයා විචාරති” යි මෙසේ දෙතුන්වරක් හෝ එක්වරක් ප්‍රකාශ කළයුතුයි. ඔබ්බූ හිස් ඇත්තාගේද, ගෙද අගලනට උබුවූ කෙස් ඇති හිස් ඇත්තාගේද කෙශච්ඡේදන කාර්යයන් එකෙණෙහි නොමැත. අහිවාතකරොගෙන-මහමාරි රොගයෙන්; මේ රොගය වැළඳුනු කුලයෙහි විපාදවතුෂ්පාදදි සියල්ලෝම විනාශයට පැමිණෙත්. යමෙක් ගෙහි භිත්තිය හෝ පියැස්ස බිඳගෙණ පලායේද හේ ජීවත්වේ. කාකුඩ්ඩෙපකං-(ඉදිරියෙහි වූ ආහාරය දකුණතින් අනුභවකරමින් වමතින්) එහි රැස්වූ කවුඩන් පලවාදමන්ට හැක්කානු; ආහුණ්ඩිකා-සමිඤ්ජනය.

අචාපුරණං-සතුර; දක්ඛිණගිරිං- එනම් දනව්ව; මෙය මගධරටට අයත්වූවකි. රජගහනුවර හාත්පස පිහිටි කඳුවැටියෙන් දකුණුදිග පිහිටි හෙයින් මෙ නම වීය. ඉත්ථාගාරං- ලාමකයෙක්; ඔහීණසෙනා- පිරිහුණු භික්ෂුගණයා ඇති.

අභිණ්හවර බණවර ගැටපදය නිමි.

---

අතික්කන්තවරා ඛො ගොතම තථාගතා-ගොතමය, තථාගත වරයෝ ඉක්මවූ වර ඇත්තෝ වෙත්. පිඬු හැසිරීමෙන් ජීවත්වන පැවිද්දෙකුගෙන් 'වරයක් ඉල්ලමි' යි කී කල්හි එය ලේනු මැනවැයි කීම නුසුදුසුය. පෙර බුදුවරුන් විසින් ද එය අනාචිණ්ණං. යං ච කප්පති යං ච අනවජ්ජං-සචාමිති, යමක් හඳුන්ව සුදුසුද, යමක් නිරවද්‍යත් වේද, [illegible] න භික්ඛවෙ අනනුඤ්ඤාතො මාතාපිතූහි පුත්තො පබ්බාජෙතබ්බො-මහණෙනි, මවුපියන් අනුනොදත් පුත් තෙමේ පැවිදි නො කටයුත්තේ වෙයි. මෙහි සවනිය මවුපියෝම ගැණෙත්. මවුපිය දෙදෙනාම ජීවමාන කල්හි දෙදෙනාගෙන් ම පිළිවිසිය යුතුයි. එක්කෙනෙකු මළ කල්හි ජීවමානව න්නහුගේ කැමැත්ත ගතයුතුයි. උපැවිදි වූවන් හැරවා පැවිදිකිරීමෙහිදී ද මවුපියන්ගේ කැමැත්ත උවමනා වෙයි. මා පැවිදි නො කරණ සේක්නම් මියෙතුදු මෙතැනින් නො යමි. විහාරය හෝ ගිනිතබමි. යසකින් හෝ පැන දිවිනසාගණිමි' යනාදි වශයෙන් බණින්නේ ආරක්ෂාව පිණිස මවුපියන් නො විචාරම පැවිදි කටයුතුයි. අබ්‍රහ්මචරියා-මෙවුන්දම් සෙවීමෙන්; නච්ච-නැටුම්; සතුන් කෙළවීම් ආදියද මීට අයත්වේ. මාලා-ගෙතු හෝ නො ගෙතු මල්; අලංකාර පිණිස පළඳිනු ලබන හුද මාලාසබ්බඥාවට යේ; ගන්ධ-විලවුන් හැර අන්‍යවූ මුව සුවඳ කරෙණ දෙය; විලෙපන ඡවිරාගය පිණිස හෝ සුගන්ධය පිණිස ඇඟගාන ආලෙපය; ධාරණං-දැරීම; මණ්ඩනං- උනුතැන් පිරවීම; විභූසනං-සැරසීම; අලාභාය පරිසක්කන්ති- (සඟනාට ලැබෙන) ලාභය වැළැක්වීම පිණිස උත්සාහ කෙරෙයි. අනත්ථාය- උවදුරු පිණිස; අවාසාය-අවසින් තොරණ පිණිස; අක්කොසන්ති පරිභාසන්ති-ආක්‍රොශ කෙරෙයි, බියදනවා තැතිගන්වයි; භෙදෙන්ති- (කෝලාම් කියා ඔවුනොවුන්) බිඳුවයි. ආවරණං කරොන්ති (සඟරමට පැමිණීම) වළක්වයි. මුඛද්වාරිකං ආහාරං ආවරණං කරොන්ති-(අද අනුභව නො කරවයි) මුඛවාරිකවූ ආහාරය වළක්වත්. න භික්ඛවෙ මුඛද්වාරිකො ආහාරො ආවරණං කාතබ්බො-මහණෙනි, මුඛවාරික ආහාරය නො වැළැක් විය යුතුයි. 'නො කාල, අනුභව නො කරව' යි කියන් යනුව ද, ආහාරය වළක්වමියි පාසිවුරු සඟවාත්යනුව ද, සියලු ප්‍රයොජනයන්හි දුකුළා ඇවැත් වේ: න භික්ඛවෙ උපජ්ඣායං අනාපුච්ඡා-උපාධ්‍යායයන් නො විචාරා; නුඹවහන්සේගේ හෙරණනුගේ මෙබඳු අපරාධයෙක් වෙයි. එයට සුදුසු දඬුවම් කටයුතුයයි කෙවරක් උපාධ්‍යායයන්ට දැන්විය යුතුයි. ඉදින් උපාධ්‍යාය තෙමේ ඊට සැලකිලි නො දක්වා නම් තමනාම දඬුවම්

කාරියතුයි. අපලිබෝධනයි- (නුඹට පාත්‍රයක් දෙමු, සිවුරක් දෙමුයි තමන්ට උපස්ථාන කරවාගැනීම පිණිස) පොළඹවයි. න භික්ඛවෙ අඤ්ඤස්ස පරිසා අපලාලෙතබ්බා-අන්‍යයාගේ පිරිස පොළඹවා නො ගතයුතුයි. හෙරණෙක් හෝ වේවා, උපසපන්නෙක් හෝ වේවා, අන්‍ය පක්‍ෂයකට අයත්වේනම් හේ ඒ පිරිස සමඟ භෙදකරවා තම පක්‍ෂයට නො ගතයුතුය. ඔහුගේ දුසිල්කමක් දුක ශාසන ගෞරවයෙන් හෝ උහු කෙරෙහි අනුකම්පාවෙන් අවවාදකරන්ට වටී. තමන්ම කලකිරී එන්නහු භාරගත යුතුය. අනුජානාමි භික්ඛවෙ දසහඞ්ගෙහි සමන්නාගතං සාමණෙරං නාසෙතුං-පන්නම්කිරීම් ආදි දස අඟකින් යුක්තවූ හෙරණුහු (ලිඞ්ගනාසනයෙන්) නසන්ට අනුදැනීමි. හෙරණ තෙමේ කුන්ථකිපිල්ලිකාදීන් මරා නැසියයුතු බවට පැමිණේ. පළමුකොට ම ඔහුට සරණාගමනය ද, උපාධ්‍යාය ග්‍රහණය ද, සෙනසුන් ගැනීම ද පරිස්ලාභය ද වැළකේ. එතම පැවිදි ලිඞ්ගය පමණක් ඉතිරිවේ. ඇඟිණිවූ දෝෂයෙන් යුත් හෙතෙමේ ආයතිසංවරයෙහි නො පිහිටා නම් නිෂ්කාශනය කටයුතුයි. හෙරණුන්ගේ සරණාගමනය භික්ෂූන්ගේ උපසම්පදා කම්වාචාවට සමාන වේ. එහෙයින් භික්ෂූන් සිවුපිරිසිඳු සීලය මෙන් හෙරණුන් දසසීලය සමාදන් වියයුතුයි. මුණ්ඩවෙල්ල- මහත් සිරුරු ඇති; නට්ඨසංකණ්ඩ-ඇස්හොඳුවන්; පණ්ඩකො-පණ්ඩකයා: ආසිත්ත, උසූය, ඔපක්කමික, පක්ඛ, නපුංසකයයි පණ්ඩකයෝ පස්දෙනෙක් වෙත්. මෙයින් ආසිත්ත උසූය දෙදෙනා පැවිදි කටහැකි වෙත්. උපසම්පන්නො නාසෙතබ්බො- උපසපන් වූයේද ලිඞ්ගනාසනයෙන් නැසිය යුත්තේය. ඕණපනාලපක්කො-මවුපිය දෙපසෙහි සැලකියයුතු කිසිනෑදෑයෙක් නොමැති; පුරිස පුග්ගලකො- පැරණි පිරිහුණු කුලයක වූ පුත්‍රයෙක්; අනුපසම්පන්නො- (එක් පසකට කැඳවාගෙණ ගොස් භණ්ඩුකම් කාෂායවස්ත්‍ර ප්‍රතිග්‍රහණ, සරණායමක උපාධ්‍යායග්‍රහණ යන ආදිය පිළිබඳ) කරුණු පළමුසිටු ලබන්නෝ; එසාමඤ්ඤං ආකරොටි- සවයංප්‍රව්‍රජිතභාව සම්බන්‍ධ මේ කාරණය (මුලපටන්ම) කියේත. ථෙය්‍ය සංවාසකො- (ථෙය්‍යාය සංවාසො එතස්සාති ථෙය්‍යසංවාසකො) සොරකමින් වූ සංවාසය ඇත්තෝ; ලිඞ්ගත්ථෙනක, සංවාසත්ථෙනක උභයත්ථෙනක යයි ථෙය්‍යසංවාසයෝ තිදෙනෙකි. යමෙක් තෙමේ පැවිදි වී විහාරයකට පැමිණ වැඩිමහලු පිළිවෙළින් වැඳීම් ආදිවත් නො විචාරා, උපොසථපවාරණ කම්යන්ට ද නො පැමිණ වේනම් ද, මේ පැවිදි ලිඞ්ගය පමණක් සොරකමකළ හෙයින් ලිඞ්ගත්ථෙනක නම්. යමෙක් භික්ෂූන්ගෙන් හෙරණ පැවිද්ද ලැබුයේ අන් රටකට පැමිණ "මම දසවස් විසිවස් ඇත්තෙක් වෙමි"යි මුසා බැණ, වැඩිමහලු පිළිවෙළින් වැඳුම් ලමයා ද, උපොසථපවාරණ කම්යන්ට පැමිණේ ද ඔහු සංවාසත්ථෙනක නම්. ශ්‍රමණ ලිඞ්ගය හා සංවාසය යන දෙනම සොරකම්කොට ගත් තැනැත්තේ උභයත්ථෙනක නම්. මේ තිදෙනාම පැවිදි උපසපන් බැව් නො ලැබිය යුත්තෝය. තිත්ථිය පක්කන්තකො-තීර්ථකයන් කෙරෙහි ප්‍රවිෂ්ටවූයේ; හෙතෙමේ පැවිදි නො කටයුතුයි. උපසම්පදා නො කටයුතුයි. තිරශ්චීනයෙක් මෙවිසි

සිවුරු සමග තීර්ථකාශ්‍රමයට පැමිණෙන්නා භික්ෂුවට පියවරක් පාසා දුකුළාවේ. ඔහු ඒ වෙස් ගත් කෙණෙහි ම තිත්ථියපක්කන්තක නම්. තීර්ථකාශ්‍රමයට ඇතුළු ගෙරණ හට පසුව පැවිදි උපසම්පදා ලැබිය හැකි වෙයි. නාග යෝනියා අට්ටීයති- නාගයෝනියෙහි පීඩිතවෙයි. හෙතෙමේ කුසලවිපාක වශයෙන් (මිනිසත් වැනි සැපත් අනුභව කෙරෙයි. එහෙත් අකුසලවිපාක ප්‍රතිසන්ධි හෙයින් මෛථුන්දම් සෙවනය, විස්සත්ථනිද්‍රොපක්කමනය, දිගෙහි හැසිරීම, මනුෂ්‍යකාසෙනය යන අවස්ථාවන්හිදී නාගශරීරය මතුවෙයි. එසේ නාගාත්මය මැවීම හෙතු කොට හෙතෙමේ පීඩිතවෙයි. ලජ්ජිත වෙයි. පිළිකුල් කෙරෙයි. විස්සට්ඨො නිද්දං ඔක්කමි- සැහැසුනේ මනසින් දව බැසගත්තේය. සිහියෙන් ප්‍රකෘතිව සාපිම්ඩයෙන් ශරීරයෙහි කල්හි සං අත්බව පත්‍ර නො වෙයි. විස්සරමකාසි- (නා හිරිගෙ දූත අභීත භයට පැමිණියේ ශුභවිමශ ද අම්භ නත්පුරයේ) විරූපවූ මහත් හඬක් කෙළේය. තුම්හෙ ඛො අයි! යෙදි වනායි නාගයෝය; ධම්ම පිදගීකා මිසිපලගත් ලැබීමට අදහස නොකොට මේ ශාසනයෙහි අබිරැලකි ධම්ම ඇන්නෝ වන්නෙතුය. පණ්ඩකා- නපුංසකයන් සමග; මනුෂ්‍ය ආදිවූ අන්‍ය ජාතීන්ගේ ස්ත්‍රීන් සමග මෛථුන්දම් සෙවනය කරණ කල්හි දෙවිපුයු වෙසය ගනී. තිරච්ඡානගතො- තිරිසන්ගතයෙක්; නාගයෙක් හෝ වේවා ගුරුළෙක් හෝ වේවා සක්දෙව්රජු පවා මිනිස් නොවන අන් සියල්ලෝම තිරශ්චීන සඞ්ඛ්‍යාවට ඇතුළත් වෙති. නිරන්තරගතං- තිරිසිඳුවීම; පිළිගම් හිරීම; මාතුඝාතකො- සිය මවු මැරූයේ මිනිස් මාගමක් වූ ස්වකීය මව භික්ෂුවූවෙකු විසින් දිවියෙන් තොරකරන ලද්දේ නම්, එකල්හි ඔහුට ආනන්තර්‍යයයි සංඛ්‍යාත මාතෘඝාතක කර්මය සිදුවේ. එහෙයින් ඔහුට පැවිදි උපසම්පදා නො ලැබිය හැකිය. අජනක මව මැරීමෙන් ඔහුට ආනන්තරීය කර්මය සිදුනොවේ. පැවිදි උපසම්පදා ද අවාරිතය. තිරිසන්වූවනු මිනිස් මිනිස් මාගමක්වූ මව මරණලද්ද, ඔහුට ආනන්තරීයකර්මය සිදුනොවේ. ශාසනයෙහි පැවිදි උපසම්පදා ද ලැබිය හැකි වෙති. අරහන්තඝාතකො- රහතුන් මැරූයේ; මිනිස්බවෙහි පිහිටි පැවිදිවූ හෝ නුවූ රහතුන් ඝාතනය කොට මිට අයත්වෙයි. අමනුෂ්‍යවූ රහතෙකු හෝ මිනිස්බවෙහි සිටි අරිය පුද්ගලයකු හෝ නසන්නහුට ආනන්තරීය නො වේ. පැවිද්ද ඔහුට අනිවාරිතය. එහෙත් කර්මය වනාහි බලවත් වේ. මිනිස් රහතෙකු නමුත් නසන තිරිසන්ගතයාහට ආනන්තරීය සිදු නො වේ. භික්ඛුණී දූසකො- පිරිසිදු මෙහෙණියක් තුන් මඟින් එකී මඟකින් දූෂණය කරණ තැනැත්තේ; එබඳු මෙහෙණියන් දූෂණකරන්නහු භික්ෂුණී දූෂක සංඛ්‍යාවට අයත් නො වේ. සංඝභෙදකො- (දෙව්දත්හු මෙන් ශාසනය උද්ධම්ම උබ්බිනය කොට සිවුවැදෑරුම් කර්මයන් අනුවරෙන් ගමයින්) සඞ්ඝ භේදය කරන්නේ; ලොහිතුප්පාදකො- (දෙව්දත්හු මෙන් වධකචෙතනාවෙන් තථාගත ශරීරයෙහි කුඩා මැස්සකු පානයකරණ පමණවූද) ලේ පිඳක්වත් උපදවන්නේ; තථාගතයන් වහන්සේ අභේද්‍යකාය හෙයින් උන්වහන්සේගේ සිරුරින් ලේ නො

වැඩිවේ. කොපමණ ලෙස ප්‍රශ්රාව කිරීයි. උභතොබ්‍යඤ්ජනකො- (කැමැති කැමැති කෙණෙහි) ස්ත්‍රීලිඞ්ග පුරුෂලිඞ්ග සඞ්ඛ්‍යාත දෙ ලිඟු මවා ගැණිම් ඇත්තේ; 'බ්‍යඤ්ජනක' යනු ලිඞ්ගයට නමකි. ස්ත්‍රීලිඞ්ගය ඇති කල්හි ඔහුට පුරුෂලිඞ්ගය නොමැති. එසේම පුරුෂලිඞ්ගය ඇති කල්හි ස්ත්‍රීලිඞ්ගය නැත. ඉන්ද්‍රිය වශයෙන් පවත්නේ එකක්ම ය. එය අජ්ඣාසය පරිදි වෙනස්වේ. ගැබ්දරන්නේ ස්ත්‍රී උභතොබ්‍යඤ්ජනකයායි. පුරුෂ උභතොබ්‍යඤ්ජනකයා- තෙමේ ගැබ් නො දරයි. අනුන්ට ගැබ් පිහිටුවයි. අනුපජ්ඣායකො- උපාධ්‍යාය නිරහිතවූ; "උපජ්ඣායො මෙ භගවා හොහි" යි උපාධ්‍යායග්‍රහණය නො කළහු; මෙසේ උපසපන් වූවෝ ධර්මයෙන් ද ආමිෂයෙන් ද සඞ්ග්‍රහ නොලබත්. සෙසොපජ්ඣාය තිත්ථියා- ආජීවකයෝ යම්සේද එසේය; ආජීවකයෝ සූප ව්‍යඤ්ජන සහිතව හැඳූ භොජනය ගන්නාකලයෙහි නැඹුකල්හි අනුගව කරති. අපත්තචීවරකො- (උපසපන්නම්කල භික්ෂූන්ට) දුකුලං ඇවැත් සිදුවේ. කම් කොපනය නොවේ. හත්ථච්ඡින්නකො- සිඳුනු අත් ඇත්තෝ; අතේ වැලමිටෙන් අග පෙදෙස සතර කම්. කණ්ණච්ඡින්නකො- සිඳුනු කන් ඇත්තෝ; මිණිගොබොල් පිණිස පැලූ කන් මසා හුවා කලකල්හි ඔහුට පැවිදිවීමට හැකිවෙයි. නාසච්ඡින්නකො- සිඳුනු නැහැය ඇත්තෝ; නාස් ඇටය හෝ නාස්පුඩු අගද මෙහි නාසිකාසඞ්ඛ්‍යාවට ම ගැණේ. අඞ්ගුලිච්ඡින්නකො- සිඳුනු ඇඟිලි ඇත්තෝ; යටත්පිරිසෙයින් නුල් කෙඳි තරම්වූද නිය නො පෙණෙන සේ සිඳුනු ඇඟිල්ල ඇත්තේද මීට අයත් වේ. අළච්ඡින්නකො- සිඳුනු මාපට ඇඟිලි ඇත්තෝ; කණ්ඩරච්ඡින්නකො- සිඳුනු මස නහර ඇත්තෝ; ඵණහත්ථකො- පෙණය වැනි අත් ඇත්තෝ; වවුල් පියාපතක් මෙන් එකට බැඳුනු ඇඟිලි ඇති අත් ඇත්තාහු; එය පැලීමෙන් වෙන්කොට සුවකරගත් කල්හි ඔහුට පැවිද්ද ලැබියහැකිය. ඛුජ්ජො- වකාගැසුනු සිරුරු ඇත්තෝ; උදරයේ හෝ පිටේ හෝ පසෙක හෝ වක්ගතිය ඇත්තෝ; හිසි අඟපසඟක් මදක් වක්වූ තරමකින් ඔහුට පැවිද්ද නො වැළකේ. එසේ මද වක් ගතියක්වත් නොමැත්තෙක් බුදුරදුන් හැර නොමැත. වාමනො- මිටිවූවෝ; ජඞ්ඝවාමන, කටිවාමන, උභයවාමනයයි මොවුහු තිදෙනෙක් වෙත්. ජඞ්ඝවාමනයාගේ කටියේ පටන් යටිකය කුඩාවෙයි. උඩුකය සම්පූර්ණවෙයි. කටිවාමනයාගේ උපරිම කය කුඩාවෙයි. හෙට්ඨිම කය සම්පූර්ණවෙයි. උභය වාමනයාගේ උඩු යටි දෙකය ම කුඩාවෙයි. මේ තිදෙනාම පැවිද්දට නුසුදුසුස්සෝ වෙත්. ගලගණ්ඩී- ගෙලෙහි ගෙඩි ඇත්තෝ; මෙහි 'ගල' යනු දේශනාවිලාසයය. සිරුරෙහි යම්කිසි තැනක වුවද එබඳු ගෙඩි ඇති කල්හි ද මහණකමට නුසුදුස්සෙකි. සිපදී- සල බරවා ඇත්තෝ; පාපරොගී- කර්මවිපාක වශයෙන් සාධ්‍ය රෝග ඇත්තෝ; අරිශස්, භගන්දර, පිත්තරොග, සෙම්රෝග, කාස, ශ්වාස ආදීහු කර්මජරොගයෝ වෙත්. පරිසදූසකො- (තමාගේ විරූපත්වයෙන්) පිරිස දූෂ්‍යකරන්නෝ; යක්ෂ දුටුහු තමාමක් මෙන් කාල වර්ණවූවෝ; සමින් වසාගත් නහර ඔවියක් සේ සිය සිරුරු ඇත්තෝ, මළ කඩාහැලෙන ඉතා කර සිරුරු ඇත්තෝ; ගණදෙවියන් මෙන් මහත් බඩක් ඇත්තෝ, ගීව මණ්ඩයෙහි ලොකු කැපියක් නමාලූ

කලක් මෙන් මහත් හිසක් ඇත්තෝ, ගමාදෙස්සක් සේ කැමිතැන්හි ඔබනාගුනු හිසක් ඇත්තෝ; තල්ලොද පිඩක් වැනි පැහැ ඇති හිසක් ඇත්තෝ, බඹරයක් සේ ක්‍රමයෙන් අවනතවූ හිසක් ඇත්තෝ, ව්‍රණිතවූ හිස් ඇත්තෝ, පණුවන් වැටුනු නෙතක ගොයමක් සේ තැනින්තැන මඳ මඳ කෙස් ඇති හිස් ඇත්තෝ, තල්ඉරටු මෙන් රළුවූ කෙස් ඇති හිස් ඇත්තෝ, එලිහාවූ කෙස් ඇති හිස් ඇත්තෝ, ගිනිගත් කලක් මෙන් වැටහෙන තඹ කෙස්වලින් ම වැසීගිය හිස් ඇත්තෝ, එකා බද්ධවූ බැමියුවලක් ඇත්තෝ, මහමුහුණත්තේ මෙන් මහත්වූ ඇස් ඇති මුහුණු ඇත්තෝ, උකාගපුලුමයාගේ මෙන් කුඩා ඇස් ඇති මුහුණු ඇත්තෝ, නොසමවූ එසේම උස්පහත්ව පිහිටි ඇස් ඇත්තෝ, කකුළුවන්ගේ මෙන් පිටතට නෙරාගිය ඇස් ඇත්තෝ, මීකැන් වවුලු කන් වැනි කන් ඇත්තෝ, නිතර කුණුගඳ වහනයවන කන් ඇත්තෝ, නිතර කඳුලුහලන ඇස් ඇත්තෝ, කුඩා හෝ මැදින් බිඳීගිය නැහැය ඇත්තෝ, ගිරාතුඩක් මෙන් වක්වූ නැහැය ඇත්තෝ, මැඩියන්ගේ මූව වැනි මහත් මුව ඇත්තෝ, නිතර විවෘතවූ හෝ වක්වූ මුව ඇත්තෝ, හට්ටි ගැටියක් මෙන් මහත්වූ තොල්සහලක් ඇත්තෝ, පිටත සුදුපැහැය ඇති ඇතුළ රතුපැහැය වූ තොල් ඇත්තෝ, නිතර දුගඳ වහනයවන මුව ඇත්තෝ, යටට හෝ උඩට විහිදීගිය දත් දෙපෙල ඇත්තෝ, ගවකනු වැනි මහත්වූ හකු ඇත්තෝ, දෑළිරැවුල් නැත්තෝ, [illegible]ක් කරක්සේ දික්වූ ගෙල ඇත්තෝ, ඇතුළට කාවැදුනාක් වැනි කොටවූ ගෙල ඇත්තෝ, ඉතා කුඩාවූ හෝ දික්වූ අත්පා ඇත්තෝ, දද පණුතැඹිල්වලින් වැසීගිය සිරුරු ඇත්තෝ, ලිග්ගල් මෙන් උල්ව පිහිටි කටිය ඇත්තෝ; මහත්වූ කලවා යුවලක් ඇත්තෝ, අණ්ඩවාත රෝගය ඇත්තෝ, ඉඟුරු අතු මෙන් ගැටගැසුනු ඇඟිලි ඇති අත්පා ඇත්තෝ, අඳ හෝ ගොළු බිහිරිවූයේ යන මොවුහු පරිෂද්දූෂකයෝ වෙත්. එහෙයින් පැවිදි නොකටයුත්තාහුය.

හත්ථච්ඡින්නාදිවත්ථු කථා ගැටපදය නිමි.

---

අලජ්ජීනං නිස්සාය වසන්ති- අලජ්ජීන් ඇසුරු කොට වසති. භාව භික්ඛු සභාගතාං ජානාමි- නිස්සය දෙනා භික්ෂුහුගේ භික්ෂූන්ට සභාගවූ දිට්ඨි සීලාදිවූ ගුණ කොතෙක් ගමනාක් දනිම්ද එතෙක්; හුපුරුදු තැනකට නිස සඳහා පැමිණි භික්ෂුව විසින් 'පැමිණ නිස සමාදන් වෙම්'යි කී පමණකින් එහි ගොස් නිස සමාදන් නොවී නිසදෙන භික්ෂුහුගේ ලජ්ජීභාවය සතරපස් දවසක් ම පරීක්ෂාකළ යුතුයි. ලජ්ජීභාවය සැර්වරතාම් කැයි පිටින් දත් කල්හි ද මෙතුන් දවසක් කමත් ම පරීක්ෂාකළ යුතුය. ඉදින් පුරුදු තැනක් නම් එදම නිස සමාදන් විය යුතුයි. පරිහාරය එක් දවසක් වත් නො ලැබෙයි. පෙරයම නිස සමාදන් වන්නට ඇදුරුතුමන්ගෙන් අවකාශයක් නොලද කල්හි පැසුළුයම සමාදන් වෙමියි යනතාල නොහෙද්. අරුණ නැගී බවද නො දනී; ඒ

ශිෂ්‍යකට අනාපත්තිය. නිශ සමාදන්වීමට බලාපොරොත්තුවෙන් කොටව ගමන කරන්නහුට අරණ්‍යගාමිකයෙහි ප්‍රතිලාභ ඇතියක් වේ. නිස්සය කරණීයො-(මෙහි 'නිස්සය' නම් 'නිශ ගැනීම' යි) නිශ සමාදන්වීම කටයුතු වෙයි. මා විසින් නිශ සමාදන්විය යුතුය යනු අදහසි. “නිස්සයගහණං නිස්සයො, සො කරණීයො යස්ස” යනුවෙන් විශේෂණ පදයාගේ පරනිපාතය විය. නිස්සයං අලභමානෙන-නිශ නො ලබන්නහු විසින්; තමන් සමග අදන්මනට පිළිපන් නිස්සයදායකයකු නැති කල්හි නිශ නො ලැබෙයි. එසේ නිශ නො ලබන්නහු විසින් බොහෝ දවසක් මුළුල්ලෙහි වුවද නිශ ඇදුරකු නොලැබ යායුතුයි, පෙර නිශ ගෙණ වැස පුරුදු කිසියම් ආවාසයකට ඇතුළුවේද, එහි එක් රැයක් වසන්නහු විසින්ද නිශ සමාදන්විය යුතුයි. අතරමග වසන් නෝ වේද, ගම්නෙහි උපාසක ඇති බැවින් ඒ සිසුනට අනාපත්ති වේ. ඇතුළුවස නිබඳ වාසයකළ යුතුයි. නිසද සමාදන්විය යුතුයි. නැවත යන්නහුට වස්සානකාලය පැමිණි කල්හි නාමුත් නිශ නො ලැබීම අනාපත්ති කෙරේ. යාචියමානෙන-(ඒ ගිලනා) ඉල්වනු ලබන්නහු විසින්; ඵාසු හොති-(සමථවිදර්ශනාවන්ගේ පිළිලැබීම වශයෙන්) පහසු වේ; මේ ඉඩය සේවාස් ශකෘදාගාමී අනාගාමී අර්හත්නයන් හිඹුද නො ලැබියහැකි වෙයි. යමෙකුට තරුණවූ සමථවිදර්ශනා ඉඳින ඇත්තේ වේද ඒ ආරක්ෂක සිසුව විසින්ම මේ ඉඩය ලැබියහැකි වෙයි. ගොත්තෙනපි අනුස්සාවෙතුං- ගොත්‍රයෙන් අනුශ්‍රාවණය කරන්නට; “ආයස්මතො පිප්ඵලියස්ස උපසම්පදාපෙක්ඛො” යි මෙසේ නාමය නො බැණ, 'කො නාමො තෙ උපජ්ඣායො'යි ඇසුවිට 'ආයස්මා මහා කස්සපො'යි ගොත්‍රයෙන් අනුශ්‍රාවණය කරන්ට අනුදනිමි. එසේ ම ප්‍රසිද්ධවූ අනික් නමක් වේනම් ඒ නාමින් හෝ පහසුව පිණිස එසේ ලෙණසි තබානලද ලැබූ නමකින් හෝ අනුශ්‍රාවණය කටයුතුයි. උපාධ්‍යාය තෙරුන්ට මෙන්ම උපසම්පදාපෙක්ෂකයාහටද අනික් නමකින් අනුශ්‍රාවණයෙහිදී පෙණීසිටියහැක. 'අයං තිස්සො' කියා ද; 'අයං නාගො' කියා ද අනික් නාමසම්මුතියක් කරන්නහු විසින් එය අනුශාසක සම්මුතියට පළමුවෙන් ම තබාගත යුතුයි. ඉක්බිති සමඝයේ අන්තරායික ධම්ම පිළිවිසිය යුතුයි. 'කිං නාමොසි?' 'අහං භන්තෙ නාගො නාම' 'කො නාමො තෙ උපජ්ඣායො?' උපජ්ඣායො මෙ භන්තෙ තිස්සො නාම; මෙසේ උපාධ්‍යාය උපසම්පදාපෙක්ෂක දෙදෙනාගේ සිත්හිලි 'මේ මාගේ නාමසම්මුතිය'යි මනා වෙන ම හැඟීම් ඇතිකරගත යුතුයි. පළමු පිහිටි නමින් බැණ පසුව ක්ෂණිකව වශයෙන් හෝ තබාගත් නාම සම්මුතිය අතරතුර ව්‍යවහාර කරන්ට නො වටී. උපසම්පදාපෙක්ෂකයා හට අනික් නමක් තබාගණු කැමැති සඞ්ඝයා විසින් ප්‍රථමයෙන් ම එය තබාගත යුතුයි. ඥත්ති අනුශ්‍රාවණාදි ප්‍රයෝගයන්හිදී ඒ තබා ගත් නමම ව්‍යවහාර කටයුතුයි. 'උපාධ්‍යාය' ශබ්දයට පෙරටුව යෙදුන 'ආයුෂ්මතා' ශබ්දය හැමතැන්හිලදීම යෙදුවද නො යෙදුවද වරද නැත. එසෙයින් ඥප්ති අනුශ්‍රාවණ සියලු ප්‍රයෝගයන්හිදීම එක් ක්‍රම

යක් යෙදීම උචිතවේ. ඡබ එකානුසාවණා- දෙදෙනක් එකවිට අනුසාවණයෙකි; ('එකස්මිං ඛණෙ අනුසාවණං එතෙසන්ති' එකානුසාවණා; උපසම්පදාපෙඛා) එකම ආචාර්යයන් වහන්සේගේ සාමණේර දෙනම 'අයං බුද්ධරක්ඛිතො ච අයං ධම්මරක්ඛිතො ච ආයස්මතො සඞ්ඝරක්ඛිතස්ස උපසම්පදාපෙඛා' යි එකම අනුසාවණයෙහි යොදන්ට; මෙසේ එකම ආචාර්යවරයාගේ සාමණේර තිදෙනෙක් නමුදු එකානුසාවණයෙහි යොදන්ට හැකිවේත්. මේ සියල්ලට එක් නමක්ම උපාධ්‍යාය වියයුතුයි. නානා ආචරිය නානා උපාධ්‍යාය වූකල මේ ක්‍රමය නො යෙදේ. සබ්බකාලො-('භගවති' යන වචනය අදහසෙහි නො පිහිටා හා විසින්) සත්‍යයම ප්‍රකාශකිරීමට කාලය වෙයි. උල්ලුම්පතු- උද්ධරණය කෙරේවා, අනුපසම්පන්නභාවයෙන් උද්ධරණයකොට උපසම්පන්බැව්හි පිහිටුවන සේක්වා; සුණාතු-අසන සේක්වා; ආඥාර්ථයෙහි ප්‍රථම පුරුෂ එකවචනයි. සඞ්ඝයා ශ්‍රවණක්‍රියාවෙහි නොයෙදවන හෙයින් එය මධ්‍යම පුරුෂයෙන් යෙදිය යුතුයි එහෙත් ශාබ්දිකයෝ 'භදන්ත, ආයස්මන්තු' ශබ්ද සන්නිධානයෙහිදී මෙන් 'සඞ්ඝ' ශබ්දයොගයෙහිදීද ගෞරව වශයෙන් ප්‍රථම පුරුෂයෝගය කැමතිවූහ. ඉම-මාගේ වචනය; ආත්මනෙපදියෙහි පඤ්චමී විභක්තියි. භන්තෙ-වහන්ස; ආමන්ත්‍රණය පිණිස වැඩිමහල්ලන් කෙරෙහි යෙදෙන ගෞරව වචනයකි. නවක භික්ෂූන් කෙරෙහි 'ආවුසො' යි යෙදේ. 'ආවුසො'-භන්තෙ, යන පදවලම නිපාත වශයෙන් ශාබ්දිකයෝ සලකති. සඞ්ඝො-සඞ්ඝතෙමේ; මින් අවිශෙෂයෙන් පකතත්ත චතුවග්ගික සඞ්ඝයා ගැණේ. මධ්‍යදෙශයෙහි නම් දසවග්ගික සඞ්ඝයාද, ප්‍රත්‍යන්තයෙහි නම් පඤ්චවග්ගික සඞ්ඝයාද යටත්පිරිසෙයින් ගතයුත්තු. වෘද්ධ භික්ෂුවක් විසින් නම් 'සුණාතු මෙ ආවුසො සඞ්ඝො'යි කියා ද, නවක භික්ෂුවක් විසින් නම් 'භන්තෙ' යි කියා ද දෙසියයුතු, 'භන්තෙ, ආවුසො' යන දෙපදය මාරුවීමද කර්මය කොප්‍ය නොවේ. එක කම්මවාක්‍යයෙහිදීම මුලදී 'භන්තෙ' කියාද, අගදී 'ආවුසො' කියාද දෙසුව වරද නැත. 'අයං ඉත්ථන්නාමො'- යන මෙහි 'අයං' යන්න උපසම්පදාපෙක්ෂකයා අත්පසෙහි සිටියයුතු බව හඟවයි. පරිසුද්ධො අන්තරායිකෙහි ධම්මෙහි-අන්තරායික ධර්මයන්ගෙන් පිරිසිදු වූවෙකි. අභව්‍යතා ආදිවූ උපසම්පදාවට අවසුතුකර ධර්මයෝ ද, පංචාබාධ හත්ථච්ඡින්නතා ආදිවූ ආපත්ති මාත්‍රයෝ ද මෙහි අන්තරායික ධර්ම නම්. පරිපුණ්ණස්ස පත්තචීවරං-(මේ උපසම්පදාපෙක්ෂකයාගේ) පා සිවුරු සම්පූර්ණය. උපසම්පදං ආකඞ්ඛති-සඞ්ඝයාගෙන් උපසම්පදාව යදියි. උපජ්ඣායෙන- උපාධ්‍යායයන් කාරණකොට ගෙණ; මෙනම් ඇත්තහු උපාධ්‍යාය කොට, කැමති වූ උපසම්පදා-නිෂ්පාදනය පිණිස සන්නිපතිතවූ සඞ්ඝයාගෙන් ඉල්ලයි. 'යාච' ධාතුකව 'සඞ්ඝං-උපසම්පදං' යන පදවලම කර්මත්වයෙන් සිද්ධවේය. සඞ්ඝස්ස පත්තකල්ලං-සඞ්ඝයාට සුදුසුකල් පැමිණියේය. මෙහි 'ඤත්ති චතුත්ථ උපසම්පදාකර්මය අදහස් කරණලදී. 'යදි'- යන්න අනුමතිය හැඟීම් වශයෙන් කර්මය පිළිබඳ සුදුසු කාලයයි දක්වයි. සඞ්ඝො [illegible]

ඛමති-යම් ආයුෂ්මත් කෙනකුගේ රුචිය වේද; සො තුණ්හස්ස- හෙතෙමේ නිශ්ශබ්ද වන්නේය. යස්ස න ඛමති සො භාසෙය්‍ය- යම් කිසිවෙකුගේ මේ කර්මයෙහි අප්‍රාප්තකාලය යි රුචිය නො වේනම් එය ප්‍රකාශකරන්නේය. මේ පත්තකල්ලය වනාහි වත්ථුසම්පද, අනන්තරායිකෙහි ධම්මෙහි වස්ස පරිසුද්ධතා, සීමාසම්පද, පරිසසම්පද, පුබ්බකිච්ච නිට්ඨාපන යයි අඞ්ග පසකින් සඞ්ග්‍රහකරණලදී. වත්ථුසම්පත්ති ආදිය සම්පූර්ණවූ කල්හිම කරණලද කර්මය අකොප්‍ය වේ.

'ඉත්ථන්නාමං උපසම්පාදෙය්‍ය' යනුවෙන් උපසම්පදාකර්මය සිද්ධකිරීමෙන් ඒ උපසම්පදාවෙන් යුක්තවූවෙකු කරන්නේයයි පවසති. 'ඉත්ථන්නාමො සඞ්ඝං උපසම්පදං යාචති' කියනලද හෙයින් පරිවාසාදියෙහි මෙන් මොහුට යාචනය අනුව උපසම්පදාව දෙන්නේයයි නො වදාරා, 'ඉත්ථන්නාමං උපසම්පාදෙය්‍ය'යි වදාළ හෙයින් මේ උපසම්පදාකර්මය දාන ලක්ෂණයෙහි පමණක් සඞ්ග්‍රහ නොකොට කර්මලක්ෂණයෙහි සඞ්ග්‍රහ කරණලදී. ධාරයාමි- දරමි; මෙහි 'මි' කාරය අවසන්වූ කල්හි ම නැවැත්වියයුතු 'ඉති' ශබ්දය නො දෙසියයුතු. ඡායා මෙතබ්බා- සෙවනැල්ල (එකපොරිස ද්විපොරිසයයි) පියවර ගණනින් මිනියයුතුයි. පියවර සයකින් හෝ සතකින් පරිමිතවූයේ 'පොරිස' නමි. උතුප්පමාණං ආචික්ඛිතබ්බං- (එති ගච්ඡතීති උතු, සො පමීයතෙ අනෙන සංවච්ඡරං ති, පමාණං, උතු එව පමාණං, උතුප්පමාණං) ඍතුප්‍රමාණය පැවසියයුතුයි හෙමන්ත ගිම්හ වස්සාන වශයෙන් ඍතුවද අසවල් දවසයයි දිවසභාගය ද පැවසිය යුතුයි. ඈගන්තුකයන් සමග වස්ගණන් සසඳාබලා වන්දන වන්දාපනාදිය කිරීම මෙහි ඇති ප්‍රයොජනයයි. සංගීති-සඞ්ගායිතය; අසවල් වර්ෂයෙහි අසවල් ඍතුවෙහි අසවල් දවසෙහි මෙපමණ ඡායා ප්‍රමාණයෙහිදී මාගේ උපසම්පදාකර්මය සිද්ධවීයයි සඞ්ග්‍රහකොට දක්වීම සංගීති නමි. දුතියං දාතුං- (උපසම්පදාමාලකයෙන් යන්නාහුට) දෙවැන්නෙකු දීමට; අලබ්භමානාය සාමග්ගියා අනාපත්ති සමෙන ගණ සංවාසෙන- (උපොසථ පවාරණාදිය කර්මය කිරීම පිණිස) සමගිය නො ලබන කල්හි ඔහු සමග එකතරණ සම්භොගයෙහිදීද, උපොසථ පවාරණ ප්‍රභෙදවූ සංවාසයෙහිදීද අනාපත්ති වේ.

මහාඛන්ධක සැමඳශ නිමි.

---

අඤ්ඤතිත්ථියා-(තරන්ති පලවන්ති එත්ථ බාලාති තිත්ථං, ලද්ධියයි. අඤ්ඤං තිත්ථං එතෙසං අත්ථීති) ශාසනයෙන් බාහිරවූ අන්‍ය ලබ්ධිකයෝ; ධම්මං භාසන්ති- (අසවල් අසවල් දිනවල අසවල් අසවල් මුහුර්තවලදී) මෙනම් මෙනම් දේශනා කටයුතු; නො කටයුතුයයි කියත්. තෙ- ඒ මිනිස්සු; අනාජ්ඣාපනෙතබ්බා වා හොන්ති ආපජ්ජිතබ්බා වා වුට්ඨිතො- ඇවිතුයි නො පැමිණියේ ගෙන් පැමිණ එයින් නැගිසිටියේ ගෙයි; අයතනසින්ඤකා- අයතනපුරය වෙයි. කිංසා එාදු ගොහසි- කුමක් සිණිසු පැනපුවෙද; සම්මුඛස්ස ඛාදනාය අභිහාරිය- පුද්ගලී බ්‍රාහ්මණයාගේ අධිගමය පිණිස; දෙවසිකං- දවසක් පාසා; මායුද්දසෙ වා පණ්ණරසෙ

වා-චාතුද්දසී පොහොයෙහි හෝ පණ්ණරසී පොහොයෙහි හෝ; සියලු සෘතුවලම තුන්වැනි සත්වැනි පොහොය දෙක චාතුද්දසිය වසයෙන්ද සෙසු පොහෝ පණ්ණරසිය වසයෙන්ද උදෙසියයුතුයි. මෙය පියවි සිරිත් වශයෙන් වදාරණලදී. "සකිං පක්ඛස්ස චාතුද්දසෙ වා පණ්ණරසෙ වා"යි වදාළ හෙයින් යම්කිසි හේතුවක් ඇතිකල්හි පක්ෂය සම්බන්ධ තුදුස්වක් දිනෙහි හෝ පසළොස්වක් දිනෙහි හෝ චාතුද්දසී හෝ පණ්ණරසී වශයෙන් නම් කොට උදෙසන්ට වටී. ආවාසික භික්ෂූන්ට චාතුද්දසිය ද ආගන්තුක භික්ෂූන්ට පණ්ණරසිය ද වෙයි. එකල්හි ආවාසිකයෝ බහුතර වෙත්නම් ආගන්තුකයන් විසින් ආවාසිකයන් අනුව පැවතිය යුතුයි. මද්දකුච්ඡිස්මිං- එනම් උයනෙහි; අජාසත් කුමරහු මවු කුස පිළිසිඳගත් කල්හි-'පසුකල ඒ කුමරතෙමේ පියරජහු මරවන්නේය'යි ඇසූ මවුතොමෝ කුසතුළදීම පුතු මරුදමන්ට කල්පනා කොට මේ උයනෙහිදී ගැබ මිරිකාලිය. එහෙයින් මේ උයන මද්දකුච්ඡි නම් විය. පඨමං නිමිත්තා කිත්තෙතබ්බා- පළමුකොට නිමිති කීර්තනය කටයුතුයි. විනයධර භික්ෂුව විසින් 'පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං'යි විචාරිය යුතුයි. ඊට පිළිතුරු දීමට සුදුනම් වූවහු විසින් 'පබ්බතො භන්තෙ'යි පැවසිය යුතුයි. ඉක්බිති විනයධර භික්ෂුව විසින් 'එසො පබ්බතො නිමිත්තං'යි නිමිත්ත කීර්තනය කටයුතුයි. මෙසේ පිළිවෙළින් සතර දිගද සතර අනුදිගද නිමිති කීර්තනය කොට පෙරදිග නිමිත්ත යළිත් කීර්තනය කොට නිමිත්තෙන් නිමිත්ත ගැළපිය යුතුයි. ඉන්පසු සඞ්ඝයා විසින් නියමිත කම්මවාක්‍යයෙන් සීමාව සම්මත කළ යුතුයි. කම්මවාක්‍යාවසානයෙහිදීම නිමිතිවලින් අභ්‍යන්තර ප්‍රදෙශය සීමාව වෙයි. නිමිති සීමාවට අයිති නොවේ. නිමිතිකීර්තනය එක්වරක් කළද සෑහේ. එහෙත් අට්ඨකථාවෙහි තුන්වරක්ම කටයුතුයයි දක්වති. නිමිති පිළිබඳ විස්තරය මෙසේ සැලකිය යුතුයි. පබ්බත නිමිත්තං- පර්වත නිමිත්ත; පස්කඳු, ගල්කඳු, උභයමිශ්‍රකඳු යයි පර්වත භේදත්‍රයකි. හුදු වැලිකඳු නිමිති වශයෙන් කීර්තනය කිරීමට නො වටී. හස්තිප්‍රමාණයෙන් අඩුවුවද මහාමේරු ප්‍රමාණයෙන් අධිකවුවද කඳු නිමිත්තාංගය. සිවුදිගෙහිම වූ කඳු සතරක් හෝ තුනක් ඒ ඒ දිශාව නිමිති වශයෙන් කීර්තනය කටහැකිවේ. එහෙත් එකම පර්වතය දෙදිගක නිමිති වශයෙන් කීර්තනය කට නො හැකිවේ. පර්වතය එකාබද්ධවූකලද නො හැකිවේ. විහාරය හාත්පසවූ එකාබද්ධ පර්වතවලල්ල එක් දිගක නිමිත්ත වශයෙන් කීර්තනය කටහැකිවේ. සෙසු නිමිති ඒ ඇතුළත අමුතුවෙන් පිහිටුවාගත යුතුයි. පර්වතයකින් කොටසක් පමණක් සීමාවට ඇතුළත් කොට ගණු කැමති කල්හි ඒ පර්වතය නිමිත්තක් කොට නොගෙණ එහි පිහිටි රූකක් හෝ පුඹසක් හෝ නිමිත්ත වශයෙන් කීර්තනය කටයුතුයි. එක් යොදුන් දෙයොදුන් පර්වතක් වුවද මේ ක්‍රමයෙන් සීමාවට ඇතුළත් කොට ගතහැකිවේ. පාසාණ නිමිත්තං-පහන් නිමිත්ත; යකඩමුළුද පාෂාණ සඞ්ඛ්‍යාවට ගැණේ. උපරිම ප්‍රමාණයෙන් මහාගව මහා මහිෂප්‍රමාණවූ පහණම නිමිත්තට සුදුසු වේ. හස්තිප්‍රමාණ වූ කල පබ්බත සඞ්ඛ්‍යාවට අයත්වන හෙයිනි.

හෙවසීම පරිච්ඡේද වශයෙන් මාගධමාන ක්‍රමයෙන් දෙතිස් පලමක් බරවූ උක්ඛකුරු පිඩක සවකන් ඇත්තක් වියයුතුයි. ඉන් උඩුවූව නොවටී. වන නිමිත්ත - වන නිමිත්ත; තෘණ වනයක් හෝ තාල නාලිකේරාදි වනයක් හෝ නොවටී.. හර සහිත රුක්වලින් මිශ්‍රවූ වනයම වටී. අඟුලකට වඩා වැඩුනු හර සහිත රුක් සතරකින් පහසින් යුක්තවූ වනයද නිමිත්තූපග වේ. සියක් යොදුන් පමණවූ වනයද නිමිති වශයෙන් තැබියහැක්කේ එක් දිශාවට පමණකි. රුක්ඛනිමිත්තං - රුක් නිමිත්ත; තවසාරතාල නාලිකේරාදිය නිමිති වශයෙන් නො තැබිය යුතුයි. හරින්යුත් තොමඳ යටත්පිරිසෙයින් සෙලදිව්හි පත්හිදී දඩක් සාවූ රුකක්ම වියයුතුයි. දෙලොස් යොදුන් තැන් පැතිර සිටි වෘක්ෂය ද නිමිත්තූපග වෙයි. උණපුරුක් ආදි සක ඇට සිටුවා වඩානත් රුක ප්‍රමාණවන්වූ කමුදු කුසුළුය. එහෙත් එය එකොණෙහි වුවද භූමියෙහි රෝපණයකල තල නිමිත්තූපග වෙයි. මග්ගනිමිත්තං - මං නිමිත්ත; වන කෙත් ගං වැව් පොකුණු ආදියට යන මං නිමිති වශයෙන් තැබිමට සුදුසු වේ. දෙපසින් ගම් කෙතක් පිහිටිදැයි ජඞ්ඝමග්ග සකටමග්ග වශයෙන් වටී විහාරය සාමන්ත සිවු දිශාසීම එනාබද්ධ වූ සිවුමහත් වූකල නිමිත්ත වශයෙන් තැබිය හැක්කේ එක් දිශාව මිසකි. මංසන්ධියක් නම් එහි විහාරය විනිවිද ගිය මග හැර සෙසු මඟක් කිතීනය කටයුතුයි. වම්මිකනිමිත්තං - වම්මික නිමිත්ත; යටත්පිරිසෙයින් එදවස හටගත් අටඟුල් පමණ උස්වූ ගොවිෂාණ ප්‍රමාණවූ තුඹසද නිමිත්ත වශයෙන් කීර්තනය කටහැකි වෙයි. විහාරය වටා සිටි තුඹස එක් දිගකට පමණක් නිමිති කළහැක. නදීනිමිත්තං - ගං නිමිත්ත; වැසිවට කල්හි පමණක් පිරී පවත්නේ නදී සඞ්ඛ්‍යාවට නොවන්. වැසි සාරමස මුළුල්ලෙහි නො සිඳී පවත්නා ජලය ඇති එසේම නදියෙන් එතෙරවන භික්ෂුණියගේ තෙමඹුලු වසා හැඳි අඳනය තෙමී යන තරම්වූ ජලය පිහිටි නදියම මෙහි නදී සඞ්ඛ්‍යාවට ගැණේ. යම් විහාරයක සිවුදිශා එකට සම්බන්ධවූ නදී සතරක් වේනම් ඒ නදී සතරම සිවුදිගට නිමිති වශයෙන් තැබියහැකි වෙත්. එහෙත් එකට සම්බන්ධවූකල නිමිති වශයෙන් තැබියහැක්කේ එක් දිගකට පමණි. උදකනිමිත්තං - දිය නිමිත්ත; ජලය නොමැති තැනක බඳුන්වල පිරවූ ජලය තබා උදකනිමිත්ත කීර්තනය කරන්ට නො වටී. ලිං පොකුණු වැව් ආදියක පිහිටි භූමිගත ජලයක්ම විය යුතුයි. බෑසගන ඇළදොළ ආදියෙහි පිහිටි ජලය සුදුසුය. ගැඹුරුවූ ආවාටයක්හි පිහිටි උක්ඛිපිම ජලය නිමිති වශයෙන් කීර්තනයකිරීමට සුදුසුයයි අන්ධකට්ඨකථාවෙහි කියයි. එය මතිමාත්‍රයක් යයි සමන්ත පාසාදිකා අටුවා කථාවෙහි දක්වති. එකොණෙහි කැපී ආවාටයක පිහිටි ජලය තමුත් තාවකාලිකව නොව රඳා පවත්නේ නම් එයද නිමිත්තූපග වෙයි. එහි නිමිත්ත ප්‍රකාශවීම පිණිස ගල්කණු හෝ පිහිටුවියයුතු. එය කරන්ට හෝ කරවන්ට භික්ෂූන්ට ද කැපය. ලාභසීමාවන් පිළිබඳව නම් එසේ නොවටී. මෙසේ නිමිති අට අතු

රෙන් සම්මිශ්‍රවූ හෝ අසම්මිශ්‍රවූ නිමිතිද පිහිටුවා, සීමාබන්ධනය කළහැකිවෙයි. "පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං? පබ්බතො භන්තෙ; පුන පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං? පාසාණො භන්තෙ;" මේ ක්‍රමයෙන් නිමිති කීර්තනයෙන් හෝ යුක්තකොට ද සීමාසම්මතය කළහැකි වේ. සීමාව ත්‍රිකෝණ, චතුරස්‍ර, මුදිඞ්ගසණ්ඨාන, අර්ධචන්ද්‍රාකාර යන ආදී අයුරුවලින් කැමැති අයුරකින් බැඳියහැකි වෙයි.

සීමාසම්මතය කරණ භික්ෂූන් විසින් සාමන්ත විහාරයන්හි සීමා බැඳුක හෝ නොබැඳුක තැන් නියම වශයෙන් දැනගෙණ බැඳුන සීමාවට සීමාන්තරිකයද නොබැඳුක සීමාවට උපචාරයද තබා සීමාසම්මතය කටයුතුයි. සීමාසම්මතය කරණ කල්හි දිසාචාරික භික්ෂූන්ගේ ගමන් වළකනු සඳහා ඒ සීමාවට අයත් ග්‍රාමක්ෂෙත්‍රයෙහි වසන භික්ෂූන්ට "අපි අසවල් දිනයෙහි අසවල් මුහුර්තයෙහි සීමාසම්මතයක් කරන්නෙමු. ඔබ ඒ වේලාවෙහි බද්ධ සීමාවෙන් පිටත නොගිය මැනවි"යි දන්වා යවා, සීමාරහිත තැන්වල වසන භික්ෂූහු අත්පසට කැඳවා ගතයුත්තාහුය. ඡන්දාරහ භික්ෂූන්ගේ ඡන්දය ද ගෙන්වාගත යුතුයි. සමානසංවාසක සීමාසම්මන්නනාදී නම් සියලු භික්ෂූන්ගේ පැමිණීම හෝ නොපැමිණීම කැමති සේ කටයුතුයයි ද, අවිප්පවාස සීමාසම්මතයෙහිදී සීමා ඇතුළු වසන සියලු භික්ෂූන්ගේ පැමිණීම හා ඡන්දාරහ භික්ෂූන්ගේ ඡන්දය ගෙන්වාගැණීම විශේෂයෙන් කටයුතුයයිද මහාපදුම තෙරණුවෝ පවසති. මෙසේ භික්ෂූන් රැස්වූ කල්හි, ඡන්දාරහ භික්ෂූන්ගේ ඡන්දය ගෙණෙනලද කල්හි, ආගන්තුක භික්ෂූන් වහවහා අත්පසට ගෙන්වාගැණීම පිණිසද නැතහොත් ග්‍රාමසීමාවෙන් පිටකිරීම පිණිසද, ඒ ඒ මංවලද, ගංතොට ගම්දොර යනාදී තැන්වලද ආරුම්කයන් හෝ හෙරණුන් තබත්වා බෙරහඬ සක්හඬ පැතිරවිය යුතුයි. ඉක්බිති නිමිති කීර්තනයෙන් පසු නිමිති ඇතුළත අත්පස නොහැර සිටි භික්ෂූන් විසින් "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො" යනාදි කම්වාචින් සීමාව බැඳිය යුතුයි. කම්මවාචා පරියොසානයෙහි නිමිතිවලින් ඇතුළත යට පඨවි සන්ධාරක උදකය දක්වා සීමාව පිහිටියේ වෙයි. මෙසේ සමාන සංවාසක සීමාසම්මතය කරණ භික්ෂූන් විසින් පබ්බජ්ජූපසම්පදාදීන්ගේ සුඛ කරණය පිණිස පළමුකොට ඛණ්ඩසීමාව බැඳිය යුතුයි. එසේ එය බඳින්නහු විසින් බෝ සෑ දක්ගල් ආදියෙන් පරිපූර්ණ විහාරයක නම් එහි මැද බොහෝදෙන රැසිවෙන ස්ථානයෙහි සීමාම නොබැඳ විහාරය කෙළවර විවික්තවූ අවකාශස්ථානයක බැඳිය යුතුයි. බෝ සෑ ආදියෙන් අසම්පූර්ණ විහාරයක නම් ඒ ඒ වස්තූන්ට මේ මේ තැන් සුදුසුයයි සලකා, ඒ ඒ දෙය නිමිකල්හි විහාරපච්චන්තය යම් තැනක වේ නම් එතැන සීමාව බැඳිය යුතුයි. ඒ සීමාව යටත්පිරිසෙයින් විසිඑක් නමකටවත් සෑහෙනතක් විය යුතුයි. ඉන් උනුවූයේ නොවටී. හත්පස නිමිත්තූපග පාෂාණයෝ පිහිටුවිය යුත්තාහුය. ඛණ්ඩසීමාවෙහි සිටි භික්ෂූන් විසින් මහාසීමාව නොබැඳිය යුතුයි. මහාසීමාවෙහි සිටි භික්ෂූන් විසින් ඛණ්ඩසීමාව

නො බැඳිය යුතුයි. ඛණ්ඩසීමාවෙහිම සිට ඛණ්ඩසීමාවද, මහාසීමාවෙහි සිට මහාසීමාවද බැඳිය යුතුයි. මේ එහි ක්‍රමය වෙයි:- හාත්පස 'එසො පාසාණො නිමිත්තං' යි කීර්තනය කොට කම්වදනින් සීමාව බැඳිය යුතුයි. ඉක්බිති අවිප්පවාස කම්වාක්‍යය කටයුතුයි. මෙසේ කළකල්හි සීමාසමූහනනයට පැමිණි භික්ෂූන්ට එය නො කළහැකි වෙයි. සීමාව බැඳ සීමාන්තරික පාෂාණයෝ රියනක් පමණ පිටතින් සිටිනසේ පිහිටුවිය යුත්තාහුය. වියතක් පමණ වුවද සතරඟුලක් පමණ වුවද සෑහේයයි ආචාර්යවරයන්ගේ මතයි. සීමාන්තරික පහන් කීර්තනය කරන්නවුන් විසින් ඛණ්ඩසීමාවෙන් පශ්චිමදිශාභාගයෙහි මහසීමාවේ පෙරදිගට මුහුණලාසිට 'පුරත්ථිමදිසාය කිං නිමිත්තං'යි යනාදි වසයෙන් දක්ෂිණාවෘතව ගමන්කිරීමෙන් ඒ ඒ දිශාවන්හි නිමිති කීර්තනයකොට නැවතත් පෙරදිග පිහිටි නිමිත්ත කීර්තනය කටයුතුයි. මෙසේ වෙන වෙනම නිමිති කීර්තනය කිරීමෙන් (මහාසීමාවක නම්) ඛණ්ඩසීමා කීපයක්ම බැඳියහැකියි. මෙසේ ඛණ්ඩසීමාව බැඳ මහාසීමාව සම්මත කරණ කාලයෙහි ඛණ්ඩසීමාවෙන් පිටත මහාසීමාවෙහි සිට හාත්පස අනුක්‍රමයෙන් සීමාන්තරික පහන් කීර්තනය කටයුතුයි. ඉන්පසු මහාසීමාවෙහි බාහිරන්තරයෙහි පිහිටි නිමිති කීර්තනය කොට අත්පස නො හරින්නවුන් විසින් කම්වදනින් සමාන සංවාසක සීමාව බැඳ, එහි තිරබව පිණිස අවිප්පවාස කම්වාක්‍යය ද කථනය කළයුතුයි. එසේ කළ සීමාව විනාශකරන්නෙමුයි පැමිණි භික්ෂූන්ට එය කරන්ට නො හැකි වෙයි. ඛණ්ඩසීමාවේ නිමිති කීර්තනයකොට ඉන්පසු සීමාන්තරිකයෙහි නිමිති කීර්තනය කොට මහාසීමාවෙහි නිමිති කීර්තනය කෙරෙති; මෙසේ තුන් තැනකදී නිමිති කීර්තනය කිරීමෙන් යම් සීමාවක් කැමැතිවෙත්ද, එය පළමුවෙන් ම බැඳිය යුතුයි. එසේනම් පළමු කියනලද ක්‍රමයෙන් ඛණ්ඩසීමාවෙහි පටන් බැඳිය යුතුයි. මෙසේ සීමාවබැඳි කල්හි ඛණ්ඩසීමාවෙහි සිටි භික්ෂූහු මහාසීමාවෙහි කරණු ලබන කර්මය කොප්‍ය නො කෙරෙත්. මහාසීමාවෙහි සිටි භික්ෂූහු ඛණ්ඩසීමාවෙහි කරණුලබන කර්මය කොප්‍ය නො කෙරෙත්. සීමාන්තරිකයෙහි සිටි භික්ෂූහු මහාසීමාවෙහි හෝ ඛණ්ඩසීමාවෙහි කර්මකොප්‍යයට නුසුදුසු වෙත්. ග්‍රාමක්ෂෙත්‍රයෙහි සිට කරන්නවුන්ගේ කර්මය සීමාන්තරිකයෝ කොප්‍ය කෙරෙති. සීමාන්තරිකය ග්‍රාමක්ෂෙත්‍ර සඞ්ඛ්‍යාවට අයත්වන හෙයිනි.

සීමාව හුදෙක් පොළෝතෙලෙහි ම බැඳිය යුත්තක් නොවේ. පහණපිට ද, තණකිළියෙහි ද, පහයෙහි ද, ලෙනෙහි ද, කඳුමුදුන්වලද, බැඳුනේ නිවරදය. පහණ මත බඳින්නවුන් විසින් එහි කෙටූ හිරි හෝ කුඩා අංවාට හෝ නිමිති වසයෙන් කීර්තනය නො කටයුත්තාහුය. නිමිත්තූපග අන් පහන් තබාම නිමිති කීර්තනය කටයුතුයි. කම්වදන් කෙළවර සීමාව පඨවිසන්ධාරක උදකය දක්වා පිහිටයි. නිමිති වසයෙන් තිබූ පහන් තිබූසේම නො සිටිනා හෙයින් ඒ හාත්පස රේඛා ලකුණුකළ යුතුයි. නැතහොත් සිවුකොණෙහි සිදුරු

කැනවිය යුතුයි. 'මේ සීමා පරිච්ඡේදයයි' අකුරු හෝ ලේඛනය කරවිය යුතුයි. ඉදින් විරුද්ධකාරයෝ සීමාව දවත්තෙමුයි ගිනිතබද්ද, ගලම දූවේ සීමාවට අනතුරක් නො වේ.

තණකිළියෙහි සීමාබන්ධනය කරණ භික්ෂූන් විසින් එහි බිත්ති නිමිති වශයෙන් කීර්තනය නො කටයුතුයි. භික්ෂූන් එක්විසි නමකට පහසුවෙන් හිඳින්නට හැකිවන තරම් පෙදෙසක් ඇතුල්කොට හාත්පස පහන් නිමිති තබා සීමා සම්මතය කටයුතුයි. සිලාමය බිත්ති යොනම් එක් එක් පහණ වෙන් වෙන් වශයෙන් ඒ ඒ දිගට නිමිති කලහැකි වෙයි. නානා ගල් එක්රැස්කොට බැඳුන සම්පූර්ණ බිත්තියම නිමිත්ත නො කටහැකි වෙයි. ගෙහි බිත්තිය පිටවනසේ ඇතුලෙහි සීමාගල් පිහිටුවා සීමා සම්මන්නනය කටයුතුයි. ඇතුල් පෙදෙස අවකාශ මද නම් ගෘහාභිමුඛයෙහි ගැබ්තරම් අයම් විතරින් යුක්තවනසේ පාෂාණයන් පිහිටුවා නිමිති කීර්තනය කටයුතුයි.

පහය මතුයෙහි සීමාව බැඳෙන කල්හි එහි බිත්තිය කීර්තනය නොකට හාත්පස ගල් පිහිටුවා සීමාව බැඳගත යුතුයි. මෙසේ සම්මත කළ සීමාව පහය මතුයෙහි ම පිහිටියේ වෙයි. ඉදින් බොහෝ මැණි වල තලාන් යොදා ඒ මතුයෙහි කළ පහයක් නම් හෙටසිම තලයෙහි වූ බිත්ති නිමිති ඇතුළත පිහිටියේ නම් මතු මහලෙහි බැඳි සීමාව පොළෝතලයෙහි ද පිහිටයි. එක්මැම් පහයෙහි උපරිමතලයෙහි කළ සීමාව ඒ මැඹ මත එක්විසිනමක් භික්ෂූන්ට හිඳිනට අවකාශය ඇති කල්හි පොළෝතලයෙහි ද පිහිටයි. පහයෙන් පිටත නිමෙබෑදක පතන ස්ථානයෙහි නිමිති පිහිටියේ නම් සියලු පහයම සීමටස්ථ වෙයි.

කඳුමුදුනෙහි භික්ෂූන් එක්විසිනමකට හිඳින්ට අවකාශස්ථාන යක් වේනම් එහි පිටසිපාෂාණයෙහි මෙන් සීමාව බැඳියහැකි වෙයි. මුල් පෙදෙස මහත්වූ අග පෙදෙස සිහින්වූ පර්වතයක නම් එහි බැඳි සීමාව, ඒ පර්වතපාදයෙහි පිහිටි එක්විසිනමක් භික්ෂූන්ට හිඳීමට පොහෝනා ලෙනෙහි ද පිහිටියේ වෙයි. එහෙයින් එහි සිටද කර්ම කළ හැක්කෝ වෙයි. සීමාවට අයත් බිමෙහි පොකුණක් කනිනලද නම් එයද සීමාවට අයත්වේ. සීමාමණ්ඩලය ජලෞඝයෙන් පිරිගියකල එහි අටල්ලක් බැඳගෙණ භික්ෂූන්ට කර්මකළහැකි වෙයි. සීමා යට පෙදෙසෙහි උමං නදියක් පිහිටියේය. එය සීමාවට පසුව ඇතිවූවකි. එහෙයින් එහි සිටි භික්ෂූන් තිස්ස එම සීමාවෙහි කාරණුලබන කර්මයකොටය පැමිණේ. සීමාවට පළමු එහි නදිය පිහිටියේ නම් ඒ නදියෙහි හුන් භික්ෂූන්ට එම සීමාවෙහි කෙරෙණ කර්මයකොටය නො කටහැකි වෙයි.

ඛණ්ඩසීමාමාලකයෙහි නුගරුකක් වෙයි. එහි අතු හෝ අරළු මහසීමාවෙහි පොළෝතලය හෝ එහි පිහිටි වෘක්ෂලතාදිය හෝ වැලඳ ගෙණ සිටී. එකල මහාසීමාවෙහි හුන් භික්ෂූන් අත්පසට කැඳවාගැණීමෙන් මහාසීමාව ශුද්ධකොට ම කර්මකළ යුතුයි. එහි වූ අතු හෝ

අථව සිදබිඳ දමා සීමා දෙකේ සම්බන්ධය නැතිකළ යුතුයි. මහසීමාවෙහි පිහිටි රුක්ලිය පිළිබඳවද මෙසේ ම සැලකිය යුතුයි. තියොජනපරමං-(තියොජනං පරමං එතිස්සාති තියොජනපරමා) තියොදුන් පමණ කොට ඇති සීමාව; තියොදුන් සීමාව සම්මත කරණ භික්ෂූන් විසින් එහි මැද සිට සිවුදිශාවට ම යෙළහොදුන යෙළයොදුන බැගින් සිටින සේ සම්මත කළ යුතුයි. එසේකල එක් කෙළවරක සිට අනිත් කෙළවරට දුර ප්‍රමාණය තුන් යොදුනක් වේ. මින් කෙසගක් පමණ තැන් හෝ අධිකවී නම් එය අසීමා සංඛ්‍යාවට පැමිණේ. එය සම්මත කළ භික්ෂූහුද ඇවතින් නොමිදෙත්. නදීපාරං-(නදියාපාර නදීපාර) නදිය මැඩගෙණ සිටි සීමාව; නදී අභ්‍යන්තරයෙහි සීමාව නො පිහිටයි. නදිලක්ෂණ පහවගිය කල්හි නම් පිහිටයි. එකල්හි එය නදීපාර සීමාසංඛ්‍යාවට නො පැමිණේ. ධ්‍රැවනාවා-(සීමාබන්ධනස්ථානගත නොවූපමලෙහි) නිති පිහිටි අභුළ; පදින පුරුෂයා සමග තිදෙනකුට එතරවියහැකි අකුල හෝ ඔරුව නාවා නම්. මෙසේ නැවකින් වෙන්ව සීමාබන්ධනය කළත් නිවරදය. මෙහි ධ්‍රැව ශබ්දය ආපත්ති පරිහාර වශයෙන් යෙදුනකි. තාවකාලික වශයෙන් ගෙණ, නිමිති කීර්තනය කරණතුරු තබාගත් නැවද 'ධ්‍රැවනාවා' සංඛ්‍යාවටම වැටෙයි. ධ්‍රැවසන්ථා-තැපූ ගස් කීපයක් එකට ගළපා බැඳි පහුර හෝ ලෑලි ගසා කළ පාරුව හෝ හෙය හෝ පාලම හෝ යවත්පිරිසෙයින් එවිලාවට හෙය වශයෙන් තොදුගණු ලැබූ කද හෝ ධ්‍රැවසෙතු සංඛ්‍යාවට පැමිණේ. එවරූපං නදීපාරං සීමං සම්මන්නිතුං-(ධ්‍රැව නැවක් හෝ ධ්‍රැව හෙයක් හෝ අභිමුඛ තීර්ථයෙහි වේනම්) එබඳු වූ නදීපාර සීමාව සම්මත කරන්ට (අනුදනිමි); අභිමුඛතීර්ථයෙහි එබඳු නැවක් හෝ හෙයක් මදක් ඉහළින් හෝ පහළින් තිබුනත් සීමාසම්මතයට බාධා නොවේ. ගවුවක් ඇතුළත පිහිටියේ නමුදු වරදක් නැතැයි කාරවීක තෙරහු කියති. මේ නදීපාර සීමාව බඳින භික්ෂූන් විසින් එක් ඉවුරක ගඟ ඉහළ පෙදෙසේ නිමිත්ත කීර්තනය කොට, ඉක්බිති යම් දුරක් කැමැතිවේ නම් එපමණ දුරින් නදීතීරයෙහි අධොභාගයෙහි නිමිත්ත කීර්තනය කොට පරතීරයෙහි සම්මුඛස්ථානයෙහි වූ නදීතීරයෙහි නිමිත්ත කීර්තනය කටයුතුයි. එතැන්පටන් තමන් කැමැතිවූ දුර වශයෙන් උපරිසොතයෙහි පළමු කීර්තනයකළ නිමිත්තට අභිමුඛයෙහි වූ නදීතීරයෙහි නිමිත්ත කීර්තනය කොට පසුව තමන් කීර්තනයකළ නිමිත්ත හා ගැළපිය යුතුයි. ඉන්පසු එහි ඇතුළත සිටි සියලු භික්ෂූන් අත්පසෙහි කොට කර්මවාක්‍යය බැණ සීමාව සම්මත කටයුතුයි. මෙහිදී නදියෙහි හුන් අත්පසට නො පැමිණි භික්ෂූහු කර්මකොපනයට සමර්ථ නොවෙත්. කම්වදුන් අවසන්හි නදිය හැර එහි පාරිමතීරය ද ඔරිමතීරය ද, එකම සීමාවක් වෙයි. නදිය වනාහි බද්ධසීමා සංඛ්‍යාවට නො පැමිණේ. නදිය මැද පිහිටි කොදෙව්වද සීමා වශයෙන් සම්මතකරගන්ට කැමති කල්හි පෙරසේම තමන් සිටි ඉවුරෙහි නිමිති කීර්තනය කොට දිවයිනේ ඔරිම පාරිම අන්තයන්හි නිමිති කීර්තනය කටයුතුයි. ඉක්බිති නදියේ ඔරිමතීරයෙහි පිහිටි නිමිතිවලට ඉදිරියෙන් පාරිමතීරයෙහි වූ නිමිතිද

කිත්තනය කොට, එතැන්පටන් පළමු ක්‍රමයෙන් උපරිගණ්ඨාවෙහි පළමු කිත්තනය කළ නිමිත්ත දක්වා නිමිති කිත්තනයකොට, [illegible]යෙහි පාරිමන්ත ඔරිමන්තයන්හි වූ නිමිති කිත්තනය කොට, පළමු කිත්තනය කළ නිමිත්ත හා ගැලපිය යුතුයි. ඉක්බිති දෙතෙර ද දිවයිනෙහි ද සිටි භික්ෂූන් අත්පසට නැඳවා කම්මවාචායෙන් සීමාව සම්මත කටයුතුයි. සම්මතය කෙළවර ගඟේ දෙතෙර ද දිවයිනද එකම සීමාවක් බවට පැමිණේ. අනුපරිවේණියං-(එකම සීමාවකට අයත් මහාවිහාරයෙහි වූ) එක් එක් ආවාසයෙක්හි ආවාසයෙක්හි; අසංකේතෙන- සලකුණක් නො කොට; සමූහනිත්වා-කම්වාචායෙන් විනාශකොට (උදුරා); මෙයද ආපත්තිපරිහාරය පිණිස වදාරණලදී. යථා පාතිමොක්ඛං සුණාති-භික්ෂූන්ගේ අත්පසෙහි යම් ඒ තැනක හුන්නේ පාමොක් අසාද; ඒ භික්ෂුව විසින් උපොසථය කරණලද්දේ වෙයි. උපොසථපමුඛං-පොහොයගෙට අයත් ඇලින්දය; නිමිත්තා කිත්තෙතබ්බා-නිමිති කිත්තනය කටයුත්තාහුය. මේ නිමිති ගැණ ප්‍රමාණ නියමයක් නැත. එහෙයින් කුඩා හෝ මහත් හෝ වූව වරී. ලීකොට, ගංබාල් ආදිය මේ නිමිතිවලට යෙදියහැකි වෙයි. පොහොය ගෙය ඉදිරිපස ඇලින්දය මෙපමණක්යයි කැපවීම පිණිස තැබියයුතු ලකුණුය. ථෙරෙහි භික්ඛූහි පඨමතරං සන්නිපතිතුං-ස්ථවිර භික්ෂූන් විසින් පළමුවෙන් පැමිණෙන්නට; පළමුවෙන් නො පැමිණෙන ස්ථවිර භික්ෂූන්ට දුකුළා ඇවැත් වේ. එකජ්ඣං සන්නිපතිත්වා|උපොසථො කාතබ්බො-එක් තැනකට රැස්වී උපොසථය කළයුතුය. විහාරයෙහි පිහිටි පෙළණිකා ආවාසයට රැස්වී උපොසථය කටයුතුය. ඒ පැරණි ආවාසය නො පොහොසත් නම් එසේම දුර්වල නම් අභිනව ආවාසයකට නැවත් රැස්වී පොහොය කටයුතුය. යත්ථ වා පන ථෙරො භික්ඛු විහරති-යම් තැනක ස්ථවිර භික්ෂුතෙමේ වාසයකෙරේද; ඒ ආවාසය සියලු භික්ෂූන්ට පොහොසත් වේද, පහසුත් වේද එහි රැස්වී උපොසථය කටයුතුයි. ඒ තෙරුන් වසන ආවාසය පසල්දනව්වෙහි [illegible] පෙදෙසක පිහිටියේ නම් "ස්වාමීනි නුඹවහන්සේ වැඩසිටිනා ආවාසය ගාම ජම් ආදියට අපහසු තෙනක පිහිටියේය. එහි සියලු භික්ෂූන්ට අවකාශද නොමැතිය. අසවල් ආවාසය නම් පහසුය. එහි අවකාශයත් ඇත" යි තෙරුන්ට දැන්විය යුතුයි. ඉදින් තෙරනු නො වඩිත් නම් උන්වහන්සේගේ ඡන්දයද රැගෙණ සෙසු භික්ෂූන් එහි පැමිණ පොහොය කළ යුතුයි. අන්ධකවින්ද-එනම් නගරය; මෙය රජගහනුවරින් තුන්ගවුවකින් ඈත සප්පිනී නදීතීරයෙහි පිහිටියේය. රජගහනුවරැ අන්ධකවින්ද නම් විහාරය ද ඇතුළු විහාර අටළොසක් පිහිටියහ. මේ සියලු විහාරම එක මහාසීමාවක්ය. දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් විසින් ඉම් මහා සීමාව සම්මතකරණලදී. එහෙයින් වෙළුවනයෙහි සඞ්ඝයාට සාමග්‍රීදානය පිණිස එහි වැඩියේය. නදිං තරමානො-සප්පිනීනදිය තරණයකරන්නේ; මනං වුළ්හො අහොසි- මඳක් ගසාගෙණයන ලද්දේවිය. මේ සප්පිනීනදිය වනාහි ගිජ්ඣකූටපව්වෙන් පවත්නේගෙණ හද

සැඩපහරින් පුස්තාව ගලාබසී. සැරියුත් තෙරුන් වහන්සේ එහි සැඩ පහර ගැණ මෙනෙහි නො කොට ගඟට බට සේක. එකවරටම සැඩපහරට අසුව මඳක් දුර ගසාගෙණ යනු ලැබූහ. සිවුරු සම්පූර්ණ සෙන් ජලයෙන් තෙමී ගියේය. සම්මතා සා සීමා සඞ්ඝෙන තිචීවරෙන අවිප්පවාසා-තිචීවර පරිහාරයට කරුණු වූ අවිප්පවාසා නම්වූ ඒ සීමාව සඞ්ඝයා විසින් සම්මත කරණලදී. මේ කම්මවාක්‍යය නියමකොට වදළ තැන් පටන් සඞ්ඝයාට පළමු කම්මවාක්‍යයෙන් කටයුතු නොකොට හැරිය හැකිය. මෙය ම නියම කම්මවාක්‍යය වන හෙයිනි. භික්ෂුණීන්ට වනාහි ප්‍රථම කම්මවාක්‍යය ම ය භික්ෂුණීහු ඇතුළුගම වසති. එහෙයින් ඔවුහු මේ කම්මවාක්‍යයෙන් ලැබෙන තිචීවර පරිහාරය නො ලබති. අවිප්පවාස සීමා' යි මහාසීමාව සඳහාම කියනලද්දකි. ගාමූපචාරෙ-පිරිකෙවි කරණලද ග්‍රාමයාගේ පරික්ෂෙපය ද, පිරිකෙවි නො කළ ග්‍රාමයාගේ පරික්ෂෙපයට සුදුසු තැනද ගාමූපචාරනම්. ඉදු තුන් සිවුරු ඇති මහණතෙමේ මෙහි තිචීවර පරිහාරය නො ලබයි. යම් තැනක සමාන සංවාසක සීමාව වේනම් අවිප්පවාස සීමාවත් එහිමය. ඒ පිළිබඳව මෙවන් වසයෙන් නිමිති කිත්තනයක් නොමැතියි. අවිප්පවාස සීමා සම්මුතිකාලයෙහි එහි ගම් පිහිටියේ නම් එය ග්‍රාමසඞ්ඛ්‍යාවට වැටේ. සීමාසම්මතයෙන් පසුව ගම් සැදුනි නම් එය සීමාසඞ්ඛ්‍යාවට ගැණේ. ඒවං ච පන භික්ඛවෙ තිචීවරෙන අවිප්පවාසො සමූහනිතබ්බො-මෙසේ වනාහි තිචීවර අවිප්පවාසය සමූහනනය කටයුතුයි. සීමාසමූහනනය කිරීමෙහිදී ඛණ්ඩසීමාවෙහි සිට මහාසීමාව ද මහාසීමාවෙහි සිට ඛණ්ඩසීමාව ද සමූහනනය නො කටහැකි වෙයි. ඛණ්ඩසීමාව ඛණ්ඩසීමාවෙහි සිටද, මහාසීමාව මහාසීමාවෙහි සිටද සමූහනනය කටයුතුයි. සීමාසමූහනනය වනාහි 'ආවාසය විශාලකිරීමට ප්‍රකෘතියෙන් කුඩාවූ සීමාව විශාලකිරීම පිණිස ද, අන්‍යයන්ගේ විහාරයකට ඉඩදීමට කුඩාකිරීම පිණිස ද යන කරුණු දෙක නිසා කරන්ට සිදුවේ. ඛණ්ඩසීමා, මහාසීමා මේ මේ යයි වෙන් වසයෙන් දනීත්නම් හසන්ට ද බඳින්ට ද පහසුවෙයි. මහාසීමාව පමණක් දන්නාවූ, ඛණ්ඩසීමාව මෙයයි නො දන්නාවූ භික්ෂූන්ට සෑමලු බෝමලු පොහෝගෙය ආදී නිසැක තැනක සිට සමූහනනය කරන්ට හැකිය. එහෙත් බඳින්ට නො හැකිය. ඛණ්ඩසීමාව නියම වසයෙන් නො දත සීමාබන්ධනය කරන්නෝ සීමාවෙන් සීමාව අජ්ඣොත්ථරණයකිරීම් සඞ්ඛ්‍යාත සීමාසම්භෙදය කෙරෙති. පෙර සෑමලු ආදියෙහි සිටද සඞ්ඝකම් කළහැකිවූ විහාරය සම්භෙදකිරීම හෙතුවෙන් එය නැති අවිහාරය වෙයි. එහෙයින් සීමාසමූහනනය නො කටයුතු. සීමාව වනාහි සමූහනන කම්මවාක්‍යයෙන් හෝ ශාසනාන්තර්ධානයෙන් අසීමාබවට පැමිණේ. සමූහනනබන්ධන එසේම මනා දැනීමෙන් ම කටයුතුවෙයි. ඇතැම් කෙනෙක් ගස්අට නමක් භික්ෂූන් රැස්කොට ගෙණ විහාර කෙළවරෙහි පවත් හාත්පස ලෙඩ්ඩුපාතයක් පමණ තැන පිහිටි සියලු විහාරභූමියෙහි මැදවූ ප්‍රමාණවූ කොටු කතා එහි සිට පළමු

කොට මහාසීමාව ද නැවත සමානසංවාසක සීමාවද සමූහනනය කෙරෙති. ඒ විහාරභූමියෙහි ඛණ්ඩසීමාවක් හෝ මහාසීමාවක් බැඳ තිබුණේ නම් එය භික්ෂූන්ගේ සමූහනන කර්මවාක්‍යයෙන් නැසේයයි ඔවුහු සලකති. මින්පසු එහි ඉතිරිවන්නේ ග්‍රාමසීමාව පමණකි. මෙය විමසා ගතයුතුයයි විමතිවිනොදනියෙහි කියති.

**අසම්මතාය භික්ඛවෙ සීමාය අට්ඨපිතාය**- සීමාව අසම්මතකල්හි නො පිරිසිඳි කල්හි; ගම්දෙටුවා යම් පෙදෙසකින් අයබදු ගණී නම් ඒ පෙදෙස කුඩා හෝ වේවා මහත් හෝ වේවා ග්‍රාමසීමා වශයෙන් සැලකිය යුතුයි. බද්ධසීමා අසම්මත පෙදෙසෙහි ග්‍රාමසීමාව සංවාසක සීමාසඞ්ඛ්‍යාවට පැමිණේ. ('ගාමො එව ගාමසීමා') ගමම ගාම සීමා නම්· රජතෙමේ ගමින් කොටසක් වෙන් කොට කෙනෙකුට පරිත්‍යාග කෙරේද, ඒ විසුංගාම නමි. විසුංගාම සීමා නම් වන්නේද එයමය. හෙද බද්ධසීමා හා සමාන වෙයි. එහෙත් මේ සියල්ල තිචීවර විප්පවාස පරිහාරයෙන් වෙන්වේ. **අගාමකෙ-අරඤ්ඤෙහි**; සීසෑම වැපිරීම් කිසක් නොමැති විඣ්‍යාටවි වැනිවූ අරණ්‍යෙහි ද, එසේම මස් මරන්නන් පවා නො පිවිසෙන මනුෂ්‍යාවාස නූවූ මුහුදු මැද පිහිටි දිවයින්වලද භික්ෂූහු වසත් නම්, එතැනින් හාත්පස සත් අබතුරක් පෙදෙස සමානසංවාසක සීමාසඞ්ඛ්‍යාවට ගතයුතුයි. මෙය චීවර විප්පවාස පරිහාරය ද ලබයි. එහි හුන් දෙනමක් වෙන්වෙන්ව සඞ්ඝකර්ම කෙරෙත් නම් සත් අබතුරක් අතර ඊට උපචාරය පිණිස අතහැරිය යුතුයි. සත් අබතුරක ප්‍රමාණය මෙපමණයයි නො දන්නා භික්ෂුව විසින් තමන්ගේ නිශ්‍රයේ හැටියට තවත් සත් අබතුරක් ඉක්මවා දුරයෙහිම විසිය යුතුයි.

**සබ්බා භික්ඛවෙ නදී අසීමා**-සියලුම නදීහු අසීමායි. නදීලක්ෂණයෙන් යුත් ගඞ්ගාවක් නිමිති කීර්තනය කොට මෙය හුදු බද්ධසීමාවක් කරමුයයි කරණු ලැබේද එය සීමාසඞ්ඛ්‍යාවට නො පැමිණේ. එය ස්වභාවයෙන් ම බද්ධසීමා සදෘශයක් වන හෙයිනි. එහි සියලු සඞ්ඝකර්ම කරන්ට වටී. සමුද්‍රජාතස්සරයන්හි ද මේ ක්‍රමයමය. ජාතස්සර නම් කෙනෙකුන් විසින් නො කැනී හාත්පසින් ගලාගෙණ ආ ජලය පිරී පවත්නාවූ ජලාශයයි.

**යං මජ්ඣිමස්ස පුරිසස්ස සමන්තා උදකුක්ඛෙපා**- (උදකං උක්ඛිපිත්වා ඛිපියති එත්ථාති උදකුක්ඛෙපො) යම් තැනක් මධ්‍යම පුරුෂයෙකුගේ සියඅතින් ඉසි ජලයෙන් පිරිසිඳිනු ලැබේද, ඒ උදකුක්ඛෙපසීමා නමි. මාතිකාට්ඨ කථාවෙති:- "පරිච්ඡෙදබ්භන්තරෙ හත්ථපාසං විජහිත්වා, ඨිතොපි පරිච්ඡෙදතො බහි අඤ්ඤං තත්තකංයෙව පරිච්ඡෙදං අනතික්කමිත්වා ඨිතොපි කම්මං කොපෙති" උදකුක්ඛෙප සීමාවෙහිම අත්පස හැර සිටියේද, එවැනි අන් උදකුක්ඛෙප සීමා ප්‍රමාණයක් නොහැර සිටියේද, ඒ උදකුක්ඛෙප සීමාවෙහි කෙරෙණ කර්මය කොපන කෙරේ. එහෙයින් මෙහි උපචාරය පිණිස වියත් සතරඟුල් ප්‍රමාණය නොව අතිස් උදකුක්ඛෙප සීමාවක්ම තැබිය යුතුයි. නදීයෙහි සඞ්ඝකර්ම කරණ භික්ෂූන්- නදිය සමතිත්තිකාව පිරුණක් නම්. උදකාපි

කෑව හැඳ නදිය මැදුම පැමිණ කම්කළ යුතුයි. නැතහොත් ඔරු අඬුල් ආදියක සිට හෝ කම්කළ යුතුයි. මෙයි සීමාව උදකුක්ඛේපමාත්‍ර වෙයි. එහෙයින් අතුරු සැඩපහරින් ගසාගෙණයාම වළක්වා ගැණීම පිණිස හබලක් හිඳුවා එයි බැඳ හෝ පහණක් ගැටගසා එය නදිය තුළට බහා හෝ නදිය ඇතුළතම් ගසක බැඳ හෝ කම්කළ යුතුයි. නදියෙහි බැඳි අටල්ලක හෝ එහි පිහිටි ගසක හෝ හිඳ සඞ්ඝකම් කටහැකි වෙයි. එහෙත් ඒ රුකෙහි අතු හෝ අරළු නදීතීරයෙහි විහාරසීමාවෙහි හෝ ග්‍රාමසීමාවෙහි හැපී පවතීනම් සීමාව හෝ ශුද්ධ කටයුතුයි. අතු හෝ සිඳදැමිය යුතුයි. නදීතීරයෙහි පිහිටි ගසක අතුලී බැඳ කම් නොකළ යුතුයි. එසේම නදීතීරයෙහි සිටවූ කණුවක බැඳි අතුන් ආදියෙහි හිඳද කම්කිරීම නුසුදුසුය. නදියෙහි මැද පිහිටි ගොඩ හෝ පාලම ඉවුරට සම්බන්ධනැති කල්හි එහි කම්කළහැකි වෙයි. නදීමැද පිහිටි කුඩා දිවයින හෝ පතන වැසි සිවුමසවත් ජලයෙන් යටවී පවතීනම් එය නදී සඞ්ඛ්‍යාවට ම යේ. වැහිවට කල්හි පමණක් ජලයෙන් යටවී පවත්නේ ග්‍රාමසීමා සඞ්ඛ්‍යාවට පැමිණේ.

සමුද්‍රයෙහි සඞ්ඝකම් කරන්නවුන් විසින් රළ පැමිණි කල්හි පමණක් ජලයෙන් වැසීයන තරම් වෙරළෙහි සිට කම්කරන්ට නුසුදුසුය. පියවී දියකෙළවර පටන් මුහුදයයි ගණනට යේ. එතැන්පටන් සඞ්ඝකම් කිරීමට ක්ෂෙත්‍ර වෙයි. සෙසු විනිශ්චය නදියෙහි සේයමය. උදකුක්ඛේපසීමා ශක්තිය පෘථුවිතලයෙන් යටට නොබසී. එහෙයින් එහි යට පෙදෙසෙහි පිහිටි උමන් හා ලෙන්වල සිටි භික්ෂූහු මතු සීමාවෙහි කරණුලබන කම්ය කොපය නොකට හැක්කෝ වෙත්. ආසන්න ග්‍රාමසීමාදියෙහි වූ කම්ය කොපයට සුදුස්සෝ වෙත්.

සීමාය සීමං සම්භින්දන්ති - තමන්ගේ සීමාවෙන් අනුන්ගේ බද්ධ සීමාව යොදකෙරෙත්. භික්ෂූන් සිවුනමකට හිඳීමට නොපොහොනා ප්‍රමාණයේ පටන් කොසගක් පමණතුදු තමන්ගේ සීමාවට ඇතුල්කර ගැණීම සම්භේදනය කිරීමයි. සීමාය සීමං අජ්ඣොත්ථරන්ති - තමන්ගේ සීමාවෙන් අනුන්ගේ බද්ධ සීමාව මඩිත්, යටකෙරෙත්. සිවුනමකට පොහොනා තරම් පටන් අනුන්ගේ සියලු සීමාවම තමන්ගේ සීමාවෙන් වසා යටකරගැණීම අජ්ඣොත්ථරණය නම්. සීමන්තරිකං ඨපෙත්වා සීමං සම්භින්දන්ති - සීමාන්තරිකාව තබා සීමාව බඳින්ට; සම්භේදන අජ්ඣොත්ථරණයන් නොකොට වුව ද බද්ධසීමාව හා ඔවුනොවුන් සපයී වන සේ බැඳි සීමාව අසීමාවක් බැව් මෙයින් දක්වති. එහෙයින් සීමාන්තරිකයට අතර ප්‍රමාණය රියනක් හෝ වියතක් හෝ සතර අඟුලක් හෝ වියයුතුයි. අතර අඟලක් පමණ වුවද තිවරදයයි ටීකාවෙහි දක්වති. එහෙත් එය දුර්බොධ හෙයින් යටත්පිරිසෙයින් සතරඟුලක් පමණවත් තැබියයුතුයයි විමති විනොදනියෙහි කියති. දෙපස සීමා දෙකකට එක රුකක් නිමිති නොකළ යුතුයි. ගස වැඩෙනකල සීමාසම්භේදය වන හෙයිනි. සීමාන්තරිකායෙහි ද වැඩෙන රුක් නොපිහිටිය යුතුයි. සීමාසංකරභාවයට ඉඩ සැලසෙන හෙයිනි.

අධම්මෙන වග්ගං - අධර්මකර්මයෙන් වර්ග උපොසථය; එක සීමාවෙහි සිවුනමක් භික්ෂූන් ඇති කල්හි පාතිමොක්ඛුද්දෙසය අනුඥාතය. තුන්නමක් හෝ දෙනමක් ඇති කල්හි පාරිශුද්ධි උපොසථය අනුඥාතය. එසේ නොකොට සිවුනමක් ඇති කල්හි එක් නමකගේ ඡන්ද පාරිශුද්ධිය ගෙනවුත් තුන්නමක් පාරිශුද්ධි උපොසථය කෙරෙති, තුන්නමක් ඇති කල්හි එක් නමකගේ ඡන්දපාරිශුද්ධිය ගෙනවුත් දෙනමක් පාමොක් උදෙසති. මෙසේ කිරීම අධම්ම නම්. ඡන්දපාරිශුද්ධිය වනාහි සඞ්ඝයා කෙරෙහි ම පැවසියයුතු වෙයි. එසේ නො කොට ගණයා කෙරෙහි ද, පුද්ගලයා කෙරෙහි ද පැවසීම 'වග්ග' නම්. අධම්මෙන සමග්ගං - අධර්මකර්මයෙන් සමගි උපොසථය; සිවුනමක් ඇති කල්හි පාරිශුද්ධි උපොසථය ද, තුන්නමක් හෝ දෙනමක් ඇති කල්හි පාමොක් උදෙසීම ද කෙරෙති. මේය අධර්මකර්මයෙන් වූ සමගි උපොසථයයි. සඤ්චරභයං - වනචරයින්ගෙන් වන බිය; රාජන්තරායො - (භික්ෂූන් පොහොය කරන්නට යයි හුන් කල්හි) රජහු පැමිණීමෙන් වන බිය; අනජ්ඣිට්ඨා - නො ඇණවූවෝ; අනාචිතයෝ; සඞ්ඝස්ථවිරයන් හෝ සඞ්ඝස්ථවිරයන්ගේ නියමය ලැබුවෙකු විසින් හෝ වාරය පැමිණියහු විසින් හෝ පාමොක් උදෙසීම කටයුතුයි. පටික්කොසිතුං - වලක්වන්නට; දිට්ඨිම්පි ආවිකාතුං - (මේ අධර්මකර්මයෙක, මට රුචි නොවේයයි අනුන්ට) තමන්ගේ දෘෂ්ටිය ප්‍රකාශ කරන්නට; ථෙරාධිකං - තෙරුන්ට අයිතිය; සො න ජානාති උපොසථං වා - (චාතුද්දසික පණ්ණරසික වශයෙන් දෙපරිදිවූ හෝ සඞ්ඝ, ගණ, පුග්ගල, සුත්තුද්දෙස, පාරිසුද්ධුද්දෙස, අධිට්ඨානුද්දෙස, චාතුද්දසී, පණ්ණරසී, සාමග්ගී වශයෙන් නවවැදෑරුම්වූ) උපොසථය නො දනීද; අධම්මෙනවග්ග, ධම්මෙනවග්ග අධම්මෙනසමග්ග, ධම්මෙනසමග්ග වශයෙන් සිවුවැදෑරුම්වූ උපොසථකර්මය නොදනී. භික්ෂු භික්ෂුණී වශයෙන් දෙවැදෑරුම් වූ ප්‍රාතිමොක්ෂය නොදනී. නිදාන, පාරාජික, සඞ්ඝාදිසෙස, අනියත, විස්තාරයයිද, එසේම භික්ෂුණීන්ගේ වශයෙන් සිවුවැදෑරුම්වූද නවවිධ පාතිමොක්ඛුද්දෙසය නොදනී. යො තත්ථ භික්ඛු ව්‍යත්තො පටිබලො - එහි යම් භික්ෂුනමක් ව්‍යක්ත වේද, ප්‍රතිබලවේද; මෙසින් ව්‍යක්තවූ දහරභික්ෂුනටද ප්‍රාතිමොක්ෂය අනුඥාතය. තෙරුන්නට උද්දෙස මාත්‍රයක්වත් යටත්පිරිසෙයින් වාචොද්ගත කල්හි පාතිමොක්ඛුද්දෙසය ථෙරායත්ත වෙයි. තෙරුන්ට එපමණවත් අමතක කල්හි පාමොක් උදෙසීම ව්‍යක්ත භික්ෂුහට අයත් වෙයි. සජ්ජුකං - එදවසම පැමිණීම පිණිස; නවං භික්ඛුං ආණාපෙතුං - (වහා උගතහැකි) නවක භික්ෂුනමකට (එහි යනු පිණිස) අණවන්ට; කතිමී භන්තෙ - (කතීනං පූරණී කතිමී.) වහන්ස, කීවැනි තිථිය වන්නී ද? මෙහි ස්ත්‍රීලිඞ්ගිකත්වය 'තිථි' ශබ්දය අපෙක්ෂා කිරීම හෙතුවෙන් ලැබුනකි. කාලවතො - කලින්ම, පළමුකොටම; යං කාලං සරති - යම් වේලාවක සිහිකරයිද; සවස හෝ අද පොහොයයි සැලකරන්නට වේ; ථෙරෙන භික්ඛුනා නවං භික්ඛුං ආණාපෙතුං ස්ථවිර භික්ෂුව විසින් නවක භික්ෂුහට අණවන්නට; කිසියම් කටයුත්තක යෙදුනාහුට හෝ,

නෑමකල්හි ම එක තාවකාල හෝ, පරහාණක ධම්මකථිකාදීන් අතුරෙන් කෙනෙකුට හෝ පොහොය ගෙය හැමදීම පිණිස නො ඇණවියයුතු. ශිෂ්‍යයන්ට වාරයෙන් ඇණවිය යුතුයි. ඉදින් නියමය ලැබූ තැනැත් තනු මුස්නක් නො ලබා නම් අතු සුහකින්වත් ඇමදිය යුතුයි. පොහොය ගෙහි අසුන් ආදිය නොමැති නම් සඞ්ඝාරාමයෙන් හෝ උවමනා දෙය ගෙණවුත් අසුන් පණවා පිළියෙලකළ යුතුයි. එසේ යමක් සපයාගත නොහැකි නම් සෑප පරිදි ලන් අතු රිකිලිවලින්වත් අසුන් පැණවිය යුතුයි. සංගහෙතබ්බා- (වහන්ස, වඩිනු මැනවි. මෙහි සිඞාවද සුලභය. සුපව්‍යඤ්ජනද ඇත. කලකිරීම් අයුර්තට නො පැමිණ වසනු මැනවැයි ප්‍රිය වචනයෙන්) සංග්‍රහ කටයුතුයි. උපලාපෙතබ්බා-(හොඳයි වසම්යි පිළිතුරු දෙනතුරු නැවත නැවත මෙනෙහිකරවීම් වශයෙන්) පෙළඹවිය යුතුයි. නැතහොත් සිවුපස යෙන් 'සඞ්ග්‍රහ' කටයුතුයි. ප්‍රියවචන සංග්‍රහයෙන් 'උපලාලනය' කටයුතුයි. ආපත්ති දුක්කටස්ස- (සඞ්ග්‍රහ ආදිය නො කරණ) සියලුම සඞ්ඝයාට දුකුළා ඇවැත්වේ. මෙහිදී තෙරනුය නවකයයි විදීමක් නැත. සියල්ලන් විසින් ම වාරයෙන් උපස්ථානකළ යුතුයි. තමන්ගේ වාරයෙහිදී උපස්ථාන නො කරන්නහුට ඇවැත් සිදුවේ. මේ භික්ෂුව විසින් මහතෙරුන් ගෙන හැමදීම් දතැටිදඬු එළවීම් ආදි වත් සපයනකල නො ඉවසිය යුතුයි. එහෙත් මහතෙරුන් විසින් ද උදය සවස උපස්ථාන යට එළඹිය යුතුයි. මහතෙරුන්ගේ එසේ පැමිණීම දැනගත් ඒ භික්ෂුව විසින් පළමුකොට ම උන්වහන්සේලාට උමැදින පිණිස යායුතුයි. තමන්ට උවටැන්කරණ උපස්ථායකයන් ඇතිකල්හි 'මම උවටැන් කරන්නෝ ඇති ... මැනවැයි දැන්විය යුතුයි. ඇතැම් කෙනෙක් 'අපි උවටැන් කරන්නෙමු. ... භික්ෂූහු පැමිණ වාසනකරයුතුයි' කියා ... අනාගතනි වේ. නො ආවාසෙ ගන්තබ්බං-(හේමන්ත ගිම්හ දෙකාලයෙහි පොහොය කිරීම පිණිස පසයනට වරක්) ඒ ආවාසය යායුතුතාන්. ... එනයි සිතනුයි. තස්මිං ආවාසෙ වස්සං වසිතබ්බං- මහණෙනි, ඒ භික්ෂූන් විසින් ඒ (පාමොක් උදෙසන්නකු නොමැති) ආවාසයෙහි වස් නො වැසිය යුතුයි. වස්සූපගත භික්ෂූන් අතුරෙන් ව්‍යක්ත මහණකෙනෙම් බැහැරකට ගේද, සිවුරු හැර යේද, කලුරිය කෙරේද, එවැනි අන් භික්ෂුවක් ඇතිකල්හිම පසුවස් කාලය එහි දී ගතකළ යුතුයි. නැත හොත් අන් තැනකට පැමිණ පසුවස් සමාදන්වී වාසයකළ යුතුයි. එසේ නොගත සිසුන්ට දුකුළා ඇවැත් වේ. පසුවස් එළඹියයුතු දිනය ඉක්ම ගේනම් කාර්ය කෙළේනමුත් එහි ඒ ඉතිරි දෙමස ද ගතකළ යුතුයි. නාලෙන ... (සිතින් සිතා) නායවිසාර යෙන් ගහවනි. ... සඞ්ඝෙන එහි ... කළයුතුයි. එබඳු බොහෝ ගිලන්හු වත් නම් සඞ්ඝයා පිළිවෙළින් අත්පස නොහැර සිට, ඒ ගිලන් භික්ෂූන් ද අත් අතෙහි ... කළයුතුයි. ... දුර

කොයින් අත්පසට හැරීමට සමඟය මිදනම් එදින පොහොය නො කළයුතුයි. මෙයින් භික්ෂූන්ගේ පොහොයකිරීම නුසුදුසු හෙයිනි. කෙසේද පොහොයමුනි - සහමුදුව හෝ පැමිණ එයින් නොසිතයි ගනී. සාමණේර භික්ෂුව - 'මම ශ්‍රාමණේරයෙක්මි' යි පිළිගනෙරෙයි. උක්ත විනිවිද ඇතිව උපසම්පන් වූවහුගේද, අන්තිම වස්තුවට පැමිණියහුගේද, සිත ථෙය්‍යසංවාසකයාගේද භික්ෂුප්‍රතිඥාව පවත්නාතෙක් ම ඔවුන් ගෙනෙනලද පාරිසුද්ධියට වරදක් නොවේ. යම්කලෙක ඔවුහු ශ්‍රමණභාවය පිළිගනෙරෙයි ද, එතැන්පටන් පාරිසුද්ධිය නො පැමිණේ. මෙසේ හෙයින් පණ්ඩකාදීන්ගේ භික්ෂු ප්‍රතිඥාව පවත්නා තුරු ම ඡන්දපාරිසුද්ධිගතභාවය සිද්ධය. සංඝයාගේ ගෙනාමුනි- සංඝයාගේ අත්පසට පැමිණීමෙන් බැහැරවෙයි. මෙසේ කළයුතු පාරිසුද්ධිය ගෙනෙනලද්දේ වෙයි. එක් තැනකට බොහෝ භික්ෂූන්ගේ පාරිසුද්ධිය ගෙණ ආ හැකිවෙයි. භික්ෂුනමින් ගෙනැවුත් ගෙනෙන්නා තමන් භාරගත් පාරිසුද්ධියද, එසේම තමන්ගේ පාරිසුද්ධියද අතර මගදී අනික් භික්ෂුනමකට දෙයි. උන් වෙත පැවරෙන්නේ තමන්ගේ පාරිසුද්ධිය පමණෙකි. ගෙණ ආ පාරිසුද්ධිය එතැනින් ඔබ්බට නො පැමිණේ. බිළාල සංඛලිකාව මෙනි. දම්වැලේ පුරුක දෙවෙනි දෙවෙනි පුරුක හා සම්බන්ධකම ලබයි. තෙවැනි පුරුක හා සම්බන්ධකමක් නැත. එහෙයින් එක පුරුකක් කැඩුණුකල එය වෙන්වෙයි. ශුද්ධිකා ආයුෂ්මත්-ශික්ෂාදයින් (ඉහවිලාගේ ඡන්දය මා විසින් ගෙනෙනලද්දේ වෙයි) ආරෝචනය නො කෙරෙති. පාරිසුද්ධිභාරකයා අනාපත්ති- (මා සිහියෙන් නො කියත) පාරිසුද්ධිභාරකයාගේ අනාපත්ති වේ. පාරිසුද්ධිං දෙන්නාහු ඡන්ද දිසිදූසුං පාරිසුද්ධිය දෙන්නාහු විසින් ඡන්දයද දෙන්ම; එම භික්ෂුනමක් ඡන්දය නොදී පාරිසුද්ධිය පමණක් දීද යනු මිනත් උපෝසථය කරන්නේද එහෙත් සංඝයාගේ අනික් කම්වලට සහභාගිවූවෙක් නොවෙයි. පාරිසුද්ධිය නොදී ඡන්දය පමණක් දීද සංඝයාගේ උපෝසථකර්මය සිද්ධවෙයි. නොහොත් පොහොය නො කරලදත් වෙයි. එහෙයින් ඒ භික්ෂුසට පොහොය කළේයයි අත්තහනදී ඡන්දය හෝ පාරිසුද්ධිය නොදී ඉන්නට සුළුමත් කමක් නැත. ගඳනි සංඝස්ස කරණීයං-සංඝයාට කරනුදු දෙක වෙති. "සකනිඝසංඝස්ස කරණීයාති" යි වියයුතු නැත. 'කරණීයං'යි වචනවිපල්ලාස වසයෙන් යෙදුණේය. සරණීයි උපෝසථං නාම සරති- උපෝසථය දම්සෙහ සිහිකරති, දවසෙහ අමතකකරති. අසනි ගනාඩ සරති-යමෙක් එකානෙකයෙන් ම අමතකකරයි. ඔහුට සම්මුතිදාන කිසක් නැත. කාලෙක සිහිකරන්නාහුට ම සම්මුතිදානය වඩුල හෙයින් කාලෙක සිහි නොකරන්නාහුට සම්මුතිදානභාවය සිද්ධය. ඔහුගේ නො පැමිණීමද වර්ජනීය පිණිස නො පවතී. ඇතැම් කෙනෙකුන් ඔහු අත්පසට ගෙනවිය යුතුයයි ද කියති. තෙන ඔදකෙන සම්මුඤ්ජිත්වා-ඒ පෙදෙස හැමද; 'පානීයං' යනු උපෝසථාගාරයෙහි පඩවනත මවනහි තබායි ඇඳිං-ඒ පැමිණි භික්ෂූන් සමඟ; අජ්ජ මෙ ආවුසෝ- (මෙ පණ්ණරසිය වේ නම්) අද මාගේ උපෝසථය ද පණ්ණරසිය වෙයි.

මෙසේ අධිෂ්ඨාන උපොසථය කරන්ට වටී. නො දැන නො සිහියෙන් අධිෂ්ඨානය නො කරන්නහුට අනාපත්ති වේ. න සාපත්තිකෙන උපොසථො කාතබ්බො-සාපත්තිකයන් සමග උපොසථය නො කට යුතුය. සියලු සිකපද පැණවීම අලජ්ජිනිග්‍රහය පිණිස වූ හෙයින් අලජ්ජීන් සමග පොහොය කිරීමද මෙයින් ප්‍රතික්ෂේපිතය. සාපත්තික භික්ෂුව විසින් පාරිශුද්ධිදානය ද නො කටයුතුයි. ඉදානිං නාමං ආපත්තිං-මේ (තුලසි නම්වූ හෝ පචිති නම්වූ හෝ) ඇවත; මෙයේ නම් සඳහන්කිරීමෙන් ඇවත ප්‍රකාශ කටයුතුයි. පස්සසි-මෙයද බලනු; වැඩිමහලු නම් 'පස්සථ භන්තෙ තං ආපත්තිං'යි දෙසිය යුතුයි. යදා නිබ්බෙමතිකො හොති- යම් කලෙක විමතිරහිතයෙක් වේද; විමති සහිතයෙක් වේ නම්; එහිදී වස්තුව කීර්තනය කොට දෙශනා කරන්ට වටීයයි අට්ඨකථාචාර්යවරු කියති. එහිදී මේ දෙශනාවිධියයි, ඉදින් පිරූ මෙඝයෙන් වැසීගිය කල්හි නියමකල් දැනගන්ට අසමත්වූයේ වෙම්තිකාව වලඳයි ඒ භික්ෂුව විසින් 'ස්වාමීනි, මම වෙමතිකාව වැළඳුයෙමි. ඉදින් කල්නම් බොහෝ දුකුළා ඇවැත්වලටද නොකල් නම් බොහෝ පචිති ඇවැත් වලටද පැමිණියෙමි'යි මෙසේ වස්තුව කීර්තනය කොට "ඒ ඇවැත් තුඹගේ පාමුලදෙසමි"යි දෙශනා කටයුතුයි.

සභාගං ආපත්තිං- සමාන වස්තුක්‍රමයෙන් අවත් ඇවත; විකල් බොජුනෙන් අවත් ඇවත අනතිරිත් බොජුන් පසයෙන් අවත් ඇවත් අන්හුගේ සමීපයෙහි දෙශනා කටහැකි වෙයි. සභාග ඇවැත් ඒ බැව් නො දැන දෙසීමෙන් පිරිසිදු වේ. එහෙත් සභාග ඇවතක් දෙසීම් හෙතුවෙන්ද, පිළිගැණීම් හෙතුවෙන් ද දෙදෙනම දුකුළා ඇවතකට පැමිණෙති එයේ සිදුවන දුකුළං ඇවත නානාවස්තුකය. එහෙයින් ඇවත දෙශනාකරගැණීමෙන් පිරිසිදු බැව් ලැබියහැකි වෙයි. සාමන්තො භික්ඛු එවමස්ස වචනීයො- සාමන්ත භික්ෂුවෙකුම මෙසේ කියයුත්තෙක් වන්නේය. මෙසේ දැක්වීම් සභාග භික්ෂුවකටම කළයුතුයි. විසභාග භික්ෂුවක් වූකල කලහ ආදියට ඉඩ සැලසෙන හෙයිනි. එහෙයින් විසභාගවූ භික්ෂූනට නො කියා නැවත සුද්ධිකාමී කරව්සි චිත්තාධිෂ්ඨානය කොට පොහෝ කටයුතුයයි අට්ඨකථාචාර්යවරු කියති.

චොදනා වස්තු බණවර සැමසුණ නිමි.

---

අනාපත්ති පණ්ණරසකං. 1.

1. සම්බහුලා ආවාසිකා භික්ඛු චත්තාරො වා අතිරේකා වා; තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගා සමග්ගසඤ්ඤිනො උපොසථං අකංසු. තෙහි පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ- අථඤ්ඤෙ ආවාසිකා භික්ඛු ආගච්ඡිංසු බහුතරා, තෙහි පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං; උද්දෙසකානං අනාපත්ති.

2. -පෙ- පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ -පෙ- ආගච්ඡිංසු සමසමා; උද්දිට්ඨං සුඋද්දිට්ඨං; අවසෙසං සොතබ්බං; උද්දෙසකානං අනාපත්ති.

3. -පෙ-උද්දිස්සමානෙ-පෙ-ථොකතරා; -පෙ- සොතබ්බං, උද්දෙසකානං අනාපත්ති.

4 -පෙ-උද්දිට්ඨමත්තෙ-පෙ-බහුතරා;-පෙ- උද්දෙසකානං අනාපත්ති.

5. -පෙ-උද්දිට්ඨමත්තෙ-පෙ-සමසමා; තෙසං සන්තිකෙ පාරිසුද්ධි ආරොචෙතබ්බා-උද්දෙසකානං අනාපත්ති.

6 -පෙ-උද්දිට්ඨමත්තෙ -පෙ- ථොකතරා; -පෙ- උද්දෙසකානං අනාපත්ති

7. -පෙ-අවුට්ඨිතාය පරිසාය-පෙ-බහුතරා; පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං, උද්දෙසකානං අනාපත්ති

8. -පෙ- අවුට්ඨිතාය පරිසාය-පෙ-සමසමා; පාරිසුද්ධි ආරොචෙතබ්බා, උද්දෙසකානං අනාපත්ති.

9. -පෙ-අවුට්ඨිතාය පරිසාය-පෙ-ථොකතරා;-පෙ-අනාපත්ති.

10. -පෙ-එකච්චාය වුට්ඨිතාය-පෙ-බහුතරා; පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං, උද්දෙසකානං අනාපත්ති

11. -පෙ-එකච්චාය වුට්ඨිතාය-පෙ-සමසමා, පාරිසුද්ධි ආරොචෙතබ්බා, උද්දෙසකානං අනාපත්ති.

12. -පෙ-එකච්චාය වුට්ඨිතාය-පෙ-ථොකතරා-පෙ-අනාපත්ති

13. -පෙ-සබ්බාය වුට්ඨිතාය-පෙ-බහුතරා, පුන පාතිමොක්ඛං උද්දිසිතබ්බං, උද්දෙසකානං අනාපත්ති.

14. -පෙ-සබ්බාය වුට්ඨිතාය -පෙ-සමසමා, -පෙ-අනාපත්ති.

15. -පෙ-සබ්බාය වුට්ඨිතාය-පෙ-ථොකතරා;-පෙ-අනාපත්ති.

**තෙ න ජානිංසු**-(සීමාවට බැස්සාහුයයිද බසිත්යයිද) නො දත්තාහුය. **වග්ගා සමග්ගා සඤ්ඤිනො**-වගීවූ (එහෙත් සමග්ගය යන හැඟීම් ඇත්තෝ; ඤත්තිය නිමිකල්හි 'කිං සඞ්ඝස්ස පුබ්බකිච්චං' ආදිය කථනක්ෂණයෙහි සීමාවට බැසගත් හෙයින් වගීයෝය. ඒ බැව් නොදත් හෙයින් සමග්ගසඤ්ඤීහුය. මෙසේ වගීවූවද සමග්ගසඤ්ඤී හෙයින් මේ පණ්ණරසකයෙහිදී ම අනාපත්තිය වේ.

## (15) වග්ගාවග්ගසඤ්ඤී පණ්ණරසකය 2

සම්බහුලා ආවාසිකා චත්තාරො වා අතිරෙකා වා තෙ න ජානන්ති අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අනාගතාති. තෙ ධම්මසඤ්ඤිනො විනයසඤ්ඤිනො වග්ගාවග්ගසඤ්ඤිනො උපොසථං කරොන්ති පාතිමොක්ඛං උද්දිසන්ති. තෙහි පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ අථඤ්ඤෙ ආවාසිකා භික්ඛූ-පෙ-බහුතරා, -පෙ-උද්දෙසකානං ආපත්ති දුක්කටස්ස;

යථෝක්ත අනාපත්තිපණ්ණරසකය මෙසේ වෙනස්කොට ගත් කල්හි වග්ගාවග්ගසඤ්ඤී පණ්ණරසකය ලැබේ. මෙහිදී භික්ෂූන් වර්ගසංඥී හෙයින් ඔවුන්ට දුකුළා ඇවැත් සිදුවේ.

(15 වෙමතික පණ්ණරසකය 3.

වග්ගාවග්ගසඤ්ඤී පණ්ණරසකයෙහි 'වග්ගාවග්ගසඤ්ඤිනො' යනු වෙනුවට 'තෙ කප්පති නු ඛො අම්හාකං උපොසථො කාතුං න නු ඛො කප්පතීති වෙමතිකා'ති යොදාගත් කල්හි වෙමතික පණ්ණරසකය ලැබේ. මෙහිදී දේශක භික්ෂූන්ට දුකුළා ඇවැත් සිදුවේ.

(15) කුක්කුච්චපකත පණ්ණරසකය 4.

යථෝක්ත පණ්ණරසකයෙහි 'තෙ කප්පතෙව අම්හාකං උපොසථො කාතුං නාම්හාකං න කප්පතීති කුක්කුච්චපකතා'ති පෙරසේ වෙනස් කොට යොදාගත් කල්හි කුක්කුච්චපකත පණ්ණරසකය ලැබේ. මෙහිදී ද දේශක භික්ෂූන්ට දුකුළා ඇවැත් වේ.

(15) භෙදපුරෙක්ඛාර පණ්ණරසකය 5.

යථෝක්ත පණ්ණරසකය 'තෙ නස්සන්තෙතෙ විනස්සන්තෙතෙ කො තෙහි අත්ථොති භෙදපුරෙක්ඛාරා' යනු වෙනස්කොට යොදාගත් කල්හි භෙදපුරෙක්ඛාර පණ්ණරසකය ලැබේ. මෙහිදී දේශක භික්ෂූන්ට අකුශලය බලවත් හෙයින් ථුලසි ඇවැත් සිදුවේ.

(25=) පඤ්චවීසතිකා–බහුතර, සමසම, ථොකතර යන මොහු තිදෙන තික නම් පඤ්ච අනාපත්තිතික, පඤ්ච වග්ගාවග්ගසඤ්ඤීතික, පඤ්ච වෙමතිකතික, පඤ්ච කුක්කුච්චපකතතික, පඤ්ච භෙදපුරෙක්ඛාරතික යයි තිකයෝ පස්විස්සක්.

(175=) එකසත පඤ්චසත්තතිතිකා

1. තෙ න ජානන්ති අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තොසීමං ඔක්කමන්තීති,
2 තෙ න ජානන්ති අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තොසීමං ඔක්කන්තාති,
3 තෙ න පස්සන්ති අඤ්ඤෙ ආවාසිකෙ භික්ඛූ අන්තොසීමං ඔක්කමන්තෙ,
4 තෙ න පස්සන්ති අඤ්ඤෙ ආවාසිකෙ භික්ඛූ අන්තොසීමං ඔක්කන්තෙ,
5. තෙ න සුණන්ති අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තොසීමං ඔක්කමන්ති.
6. තෙ න සුණන්ති අඤ්ඤෙ ආවාසිකා භික්ඛූ අන්තොසීමං ඔක්කන්තාති.

මුලින් දැක්වූ පඤ්චවීසති තිකයන් මේ ක්‍රමයෙන් ගුණකොට නැවතත් මුල් පස්විස්ස එකතු කළ කල්හි (25 × 6=150 + 25=175) එක්සිය පන් සැත්තෑ තිකයෝ ලැබෙති.

**සත්තතිකසතානි** = තික සත්සියයකි. (700)

1. ආවාසිකේන ආවාසිකා පඤ්ච සත්තති තිකා (175)
2 ආවාසිකේන ආගන්තුකා පඤ්ච සත්තති තිකා (175)
3. ආගන්තුකේන ආවාසිකා පඤ්ච සත්තති තිකා (175)
4. ආගන්තුකේන ආගන්තුකා පඤ්ච සත්තති තිකා (175)

මේ ක්‍රම චතුෂ්කයෙන් එක්සිය පන්සැත්තෑව ගුණකළ කල්හි (175 × 4 = 70J) සත් සියයක් තිකයෝ ලැබෙති.

**ආවාසිකානං අනුවත්තිතබ්බං**- (අජ්ජුපොසථො චාතුද්දසො, යි පූර්වකෘත්‍යයන් කරණු ලබන කල්හි ආගන්තුකයන්) ආවාසික භික්ෂූන්ට අනුව පැවතිය යුතුයි· **ආවාසිකාකාරං**- ආවාසිකයන්ගේ ආකාරය; මොවුහු වතින් යුක්තයෝ ද වියුක්තයෝදැයි යමකින් ප්‍රකාශ වේ නම් ඒ ආකාර නම්. **ලිඞ්ගං**,- ලිඞ්ගය; යමකින් සැඟවුනු දෙය අවබෝධ කෙරේද ඒ ලිඞ්ග නම්. **නිමිත්තං**- නිමිත්ත; යමක ඇති නැති බැව් යම් දෙයක් දැකීමෙන් දැනගන්ට ලැබේද, එය නිමිත්ත නම්. **උද්දෙසො**- පැවසීම; මේ පිරිකරාදිය අසවලුන්ගේ යයි යමකින් ප්‍රකාශවේද ඒ උද්දෙස නම්. **අඤ්ඤාතකං**- මේ අපගේ යයි නොදත් දෙය, හෙවත් අනුන් සතු දෙය; **පාදානං ධොතං උදක නිස්සෙකං**- පාදෙව්මෙන් දිය වැගිරගිය තැන්; **නානාසංවාසකභාවං**- ලබ්ධි නානා සංවාසක භාවය; **නාභිවිතරන්ති**- නානාසංවාසකභාවය මඩින්ට නොහැකි වෙත්. **අඤ්ඤත්‍ර සඞ්ඝෙන**- සඞ්ඝපහොනක භික්ෂූන්ගෙන් වෙන්ව; සඞ්ඝුපොසථස්ථානයෙන් යන්නහු තමන් සිවුවැනි කොට ඇත්තහු විසින් යා යුතුයි. භික්ෂූන් තුන් නමක් හුන් තැනින් යන්නහු විසින් එක් නමක් සමග වත් යායුතුයි. **අඤ්ඤත්‍ර අන්තරායා**- පෙර කියන ලද දශවිධ අන්තරායවලින් වෙන්ව; යටත් පිරිසෙයින් අතන චතුත්ථව හෝ අන්තරායක් ඇතිකල්හි හෝ යන්ට වටී **අනාවාසො**- අවසක් නොවන තැන; නවකර්මාන්ත ශාලාදිය පිහිටි තැන; යම් භික්ෂුවක් වසන තැනක් වේ නම් එතනට යා හැකියි. **ආරඤ්ඤකෙන**- එක චාරික වූ ආරණ්‍යක භික්ෂුව විසින්; පොහෝදිනයෙහි ගමෙහි පිඬු හැසිර තමන්ගේ විහාරයට ම පැමිණිය යුතුයි. ඉදින් අතික් විහාරය කට වදිනම් එහිදී පොහොය කොට ම ආපසු පැමිණිය යුතුයි. පොහොය නොකොට එන්ට නොවටී. **යං ජඤ්ඤා සක්කොමි අජ්ජෙව ගන්තුං**- අදම එහි යන්ට හැක්කෙමියි යම් ආවාසයක් දන්නේ නම්, එබඳු ආවාසයකට ම පැමිණිය යුතුයි. එහි භික්ෂූන් සමග පොහොය කරන්නහු විසින් තමන්ගේ උපොසථාන්තරාය නො කරණ ලද්දෙක් ද වන්නේය. **භික්ඛුණියා නිසින්නපරිසාය**- භික්ෂුණීන් හුන් පිරිසෙහි 'භික්ඛුණියා' යනු කරණාර්ථයෙහි සාමිවචනයි. **අවුට්ඨිතාය පරිසාය**- නො නැගිට හුන් පිරිසෙහි; **අනුපොසථෙ**- නො පොහෝදිනෙහි; චාතුද්දසී පඤ්චදසී දෙදින පොහෝදිනයෝයි.

**උපොසථක්ඛන්ධක ගැටපද නිමි.**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු